# *Journal of the Faculty of Graduate Studies*

***University of Kelaniya, Sri Lanka***

***Volume 7, 2019***

## Journal of Faculty of Graduate Studie

Journal of the Faculty of Graduate Studies (ISSN 2279-2147) is published annually or multiannual by the Faculty of Graduate Studies of the University of Kelaniya, Sri Lanka.

## Objective:

The objective of this Journal is to disseminate knowledge of national and international research conducted by the postgraduate students of the faculty of graduate studies, academics, scientists and practitioners in the disciplines of Commerce and Management, Computing and Technology, Humanities, Medicine, Science, and Social Sciences.

## Editorial Policy:

Manuscripts of papers are considered to publish in the Journal of the Faculty of Graduate Studies whose abstracts were published in proceedings of the international postgraduate research conference (IPRC) on the recommendation of review panel of the IPRC to publish selected full papers.

1. Open peer-review process is used to review these articles
2. Editorial board of the journal reserves the right to request authors to revise their manuscripts according the comments made by the reviewers.
3. The editorial board reserves the right to refuse publication of the article even though the panel of the IPRC has recommended for publishing
4. University of Kelaniya reserves the copyright of articles accepted for publications. Each author is entitling to one copy of the journal of his/her article free of charge. If the manuscript is not accepted for publishing, the decision is informed to the corresponding author.
5. Guidelines for the authors are given in the last page of the journal

## Correspondence:

All correspondence regarding the journal articles should be sent to:

Editor in Chief,
Journal of Faculty of Graduate Studies,
Faculty of Graduate Studies, University of Kelaniya, Sri Lanka.
Tel: +94112903952, Fax: +94112908165, E-Mail: fgs@kln.ac.lk

**Journal of the Faculty of Graduate Studies**

**University of Kelaniya, Sri Lanka**

The Journal of the Faculty of Graduate Studies published by the Faculty of Graduate Studies of the University of Kelaniya offers basic and applied research of local and international authors. The journal accepts original contributions in disciplines of Commerce and Management, Computing and Technology, Humanities, Medicine, Science, and Social Sciences.

Copyright ©2016 by the Faculty of Graduate Studies, University of Kelaniya, Sri Lanka.

## Editor in Chief

**Prof. P.M.C. Thilakaratne**, Ph.D., Professor, Department of Accountancy,
Faculty of Commerce and Management Studies, University of Kelaniya

## Advisory Editor

**Prof. Ariyarathna Jayamaha**, Ph.D., Dean, Faculty of Graduate Studies,
University of Kelaniya

## Reviewers

**Dr. D.M.A.B Dissanayake**
Senior Lecturer (Grade II), Department of Obstetrics & Gynaecology,
Faculty of Medicine, University of Kelaniya
BSc (S.J'pura) (Hons), M.Phil. Dip. In Mgt. and Admin, PhD

**Tharupathi Munasinghe**
Senior Lecturer II, Department of Fine Arts, Drama & Theater and Image Arts Unit,
University of Kelaniya
BA (Kel'ya), MA (J'pura), MSD (Melbourne), Adv Dip Mus (Melbourne), Dip in Comunication (J'Pura)

**Dr. K.A.T. Dharaneeta**
Senior Lecturer I, Department of Philosophy, University of Kelaniya
B.A. (Kel'ya), M.S.Sc. (Kel'ya), Ph. D (Kel'ya), Dip.in Counselling (IPRS)

**Thilina Indrajie Wickramaarachchi**
Department of English Language Teaching (DELT), University of Kelaniya
B.A. (Hons) in English (Peradeniya), MA in TESL (The Open University)

**Professor (Mrs.) P. Narangoda**
Visual Arts & Design and Performing Arts Unit, Department of Fine Arts, University of Kelaniya
B.A.(Kel'ya),PG.Dip(PGIAR), PG.Dip.(Mor'wa), M.Sc.(PGAIR) ,PhD (Cali.)

**Mrs Dulanga Gunarathna**
Visual Arts & Design and Performing Arts Unit, Department of Fine Arts, University of Kelaniya
B.A. (Kel'ya), M.Phil.(Kel'ya), Dip. in Bharathnatyam(Lucnow) Dip.in Bharathanatyam (Tamilnadu)
B.Ph., B.Th. (Rome), M. Phil (Kalaniya), Master of Advanced Studies in Theology & Religion

**S. Damayanthi Edirsiinghe**
Senior Lecturer, Department of Commerce and Financial Management, University of Kelaniya
B.Sc. Social Statistics (Special) (SJP), MSc in Economics (Kelaniya)

## Editorial Secretary

**Mr. K.B.S.L Wijeratne,** Senior Assistant Registrar, Faculty of Graduate Studies,

University of Kelaniya

## Editorial Assistant

**Ms. M.S Hettiarachchi,** Computer Programmer, Faculty of Graduate Studies, University of Kelaniya

**Ms. P.G.C. Sudarshani,** Staff Management Assistant, Faculty of Graduate Studies, University of Kelaniya

# Table of Contents

1. අනුරාධපුර යුගයේ රාජ්‍ය පාලන කටයුතු කෙරෙහි රාජකීය කාන්තාවගේ දායකත්වයේ ස්වරූපය පොළොන්නරු යුගය වන විටදී කෙබඳුවීද ? (ප්‍රාථමික මූලාශ්‍රය ඇසුරින් කෙරෙන අධ්‍යයනයකි) ........................................ 1

පී.ජී.ආර්.ජේ.එන්. හර්ෂණී

2. Financial Literacy and Retirement Planning; Based on Wewala West Gn Division, Sri Lanka........................................ 15

P.G.T.N Perera

3. දුටුගැමුණු රාජ්‍ය සමයේ ශ්‍රී ලංකාවේ සංගීතය (ක්‍රි.පූ. 161-137)........................................ 29

The Ethno-Musicological Aspects of Sri Lankan Music During The Period of King Dutugemunu (161-137 BCE)........................................ 29

චන්දන රුවන් කුමාර

4. ගොඩගම්වෙල විහාර වත (ගොඩගම්වෙල පුරාණ විහාරයේ ඉතිහාසය හා විහාරයට අයත් පුරාවිද්‍යාත්මක, සාහිත්‍ය මූලාශ්‍රය පිළිබඳ කෙරෙන විමර්ශනයකි)........................................ 48

ඩබ්ලිව්. එම්. හිරාන් මධුසංක වීරබාහු

5. Intra-Household Food Sharing in a Selected Semi Urban Area in Matale District: A Case Study ........................................ 58

Herath HMDR, Angammana BH

6. පැරණි ශ්‍රී ලංකාවේ පැවති දේපළ අයිතිවාසිකම් පිළිබඳ විමර්ශනයක් ශිලාලේඛන ඇසුරින්. (ක්‍රි. පූ. 3වන සියවසේ සිට ක්‍රි. ව. 13වන සියවස දක්වා) ........................................ 70

ප්‍රාර්ථනා කරුණාරත්න

7. Possible Application of Sickling Test in Haemoglobinopathy Screening of Sri Lanka........................................ 87

Thamal Darshana, Nugee Perera, Aresha Manamperi, Anuja Premawardhena

8. හැඟීම්වලට වහල් නොවී බුද්ධියට තැන දීම, තර්ක ශාස්ත්‍රයේ පැනෙන න - රූපික තර්කාභාස ඇසුරින් සිදු කරන විචාරාත්මක විමර්ශනයක්........................................ 95

Prasad P.L. Jayalal

9. Productive Strategies of Generating Neologisms in Sri Lankan Print Media ........... 108

Anoma Abeywickremasinghe Gunawardana

10. උඩරට වෙස් ඇඳුම් කට්ටලය, විකාශනය, භාවිතය සහ සමාජ විඥානය. ......................... 123

ජේ. ඒ. ටී. සී. ජයසිංහ

11. නර්තනයේ භාවිත සරඹ අභ්‍යාස සහ කායික හා මානසික ඒකාග්‍රතාව (උඩරට නර්තන සම්ප්‍රදාය ඇසුරින්) ................................................................................................. 137

කේ. දනංජය ජයසේකර

12. ශ්‍රී ලාංකීය නර්තන චලන සංකේතකරණය හා ලේඛනගත කිරීමේ වැදගත්කම පිළිබඳ අධ්‍යයනයක් ........................................................................................................... 144

බී.ඩබ්.ආර්. දිල්කුෂි විජේරත්න

13. ශ්‍රී ලාංකේය ශාන්තිකර්ම රංගභූමිය හා බැඳි දේශීය වාස්තු විද්‍යාත්මක ලක්ෂණ.............. 158

ඩබ්ලිව්. ජී. එච්. එම්. වෙද්දෙනිය

14. The Moderating Effect of Ethnicity on Relationship Between Role Demands and Work-Life Balance Among Women Lecturers in Sri Lanka .............................................. 177

Indumathi Welmilla

15. වතු ජනතාවගේ මානව සම්පත් සංවර්ධනය : බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින් ........................................................................................................................ 200

ඩී.කේ. මහේෂා සාවිත්‍රි නන්දසිරි

16. ලී ඉරීම හා බැඳි උප සංස්කෘතික භාෂාව පිළිබඳ අධ්‍යයනයක් (බිබිල ප්‍රදේශයට විශේෂිතව) ........................................................................................................................ 216

A Study on Sub Cultural Language of Wooden Tear (With Reference to Bibile) .... 216

A.M. Chaminda Kumara

17. සත්‍යජිත් රේගේ සිනමාව කෙරෙහි සාහිත්‍යයේ ආභාසය................................................ 224

නිපුණ හේමින්ද බස්නායක

# අනුරාධපුර යුගයේ රාජ්‍ය පාලන කටයුතු කෙරෙහි රාජකීය කාන්තාවගේ දායකත්වයේ ස්වරූපය පොළොන්නරු යුගය වන විටදී කෙබඳුවීද ? (ප්‍රාථමික මූලාශ්‍රය ඇසුරින් කෙරෙන අධ්‍යයනයකි)

පී.ජී.ආර්.ජේ.එන්. හර්ෂණී[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලාංකේය ඉතිහාසය තුළ වැදගත් අවධියක් වශයෙන් අනුරාධපුර යුගය සැලකේ. මන්දයත් ප්‍රථම රාජධානිය බවට අනුරාධපුරය පත් වන හෙයින් මෙන්ම සෑම අංශයකින්ම දියුණු සභ්‍යත්වයක් හෙළිකරන ලද හෙයිනි. විජය කුමරුගේ පැමිණීමත් සමඟ ලාංකීය ඉතිහාසය වෙනස් මඟකට යොමුවුණි. කෙසේදයත් විජය කුමරුට ලක් රජය ලබාදීමට කුවේණි නම් යක්ෂ ගෝත්‍රික කාන්තාව සහය දක්වා ඇත. ඉන් අනතුරුව රාජාභිෂේකයේදී ක්ෂත්‍රිය කුමරියකගේ අවශ්‍යතාව මතුවිය. රාජකීය කාන්තාවන් නිරන්තරව සිය ස්වාමියන් ආරක්ෂා කිරීමට ප්‍රයත්නය දැරූ බවත් ඇතැම් අවස්ථාවල දී රාජ්‍ය පාලනයෙන් සිය ස්වාමියා ඉවත් කර වෙනත් අය එම තනතුරට පත්කිරීමට කටයුතු කළ බවත් හෙළි වේ.

මෙම පර්යේෂණයේ අරමුණු වන්නේ රාජ්‍ය පාලන කටයුතුවලට කාන්තාවගේ දායකත්වය කුමන ආකාරයකින් සිදුවීද යන්නත්, රාජාභිෂේකයේදී කාන්තාවට හිමි වූ ස්ථානයත්, අනුරාධපුර යුගයේ රාජ්‍ය පාලන කටයුතුවලට රාජකීය කාන්තාවගේ දායකත්වය පොළොන්නරු යුගය වන විටදී කෙසේවූයේ ද යන්නත් හෙළිකරගැනීමයි. මෙහිදී ක්‍රමවේදය වශයෙන් පර්යේෂණ මාතෘකාවට අදාළ ප්‍රාථමික සාහිත්‍ය මූලාශ්‍රය මෙන්ම ශිලා ලිපි ඔස්සේ කරුණු ඒකරාශී කරනු ලැබිණි.

පොළොන්නරු යුගයේ දී සෙනෙවියන්ගේ බලවත්වීම නිසා රාජකීය කතුන් සිහසුනට පත් කරලීම සිදු කළ බව පෙනීයයි. අනුරාධපුර යුගයේදී මෙන් නොව පොළොන්නරු යුගයේදී රාජකීය කතුන් කෙටිකලක් වුවත් සාර්ථකව පාලන කටයුතු කළ බව මූලාශ්‍රයවලින් හෙළිවේ. අනුරාධපුර යුගය ආරම්භයේ සිටම ක්ෂත්‍රිය කුමරියකගේ අවශ්‍යතාව රජුන් සතු වූ බවත් රාජකීය කතුන් පාලන කටයුතුවලදී වැදගත් තැනක් හිමි කරගත් බවත් අනුරාධපුර යුගයේ රාජකීය කතුන්ගේ දායකත්වය පොළොන්නරු යුගයේදී සෙනෙවිවරුන්ගේ බලවත්වීම හා ඇතැම් අවස්ථාවල දී ප්‍රබල පාලකයෙක් නොමැතිවීම නිසා පැවති වාතාවරණය අනුව බලයට පත් වූ බවත් අනුරාධපුර යුගයට වඩා පොළොන්නරු යුගයේදී රාජකීය කාන්තාවන්ගෙන් සැලකිය යුතු සේවයක් සිදු වූ බවත් අනාවරණය කරගත හැකි විය.

***ප්‍රමුඛ පද ඃ*** *අනුරාධපුරය, පොළොන්නරුව, රාජකීය කාන්තාවන්, දේශපාලනය, රාජ්‍ය පාලනය*

## හැඳින්වීම.

ලංකා ඉතිහාසය ගොඩනැගීමෙහිලා අනුරාධපුර යුගය ප්‍රධාන වේ. විජයාගමනයත් සමඟ ලාංකේය දේශපාලන වාතාවරණය කිසියම් වූ ආකාරයකට සකස් වන්නට වූ බව මූලාශ්‍රයවලින් පැහැදිලි වේ. ඒ කෙසේදයත් ක්ෂත්‍රිය කාන්තාවකට රාජ්‍ය පාලන කටයුතු කෙරෙහි පැවති අවස්ථාව වෙනසකට ලක්

[1] ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, nisansalaharshani200@gmail.com

වීමයි. රජරට අවධියේ දී රාජ්‍ය පාලන කටයුතුවලට රාජකීය කාන්තාවගේ දායකත්වය කුමන ආකාරයකින් සිදුවීද යන්නත්, රාජාභිෂේකයේදී කාන්තාවට දේශපාලනික වශයෙන් හිමි වූ ස්ථානයත්, අනුරාධපුර යුගයේ රාජ්‍ය පාලන කටයුතුවලට රාජකීය කාන්තාවගේ දායකත්වය පොළොන්නරු යුගය වන විටදී කෙසේ සකස් වූයේ ද යන්නත් හෙළිකරගැනීම මෙම අධ්‍යයනයෙන් සිදුවිය.

**අනුරාධපුර යුගයේ රාජ්‍ය පාලන කටයුතු කෙරෙහි රාජකීය කාන්තාවගේ දායකත්වය.**

අනුරාධපුර යුගයේ සිටම රාජකීය කාන්තාවන් දේශපාලන අංශයෙහිලා කැපීපෙනෙන බව කරුණු විමසීමේදී පැහැදිලි වේ. කෙසේදයත් ඕනෑම සමාජයක කාන්තාව වනාහි වැදගත් වූ සාධකයකි. ලාංකීය ඉතිහාසය තුළ ද කැපීපෙනෙන රාජකීය කාන්තාවන් රැසක් පිළිබඳව තොරතුරු හෙළිකරගත හැකිය. අනුරාධපුර යුගයේ රාජකීය මෙහෙසියන් පිළිබඳව අවධානය යොමුකිරීමේදී පැහැදිලි වන්නේ රාජකීය කාන්තාවන් පිළිබඳව මූලාශ්‍රයවල වැඩි වශයෙන් සඳහන් නොවන බවයි. එනමුත් අනුරාධපුර යුගය ආරම්භයේ සිටම රාජකීය මෙහෙසිය රාජ්‍ය පාලන කටයුතු උදෙසා අත්‍යවශ්‍ය වූ බවක් කරුණු විමසීමේදී පෙනීයයි.

විජයාගමනයත් සමඟ විජයට ලක්දිව පාලන කටයුතු ලබාගැනීම උදෙසා කුවේණි නම් යක්ෂ ගෝත්‍රික කාන්තාව බෙහෙවින් සහයෝගය දැක්වූබව මහාවංසය තුළින් හෙළිවේ.

***'තසසා සුත්වා තථා කත්වා සබෙබ යකෙඛ අසාතයි***

***සයමපි ලඞවිජයො යක්ඛරාජපසාධනං'***

(ම.ව.,7:37)

කුවේණිය විසින් විජයට ලංකා රාජ්‍යය ලබාගැනීමට සහය ලබාදුන්න ද අනතුරුව කුමරුගේ අමාත්‍යවරුන් විසින් විජයව අභිෂේක කරවීම උදෙසා කටයුතු කරන්නට විය. නමුත් මෙහිදී ගැටලුව වූයේ කුවේණිය යක්ෂ ගෝත්‍රික කතක් වීමයි. මන්දයත් අභිෂේක කරවීමට නම් ක්ෂත්‍රිය කුමරියක් සිටිය යුතුවීමයි. රාජත්වයේදී රාජාභිෂේකය මුඛ්‍ය විය. විජය කුමරු ක්ෂත්‍රිය කන්‍යාවක් නොමැතිව අභිෂේකවීමට අකැමැති වූ බව මහාවංසයෙන් පෙනීයයි (ම.ව.,7:47). මෙම අවස්ථාවේදී මදුරාපුර පඬි රජුගේ දියණියව මෙරටට ගෙන්වා විජයහට සරණපාවා දී අභිෂේක කටයුතු සිදුකර ඇත.

***'සබබා තා ලදධසකකාරා කඤඤායො ච යථාරහං***

***රාජාරහෙ ච හත්ථසසරථපෙසසියකාරකෙ.......'***

(ම.ව.,7:56)

මින් පැහැදිලිවන්නේ රාජ්‍ය පාලන කටයුතුවලදී ක්ෂත්‍රිය කුමරියකගේ දායකත්වය විජයාගමනයත් සමඟ මෙරට තුළ ආරම්භ වන්නට ඇති බවයි.

මදුරාපුර බිසවට දරුවන් නොසිටි අතර එහිදී කුවේණියගේ දරුවන් වූ ජීවහත්ථ සහ දිසාලාහට විජයගෙන් පසුව රාජත්වය හිමිනොවීය. මන්දයත් ක්ෂත්‍රිය කුමරියකගේ දරුවෙකුට පමණක් රාජත්වය හිමිවිය යුතුය යන න්‍යාය පුරාණයේ පටන්ම පැවති හෙයිනි. මෙහිදී විජය විසින් සිය මලණුවන් වූ සුමිත්තට මෙරට රාජත්වය ලබාගන්නා ලෙසට දන්වමින් හසුන්පතක් යවා තිබේ. ඊට අනුව සුමිත්තගේ

පුත් පණ්ඩුවාසදේව ලක්දිවට පැමිණ ඇත. එතුමාට ද රාජත්වයට පත්වීමෙන් පසුව අභිෂේකවීම උදෙසා ක්ෂත්‍රිය කුමරියකගේ අවශ්‍යතාවය මතුවිය. මෙහිදී භද්දකච්චානා නම් වූ පණ්ඩුශාක්‍ය රජුගේ දියණිය ඇතුළු පිරිස ලක්දිව ගෝණගාමක පට්ටනට ගොඩබැස ඇත. මේ පිළිබඳව ආරංචි වූ පඩුවස්දෙව් කුමරුගේ ඇමතිවරුන් විසින් ඇයව රජුට භාර කර තිබේ. එහිදී භද්දකච්චානා කුමරියව තම මෙහෙසිය බවට පත් කරගෙන ඇත

*'තං පණ්ඩුවාසවෙං තෙ අමච්චා සුදධබුදධිනො*

*රජෙජ සමභිසිඤ්චිංසු පුණ්ණසබ්බමනොරථං'*

(ම.ව.,8:27)

මේ තුළින් ද මනාව පෙනීයන්නේ ඕනෑම ක්ෂත්‍රියෙකුට රාජත්වයට පත්විය හැකි වුවත් ක්ෂත්‍රිය මෙහෙසියක් නොසිටීමෙන් අභිෂේක වීමට නොහැකි වූ බවයි.

පණ්ඩුකාභය රාජ්‍ය කාලය ගත්විට පණ්ඩුකාභය කුමරු රාජත්වය ලබාගැනීමට තම මාමාවරුන් සමඟ සටන් කිරීමට යන අවස්ථාවේදී එතුමාට පාලි නම් වූ සිය මාමාගේ දියණිය හමු වූ බවත් එම අවස්ථාවේදී ඇයව සරණපාවා ගැනීම කෙරෙහි පණ්ඩුකාභය කුමරු තුළ අදහසක් ඇති වූ බවත් මහාවංසයෙන් ගම්‍ය වේ.

*'තානි දිස්වා රාජපුතෙතා සරිත්වා දීජභාසිතං*

*මහෙසීභාවයොගගා මෙ කඤ්ඤා ලදධා'ති තුසසි සො'*

(ම.ව.,10:37)

ස්වර්ණපාලි නම් වූ ඇය ක්ෂත්‍රිය වංශික විය. ඒ වනවිටත් ක්ෂත්‍රිය කාන්තාවක් මෙහෙසිය කරගත යුතු බවට මතයක් පැවති බව ඔහුට පූර්ව පාලකයන්ගේ ක්‍රියාකලාපය ඔස්සේ පෙනීයයි. එහෙයින් ඔහු ඇයව සරණපාවා ගන්නට ඇති බව සිතීමට පුළුවන. ඉන් විශද වන්නේ ක්ෂත්‍රිය කුමරියක් පමණක් පාවා ගැනීම පිළිබඳව පණ්ඩුකාභය කුමරු තුළ ද අවබෝධයක් පැවති බවත් ඒ අනුව ඔහු ක්‍රියා කළ බවත් ය.

එසේම මුටසීව රාජ්‍ය කාලය ගත් කල්හි එතුමාගේ බිසව පිළිබඳව මූලාශ්‍රයවල සඳහන් නොවුණ ද එතුමා ද ක්ෂත්‍රිය කුමරියක් විවාහ කරගෙන සිටින්නට ඇති බව ඔහුට හිතෛෂී වූ පුතුන් දසදෙනෙක් හා කුලයට සුදුසු වූ දියණියන් දෙදෙනෙක් ද වූ බව සඳහන් වීමෙන් පෙනේ.

*'තසස පුතතා දසා'හෙසුං අඤ්ඤමඤ්ඤහිතෙසිනො*

*දුවෙ ධීතා චා'නුකූලා කුලානුචඡවිකා අහු'*

(ම.ව.,11:5)

ඒ තුළින් පෙනීයන්නේ ද කුලයෙන් උසස් කතක් මෙහෙසි බවට පත්කරගෙන සිටින්නට ඇති බවය.

දේවානම්පියතිස්ස රජු පළමුවරට අභිෂේක වී සිටිය ද අශෝක රජු සමඟ ඇති කරගත් නොදුටු මිත්‍රත්වය හේතුකොටගෙන නැවත වරක් අභිෂේක විය. මෙහිදී අශෝක රජු විසින් දෙවනපෑතිස් රජුට එවන ලද අභිෂේක උපකරණ අතර ක්ෂත්‍රිය කන්‍යාවක් ද විය.

***'අනොතතෙතාදකඤෙචට ගඞගාසලිලමෙව ච***

***සඞඛඤච තන්දියාවටට වඩඪමානං කුමාරිකං'***

(ම.ව.,11:30)

මෙහිදී රජු නැවත වරක් අභිෂේක වී ඇත. ඒ තුළින් ද පැහැදිලි වන්නේ ක්ෂත්‍රිය කාන්තාව රාජ්‍ය පාලන කටයුතුවලදී වැදගත් වූ බවයි.

එසේම දෙවනපෑතිස් රජුගේ සොහොයුරෙකු වූ මහානාගගේ බිසව අනුලා නම් වූ බව මූලාශ්‍රයවලින් හෙළිවේ.

***'කණිටඨසෙසාපරාජසස මහානාගසස ජාසිකං***

***වසනතීං රාජගෙහෙ'ව පකෙකාසාපෙසි චා'නුලං'***

(ම.ව.,14:56)

එසේම අනුලා දේවිය පන්සියයක් ස්ත්‍රීන් සමඟ සකෘදාගාමී තත්ත්වයට පත් වූ අතර පසුව පසුකාලීනව පැවිදි බවට ඇත. දෙවනපෑතිස්ස රජුගේ බිසව සිය පුත්‍රයාට රාජත්වය ලබාදීම උදෙසා රජුගේ සොයුරු මහානාගව මරාදැමීමට කුමන්ත්‍රණය කර ඇත. මන්දයත් මෙකල සහෝදරයාගෙන් සහෝදරයාට රාජත්වය උරුම වූ හෙයිනි. රාජ මෙහෙසියට රාජ්‍ය පාලන කටයුතුවලට ඍජුවම මැදිහත්වීමට අවස්ථාවක් හිමිනොවූ බව මින් පෙනීයයි. මහානාග කුමරු පළායාමේදී ඔහුගේ බිසව ද රැගෙන ගිය බව සඳහන්වීමෙන් පැහැදිලි වන්නේ මෙහෙසිය එවක වැදගත් ලෙස සැලකීම ඊට හේතුවන්නට ඇති බවයි.

***'....යුව රජ තෙමේ එයින්ම ඇතොවුරන් හා බල වාහන සමග සිය දේහය රක්නට රුහුණ බලා ගියේය. ඒ යුව රජ ගැබ් ගත් මෙහෙසි තොම යටාල වෙහෙර දී පිතෙකු වැදුවා.....'***

(ම.ව.,22:6,7)

මහානාග රජුගෙන් ආරම්භ වූ රෝහණ රජ පෙළපත ගත්කල එහිදී ද රාජකීය මෙහෙසියට කිසියම් වූ උසස් තත්ත්වයක් හිමිව තිබූ බව මූලාශ්‍රය ඔස්සේ අනාවරණය කරගත හැකිය. කාවන්තිස්ස රාජ්‍යය සමය වන විටදී රෝහණය තුළ ගිරි, සේරු, සෝම, ලෝණ වශයෙන් ප්‍රාදේශීය රාජධානි කීපයක් විය. මෙකී ප්‍රාදේශීය රාජධානිවල පවා ප්‍රාදේශීය රජුන් සිය මෙහෙසිය කෙරෙහි අවධානය යොමු කරන ලද බවත් ඇයට ද රාජ්‍ය පාලන කටයුතුවලදී යම්කිසි බලවත් බවක් පැවති බවත් ගම්‍ය වේ.

කෙසේදයත් කැලණියේ සිව රජුගේ බෑනනුවන්හට කාවන්තිස්ස රජුගේ නැගණිය වූ සෝම දේවිය විවාහ කරදුන් අතර ඔවුන් ගිරි නුවර වාසය කර ඇත. ගිරි අභය රජු හා ගැමුණු කුමරු අතර ජාතිය පිළිබඳ විවාදයක් ඇති වූ බවත් එවිට අභය විසින් සෝම දේවිය ද සමඟ ගිරි නුවර අතහැර සිය මිත්‍ර වූ සේරු නුවර සිව රජු වෙත බල සේනා ද රැගෙන පිටත්ව යන ලද බවත් වේ.

***'....කාවන්තිස්ස රජහුගේ බූන් වූ සෝමදේවි නම් රාජ කුමාරිකාවකමහ පෙරහරින් ගෙනවුත් පාවා දී අභය රාජ කුමාරයන් ගිරි නුවර වාසය කරවූයේ ය.....'***

(සිංහල ධාතුවංසය, 2012:488)

***'....සෝමදේවී නම් වූ බිසව හා සමග සිවුරඟ සෙනග ගෙන ක්‍රමයෙන් යන්නෝ.....'***

(සිංහල ධාතුවංසය, 2012:499)

ගිරි අභය රජු විසින් සිව රජුගේ උපකාරය ඔස්සේ සිය මෙහෙසියගේ නාමයෙන් පිහිටුවාගත් නුවර 'සෝම නුවර' නම් වූ බව තවදුරටත් ධාතුවංසයේ සඳහන් වේ (සිංහල ධාතුවංසය, 2012:501).

යටාලතිස්ස රජු ගත්කල එතුමාගේ මෙහෙසිය පිළිබඳව මූලාශ්‍රයවල සඳහන් නොවේ. ගෝඨාභය රජුගේ මෙහෙසිය පිළිබඳව ද මූලාශ්‍රයවල සෘජුවම සඳහන් නොවේ. එනමුත් ගෝඨාභය රජු චණ්ඩාල කාන්තාවක් සමඟ විවාහ වී සිටි බවට ධාතුවංසය ඉඟියක් සපයන බවට අයි.ඩී. ජයසිංහ මහතා පවසයි (ජයසිංහ, 1966:117). මෙහිදී ඔහු විසින් සාක්ෂි වශයෙන් දක්වනුයේ කාවන්තිස්ස රජු දවස ගැමුණු කුමරු හා ගිරි අභය අතර ජාති සම්බන්ධයෙන් ඇති වූ විවාදයයි (සිංහල ධාතුවංසය, 2012:499). ඔහුගේ මතය විමසීමේ දී ගෝඨාභය රජු ඇතැම්විට චණ්ඩාල කාන්තාවක් සරණපාවා ගෙන සිටි බවත් එය හුදෙක්ම දසබෑ රජුන් සමඟ ගැටලුකාරී වාතාවරණයක් ඇති වන්නට හේතු වූ බවත් අනුමාන කළ හැකිය.

මෙකී විවාහය, ගෝඨාභය විසින් දසබෑ රජදරුවන් මරා දැමීමට තරම් ප්‍රබල වී ඇත්තේ එවක අගබිසවට රාජ්‍යය පාලන තුළ හිමිව තිබූ සුවිශේෂී ස්ථානය නිසා බවට ද සිතිය හැකිය. අගබිසවට සමාජයෙහි කෙතරම් වැදගත් තැනක් හිමිව තිබූණේ ද යන්න ගිරි අභය විසින් සිය අගබිසව වූ සෝම දේවියගේ නමින් නුවර ඉදිකිරීම තුළින් පැහැදිලි වේ (සිංහල ධාතුවංසය, 2012:501). එමෙන්ම කාවන්තිස්ස රජුගේ ඇවෑමෙන් සද්ධාතිස්ස තම මව් බිසවත් හස්තිරාජයාත් රැගෙන දීඝවාපියට ගිය පසු මව සහ ඇතු ලබාගැනීමේ අරමුණින් ගැමුණු - තිස්ස කුමාරවරු අතර අරගලයක් ද ඇති විය. මේ තුළින් ද ගම්‍ය වන්නේ රාජ්‍යයක අගමෙහෙසියහට ද සුවිශේෂී බලයක් හිමිව තිබූ බවයි.

කැලණිතිස්ස රජුගේ දියණිය වූ විහාරමහාදේවිය ගත් කල ඇය පසුකාලීනව කාවන්තිස්ස රජුගේ අගමෙහෙසිය බවට පත්විය. මොවුන් සම කුලයෙහි බව සීහළවත්ථුප්පකරණයෙන් හෙළිවේ.

***"රජකුල දෙකෙහි උපන් පෙරවාසනා ඇති, පින්වත්, මහේසාක්‍ය වූ ඒ දෙදෙන එකට වැඩුණහ. රජකුලයේ සම්පතින් වැඩෙමින් තරුණවියට පත් ඒ දෙදෙන අන්‍යෝන්‍ය සම්බන්ධයට පමුණුවන ලදහ"***

(සීහළවත්ථුප්පකරණය, 2006:113)

විහාරමහාදේවිය වූ කලී රාජ්‍ය පාලන කටයුතුවලට සිය ස්වාමියාට මහත් සේ උපකාර කළ ස්ත්‍රියකි. කාවන්තිස්ස රජුගේ මරණින් පසු ඇය සිය වැඩිමල් පුතු වූ දුටුගැමුණු කුමරුට යුධ කටයුතුවලට සහයෝගය දක්වා ඇත. තිත්ථම්බ නම් වූ මහත් බල ඇති ද්‍රවිඩයා සමඟින් යුද්ධ කරන විටදී විහාරමහාදේවියගේ උපායකින් ඔහුව අල්ලාගෙන ඇත.

***'....තිත්ථම්බ නම් වූ මහත් බල ඇති කෘතහස්ත වූ දෙමළා යුද්ධ කෙරෙමින් සාර මසෙකින් මෑණියන් දක්වා ඒ උපායෙන් අල්වා ගත්තේය.....'*** (ම.ව.,25:8-10)

ඇය දුටුගැමුණු - එළාර යුද්ධයේ දී සිය පුත්‍රයාගේ උපදේශිකාව ලෙස කටයුතු කරමින් මවක සතු යුතුකම් මැනැවින් ඉටු කළාය. යුද්ධ ජයග්‍රහණය සඳහා ඈ ඉටු කළ මෙහෙවර පිළිබඳ මහාවංසයේ සඳහන් වන්නේ මෙසේය.

***"දුටුගැමුණු රජ තෙමේ මෑණියන් හා මන්ත්‍රණය කොටගෙන ඒ බිසවුන් උපායෙන් දෙතිස් බලකොටුවක් කරවීය......"***

(ම.ව.,25:55,56)

රාජ්‍ය පාලනයේදී අනුගමනය කළ යුතු උපක්‍රම පිළිබඳව විහාරමහාදේවිය තුළ කිසියම් අවබෝධයක් තිබූ බව ඒ තුළින් මනාව පැහැදිලි වේ.

එසේම ක්ෂත්‍රිය රජු විසින් විවාහ කරගත යුත්තේ ක්ෂත්‍රිය කුමරියක් යන්න දැඩිව එවක සමාජයේ පැවති පිළිගැනීම බව සාලි කුමරු අසෝකමාලාව විවාහ කරගැනීම හේතුවෙන් ඔහුට රාජත්වය අහිමි වූ බව සඳහන්ව තිබීමෙන් පැහැදිලි වේ.

***'.....හේ ඉතා ලාවන්‍ය රූ ඇති චණ්ඩාලියක් කෙරෙහි ඇලුනේ ය. පූර්ව ජාතියෙහි සම්බන්ධ වූ ඒ අශෝකමාලා දේවිය රූපත් බැවින් අතිශයින් ප්‍රිය කරන්නේ රජය නොම පැතීය.....'***

(ම.ව.,33:3)

අනුරාධපුර යුගයේ මේ වනවිටදී රාජ මෙහෙසිය රාජ්‍ය පාලනයේදී ක්ෂත්‍රිය මෙහෙසියක් රජුට සිටීම අනිවාර්ය අංගයක් වූ බව ඉහත කරුණු අනුව මනාව පෙනීයයි.

වළගම්බා රජු විසින් සිය සොයුරු බල්ලාටනාගගේ බිසව වූ අනුලා දේවිය පසුකාලීනව විවාහ කරගෙන තිබේ.

***'.....ඒ කුමරහු මෑණි වූ අනුලා දේවියත් බිසව් කොට ගත්තේ ය.....'***

(ම.ව.,33:36)

එසේම මෙතුමාගේ අගබිසවක් වශයෙන් සෝමා දේවිය සැලකේ. වළගම්බා රාජ්‍ය කාලයේ දී සත් ද්‍රවිඩ ආක්‍රමණය එල්ල වූ අතර එහිදී රජු ඇතුළු පිරිස පළායන්නට විය. මෙම අවස්ථාවේදී රජු ඇතුළු පිරිස පළා ගිය රථයේ සැහැල්ලු බව උදෙසා යහපත් සිළුමිණක් දී මිහිපති තෙමෙ සෝමා දේවිය ඇයගේ අනුමැතියෙන් බැස් වූ බව මහාවංසයේ සඳහන් වේ (ම.ව.,33:47,48). එහිදී එක් ද්‍රවිඩයෙක් විසින් රජුගේ අගමෙහෙසියව ගෙන ගොස් ඇත (ම.ව.,33:56,57, රාජාවලිය, 1997:190). සිය ස්වාමියා ආරක්ෂා කරලීමේ අභිප්‍රාය සෝමා දේවිය තුළ පැවති බව ඒ තුළින් පෙනීයයි. ඇයගේ මෙම ක්‍රියාකලාපය හේතුවෙන් පසුකාලීනව නැවත රාජත්වයට පත් වූ වළගම්බා රජු විසින් සෝමා දේවිය ගෙන්වා පෙර වූ පරිද්දෙන් සිය තනතුරෙහි පිහිටුවා එම බිසවගේ නාමයෙන් යුක්තව සෝමාරාමය කරවා ඇත.

***'.....ඒ රජ තෙමේ සෝමා දේවිය ගෙන්වා යථා ස්ථාන සංඛ්‍යාත වූ සිය තනතුරෙහි පිහිට විය. ඒ බිසවුන්ගේ එම නම් කොට සෝමාරාමය කරවීය.....'*** (ම.ව.,33:86)

රාජ්‍ය පාලන කටයුතුවලදී රාජකීය බිසවගේ තත්ත්වය වැදගත් වූ බව මෙමගින් මනාව පෙනීයයි.

අනුරාධපුර යුගයේ මෙරට සිංහාසනයට පත් පළමු කාන්තාව වශයෙන් අනුලා බිසව බව මූලාශ්‍රය තුළින් හෙළිවේ. අය වූ කලී විෂම අදහස් ඇති තැනැත්තියෙකු බව මහාවංසයෙන් පැහැදිලි වේ.

***'.....චොරනාග බිසව් විසම අදහස් ඇති අනුලා දේවී බලතා කෙරෙහි ඇළුණු සිත් ඇත්තී විස දී විසම ක්‍රියා ඇති.....'***

(ම.ව.,34:15,16)

ඒ අනුව අනුලා දේවිය බලතා කෙරෙහි සිත් ඇතිව චෝරනාග රජුව විෂ දී මරා දමා රජය බලතාට ලබාදුන් බව පෙනේ. එසේම සිව නම් වූ දෙටු දොරපල් බලත් තෙමේ ද අනුලාව මෙහෙසිය කොට ගෙන දෙමසකට අධික අවුරුද්දක් ඒ නුවර රජය කරවා ඇත. ඊට අමතරව අනුලා බිසව වටුක නම් වූ දෙමළා කෙරෙහි ද බැඳී විෂ දී සිව මරා දමා වටුකව රාජ්‍යයට පමුණුවා ඇති බව සඳහන් ය. වටුක ද දෙමසක් අධික අවුරුද්දක් පාලන කටයුතු සිදුකර තිබේ.

පසුව අනුලා බිසව විසින් දරකැටියා දැක ඔහු කෙරෙහි සිත් ඇති වී වටුකව මරා දරකැටියාව බලයට පත් කර ඇත. මෙහිදී දරකැටිතිස් විසින් අනුලාව මෙහෙසිය කරගනිමින් එක් මසක් අධික අවුරුද්දක් රාජ්‍ය පාලන කටයුතු මෙහෙයවා තිබේ. කල්යාමත් සමඟ අනුලා බිසව නීලිය නම් දෙමළ පෙරෙවි බමුණා කෙරෙහි රාගයෙන් ඇලී ඔහු හා සහවාසයට කැමැති හෙයින් දරකැටිතිස් රජුව මරා නීලියට රාජ්‍ය පවරා දී ඇත. නීලිය අනුරාධපුරයේ මාස සයක් රජ කර වූ බව සඳහන් ය. මූලාශ්‍රයවලට අනුව නීලියව මරා අනුලා දේවිය විසින් සාර මාසයක් රජය කර වූ බව වේ.

***'.....අනුලා නාම සා ඉත්ථී හනිත්වා ජනරුත්තමෙ***

***චතුමාසං තම්බපණ්ණිම්හි ඉස්සරිය අනුසාසි සා.....'***

(ම.ව.,34:27)

***.... අනුලා නම් ඒ ස්ත්‍රී තොමෝ රජුන් සදෙනෙකු නසා තාම්‍රපර්නිද්වීපයේ සිවු මසක් රිසි සේ රාජ්‍ය විචාළ....'***

(වංසත්ථප්පකාසිනී, 2001:504)

රාජාවලියට අනුව කුඩාතිස්ස රජු තුන් අවුරුද්දක් රාජ්‍ය කළ බවත් අනුලා විසින් වස දී සුරත්, මුකවෙට්ටි, ප්‍රොහිත යනාදීන්ට බලය ලබාදී අනතුරුව තමා සිව් මසක් රාජ්‍ය කළ බවත් වේ.

***'.....අගබිසව ඒ රජ වස දී මරා සුරත් කියන ඇමතියා ලවා එක් අවුරුද්දක් රාජ්ජය කෙළේය. ඔහු වස දී මරා මුකවෙට්ටි දෙමළා ලවා එක් අවුරුද්දක් රාජ්ජය කෙළේය. ඔහු වස දී මරා ප්‍රොහිත බමුණා ලවා එක් අවුරුද්දක් රාජ්ජය කෙළේය. ඔහු වස දී මරා තොමෝ සාර මසක් රාජ්ජය කෙළේය.....'***

(රාජාවලිය, 1997:191)

මකලන්තිස්ස නම් වූ මහාචූලික රජුගේ දෙවන පිත් වූ අනුලා දේවියට බියේ පළාගොස් පැවිදිව සිට සුදුසු කල නැවත පැමිණ ඇයව මරා රාජත්වයට පත්ව තිබේ (ම.ව.,34:28,29). මින් හෙළිවන වැදගත්

කරුණක් වන්නේ අනුලා දේවියට ඒ වනවිටදී කිසියම් වූ දැඩි බලයක් පැවති බවයි. එහෙයින් සුදුසු කාලය එනතුරු සිට ඇය මරාදැමීමට කටයුතු කරන්නට ඇති බව සිතිය හැකිය. අනුලා බිසව විසින් මෙලෙසට කාමාශාව පදනම් කරගනිමින් පමණක්ම නොයෙක් පුද්ගලයන් කෙරෙහි යොමු වූ බව ප්‍රකට වුවත් ඇතැම්විටදී ඇය විසින් බලවතුන් ලෙසට විවිධ පුද්ගලයන් පත් කරන්නට ඇත්තේ ඇයට එල්ල වූ තර්ජන හමුවේ සිය ආරක්‍ෂාව වඩාත් තහවුරු කරගැනීමේ අභිප්‍රායෙන් වන්නට ඇති බවට ද අනුමාන කළ හැකිය.

රාජකීය බිසවක් වශයෙන් අනුලා දේවිය ඇය රාජත්වයට පත් වූ කාලවකවානුව තුළදී හෝ ඇය විසින් බලය අත්පත් කරදුන් පුද්ගලයන් පාලන කටයුතු කරන ලද කාලයේදී ආගමික, සාමාජීය, ආර්ථික යන අංශවලින් දියුණුවක් ඇති වූ බවක් මූලාශ්‍රයවලින් පෙන්නුම් නොකෙරේ. නමුත් දේශපාලනික වශයෙන් ප්‍රබලත්වයක් ඇය සතු බවත් ඊට එරෙහිව කටයුතු කිරීමට අන්‍යයන් කටයුතු නොකළ බවත් යනාදිය ඇතැම් කරුණු අනුව පැහැදිලි වේ.

අනුරාධපුර යුගයේ රාජ්‍ය පාලන කටයුතු කෙරෙහි මූලිකත්වයෙන් කටයුතු කරන ලද තවත් රාජකීය කාන්තාවක් වශයෙන් සීවලී බිසව සඳහන් කළ හැකිය. චූලාභය රජුගෙන් අනතුරුව එතුමාගේ නැගණිය වූ ද ආමණ්ඩ රජුගේ දියණිය වූ සීවලී කුමරිය රාජත්වයට පත්ව ඇත. නමුත් ඇයට රාජ්‍ය පාලන කටයුතු කරගෙනයාමට හැකිව ඇත්තේ සිව් මසක් පමණක් බව මහාවංසයෙන් පෙනීයයි.

***'.....චූලාභය රජු ඇවෑමෙන් ඒ රජු නැගෙණි වූ ආමණ්ඩ රජ දූ වූ සීවලී කුමරිය සාර මසක් රජය කරවී.....'***

(ම.ව.,35:13,14)

දීපවංසය තුළ ද සීවලී බිසව විසින් මාස හතරක් රාජ්‍ය පාලන කටයුතු සිදුකරන ලද බව සඳහන්ව තිබේ (දී.ව.,21:39).

මෙතරම් කෙටි කාලයක් පාලන කටයුතු කිරීමට සිදුවූයේ ආමණ්ඩගාමිණී රජුගේ බෑණා වූ ඉලනාග විසින් සීවලී කුමරියගෙන් රාජ්‍ය පැහැරගෙන රාජත්වයට පත් වූ හෙයිනි. සීවලී කුමරියව දීපවංසය තුළ රේවතී නමින් හඳුන්වා තිබේ.

***'සීවලි නාම සාදෙවී රෙවතී ඉති විසසුතා***

***චතුමාස'මකා රජජං ධීතා ආමණ්ඩ රාජිනො'***

(දී.ව.,21:39)

පූජාවලිය තුළ ද සිංහවල්ලි නමින් හඳුන්වා දී ඇත්තේ සීවලී කුමරිය යැයි කරුණු අනුව ගම්‍ය වේ.

***'.....ඔහු නං සිංහවල්ලි නම් බිසෝ සාරමසක් රජය කළාය. අමඬගැමුනු රජහු බෑන එළුන්නා මහරජ ඇය තමහට බිසෝ කොට සහවුරුද්දක් රජය කළේය.....'***

(පූජාවලිය, 1986:775)

කෙටිකලක් වුවත් අනුරාධපුර යුගයේ රාජ්‍ය පාලන කටයුතුවල නියැළුණු රාජකීය කුමරියක් වශයෙන් සීවලී කුමරිය වැදගත් වේ. සිව් මාසයක් වුවත් ඇයට පාලන කටයුතු කරගෙනයාමට හැකියාව ලැබුණේ රාජකීය වශයෙන් එවක සමාජය තුළ හිමිව තිබූ ගෞරවය, බලය හේතුකොටගෙන බව සිතීමට පුළුවන.

වසභ රජු විසින් සිය මයිල්ගේ බිරිද වූ මෙත්තා නම් වූ බිසව සිය අගමෙහෙසිය බවට පත්කරගන්නා ලද බව සඳහන් ය.

***'.....පූර්වෝපකාරී වූ මෙත්තා නම් වූ මයිල් බිරින්ද ඒ වසභ රජ තමහට අග මෙහෙසුන් කෙළේයි.....'***

(ම.ව.,35:70)

මහාවංසයේ සඳහන් ආකාරයට වසභ රජුගේ ප්‍රසිද්ධ වූ බිසව බෝ මළුවෙහිම සිත්කළු වූ වෘත්ත නම් වූ සෑ ගෙයක් කරවන ලද බව වේ (ම.ව.,35:90,91). ඒ තුළින් ද ගම්‍ය වන්නේ රාජකීය කාන්තාවන්ට ආගමික කටයුතුවල නිරතවීමේ අවස්ථාව හිමිව තිබූ බවයි.

ඊට අමතරව රාජකීය දියණියක් රාජ්‍ය පාලනයේදී රජවරුන් විසින් සරණපාවා ගැනීම වැදගත් වූ බව තවදුරටත් විශද වන අවස්ථාවක් වශයෙන් වසභ රජුගේ පුත්‍රයා වූ වංකනාසිකතිස්සහට ශුභ රජුගේ දියණියව සරණපාවා දීමට වසභ රජු කටයුතු කරලීම දැක්වීමට පුළුවන (ම.ව.,35:101-111).

***'.....රජතෙමේ ඇය ගෙන්වන්නට පටන් ගත. එකල උළු වඩු තෙමේ ඇය තමා රජ දූ බැව් කීය. එසේම කම්බලාදියෙන් ශුභ රජහු දූ බැව් හැඟවීය. රජ තෙමේ තුටු වූයේ මනා කොට කෘත මංගල්‍ය විධි ඇති ඇය පුත්‍රයාහට පාවා දුන්නේය.....'***

(ම.ව.,35:109-111)

එසේම රාජකීය බිසවගේ බස් අනුව රජුන් කටයුතු කළ බව ද හෙළිකරගත හැකිය. එහිලා නිදසුනක් වශයෙන් ගජබාහු රජු මවු බිසවගේ බස් අසා මව් බිසව උදෙසා හිඟුරුවැල් ලැහැබ් ස්ථානයක රාජ මාතු විහාරය කරවන ලද බව සඳහන් කළ හැකිය. තව ද එකී බිසව බිම පිණිස මහාවිහාරයට ලක්ෂයක් දුන් බවත් විහාරය ද එහි සෙල්මුවා සෑය ද සංඝ භොගය ද දුන් බව තවදුරටත් මහාවංසයේ වේ.

***'.....ඒ බිසවුන් බස් අසා මවු බිසවුන් පිණිස හිඟුරුවැල් ලැහැබ් තන්හි රාජ මාතු විහාරය කරවී. පණ්ඩිත ඒ බිසව් මහා විහාරයට ලක්ෂයක් දුන්නීය. විහාරය ද කරවී. එහි සෙල්මුවා සෑය තොමෝම කරවී. ඒ ඒ තැනින් මිලට ගෙන සංඝ භොගය ද දුන්නාය.....'***

(ම.ව.,35:116-118)

ඉන් ගම්‍ය වන කරුණක් වන්නේ රාජ්‍යය තුළ රාජකීය කාන්තාවට බිසවක් වශයෙන් මෙන්ම මාතාවක් වශයෙන් ද ආගමික, ආර්ථික වශයෙන් ද කටයුතු කරලීමේ ස්වාධීනත්වය පැවති බවයි.

මහසෙන් රජුගේ වල්ලභ වූ ලේනාවෙහි ද එක් බිරින්දක් මහාවිහාරභායනයෙහි කණගාටුවට පත්වූවාසේම කෝපයට පත්ව වඩුවාට සංග්‍රහ කර ඒ විනාශක තෙරුන් මරවා ඇත (ම.ව.,37:26,27). රාජ්‍ය පාලන කටයුතු කරගෙනයාමේදී ද්‍රෝහී අයුරින් කටයුතු කරන ලද පිරිස් ඕනෑම රාජ්‍යයක බොහෝ ලෙස දැකගත හැකිය. එබඳු අය උදෙසා රාජකීය කාන්තාවන් පවා නිර්භීත අයුරින් සාධාරණය කිරීමට

ඉදිරිපත් වූ බවත් ඒ සඳහා සුදුසු අවස්ථාව එවක රාජ්‍ය පාලනය තුළින් හිමිව පැවති බවත් මින් පැහැදිලි වේ.

තවද මහානාම රජුට දාව දෙමළ කාන්තාවකගේ කුසින් උපන් සොත්ථිසේන නම් වූ කුමාරයෙක් ද මෙහෙසියගේ කුසින් උපන් සංඝා නම් කුමාරිකාවක් ද වූ බව වේ (ම.ව.,38:1). එමෙන්ම සොත්ථිසේන කුමරු රාජත්වයට පත්ව ඇති අතර සංඝා කුමරිය විසින් මරා තම ස්වාමියා වූ ඡත්තගාහකට රාජ්‍ය ලබා දී ඇත.

***'....එදවස්හිදීම ඕතොමෝ බෙර පියවි කරවා තමා වල්ලභ ඡත්තගාහකයහට රජය දින.....'***

(ම.ව.,38:3)

මේ තුළින් පෙනීයන්නේ ද රාජ්‍ය පාලන කටයුතු සිදු කිරීමේදී රාජකීය කාන්තාව කෙතරම් බලවත් වූයේ ද යන්නයි.

අනුරාධපුර අවධියේදී රාජකීය මෙහෙසියට කිසියම් වූ බලයක් තිබූ බව සුලුමුගලන් රජුගේ මෙහෙසිය විසින් විෂ යොදා ඥාතීන් මරා පිත්හු රාජ්‍යයෙහි අභිෂේක කොට තොමෝ රාජ්‍ය විචාල බව මහාවංසයේ සඳහන්වීමෙන් පැහැදිලි වේ (ම.ව.,40:64). එවක මහේසිකාව සියලු කර්මාන්තයෙහි ප්‍රධාන වූ බව තවදුරටත් මහාවංසය තුළින් හෙළිවේ. ඒ අනුව ගම්‍ය වන්නේ ද රාජකීය කාන්තාවට රාජ්‍යය තුළ පාලන කටයුතුවලදී කිසියම් වූ විශේෂ බලයක් පැවති බවයි.

කුඩා අක්බෝ විසින් සිය මයිල්හුගේ දියණියක් අගමෙහෙසුන් කළ අතර ඇයගේ ඥාතියෙක් වූ සංඝභද්‍ර කුමරු අසිග්‍රාහක බවට පත් කර ඇත (ම.ව.,42:40-42). රාජකීය පෙළපතකට අයත් වූ බිසවක් සිය මෙහෙසිය කරගත් බවත් ඇයගේ ඥාතීන් ද රාජ්‍ය පාලන කටයුතු උදෙසා බඳවා ගන්නා ලද බවත් ඉන් ගම්‍ය වන්නකි. රාජ්‍ය උරුමය පාලන කටයුතුවලදී කාන්තාවට ඉතාමත් වැදගත් වූ බව මෙමගින් විද්‍යමාන වේ.

සිලාමේඝ රජුගේ අභාවයෙන් අනතුරුව දේවිය කණගාටුවට පත්ව සිටිනු දුටු රජුගේ සේනාපති විසින් රාජ්‍යය කරවන ලෙසට පැවසූ බව මහාවංසයෙන් හෙළිකරගත හැකිය.

***'....රජහු මළ තැනට ගොස් දේවිය දැක අඬා අස්වසා කල්වූ පරිද්දෙන් මහාදේවීනි මාගේ ස්වාමීතෙම මළේයයි නොසිතව මම දිවයින රක්නෙමි නුඹවහන්සේ රාජ්‍යය කරවයි මේ වචනය කීයේය.....'***

(ම.ව.,48:85,86)

අනුරාධපුර යුගය අගභාගය වනවිටදී ලක්දිව ක්ෂත්‍රියන් ඇති කලත් කලිගු සක්විති වංශයෙහි ආදී වශයෙන් උපන් කුමරියක් ගෙන්වා අගමෙහෙසුන් බවට පත්කරගන්නා ලද බව ද මූලාශ්‍රයවලින් හෙළිවේ (ම.ව.,54:9,10). මේ අනුව අනුමාන කළ හැකි වන්නේ එවක ලාංකීය රාජකීය කාන්තාවට රාජ්‍ය පාලන කටයුතුවල දී මෙන්ම සමාජය තුළ ද පැවති තත්ත්වය යම් තරමකට අල්ප වන්නට ඇති බවය. කෙසේ නමුත් අනුරාධපුර යුගයේදී රාජකීය කාන්තාවට යම් යම් අවස්ථාවලදී කිසියම් ලෙසකට උසස් මෙන්ම ඇතැම් අවස්ථාවලදී සුළු වශයෙන් තත්ත්වයක් හිමිව තිබූ බව පැහැදිලි වේ.

**පොළොන්නරු යුගයේ රාජ්‍ය පාලන කටයුතු කෙරෙහි රාජකීය කාන්තාවගේ දායකත්වය.**

පොළොන්නරු යුගය ද ලාංකීය ඉතිහාසය තුළ කැපී පෙනෙන අවධියකි. මෙම අවධියේදී ද රාජ්‍ය පාලන කටයුතු ගත් කල එහිදී වැදගත් වන මෙහෙසියන් දෙදෙනෙක් පිළිබඳව මූලාශ්‍රයවලින් හෙළිකරගැනීමට පුළුවන. එනම්,

- ලීලාවතී රැජින
- කල්‍යාණවතී රැජින

පොළොන්නරු යුගයේ රාජත්වයට පත් වූ රැජිනියන් අතර ලීලාවතී රැජින ඉතා වැදගත් වේ. ලීලාවතී වූ කලී මහාපරාක්‍රමබාහු රජුගේ අගමෙහෙසියයි. ඇය අවස්ථා ත්‍රිත්වයකදීම රාජත්වයට පත්ව තිබේ.

***'.....පණ්ඩිත විජයබාහුය, කිලිං කෙස් දා මිහිඳුය, කීර්ති නිශ්ශංකය, වීරබාහුය, චෝඩ ගංගය, ලීලාවතීය, සහසමල්ලය, කල්‍යාණවතිය, ධමාශෝකය, ඇණියහඟය, ලීලාවතීය, ලෝකේශ්වරය, ලීලාවතීය, පරාක්‍රම පාඬිය යන.....'***

(නිකාය සංග්‍රහය, 2001:37)

චෝඩගංගගේ නව මසක පාලනය උපුටා දමමින් කීර්ති නම් සෙනෙවියා විසින් ලීලාවතී බිසව සිහසුනට පත්කර ඇත.

***'.....කීර්ති නම් සේනානායකතෙම ඒ නරනිඳුගේ ඇස් උපුටා උහු දුරුකොට පරාක්‍රම භුජේන්‍ද්‍රයානන් අගමෙහෙසුන් වූ ලීලාවතී බිසවුන් ලවා නිරුපද්‍රව ලෙස තුන් අවුරුද්දක් රාජ්‍යය කරවූයේ ය.....'***

(ම.ව.,80:30,31)

***'.....පසුව සෙනෙවි රජ තෙම චොඩගඞ්ග රජු මරා දමා පරාක්‍රමබාහු රජුගේ අගබිසව ලවා තුන් අවුරුද්දක් රාජ්ජය කෙළේය.....'***

(රාජාවලිය, 1997:211)

ඊට පසුව වික්කන්ත චමුනක්ක විසින් ලීලාවතී රැජිනව නැවත වරක් සිහසුනට පත් කළ බව හෙළිවේ. ඇයගේ මෙම දෙවන රාජ්‍ය කාලය ලෝකේශ්වර විසින් දමිළ සේනාවක් රැගෙන මෙරටට පැමිණ රාජ්‍ය බලය පැහැර ගන්නාතුරු පැවතිණි. ලෝකේශ්වරගේ පාලනය අවසන් කරලමින් කළුන්නරු වංශයේ උපන් පරාක්‍රම නම් සෙන්පතියා නැවතත් ලීලාවතී රැජිනව සිහසුනට පත් කර ඇත.

***'.....එකල්හි කළුන්නරුවස උපන් ධෘතිමතුන් අතුරෙන් ශ්‍රේෂ්ඨ මහා බල පරාක්‍රම නම් සේනාපති තෙමෙ චන්ද්‍ර සූර්ය වංශයෙන් උපන් රාජතේජෝවිලාස ඇත්තා වූ ලීලාවතී නම් ඒ මෙහෙසිය නැවත ද රාජ්‍යයෙහි අභිෂේක කෙළේය.....'***

(ම.ව.,80:49,50)

සත් මසක් පමණ ගත වූ පසු තේජස් ඇත්තා වූ පරාක්‍රම නම් පඬි රජ තෙම මහත් වූ පඬි සෙන් ගෙන ලක්දිවට පැමිණ ඒ දේවිය ද පැරකුම් සෙනෙවියන් ද පහකොට ලක්දිව පාලන බලය ලබාගෙන ඇත.

***'.....සත් මසක් පමණ ගිය කල්හි තේජස් ඇත්තා වූ පරාක්‍රම නම් පඬි රජතෙමේ මහත් වූ පඬිසෙන් ගෙන පඬිරටින් ගෙන.....'***

(ම.වං.,80:51)

කෙසේවුවත් පොළොන්නරු රාජධානිය තුළ දී රාජ්‍ය පාලන කටයුතුවල ප්‍රමුඛත්වය ගත් රැජිනක් වශයෙන් ලීලාවතී රැජින ද වැදගත් වූ බව මූලාශ්‍රයගත තොරතුරු විමසීමේදී පැහැදිලි වේ.

සහස්සමල්ල රජුට වසර දෙකකට වඩා බලය පවත්වා ගැනීමට නොහැකි වූ අතර එහිදී ආයස්මන්ත සෙනෙවියා විසින් ඔහුව බලයෙන් ඉවත් කර නිශ්ශංකමල්ල රජුගේ අගමෙහෙසියවූ කල්‍යාණවතී දේවියව බලයට පත් කර ඇත. ඇය ලවා ධර්ම නීතියෙන් සය අවුරුද්දක් රාජ්‍ය කර වූ බව මහාවංසයේ සඳහන් ය.

***'.....කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල මහරජාණන් අගමෙහෙසුන් වූ කල්‍යාණවතී නම් බිසවුන් ලවා ධර්මනීතියෙන් සහවුරුද්දක් රාජ්‍ය කරවී.....'***

(ම.වං.,80:34,35)

ඇය ධර්ම නීතියෙන් රාජ්‍ය කළ බව සඳහන්වීමෙන් මනාව පැහැදිලි වන්නේ එතෙක් පැවති ස්ථාවර දේශපාලන වාතාවරණය තරමක් දුරට හෝ ස්ථාවර බවකට පත් කිරීමට හැකියාව හිමි වූ බව පෙනේ.

ලීලාවතී රැජිනගෙන් අනතුරුව ඔක්කාක වංශයෙන් ආ රජෙක් නව අවුරුද්දක් රාජ්‍යය කළ බවත් පසුව එලළුඅභා සෙනෙවි රජු රාජ්ජය ගෙන නිශ්ශංක රජුගේ බිසව ලවා සාවුරුද්දක් රාජ්‍යය කළ බවත් තවදුරටත් රාජාවලියේ සඳහන් ය (රාජාවලිය, 1997:211,212). මූලාශ්‍රයගත කරුණුවලට අනුව රාජකීය කාන්තාවට රාජ්‍ය පාලන කටයුතුවල නිරතවීමට අවශ්‍ය පසුබිම පොළොන්නරු අවධිය වනවිටදී සකස්ව තිබූ බව ඇය රාජත්වයට පත් කිරීමෙන් දැඩි විරෝධතාවයක් එල්ල නොවීමෙන් මනාව ගම්‍ය වේ.

කල්‍යාණවතී රැජින ඇයගේ පාලන කාලය තුළ දී ආගමික කටයුතුවල ද යෙදුණ බව මහාවංසය තුළින් හෙළිකරගත හැකිය. ඒ කෙසේදයත් ඇය විහාරාරාම ඉදිකොට ඒවාට වස්තුව පරිත්‍යාග කළ බව හෙළිවීම එහිලා දැක්වීමට පුළුවන.

***'පණිශාලක නම් ගමෙහි සිය නමින් වෙහෙරක් කරවා ඊට ගම් නතු කිරීමෙන් ගම්කෙත් පිරිකර මෙහෙකරුවන් හා උයන් ආදිය ද දුන්නීය'*** (ම.වං.,80:35-37)

තවද කල්‍යාණවතී බිසව විසින් සිය නිලධාරීන් පාලන කටයුතුවලදී තමාට අවශ්‍ය පරිදි හසුරුවන ලද බව ආයස්මන්ත සෙනෙවියා ද දේව නම් අධිකාරිවරයා ද වල්ලිගාමයට යවා එහි විහාරයක් කරවා ඇති බව ද මහාවංසයේ සඳහන්වීමෙන් ගම්‍ය වේ.

***'ඒ බිසව අනුමතියෙන් ........වල්ලි නම් ගම් යවා එහි මනෝහර වූ විහාරයක් කරවා මහ සඟහට දිවීය'***

(ම.වං.,80:37-39)

ඒ අනුව ශාසනික වශයෙන් ද තමාට රිසි පරිද්දෙන් රාජ්‍යය තුළ කටයුතු සිදුකරලීමේ අවකාශය රාජකීය කාන්තාවක් වශයෙන් ඇයට හිමිව තිබූ බව මින් මනාව ගම්‍ය වේ. ඒ හැරුණුකොට සමාජය තුළ

ආර්ථිකය ඉතා වැදගත් අංශයකි. ඒ පිළිබඳව මනා අවබෝධයක් ඇයට පැවති බව ඇය විසින් සිය සය වසරක රාජ්‍ය පාලන කාලය තුළ දී දැදුරු ඔය ආශ්‍රිතව ඉදිකරන ලද බතලේගොඩ වැවේ බිඳී ගිය ස්ථාන අළුත්වැඩියා කරන ලද බව සෙල්ලිපියක සඳහන්වීමෙන් පැහැදිලි වේ.

***"...... බදලගොඩ නැමැති මගලපුරෙස්වර .. .. ාධිකාරි මක .. .. .. චූඩාමණි තෙමැ මෙ .. .. වැව තුන් කඩෙකින් කඩා හැලිසොරො සුන් (බුන්)වැ නොපවත්(වැ) තිබූ කල්හි සෙ බ .. .. හැලිසොරො ලවා පවත්වා පෙරමැ දෙවැනි සොරොව්වක් නැති හෙයින් ......"***

(E.Z., Vol:iv, 1943:105)

ක්‍රම ක්‍රමයෙන් පොළොන්නරු රාජධානිය පරිහානිය කරා ගමන් කරන්නට වූ හෙයින් වාරි නිර්මාණයන් ද හීන වන්නට විය. කෙසේවුවත් කල්‍යාණවතී රැජිනගෙන් අනතුරුව වාරි කර්මාන්තය සම්බන්ධයෙන් ප්‍රතිසංස්කරණයක් පිළිබඳව හෙළිවන්නේ දෙවන විජයබාහු රාජ්‍ය අවධියේ ය. ඒ අනුව අනුමාන කළ හැකි වන්නේ කල්‍යාණවතී රැජින කෙටි කලත් පාලන කටයුතු මෙහෙය වුවද එවක සමාජය තුළ පැවති අවශ්‍යතා පරිපූර්ණ කිරීම උදෙසා කටයුතු කරන්නට ඇති බවත් ඒ උදෙසා අවශ්‍ය අවස්ථාව හිමිව පවතින්නට ඇති බවත් ය.

එපමණක් නොව කල්‍යාණවතී රැජින රාජ්‍ය පාලන කටයුතුවල ප්‍රධානියා ලෙස පාලන කටයුතු මෙහෙයවා ඇත්තේ නාමිකව පමණක් බව ඇතැම් අවස්ථාවලින් පෙනී ගිය ද ඇය විසින් ආගමික මෙන්ම සමාජ, ආර්ථික අංශවල සිදුකරන ලද මෙහෙවර පිළිබඳව විමසීමේදී ඇයට ද කිසියම් වූ බලවත් බවක් රාජ්‍යය තුළ හිමිව තිබෙන්නට ඇති බව කරුණු විමසීමේදී පැහැදිලි වේ. ඊට අමතරව ආයස්මන්ත සෙනෙවියා විසින් මාස තුනක් වයසැති බිළිදෙකු බලයට පත් කිරීමට කටයුතු කිරීමේදී කල්‍යාණවතී රැජිනට පක්ෂපාතීව සිටි පිරිසකගේ විරෝධතාවය එල්ල වන්නට ඇති බව අනුමාන කිරීමට පුළුවන.

කෙසේවුවත් කල්‍යාණවතී බිසවගෙන් අනතුරුව පොළොන්නරු රාජධානියේ පාලන කටයුතු නැවත වරක් මෙහෙය වන ලද රැජිනක් වශයෙන් ලීලාවතී රැජින සඳහන් කළ හැකිය. ලීලාවතී රැජිනව මෙලෙස තෙවරක් රාජත්වයට පත් කරන්නට ඇත්තේ හුදෙක්ම ඇය රාජකීය වශයෙන් ඒ වන විටත් බලවත් ස්ථානයක් හිමි කරගෙන සිටි නිසා බව අනුමාන කිරීමට පුළුවන.

**නිගමනය**

අනුරාධපුර යුගයේ රාජ්‍ය පාලන කටයුතු කෙරෙහි රාජකීය කාන්තාවගේ දායකත්වයේ ස්වරූපය පොළොන්නරු යුගය වන විටදී යම් යම් අවස්ථාවලදී වෙනස් වූ බවට කරුණු මූලාශ්‍රය අධ්‍යයනය ඔස්සේ විද්‍යමාන වේ. එනම්, අනුරාධපුර යුගය ගත් කල්හි එහිදී රාජකීය කාන්තාවන් ඇතැම් අවස්ථාවල සිය ස්වාමියන් ආරක්ෂා කිරීමේ අභිප්‍රායෙන් කටයුතු කළ බවත් තවත් විටකදී කාමාශාව පදනම් කරගනිමින් වෙනත් පුද්ගලයන් රාජ්‍ය පාලන කටයුතු උදෙසා පත් කරලීමේ හැකියාව පැවති බවත් මෙන්ම දේශපාලන වශයෙන් රාජත්වයට පත් වීම සහ පාලන කටයුතුවලදී අවශ්‍ය උපදේශකත්වය ලබාදීමේ හැකියාව මනා අයුරින් පැවති බව මූලාශ්‍රයවලින් පැහැදිලි වේ.

පොළොන්නරු යුගයේදී පැවති දේශපාලන අස්ථාවරභාවය හේතුවෙන් දේශපාලන කටයුතු කෙරෙහි රාජකීය කාන්තාව සම්බන්ධ වූ බව මෙන්ම අනුරාධපුර යුගයේ රාජකීය කතුන්ට වඩා රාජ්‍ය පාලන කටයුතු කෙරෙහි කිසියම් බලවත් බවක් පොළොන්නරු යුගයේ කතුන්ට හිමි වූ බව හෙළිකරගැනීමට

පුළුවන. එමෙන්ම අනුරාධපුර යුගයේදී මෙන් නොව පොළොන්නරු යුගයේදී රාජකීය කාන්තාවගෙන් ශාසනික, ආර්ථික ආදී වශයෙන් ඇතැම් අවස්ථාවලදී මෙහෙයක් සිදු වූ බවට ද කරුණු දැකගත හැකිය.

කෙසේවුවත් අනුරාධපුර යුගය ආරම්භයේ සිටම ක්ෂත්‍රිය කුමරියකගේ අවශ්‍යතාව රජුන් සතු වූ බවත් රාජකීය කතුන් පාලන කටයුතුවල දී වැදගත් තැනක් හිමි කරගත් බවත් අනුරාධපුර යුගයේ රාජකීය කතුන්ගේ දායකත්වය පොළොන්නරු යුගයේදී සෙනෙවිවරුන්ගේ බලවත්වීම හා ඇතැම් අවස්ථාවල ප්‍රබල පාලකයෙක් නොමැතිවීම නිසා පැවති වාතාවරණය අනුව බලයට පත් වූ බවත් අනුරාධපුර යුගයට වඩා පොළොන්නරු යුගයේදී රාජකීය කාන්තාවන්ගෙන් සැලකිය යුතු සේවයක් රාජ්‍ය පාලනයේදී සිදු වූ බවත් රජරට යුගයන්හිදී රාජකීය කාන්තාව රාජ්‍ය පාලන කටයුතුවලදී අඩු වැඩි වශයෙන් දායකත්වය ලබාදෙන ලද බවත් අනාවරණය කරගැනීමට හැකි විය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


- ***දීපවංසය*** (1959), ඤාණවිමල හිමි, කිරිඇල්ලේ (සංස්:), සීමාසහිත ඇම්.ඩී.ගුණසේන සහ සමාගම.
- ***නිකාය සංග්‍රහය*** (2001), නානායක්කාර, ගුණවර්ධන (සංස්:), ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.
- ***පූජාවලිය*** (1986), ඤාණවිමල හිමි, කිරිඇල්ලේ (සංස්:), සීමාසහිත ඇම්.ඩී.ගුණසේන සහ සමාගම, කොළඹ 11.
- ***මහාවංසය*** (2006), ශ්‍රී සුමංගල හිමි සහ බටුවන්තුඩාවේ දේවරක්ෂිත පඬිතුමා (සංස්:), එස්.ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.
- ***රාජාවලිය*** (1997), සුරවීර, ඒ.වී. (සංස්:), අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.
- ***වංසත්ථප්පකාසිනිය*** (2001), අමරවංස නාහිමි, අකුරටියේ සහ දිසානායක, හේමචන්ද්‍ර (පරි.), ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.
- ***සිංහල ධාතුවංසය*** (2012), විජේරත්න, විමල් එම්.ඩබ්ලිව්. (සංස්:), සීමාසහිත ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.
- ***සීහළවත්ථුප්පකරණය*** (2006), බුද්ධදත්ත හිමි, පොල්වත්තේ (සංස්:), බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.
- ***Epigraphia Zeylanica Vol. vi*** (1943), Paranavitana, S., The Government of Ceylon.
- ආටිගල සහ වෙනත් අය (1972), ***ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය - i කාණ්ඩය, ද්විතීය භාගය***, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ආයතනය.
- ජයසිංහ, අයි.ඩී. (1966), ***දසබෑ රජුන් ගෝඨාභයට විරුද්ධව නැඟී සිටියේ ගෝඨාභය චණ්ඩාල බිසවක් විවාහ කරගැනීම නිසාද?***, ඉතිහාසය සඟරාව - 1 කලාපය.
- පියනන්ද හිමි, දික්වෙල (1974), ***විහාරමහාදේවි***, විදුලකර.
- ලියනගමගේ, අමරදාස සහ ගුණවර්ධන, රණවීර (1965), ***අනුරාධපුර යුගය***, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලය.

# Financial Literacy and Retirement Planning; Based On Wewala West GN Division, Sri Lanka

P.G.T.N Perera[1]


## Abstract

In present society several severe troubles which arise due to the lack of financial literacy and specially issues regarding retirement life confidence are observed. A very few out of the Sri Lankan population have retirement plans while a majority have a blank idea about it. Several factors can be identified which determine this difference of numbers. According to the previous studies in many countries, financial literacy rate is a considerable factor among other factors which decide whether an individual has a retirement plan or not. Research problem of this study is to check whether financial literacy rate is a significant factor which determines owning a retirement plan in the Sri Lankan context. In addition, specific objectives of this study are constructing indices for financial literacy and retirement life confidence, identifying the basic demographic factors affecting the financial literacy and retirement life confidence. A sample of 300 households from Wewala West GN division of Colombo District is selected for this research using simple random sampling technique. Structured questionnaire was used to gather data which contained basically 3 parts. Indices for financial literacy rate and retirement life confidence are constructed using weighted average method. With the use of these index values, people are categorized into two categories as high and low using the median value of each index. It was identified some factors including education level and age have a significant impact on the financial literacy rate but the race does not have a significantly effect. As well as there are some factors including monthly income, education level and ownership of the house which are significantly effect to retirement life confidence while gender, marital status, race, number of dependents and sector of job does not have a significant effect on retirement life confidence. Finally, it can be concluded that if someone has good financial literacy rate, such respondents tend to choose a retirement plan. Thus there is a relationship between financial literacy rate and having a retirement planning.


***Key words:*** *Financial literacy, Retirement life confidence, Retirement planning, Sri Lanka*

## Introduction

Financial literacy possesses the skills and knowledge on financial matters to confidently take an effective action that best fulfills an individual's personal, family and global community goals

[1] University of Moratuwa, tharakanuwanthi@gmail.com

(Financial educators' council, 2018). Financial literacy is a combination of awareness, knowledge, skills, attitudes and behavior necessary to make sound financial decisions and ultimately achieve individual financial well-being (Akinson & Messy, 2012). According to most of researches financial literacy can be identifying as combination of financial knowledge, financial behavior and financial attitudes.

Financial knowledge is some basic knowledge of key financial functions such as division, interest rate, compound interest, time value of money, risk and return, inflation, diversification etc. of financially literate person. Is the capability how to manage the money in different usage, including the monitoring of day to day financial matters in the market and make the right choices for "financial literate" people's needs. (Akinson & Messy, 2012).

Financial behavior can be defined as any human behavior that is relevant to money management. Common financial behaviors include cash, credit and saving behavior (IGI Global, 2018a). The way in which a person behaves will have a significant impact on their financial literacy.

Individual characteristics that take the form of tendencies towards a financial practice or action is known as financial attitudes. It shows the inclination or likelihood of a person to undertake a behavior (IGI Global, 2018b). Attitudes and preferences are considered to be an important element of financial literacy.

Retirement planning is the process of determining retirement income goals and the actions and decisions necessary to achieve those goals. Retirement planning includes identifying sources of income, estimating expenses, implementing a savings program and managing assets. Future cash flows are estimated to determine if the retirement income goal will be achieved (Investopedia, 2018).

Financial decision making is an integral part of daily life of people. Most of financial decisions are made as own decision without advise of financial specialists. Ability of financial decision making and also accuracy of those decisions are depending on financial literacy (Meir, Mugerman & Sade, 2016). The lack of financial literacy may lead to making poor financial choices that can have negative consequences on the financial well-being of an individual. Retirement planning is very important part of today world because of the rapidly increasing age problem of developing countries. Normally retirement plan is the planning one does to be ready for life after paid finishing the jobs, not just financially but in all aspects of life (Clark, Lusardi & Mitchell, 2015).

There are some troubles with lack of financial literacy and also aging problem in Sri Lanka as a developing country. Certain numbers of people have retirement plans while considerable amount of people haven't. There may be some factors affecting to difference of this amounts. As the previous literature in many countries, financial literacy rate is a considerable factor among other factors which affect to the having retirement plan. So it is important to check financial literacy rate is affected to the having a retirement plan in Sri Lankan context.

**Objectives of the study**

The main objective of this study is to identify whether there is a relationship between financial literacy and retirement plan.

Specific objectives are;

- Constructing index for financial literacy
- Identify the basic demographic factors affecting to financial literacy
- Constructing index for retirement life confidence
- Identify the basic demographic factors affecting to retirement life confidence.

**Literature Review**

According to the research done by Clark and his team in 2015, employees who completed an educational module were more likely to start contributing and less likely to have stopped contributing to the retirement plan (Clark, Lusardi & Mitchell, 2015). As the study of Lusardi and Mitchell in 2005, shows that financial illiteracy is widespread among older Americans. They also evaluate whether people tried to figure out how much they need to save for retirement and those calculations prove to be difficult: fewer than one-third of age50+ respondents ever tried to devise a retirement plan, and only two-thirds of those who tried actually claim to have succeeded in USA (Lusardi & Mitchell, 2005). In 2016 Mier and group done a research in Israel and that research findings indicate that the activities of searching for financial information and monitoring household expenses are positively correlated with retirement literacy, even after controlling for various demographic and behavioral variables. They conclude that no significant correlation was found between retirement literacy and financial knowledge when controlling for other variables. Financial literacy regarding retirement savings increases with an individual's tendency to meticulously check bills and periodic account statements, while financial expertise does not necessarily translate into higher levels of retirement literacy (Meir, Mugerman & Sade, 2016). Regarding to results of the Castro's study in 2014 most people seem to be unprepared to take charge of financial decisions and retirement. The results suggest a lack

of knowledge in financial and retirement planning, although respondents answered they look for information regarding financial and retirement matters (Castro-Gonzalez, 2014). In 2016 a paper done by Aubram and team analyzes the impacts of financial literacy on the investment and pension planning behavior in Austria and Switzerland. According to their study a higher financial literacy has a clear positive impact on the level of pension planning, whereas the effect of the self-assessed financial literacy is stronger than the impact of the factual one (Aubram, Simcek & Wanzenried, 2016).

## Methodology

This part basically discusses the tools used to gather the relevant data and also analyzing method which used to achieve the objectives of the research.

### Research Population and data collecting method

This study selected Wewala west GN division as the study area because it is one of unique GN division which represents all the demographic factors considered. There are 1442 number of households in the Wewala West GN division which is selected area for this study. Among those 1442 Number of households for this study was selected 300 people from 300 different households as the sample. Simple random sampling method is used for this study. Although, mathematically 20.8% of proportion was selected it can be justified in the sense of time and cost limitations.

Researcher only used primary data for research purposes. Primary data were collected through structured questionnaire which designed as three main parts. 300 questionnaires were distributed and 216 respondents were given back them. Questionnaire used for this research were based on OECD core questionnaire on financial literacy and also questionnaire of Aubram and team that use for their research on financial literacy and retirement planning. Questionnaire which used here comprises basically 3 parts as demographic data, financial literacy data and retirement planning data

### Measuring variables

Demographic data were collected so as to get an idea about sample and also to find the relationship between financial literacy and retirement planning with respect to demographic data. All the demographic data were categorical and there hasn't been used any method as measurements for those data. In the second part of the questionnaire, this study tries to collect data about financial literacy and there may use some scores to get a weighted value for a

component named Financial literacy. For that purpose, here the researcher used 15 variables under three sub categories.

**Data analysis method**

This study is mainly used validity analysis, frequency analysis, factor analysis, weighted average, chi square test and also logistic regression as the tools of analysis.


**Data presenting and analysis**

After collecting relevant data study has used response rate and reliability analysis as a unique measurement to measure the validity of the gathered data. According to first time responses response rate which equals to 72% is more than 50%. So the study concludes that validity of questionnaire method is appropriate for further analysis. Reliability analysis refers to the fact that a scale should consistently reflect the construct it is measuring. Standardized Cronbach's $\alpha$ is a coefficient should be with in 1 and 0 and here these value becomes 0.729. According to Field (2009), it is acceptable for further analysis.

**Demographic features of the sample**


According to the gathered data one can identify different demographic features in the sample. They are briefly identified as in below.

**Figure 1: Demographic features (I) of the sample**




According to the figures mentioned above there are 107 male and 109 female in the sample and among them 8 were single and 208 were married respondents. In the aspect of race there were 206 number of Sinhalese, 4 Tamil people, 2 Muslims and 4 others.


**Figure 2: Demographic features of the sample**




Then considering the household's monthly income there are 19 respondents who have less than Rs. 30,000 incomes per month. 72 have Rs. 30,000 to 75,000 monthly income and 88 of respondents have Rs. 75,000 to 100,000 of it. Other 37 respondents give monthly household income as more than Rs. 100,000.


When we consider the level of education of the sample; 20 of them mentioned maximum level of education is O/L, 76 of respondents educated up to A/L. 92 respondents have diploma level education and 17 of respondents are graduates. Other 11 respondents have Post graduate level educational qualification.

**Figure 3: Demographic features of the sample**




Then considering the number of dependents in the households, there are no any households with more than 6 dependents. There are 107 households with 1 to 2 dependents, 89 households with 3 to 4 dependents and other 20 households with 5 to 6 households. When considering the sector of job of each respondent, there are 52 government sector job owners, 103 private sector job owners, 21 number of semi government employees and 40 other respondents engaged with self-employee.

**Figure 4: Demographic features of the sample**




Next considering the age group of the sample there are 98 respondents who belong to 21 to 35 age group, 61 respondents who belong to 36 to 50 age group, 39 respondents belongs to 51 to 60 age group and 18 respondents belong to more than 60 age group.

Considering the ownership of the house, there are 125 households that they live in their own house and other 91 respondents live in rental house. As well as considering the ownership of motor vehicle 72 respondents have motor vehicle while other 144 respondents haven't motor vehicle.

**4. Measurements of the variables**

In the financial knowledge category, questionnaire used 8 questions to check financial knowledge about division, time value of money, interest, interest + principle, compound interest, inflation and diversification. In the category of financial behavior, questionnaire includes 4 questions to get idea about financial behavior such as considering purchase, timely bill payment, financial affairs and long term financial goals. In these two sub sections, if the respondent gives correct answer study has given value 1 and otherwise value 0. Attitudes are considered as another important part of financial literacy. If a person has rather negative attitudes towards savings and if people have only short term financial goals they haven't positive financial attitudes. In the sub section of financial attitudes, questionnaire includes 3 lickert scale questions. Then study has given value 1 for the expected answer and otherwise value 0 for measuring purposes. This study has been counted the number of correct responses given by each respondent separately for three sub sections. Then construct the index for whole financial literacy by using weighted average method. Weight for each component is defined according to the component score coefficient matrix result of confirmatory factor analysis.

Accordingly calculate the weighted average of financial literacy rate for each respondent as follows.

$$\bar{X}_w = \frac{(0.405X_{1i}+0.373X_{2i}+0.407X_{3i})}{(0.405+0.373+0.407)}$$

Where, $X_{1i}$: financial knowledge score of $i^{th}$ person.

$X_{2i}$: financial behavior score of $i^{th}$ person.

$X_{3i}$: financial attitude score of $i^{th}$ person.

Calculated financial literacy index is between 0 - 5.02 and then categorized values of index as high financial literate person and low financial literate person according to the median value of financial literacy index which is equals to 3.506. So if someone has financial knowledge index more than 3.506 that person includes to high financial literate person and otherwise low financial literate person.

Last part of the questionnaire tries to capture the data about retirement planning. Basically use the dualistic question to get idea about retirement planning. Then there include few questions to gather more data about the type of retirement planning and also data about confidence level of retirement life. Then construct the index for retirement life confidence by using weighted average method. Weight for each component is defined according to the component score coefficient matrix result of confirmatory factor analysis. Accordingly retirement life confidence index has calculated as follows;

$$\bar{X}_w = \frac{(0.185X_{1i}+0.207X_{2i}+0.195X_{3i}+0.192\,X_{4i}+0.154X_{5i}+0.208\,X_{6i})}{(0.185+0.207+0.195+0.192+0.154+0.208)}$$

Where, $X_{ij}$: $j^{th}$ component score of $i^{th}$ person.

According to weighted average calculated above, retirement life confidence index is between 0 - 1. Then categorized values of index are put into two categories as high retirement confidence person and low retirement confidence person according to the median value of retirement confidence index which is equals to 0.54.

**Identifying the basic demographic factors affecting to financial literacy and retirement life confidence**

This study tries to test some hypotheses to check whether there is a significant affection to financial literacy rate from considering demographic factors using Chi squared test.

**Table 1: Identify factors affecting to financial literacy**

| Null Hypothesis | Chi square value | Sig. value | Decision |
|---|---|---|---|
| $H_{01}$ : There is no relationship between gender and financial literacy rate. | 6.686 | 0.010 | $H_{01}$ is rejected. |
| $H_{02}$ : There is no relationship between race and financial literacy rate. | 2.078 | 0.556 | $H_{02}$ is accepted. |
| $H_{03}$ : There is no relationship between household's monthly income and financial literacy rate. | 36.805 | 0.000 | $H_{03}$ is rejected. |
| $H_{04}$ : There is no relationship between education level and financial literacy rate. | 60.131 | 0.000 | $H_{04}$ is rejected. |
| $H_{05}$ : There is no relationship between sector of the job and financial literacy rate. | 15.308 | 0.002 | $H_{05}$ is rejected. |
| $H_{06}$ : There is no relationship between age and financial literacy rate. | 44.592 | 0.000 | $H_{06}$ is rejected. |

According to the results shown in table 4, gender, household's monthly income, education level, sector of job and age category are significantly affecting factor for the financial literacy rate while race is not significantly affect to financial literacy rate. Education level and age are the most important factors among the affected factors.

This study tries to test some hypotheses to check whether there is a significant affection to retirement life confidence from considering demographic factors using Chi squared test.

**Table 2: Identifying basic demographic factors affecting to retirement confidence.**

| Null Hypothesis | Chi square value | Sig. value | Decision |
|---|---|---|---|
| $H_{07}$ : There is no relationship between gender and retirement life confidence. | 0.549 | 0.459 | $H_{07}$ is accepted. |

| | | | | |
|---|---|---|---|---|
| $H_{08}$ : | There is no relationship between marital status and retirement life confidence. | 0.599 | 0.439 | $H_{08}$ is accepted. |
| $H_{09}$ : | There is no relationship between race and retirement life confidence. | 3.930 | 0.269 | $H_{09}$ is accepted. |
| $H_{010}$ : | There is no relationship between household's monthly income and retirement life confidence. | 34.682 | 0.000 | $H_{010}$ is rejected. |
| $H_{011}$ : | There is no relationship between education level and retirement life confidence. | 26.026 | 0.000 | $H_{011}$ is rejected. |
| $H_{012}$ : | There is no relationship between number of dependents and retirement life confidence. | 0.156 | 0.925 | $H_{012}$ is accepted. |
| $H_{013}$: | There is no relationship between sector of the job and retirement life confidence. | 3.409 | 0.333 | $H_{013}$ is accepted. |
| $H_{014}$ : | There is no relationship between age and retirement life confidence. | 13.981 | 0.003 | $H_{014}$ is rejected. |
| $H_{015}$ : | There is no relationship between ownership of house and retirement life confidence. | 24.361 | 0.000 | $H_{015}$ is rejected. |
| $H_{016}$ : | There is no relationship between ownership of motor vehicle and retirement life confidence. | 3.971 | 0.046 | $H_{016}$ is rejected. |
| $H_{017}$ : | There is no relationship between financial literacy rate and retirement life confidence. | 17.868 | 0.000 | $H_{017}$ is rejected. |

According to the results shown in table 2, household's monthly income, education level, age, ownership of house and ownership of motor vehicle categories are significantly affecting factor for the retirement life confidence while gender, marital status, race, number of dependents and the sector of job are not significantly affected to the retirement life confidence. Monthly income, education level and ownership of the house are the most important factors among the affected factors.

**Relationship between financial literacy and retirement plan**

The study can summarize the data about retirement planning and as; 101 respondents have retirement plan before get retired is a considerable event. Considering with today's aging problem, it's a positive characteristic of the sample. So as to fulfill the main objective of this study we have to check whether there is a relationship between financial literacy rate and retirement planning and also if there is a relationship, measure the size of effect too.

**Table 3: Identifying relationship between financial literacy rate and retirement planning.**

| Null Hypothesis | | Chi square value | Sig. value | Decision |
|---|---|---|---|---|
| $H_{018}$ : | There is no relationship between financial literacy rate and having retirement planning. | 9.838 | 0.002 | $H_{018}$ is rejected. |

According to the result shown in table 3 there is a relationship between financial literacy rate and having retirement plan. After identified there is a relationship, study has done the logistic regression analysis as follows to measure the effect of relationship. Logistic regression is the appropriate regression analysis to conduct when the dependent variable is binary. In this case, having retirement plan before they get retired consider as the dependent variable which coded "1" for having retirement plan and "0" for haven't retirement plan. Independent variable is also binary variable which coded "1" for high financial literate person and "0" low financial literate person. Accordingly estimated logistic regression function as follows;

$$P(Y) = \left(\frac{1}{1+ e^{-(-0.571+0.869X_1)}}\right)$$

Here, P(Y): Probability of having or not having retirement plan.

$\beta_0$: Constant term

$\beta_1$: Slope

$X_1$: Financial literacy level

Also one can get the log value of this model as;

$$\log\left(\frac{P}{1-p}\right) = -0.567 + 0.869X$$

These estimates tell about the relationship between the independent variables and the dependent variable, where the dependent variable is on the logit scale. As an example the first respondent of this sample is high financial literate person and that respondents' probability of having retirement plan is 0.57 which is greater than cut point 0.5. So there is high probability to having retirement plan. When concerning the odd ratios, log-odds units' coefficients are often difficult to interpret, so they are converted into odds ratios. By looking at the "Exp($\beta$)" value it can understand odd ratios. Accordingly, coefficient for financial literacy = 2.385 which is interpreted as **the expected change in log odds for a one-unit increase in the financial literacy rate**. In other simple words, one respondent having retirement plan, when he belongs to higher financial literate category is 2.385 times higher than lower financial literate person.

Then one can question about the goodness of fit of this model. Here Nagelkerke R square value is greater than 0.5 which indicates the model is good for using interpret purposes. Also it proves by the results of Omnibus test.

## 5. Conclusions and discussion

According to the first objective this study constructed index for financial literacy and financial literacy index is between 0 - 5.02. Then categorized values of index as high financial literate person and low financial literate person according to the median value of financial literacy index which is equals to 3.506. So the researcher can conclude that, if someone has financial knowledge index more than 3.506 that person includes into high financial literate person and otherwise low financial literate person.

According to the second objective identified the basic demographic factors affecting to financial literacy. This study finds that gender, household's monthly income, education level, sector of job and age category are significantly affecting factor for the financial literacy rate while race is not significantly affect to financial literacy rate. Education level and age are the most important factors among the affected factors.

To achieve the third objective, this study constructed index for retirement life confidence which is between 0 - 1. Then this study has categorized values of index as retirement confidence person and low retirement confidence person according to the median value of retirement confidence index which is equals to 0.54. So the researcher can conclude that, if someone has retirement confidence index more than 0.54 that person includes into retirement confidence person and otherwise low retirement confidence person.

Then for achieving fourth objective, this study identified the basic demographic factors affecting to retirement life confidence. So, household's monthly income, education level, age, ownership of house and ownership of motor vehicle categories are significantly affecting factor for the retirement life confidence while gender, marital status, race, number of dependents and sector of job are not significantly affect to retirement life confidence. Monthly income, education level and ownership of the house are the most important factors among the affected factors. And also we can identify there is a relationship between financial literacy rate and retirement life confidence.

## Conclusion

As the final conclusion this study identifies that if someone has good financial literacy rate, that respondent tends to be chosen a retirement plan also. So there is a relationship between financial literacy rate and having retirement plan.

Further research can be done on this topic with the large number of respondents than this sample size and also for more than one GN division get generalized results. If it could conduct more in depth interviews with relevant responsible persons in financial literacy and retirement planning field study can identify invisible dimensions.

## Reference


Akinson, A. & Messy, F. (2012). Measuring financial literacy: Results of the OECD / International network on financial education Pilot study. *OECD Working papers on Finance, Insurance and private pensions, No 15.* http://dx.doi.org/10.1787/5k9csfs90fr4-en

Castro-Gonzalez, K. C. (2014). Financial literacy and retirement planning: evidence from puerto rico. *Global journal of business research.8(1).* 87-98 Retrieved from https://papers.ssrn.com/sol3/papers.cfm?abstract_id=2323594

Central Bank of Sri Lanka. (2018). Financial Intelligence Unit. Retrieved June 28, 2018 from https://www.cbsl.gov.lk/en/financial-intelligence-unit

Clark,R., Lusardi, A. & Mitchell, O. (2015). Employee financial literacy and retirement plan behavior: A case study. *Working Paper 21461.* Retrieved from http://www.nber.org/papers/w21461

Field, A. (2009). Discovering Statistic sing SPSS. New Delhi: SAGE Publishers.

Financial educators' council. (2018). Financial Literacy Definition. Retrieved June 28, 2018 from https://www.financialeducatorscouncil.org/financial-literacy-definition/

IGI Global. (2018a). *What is Financial Behavior*. Retrieved June 28, 2018 from https://www.igi-global.com/dictionary/financial-education-for-children-and-youth/47372

IGI Global. (2018b). *What is Financial Attitudes*. Retrieved June 28, 2018 from https://www.igi-global.com/dictionary/financial-literacy/58683

Investopedia. (2018). *Retirement planning*. Retrieved June 28, 2018 from https://www.investopedia.com/terms/r/retirement-planning.asp

Lusardi, A. & Mitchell, O. S. (2011). Financial Literacy Planning: Implication for retirement well-being. *NBER Working Paper 17078.* Retrieved from http://www.nber.org/papers/w17078

Meir, A., Mugerman, Y. & Sade, O. (2016). Financial Literacy and Retirement Planning: Evidence from Israel. *Journal of Israel Economic review*, 14(1), 75-95 Retrieved from https://papers.ssrn.com/sol3/papers.cfm?abstract_id=2889925

# දුටුගැමුණු රාජ්‍ය සමයේ ශ්‍රී ලංකාවේ සංගීතය (ක්‍රි.පූ. 161-137)

# The Ethno-Musicological Aspects of Sri Lankan music during the period of King Dutugemunu (161-137 BCE)

චන්දන රුවන් කුමාර[1]


**Abstract**

This research examines the historical background and the significance of Sri Lankan music during the period of King Dutugemunu (161-137 BCE). The literary evidence and the data analysed in the present study is significant because they reveal some important facts with regard to the origin and evolution of Sri Lankan music from the period of Anuradhapura. The evidence found from the particular period is diminished for a period, perhaps a century or more, and the causes of its disappearance can be evolved at various dimensions one of which is the diverse indological perspective of analysing and arguing the data, attempting to assum the Indian inspiration. 20th Century Sri Lankan studies attempt to pursue the studies on Sri Lankan origin in which the present study scets the authentic characteristics of Sri Lankan music during the relevent period. The impact of Buddhism on Sri Lankan Music during several phases of the selected period was necessarily discussed in this research to identify its foreign elements. It can be concluded that the evidence found from the particular period have provided some independent and indegenous characterestics of Sri Lankan music resembles the ideological underlining of foreign inspiration with the passage of time and the need of the society.The present study involved both literature survey and the evidence and elements of the Sri Lankan music that were obtained from the primary sources i.e. Mahavamsa, Culavamsa and other texts, scholarly studies, and an examination of archeological information.


***Key Words:*** *Sri Lankan Music, Historical background, Significance, Impact of Buddhism, Independent Characteristics*

## හැඳින්වීම

ශ්‍රී ලාංකේය සංගීතයෙහි ආරම්භය, විකාසනය හා ස්වාධීන ලක්ෂණ පිළිබඳ සිදුකෙරී ඇති පර්යේෂණ විරල ය. ඒ පිළිබඳව පර්යේෂණ සිදු කළ පර්යේෂකයින්ගේ වාර්තාවලින් ද අදාළ ක්ෂේත්‍රය පිළිබඳ පුළුල් විමර්ශනයක් සිදු වී නොමැත. ශ්‍රී ලාංකේය සංගීතයෙහි ස්වාධීන ලක්ෂණ පිළිබඳ

[1] B.A (Kelaniya), M.A (Delhi), MPhil (Kelaniya) දෘශ්‍ය කලා හා සැලසුම්කරණ සහ ප්‍රාසංගික කලා ඒකකය, ලලිත කලා අධ්‍යයනාංශය කැලණිය විශ්වවිද්‍යාලය ruwankumarac@gmail.com

පර්යේෂකයින්ගේ අවධානය අවම වශයෙන් යොමුවී තිබීම නිසා ලංකාවේ සංගීතය ඉන්දියානු සංගීතයෙන් පෝෂණය වී ඇතැයි යන නිගමනයට එළඹී තිබෙනු දක්නට ලැබේ. කෙසේවෙතත් දේශීය පරිසරයට අනුකූලව වැඩුණු සමාජ - සංස්කෘතික පසුබිමක විකාසනය වෙමින් බෞද්ධ මුහුණුවරකින් පුනර්ජීවනයක් ලබා උත්කර්ෂයට නැංවුණු ස්වාධීන ලක්ෂණ සහිත සංගීත පද්ධතියක් පිළිබඳ සාධක දුටුගැමුණු යුගය ආශ්‍රයෙන් හඳුනාගැනීම මෙම අධ්‍යයනයේදී සිදු කෙරේ. ශ්‍රී ලංකාවට අනන්‍ය වූ සමාජ-සංස්කෘතික හර පද්ධතියක් හා ඒ මත ස්ථාපිත ස්වාධීනත්වය ඔප් නංවන ලද කලා ප්‍රපංච පිළිබඳ සාධක පැහැදිලි ලෙස දෘශ්‍යමාන කෙරෙන යුගයක් වශයෙන් දුටුගැමුණු රාජ්‍ය සමය (ක්‍රි.පූ. 161-137) හඳුනාගත හැකි ය. එම කාල සීමාව ඓතිහාසික යුගයට අයත් වන බැවින් සාහිත්‍යයික මූලාශ්‍රය සහ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය, මෙම අධ්‍යයනය සඳහා උපස්ථම්භක කර ගනු ලැබේ. ඊට අමතරව පුස්තකාල අධ්‍යයන, සිතියම් අධ්‍යයන, කෞතුකාගාර හා ලේඛනාරක්ෂණ අධ්‍යයන, ක්ෂේත්‍ර ගවේෂණ හා සම්මුඛ සාකච්ඡා යන ක්‍රමවේද දත්ත රැස් කිරීම සඳහා භාවියට ගෙන තිබේ.

## දුටුගැමුණු යුගයේ සංගීතය පිළිබඳ සාහිත්‍යයික මූලාශ්‍රය මගින් හෙළිවන සාධක

අනුරාධපුර යුගයේ මුල් භාගයේ ලියැවෙන මහාවංසයේ දුටුගැමුණු රාජ්‍ය සමයෙහි පැවැති තූර්ය වාද්‍ය වෘන්ද, තූර්ය ඝෝෂා, නර්තන ආදිය පිළිබඳ සාධක රැසක් මහාථූප වන්දනාව හා බැඳි උත්සව පිළිබඳ තොරතුරු මගින් අනාවරණය කරගත හැකිය. දුටුගැමුණු රජු නාටිකාංගනාවන් පිරිවරා සතළිස් දහසක් මිනිසුන් පිරිවරන ලද නානාවිධ තූර්ය නාදයෙන් උපලක්ෂිතව සවස් කාලයේ මහාථූපය පිහිටන ස්ථානයට පැමිණි අයුරු මහාවංසයේ විස්තර කර ඇත.

*'සුමණ්ඩිතාහි නෙකාහි, දෙවකඤ්ඤූපමහි ච*
*නාටකීහි පරිබ්බුළෙහා සුමණ්ඩිත පසාධිතො*
*චත්තාළීස සහස්සෙහි නරෙහි පරිවාරිතො*
*නානා තුරිය සඞඝුටෙඨා දේවරාජ විලාසවා'*[2]

(පරිඃ ඇමැතියන් විසින් රැකවරණය කරන ලද්දා වූ මිහිපති තෙම මොනවට සැරසුණා වූ දේව කන්‍යාවන් හා සමාන වූ නාටිකාවන් විසින් පිරිවරන ලදුව යහපත් සේ සැරසී පිළියෙළ කරන ලද්දේ සතළිස් දහසක් මිනිසුන් විසින් පිරිවරන ලද්දේ නානාවිධ තූර්‍යයන් ඝෝෂණ ශබ්දයෙන් යුක්ත වූයේ සක්දෙව් රජහු විලස් ඇත්තේ...)

නාටිකාංගනාවන් ද සමග නොයෙක් සංගීත භාණ්ඩවලින් සමලංකෘත තූර්ය වාද්‍ය වෘන්ද එකල පැවැති බව ඉහත විස්තරයෙන් ගම්‍යමාන වේ. මහාවංසයට ටීකා සපයන වංසත්ථප්පකාසිනීයෙහි මෙම ගාථාව සඳහා පුළුල් අර්ථ විග්‍රහයක් සිදු කොට ඇත. පංචතූර්ය (පසඟතුරු) යන්න මහාවංසයේ සඳහන් නොවෙතත් ටීකාවෙහි 'පංචතූර්ය' යන්න ඇතුළත් වේ.

[2] ම. ව. 29 පරි. 24-26 ගාථා

> *'තූර්යසංඝුට්ඨෝ යනු, බෙර හඬ පතුරුවා, පසඟතුරුඝොසින් යුතුව යන අර්ථයි. මෙහි පසඟතුරු නම්ඃ ආතතය, විතතය, ආතතවිතතය, සුසිරය, ඝනය යන පසයි. එහි ආතත නම් සමින් බැඳි බෙර, මිහිඟු බෙර ආදිය අතුරින් එක් - තල තුරු වෙසෙස් ය; විතත නම් දෙතල තුරු වෙසෙස් ය; ආතතවිතත නම් තතින් බැඳි පණා බෙර ආදිය යි; සුසිර නම් වස්කුළල් ආදියයි. ඝන නම් කුළුතාලම් ආදියයි. වයනු ලබන මෙකී පසඟතුරු වෙසෙසින් යුතුව නික්ම යනු අභිප්‍රේතාර්ථය යි.'[3]*

පංචතූර්ය පිළිබඳ මහාවංස ටීකාවේ දැක්වෙන අර්ථකථනය පසුකාලයේ වෙනස් වී ඇති බව පෙනේ. 'ආතතවිතත' වෙනුවට විතතාතත යන්න ද පසුව එක්වූ ව්‍යවහාරයකි. වර්තමානයේ පිළිගැනෙන පරිදි 'ආතත' යනු අතින් පමණක් වයන ගැටබෙරය, දෙවොල් බෙරය වැනි බෙරය.

විතත යන්නෙන් දණ්ඩෙන් (කඩිප්පු) පමණක් වයන තම්මැට්ටම වැනි බෙර හඳුන්වනු ලැබේ. විතතාතත (විතත + ආතත > විතතාතත) යනුවෙන් හඳුන්වන්නේ දණ්ඩෙන් (විතත) සහ අතින් (ආතත) වයන දවුල වැනි බෙර විශේෂයන් ය.)

> *'පඤ්චාංගික තූර්ය :- අතින් වයන, කඩිප්පුවෙන් වයන, ඒදෙකින් ම වයන, පිඹින, ඝසන තූර්ය. (ඝසන තූර්ය නම් කයිතාළම් තහඩුයි)'[4]*

සිංහල බෝධිවංශයේ (ථ. තෙන්නකොන් සංස්කරණය) ගැටපද විවරණයෙහි 'පඤ්චාංගික තූර්ය' විග්‍රහ කොට ඇති ආකාරය ඉහත දැක්වේ. කෙසේවෙතත් ධර්මප්‍රදීපිකාවේ පංචතූර්ය පිළිබඳ විග්‍රහය වංසත්ථප්පකාසිනියෙහි අර්ථ කථනයට සමාන ය.

> *'පඤ්චඞ්ගිකස්ස තුරියස්ස විය යන තන්හි 'පඤ්චාඞගික තූර්‍ය'නම් කවරැ යත්? ආතතයැ, විතතයැ, ආතතවිතතයැ, ශුෂිර යැ, ඝන යැ යන මෙයි. මෙහි 'ආතත' නම් ඒකතල තූර්‍ය යැ, 'විතත' නම් උභයතල තූර්‍ය යැ, 'ආතතවිතත' නම් සර්‍වප්‍රකාරාවනද්ධතූර්‍යයැ, ශුෂිර නම් වංශශඞඛකාහලාදියැ. 'ඝන' නම් ලෝහමයතාලාදියයි. මෙයැ 'පඤ්චාඞගිකතූර්‍ය නමි.'[5]*

පංචතූර්ය වාද්‍යයන්ගේ සම්භවය පිළිබඳ ජනවංසයේ දැක්වෙන අර්ථකථනය මෙසේය.

*'අතංජෙව විතාත - මාතත විතතං ඝණං*
*සුසිරං චේතිතුරියං - පංචාංගික මුදිරිතං*
*අතතං නාම චම්මා - වනද්දේසු බෙරියා දිගු*
*ලෝකේක යුතං - කුම්භ භූත නදද්දරි නාදිනං'[6]*

---

[3] වංසත්ථප්පකාසිනී (සිංහල අනුවාදය), 1994. අකුරටියේ අමරවංස ,හේමචන්ද්‍ර දිසානායක, 41 පිටුව
[4] සි. බෝ. ව. (සංස්.), 1964. ථ. තෙන්නකෝන්, 266 පිටුව
[5] ධර්මප්‍රදීපිකාව (සංස්.), බු. ව. 2511. මැදඋයන්ගොඩ විමලකීර්ති, කඩවැද්දුව සුමඞගල, 361 පිටුව
[6] ජනවංසය (සංස්.), 2012. ගල්වැවේ විමල බත්ති, 91 පිටුව

පරිː අතෝජ්ජ නම් අමාත්‍යය විසින් පළමු ඉපිද වූ තත යයි කියන ලද අතත වූ එකැස් බෙර ද, විතත යයි කියන ලද බෙර දවුල් හා විතාත වූ වෙණ සමග නළා ද, හොරණෑ නම් ලද සුසිර ලො අදිත්ත තත ඝනක ලී දූයි මෙසේ පංචාංගික තූර්‍යනාදයක් ඉපිද වූහ.

දුටුගැමුණු යුගය පිළිබඳ විස්තර කරන මහාවංසයේ අවස්ථා කිහිපයක ම තූර්‍ය වාදන ගැන සඳහන් වේ. එළාර රජුගේ සිරුර ආදාහනය කළ ස්ථානය අසලින් පෙරහැර පවත්වන්නෝ තූර්‍ය වාදනය නොකරති යි මහාවංසයේ දක්වා ඇත.

*'අජ්ජාපි ලංකාපතිනො, තං පදෙස්සම්පගා*
*තෙනෙව පරිහාරෙන, න වාදාපෙන්ති තුරියං'*[7]

(පරිː අද දක්වාත් ලක්දිව්හි රජ දරුවෝ ඒ පෙදෙස සමීප ගත වූවෝ එම පෙරහරින් තූර්‍ය වාදනය නොකරවති)

රජු විසින් රුවන්වැලි සෑ දාගැබ පර්යංකයෙහි සක් පිඹින ශක්‍ර දෙවි, වීණා වයන පංචසිඛ, නාටිකාංගනාවන් සහිත කාළනාග රජු චිත්‍රණය කළ බව මහාවංසය දක්වයි.

*'විජයුත්තරසඞ්ඛන සකෙකා ච අභිසෙකදො'*
*'වීණාහත්‍ථො පඤ්චසිඛො, කාළනාගො සනාටිකො'*[8]

(පරිː අභිෂේකදායක ශක්‍ර ද ජයතුරා සකින් යුක්ත කොට තබනු ලැබීය. වීණා ගත් අත් ඇති පංචසිඛය, නාටිකාවන් සහිත කාළනාග රාජය...)

තවද, නටන දේවතාවෝ සහ තූර්‍ය වයන දේවතාවෝ එහි (දාගැබෙහි) මූර්තිමත් කළ බව සඳහන් වේ.
*'නච්චකා දේවතාචෙව, තුරියවාදක දේවතා'*[9]

(පරිː නටන දේවතාවෝය, තූර්‍ය වාදනය කරන දේවතාවෝය)

මහසෑයෙහි ධාතු නිදානෝත්සවය සඳහා ගැමුණු රජු මහමෙවුනාවට පැමිණෙන අවස්ථාව විස්තර කරන තැන්හි ද 'තූර්‍ය නාද' ගැන සඳහන් වේ.

*'නානාතුරියඝොසෙහි අනෙකෙහි තහිං තහිං*
*හත්‍ථස්සරථසද්දෙහි භිජ්ජනෙත විය භූතලෙ'*[10]

[7] ම. ව. 25 පරි. 74 ගාථාව
[8] ම. ව. 30 පරි. 74-75 ගාථා
[9] ම. ව. 30 පරි. 91 ගාථාව
[10] ම. ව. 31 පරි. 43 ගාථාව

(පරිඃ ඒ ඒ තන්හි නානාවිධ තූර්‍ය ශබ්දයෙන් හා අනේකවිධ හස්ත්‍යශ්ව රථ ශබ්දයෙන් ද පොළෝ තල බිඳිනු ලබන සේ වූ කල්හි...)

ධාතු නිදානෝත්සව අවස්ථාව සංගීතයෙන් හා නර්තනයෙන් උපලක්ෂිත වූ බව මහාවංසයේ දැක්වේ. දිය සහිත සංඛය දරමින් සිටි ශක්‍ර දේවයාත්, වීණා වයමින් සිටි පංචසිඛත්, ප්‍රමුඛ දිව්‍ය සේනාව සාදු ගීතිකා ගයමින් ද, දිව්‍යතූර්ය වයමින් ද සිටි බව එහි දැක්වේ. තිම්බරු දිව්‍ය පුත්‍රයා නෘත්‍ය භූමියක් මවා තූර්ය ඝෝෂා පවත්වමින් සිටි බව ද මහාවංසයේ දැක්වේ.

> *'සඛෙකා සඛඛං තු සොද්දකං' (ශක්‍ර තෙම දිය සහිත සංඛය දැරූයේය); 'වීණං වාදයමානො' ච, අට්ඨාපඤ්චසිඛො තහිං' (පංචසිඛ වීණා වයමින් සිටියේ ය); 'අනේකදේවපුත්තාච සාධුගීතප්පයෝජකා (නොයෙක්දේව පුත්‍රයෝ සාධු ගීතිකා යොදන්නෝ වූහ);'ද්බ්බතූරියානි වජ්ජන්ති දිබ්බ සංගීති වත්තති' (දිව්‍ය තූර්‍යයන් වයනු ලබති, දිව්‍ය සංගීතය ද පවතී); 'රඞගභූමියං මාපයිත්වා තිම්බරුතුරිය ඝෝෂාවා'(ලිම්බරු දෙව් පින් තෙම නෘත්‍ය භූමියක් මවා තූර්‍ය ඝෝෂා ඇතිව සිටියේය.)*[11]

මහාවංසයේ දැක්වෙන තූර්ය නාද, නර්තන වින්‍යාස, බෙරය, වීණාව, ශංක ආදි වාද්‍ය භාණ්ඩ තත්කාලීන සමාජයේ ප්‍රචලිත ව පැවැති බව පෙනේ. මහාවංසය ක්‍රිස්තු වර්ෂයෙන් පස්වැනි සියවසට ආසන්න කාලයේ ලියැවුණු බව පිළිගැනේ. වංසත්ථප්පකාසිනිය හෙවත් මහාවංස ටීකාව ලියැවී ඇත්තේ මහාවංසය ලියැවී වසර සියයකට පමණ පසුව ය. කෙසේවෙතත් මෙම ග්‍රන්ථ දෙකම අනුරාධපුර යුගයේ මුල් භාගයට අයත් වන නිසා ඒවායෙහි දැක්වෙන තොරතුරු අඩු හෝ වැඩි වශයෙන් තත්කාලීන සමාජ - සංස්කෘතික සංදර්භ පිළිබඳ අවබෝධයක් ලබාදීමට සමත්වේ.

## දුටුගැමුණු රාජ්‍ය සමයේ සංගීතය පිළිබඳ පශ්චාත් සාහිත්‍යයික මූලාශ්‍රයෙන් ලැබෙන සාධක

පොළොන්නරුව, කුරුණෑගල, දඹදෙණිය, ගම්පොළ වැනි යුගවල ලියැවෙන සාහිත්‍යයික මූලාශ්‍රයවල දුටුගැමුණු රාජ්‍ය සමය පිළිබඳ සිදුකරන විස්තරයන්හි ද සංගීතය පිළිබඳ සාධක අන්තර්ගත වේ.

දුටුගැමුණු රජතුමා දෙමළුන් හා සටන් කිරීම අරභයා ස්වකීය සේනාව සමඟ පිටත්වන අවස්ථාවේ වාදනය කරවූ සංගීත භාණ්ඩ ලැයිස්තුවක් සිංහල ථූපවංසයේ දක්වා ඇත.

> *'රජ්ජුරුවෝ තුමූ කා බී සැරසී දශමහා යෝධයන් ඇතුළු වූ සේනාව කවා පොවා, පටකඩ, පට්ටෝලි බැඳ, සැරසී සිටි, සේනාවට ප්‍රසාද දී ගැටබෙර, පණා බෙර, එකැස්බෙර, මිහිගු බෙර, මද්දල, පටහ, ලොහොබෙර, යුවළබෙර, මහබෙර, දඳුරුබෙර,*

[11] ම. ව. 31 පරි. 78, 82, 83, 84 ගාථා

> *රෝදබෙර, ගැරඩිබෙර, ඝෝෂ බෙර, තලප්පර, විරන්දම්, තම්මැට්ට, නිසාන, රණරඟඝෝෂ, සමුද්‍රඝෝෂ, අනුක්කත්තුලි, තිඹුලිවු දවුල්, මොරහු, මල්ලරි, සිරිවිලි, තප්පු, තත්සර, ඩැක්කි, උඩැක්කි, මඬල, නාගසර, උච්චභයාංගි, කොම්බු, දළහම්, සකුණවිරිදු, සුරණකාලදම්, දාරා, දළහම්, ලෝහම්, සින්නම්, කින්නර, කයිතාලම්, සමුත්තාලම්, ගී තාලම්, පටහ, ඩමරු, ඩිණ්ඩිමධ්වනි මේ ආදී සියගණන් දහස්ගණන් භෙරජාතීන් ගස්වමින්, සක්සින්නම්, රන්සින්නම්, රුවන්සින්නම්, රන්දාරා, රිදීදාරා, දළහම්, ලෝහම්, ගවරහං, විජයොද්ධ්වනි, ඔත්තු, තන්තිරි පටසිරි, මෙ කී කෝලාහලයෙන් කෙළිනා මෙන්...'*[12]

සද්ධර්මාලංකාරයේ 14 වැනි පරිච්ඡේදයේ (කාකවණ්ණ වර්‍ගීය දුෂ්ඨගාමිණී රාජ වස්තුව) දුටුගැමුණු රජු දෙමළ සේනා සමඟ යුද වැදීමට පිටත්වන අවස්ථාවේ වාදනය කරවූ වාද්‍ය භාණ්ඩ පිළිබඳ විස්තරයෙහි දක්වෙන සංගීත භාණ්ඩ පහත දක්වේ.

> *'රජ්ජුරුවෝ තුමූ ද කා බී සැරැසී දසමහා යෝධයන් ඇතුළු වූ මහා සේනාව ද කා බී සැරැසී සිටි කල්හි ඔවුන්ට ප්‍රසාද දී ගැටබෙර, පණාබෙර, එකැස්බෙර, මිහිඟුබෙර, මද්දල, පටහ, ලොහොබෙර, තලප්පර, වීරන්දම්, තම්මැට්ට, නිසාන, රණරඞගඝෝෂා, සමුද්‍රඝෝෂා ආදි වූ සියගණන් දහස්ගණන් භේරීජාතීන් එකපැහැර ගස්වමින් රන්සක්, රිදීසක්, රුවන්සක්, රන්සින්නම්, රිදීසින්නම්, රුවන්සින්නම්, රන්දාරා, රිදීදාරා, දළදාරා, දළහං, ලෝහං, විජයොධ්වනි ඔත්තු, තන්තිරි, පටසිරිවිල් ආදී වූ කාහළ ජාතීන් ද එකපැහැර පුඹවමින් යුගන්ධර සමීපයෙහි සාගරනාදයක් මෙන් මහත් කෝලාහල කරවා කෙළිමින් සෙමින් අසුරු යුධයට නික්මුණු ශක්‍ර දේවේන්ද්‍රයා පිරිවැරූ දේවතා සමූහයක් මෙන් මහසෙනඟ පිරිවරා...'*[13]

දුටුගැමුණු රජු නාටක ස්ත්‍රීන් පිරිවරා නොයෙක් සංගීත භාණ්ඩවලින් සමන්විත වූ තූර්ය වාදන කණ්ඩායම් මධ්‍යයේ දාගැබ (රුවන්වැලිසෑය) බඳින ස්ථානයට පෙරහරින් නික්මුණු බව මහාවංසයේ මෙන්ම ථූපවංශයේ ද දක්වා තිබේ. එම අවස්ථාවේ වාදනය කළ තූර්ය වාද්‍ය ප්‍රකාර (නාමිකව) මහාවංසයේ නොදක්වේ. එහෙත් ථූපවංසයේ ඒවා නාමිකව දක්වා තිබේ.

> *'සොළොස් දහසක් නාටක ස්ත්‍රීන් පිරිවරා සක්දෙව් මහ රජුහු මෙන් තමන්ගේ ශ්‍රී සම්පත්තීන් ඒ දුටුගැමුණු මහරජ බොහෝ දෙනා සතුටු කරවමින්, ගැටබෙර, පණාබෙර, එකැස්බෙර, දද්දර, මිහිඟුබෙර, පටහ, ලොහොබෙර, තප්පු තලප්පර වීරන්දම්, ඩැක්කි, උඩැක්කි, තම්මැට, රණරංග ඝෝෂා, සමුද්‍ර ඝෝෂා, ඩවුර සින්නම්, යන මෙකී භේරි ජාතීන් ද, රන්සක්, රිදීසක්, ජයසක්, රුවන්සක්, රන්සින්නම්, රිදීසින්නම්, රුවන් සින්නම්, රන්දාරා, රිදීදාරා, දළහං, ලෝහං, ගවරහං, විජයොධ්වනි, ඔත්තු, තන්තිරි, පටසිරි මෙකී කාහල ජාතීන් ද නකුල වීණා, භෘඞ්ග වීණා, ක්ෂුද්‍ර වීණා, ආලවත්ති, වංගි, වස්දඬු, මේ ආදී නාදයෙන් ද, යුගන්ධර පර්වත සමීපයෙහි සාගර*

---

[12] සි. ථූ. ව. (සංස්.), 1986. රන්ජිත් වනරත්න, 168 පිටුව
[13] සද්, (සංස්.), 2010. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 537 පිටුව

> *නාදයක් මෙන් මහත් වූ යසශ්‍රීන් මහත්වූ පෙරහරින් පස්වරු දාගැබ බඳිනා ස්ථානයට නික්මුණේය.*[14]

දුටුගැමුණු රජු විසින් කණ්ඩුල ඇතු රා පොවා ඩවුර සින්නම් ආදි බෙර සෝෂා කොට යුද පිණිස වීරියට යවන ලද බව සද්ධර්මාලංකාරයේ කාකවණ්ණ වගීයෙහි (දුෂ්ටගාමිණී රාජ වස්තුව) දැක්වේ.

'කණ්ඩුල නම් ඇතු රා පොවා කිපෙන්නට සුදුසු බස් බැණ නියපිටැ ගල් ගස්වා ඩවුරසින්නම් සක්පඤ්චලෝහොබෙර තලප්පරවීරන්දම් ආදි වූ භේරිතූර්‍ය භාණ්ඩයන් එකපැහැර සෝෂා කරවූහ...'[15]

දුටුගැමුණු යුගය පිළිබඳ විස්තර කෙරෙන සද්ධර්මාලංකාරයේ තබ්බසුමන වර්ගයෙහි ද ඩවුරසින්නම් ආදි වාද්‍ය ප්‍රකාර පිළිබඳ ව සඳහන් වේ.

> *'නානාප්‍රකාර වාද්‍යවිධියෙහි දක්ෂ වාද්‍යකාරයෝ කළ මිහිඟුබෙර, එකැස්බෙර, ඩවුර, සැක්කි, මහබෙර ආදී වූ භේරිජාතීන් ගෙන තොප ඉදිරියෙහි වාද්‍යවිධි දක්වා භේරිනාද කෙරෙති...'*[16]

ගැමුණු රජු විජිතපුර බලකොටුව දෙමළුන්ගෙන් මුදවාලනු පිණිස ඒ සමීපයෙහි කඳවුරු බැඳ තම දසමහා යෝධයන්ගේ බලය විමසනු සඳහා (නන්දිමිත්‍ර යෝධයා ඉදිරිපිට) රා පොවා කිපෙන්නට සලස්වා නියපිට ගල් ගසා ඩවුර සින්නම් සොලවා කඩොලැතු වීරියට යැවූ බව ථූපවංසයේ ද දක්වා ඇත.

> *'එ සමයෙහි දුටුගැමුණු රජු විජිතපුරය සමීපයෙහි කඳවුරු බැඳ ඒ පුරය ගන්නා කැමතිව දශමහායෝධයන්ගේ බල විමසනු පිණිස දක්නට එන නන්දිමිත්‍ර නම් යෝධයා ඉදිරිපිට තමන්ගේ කඩොලැතු රා පොවා කිපෙන්නට සුදුසු බස් බැණ නියපිට ගල් ගසා ඩවුර සින්නම් සොල්වා ඇතු මෙහෙයා ලූහ...'*[17]

## දුටුගැමුණු යුගයේ සංගීතය පිළිබඳ පුරාවිද්‍යා මූලාශ්‍රය මගින් හෙළිවන සාධක

සාහිත්‍යයික මූලාශ්‍රය මගින් හෙළිවන දුටුගැමුණු යුගයේ සංගීතමය සාධක පුරාවිද්‍යා ගවේෂණ මගින් තවදුරටත් තහවුරු කළ හැකිවීම මෙහිදී ඉතා වැදගත්වනු ඇත. දුටුගැමුණු රජු විසින් කරවන ලද ලෝවාමහාප්‍රාසාදය භූමියේ සිදුකළ පුරාවිද්‍යා කැණීම්වලින් සොයාගෙන ඇති ගල් කුලුණු කැටයම් අතර සංගීත භාණ්ඩ වයන වාමන රූප දක්නට ලැබේ එම කැටයම් අතර වීණාව (ඡායාඵලක-1), හරස්බෙරය (ඡායාඵලක-2), බටනළාව (ඡායාඵලක-3) ශංකය (ඡායාඵලක-4), උඩැක්කිය (ඡායාඵලක-5), කුම්භබෙරය (ඡායාඵලක-6), කයිතාලම (ඡායාඵලක-7), ආදි සංගීත භාණ්ඩ වයන වාමන රූප සහිත කැටයම් දක්නට ලැබේ. ආසන්න වශයෙන් ක්‍රිස්තු පූර්ව දෙවැනි සියවස තරම් පැරණි **කයිතාලම්**

---

[14] සි. ථූ. ව. 190 පිටුව
[15] සද්ධල. 540 පිටුව
[16] එම. 670 පිටුව
[17] සි. ථූ. ව. 171 පිටුව

අනුරාධපුර කැණීම්වල දී හමු වී ඇත (ඡායාළුලක- 8). මේවා ද දැනට අනුරාධපුර පුරාවිද්‍යා කෞතුකාගාර ගබඩාවේ තැන්පත් කර තිබේ. එමෙන්ම ඉසුරුමුනියේ ඇති **වීණා වයන කැටයම** (ඡායාළුලක-9), මිහින්තලේ සිංහ පොකුණ කැටයම් අතර හමුවන **වීණා වයන කැටයම්** ද (ඡායාළුලක අංක-10), නාට්‍යාංගනාවට දකුණු පසින් ඇති **බටනළා** වාදනය කරන කැටයම ද (ඡායාළුලක අංක-11.) සංගීතය විෂයෙහි ඉතා ප්‍රබල සාධක සපයනු ලැබේ.

## දත්ත විශ්ලේෂණය සහ නිගමනය

දුටුගැමුණු යුගයේ භාවිත වූ බවට සාධක ඇති ඇතැම් වාද්‍ය භාණ්ඩ අද්‍යතනය දක්වා ම ප්‍රචලිත ව පවතිනු දක්නට ලැබේ. උඩරට නර්තන සම්ප්‍රදාය හා යාතුකර්ම විෂයෙහි යොදා ගනු ලබන 'ගැටබෙරය' දුටුගැමුණු යුගයේ පැවැති බව සාහිත්‍යයික මූලාශ්‍රයවල (ධාතුවංශය, ථූපවංශය, සද්ධර්මාලංකාරය, දඹදෙණි අස්න) දැක්වෙන තොරතුරු අනුව දෘශ්‍යමාන වුවද එය වර්තමාන ගැටබෙරයට සමාන ස්වරූපයෙන් ම පැවතී ද යන්න නිශ්චිතව කිව හැකි සාධක හමුනොවේ. ලෝහප්‍රාසාද භූමියෙන් සොයාගත් වාමන රූපවල දැක්වෙන හරස් බෙරය දැතින් වැයූ බෙරයක් බව පැහැදිලි ය. එහෙත් එහි හැඩය (කඳ) සමාන වන්නේ වර්තමාන ගැටබෙරයෙහි හැඩයට නොව පහතරට දෙවොල් බෙරයේ හැඩයට ය. දෙවොල් බෙරය හෝ යක්බෙරය නමින් හැඳින්වූ බෙර විශේෂයක් ගැන දුටුගැමුණු යුගයේ තොරතුරුවල නොදැක්වේ. වර්තමානයේ යක්බෙරය ලෙස හඳුන්වනු ලබන්නේ අතීතයේ 'පණාබෙරය' ලෙස හැඳින්වූ බෙරය බව ජේ.ඊ. සේදරමන්ගේ මතය වේ.[18]

'පණවභේරි' නමින් ධාතුවංශයේ දැක්වෙන බෙරය ද 'පණාබෙරය' විය යුතුය.[19] 'පණව' නමින් කඳ මැටියෙන් හෝ ලෝහයෙන් කළ බෙර විශේෂයක් ගැන ලලිත විස්තරයෙහි ද සඳහන් වේ.[20] 'පනව' (Panawa)යනු ගායනය සඳහා සහාය වාදනයට යොදා ගත් කුඩා බෙර විශේෂයක් ලෙස සංස්කෘත ශබ්දකෝෂවල දක්වා ඇත.[21]

'පටහ' ලෙස හඳුන්වන බෙර විශේෂයක් ද දුටුගැමුණු යුගය පිළිබඳ කෙරෙන විස්තරවල හමුවේ. පටහ බෙරය 'දවුල' හෝ ඊට සමාන බෙරයක් බව පටහ බෙරය පිළිබඳ දැක්වෙන තොරතුරුවලට අනුව නිගමනය කළ හැකි ය.

'ගන්ධර්ව කුලයෙහි ප්‍රධානියා හට තමා පිරිවර ගන්ධර්වයන් ගෙනැ මහබොයට තුන් වේලේ හේවිසි පූජා කරනු කොටැ **මහපළවා නා** තනතුර දුන්නේය' යනුවෙන් සිංහල බෝධිවංශයේ දැක්වේ. 'මහපළවා නා' යනු පටහබෙර වාදකයන්ගේ ප්‍රධානියාට පිරිනැමෙන තනතුරු නාමයකැයි සුමංගල ශබ්දකෝෂයේ දැක්වේ.[22] ශ්‍රී මහා බෝධියට හේවිසි පූජා පැවැත්වීමේදී අතීතයේ සිට අද දක්වාම භාවිත කරනු ලබන ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වන්නේ 'දවුල' ය. සිංහල ථූපවංසයෙහිත් දඹදෙණි අස්නෙහිත් 'දවුල' පිළිබඳ

---

[18] සේදරමන්, ජේ. ඊ, 1959. නෘත්‍ය රත්නාකරය, 28 පිටුව
[19] ධා. ව. (සංස්.), 1941. මකුළුදූවේ පියරතන, 117 පිටුව
[20] Lalitha Vistaraya (trans.), 1886. Rajendra Mitra, pp. 90
[21] Williams, Monier, 1899. A Saìkrit English Dictionary, pp. 645
[22] ශ්‍රී සුමඞ්ගල ශබ්දකෝෂය (සංස්.), 1999. වැලිවිටියේ සෝරත, 745 පිටුව

සඳහන් වේ. 'දවුල' යනු පටහ වර්ගයේ බෙර විශේෂයක්ය යන්න සී. ද. එස්. කුලතිලකගේ මතය වේ.[23] සංස්කෘත ශබ්දකෝෂවලට අනුව 'පටහ' යනු යුද බෙරයකි. එය වාදනය කරනුයේ යුද්ධය ප්‍රකාශ කිරීම සඳහා ය.

*'Pataha, a kettle Drum, a war Drum to give Proclamation'*[24]

යුද බෙර හෙවත් රණ බෙර ලෙසත්, අණබෙර මගින් කළ සන්නිවේදන කටයුතු සඳහාත්, හේවිසි වාදන සඳහාත්, මළබෙර වාදනය සඳහාත් අතීතයේ සිට ලංකාවේ භාවිත වී ඇත්තේ දවුල ය. මළ පෙරහැරේ සදුවතින් වැසූ දවුලක් වැයීමේ සම්ප්‍රදාය අද දක්වා ම ලංකා සමාජයේ දැකිය හැකි ය. 'පටහ' නමින් හඳුන්වන බෙරය දවුල හෝ ඊට සෑම අතින්ම සමාන බෙරයක් විය යුතු බව පෙනේ. දවුල ලංකාවේ ආදිවාසී වැදි ජනයා අතර භාවිත වන බැවින් එහි පෞරාණික බව තවදුරටත් සනාථ වනු ඇත.

තුර්කි සහ බල්කන් ජන සංගීතයේ 'දවුල' නමින් විශාල බෙර විශේෂයක් භාවිත වන බව ඇන්තනි බේන්ස්ගේ (1961) වාර්තාවල සඳහන් වේ.

*'In Turkish and Balkan folk Music one may still hear the big drum Davul besten with a knobbed or hooked stick on one side and a light cane on the other'*[25]

තුර්කිවරුන්ගේ දවුල් නමැති තාල වාද්‍ය භාණ්ඩ හැඩයෙන් ලංකාවේ දවුලට යම් සමානකමක් දක්වයි (ඡායාළුලක -12). තුර්කිවරුන් එය වාදනය කරනු ලබන්නේ ද දණ්ඩක් ආධාරයෙනි. තුර්කි බෙරයෙහි මුහුණත් ලංකාවේ දවුලේ මුහුණතට වඩා විශාලය. බෙර කඳ දිගින් අඩුය. වාදනය කරනු ලබන අවස්ථා (එනම් අරමුණු වශයෙන්) අනුවත්, හඬෙහි ස්වභාවය අනුවත් මෙම තුර්කි 'දවුල්' ලංකාවේ දවුල සමග සන්සන්දනය කළ හැකි නොවේ. පර්සියාවේ ද 'දවුල්' විශේෂයක් භාවිත වන බවත්, වාණිජ සබඳතා මත එහි අභාසය ලංකාවට ලැබුණු බවත්, සී. ද. එස්. කුලතිලකගේ වාර්තාවල (1974) දක්වේ.

*'දවුල වැඩිකොට සම්බන්ධ වන්නේ සබරගමුව ප්‍රදේශයට යි. අද වුව ද පර්සියාවේ 'දවුල' නමින් ම මෙම බෙරය භාවිත වේ... ලංකාවේ සබරගමු ප්‍රදේශය සමඟ පර්සියානු ජනයා අතීතයේ පැවැත්වූ වාණිජ සබඳකම් දෙස බලන කල ඉහත කී නිගමනයට එළඹීම අපහසු නොවේ.'*[26]

කෙසේවෙතත් ලංකාවේ සංස්කෘතික මූලයන්ගෙන් ඉපිද දීර්ඝ කාලයක් තිස්සේ ඒ මත වර්ධනය වී ආ 'දවුල' ශ්‍රී ලාංකේය අනන්‍යතාව විනා අන් කිසිදු දේශයක ලක්ෂණ පරාවර්තනය නොකරයි. ප්‍රාග්තන යුගයේ පටන් අද්‍යතනය දක්වා දේශීය අනන්‍යතාව පිළිඹිබු කරමින් විකාසනය වී ඇති 'දවුල'

[23] කුලතිලක, සී. ද. ඇස්, 1974., ලංකාවේ සංගීත සම්භවය, 145 පිටුව
[24] Williamas, Monier, pp. 667
[25] Baines, Anthony, 1961. Musical Instruments through the Ages, pp. 338
[26] කුලතිලක, සී. ද. ඇස්, 133 පිටුව

පර්සියානුවන්ගෙන් ලැබුණු දායාදයක් ලෙස ලඝු කොට විග්‍රහ කිරීමට නොහැකි ය. එසේ විග්‍රහ කිරීමට තරම් අවශ්‍ය සාධක ද නොමැත.

ලෝහප්‍රාසාද භූමියෙන් හමු වී ඇති වාමන රූප අතර කළගෙඩියක හැඩය ගත් තාල වාද්‍ය භාණ්ඩයක් වයන කැටයමක් දක්නට ලැබේ. එම වාද්‍ය භාණ්ඩය ලංකාවේ ජනසංගීතයේ දී භාවිත කරන බුම්මැඩිය නමැති බෙරයට සෑම අතින්ම සමාන ය (ඡායාඵලක -13). එක බෙර ඇසක් පමණක් සහිත බැවින් සාහිත්‍යයික මූලාශ්‍රයවල දැක්වෙන 'එකැස් බෙරය' මෙම බුම්මැඩිය නමැති බෙරය විය හැකි ය. දුටුගැමුණු යුගය පිළිබඳ ථූපවංශයේත් සද්ධර්මාලංකාරයේත් දැක්වෙන විස්තරවල 'එකැස් බෙරය' නමින් බෙර විශේෂයක් සඳහන් වේ. ලෝහප්‍රාසාද කැටයම් අතර ඇති මෙම කළගෙඩියක හැඩැති බෙරය චාල්ස් ගොඩකුඹුරගේ වාර්තාවල (1961) හඳුන්වා ඇත්තේ 'කුම්භ බෙරය' නමිනි[27] . සී. ද. එස් කුලතිලක (1974), බුම්මැණ්ඩිය ලෙස දක්වයි.[28] දීඝනිකායට අයත් සාරත්ථදීපනී ටීකාවේ කුම්භ බෙරය (කළ බෙරය) වැයීම හෝ වයනු ඇසීම සංඝයාට අකැප බව දක්වා තිබේ.[29] ඒ අනුව එකැස් බෙරය, බුම්මැඩිය, කුම්භබෙරය, කළබෙරය යන නම්වලින් හඳුන්වනනේ එකම බෙර විශේෂයක් බව පෙනේ.

අනුරාධපුර - පොළොන්නරු නටඹුන් අතර හෝ සාහිත්‍යයික මූලාශ්‍රයවල හෝ රබාන පිළිබඳ සටහනක් නොමැත. කෝට්ටේ යුගය දක්වා ම රබාන පිළිබඳ සඳහනක් හමු නොවේ. රබන් වයන චිත්‍ර නුවර යුගයේ බහුලව දක්නට ලැබේ. අනුරාධපුර, පොළොන්නරු, දඹදෙණි, ගම්පොළ ආදි යුගවල සාහිත්‍යයික මූලාශ්‍රයවල 'එකැස් බෙරය' ලෙස දක්වා ඇත්තේ කුම්භබෙරය, බුම්මැඩිය වැනි නම්වලින් හඳුන්වන කළගෙඩියක හැඩය ගත් බෙරය විය යුතුය. එවැනි බෙරයක් ලෝවාමහාප්‍රාසාද කැටයම් අතර ද දක්නට ලැබීමෙන් ඒ බව තවදුරටත් සනාථ වනු ඇත.

ලෝහප්‍රාසාද භූමියෙන් හමුවී ඇති ගණරූප (වාමන රූප) අතර උඩැක්කි වාදකයෙකුගේ කැටයමක් ද වෙයි. ථූපවංශයේ මහාථූප ධාතුනිදානෝත්සව වර්ණනාවෙහි දැක්වෙන සංගීත භාණ්ඩ ලැයිස්තුවේ උඩැක්කිය සඳහන් කොට තිබේ. එහි දැක්වෙන ඩැක්කි සහ උඩැක්කි යන නම්වලින් හඳුන්වා ඇති බෙර විශේෂ එකම වර්ගයකට අයත් ප්‍රාමාණික වශයෙන් සුළු වෙනස්කම් සහිත බෙර විශේෂ දෙකක් ලෙස සැලකිය හැකි ය . හැඩයෙන් සමාන වුවත් ඩැක්කිය උඩැක්කියට වඩා විශාල බෙරයක් බව පෙනේ. උඩැක්කිය, ඩැක්කිය, ඩැක බෙරය, ඩමරු යන නම්වලින් හැඳින්වෙන බෙර සුළු සුළු වෙනස්කම් ඇතත් එකම වර්ගයට අයත් බෙර විශේෂයක් බව සී. ද. එස්. කුලතිලකගේ මතය යි.[30]

ඩවුර හෙවත් ඩවුර සින්නම් නමැති වාද්‍ය භාණ්ඩය ද උඩැක්කියේ හැඩයට සමාන වාද්‍යයක් බව පෙනේ. මෙය දෙපසට සෙළවීමෙන් හඬ උපදවා ගත් භාණ්ඩයක් බව සාහිත්‍යයික මූලාශ්‍රය ආශ්‍රයෙන් තහවුරු වේ. දුටුගැමුණු රජු කඩොලැතුට රා පොවා කිපෙන්නට සලස්වා තියපිට ගල් ගසා **ඩවුර සින්නම් සොලවා** ඇතු වීථියට යැවූ බව සිංහල ථූපවංශයේ හා සද්ධර්මාලාංකාරයේ දැක්වේ.

---

[27] ගොඩකුඹුර, චාල්ස්, 1961. කලා සඟරාව (මාර්තු කලාපය), සිංහල නාට්‍ය හා වාදනය, 9 පිටුව
[28] කුලතිලක, සී. ද. ඇස්, 563 පිටුව
[29] සාරත්ථදීපනි නාම විනය අට්ඨකතා - ෂෂ (සංස්.). බෝපිටියේ මේධංකර, 900 පිටුව
[30] කුලතිලක, සී. ද. ඇස්, 134 පිටුව

බෙරයෙහි කඳට සම්බන්ධ කොට ඇති ලණුවල අගට සවිකළ කුඩා ලෝහ හෝ ලී කැට දෙකක් (බෙරය සෙලවීමෙන්) බෙර ඇසෙහි ගැටීමට සලස්වා හඬ උපදාවා ගනු ලබන 'ඩමරු' නමැති බෙරයට සමාන බෙරයක් ලෙස 'ඩවුර සින්නම්' හඳුනාගත හැකි ය. හින්දු භක්තිකයෝ මෙම ඩමරු නම් භාණ්ඩය ශිවගේ නිර්මාණයක් ලෙස සලකති. ටිබෙට් ජාතික තන්ත්‍රයානික බෞද්ධයන් ද මීට සමාන වාද්‍ය භාණ්ඩයක් භාවිත කරනු දක්නට ලැබේ.

> *'The Origin of the double-sided hand drum or **damaru** dates back to the early Harappan civilization, where it first apppesrs as a pictogram in the ancient Indus valley script. As an early Shaivite emblem the damaru is a right hand attribute of Shiva in his form as Nataraja, the "king of the Dance" who vibrantly sounds the drum to create the male rhythm...'*[31]

දුටුගැමුණු රාජ්‍ය සමයේ භාවිත වූ බවට සාධක ඇති තවත් බෙර විශේෂයක් ලෙස තම්මැට්ටම හඳුනාගත හැකි ය. ලංකාවේ පංචතූර්ය සංගීතය පිළිබඳ දැක්වෙන ඓතිහාසික තොරතුරුවල 'තම්මැට' හෙවත් තම්මැට්ටමට සුවිශේෂී ස්ථානයක් හිමිවේ. තම්මැට්ටම දවුල තරමට ම දීර්ඝ ඉතිහාසයක් ඇති බෙර විශේෂයකි (ඡායාඵලක-14). ජනප්‍රවාදයට අනුව තම්මැට්ටම වාදනය කොට ඇත්තේ ගාන්ධර්ව දිව්‍යපුත්‍රයා විසිනි.

*'මා මුනි ඉසිවරා - නෙර්ත පල කළ ඇදුරා*
*තම්මැට්ටම දරා - ගාන්ධර්වය තාල ඇදුරා'*[32]

මැත පෙරදිග රටවල කාන්තාවන් විසින් සූර්ය චන්ද්‍රාව උදෙසා යොදාගන්නා ලද තිමුබූට, තිබ්බූ වැනි නම්වලින් හඳුන්වන බෙර විශේෂයක් පිළිබඳ ව ආචාර්ය සැක්ස් (1940)සඳහන් කරයි. මෙම කුඩා රාමු බෙර (frame drums) අතින් වැයූ ඒවා බවත්, ආසන්න වශයෙන් ක්‍රිස්තුපූර්ව 2000 තරම් පැරණි බවට පූරවිද්‍යාඥයන් විසින් සොයාගෙන ඇති බවත් ඔහු පෙන්වා දෙයි. ආචාර්ය සැක්ස් පෙන්වා දෙන පරිදි මෙම බෙර විශේෂයට ද්‍රවිඩ භාෂාවෙන් 'තම්බැට්ටම්' නමින් දකුණු භාරතයට සංක්‍රමණය වී ඇත.

> *'Statuettes of women playing smaller frame drums with their bare hands are roughly dated 2000 B. C. by archaeologists. It is not hazardous to give the third term balag-di to these drums. Its Akkadian equivalent, timbuta, or tibbu, has 'ring' as first significance. Women in the near East used frame drums in rites connected with the worship of the moon. Moreover, the radicals of the Tamil name of frame drums, tambattam.'*[33]

---

31 Beer, Robert, 2003. The Handdook of Tibetan Buddihist Symbols, pp. 107
32 සච්රිස්, ඇස්. එච්, 1965. පහතරට නැටුම් (ප්‍රථම භාගය), 41 පිටුව
33 Sachs, Curt, 1940. The History of Musical Instruments, pp. 76

බැබිලෝනියානු සංගීතය ගැන විස්තර කෙරෙන පරිච්ඡේදයේ ආචාර්ය සැක්ස් දක්වන බෙර විශේෂය ලංකාවේ තම්මැට්ටම මෙන් යුගල බෙර විශේෂයක් ලෙස හෝ කඩිප්පු ආධාරයෙන් වැයූ බව හෝ සඳහන් නොවේ. එහෙත් දකුණු ඉන්දියානු 'තම්බැට්ටම්' නමැති බෙරය නාමික ව ලංකාවේ තම්මැට්ටම යන්නට සමීප වේ. ආචාර්ය සැක්ස්ගේ වාර්තා ඇසුරින් මේ පිළිබඳ නිගමනයකට එළඹීමට සී. ද. එස්. කුලතිලක (1974) උත්සහ දරයි.

'ලංකාවේ බෞද්ධ විහාරයන්හි අද වුව ද වාදනය කරනු ලබන තම්මැට්ට බැබිලෝනියානු ශිෂ්ටාචාරයෙන් උපත ලබා ඇති 'කෙට්ල් ඩ්රම්' වර්ගයේ බෙරයක් බව ආචාර්ය කර්ත සැක්ස් මහතා සඳහන් කරයි. මෙහි බැබිලෝනියානු වහර 'තම්බුටු' විය.දකුණු ඉන්දියාවේ ද එය තම්මැට්ට හෙවත් තම්බට්ටි නමින් පවතී. උතුරු ඉන්දීය සංගීත භාණ්ඩ අතර එතරම් සඳහන් නොවන තම්මැට්ට හෙවත් තම්බට්ටි යුගල බෙරය ක්‍රි. පූර්වයෙහි බැබිලෝනියාව සමඟ පැවති වාණිජ සම්බන්ධකම් මාර්ගයෙන් දකුණු ඉන්දියාවට සංක්‍රමණය වූ බව පිළිගත හැකි ය.'[34]

බැබිලෝනියාවේ හෝ මැත පෙරදිග හෝ ලංකාවේ තම්මැට්ටමට සමාන යුගල බෙර විශේෂයක් ගැන ආචාර්ය සැක්ස් වාර්තා කර නොමැත. ද්‍රවිඩ වහරින් තම්බට්ටම් හෝ 'තම්බැට්ටම්' යයි ව්‍යවහාර කෙරෙන බෙර විශේෂය ගැන ද සැක්ස්ගේ වාර්තාවල සැලකිය යුතු තරම් තොරතුරු අන්තර්ගත නොවේ.

බැබිලෝනියානු හෝ මැත පෙරදිග රටවල ප්‍රචලිත මුහුණත් බෙර විශේෂ (frame drums) අතර ලංකාවේ තම්මැට්ටමට සමාන යුගල බෙර හමුනොවේ. ඔවුන් භාවිත කළ බවට සාධක ඇති මුහුණත් බෙර විශාල ප්‍රමාණයේ එක් මුහුණතක් පමණක් ඇති අතින් වාදනය කළ (ලංකාවේ බංකු රබාන වැනි) බෙර විශේෂ බව පෙනේ. කෙසේවෙතත් බැබිලෝනියාවෙන් දකුණු ඉන්දියාවට සංක්‍රමණය වූ බෙර විශේෂයක් ආශ්‍රයෙන් ලංකාවේ තම්මැට්ටම නිර්මාණය වී ඇතැයි යන සී. ද. එස් කුලතිලකගේ මතය තහවුරු කළ හැකි පැහැදිලි සාධක නොමැත. ස්වාධීන ලක්ෂණවලින් සමන්විත ලංකාවේ තම්මැට්ටම ශ්‍රී ලාංකේය අනන්‍යතාව පිළිබිඹු කෙරෙන වාද්‍ය භාණ්ඩයක් ලෙස හඳුනාගත හැකි ය.

කයිතාලම් (තාලම්පට) සහ ශංකය (හක්ගෙඩිය) දුටුගැමුණු යුගයේ භාවිත වූ බවට සාධක ඇත. ලෝහප්‍රාසාද කැටයම් අතර ද කයිතාලම් වයන සහ හක් පිඹින වාමන රූප දක්නට ලැබේ. ආසන්න වශයෙන් ක්‍රිස්තු පූර්ව දෙවැනි සියවස තරම් පැරණි කයිතාලම් අනුරාධපුර කැණීම්වල දී හමු වී ඇත. ඝන වාද්‍ය භාණ්ඩ වර්ගයට අයත් වාද්‍ය කිහිපයක් (දුටුගැමුණු රජුගේ වාද්‍ය වෘන්ද ලැයිස්තුවට අයත්) ථූපවංශයේ දක්වා ඇත. ඒවා අතර **දළහං**, **ලෝහං**, **කින්නර**, **කයිතාලම්**, **සමුත්තාලම්**, **ගී තාලම්** වැනි නම් සඳහන් වේ (පෙර සඳහන). මෙහි '**තාලම්**' නමින් සඳහන් වන වාද්‍ය සියල්ල ම පාහේ තාලය පවත්වා ගනු සඳහා තලනයෙන් (තැලීමෙන්) නාදය උත්පාදනය කළසන වාද්‍ය භාණ්ඩ බව කිව හැකි ය. වර්තමාන ව්‍යවහාරයේ 'තාලම්පොට' නමින් හඳුන්වන තැලීමෙන් හඬ උපදවා ගන්නා ලෝහයෙන්

[34] කුලතිලක, සී. ද. ඇස්, 132 පිටුව

කළසන වාද්‍යය එකල '**කයිතාලම්**' නමින් හඳුන්වා ඇති බව පෙනේ. සක්සින්නම්, රන්සින්නම්, රුවන්සින්නම්, රන්සක්, රිදීසක්, රුවන්සක්, වැනි නම්වලින් විවිධ ශංක වර්ග හඳුන්වා ඇති බව පෙනේ. අතීතයේ සිට වර්තමානය දක්වා ම ශංකය ශ්‍රී ලාංකේය සංස්කෘතියේ සෞභාග්‍යය රූපණය කෙරෙන උපකරණයක් බවට පත්වී තිබේ.

දුටුගැමුණු යුගයේ භාවිත වූ තත් සහ ශුෂිර වාද්‍ය භාණ්ඩ පිළිබඳ විමසීමේදී බටනලාව සහ වීණාව පිළිබඳ සාධක වැදගත් වේ.ලෝහප්‍රාසාද භූමියෙන් හමුවී ඇති බටනළා වයන වාමන රූපයත් වීණා වයන වාමන රූපයත් ඒ අතර වැදගත් වේ. වීණා වාදක කැටයම් ඉසුරුමුණියේ සහ මිහින්තලේ සිංහ පොකුණු කැටයම් අතර ද දක්නට ලැබේ . මිහින්තලේ සිංහ පොකුණු කැටයම්වල බටනලා පිඹින්නෙකුගේ කැටයමක් ද දක්නට ලැබේ. ලෝහප්‍රාසාද භූමියෙන් හමුවන වීණා කැටයමට අනුව වීණාව ඉලිප්සාකාර හැඩයකින් යුත් බඳකින් සමන්විත වේ. රූප ආකෘතියෙන් බෝවක හැඩය (එනම් අර්ධ වක්‍රාකාරඃ දුන්නක් වැනි) ගනී. හින්දු සාහිත්‍යයේත්, අද්‍යතන දක්ෂිණ භාරතයේත් ප්‍රචලිත වීණාව තුම්බා සහිත ඍජු දණ්ඩකින් හා හිසෙහි මකර කැටයමක් සහිත (යාලි මුඛම්) වීණාවකි. එහෙත් ලෝහප්‍රාසාදයෙන් හමුවන වීණාව යම්තාක්දුරට සමාන වනුයේ ඊජිප්තු, පර්සියානු හාර්ප් (Harp) නමැති තන්ත්‍ර වාද්‍ය භාණ්ඩයේ ආකෘතියට වේ. දුටුගැමුණු යුගය හින්දු ඇදහීම් පැවති යුගයක් නොවේ. එම යුගය ලංකා ඉතිහාසයේ දැක්වෙන බෞද්ධාගමේ ස්වර්ණමය යුගය වේ. බෞද්ධ සාහිත්‍යයෙහිත්, බෞද්ධ ගුහා කැටයම් අතරත් පර්සියාව, බුරුමය වැනි පැරණි බෞද්ධ රටවලින් හමුවන වීණා පිළිබඳ සාධකත්, ලෝහප්‍රාසාද වීණා කැටයමත් සලකා බලන කල්හි මෙවැනි ස්වරූපයේ වීණා බෞද්ධ මූලාශ්‍රයවලට දක්වන නැඹුරුතාව ප්‍රබල ව ඉස්මතු වි පෙනේ. වීණා වාදකයකු ව සිට පැවිදි වූ සෝණ තෙරුන්ට බුදුන් වහන්සේ වීණාවේ තත් සුසර කිරීමේ ක්‍රමවේදය අළලා කමටහන් ලබා දුන් අයුරු ත්‍රිපිටකයේ සූත්‍ර පිටකයට අයත් අංගුත්තර නිකායේ එන 'සෝණ සුත්ත' කථාවෙන් පැහැදිලි කෙරේ.[35] එමෙන්ම ශක්‍ර දෙවියන්ගේ වීණා වාදක වූ පංචසිඛ බුදුන් විසූ ඉන්දසිලා ගුහාවට පැමිණ තම වීණාව (බේළුපණ්ඩු වීණාව) වැයූ බව ත්‍රිපිටකයේ සුත්ත පිටකයේ දීඝනිකායට අයත් සක්කපඤ්හ සූත්‍රයෙහි සඳහන් වේ.[36] ත්‍රිපිටකය පාළි භාෂාවෙන් ලියැවෙන්නේ ක්‍රි.පූ. පළමු වැනි සියවසට ආසන්න කාලයේ ය. එනම්, වළගම්බා රජු සමයේ මාතලේ අලුවිහාරයේදී ය. ඊට තදාසන්න කාලයක ලියැවී ඇතැයි පිළිගැනෙන 'මිලින්දපඤ්හ' පාලි ග්‍රන්ථයේ ද බෞද්ධකාලීන වීණාවක් ගැන තොරතුරු සඳහන් වේ.[37] ක්‍රිස්තු පූර්ව යුගයට අයත් ඉන්දියාවේ පිටල්කොරා, භාරුත්, අමරාවතී, නාගර්ජුනකොණ්ඩ වැනි බෞද්ධ ගුහාවල ඇති වීණා කැටයම් ද ඉහත සඳහන් කළ හා(ර්)ප් ස්වරූපයේ වීණාවට සමාන බව පෙනේ.[38] මහාවංසය දක්වන පරිදි දුටුගැමුණු රජු විසින් රුවන්වැලි සෑ දාගැබ පර්යංකයෙහි වීණා වයන පංචසිඛ (වීණාහත්‍ථො පඤ්චසිඛො) සිතුවමට නගා ඇත. එමෙන්ම රුවන්වැලි සෑ ධාතුනිදානෝත්සව අවස්ථාවේ පංචසිඛ දිව්‍ය පුත්‍රයා වීණා වයමින් සිටි බව (වීණා වාදයමානො ව අට්ඨා පඤ්චසිඛො තහිං) මහාවංසයේ දැක්වේ.[39]

---

[35] SonaSutta(AN6.55)(trans.)1997.ThannissaroBhikkhu, http://www.accesstoinsight.org/tripitaka/an/an06/an06.055.than.html

[36] දීඝනිකාය (සිංහල) 1996. බෞ.ස.ම. 308පිටුව

[37] Milinda Question. Vol. I (trans.) 1993. I. B. Horener, pp. 74

[38] Ruwan Kumara, Chandana, 2014/2015. Journal of the Faculty of Humanities, Vol' XXII, University of Kelaniya, pp. 209

[39] ම. ව. 30 පරි. 75 ගාථාව, 31 පරි. 82 ගාථාව

භාරතීය පර්යේෂක ආචාර්ය ස්වාමි ප්‍රඥානන්ද විසින් (1981) සිදුකර ඇති පර්යේෂණයකට අනුව බෝවක හැඩයේ (අර්ධ වක්‍රාකාර ) වීණා හමුවන ස්ථාන ලැයිස්තුවේ ලංකාවේ අනුරාධපුරය ද සඳහන් කොට තිබේ. ඔහු විසින් එසේ සඳහන් කර ඇත්තේ ලෝහප්‍රාසාද භූමියෙන් හමු වූ වීණා වාදන කැටයම් නිරීක්ෂණය කිරීමෙන් බව නිගමනය කළ හැකි ය.

> *'The veenas featured in the sculptures of Gandhara (1st _ 2nd century AD), Barabudur (8th century AD), kamboja (6th - 13th century AD), Ajanta (2nd - 7th AD), Nagarjunakonda (2nd - 3rd century AD), Satana (2nd century AD), Mahavallipuram (7thcentury AD), paharpur (8thcentury AD),* ***Anuradhapuram, Ceylon (2nd- 3rd century AD)****, and other places resemble the bow - shape.'*[40]

පූර්ව බෞද්ධ යුගයේ පැවැති හා(ර්)ප් ස්වරූපයේ වීණා විශේෂයක් ගැන ඉතිහාසඥ රතිලාල්ගේ වාර්තාවල ද (1939) සඳහන් වේ.

> *'Old veena was a harp without the Post. It has a hollowed belly - (Doni) covered wiht a board or stretched leather (Camma pokkara). The hollowed belly was broader towards the back..... and tapered towards the front, where it was continued into an upstanding arm (danda) Which terminated in a little like the head of a violin...'*[41]

දුටුගැමුණු රජු දාගැබෙහි කළ පංචසිඛ වීණාවත්, ලෝහප්‍රාසාද වීණාවත් හැඩයෙන් සමාන විය හැකි ය. එනම්, එම යුගයේ බෞද්ධ සංකල්ප සමඟ ව්‍යවහාරයට පත් හා(ර්)ප් ස්වරූපයේ වීණා භාවිත වී ඇති බව නිගමනය කළ හැකි ය. මෙවැනි හැඩයේ වීණා ඉතා පැරණි මෙසපොතේමියානු සුමේරියන්වරුන්ගේ ඌර් පෞර රාජ්‍ය සමයට (එනම් ක්‍රි.පූ. 4500 පමණ) අයත් සාම ඵලකවල (Peace panel) දක්නට ලැබේ. පැරණි ඊජිප්තුවේ හා පර්සියාවේ ද බුනි (Buni), චැන්ග් (Chang), ලයර් (Lyre), ලූට් (Lute), ආදි නම්වලින් හැඳින්වූ හා(ර්)ප් වර්ගයේ තත් වාද්‍ය භාණ්ඩ භාවිත වූ බවට සාධක හමුවේ.[42]

වසර පන්දහසකට වඩා පැරණි යැයි අනුමාන කෙරෙන රාවණා වීණාව ලොව ඇති පැරණිතම තන්ත්‍ර වාද්‍යයක් ලෙස හඳුනාගෙන තිබේ. ඒ අනුව දණ්ඩකින් සහ තුම්බාවකින් යුත් හින්දු වීණාව රාවණාහස්ත වීණාවේ ආකෘතිය අනුව නිර්මාණය වී ඇති බවත්, මෙසපොතේමියානු, මිසර, පර්සියානු හා(ර්)ප් ස්වරූපයේ තන්ත්‍ර වාද්‍ය භාණ්ඩ ඇසුරින් සප්තතන්ත්‍ර වීණා, බෞද්ධ වීණා ආදි නම්වලින් හඳුන්වන

[40] Prajnananda, Swami, 1981. A Historical Study of Indian Music, pp. 112
[41] Meheta, Ratilal, N, 1939. Pre-Buddhist India, pp. 313
[42] Ruwan Kumara, Chandana, pp. 211-212

වීණා විශේෂය මියැන්මාරය (බුරුමය), ඉන්දියාව, ශ්‍රී ලංකාව වැනි රටවලට බෞද්ධාගම සමග ව්‍යාප්ත වන්නට ඇති බවත් නිගමනය කළ හැකි ය. දුටුගැමුණු යුගයේ සිතුවමට නැගූ පංචසිඛගේ වීණාවත්, ලෝහප්‍රාසාද වීණාවත් හැඩයෙන් හා(ර්)ප් ස්වරූපයේ වීණා ලෙස හැඳින්විය හැකි ය. එකල භාවිත වූ බව සඳහන් වන ʻනකුල වීණා, භෘංග වීණා, ක්ෂුද්‍ර වීණා වැනි වීණා ප්‍රකාර (ථූපවංශය 190 පිටුව) පෙර සඳහන් කළ රාවණාහස්ත වීණාවේ හැඩයට සමාන වන්නට ඇතැයි අනුමාන කළ හැකි ය.

ඉහත කරුණු අනුව සැලකීමේදී අනුරාධපුර යුගයට අයත් දුටුගැමුණු රාජ්‍ය සමය ශ්‍රී ලාංකේය සංගීතය පිළිබඳ ප්‍රබල සන්ධිස්ථානයක් බවට පත්වේ. ගෘහ නිර්මාණ , සිතුවම්, කැටයම්, සංගීතය සහ නර්තනය වැනි අනේකවිධ කලා සන්දර්භ කෙරෙන් ශ්‍රී ලාංකේය අනන්‍යතාව (ස්වාධීනතාව) පිළිබිඹු කරන ස්වර්ණමය යුගයක් ලෙස දුටුගැමුණු යුගය ලංකා ඉතිහාසයේ සන්ධිස්ථානයක් සනිටුහන් කරනු ලබයි. දේශීය පරිසරයට අනුකූල ව වැඩුණු සමාජ - සංස්කෘතික පසුබිමක විකාසනය වෙමින් බෞද්ධ මුහුණුවරකින් පුනර්ජීවනයක් ලබා උත්කර්ෂයට නැංවුණු සංගීත ශෛලියක් දුටුගැමුණු යුගයෙහි පැවති බව ඒ අනුව නිගමනය කළ හැකි ය.

**ඡායාඵලක**


1


2


3


4


5



6


7


8



8



9



10



11



12



13



14

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

**ප්‍රාථමික මූලාශ්‍රය (සිංහල)**


ජනවංසය, 2012. විමල බන්ති, ගල්වැවේ, (සංස්), හුණුමුල්ල, කර්තෘ ප්‍රකාශන

ථූපවංශය, 1986. වනරත්න, රන්ජිත් (පරි.), කොළඹ, සමයවර්ධන ප්‍රකාශන

දීඝනිකාය, 1996. ධර්මකීර්ති නිවන්දම; විමලරත්න බෙල්ලන්විල; නාරම්පනාව, කීර්ති (පරි.), කොළඹ, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

දීඝනිකාය, 1996. විමලජෝති, කිරගම (සංස්.), කොළඹ, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

දීපවංශය, 1959, ඤාණවිමල, කිරිඇල්ලේ (සංස්.), කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම

ධර්මප්‍රදීපිකාව, බු. ව. 2511. විමලකීර්ති, මැදඋයන්ගොඩ, සුමංගල කඩවැද්දුව (සංස්.), කොළඹ, රත්න ප්‍රකාශකයෝ

ධාතුවංශය, 1923. ශ්‍රී සුමේධංකර, දඹගස්ආරේ (සංස්.), කොළඹ, රුවන් මුද්‍රණාලයනාට්‍ය ශාස්ත්‍රය, 2007.

පාලි බෝධිවංශය, 2012. පියරතන වෑගම (සංස්.), කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ

පූජාවලිය, 2014. ඤාණවිමල, කිරිඇල්ලේ (සංස්.), කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම

මහාවංශය, 1996. සුමංගල ශ්‍රී, දේවරක්ෂිත, බටුවන්තුඩාවේ (පරි.), කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ

මහාවංසො, 2005. ඉලංගසිංහ, මංගල (සංස්.), කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ

ලංකා ඉතිහාසය, I කාණ්ඩය, I භාගය, 1964. ආටිගල, නිකලස්; ලබ්රෝයි, ඩබ්ලිව්. ජේ. එෆ්; නිකලස්, සී. ඩබ්ලිව්; පරණවිතාන, සෙනරත් (සංස්), කැලණිය, විද්‍යාලංකාර විශ්වවිද්‍යාල ප්‍රකාශන

වංසත්ථප්පකාසිනී (මහාවංස ටීකාව), 1994. අමරවංශ, අකුරටියේ, දිසානායක, හේමචන්ද්‍ර (පරි.), කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ

ශ්‍රී සුමංගල ශබ්දකෝෂය, ප්‍රථම භාගය, 1999. සෝරත, වැලිවිටියේ, කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ

ශ්‍රී සුමංගල ශබ්දකෝෂය, ද්විතීය භාගය, 2011. සෝරත, වැලිවිටියේ, කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ

සමන්තපාසාදිකා, 1913. ඤාණිස්සර, සිරි (සංස්.), කොළඹ, විද්‍යාසාගර මුද්‍රණාලය

සමන්තපාසාදිකා, විනයට්ඨකථා, 2009. ධම්මකුසල, අම්බලන්ගොඩ (පරි.), කොළඹ, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

සවිස්තර මහාවංස අනුවාදය, 2007. ඉලංගසිංහ, මංගල, කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ

සිංහල බෝධිවංශය, 1963. තෙන්නකෝන්, රි. (සංස්.), කොළඹ, ශ්‍රී ලංකා ප්‍රකාශන සමාගම


**ද්විතියික මූලාශ්‍රය (සිංහල)**


කුලතිලක, සී. ද ඇස්., 1974. ලංකාවේ සංගීත සම්භවය, කොළඹ, ලේක්හවුස් ඉන්වෙස්මන්ට්ස් සමාගම

ගොඩකුඹුරේ, චාල්ස්, 1961. සිංහල නාට්‍යය හා වාදනය, කලා සඟරාව, මාර්තු, කලාපය, ශ්‍රී ලංකා කලා මණ්ඩලය, කොළඹ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

සේදරමන්, ජේ. ඊ, 1959. නෘත්‍ය රත්නාකරය, කොළඹ, ඇම්. ඩී, ගුණසේන සහ සමාගම

සෝමසුන්දර, දයානන්ද, 2015. රාවණා, කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ

සෝමානන්ද, තෙරිපැහැ, 1961. සිංහලයේ පරිණාමය ආදි යුගය, කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම

ශ්‍රී බුද්ධදත්ත, පොල්වත්තේ, 1966. පාලි සාහිත්‍යය, කොළඹ, රත්න ප්‍රකාශකයෝ

ශ්‍රී රාහුල, වල්පොළ, 1989. ලක්දිව බුදුසමයේ ඉතිහාසය, කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම

හේරත්, එල්. බී, (පරි.), 2007. සැබෑ ලක්දිව, ( The Real Ceylon of C. Brooke Elliott), කොළඹ, සමයවර්ධන ප්‍රකාශන

**ප්‍රාථමික මූලාශ්‍රය (ඉංග්‍රීසි)**

A Concise History of Ceylon, 1961. Nicholos, C.W.; Paranavitana, S. (edit.), Colombo, Ceylon University Press

A Short History of World Music, 1949. Sachs, Curt, Dobson Books LTD, London

An Account of the Interior of Ceylon, and Its Inhabitants, 1821. Davy, John, New Delhi, Madras, Asian Educational services

Ancient Ceylon-No.2, 1972. Deraniyagala, S.U., Sri Lanka, Department of Archaeological Survey

Ancient Ceylon, 1910. Parker, Henry, London: Luzac and Co.

Ceylon: An Account of the Island (Vol.I), 1860. Tennent, James Emerson, London, Longman, Green, Longman, and Roberts

Epigraphia Zeylanica, vol. I, Don Martino De Zilva Wickramasinghe (ed.) 1912. London: Oxford University Press.

Lalitha Vistharayica, 1881. Mitra, Rajendra (Trans.), Culcutta, Baptist Mission Press

Milinda Question (Vol.I), 1963. Horner, I.B. (Trans.), London, the Pali Text Society

Record of Buddhist Kingdoms by Chinese Monk, Fa-Hien, 1886. James Legge (Trans.), London, Oxford at Clarendon Press

Voyage aux index Orientals ET a la Chine, 1806. Sonnerat, M., Paris, Dentu Publishers

**ද්විතියික මූලාශ්‍රය (ඉංග්‍රීසි)**

Ariyapala, M.B., 1956. Society of Medieval Ceylon, Colombo, Published by K.V.G. de Silva

Baines, Anthony, 1961. Musical Instruments through the Age, London, Spring Book

Bhalla, Omchery Deepti. 2006. Vanishing Temple Arts, Gurgaon: Shubhi Publication.

Bor, Joep, 1986-1987. The Voice of Sarangi, Vol. XV and XVI, Bombay, the National Centre for the Performing Arts

Day, C.R, 1891. The Music and Musical Instruments of Southern India and Deccan, London and New York, Ewer and Co.

Dissanayaka, J.B, 1987. Mihintale, Colombo, Lake House Investments

Gunawardhana, Theja, 1977, Ravana Dynasty in Sri Lanka's Dance Drama, Lahore: National publishing House.

Kasliwal, Suneera, 2009, Ravanahattha- Epic journey of an Instrument in Rajasthan, Gurgaon, Subhi Publication.

Kulatillaka, C. De S., 1991. Ethnomusicological Aspects of Sri Lanka, Colombo, S. Godage and Brothers

Malalasekaram G.P., 1928. Pali literature of Ceylon, Royal Asiatic Society of Great Britain and Ireland

Meheta, Ratilal, N., 1939. Pre-Buddhist India, Mumbai, Examiner Press

Sachs, Curt, 1940. History of Musical Instruments, New York: W. W. Norton and Company Publishers

Sanskrit English Dictionary, 1960. Williams, Monier, London, Oxfod, Clarendon Press

**සම්මන්ත්‍රණ සහ සම්මුඛ සාකච්ඡා**

Chandana Ruwan Kumara, The Impact of Sacial caste system on traditional drum players: A case study based on the Anuradhapura region. (Second International Conference on Humanities (ICH-2016); 8th December 2016, Faculty of Humanities, University of Kelaniya; available in repository.kln.ac.lk)

**විද්‍යුත් කෘති, ලේඛන සහ අන්තර්ජාල මූලාශ්‍රය**

Beer, Robert, 2003.The Handbook of Tibetan Buddhist Symbols, Sonasutta (AN6.55), 1997.Thannissaro Bhikkhu (Trans) available in http://www.acceetoinsight.org/tripitaka/an06/an0.055.than.html

# ගොඩගම්වෙල විහාර වත (ගොඩගම්වෙල පුරාණ විහාරයේ ඉතිහාසය හා විහාරයට අයත් පුරාවිද්‍යාත්මක, සාහිත්‍ය මූලාශ්‍රය පිළිබඳ කෙරෙන විමර්ශනයකි)

ඩබ්ලිව්. එම්. හිරාන් මධුසංක වීරබාහු[1]

**සංක්ෂේපය**

ඉතිහාසය යනු යම් රටක හෝ ප්‍රදේශයක හෝ ජන කණ්ඩායමක පැවැති අතීත ප්‍රවෘත්තියයිග වර්තමානය වන විටදී එම ප්‍රවෘත්තිය කාලයේ වැලි තලාවන් වැසී ගියද ඇතැම් විට එම ඉතිහාසය මතු කර ගැනීමට හැකි අංකුර හමුවේග එම රටේ හෝ ප්‍රදේශයේ අනන්‍යතාව, පැවැත්ම පිළිඹිඹු කරන්නාවූ කැඩපතක් බඳු මේ අංකුර මතුකර ගෙන ඒ ඔස්සේ සැබෑ ඉතිහාසය හෝ මෙතෙක් හඳුනා නොගත් ඉතිහාසයක් මතු කර ගැනීමට උත්සාහ දැරීම හෝ එය නූතන සමාජයට ඉදිරිපත් කිරීම මගින් වර්තමානයේ සිට ඉතිහාසය විමර්ශනය කිරීම පර්යේෂකයාගේ වගකීමයිග

කෙසේ නමුත් ඒ ජන සමූහ සතුව විවිධාකාරයේ ඓතිහාසික සාධක හෝ සාක්ෂි සජීවීව පවතින්නේ නම් එම ඉතිහාසයද සජීවී අයුරින්ම ගොඩනගා ගත හැකි වන්නේය. ඇතැම් විට මෙම සාධක ප්‍රසිද්ධ හෝ අප්‍රසිද්ධ ව තිබුණත් ඇතැම් මූලාශ්‍රය අප්‍රසිද්ධ වේශයෙන් පවතින්නට ඇති ඉඩකඩ වැඩිය. එපමණක් නොව මෙම ඓතිහාසික යටගිය ඓතිහාසික සිද්ධි හෝ අවස්ථා සනාථ කළ හැකි අන්දමේ සාධක ද පවතින්නේ නම් එහි ඓතිහාසික වටිනාකම මෙතෙකැයි නිශ්චය කිරීමද කළ නොහැක. එම මූලාශ්‍රය තුළ මෙතෙක් බාහිර සමාජයට හෙළි නොවූ අන්දමේ තොරතුරුද ඇතුළත් විය හැකි බැවින් ඉතිහාසය යාවත්කාලීන කිරීමට හෝ නව කරුණු එකතු කිරීමටද ලැබෙන අවස්ථාව අගනේය. ඒ අයුරේ වටිනාකම් රාශියක් සඟවා ගෙන සිටින ලංකා ඉතිහාසයෙන් සැඟව ගිය විහාරස්ථානයක් හා ඒ ආශ්‍රිත කථා පුවතක් පිළිබඳ තොරතුරක් ලද හෙයින් ඒ පිළිබඳ වැඩි දුර අධ්‍යයනය සඳහා පර්යේෂණයක් දියත් කිරීමේ අවශ්‍යතාව ඇති විය.

කෙසේ වුවද මහනුවර රාජධානි සමයේ සිට පැවත එන දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන නාරම්මල ගොඩගම්වෙල පුරාණ විහාරස්ථානය සතුව ඇති සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය සතුව හෙළි නොවී යයි සඳහන් කළ හැකි ඓතිහාසික කරුණු රැසක් පවතී. උදාහරණයක් සේ සැලකුවහොත් රාජාධි රාජසිංහ රජ සමයේ වැඩ අරඹා කීර්ති ශ්‍රී රාජසිංහ සමයේ වැඩ අවසන් කළ මෙම පුරාණ විහාරස්ථානයේ ආරම්භය පිළිබඳ වූ කථාවද සුවිශේෂී එකකිග එපමණක් නොව එහි සිතුවම් දුර්ලභ යැයි හඳුන්වා දිය හැක්කේ අන් කිසිඳු විහාරස්ථානයක දක්නට නැති සිතුවම් ද අන්තර්ගත වන හෙයිනිග මහනුවර යුගයේ රදළවරුන්ගේ පවා සිතුවම් සහිත මෙහි උප්පත්ති හා අවසන් කථාව පමණක්ම සිත් ඇද ගත්තා සුළුයග මෑත කාලීනව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් මෙහි සිතුවම් සංරක්ෂණය කිරීමට කටයුතු කිරීම පැසසිය යුත්තකිග කෙසේ වුවත් මෙම විහාරස්ථානය සතු එම ප්‍රාථමික මූලාශ්‍රයාගත තොරතුරු එක්සත් භාවයකට රැගෙන ඒ මඟින් විහාරස්ථානයේ ඉතිහාසය පිළිබඳ පෙළගැස්මක් සිදු කිරීමත් හෙළි නොවූ කරුණු ඉතිහාසය කෙරේ දක්වන දායකත්වය ප්‍රමාණ කිරීමත්

[1] (පර්යේෂණ නිලධාරි) පුස්කොළ පොත් අධ්‍යයන හා පර්යේෂණ පුස්තකාලය සමාජීය විද්‍යා පීඨය -. කැලණිය විශ්වවිද්‍යාලය hiran6361@gmail.com - 0716361251

මෙම පර්යේෂණයේ අරමුණ විය. මෙම විහාරස්ථානය සතුව දීර්ඝ ඉතිහාසයක් හා ඓතිහාසික ලේඛන හා දුර්ලභ සිතුවම් ද යම් ප්‍රමාණයත් ඇතත් ඒ පිළිබඳ ප්‍රමාණාත්මක හා විධිමත් අධ්‍යයනයක් සිදුව නොතිබීමත් ඒ මූලාශ්‍රය මගින් ක්‍රමනාකාරයේ කරුණු හෙළිවේද යන්නත් පර්යේෂණයේදී වූ එක් ගැටලුවක් විය. මෙහිදී පර්යේෂණ ක්‍රමවේදය ලෙසින් ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍රය අධ්‍යයනයත් හා ක්ෂෙත්‍ර ගවේෂණයත් භාවිත කර ඇත.

***ප්‍රමුඛ පද ඃ*** *ගොඩගංවෙල, ඉතිහාසය, විහාරය, මූලාශ්‍රය, ඓතිහාසික ලේඛන*

## හැඳින්වීම

වර්තමාන කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පොළ හත්පත්තුවේ මැද්දේකැටිය කෝරළයේ ගොඩගම්වෙල පුරාණ විහාරස්ථානය පිහිටා ඇති අතර නාරම්මල කුලියාපිටිය ප්‍රධාන මාර්ගයේ හොරම්බාව තෙක් පැමිණි අයෙකුට මාවී ඇළ මාර්ගයේ ගමන් කර විහාරස්ථානය කරා පහසුවෙන් ළඟා විය හැකිය. අක්කර දහයක පමණ විසිරී පවතින විහාරස්ථානයට අයත් දේපල විශාල ප්‍රමාණයකි. එසේම විහාරස්ථානය සඳහා පොතුහැර, හේන්මුල්ල, ගොඩගම්වෙල, වෙලගෙදර, වල්පොල, පහල ගොඩගම්වෙල, උඩබාගෙ, ගොරොග්ගල, දේවාලේ වත්ත, මහගම, හොදිවැව, උඩබාගෙ ලෙසින් ගම් දොළසක් පමණ අයත්ව තිබේ. 1945 දී පමණ සිට මෙම විහාසර්ථානයේ මව් විහාරස්ථානය වන්නේ මීවැව විහාරස්ථානයයි. ඊට අයත් පොකුරු විහාරස්ථාන හයකි. එනම් කළුගමුව, ගිනිපෙන්ද, හොරම්බාව, ගොඩගංවෙල, සේරුවාගල, හිරිපත්වැල්ල, කටුපොත, හල්මිටිය විහාරය යන විහාරස්ථානයන්ය. (සුමේධ හිමි, 2016ඵ26)

කෙසේ නමුත් 1945 වර්ෂයට පෙර ගොඩගංවෙල විහාරයේ මව් විහාරය වී ඇත්තේ බිහල්පොළ රජ මහ විහාරයයි. එපමණක් නොව බිහල්පොළ විහාරයේ මුල් ශාඛාව වන්නේද ගොඩගංවෙල විහාරස්ථානයයි. (රතනපාලහිමි, 2000ඵ12) වර්තමානය වන විටදී මේ විහාරස්ථානයේත් ඊට අනුබද්ධ හොදිවැව ලුම්බිණි විහාරයේත් හා මීවැව මව් විහාරස්ථානයේත් ගම්වලත් පැවිදි අනුශාසක හා භාරකරු ලෙස ශාස්ත්‍රවේදී මීවැවේ ගුණානන්ද හිමියෝ කටයුතු කරති. මහනුවර යුගයේ දෙවැනි නායක්කර් රජු වූ කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ කාලයේදී ඇරඹියා යැයි සැලකෙන මේ විහාරස්ථානය ප්‍රදේශය හා සම්බන්ධ ඉතිහාසය අනුරාධපුර රාජධානි සමය තෙක් දීර්ඝ කාලයට දිව යයි. එනම් දෙවනපෑතිස් රාජ්‍ය සමයේදී ගොඩගම්වෙල හෙවත් මේ ගොඩගම පළාත මයුරාවතී නම් කුමරියට (මීට අසල්වැසි ප්‍රදේශයක්ද මයුරාවතී නමින් ව්‍යවහාර වේ) ට භාර දුන් බව සඳහන් වීමෙනි. (රාජරත්නාකරය, 1995ඵ131) එතැන් සිට විවිධ විකාශනයන්ට හසු වෙමින් පැවැති ගොඩගම පළාත මහනුවර යුගයේදී වැදගත් බවක් උසුලා ඇත. කෙසේ වුවද ඉහතින් සඳහන් කළ පරිදි ගොඩගම්වෙල පුරාණ විහාරස්ථානය සතුව පවතින ලේඛන හා ඉතිහාසය ගොඩනගා ගත හැකි මූලාශ්‍රය පිළිබඳ මෙසේ ප්‍රමාණ කළ හැකිය.

- ගොඩගංවෙල පුරාණ විහාර තුඩපත
- ඇඹුල්හෙළුව විහාර දිවුණු පත්‍රය

- විත්ති පොත
- රාජ කණ්නලවුව හෙවත් සූර්ණිකා පත්‍රය
- ක්‍රි. ව 18 වන සියවසට අයත් ලේඛනය
- විහාර චිත්‍ර (මාර පරාජය, මීගස්තැන්නේ අධිකාරම, පොතුහැර ගමරාළ, හංගිලිපොල මහ දුරයා)
- පරණවිතාන මහතා විසින් යැවූ ලිපිය
- රාජාධිරාජසිංහ රජු විසින් ගොඩගංවෙල පුරාණ විහාර තුඩපත ප්‍රදානය කිරීම සඳහන් සිතුවම
- බිහල්පොළ විහාරස්ථානයේ තල්පතේ පිටපත
- වැලිවිට සරණංකර සංඝරාජ හිමියන්ට ප්‍රතිකාර කළ පුස්කොළ පොත

ගොඩගංවෙල පුරාණ විහාර තුඩපත හා ගොඩගම්වෙල පුරාණ විහාරස්ථානයේ ඉතිහාසය
:ගොඩගංවෙල පුරාණ විහාර තුඩපත*

මේ අතුරින් වැදගත්ම මූලාශ්‍රය ලෙස පෙන්වා දිය හැක්කේ ගොඩගංවෙල පුරාණ විහාර තුඩපතයි. මෙය මෙම විහාරස්ථානය ස්ථාපනය කරන අවස්ථාවේදී දී දුම්බර රාජකරුණා සෙනෙවිරත්න වාසල අභයකෝන් මුදියන්සේ රාළහාමි හෙවත් සත්කෝරළ දිසාව කරවන මීගස්තැන්නේ අධිකාරම විසින් (හේමපාල, 1980ඵ19) විහාරස්ථානය උදෙසා ප්‍රදානය කරල ලද තුඩපතයි. එහි විස්තරයට අනුව විහාරස්ථානයේ ආරම්භය කීර්ති ශ්‍රී රාජසිංහ රාජ්‍ය කාලයට :ක්‍රි.ව 1747.1782* අයත් වන බවත් මෙම විහාරස්ථානය පිහිටුවීමට මූලික වූ හේතුවත් සඳහන් කර ඇත. එනම් නැලැල්ලේ ධර්මරක්ෂිත නම් හිමි නමක් ගරා වැටුණු විහාරස්ථාන ප්‍රතිසංස්කරණ කටයුතුවල නියැලී සිට මේ අසළ විහාරස්ථානයක දැගැබ් කොත පළන්දන අවස්ථාවකදී ගම් ඉඩම් හිමියෙකු විසින් ඉඩමක් අදාළ විහාරස්ථානයට පූජා කරන ලදී. (බිහල්පොළ රජමහ විහාර තල්පතෙහි පිටපත) ඒ අවස්ථාවේදී එහි කොටසක් වූ රුක්මලා වැව පූජාවේදී ඊට හංගිලිපොළ මහ දුරයා නම් අයෙක් විරුද්ධ වි ඇති අතර විහාරේ පූද පූරා නොකරන්නට අවුල් උද්දරණද ද සිදුකර ඇත. පසුව ඒ දුරයාත් පොතුහැර ගමරාළ නම් අයත් අංගම්මන දිවාකර රාජපක්ෂ මහ අධිකාරමත් ඉපලෝගම හිමියනුත් නුවරට ගොස් මේ බව කීර්ති ශ්‍රී රාජසිංහ රජුට සැල කර ඇත. (බිහල්පොළ රජමහ විහාර තල්පතෙහි පිටපත) රජුගේ කැමැත්ත ඇතිව වෙනත් විහාරයත් කරවා වන්දනා ආගමික වතාවත් කිරීමට අවසර ලබා දී ඇත. මෙහිදී සිතා බැලීමට කරුණක් ඉතිරි වන්නේ දුරයින්ගේ බසට රජු එකහෙළා එකඟ වීම නිසාය. එනම් දුරයින් හා ගමරාළ එක්ව කීර්ති ශ්‍රී රජු හමු වී තම දුක්ගැනවිල්ල ඉදිරිපත්කළ අවස්ථාවේදී ඊට රජු විශේෂ සැලකිල්ලක් දක්වා ඊට අවසර දී ඇත්තේ හේතු දෙකක් නිසා බැව් සිතීම සාධාරණය. එනම් තුඩපතට අනුව සඳහන් වන පොතුහැර ගමරාළත් හංගිලිපොළ මහ දුරයාත් රජවාසලට අතිශය පක්ෂපාත වූ නිසාද ඒ දෙදෙනගේ ඉල්ලීමක් වූ නිසාද හා කීර්ති ශ්‍රී විසින් මෙහෙයවනු ලැබූ කටුවන සටනේදී රජවාසල වෙනුවෙන් පක්ෂව දිවි හිමියෙන් සටන් කළ පොත-ුහැර පුංචිරාළගේ ගම් ප්‍රදේශය නිසා බවත් සිතිය හැකිය. ඒ කෙසේ වෙතත් දේශීය විදේශිය අතින් අන්තරාදායක තත්ත්වය සිටි රජු දේශිය බෞද්ධයින්ගේ පක්ෂපාතී බව ලබා ගැනීම උදෙසා හෝ බුද්ධාගම වෙනුවෙන් බෙහෝ ආධාර උපකාර කළ බවත් රජුගේ අනුග්‍රහය හිමි නොවූ විහාරස්ථානයක් කන්ද උඩරට නොතිබූ බවත් කියවේ. :දේවරාජ,2013ඵ138*

කෙසේ වුවද උක්ත සඳහන් මේ විස්තරයට අනුව මෙහි සඳහන් වන ග්‍රාම නාම වර්තමාන නාමවලට බොහෝ දුරට සමාන වන බවත් පැහැදිලි කරුණකි. එසේම එදා ඉඩම් භුක්තිය පැවරීම අයිතිය හා සම්බන්ධ පැහැදිලි විස්තරයක්ද ඒ පිලිබඳ අධ්‍යයනය කරන්නෙකුට අතිශය වැදගත් වනු ඇත.

ඒ කෙසේ වුවද කටුවන කොටුව අරවන (බිඳීමේ) අවස්ථාවේදී මිය ගිය පොතුහැර පුංචිරාළ නම් අයගේ ඉඩමේ ඇරඹූ මේ විහාරස්ථානය ක්ෂෙත්‍රාරාමය නම් වී. (අද ගොඩංම්වෙල පුරාණ විහාරය) විහාරස්ථානයේ පුද පූජා සඳහා සත්රියන් පිළිමයක් කරවමින් සිටින අවස්ථාවේ මහ රජු පරලෝකාප්‍රාප්ත වූ හෙයින් රාජාධිරාජසිංහ රජු විසින් දෙවන අනුග්‍රහය ලබා දී ඇත. එසේම තුන් ඉරියම් පිළිම ගෙයක් කරවා අනුරාධපුරයෙන් බෝධියක් වඩමවා පස්රියන් දාගැබක්, ලැගුම් ගෙයක්, වැව්කොටුවක්, ප්‍රාකාරයක් කරවා විහාරස්ථානයේ වැඩ අවසන් කර බිහල්පොළ විහාරවාසී ඉපලෝගම බුද්ධරක්ඛිත හිමියන්ට පූරා කර ඇත්තේ ශක රාජ වර්ෂ ප්‍රමාණයෙන් එක්වා දහස් හත්සිය පහේදී හෙවත් ක්‍රි. ව 1783 දී ය. මේ සඳහා මූලික ව කටයුතු කර ඇත්තේ සත්කොරළේ දිසාව කරවන දුම්බර රාජකරුණා සෙනෙවිත්න වාසල අභයකෝන් මුදියන්සේ රාළහාමි හෙවත් මීගස්තැන්නේ අධිකාරම්තුමායැයි එහි වැඩි දුරටත් සඳහන් වේ. විහාරය පූජා කිරීමේ විස්තරය අඩංගු රේඛිය සිතුවමක් ද විහාරාධිපති හිමි සතුව පවතී. ඊට අනුව රාජාධිරාජසිංහ රජු ඉපලෝගම හිමි වෙත තුඩපත ප්‍රදානය කරන අයුරුත් (තුඩපතට අනුව) චිත්‍රණය වේ. මෙහි එක් පසෙකින් ඉපලෝගම හිමිත් රජුත් දක්නට ඇති අතර සත්කෝරළ මහ දිසාව වූ මීගස්තැන්නේ අධිකාරමත් ඊට පසුව පොතුහැර ගමරාළත් හංගිලිපොළ මහ දුරයාත් විහාරස්ථානයේ වැවත් විහාරයත් දර්ශනය වේ. එම සිතුවමේ ඉහළින් කඩුවක් අතින් දරාගෙන අහස දෙස බලාගෙන සිටින්නේ මෙම ඉඩම්වල අයිතිකරු වූ පොතුහැර පුංචිරාළ නම් වූ කටුවන හටනේදී මිය ගිය පුද්ගලයාය.

කෙසේ වුවද කීර්ති ශ්‍රී රාජසිංහ රාජාධිරාජසිංහ යන රජුන්ගේ අනුග්‍රහයට හා ගෞරවයට පාත්‍ර වූ මෙම විහාරස්ථානට දුර්භාග්‍ය සමයක් උදාවන්නේ සිංහලේ අවසන් රජු වූ ශ්‍රි වික්‍රම රාජසිංහ රජුගේ රාජ්‍ය කාලයේදීය. රජු විසින් ගෙන ගිය අත්තනෝමතික ක්‍රියා කලාපයට විරුද්ධ වූ නිළමේවරු අතර සිටි සත් කෝරළයේ ඉහළ දොලොස් පත්තුව කරවන පිළිමතලව්වේ හා පහල දොළොස්පත්තුව කරවන රත්වත්තේ දිසාව විසින් රජු ඝාතනය කිරීමට කළ කුමන්ත්‍රණය හෙළි වීම නිසා නිළමේවරු දෙදෙනාගේ හිස් සිඳ ඊට පක්ෂ පාතීවූ උක්ත සඳහන් කරන ලද විහාරස්ථානය පිහිටුවීමට මුල් වූ හංගිලිපොළ මහ දුරයා හා පොතුහැර ගමරාළ යන අය නුවරට ගෙන්වා උල හිඳුවා මරා දැමීය. ඒ ක්‍රි.ව 1808 දී යැයි තුඩපත සඳහන් කරයි. නමුත් මේ සිද්ධිය සිදු වූයේ 1811 දී යැයි තවත් තැනක සඳහන් වීම ප්‍රශ්නාර්ථයකි. එතැකින් නොනැවතුන රජු විහාරස්ථානයට රාජාධිරාජසිංහ රජු විසින් තුඩපතින් පූජා කළ විහාර දේපල විහාරලාභය ඉතිරි කොට කුරීකොටුවෙන් ගෙන්වන ලද මරක්කලයින්ට පවරා දුන්නේය. මේ සිද්ධිය නිසා චිත්ත පීඩාවෙන් වැඩ සිටි වයස්ගත වූ ඉපලෝගම තෙරුන් වහන්සේ ක්‍රි.ව 1816 දී පමණ අපවත් වූ සේකැයි එහි තවදුරටත් සඳහන් වේ. එතැන් සිට පුද බිම බෞද්ධයින්ගෙන් ගිලිහුණ අතර වල් බිහි වී පූජා භූමිය මුස්ලිම් ජනයාගේ වාස භවනක් ද විය. එතැන් සිට වසර 40 ක් පමණ මෙම දුරෙයි ගම්වාසීහු නැවතත් බිහල්පොළ විහාරස්ථානයට සිය වැඳුම් පිදුම් සඳහා යන්නට වූහ.

ක්‍රි.ව 1840 උදා වන්නේ ගොඩගම ග්‍රාමයට නැවතත් ගැටලුවක් හා විසඳුමක් යන දෙකම නිර්මාණය කරවමිනි. එනම් මේ වන තෙක් ගොඩගම ගම්වාසීන් බිහල්පොළ විහාරස්ථානයට යාම සම්බන්ධයෙනි.

ශ්‍රී වික්‍රම රාජසිංහගේ ක්‍රියාකලාපය නිසා ගොඩගම වාසී දුරයින් හට පෙර සේම බිහල්පොළ විහාරස්ථානයට යාමට සිදු විය. නමුත් එම වැසියන්ට සිය විහාරයේ වියන යටට යාමට බිහල්පොළ වාසී ගම්වැසියන් ඉඩ නොදුන් හෙයින් ගැටලුවක් පැන නැගිණ. එහෙයින් මේ ගොඩගම ගම්වාසීන් සඳහා විහාරස්ථානයක් අවශ්‍ය වූ තැන නැවතත් ක්ෂෙත්‍රාරාම විහාරස්ථානය කෙරේ අවධානය යොමු විය. ඒ වන විටදී ගරා වැටී ජරාවාස වී තිබු ක්ෂෙත්‍රාරාම විහාරස්ථානය හෙවත් වර්තමාන ගොඩගංවෙල පුරාණ විහාරය නැවතත් ප්‍රතිෂ්ඨාපනය වන්නේ වැලම්ටියාවේ බුද්ධදත්ත හිමි මාර්ගයෙන් ක්‍රි.ව 1855 දී ය. එතැන් සිට දෙවැනි වරට ප්‍රතිෂ්ඨාපනය වී ආරම්භ වූ විහාරස්ථානය හා භික්ෂු පරම්පරායව අද දක්වා පැවත එයි. දෙවන වර ආරම්භයේ සිට වූ භික්ෂු පරපුර මෙසේය.

- වැලම්ටියාවේ බුද්ධදත්ත හිමි
- වරංපොළේ සිද්ධාර්ථ හිමි
- රඹුකන සුමංගල හිමි
- උඩකොරකේ ගුණරතන හිමි
- පුවක්ගහකොටුවේ සරණංකර හිමි
- පාලුකඩවල සුමංගල හිමි
- වර්තමාන විහාරාධිපති ලෙස මීවැවේ ගුණානන්ද හිමි

## ඇඹුල්හෙළුව විහාර දිවුණු පත්‍රය

ගොඩගම්වෙල පුරාණ විහාරස්ථානයට අයත් සාහිත්‍ය මූලාශ්‍රය අතර විශේෂ වැදගත්කමක් අත් කර ගන්නා වූ හා ඓතිහාසිකව ඉතා විශාල වටිනාකමක් හිමි කර ගන්නා මූලාශ්‍රයක් ලෙස ඇඹුල්හෙළුව විහාර දිවුණු පත්‍රය හඳුන්වා දිය හැකිය. මෙහි සඳහන් අන්දමට ඇඹුල්හෙළුව නම් මේ ආශ්‍රිත විහාරස්ථානය කර විමේ අවස්ථාවේ සිට : වළගම්බා රජ සමයේ * මලියදේව රහතන් වහන්සේ සම්බන්ධ තොරතුරුද සඳහන් වේ. මීට අනුව මෙම ලියවිල්ල මලියදේව තෙරුන් වැඩ සිටියා වූ වට්ටාරම රජ මහ විහාරයටද වැදගත්ම වන මූලාශ්‍රයක් බව පැහැදිලිය. කෙසේ නමුත් මෙහි අඩංගු විස්තරයේ ඇතැම් කොටස් ඒ අයුරින්ම මී වැව විත්ති පොතේද සඳහන් හෙයින් මූලාශ්‍රය ද්විත්වය පිළිබඳ විස්වසනීයක්වයක් ගොඩනගා ගැනීමට ආධාරයක් ද වේ.

### දිවුණු පත්‍රයයි

ශ්‍රී සිධ ........ බුදුරජාණන් ........ අසූ අටවෙනි අවුරුද්දෙහි වළගම්අභය මහ රජහු අභිසේකප්ප්‍රාප්ත ........ වත්වන කල්හි ඔබට සහෝදර බෑණා වූ අන්තිම රහත් බව ........ තෙරුන් වහන්සේ වට්ටාරම මලියදේව පායෙහි වැඩ උන් කා ........ ත් සියයක් රන් කොත් පිහිටි විහාරයෙහී වැඩ හිඳ පන්සියයක් දෙනා පි........ ........... ශ්‍රී සුධ ශකරාජ වර්ෂයෙන් එක්වා දහස් පන්සිය පනස් දෙකක් වූ වනු යෙතිස් නව අවුරුද්දක් ප්‍රතිකානුන් වසඟවා තිබූ ලන්කා රාජ්‍යයෙහි බුධස්ථාන නැසී තිබුනාය ඒ පරහතරාට ජයගෙන රාජසුන්දරයට ........ විජයපාල අස්තාන මහ රාජධානි පිරිවං වහංසේ විසින් පාබත් කැඹුර බිජු ........ පිණිස දෙවා වදාල පනතයි

(හිස්තැන්වලින් දක්වා ඇත්තේ මුල් පිටපතේ විනාශ වී ගිය හා හඳුනා ගැනීමට නොහැකි වූ ස්ථාන වන අතර මෙහි දක්වා ඇත්තේ සම්පූර්ණ මූලාශ්‍රයෙන් ආරම්භයේ හා අවසානයේ කොටස් පමණි*

මීට අනුව විජයපාල කුමරා මේ ප්‍රදානයට වක්‍ර ව හෝ අන් අයුරකින් සම්බන්ධ වී ඇති බවක් පෙනේ. ඒ කෙසේ වුවත් විජයපාල මාතලේ ප්‍රදේශයත් කුමාරසිංහ ඌවත් හා රාජසිංහ සෙංකඩගලත් පාලනය කළ බවත් ඒ සඳහා සෙනරත් පිය රජු කුමන්ත්‍රණ කළ බවත් අප දනිමු ඃසෝමතිලක, 2009ඵ35*. එපමණක් නොව මේ විහාරස්ථානය පිහිටා ඇති සත් කෝරළය අයත් වන්නේ සෙංකඩගලට බැවින් එසේ නම් එක් අවස්ථාවකදී සත් කෝරළය සඳහා විජයපාලගේ බලපෑමක් වී ඇති බව සිතීම සාධාරණ විය හැකිය. ඒ මෙම ප්‍රදානය සිදු කිරීම නිසාය.

## මහනුවර යුගයට අයත් සූර්ණිකා පත්‍රය

මෙම විහාරස්ථානය සතුව පවතින තවත් වැදගත් මූලාශ්‍රයයක් ලෙසින් මේ සූර්ණිකා පත්‍රය පෙන්වා දිය හැකිය. විහාරාධිපති හිමියන්ගේ ප්‍රකාශයට අනුව මෙය භික්ෂු පරම්පරාවෙන් විහාරස්ථානයට උරුම වූවක් වන අතර එසේ නම් ආරම්භයේ සිටම මේ විහාරස්ථානය සමග රජවාසල සමීප සබඳතා පවත්වා ඇති බව සිතීම සාධාරණ වේ. කෙසේ වුවද මේ සූර්ණකා පත්‍රයේ ද්වී පාර්ශවයක් පිළිබඳ තොරතුරු හමුවේ. එහි දක්වා ඇත්තේ "මහවාසලින් රදළවරු එන පෙර මගට තානාපති උන්නාන්ශේ ගියාම කරන කථාව නම්" යනුවෙන් ඊට අදාළ විස්තරයද, දෙවනිව "රදළවරු තානායමට ඇවිත කරන කථාව නම්" යනුවෙන් ඊට අදාළ කොටසක්ද සඳහන් කර ඇත. කෙසේ වුවද මෙහි මුල් කොටසින් රජු භාවිත කළ විරුද නාම කිහිපයක් හෝ රජු ආමන්ත්‍රණය කළ යුතු ආකාර කිහිපයක් පිළිබඳ මෙහි සඳහන් වීම විශේෂ කරුණකි. එනම්

- ශ්‍රී ලංකේශ්වර උතුම්
- ත්‍රි සිංහලාධීශ්වර උතුම්
- දිනරාජ හේජ පූජිත වූ උතුම්
- වයිරිනපතමහාස්ත්‍ර වූ උතුම්
- දිනරත්නවංශ ප්‍රදීප වූ උතුම්
- භුජබලපරාක්‍රම සම්පන්න වූ උතුම් ..... හා තවත් ලෙසින් නම් සඳහන් වේ. විවිධ රජවරු මේ විරුද භාවිත කර ඇති නිසා මෙය කුමන රජුගේ කාලයට අයත්දැයි නිශ්චිතවම හඳුනා ගැනීම අසීරුය.

### ක්‍රි. ව 18 වන සියවසට අයත් ලිපිය

ක්ෂේත්‍රාරාමය හෙවත් මේ ගොඩගංවෙල පුරාණ විහාරස්ථානයේ මුල්ම විහාරාධිපති හිමියන් වූ ඉපලෝගම බුද්ධරක්ඛිත තෙරුන් වහන්සේ විවිධ සිංහල පාලි දෙමළ භාෂා ශාස්ත්‍ර උගත් තෙරුන් වහන්සේ නමක් වූහ. (රතනපාල හිමි, 2000ඵ12) උන්වහන්සේ බිහල්පොළ විහාරාධිපතිව වැඩ හිඳ ගොඩගංවෙල විහාරස්ථානය ආරම්භ කිරීමෙන් පසු රජුගේ ප්‍රදානයෙන් එහි භාරකාරීත්වයද දැරූ සේක. ගිහි පැවිදි ශිෂ්‍යයින්ගේ ගු-රුවරයා වූ උන්වහන්සේ වෙත උන්වහන්සේගේ ගිහි ගෝල දෙපළක් වූ ලුඩුවයික් හා හෙන්ද්‍රික් යන අය කොළඹ සිට ක්‍රි.ව 1785 දී ලිපියක් ඉපලෝගම හිමි වෙත එවනු ලබයි. මෙහි වැදගත් ඓතිහාසික තොරතුරක් සඳහන් නොවතත් ඓතිහාසික වශයෙන් වැදගත් මූලාශ්‍රයක් ලෙස හැඳින්වීම නිරවද්‍යය. මෙහි අන්තර්ගතය කෙටියෙන් විස්තර වන්නේ නම් හිමියන්ගේ පුද්ගලික

තොරතුරු විමසීමකි. එහි සඳහන් වන්නේ ඉපලෝගම හිමියන් බොහෝ කාලයකින් නොදුටු බවත් හිමියන් දැක ගැනීමේ මහත් වූ ආශාවක් ඇති බවද දක්වන අතර හිමියන් හමු නොවීම අපගේ පවක් බව මේ ශිෂ්‍යයෝ දෙපල පවසති. එසේම ලිපිය ආරම්භ කර ඇත්තේද "ප්‍රවරාමිත සශ්‍රීන්විස්ශ්‍රීතසාර ගැණරතන වූ අපේ ගුරුන්නාන්සේ වන ඉපලවගම හාමුදුරුවන්ඩ ........." ලෙසින් බොහෝ ගරු පක්ෂපාතීවය. ලිපිය අවසන් කර ඇත්තේ වර්ෂ එක්වා දහස් හත්සිය අසූපහක් වූ ජනේරු මාසේ දෙවෙනි දින කොළඹදීය, යන මේ වගට ලියා එව්වේ ඔබ වහන්ෂේගේ ගෝලයෝ වන දොන් ලොදවයික් අප්පුහාමි සහ දොන් හෙන්ද්‍රික් අප්පුහාමින්ය යැයි සඳහන් කර ඉංග්‍රීසියෙන් අත්සන් කර ඇත.

පැහැදැලිවම මේ නම් ඉංග්‍රීසි භාෂාවේ පුද්ගල නාමයන්ය. එසේ නම් මෙහිදී එක් කරුණක් පිළිබඳ වැදගත් නිගමනයකට එළඹීමට සිදු වේ. එනම් මෙය 1785 දී රචනා වී ඇති නිසා මේ වන විටත් ඉංග්‍රීසි භාෂාව ජනයා අතරට පැමිණ තිබූ බව පිළිගැනීමට සිදුවන බවය. ප්‍රථම ඉංග්‍රීසි දූත ගමන ජෝන් පයිබස් විසින් සිදු කරන්නේ ක්‍රි.ව 1762 දී වුවත් ඃබණ්ඩාර,2011ඵ25* ඉංග්‍රීසින්ට ලංකාවේ වෙරළබඩ නතු වීමටත් පෙර සිටම කොළඹ ප්‍රදේශයේ හෝ ලංකාවේ ඇතැම් වියතුන් ඉංග්‍රිසි බස භාවිත කර ඇති බවය. එනම් 1796 පෙබරවාරි 15 දින ලන්දේසීන්ගේ යටත් වීම ඃවිජේතුංග, 2016ඵ58* හා ඉංග්‍රීසින්ගේ බල ව්‍යාප්තියටත් පෙර සිටම ඃප්‍රථම දූත ගමනට පසු* සැලකිය යුතු අන්දමේ සබඳතා ඉංග්‍රීසින් හෝ ඉංග්‍රීසි භාෂාව හා ස්වදේශිකයින් අතර වූ බවය. කෙසේ වුවද ලේඛනයක් වශයෙන් මෙය විහාරස්ථානය සඳහා අතිශය වැදගත් හා වටිනාකමක් එක් කරන මූලාශ්‍රයක් බව සඳහන් කළ යුතුය.

## සංඝරාජ හිමිට වෙදකම් කළ පුස්කොළ පොත

වැලිවිට සංඝරාජ හිමි බොහෝ කාලයක් අක්ෂි රෝගයකින් පීඩා විඳි බව කවුරුත් දන්නා කරුණකි. එසේම උන්වහන්සේගේ අවසාන කාලයේදී එම රෝගය උත්සන්න වී එක් ඇසක් ද අන්ධ වී ඇත. මේ අක්ෂි රෝගය නිසාම වැලිවිට හිමියන්ට විඳින්නට වූ අපවාද බෙහෝය. එහි එක් අවස්ථාවක් නම් මහ රජු ඝාතනය සඳහා වූ කුමන්ත්‍රණය හිමි දැන දැනම වසන් කළ නිසා රජු "වැලිවිට කණා සස්නේ වනනවා" යැයි සඳහන් කරමින් උන්වහන්සේව ඇමතීය ඃවාචිස්සර හිමි,2003ඵ185*. එසේම අස්ගිරිය හා මල්වත්ත හින්න වී ගිය කල මේ උභය නිකාය සමගි කර වීමට ගත් උත්සාහයේදී අස්ගිරිය හා මල්වත්ත මට මගේ ඇස් දෙක වගේ යැයි කී පසු එක් හිමි නමක් අස්ගිරිය නරක් වූ ඇස වගේ දැයි ඇසූයෙන් නැවතත් හිමියන්ගේ හිත රිදිණි. කෙසේ වුවද ජනප්‍රවාදයට අනුව උන්වහන්සේගේ දීර්ඝ කාලීනව පැවැති අක්ෂි රෝගය සඳහා පිළියම් කරන ලද්දේ මීවැවේම සිටි සුමංගල දසනායක නම් ගණින්නාන්සේ කෙනෙකි. උන්වහන්සේ ඇස් වෙදකමට ඉතා දක්ෂ වූ වග ***මී වැව විත්ති පොතේම*** සඳහන් වේ. (සුමේධ හිමි, 2016ඵ139,140) එහි සඳහන් වන අන්දමට ගණින්නාන්සේ වැඩ සිටි බැලුම්ගල විහාරයට සංඝරාජ හිමි වැඩම කර ඇත. එහිදී සංඝරාජෝත්තමයාණන් වහන්සේ සුමංගල දසනායක ගණින්නාන්සේගෙන් "ජාතක පොත ඇද්දැයි" ඇසූ කල එය අල්ගම විහාරයට ගෙන ගියා කීවාය. තවත් පොත් ඇද්දැයි ඇසූ විට ගණින්නාන්සේ සංඝරාජජෝත්තමයන්ට බෝධිවංස පොත දුන්නාය. සංඝරාජජෝත්තමයන්ගේ ඇසේ රුජාවට බෙහෙත් දුන්නාය" යනුවෙනි. එසේම එහි තවත් තැනක සඳහන් වන්නේ සංඝරාජ ස්වාමිදරුවාණන් වහන්සේ තමන් වහන්සේගේ ඇසේ රුජාවට වෙදකම් කල සුවකල නිසාවට සුමංගල දසනායක ගණින්නාන්සේට තමන් වහන්සේට ගෝවා රටින් ලැබුන රන් පිලුමයකුත් දුන්නාය (සුමේධ හිමි, 2016ඵ141) යනුවෙනි.

කෙසේ නමුත් මේ නම් සඳහන් වන අක්ෂි රෝග සම්බන්ධ පුස්කොළ පොතක් මේ ගොඩගංවෙල විහාරස්ථානය සතුව පවතී. ඉතා පැරණි ස්වභාවයකත් පෙන්නුම් කරන මෙහි අක්ෂි රෝග ගණනාවකට පිළියම් දක්වා ඇත. එය ගණින්නාන්සේගේම පොත හෝ වේවා එහි පිටපතක් හෝ වේවා විශේෂත්වය වන්නේ සුමංගල ගණින්නාන්සේගේ පොතයි ලෙසින් මෙහි ආරම්භයේ ම දක්වා තිබීමයි. එසේ නම් ජනප්‍රවාදය හෝ මීවැව සන්නසේ සඳහන් මේ කරුණ එක හෙළා බැහැර කිරීමද කළ නොහැකිය. එම පුස්කොළ පොතෙහි සුමංගල දසනායක යනුවෙන් නම ද සඳහන් කර ඇති බවත් කිව යුතුය.

## විහාර චිත්‍ර

කීර්ති ශ්‍රී රාජසිංහ රජු කල ගොඩනංවන්නට යෙදුණු මෙම විහාරස්ථානයෙහි වැඩ අවසන් කරන ලද්දේ රාජාධි රාජසිංහ රජ සමයේදී බව ඉහත සඳහන් කෙරිණි. එකල චිත්‍රණය කළාවූ මහනුවර යුගයට අයත් සිතුවම් රාශියකයට මෙම විහාරස්ථානය උරුමකම් කියයි. ඒ අතර අති දුර්ලභ සිතුවම් කිහිපයක්ද වන්නේ විහාරයේ අනන්‍යතාව සිතුවම් මගින් සනිටුහන් කරන්නාක් මෙනි. විහාරස්ථානයේ බෝධියත් චෛත්‍යයත් පිහිටා ඇති ස්ථානයේම ගල් තලාවක් මත පිහිටා ඇති මෙම විහාරය දිගින් අඩි 20 ක් හා අඟල් 19කි. පළල අඩි 20 ක් හා අඟල් 6 කි. පිටත බිත්තියේ ඝනකම අඟල් 15 ක් වන අතර සිතුවම් සහිත ඇතුල් බිත්තිය අඟල් 17 ක ඝනකමක් ගනී.

**මාර පරාජය සිතුවම** . ඇතුල් විහාරයේ වම් පස බිත්තියේ හිඳි බුදු පිළිමය අසල සිතුවම් කර ඇති මෙම සිතුවම දුර්ලභ ගනයේ සිතුවමකි. මෙහි බුදුන් වහන්සේ භාවනා යෝගීව වැඩ සිටින අතර රතු පසුබිමක මාරයා ඇතු පිට නැගීසිටින්නේ අත් අටක් සහිතවය. ඒ සියලු අත් සතුව ආයුධය බැගින් නිරූපණය කර ඇත. මාරයා ඇතු පිට සිටින ඉරියව්ව නම් සාමාන්‍යයෙන් ඇති ගොව්වකු ඇතකු පිට සිටින ඉරියව්ව නොවේ. ඔහු සිටිනුයේ දෙපා එක් පසකට යොමු කරගෙන වුවත් ඉදිරිය බලාගෙනය. මෙම සිතුවම හෝ මීට සමානවම හෝ අන් තැනක දක්නට නොමැති වීමත් අත් අටක් දක්වා තිබීමත් නිසා මෙහි මාර සේනාවක් යැයි යමෙකුට තර්ක කළ හැකි මුත් එක් හස්තියෙක් පමණක් දෘශ්‍යමාන වන හෙයින් ඒ තර්කය බැහැර කළ හැකිය. මීට සමාන සිතුවමක් මහනුවර ලේවැල්ල ගංගාරාමයේ දක්නට ඇතත් එහි මාරයා මුහුණු පහකින්ද අත් දහයකින්ද නිරූපිත වේ. තවද රුස්වෙහෙර මාර පරාජය සිතුවමද කුලියාපිටිය කෝන්ගහගෙදර විහාරයේ සිතුවම්ද මීට යම් සමානතාවත් දක්වතත් මෙයින් වෙනස් වේ.

මහනුවර සම්ප්‍රදායේ පුද්ගල රූප දැක්වීමේදී ශිල්පියා අනුගමනය කර ඇති සාම්ප්‍රදායික ක්‍රමවේද කිහිපයක් මහාචාර්ය මහින්ද සෝමතිලක මහතා පෙන්වා දෙයි. ඒ අනුව මෙහිදීද අනුගමනය කර ඇත්තේ පුද්ගල රූපවල හිසකෙස් බැඳ ඇති හෝ පීරා ගැටගසා ඇති බව පෙන්වමිනි. සෑම පිරිමි රුවකටම වාගේ මුහුණ පුරා වැඩුණු රැවුලක්ද නිරූපණය කිරීමේ අවස්ථාව මේ දුර්ලභ සිතුවම සඳහාද භාවිත කර ඇති බව පෙන්.මෙයින් සිතකලු බව දර්ශනීය බව හා එයින් රූපයක් තිබිය යුතු පෞරුෂත්වයද වර්ධනය වන බව ඒ මහතා පෙන්වා දෙයි. ꞉සෝමතිලක, 2002ථ323*

කෙසේ වුවද මෙය දුර්ලභ සිතුවමක් බව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවත් කැලණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය මාලිංග අමරසිංහ මහතාද පවසයි. එසේම මෙම විහාරස්ථානයේ මව් විහාරය වූ බිහල්පොළ විහාරයේ සිතුවම් මහනුවර මුල් යුගයට මහනුවර සම්ප්‍රදායටම හා නූතන

යුගයට අයත් සිතුවම් යන තෙවැදෑරුම් පක්ෂ ගනී. (හේවාපතිරණ, 2012ඵ237) ඇතැම් විටෙක එම සිතුවම්වල ආභාසය මෙම විහාරය ලබන්නට ඇත.

**පුද්ගල රූප** . ඇතු-ල් විහාරයේ දකුණු පස පුද්ගල රූප තුනක් දක්නට ලැබෙන්නේ මේ විහාරය කරවීමට සම්බන්ධ වූවන් දක්වමිනි. එහි මුලින් සත්කෝරළ දිසාව භාර වූ මීගස්තැන්නේ අධිකාරමත් දෙවනුව පොතුහැර ගමරාළත් තෙවනුව හංගිලිපොළ මහ දුරයාත් පිළිවෙලින් චිත්‍රණය කරයි. මේ චිත්‍රවලට පහළින් ඔවුන්ගේ නම් සඳහන් කර තිබී ඇතත් වර්තමාන වන විටදී ඒවා මැකී ගොසිනි. මේ පුද්ගලයින් කවුද කුමක් කළේද හා විහාරයේ සම්බන්ධතාව පිළිබඳ ඉහත තුඩපත් විස්තරයේදී සඳහන් කළ නිසා නැවත දැක්වීම අනවශ්‍ය කරුණකි. කෙසේ නමුත් ලංකා ඉතිහාසයේ විවිධ අවස්ථාවල වූ පුද්ගලයින් හා සම්බන්ධ රූප හමුවීමේ සම්භාවිතාව ඉතා දුර්ලභ නිසා මෙය වැදගත් මූලාශ්‍රයක් ලෙසින් සැලකිම වරදක් නැත. එපමණක් නොව මේ විහාරස්ථානය සතුව ඉපැරණි බුදු පිළිම අතරට ගැනෙන හිටි පිළිම, හිඳි පිළිම, සැතපෙන පිළිම හා දේව පිළිම කිහිපයක්ද වන අතර ඒ පිළිබඳ පූර්ව අවධානයක් යොමු නොවී තිබීම කණගාටුවට කරුණකි.

## නිගමනය

වර්ෂ දෙසිය පණහකට ආසන්න දීර්ඝ කාලයක් කාලයේ වැලි තලාවෙන් වැසී ඉතිහාසය නැවත ගොඩනගා ගැනීමේලා වැදගත් මූලාශ්‍රය රැසක් පවතින මේ විහාරස්ථානය පිළිබඳ තතු ගවේෂණය කිරීමට ලැබීමම භාග්‍යයකි. ඒ අවස්ථාව නිසාම මෙවැනි පර්යේෂණයකට එළඹීමට හැකි වූ අතර හෙළි නොවූ විස්තර යම් ප්‍රමාණයක් සමාජ ගත කිරීමට හැකි විය. මෙහිදී සඳහන් කළ යුතු වැදගත්ම කාර්යයක් වන්නේ විහාරස්ථානය සතු සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක ලේඛන සියල්ල මෙහිදී ඉදිරිපත් නොකළ වගත් යම් ප්‍රමාණයකට ඉදිරිපත් කළ සාධකද හෙළි කර ඇති බවය. ඒ මේ පිළිබඳ කෙරන ඉදිරි කටයුතු වෙනුවෙන් සමස්ථය එකවර හෙළි නොකිරීමක් ලෙසත් ඒවයේ මතු ආරක්ෂාව සඳහාත් යැයි සඳහන් කරමි. විහාර සිතුවම් හා උක්ත සඳහන් කළ සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය සිතුවම් ගැනද සඳහන් කළ හැක්කේද එවැනිම සඳහනකි.

කෙසේ වුවද ඓතිහාසික හෝ පුරාවිද්‍යාත්මක ගවේෂකයෙක්ට මෙය කදිම තෝතැන්නත් වනු බව සඳහන් කළ යුතුමය. එකල කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ ආගමික අනුග්‍රහය හා ප්‍රතිසංස්කරණ තුළට අදාළ වූ නමුත් දැනට හමුවන මූලාශ්‍රයවල සඳහන් නොවන මේ විහාරස්ථානය සතු විස්තරය දැන් සිට හෝ ඔහුගේ කාර්යය සාඵල්‍ය තුළ හැඳින්වීම අගනේය. එසේම රාජාධි රාජසිංහ රජුගේ කාර්යය ප්‍රමාණ කිරීමේදී ද මේ විහාර කර්මාන්තය එතුමන්ගේ අනුග්‍රහය යටතේ අවසන් වූ බව ඉතිහාසයේ ලියා තැබිය යුත්තේය. එපමණක් නොව මේ ආකාරයේ ගවේෂණ මගින් හෝ අන් ක්‍රමයකින් සොයා ගත හැකි මෙවැනි ස්ථාන රැසක් ලංකාවේ කැමන හෝ පළාතක, දිස්ත්‍රික්කයක පැවතිය හැකිය. ඒ පිළිබඳ නිරීක්ෂණවලින් පසුව ඒවා සමාජ ගත කිරීමේ වැඩ පිළිවෙළක් හෝ අන් යම් ක්‍රමයක් පවත්න්නේ නම් වැළලී ගිය ඉතිහාසය නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමටත් නව්‍ය කරුණු ඉදිරිපත් කිරීමටත් එය මුඛ්‍යතම අවස්ථාවක් වන බව නිගමනය කළ හැකිය. එපමණක් නොව එය ඓතිහාසික හෝ පුරාවිද්‍යාත්මක පර්යේෂකයකු සතු පරම කාර්යයද වන්නේය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


01. තිලකසිරි, සිරි, ꞉1995*, *රාජරත්නාකරය*, ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන.

02. බණ්ඩාර, රාජේන්ද්‍ර, ꞉පරි*, ꞉2011*, ***ජෝන් පයිබස්ගේ දූත මෙහෙවර,*** සූරිය ප්‍රකාශකයෝ, මරදාන.

03. දේවරාජ, ලෝනා, (1997), ***උඩරට රාජධානිය***, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව. කොළඹ.

04. රතනපාල හිමි, නක්කාවත්තේ, ꞉2000*, ***විහාර වංශය බිහල්පොළ වෙහෙරගල ශ්‍රී පාදස්ථාන රජ මහ විහාරය,*** මධ්‍යම සංස්කෘතික අරමුදල සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යංශය, කොළඹ.

05. වාචිස්සර හිමි, කොටගම, ꞉2003*, ***සරණංකර සංඝරාජ සමය***, විසිදුණු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව.

06. විජේතුංග, ඩබ්ලිව්. එම්. කේ. ꞉2016*, ***ශ්‍රී ලංකාවේ ඉතිහාසය IV වෙළුම***, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම. කොළඹ.

07. සුමේධ හිමි, පන්නල, (2016), ***ඓතිහාසික දඹදෙණිය තෙවැනි රාජධානිය***, ප්‍රකාශක ආචාර්ය රෝලන්ඩ් සිල්වා, ග්‍රෙගරි පාර, කොළඹ 07.

08. සෝමතිලක, මහින්ද, (2002), ***මහනුවර සම්ප්‍රදායේ බෞද්ධ බිතු සිතුවම් කලාව***, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

09. සෝමතිලක, මහින්ද, (2009), ***පෘතුගීසි පාලන සමය හා ගන්නොරුව සටන***, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

10. හේමපාල, නුවරඑළියේ, ꞉2003*, ***ත්‍රි සිංහලේ නායකයෝ***, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

11. හේවාපතිරණ, දයා, (2012), ***ශ්‍රී ලංකාවේ විහාරාශ්‍රිත සිතුවම් කලාව***, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

12. හේමපාල, නුවරඑළියේ, ꞉2003*, ***ත්‍රි සිංහලේ නායකයෝ***, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.


## අමුද්‍රිත ලේඛන


13. ඇඹුල්හෙළුව විහාර දිවුණු පත්‍රය
14. ක්‍රි. ව 18 වන සියවසට අයත් ලිපිය
15. ගොඩගංවෙල පුරාණ විහාර තුඩපත
16. මහනුවර යුගයට අයත් සූර්ණිකා පත්‍රය

# Intra-Household Food Sharing in a Selected Semi Urban Area in Matale District: A Case Study

Herath HMDR[1], Angammana BH[2]

## Abstract

Food is one of the basic needs of human beings. According to the biological approach food can be defined as a combination of organic and inorganic elements which need to nurture the human body; Further, food is a cause variable of hungry as hunger is fulfilled by food. When we consider the food consumption in a sociological approach, it is revealed that people get food not only to fill up the hungry but also to fulfill various social needs. It is an appropriate field for researchers. The culture formulated based on selecting, preparing, eating and sharing foods, is called a food culture. Food culture is associated with the customs and values which are established by the Sinhala community. As one aspects of the food behaviour, Intra-household food sharing is important to study. Intra-household food sharing can be defined as the way which people share foods within household. There are many courses that affect for formulation and function of Intra-household food sharing; such as gender and Educational background of the housewives. The semi urban sector of Sri Lanka which possesses both urban and rural characteristics is vastly expanded including most of the geographical territories. The major objective of this research was to identify the patterns of food sharing within households. Other two specific objectives were to identify factors which effect to Intra-Household Food Sharing in selected semi urban area and to identify fallouts of existing ways of sharing food within households. The ethnographic research methodology was applied basically based on ten case studies in the Aluvuhare Grama Niladaree Division of the Matale District of Central Province and observations were used as a research instrument to protect the reliability and validity of data. Since food behaviour can be considered as latent function observations had been affected to maintain the reliability of data. Accordingly, basics facts as gender, education, class relations and axiom of amity, Caste etc had been identified as causes which affect the Intra-Household Food Sharing in selected semi urban area. Especially gender played major role in this content with related to the education level of the housewife and the influence of the ancestral family. As fallouts gender discriminations and some health issues etc. had been identified. In this component caste had been identified as a significant fact as people belongs to castes which considered as high castes attempt to follow traditional practices in sharing foods within the household such as *'mudhun batha'*

***Keywords:*** *Food behavior, Intra-household, Food Sharing, Gender, Semi Urban Sector;Matale District*

---

[1] Proffersor Emaratious, University of Peradeniya, Peradeniya, Sri Lanka, herathsoc@yahoo.com
[2] Senior Lecturer, The Open University of Sri Lanka, Nawala, Sri Lanka, binara.angammana@yahoo.com

**Introduction**

Food can be defined as a combination of organic and inorganic elements which is needed to nurture the human body; also food is a cause variable of hungry in the biological approach, In the consideration of food consumption according the sociological approach, it is noticeable that people consume food not only to have the abdomen failed, but also to accomplish various social needs in day to day life. As mentioned by Doshi in his book 'Anthropology of food and Nutrition', "Food is a bio - chemical process and products which sustain life. But it is not merely the source of bio – chemical needs; it also has a cultural dimension which helps a person to determine his food and nutrition habits and choices" (Doshi, 1995: 11). According to the opinion of Doshi, biological and cultural dimension of food is emphasized. The culture which has been created around the South Asian region; it is called Rice Culture. Most of the cultural attributes within these countries are based on the customs and values associated with paddy cultivation and rice is the staple food among all the South Asians despite their race, caste and colour. The food behavior is a significant concept in this research and there is a special attention driven on the phenomenon of food sharing among others in the neighborhoods or community, as an important element of social behavior of people. The concept of food behavior is significantly addressed in this research. There are differences identifiable among communities regarding the methods of food preparation for consumption and food eating habits. Food sharing is identifiable as occurring in two ways: sharing food within the household and sharing food among the individuals in the community. Sharing of food within the community is the major consideration of this research study. In contemporary Sri Lanka, which is on the top level of south Asian society, even a casual visitor also become impressed by the importance of food in daily life and daily conversation. Food is considered as important medium of keeping contact among individuals. In a society that rests on the regulation of such contact, food is a focus of much taxonomic and moral thought.

Therefore, in this research the topic is taken as 'Intra-household food sharing in a selected semi urban sector in Sri Lanka'. Thus, the identified research problem for this research is; how people share food within the households in the semi urban sector? Subsequently this research had contemplated to study sharing food within the household, which can be easily identified as gastro politics. 'While features of both Urban and Village areas have been mixed in some given area that can defined as a semi urban area' (Educational Publishers Department, 1998:110). There was a general objective and there were other two specific objectives. Those are as follows: the general objective is to identify the patterns of food sharing within households. Specific objectives are to identify factors which effect for sharing food within households and to identify fallouts of existing ways of sharing food within households. Ethnographic research methodology had been applied since the topic is sensitive and with the aim of overcoming the ethical issues of collecting data as the food behavior is a latent day routing for some extent in every household. Therefore, ten case studies have been done and those ten households were selected by using random sampling technique from the research area. Further, both observations and twenty-four-hour

recalling methods had used to diminish the shortcomings of the data analyses. Analyses had been done in qualitatively and basically the cultural, ecological and economical factors was taken as independent variables. ‘Aluwihare’ Grama Niladari Division has been selected as the Research area to conduct this research. It is in Matale divisional secretariat division in the Matale district of the Central Province in Sri Lanka. Most of the people in this area are employed in both governmental and non-governmental (Private) sectors and there are newly settled people who are from the rural areas in the Matale district.

## Results and discussion

### Factors Influence on Gastro Politics and Fallouts of Intra-Household Food Sharing

How people share food within household is a very personal fact in each household. But in any house, there is a routine behavioral practice on Intra-household food sharing and many reasons are been affected to formulate and function of that practice. In the present study, it is essential to study about how housewives select and prepare food for their family consumption. Basically, gender has affected the Intra-Household Food Sharing they concern about the gender and gender relations of their family members when they share foods among themselves.

When we consider about effects of the gender to Intra-household food sharing, it is essential to study about how housewives select and prepare food for their family consumption, for premise all housewives prepare the list of dry and other food which should buy from the market weekly and monthly. Normally when they prepare the list they have a prior discussion with other family members of their own family to ask their preferential foods without considering about own flavor. As they believe it is their responsibility and they do that without any hesitation. Because those believes had been internalized them by varies socialization agents of the patriarchal society. For example,

“*My favorite food is pumpkin. But I can’t even remind a date which I eat pumpkin or brought pumpkin to the home. Why because nobody likes to eat pumpkin in our home. Therefore, I never bring pumpkin”* (but her husband knows her favorite food is pumpkin. very rarely he goes to market and buys pumpkin for his wife”)

(Field study)

Gender is an important fact which influence the Intra-household food sharing and it had been proven through the above statement of the housewife. As present research deserves to study gastro politics, according to folklorist Mr. K.B. Manawa. He pointed out the concept called “*mudun batha*”. According to him *mudun batha* means, after cooking the rice each housewife used to reserve the top and first share of the rice for husbands, whether husband is at home or not this practice is used it as a routine habbit. Though it is called *mudun batha*, housewives used to reserve anything whatever they prep

.are at the household including sweets and other types of foods. In the present research it is identified that *mudun batha* concept is still practicing and it is valid furthermore even in the semi urban sector of Sri Lanka. Also, we realized that the effect of gender in gastro politics. As maintained above women do those kinds of a practices unconsciously. Thai is because from the beginning of the socialization process of our society even in the semi urban sector ideology of differentials between the roles of males and females are internalized to the children to maintain patriarchal traits of this society.

As a post graduate qualified teacher; the house wife plays the subdominant role in each situation including sharing food within household though her husband is not qualified even in the ordinary level examination. Especially when she was eighteen years old, she had faced a heart surgery (Hole in the heart) and because of these reasons her parents arrange that kind of a marriage and she believes that she should respect her husband for the dedication made by her husband to marry a patient like her. But today she is leading a normal with her seven years old daughter and her husband who is elder than her by about ten years without rely on medicine or any other medical treatment. But she is strictly stigmatized by her family and the community as a heart patient. Consequently, she had not been able to come out from those believes and she accepts what others response her as a heart patient. Therefore, she uses gastro politics to admire her husband while maintaining her gender statues.

"The husband's relatives always rank higher and are hence accorded precedence in the serving and eating of food. Conversely, the wife's relatives are treated as somewhat lower in rank under ceremonial circumstances" (Appadurei,1991). As appadurei had pointed out in his research the south Indians treat husband's relatives firstly. But as identified in present study we could not see a kind of a practice in semi urban sector of Sri Lanka.

A special case was reported about a housewife who never considers about her family member's interests when she selects, prepares and shares or eats food in any meal. Further, when she selects or prepares food, she does it as she wishes without any concern about the family members. Her husband is a Grama Niladaree and she has three children. Even at the time of eating food she doesn't think whether her husband or children are eating or not. She is an advanced level qualified Clerk. Because of such behaviour and attitudes, relatives and neighbors have identified her as an abnormal patient. Besides, her husband is now fully addicted to alcohol. Her husband and the community blame her for negligence in caring her family members and many believe that there is a relationship between the ill-treatment and her husband's addiction to alcohol. It is evident that, even in the semi urban sector still society expects women to give priority for food preferences of their family members. That is why the neighbors and relatives identify the women as an abnormal character. The situation in the above-mentioned case can be understood regarding the influence of ancestral family. That housewife's mother had never concerned about her husband flavour even though she was an unemployed housewife. Therefore, such characteristics may have intermixed to form her daughter's personality. As we discussed with the above

examples extracted from the data gathered from the research sample. It is proven that gender is a crucial factor that affects intra-household food sharing, even in all other cases it is demonstrated irrespective of the caste, income or level of education.

Economy or income of the family affects the Intra-household food sharing as it is very important in any case. Especially when they select food, all housewives whether they are employed or not employed, strictly concern about the income of their family. That is because as they are settled in semi urban sector; they must entirely depend on the market for their food requirements. Because of the problem of lack of space in their gardens and the busy life style nobody involves in home gardening. Though some housewives are unemployed they too lead a busy life with the household works and duties. Consequently, they have to consider about the income of their families when they buy food. Especially unemployed housewives strictly concern about the income of the family as those families must entirely depend on husbands' wage and they would have to manage all works with that sufficient or in sufficient amount. People's life style and social class are also specially depending on the factor of income. Especially the high-class people in the present sample try to maintain their status even through the food behavior. As reported in a one case study, a businessman though he has not succeeded on his business and he used to go for dinner out or bring dinner to home from standard hotels where his business colleagues' families used to come for dinner, at least once per week. The thing what can be realized in this case is he does it just for showing off consumption for maintain his status among his business colleagues.

Although eight hose wives are employed in the sample of the present research, as observed unemployed housewives pay more attention on her family members' preferential foods and health than others. Employed housewives must consider about the easiness of access and preparing specially in working days as they must struggle with time. In some households the employed husbands come home during the weekend since they are working in remote areas from home. In such cases housewives must pay attention on the husband's food preferences only during the weekends when he is at home. On the other days they normally give priority to children's preferential foods and they feed them first. With the effects of urban sector and as employed ladies are influenced by their modern colleagues though these husbands and mother in law expects them to treat husband first. But some of them try to ignore those ideas for some extent. As some of them are also in a new mind set on demanding same rights and, status as same as males try to challenge these kinds of traditions.

Moreover, women's or housewife's education level and the education level of the husbands are also affected in selecting food in Intra-household food sharing; especially the housewives' education. Because based on their educational level and the general knowledge, they specially concern about the health of each member of their families when they select foods and preparing food. In one case study, the housewife is unemployed. She is Ordinary Level qualified and as observed she used her leisure time

for reading and watching TV programme which are useful to improve her knowledge on nurturing her family members. For that reason, she is aware about her husband's sickness and genetical tendency in transmitting the same disease for her children. This is an important example to emphasize the relevance of Housewife's educational background in selecting food;

"If there is an only one egg available at home, when I prepare food parcels for all, I used to put that egg to my eldest daughter's parcel. Because now she is seventeen years old teenage and she will have to be pregnant after getting married in near future. Therefore, I have to broadly think about her health. Otherwise one day her mother-in-law or husband will blame me."

(Field study)

The housewife who stated the above mentioned statement is an advanced level qualified unemployed housewife in the science stream and her educational back ground has positively affected for Intra-household food sharing. Above housewife's mother has three daughters, her mother had always concerned about their health, since they would have to deliver babies in future. It is like the practice of intuits food sharing pattern arctic zone. Their main food is seal fish and after they brought the hunted seal fish to the middle of the housing cluster, head or leader of the community, cuts the seal fish. When he does that, he collects fresh blood to his both hands and feeds it to all the small girls in their community. Because they specially concern about girl's health as they are important in reproduction process. Even though Intuits are being identified as a hunting and gathering community by various anthropologists, advanced Intra-household food sharing practices are being practiced by Intuits in their community. As discussed above according to the housewife's knowledge some positive fallout had been occurred specially in girls' health in reproduction. Also, tendency of acquireing non-commutable diseases might be controlled for some extent. Consequently, education level also caused to shape the Intra-household food sharing in the semi urban sector had been demonstrated.

Number of the members in a family is another important variable that influences for the Intra-household food sharing. Especially in the extended families, the income is an important fact that greatly influence the determination of what to consume. If they don't have enough food to share among all the members in the family, a big quantum of food is given only for selected family members to whom that food is suitable to be given. The income of the family is highly

affected the Intra-household food sharing and it is also identified through the present research. As identified in the study, if there is a pregnant woman in the house, all the food selections and consumption of the household is fulfiller based on her requirement and interests in each meal. Not only the meals but also snacks are also prepared in a way she wants. In this kind of a situation we can realize that; axiom of amity also affects Intra-household food sharing. Especially if there is a child with special needs or adult or even a small kid, housewife or another woman of those families tend to serve food at the outset to those kinds of individuals based on axiom of amity. That is basically depending on humanitarian qualities such as love, generous and kindness. Also, in each household they serve a large quantity of special food to kids, based on the axiom of amity which discussed above. Seeing that an act with axiom of amity could be considered as an emotional factor it is being strongly affected for gastro politics in the semi urban sector of Sri Lanka.

In India the caste plays a significant role in food culture. Though the caste is a latent function of the Sri Lankan contemporary society, the caste is also affecting to shape the food behavior. Especially in the percent communities when those household share foods within the community they strictly consider about caste. Further, the high caste people refuse to sit for the meals at a same table with low caste individuals, even in special occasions such as weddings. As a special case was reported, a retired principal who belongs to the radala group of high caste which is in the sample of the present research, had come back home without having lunch after he saw a radawa man (washman) at the wedding which was held in a hotel in Matale town. Although the caste is a latent function, in the present research had identified the caste of each household. As Matale is belonging to Kandyan Region, Kandyan govi caste people ranked themselves as higher than low country govi caste people in the hierarchy. The kandyan radala families are inflexible for some extent and strictly concern about all kinds of traditional practices. It could be observed that they serve food for males in the family first comparing to the people belonging to lower caste families. Absolutely these practices were becoming less important according to the caste hierarchy. That would be because of low caste people do not concern about such traditions as much as high caste people in the semi urban sector of Sri Lanka. Because those radala families which live in the research area; might want and try to keep their statues by following these types of traditional practices of Intra-Household Food Sharing. These traditional practices could be seen for some extent among govigama caste in the present research. But in low caste families they are not much interested to follow traditions. Therefore, we could not see a difference or special feature of food distribution within household in low caste families like Radala and Govigama castes.

When considering the patterns of Intra-Household Food Sharing, basically we paid special attention on serving hierarchy of foods in present study The Sri Lankan society can be identified as patriarchal

society and males of the communities play a dominant role while women play the subordinate role in each situation. But due to the modernization and urbanization some changes were occurred in these gender relations related to gender roles and responsibilities. For an example both two spouses involve in preparing food especially for breakfast seeing that both are employed and struggle with time. Therefore, it is important to study about the pattern of sharing food within household in semi urban sector in Sri Lanka. When we discuss about the patterns of Intra-household food sharing it is essential to study about serving order as well, method of serving and quantity of serving, in order to understand the pattern of gastro politics in semi urban sector.

"…. In the service of food infants and children are served first before anybody takes food. The second in the hierarchy comes the male members of the family. The females take the last turn. The daughter-in-low if there is one in a family takes her foods in the last"(Doshi, 1995:113). Studying what Doshi mentioned in his book on Anthropology of food and nutrition, a hierarchical pattern had been identified in the present research. In the present study as most of the families have small children, children are at the top of priority in the serving order irrespective of the gender. It is not like what Intuits do as explained previously. Based on the axiom of amity they are served first. Also, when considering the age range all children who are served firstly are below ten years old. But two special cases were reported; in a household though they have small children who are below to ten years old, top priority is given to the adult male in that family. Even though they are educated they are practicing and continuing the '*Mudun Batha*' and they do not try to change this practice, as they believe that as traditional family custom. They are from a kandyan radala caste and it was observed that they are inflexible in a certain extent than others.

In some instances, the housewife does not concern about her husband's or children's preferential food and she is accustomed to serve herself first. With the influence of such habits some problems also arise in the household and sometimes the outsiders also intervene in solving those family matters. Other than because of the Intra-household food sharing within their family members that family is very instable now. As realized, this point emphasizes the importance Intra-Household Food Sharing in establishment of structure and stability of a family.

Second priority is given to male adults automatically. Also, in the household which does not have small children; the top priority of serving has gone to adult males. Furthermore, it was especially identified that housewives and elderly women serve themselves at last after serving food for all in the household. As the Sri Lankans are enjoying and interested in hospitality, they habitually invite even unexpected

visitors to have meal with them. Especially they serve male servant as visitors. But when they get the support of female servant that kind of a serving customs could not be identified. The thing what we could realize from this is; serving for male and female servant is also based on gender relations. Furthermore, when there is a patient or pregnant woman below mentioned hierarchy may change and top priority will be given to them based on the axiom of amity. That is also caused by the cultural norms and values regarding pregnancy because that is also identified as an illness in the Sri Lankan context. In the European society it is just biological stage of a woman. But the Sri Lankans are identified that pregnant woman as 'leda' meaning a patient. Therefore, pregnant woman and other patients are served first when they share food in each meal.

Similarly, as discussed, the top priority of serving food is given gone to the small children, mostly because axiom of amity. When serving the small children, the gender is not a face considered by housewives. But the second priority of the hierarchy has given to the adult males. Husbands, young sons, fathers, fathers-in-law and sons-in-law are included for this category in the present research. When there are no any small children in the household the top priority is given to elderly males. The third stage of hierarchy has gone to youths and the gender is considered for some extent. Most of the times male youths were served by housewives prior to the female youths. Most of the housewives even try to emphasize that there is a fair manner in this serving eventually gender has become more significant in food serving among youth males and females. In the stage of elderly children in the hierarchy, the situation is same as youths. Serving method refers to that how food is offered by someone in a household. In the sense it is very important in the present research as it is compelling to study Intra-household food sharing of Semi urban sector. Especially following factors should be considered when discussing in serving method and quantity as well. Those are,

- What is the food served and to whom it is served?
- How much of each food is served and to whom the large portion is served?
- How each individual is served?

Though the Sri Lankan society is identified as a patriarchal society where males are the dominants of family, latently wives take the decisions regarding food behavior. Therefore, in each household of present study of semi urban sector, wives serve food for others in the family in each meal. Since most of the wives and husbands are employed, they have no opportunity to normally get breakfast at their residence on working days, especially during weekdays.

Not only in weekdays but also the situation is same in weekends in most of the families due to their children's tuition classes, dhamma schools and husbands works (As some husbands who are working as security officers or police officers etc., must work in weekends). When they have to make parcels of food, normally wives do it and some husbands assist for that task. But when they are having meals

together they follow two ways. One is, seating at one table and the second way is, serving food in kitchen and eating while watching Television in TV room or living room. Under both two ways which mentioned above housewives used to offer food by her own hand for each household except a special situation like she is in not good health condition. These housewives like to engage in this practice and, they enjoy this practice and satisfied with this practice. By experience each housewife knows about preferential food of each family member and how much they usually eat from those preferential foods. Therefore, when they serve food portion, it is done based on each member's requirement specially. Moreover, it is based on the portion which had been prepared by her. As observed because of females normally use to have small quantity and male are served larger quantity of food by housewives specially flesh foods (non-vegetarian). But when there are leaves or leafy vegetables house wives try to offer large quantity to small children and teenage girls because of the health as mentioned above.

*Different serving methods can be identified as follows in the present research,*

- Serving food without asking from whom the food served.
- The person who needs food asks for food from server.
- Server asks whether the person would like food.
- Self serving.

Gittelsohn (1991) had also identified five serving methods including above four methods. The fifth one which had not been identified in present research is breast feeding. That is especially because of there was no any case which breast feeding was reported in the sample of present study. As present research is from semi urban sector, due to the busy life style of most of the housewives; normally they use to serve food specially lunch and breakfast from the kitchen. Also, especially in each household, the duty of serving food is done by housewife of each household except the special case which had been reported before. But normally in most of the household's family members are seating together at the dinner table especially in weekends. Even who does not have such a facility. They also arrange their dishes in two or three small stools in living room and eat together. This practice could be observed in every household where small children were there. As housewives selected and understood food. It is no need to ask for serve them. But normally when woman serves food in the dinner table or at the kitchen, they ask from all adult males for taking some more food. But when there are other adult women in the household the serving woman does not ask for some more foods as the way she normally asks from adult males. Nevertheless, she serves foods based on those women's request. Through that fact; under the gastro politics serving methods also based on gender is proven and generalized.

## Conclusion

When Intra-Household Food Sharing could be identified as the dependant variable of the present study and many independent variables, which can be considered as causes of formulation and functioning of gastro politics, were identified. Those factors could be determined under the socio economic and socio-cultural traits as well. As Sri Lanka can be identified as patriarchal society masculine and feminine traits are being internalized to everyone in Sri Lankan society through the socialization process. Therefore, males are identified as dominant group they are given priority in each phenomenon. Food behaviour or food culture is also influenced by gender. The Present research under the Intra-Household Food Sharing practices from the beginning of selecting the list of foods to sharing or serving foods, gender plays a major role. In the present research even when many housewives prepare the list they have totally neglected themselves. Also Income, caste, axiam of amity, number of the family members, educational level of the hose wife, ancestral family and health had been identified as major factors which affect to the Intra-household food sharing in semi selected semi urban village. Social stigma has identified as one of the major fallouts of the Intra-household food sharing. Since Intra-household food sharing has identified as importance for stability of family relations and health of the family it is essential to make aware policy makers about the findings of the present research.

## References

Alles, D. (1997). *Traditional Foods cookery down the ages*. Colombo 02:

Appaduai, A. (1981). Gastro politics in Hindu South Asia. *American ethnological society*,8(3)

Doshi, S. L. (1995). Anthropology of food and nutrition. India: Rawat Publications.

Gittlesohn, J. (1991). Opening the box: Intrahousehold food allocation in rural Nepal. *Social Science and Medicine*, 33(10).

Hartong and others. (2006). Retinal Degnerative Diseases. The Lancet, 368(9549).

Miller B. D. (1981). The Endangered Sex: The Neglect of Female Children in Rural North India. Ithaca : Cornell University Press.

Pelto, G.H. (1984). Intrahousehold food distribution paterns in Malnutrition. In: G. Darvis ed., *Science and Medicine*, 25(6).

Pelto, G. H. and Pelto, P. J. (1983). Diet and Delocalization. The Jouanal of Inter disciplinary History. 14(2).

Reeves, S, Kuper, A, and Hodges, D. (2008). *Qualitative research methodologies:* Suzanne, *ethnography*. US National Library of Medicine, National Institutes of Health.

Suzanne, S.Y. (1985). Dietary beliefs in health and Illness among a Hong Kong Community. *Social Science and Medicine*, (2003).

Yalman, N. (1967). Under the Bo Tree Studies in Caste, Kingship and Marriage imperial in Ceylon. Berkely: University of Californiya Press.

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. (1998). මානුෂ භූගෝල විද්‍යාව 1 කොටස. කොළඹ:

ආරියවර්ධන, අනෝමා. (2003). ශ්‍රී ලංකාවේ වෙනස්වන ආහාර පරිභෝජන රටාවන්.

*ආර්ථික විමසුම*, කොළඹ: මහජන බැංකු පර්යේෂණ අංශය.

ඇඳගම, පණ්ඩුල. (1998). ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ආහාර රටාව සහ සූප ශාස්ත්‍රය. කොළඹ:

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පුහුණු කිරීමේ ආයතනය.

පීරිස්, රැල්ෆ්. (2001). උඩරට සමාජ සංවිධාන. බොරලැස්ගමුව: සී/ස විසිදුණු ප්‍රකාශකයෝ,

පුංචිහේවා, ඒ.පී. (1979). ගම සහ විපරිණාමය. කොළඹ 05: මාර්ග ආයතනය .

මානෑව, කේ. බී. (2001). නුවරකලාවියේ ජනවහර. කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

මානෑව, කේ. බී. (2004). නුවරකලාවියේ ජනමජගල්ල. කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

මානෑව, කේ. බී. (2008). ලග්ගල ජනවහර. කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

මානෑව, කේ. බී. (2014). මහතලා ජනවහර. කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

මාලිමගේ, ඒ. (2008). පත්තිනි දෙවි. කොළඹ 10: රත්න පොත් ප්‍රකාශකයෝ.

විජේසූරිය, ඇස්. (1998). ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ආහාර. කෝට්ටේ: සහභාගීත්ව සංවර්ධන පර්ෂදය.

# පැරණි ශ්‍රී ලංකාවේ පැවති දේපළ අයිතිවාසිකම් පිළිබඳ විමර්ශනයක් ශිලාලේඛන ඇසුරින්. (ක්‍රි. පූ. 3වන සියවසේ සිට ක්‍රි. ව. 13වන සියවස දක්වා)

ප්‍රාර්ථනා කරුණාරත්න[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාව සමාජ, ආර්ථික හා දේශපාලන ක්ෂේත්‍රයේ වෙනස්වීම් හා එහි සංවර්ධනයේ හේතු මත ස්වාධීනතා වශයෙන් සමාජයේ ව්‍යවහාර වන අයිතිවාසිකම්වලින් සැලකිය යුතු ප්‍රමාණයක් පසු කාලය වන විට ලිඛිත, නීතිගත අයිතියක් බවට පරිණාමය විය. එම අයිතිවාසිකම් අතරින් දේපළ පිළිබඳ අයිතිය ද මූලික වේ. මෙම අයිතිවාසිකම් පැරණි ශ්‍රී ලංකාවේ ක්‍රි. ව. 8 හා 9වන විටත් පැහැදිලිවම නීතිගතව තිබූ බවට සාධක ශිලාලේඛන අධ්‍යයනයෙන් පැහැදිලි වේ.

මෙම පර්යේෂණයේ දී මූලික අරමුණ වන්නේ අතීතයේ දේපළ අයිතිවාසිකම් පිළිබඳ විමර්ශනය කිරීමයි. ඒ සඳහා ප්‍රස්තුත කාලය වශයෙන් ක්‍රි. පූ. 3වන සියවසේ සිට ක්‍රි. ව. 13වන සියවස දක්වා ශිලාලේඛන අධ්‍යනයට බඳුන් විය. මෙම අධ්‍යයනයේ දී මූලික වශයෙන් ශිලාලේඛන ප්‍රාථමික මූලාශ්‍රය ලෙස යොදාගත් අතර ද්විතියික මූලාශ්‍රය ද ඇතැම් කරුණු විස්තර කිරීමේ දී යොදාගනු ලැබුණි.

අතීතයේ දී ගිහි පැවිදි දෙපිරිසට පොදුවේ මෙන් ම පෞද්ගලිකව ද දේපළ අයිතිවාසිකම් භුක්තිවිඳීමට ඉඩ කඩ ලැබුණු  අතර දේපළ යනුවෙන් මෙහි දී අදහස් කරන්නේ පුද්ගලයෙකු සතු ඉඩම්, ගව මහීෂාදීන් හා නිවාස, යානවාහන මෙන්ම ධනය ආදී සියලු සම්පත් ය. මෙහිදී විශේෂයෙන් අධ්‍යනය කරනු ලබන්නේ අතීතයේ මෙරට වැසියාට හිමි වූ ඉඩම් පිළිබඳ දේපළ අයිතිවාසිකම් පමණි. මෙම ඉඩම් අයිතිය ගිහි පැවිදි යන කොටස් දෙකක් යටතේ වර්ගීකරණය කර අධ්‍යයනය කර ඇත. මෙම ඉඩම් අයිතිය පාරම්පරිකව ද, වෙනත් අයෙකුගෙන් මිල දී ගැනීමෙන් හා රජු විසින් පමුණු වශයෙන් භුක්තිය ද ඇතිව කළ ප්‍රධානයන් වශයෙන් හිමි වූ බව මෙම පර්යේෂණයට යොදාගත් ශිලාලේඛන අධ්‍යයනය මගින් අවබෝධ කරගත හැකිවේ.

***ප්‍රමුඛ පද ඃ*** *ශිලාලේඛන, ගිහි, පැවිදි, ඉඩම්, අයිතිය*

ශ්‍රී ලංකා ඉතිහාසය හැදෑරීමේ දී ඉතා වැදගත් වන මූලාශ්‍රයක් ලෙස ශිලාලේඛන හඳුන්වා දිය හැකිවේ. පැරණි ශ්‍රී ලංකාවේ සමාජය දෙස බලන විට පැහැදිලි වන්නේ අතීතයේ සිටම මෙරට ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ කටයුතු ක්‍රියාත්මක වූ බවයි. ඒ අනුව අතීතයේ සිටම රටේ පාලකයා වන පුද්ගලයා මහජන අයිතිවාසිකම් නිසි ලෙස ආරක්ෂා කිරීමට අතීතයේ සිට ක්‍රියා පටිපාටියක් අනුගමනය කර ඇති බවයි. මේ අනුව ඈත අතීතයේ සිට පැවතගෙන ආ නැතිනම් ශිලාලේඛනවල ව්‍යවස්ථා කර ඇති යම් යම් අයිතිවාසිකම් තවත් නීති රීතීන් ඇතුළත් කරමින් පසු කාලයේ දී ලිඛිත නීතිගත අයිතීන් බවට පරිණාමය විය. පොදුවේ මෙම අයිතිවාසිකම් ගත් විට, ජීවත් වීමේ අයිතිය, වධ හිංසාවලින් මිදීමේ අයිතිය, දේපළ අයිතිය ආදී වශයෙන් වර්ග කළ හැකිවේ. මේ අතරින් දේපළ පිළිබඳ අයිතිවාසිකම් ද

[1] ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය. sumuduprarthana92@gmail.com

ප්‍රධාන වේ. මූලික වශයෙන් ගත්විට මෙම දේපළ පිළිබඳ අයිතිය කොටස් දෙකක් යටතේ වර්ග කළ හැකිවේ.

I. ගිහි පක්ෂයට අයත් ඉඩම්

II. පැවිදි පක්ෂයට අයත් ඉඩම්

*I. ගිහි පක්ෂයට අයත් ඉඩම්*

පුරාණයේ සිට මහ පොළව රජු සතු විය යුතු බවට අදහසක් ඉදිරිපත් විය. සාහිත්‍ය මූලාශ්‍රයවල සඳහන් ආකාරයට අතීතයේ බොහෝ පාලකයන් ලංකා රාජ්‍ය ශ්‍රී මහා බෝධීන් වහන්සේට පූජා කළ බව දක්වයි. දේවානම්පියතිස්ස රාජ්‍ය අවධියේ දී අවස්ථා කිහිපයක දී රජු බෝධි ධ්‍රැමය ලංකා රාජ්‍යයෙන් පිදූ බව දක්වයි. "මම රාජ්‍යයෙන් මහා බෝධිය පුදමි'යි කියා මහා බෝධිය මහා රාජ්‍යයෙහි අභිෂේක කළේය" (ම.ව, 18:37). නැවතත් එම රාජ්‍ය අවධියේ දී රාජ්‍ය මහා බෝධියට පූජා කළ බව දක්වයි. "ඒ මහරජ තෙම නැවත මහා බෝධියමහා රාජ්‍යයෙන් අභිෂේක කොට නා නා පූජායෙන් පුදන්නේ නැවත සත් දවසක් එහිම වාසය කළේය" (ම.ව, 18:60-61). "භූමිපති තෙම මහා බෝධිය රාජ්‍යයෙහි අභිෂේක කොට නානා වි ධ වු මහා බෝධි පූජා ද කර වූයේය" (ම.ව, 18:67). දේවානම්පියතිස්ස අවධියේ පමණක් නොව දුටුගැමුණු රාජ්‍ය අවධියේ ද මහා ථූපය තැනීමේ දී එහි තැන්පත් කිරීමට ගෙන ආ ධාතූන් වහන්සේලා ලංකා රාජ්‍යයෙන් පිදූ බව දක්වයි. "ඒ නරේන්ද්‍ර තෙම දිව්‍යච්ඡත්‍රයෙන් ද, මානුසිච්ඡත්‍රය ද, විමුක්තිච්ඡත්‍රය ද යන ඡත්‍රයය දරන්නා වූ ලෝකස්වාමී වූ ශාස්තෲන් වහන්සේට තුන් යළක්ම මාගේ රාජ්‍යය දෙමි'යි කියා ෂතුටු සිත් ඇත්තේ ලංකා රාජ්‍ය තුන්වරක් ධාතූන්ට පිදූයේය" (ම.ව, 31:91-93). " .......රජ තෙමේ ඒ ධාතූන් සේසතින් පිදූයේය. ලංකාවෙහි සියලු රාජ්‍යය සත් දවසක් දුන්නේය"(ම.ව, 31:111-112).

අතීතයේ පාලකයන්ට මේ ආකාරයට ලංකා මහීතලයම ශ්‍රී මහා බෝධියට හා ධාතූන්ට පූජා කිරීමට හැකි වූයේ මහ පොළව රජු සතු වූ නිසා බව මින් පැහැදිලි වේ. යම් අයෙකුට රජකම හිමිවීමෙන් පසු ඔහුට හෝ ඇයට එම රාජ්‍යයත්වය නැමැති දේශපාලන සංස්ථාව හා විවිධ බලතල හිමි විය. එම බලතල හා වගකීම් හිමි වූ රටේ පාලකයාට දේපළ නැතිනම් ඉඩකඩම් සම්බන්ධයෙන් සුවිශේෂී අයිතිවාසිකමක් හිමි විය. අස්වාමික වූ ඉඩම් පමණක් නොව කැලෑ ඉඩම්හි හිමිකරුවා ද රජු විය. එමෙන්ම රජුට රාජ්‍ය තුළ සෑම ඉඩමකින්ම බදු අය කිරීමේ අයිතිය වාගේම වැරදිකරුවන්ගේ ඉඩම් රාජසන්තක කරගැනීමේ අයිතිය ද රජුට හිමිව තිබූ බවට සාධක ඇතැම් මූලාශ්‍රයවලින් හමුවේ. මීට කදිම උදාහරණයක් මහසෙන් රාජ්‍ය කාලයෙන් හමුවේ. මහා විහාරික භික්ෂූන් මහා විහාරය අතහැර ගිය අවස්ථාවේ සංඝමිත්ත භික්ෂූව එම ඉඩම් රජුගේ යටතට ගැනීමට උත්සාහ දරා ඇත්තේ අස්වාමික දේපළ රජු සතු බව පවසමිනි."හොති අස්වාමිකං වත්ථු පුථුවි සාමිනො........."(ම.ව, 37:8,9). රජු රාජ්‍යයේ සියලු ඉඩම් හිමිකරුවී ය. යන අදහස ඉදිරිපත් වීමට මූලික හේතු දෙකක් ඇති බව ඉන්ද්‍රකීර්ති සිරිවීර මහතා පෙන්වා දෙයි. ඉන් පළමුවැන්න නම් සාහිත්‍ය ග්‍රන්ථ, වංසකථා හා ඇතැම් සෙල්ලිපිවල රජු හැඳින්වීම සඳහා භූපති, මහීපති, පඨවිපති, වත්හිමි සහ පෘථුවීශ්වර යන කාව්‍යමය යෙදුම් භාවිතා කර තිබීම ය. මුහුදුබඩ ප්‍රදේශ පාලනය කළ ප්‍රතිකාලුන්ට හා ලන්දේසීන්ට ද, ඉංග්‍රීසීන්ට ද රජු භූපතිය යන

අදහස උපයෝගී කරගෙන තම ඉඩම් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අවස්ථාව ලැබීම දෙවැන්නයි. නමුත් වංසකථා හා සෙල්ලිපි හොඳින් විමර්ශනය කළ විට මේ අදහස සාවද්‍ය බව පෙනේ (සිරිවීර,2002,256). කෞටිල්‍ය අර්ථශාස්ත්‍රයට අනුව අත්හරින ලද ඉඩකඩම් මෙන් ම හිස් බිම් හෙවත් පදිංචි නොවන ප්‍රදේශ ද රජුන් සතු වේ (කෞටිල්‍ය අර්ථශාස්ත්‍රය, අධිකාර 3-7, 9:17, පි. 52). මෙය පැරණි ලංකාවේ ද ක්‍රියාත්මක වන්නට ඇති බව සිරිවීර මහතා තවදුරටත් පෙන්වා දෙයි.

රජුට සෑම ඉඩමක්ම අයත් වුවත් ඒවා පරිහරණය කිරීමේ දී රජුට ඒකාධිපති ප්‍රතිපත්තියක් ගෙනයාමට නොහැකි විය. රජුට පමණක් නොව සාමාන්‍ය ජනයාට ද ඉඩකඩම්වල අයිතිය හිමි වූ බව පැරණි ශිලා ලේඛන සාධක අනුව තහවුරු වේ. ඒ බව වඩාත් පැහැදිලි වන්නේ පැරණි ශිලා ලේඛනවල යම් යම් පුද්ගලයන් පෞද්ගලිකව ඉඩම් විකුණූ හා ඒවා ප්‍රදානය කළ අවස්ථා ද සඳහන් වීමෙනි. එම සෙල්ලිපි සාධක අතර රජු ද යම් යම් පුද්ගලයින්ගෙන් ඉඩම් මිලදී ගත් අවස්ථා දක්නට ලැබේ. විහාරේගල සෙල්ලිපියේ සභ නම් රජු ඒකද්වාරික විහාරයෙහි උපෝසථාගාරය කරවා උත්පල ද්‍රෝණික වැව පන්සියයකින් (මිලදී) ගෙන පන්සියයකින් පස් ඉවත් කර භික්ෂු සංඝයාට දුන් බව දක්වා ඇත. "සිධ සබ රජෙ එකදොරික විහරහි පොහතකර කරවය උපලදොණික වවි පවසතෙ(හි) කිණිය පවසතෙහිය පසු ඔවය බිකුසගහටය දිනෙ"(E.Z., vol. III, p.165). නාගිරිකන්ද ලිපිය ද මෙවැනි උදාහරණයක් දක්වයි. මෙම නාගිරිකන්ද ලිපියට අනුව කුමාරදාස නම් රජු විසින් මිලට ගත් බමණගිරිය විහාරයට පරිත්‍යාග කළ මහගිරිය වැව හා වැසර (කුඹුරු)ද, වුගරිය වැව වළසර (කුඹුරු)ද, කබුබෙ වැව හා කුඹුරු ද, කටවනකපු කුඹුරු ද, මේ වැව් සතර හා කුඹුරුද දිය බද්දේ (කොටස) දී (කඩා) ඉඩම් හිමියා සතු කොටස් බමණගිරිය විහාරයේ භික්ෂූන්ගේ සිව්පසය සඳහා ලබා දෙන ලද බව දක්වා ඇත."මහ කුමාරතස රජ අපය (හ බමණග)රිය වහෙරටය කෙණෙවි වඩ කොටුදිනක මහගරිය වෙවසර (ෙ)ව වුගරිය වෙවසර (ෙ)ව කබුබෙ වෙවසර (ෙ)ව කටවනකපුලසර වෙ (වෙ)වව (ෙ)ව ම වතර වෙවසර දකපෙත කඩය බෙජිපෙත පමණගරිය වෙහෙරෙ බිකු සඟහට චර පවයට දිනෙ"(E.Z., vol. Iv, p.123). මෙම ලිපියේ එක් තැනක *"මෙ අතනො සිමෙ"* යනුවෙන් දක්වා ඇත්තේ තමන්ට හිමි නැතිනම් තමන්ට අයිති යනුවෙනි. ඒ අනුව සාමාන්‍ය පුද්ගලයන් සතු දේපළ අයිතිය රජවරු විසින් මිලදී ගෙන භික්ෂූන්ට පූජා කළ බව පැහැදිලි වේ.

රාජ්‍ය පාලකයන්ට ඉඩම් හිමි වූ බව මහාවංස සාධක අනුව ද පැහැදිලි වේ. ඉළනාග රජු සතුන්ට ද ජනපද ප්‍රදානය කරඇති බව දක්වයි. "රජ තෙමේ ඇතු විසූ ජනපදය ඇතුට දුන්නේය. එහෙයින් නමින් 'හස්ති භෝග ජනපදය' වී" (ම.ව, 35:44-45). මෙවැනි උදාහරණ රැසක් මහාවංසයෙන් හමුවේ. ක්‍රිස්තු වර්ෂ දෙවන සියවසේ දී පළමුවන ගජබාහු රජු සහ රජුගේ මව විසින් කහවණු ලක්ෂය බැගින් වෙන වෙනම මිල ගෙවා ඉඩම් දෙකක් පිලිවෙළින් මිරිසවැටි විහාරයට හා මහාවිහාරයට පූජාකළ බව මහාවංසය දක්වයි (ම.ව, 49:52). පළමුවන කාශ්‍යප රජු ද ඉසුරුමුණි විහාරයට පූජාකළ ඉඩම ලබාගෙන ඇත්තේ පුද්ගලික ඉඩම් හිමියෙකුට මුදල් ගෙවීමෙන් පසුවය (ම.ව, 39:10). පළමුවන කාශ්‍යප රජු විසින් ඉළනාග රජුගෙන් පසුව රාජ්‍යත්වයට පත්වන චන්‍ද්‍රමුඛසීව රජු ඉසුරුමුණි විහාරයට වැවක් පූජා කළ බව දක්වයි. "ඉළනාග රජු ඇවෑමෙන් ඔහු පිති චන්‍ද්‍රමුඛසීව රජ අට හවුරුදු සත් මසක් රජය කරවීය. ඒ මිහිපල් මණිකාරගම වැවක් කරවා ඉසුරුමුණි විහාරයට පිදීය"(ම.ව, 35:46-47). බොහෝ පාලකයන් තමන්ට හිමි දේපළ ආගමික සිද්ධස්ථානවලට පූජා කළ බවට සාධක ඇත. "දෙමළ දේවී යයි ප්‍රසිද්ධ ඒ රජහු බිසව් ද ඒ ගම්හි තමහට උපදනා ලාභව එම වෙහෙරට පිදුවා" (ම.ව, 35:47-48). වසභ රාජ්‍ය

කාලයේ දී වැවක් කරවා පූජා කළ බවට සාධක හමුවේ. "ගලඹයතොට සෑයෙහි උළුවස්ස ද කරවීය. පොහොය ගෙය ද කරවීය. මෙම පොහෝ ගෙය වැටි තෙල් පිණිස ඒ තෙමේ දහස්කිරිය වැව ද කරවා දුන්නේය"(ම.ව, 35:85-87). පණ්ඩුකාභය රාජ්‍ය කාලයේ දී කුඹුරු වගා කළ බවට ද සාධක හමු වේ. පණ්ඩුකාභයගේ පාලි කුමරියගේ පියා ගිරිකණ්ඩ ශිව කුඹුරු වගා කළ බව දක්වයි. ඇතැම් විට තමන්ට අයත් ඉඩම්වල මෙම වී වගාවන් සිදු කරන්නට ඇති බව සිතිය හැකි වේ."ඒ ක්ෂත්‍රිය තෙමේ එ කල්හි සියයක් කිරියක පැසුණු ගොයම් කප්වයි"(ම.ව,10:30-31). මෙම කෙත්වතු පරම්පරාවෙන් උරුමවන්නට ඇති බව ද සිතිය හැකි වේ. මේ අනුව අතීතයේ අපේ රටේ සිටි පුද්ගලික ඉඩම් හිමියන් ද, වැව් හිමියන් පිළිබඳව ද රැසකගේ තොරතුරු වංසකථාව හා සෙල්ලිපි අධ්‍යයනය මගින් හඳුනාගත හැකි වේ. ක්‍රිස්තු පූර්ව යුගයේ ශ්‍රී ලංකාවේ ප්‍රදේශ කිහිපයක කරීස (අමුණු 4ක්) සිය ගණන් විශාල කුඹුරු පවත්වාගෙන යනු ලැබූ පෞද්ගලික ඉඩම් හිමියන් කිහිප දෙනෙකු ගැන රසවාහිනිය, සීහළවත්ථුප්පකරණය ආදී මූලාශ්‍රයවල සඳහන් වී ඇත.

ශිලා ලේඛන අනුව පැහැදිලි වන්නේ සාමාන්‍ය ජනයාට ද, උපාසකවරුන්ට ද, පරුමක නම් ප්‍රාදේශීය පාලකයන්ට ද දේපළ හිමි වූ බවයි. මණ්ඩලගම ලිපියට අනුව ග්‍රාමික සාතකගේ පුතා ගණකාධිකාරී නුගුයගේ දුහිතෘ දාරක තිස්සාගේ ලෙණ සංඝයාට ඉදිකරවන ලද බවත් මරගම නම් වූ වැවක් ද කරවන ලද බවත් මෙසේ සඳහන් වේ."ගමික ශතක පුත ගණක නුගස ඣිතය දරක තිශය ලෙණෙ ශගශ පදිටිතේ වපික කරපිත මරගම ම....."(I.C, vol. I, p.44, No:576). හලඹගල ලිපියේ සඳහන් වන්නේ උතුර නැමැත්තා සතුව තිබුණු වැව වස් කාලයේ භික්ෂූන්ගේ ප්‍රයෝජනය සඳහා පූජා කළ බවයි."උතරහ වවි තෙරහ කුම්ය නියතෙ වසවසිකෙ..............."(I.C, vol. I, p.100, No:1228). තෝරමයිලෑව ලිපියට අනුව පුනපිටික වැව හිමි වූ උපාසක විණු පිළිබඳ දක්වා ඇත. "පුනපිටික වවි හමික උපසක විණුහ ලෙණෙ..............."(I.C, vol. I, p.99, No:1217). ගලගමුව ශිලා ලිපිය අනුව අභය රජු වඩ්ඪමාන ගමේ ප්‍රාප්තිය (බද්ද) ද, වැව ද මහා විහාරයේ සංඝයාට පූජා කළ බව දක්වයි. "රඣ අබයෙ දිනෙ පති වඪමනගම මහ-විහරහි ශගශ වාවිච..............." (I.C, vol. I, p.99, No:1216). නා උල්පත ලිපිවල එක් ලිපියක ගාමිණී අභයගේ කුඹුර සංඝයාට දෙන ලද බව දක්වා ඇත. "ගාමිණී අබයෙ කුඹුර සඟ දිනෙ"(I.C, vol. I, p.99, No:1217). ගමිණීවරුන් පමණක් නොව පරුමකවරුන් ද වැව් පූජා කළ බවට සාධක හමුවේ. එරියාව ශිලා ලිපියට අනුව පරුමක යශෝපාලගේ පුත්‍ර පරුමක පාදක විසින් මෙම වැව දිපිගල විහාරයේ සංඝයාට පූජා කළ බව දක්වයි. "පරුමක යහපල පුත පරුමක හදනෙ ඉම වපි දිපිගල විහරහි නියතෙ ශගශ.............."(I.C, vol. I, p.99, No:1225). තෝණිගල ශිලා ලිපියට අනුව පරුමක අභයගේ පුත්‍ර පරුමක තිස්සගේ වැව අච්ඡගිරික තිස්ස පබ්බතයෙහි සංඝයාට පූජා කළ බව දක්වා ඇත."පරුමක අබය පුත පරුමක තිශහ වපි අචගිරික තිශ පවතහි අගත අනගත චතුදිශ ශගශ දිනෙ" (I.C, vol. I, p.82, No:1051). මේ අනුව රජවරු පමණක් නොව සාමාන්‍ය පුද්ගලයින්ට ද දේපළ හිමිව තිබූ බව පැහැදිලි වේ.

ශිලාලේඛන පිළිබඳ දැක්වීමේ දී සාමාන්‍ය ජනයා සතුව පැවති ඉඩම් අයිතීන් ද ඒවා මිලට ගැනීමමෙන් ම අන්නයන්ට ප්‍රදානය කළ අවස්ථාව ද දැකගත හැකි වේ. එප්පාවල ශිලාලිපියට අනුව වෙලෙත්මේ මිහිඳු රන් කළං අටකට තම කුඹුරෙහි කොටසක් තවත් අයෙකුට විකුණූ බව දක්වයි. "හවුරුදුයෙහි නිකිමනියැ පුර තිසවැකැ උකුණුහුසු කොට්ටාම් වෙලත් මෙ මිහින්දු අට් කලන්දකට් මට්

විකිණැ....."(I.C, vol. iii, p.190). කහවනු හාර දහසකට ගාමිණි අභය රජුගේ මවට විකුණූ වැවක් ගැන විලේ වැව සෙල්ලිපියේ සඳහන් වේ. ගලපාත විහාර ලිපියට ද අනුව පිරිසක් විසින් විහාරයට කරන ලද ඉඩම් ප්‍රදානයක් ගැන සඳහන් වේ. "දෙමළ (අධිකාර කහමබල්කුළු මිඳැල්)නා වමහ අප හා අපගේ මෑණියන් වහන්සෙ හා අපගේ බෑන මියගුණුබිම් කොදානාවන් හා දෙගලතුරුබිම් විජයනාවන් හා අපගේ නෑ කටුවිත්තා සැතුමබ හා.........වූන් වෙල්ගම්මුළට බද ව සඩ්ධර්ම රාජන්පිරිවනට ඇතුළත් කොටැ රාජසම්මත ඇති වැදාගප් මාබො පිළිම පිහිටුවා අප කැරැ වූ ගල්පාත-විහාරයට......කොටැ මෙමැ විහාරයෙහි වැඩ හිඳිනා වහන්සේවරුන්දට ප්‍රත්‍යය පිණිසැ හා ලු අප සිපරපුර රැ වැ වළඳා ආ සියම්බලාපය හා මෙහි මැ බද වියළ තැනු සුඹුළුපත් හැල්ල ඇතුළු වූ තැනැකුඹුරු හා මෙහි පොල් පුවක් ඇතුළු වූ කොළවෙස් අය කුසලාවන් නොටැ හා කුන්රාමාශාතතුනාවන්ට රන් ධීලා ගත් බෙම් තොටැ තාවළමට ඇතුළත් ටිගවටු නාගයෙන් විහාරයට පැදුම් දිගින් කුඹුක් හිඳිවූ පොකුණ හා දකුණු දිගින් කළපුව හා පැළදිගින් උඩයාදශපාලයන්ගේ චතුබඩැ පොකුණ හා උතුරු දිගින් නම් සෙට්ටි හිඳු වූ පොල්වතු භාගයෙහි....."(E.Z, vol. iv, p.203). යනුවෙන් කළ ඉඩම් ප්‍රදානයක් පිළිබඳව සඳහන් වන අතර මෙම සෙල්ලිපියේ ඇතැම් සාධක අනුව ඇතැම් පුද්ගලයන් තවත් අයෙකුගෙන් මිලට ගත් අවස්ථා ද සඳහන් වේ. එහි සඳහන් *"කුන්රාමාශාතතුනාවන් රන් දීලා ගත්"* යන පාඨය අනුව පැහැදිලි වන්නේ තවලම් නායකයා රන් ලබා දී මිල දී ගත් ඉඩමක් පිළිබඳවයි.

මේ අනුව ඉඩම් මිල දී ගැනීම, ඉඩම් ප්‍රදානය කිරීමට සාමාන්‍ය ජනයාට ද හැකි වූ බව පැහැදිලි වේ. මේ අනුව ඔවුන්ට ද දේපළ පිළිබඳ පෞද්ගලික අයිතියක් තිබූ බව අනුමාන කළ හැකිය. ප්‍රධාන වශයෙන් මෙම ඉඩම් අයිතීන් ආකාර කිහිපයක් යටතේ දැක්විය හැකි වේ.

01. ප්‍රවේණිගත හෙවත් පරම්පරාවෙන් උරුම වූ ඉඩම්.

02. උකස් දිවෙල් අයිතිය හිමි ඉඩම්.

03. රජු විසින් ඉඩමක පමුණු භුක්තිය ද ඇතිව ප්‍රදානය කිරීමෙන් අයිතිය හිමි ඉඩම්.

වශයෙනි. පරම්පාරවෙන් පැවත එන ඉඩම් *"ප්‍රවේණි"* හෙවත් *"පමුණු"* යනුවෙන් හඳුන්වයි. 14 වන ශතකයෙන් පසු *"පමුණු"* යන්න වෙනුවට *"ප්‍රවේණි"* යන පදය වඩා ප්‍රචලිත විය (සිරිවීර, 2002, 263). ප්‍රවේණිගත ඉඩම් ප්‍රධාන වශයෙන් පවුලේ ප්‍රධානියා මියගිය පසු පිළිවෙළින් ඔවුන්ගේ දරු මුණුබුරන්ට හිමි වී ඇත. වසභ රජුට අයත් පෙරිමියම්කුලම් ලිපිය කුල සතක උරුමය පිළිබඳ දක්වා ඇති පැරණිතම සාධකයකි. "කිහලක කනියෙහි පලොනකරක වවිය දකපති මතෙර මජිබක දිනි, බඩකරිය බතකයහ පුති අයිසයිහ නවක නකයහ ලතනගලහි පිණ පටිසතරිය කමකරනක කොටු අමරතනෙහි කෙතවලක වවිය දකපති තුමහ පිටසතක කොටසහ තිපතිය නහති මජිබිනක සතතනි මෙ දකපතිය සකොටසහි එක කොටසපති" (E.Z, vol. i, p.69, No.6). මෙහි "පිටසතක කොටසහ" යනුවෙන් දක්වා තිබීමෙන් පැහැදිලි වන්නේ එම වැවේ අයිතිය පියාගෙන් උරුම වූ බවයි. මෙහි "මතෙර මජිබක" යනුවෙන් අදහස් වන්නේ *'මත්ස්‍ය භාගය, මාළු ඇල්ලීමෙන් ලැබෙන ආදායම් කොටස'* යන අදහස ද ඉදිරිපත් කොට ඇත (අමරවංශ, 1969, 121). පෙරියකඩු විහාර ගිරි ලිපිය, ගල්වැව විහාර ලිපිය, තිඹිරිවැව ලිපිය යන ලිපිවල ද මතෙර මජිහක භික්ෂූන්ට පූජා කළ බවට සාධක දක්වා ඇත. මේ අනුව එම වැව්වල උරුමය හිමි පුද්ගලයින් මෙම බද්ද අය කරන්නට ඇති බව සිතිය හැකිය. ක්‍රිස්තු වර්ෂ 1 වන සියවසට අයත් කෝක් එබේ ගිරි ලිපිය (I.C, vol.ii, p.120) තලතා කුමරිය තමාට හිමි වූ ප්‍රවේණිගත ඉඩම්වලින්

කොටසක් විහාරයට ප්‍රදානය කළ බව දක්වයි. ක්‍රි.ව 2 වන සියවසට අයත් තිඹිරිවැව සෙල්ලිපියෙහි " අනුලබි" නම් කාන්තාව තම පවුලෙන් ඇයට උරුම වූ වැවේ ආදායම "ගගපවත" නම් විහාරයට ප්‍රදානය කළ බව දක්වා ඇත (I.C, vol.ii, p.186). මෙම සෙල්ලිපි දෙකෙහිම සඳහන් "තුමහ කුල සතක" යන සඳහනෙන් තමාගේ කුල පරම්පරාවේ උරුමය යනුවෙන් කරන්නට ඇති බව සිතිය හැකිය. මොලාහිටිය වෙලේගල ලිපියේ දේවානම්පියතිස්ස මහ රජුගේ මුණුබුරු වූ කුඨකණ්ණතිස්ස රජුගේ වැඩිමල් පුත් අභය රජු විසින් "අතර ගග" නම් ස්ථානයෙහි ගණතකහ නම් ඇළ පිළිපවත විහාරයෙහි භික්ෂු සංඝයාට පූජා කළ බව දක්වයි. "දෙවනපිය තිස මහරජ - මරුමණක කුඩකණ රජහ ජෙට පුතෙ රජ අබයෙ අතරගගහි ගණ-තකහ අඩි පිලිපවත විහාරහි බිකු සඟය................." (E.Z, vol.iii, p.153). මෙම "අතරගගහි" යනුවෙන් අදහස් වන්නේ මහවැලි හා අඹන් ගඟ අතර බව ගෛගර්ගේ අදහසයි. ගං දෙක අතර පිහිටි අන්තරාගඞ්ග පෙදෙස බව පරණවිතාන මහතාගේ අදහසයි (අමරවංශ හිමි, 1969,116). ඒ අනුව දේවානම්පියතිස්ස රාජ්‍ය කාලයේ සිට මෙම ප්‍රදේශ ඔවුන්ට හිමි වූ පාරම්පරික ඉඩම් බව සිතිය හැකි වේ. පවුලකට අයත්ව තිබූ ලෙන් පිළිබඳව සාධක ශිලා ලේඛන මඟින් හමුවේ. මේ අනුව වෙස්සගිරි ලිපිවල එක් ලිපියක "ගොණුතර කලහ" ලෙස දක්වා ඇත්තේ සෝණුත්තර පවුල යන අර්ථය දක්වයි. ඒ අනුව එම පවුලේ මුණුබුරෙකු වූ සුමනගේ පුත් සෝණුත්තරගේ ලෙනක් පිළිබඳව දක්වා ඇත. ප්‍රවේණිගත දේපළ පිළිබඳ වැදගත් සාධකයක් ලෙස මෙය පෙන්වා දිය හැකිය. ඊට හේතුව ඔවුන් සාමාන්‍ය පවුලක පුද්ගලයන් වීමයි. "ශොණුතර කුලහ මරුමකනෙ සුමනහ පුතෙ ශොණුතර(හ) ලෙණෙ........."(E.Z, vol.i, p.10). දෙවනගල ශිලා ලිපියේ ද නගරගිරි කිත්තිට පිරිනැමූ ප්‍රවේණි ඉඩම පිළිබඳව සඳහන් වේ. "කිත්නුවරගලුන්ට හිරිසන්ද පවත්නා (තෙක් සිටින) පරිද්දෙන් මෙග(ලැ) කොටාදුන් මලබටුව හා....හා කිත්සෙන් පවුයෙන් බිජුවට දොළොසමුණු දෙපෑළක් ඇතුළු වැ දෙයාළක් පමුණු කොට දුන්නේයි" (E.Z, vol.iii, p.321). ලිපියේ සඳහන් අයුරින් පමුණු ගම්වල වපසරිය අමුණු 52, පෑළ 2ක් වේ.

මේ අනුව ප්‍රවේණි හෙවත් පමුණු ඉඩම් පරාක්‍රමබාහු රජු විසින් ඔහුට ප්‍රදානය කරන ලදී. නිශ්ශංකමල්ල රජු විජය නම් නිලධාරියෙකුට ද මෙවැනි ඉඩමක් ප්‍රදානය කර ඇත. එම ඉඩම් ද මෙවැනි ඉඩම් ලෙස සැලකිය හැකි වේ (E.Z, vol.v, p.203). ක්‍රි . ව 1458 පමණ අයත් මඩවල ශිලාලිපියෙහි "පරමණයා" නම් කම්මල්කරුට පිරිනැමූ "පමුණුව" ඔහුගෙන් පසු ඔහුගේ පුතෙකුට හිමිවිය යුතු බව දක්වා ඇත. " මඩවළ කුඹුරු බිජුවට සමුණ හා මෙහි බද ගම්මුදල ගස කොළ වල්පිට ඇතුළු වූ තැන් සිද්දාවුලෙල ආචාරි පරමණයාට ප්‍රවෙණිට සලස්වා මෙකු පුත් සූරියාට ප්‍රවෙණි සැලැස්මට ඉර සඳ ඇති තෙක් පවතින ලෙසට සලස්වා........." (E.Z, vol.iii, p.239) යනුවෙන් පරම්පරා උරුමය පිළිබඳ දක්වා ඇත. රජුට හිතවත් හා යුද්ධවල දී දක්‍ෂතා දැක්වූ පිරිසට ද රජු විසින් ඉඩම් පිරිනැමූ බවට සාධක හමුවේ. එනම්, ගුල්පිටි බූත් නැමැත්තා යුද්ධයේ දී දැක් වූ දස්කම් නිසා ඔහුට ඉඩම් ප්‍රදානය කළ බව සාහස්සමල්ල රජුගේ කෙවුල්ගම ශිලා ලේඛනයේ සඳහන් වේ. "ගුල්පිටි බූත් පාඹුල්ලේදරුවන් රාජපක්‍ෂපාත වැ ශස්ත්‍රප්‍රහාර ලදින් කළ දස්කමට මෙවනු මුත්හස පටන්.......පමුණු කොට ලියා දුන් නියායි" (E.Z, vol.iii, p.233-234). මේ අයුරින් ලබා දුන් ඉඩම් සමහර විට රජුට පෞද්ගලිකව අයත් නොවූ ඉඩම් විය හැකිය.

පමුණු ලබන්නට නම් ඉඩමේ අයිතියට පුළුල් හිමිකමක් ලැබී තිබුණි. එයින් බදු හෝ ආදායම් රජයට ලබා නොගත්ත ද ඇතැම් අවස්ථාවල රෝහල් හෝ විහාරයකට හෝ තම දේපළ (පමුණෙහි)

ආදායමෙන් කොටසක් ලබා දීම සිදු කළ බවට සාධක ශිලාලේඛන මගින් හමුවේ. "උදා මහාපාණන් වහන්සෙ මහවෙහෙර ඇත් වෙහෙරට් කැරුණු හසැ කිරි අමුණබා දී වළඤනු කොට අ(ග්) බො මුගයින් වරදාණන්ට ගෙව්හසින් පමුණු කොට වදාළ මහමිණි ලැබ්(මිහිආවු)............"(E.Z, vol.iv, p.188). ඒ අනුව අභයගිරි විහාරයට වාර්ෂිකව තෙල් ප්‍රමාණයක් සැපයූ අතර තවත් අයෙක් මහා විහාරයට සතර අමුණක අස්වැන්නෙන් වී අමුණක් සැපයි ය යුතු බව ගොන්නැව ලිපිය දක්වයි.

ඉඩම් පිළිබඳ "උසස්ම හිමිකම" ඇති පමුණුලාභීන්ගේ නැතිනම් ප්‍රවේණිය හිමියන්ගේ "අයිතිය" පවා පූර්ණ නොවන බව මෙම කරුණු මගින් පැහැදිලි වේ. තවත් අයෙකුගෙන් මිල දී ගැනීමෙන් ද කිසියම් කෙනෙකුට ඉඩම් හිමිවිය හැකි වේ. මෙය සාමාන්‍යයෙන් ඉඩම් හිමිවීමේ නැතිනම් සාමාන්‍ය ජනයාට ඉඩම් අයිතීන් ලැබෙන දෙවන අවස්ථාවයි. එප්පාවල ශිලා ලේඛනය මීට නිදසුන් සපයයි. "උකුණුහුසු කොට්ටාම් වෙලත් මෙ මිහින්දු අට් කලන්දකට් මට් විකිණැ තිබූ ගලම්බුරු කැරැයෙහි එක් පයක් ඉසා මා අතින් විපොලියට්දුන් දෙකළන්දක් ඇතුළු වැ දසකළන්දක් රන් ප(ම)ගුලු අරැම පිළිම ගෙහි.................."(E.Z, vol.III, p.188). මේ අනුව වෙලත්මේ මිහිඳුගේ ඉඩම උකුණුහොසු කොත්තා නම් අය මිල දී ගත් පසු එය පසුව සඳහන් පුද්ගලයන්ගේ පමුණු ඉඩමක් විය. තමා කැමති පරිදි උකුණුහොසු කොත්තා විහාරයකට ප්‍රදානය කළේ එම ඉඩම පිළිබඳ පූර්ණ අයිතිය වෙලත්මෙ මිහිදුගෙන් පසු ඔහුට හිමි වූ බැවිනි.

උකස් භුක්ති ක්‍රමය ද ඉඩම් භුක්ති අතර දක්නට ලැබේ. ඉඩමක් උකසට ගන්නා පුද්ගලයා පොලිය වෙනුවට ඉඩම් භුක්ති විඳීමේ ක්‍රමය උකස් භුක්ති ක්‍රමය ලෙස හඳුන්වයි. නියමිත කොන්දේසි මත උකසට බැඳී සිටින පුද්ගලයාත් කටයුතු කළ යුතුවිය. උකස් කරන්නා විසින් යම් වගාවක් කර ඇත්නම් උකස් ඉඩම් ලබාගන්නා පුද්ගලයාට එය ඉල්ලීමට අවසර නොලැබුණි. ඒ කන්නය නැතිනම් වගාව නිමවනතුරු සිටීම සිදු කළ යුතුය (කොඩ්රින්ටන්,1938,19). කළුදිය පොකුණ ශිලා ලිපිය මීට නිදසුන් සපයයි. "පණගම (අතුල්) මෙතුවාක්.....මෙතුවාක් තන්හි.......දියවන් (කුඹු)ර් *උකස් පමුණු* පාට්ට කැරැ" (E.Z, vol.III, p.264) යනුවෙන් මෙහි සඳහන් වී ඇති "උකස් පමුණු" යන්නෙන් පමුණු ඉඩම් ඉඩම් උකසට තැබීම අදහස් වන්නට ඇති බව විද්වතුන්ගේ අදහසයි. 9 හා 10 ශතවර්ෂයට අයත් ශිලාලිපිවල මෙය සඳහන්ව ඇති අතර ඊට පෙර සිට මෙම භුක්ති ක්‍රමය පැවතෙන්නට ඇති බව විශ්වාස කරනු ලබයි. සද්ධාතිස්ස රජුගේ කාලයේ දී අනුරාධපුරයේ විසූ දුප්පත් ගොවියෙකු කහවනු අටක් ගෙවා වපසරිය අට අමුණක් පමණ වූ භූමිභාගයක් මිලට ගන්නා ලද බව කියන පුවතක් සීහළවත්ථුප්පකරණයේ දැක්වේ (සීහළවත්ථුව, 2001, 121). යුද හමුදා කඳවුරක විසූ සෙබළුන් පිරිසක් විසින් එහි පිහිටා තිබූ විහාරයක කැමියන් අතින් සඟ සතු මුදල් ලබාගනිමින් ඒ කඳවුරට අයත්ව තිබූ කුඹුරු කිහිපයක් කහවණු අසූව ගණනේ විකුණා ඇත (E.Z, vol.v, pp.115-116). මේ ආකාරයේ ඉඩම් ගනුදෙනුවක් ගැන එප්පාවල පුවරු ලිපියේ ද දක්වයි. සාමාන්‍ය පුද්ගලයන් දෙදෙනෙකු අතර මෙම උකසට ගැනීම සිදුව ඇත (E.Z, vol.III, p.190). මේ අනුව උකුණුහුසු කොට්ටා වෙලත් මෙ මිහිඳු (රන්) කලන් අටකට විකුණු තිබුණු "ගලම්බුරු කැරය" නම් කුඹුර පිළිබඳව මෙහි දක්වා ඇත. මේ අනුව ඉඩමක් උකසට ගන්නා පුද්ගලයා පොලිය වෙනුවට ඉඩම් භුක්ති විඳීමේ ක්‍රමයක් ද තිබුණි.

අඳ භුක්ති ක්‍රමය නමින් ද ඉඩම් භුක්ති ක්‍රමයක් පැවතුණි. නමුත් 13 වන සියවසට පෙර මෙම භුක්ති ක්‍රමය ගැන සාක්ෂි අඩුය. වගාවන් වෙනත් අය යටතේ වගා කරගැනීම ප්‍රචලිත වීම සමඟ මෙම ක්‍රමය

භාවිතාවන්නට ඇත. සිරිවීර මහතා දක්වන්නේ "තුනේ අඳේ" යන පූජාවලී පාඨය අනුව අස්වැන්නෙන් තුනෙන් එකක් අඳ ලාභියාට හිමි වූ බවයි (සිරිවීර, 2002, 266). "අඳ පරවේණි" ක්‍රමය ඉන්පසු ඇති වන්නේ මෙම අඳ භුක්තියේ විකාශනයක් ලෙසය.

මීට අමතරව දිවෙල් හෙවත් සේවා භුක්ති ක්‍රමයක් ද ඉඩම් භුක්ති ක්‍රමය අතර විය. මෙය පැරණි හා මධ්‍යතන ඉඩම් භුක්ති ක්‍රමයේ ප්‍රචලිතව පැවති ක්‍රමයක් විය. විශේෂයෙන් ඉඩම් අයිතිය රජු විසින් පවරා දෙන අවස්ථා ද දක්නට ලැබේ. මෙම දිවෙල් හෙවත් සේවා භුක්තිය වෙනුවෙන් ඉඩම් රජු විසින් ප්‍රදානය කළ අවස්ථා රැසක් දක්නට ලැබේ. මෙසේ ඉඩම් ප්‍රදානය කිරීමේ දී ඔවුන්ට එකී ඉඩම් හිමිකර දී ඇත්තේ පමුණු භුක්තිය ද සහිතවය. ඉන්පසු ඉඩම ප්‍රධානලාභියාගේ පෞද්ගලික අයිතියක් බවට පත්වේ. එසේ නැතිනම් රජු රජයේ නිල සේවා සැපයීම හෝ ද්‍රව්‍යමය සේවා සැපයීම වෙනුවෙන් වැටුප් වෙනුවට ඉඩම් ප්‍රදානය කිරීම සිදු කළහ. දිවෙල් ඉඩම් වර්ග දෙකක් දක්නට ලැබුණි. එනම්, දිවෙලක් ලබන්නට එකී ඉඩම්වලින් රජයට හිමි වූ බදු ලැබීමේ අවසරය පළමු ක්‍රමයයි. බද්ද මෙන්ම ආදායම දෙකම දිවෙල් ලාභියාට ප්‍රදානය කිරීම අනෙක් ක්‍රමයයි. ලාභියාගේ සේවා සැපයුම අවසන් වූ පසු ඉඩම රජයට භාරදීම සිදු කළ යුතුවිය. මෙම දිවෙල් ලාභීන්ට මෙසේ ලැබෙන ඉඩම් විකිණීම, උකස්කිරීම, පැවරීම හෝ අන්සතු කිරීම සිදු කළ නොහැකි විය (ඉඥකීර්ති, 2002, 266). සේවා දිවෙල් හිමිවීම රජමාලිගයට විවිධ සේවා සැපයීම මත ලැබුණු අතර ශිලා ලිපි මෙන්ම සාහිත්‍ය මූලාශ්‍රයන් ද ඊට නිදසුන් දක්වා ඇත. මෙම භුක්තිය රජුගේ හෝ ඉඩම් හමියාගේ හෝ කැමැත්ත පරිදි දිවෙල් ලබන්නා ගේ ජීවිත කාලය අවසානය දක්වා පැවතුණි. යම් අවස්ථාවක රජු උදහස් වූ විට හා දිවෙල ලැබූ තැනැත්තා කොන්දේසි කඩකළ විට හෝ යම්කිසි වරදකට අසු වූ විට පමණක් දිවෙල් ඉඩම් ආපසු පවරා ගැනීම සිදු කළ හැකිය. මීට නිදසුන් ජේතවනාරාම පුවරු ලිපියෙන් හමුවේ."මෙහෙකරුවන්ගේ වරයාලෙන් වැඩි උපකරණයක් තුබුව අතැ දිවෙල් ගෙන නෙර්නා ඉසා" (I.C, vol.v, No.65). නමුත් විහාරවලට පූජා කරන ඉඩම් නැවත රජයට පවරා ගැනීම සිදු නො කළහ. රජවරුන් විසින් ප්‍රදානය කරනු ලබන පමුණු ඉඩම් හිමියන්ට යම් කොන්දේසිවලට යටත් වීමට සිදු වූ අවස්ථා ද දක්නට ලැබේ. පොළොන්නරු රාජසභා ටැම් ලිපියේ රජු විසින් "රක්" නම් වෛද්‍යවරයාට පමුණු ඉඩමක් ප්‍රදානය කර ඇත්තේ නිතිපතා ආරෝග්‍යශාලාවකට ඉඟුරු පැලක් බැගින් සැපයීමේ කොන්දේසිය මතයි. "වෙද හලට් හවුරුදු හවුරුදු (පතා බද්)දට් සර් අඩ්මානා ගන්නා ලහසුයෙන් එක් පැළක් සුද් හිඟුර් දි වළන්දනු කොට් ඉසා..........."(E.Z, vol.Iv, p.34). මෙම ලිපියේ ම සඳහන් වන්නේ "රජු විසින් කැමැත්තෙන් ම මේ ඉඩම පිළිවෙළින් (බුක්ති විඳිය හැකි) පමුණුවක් බවට පත් කරන ලෙසට අපට දන්වන ලදී" යනුවෙනි. මේ අනුව රජු පරම්පරාවෙන් පරම්පරාවට උරුමවන අයුරින් එය පවරා ඇත. ගොන්නැවේ දේවාල ලිපියට අනුව ද රජුගෙන් පමුණු ලත් අය කුඹුරෙහි අස්වැන්නෙන් කොටසක් මහාවිහාරයට දිය යුතු බව දක්වයි. "උදා මහාපැණන් වහන්සේ මහවෙහෙරැ ඇත් වෙහෙරට් කැරුණු හසැ කිරි අමුණබාදි වළඥනු කොට අ(ග්)බො මුගයින් වරදාණන්ට ගෙට්හසින් පමණු කොට වදාළ..........." (E.Z, vol.Iv, p.189).

පමුණු දීමේ ක්‍රමය පිළිබඳ අනුරාධපුර යුගයේ සිට කෝට්ටේ යුගය දක්වා ශිලා ලේඛන මගින් තොරතුරු ලබාගත හැකි වේ. නිශ්ශංකමල්ල රාජ්‍ය කාලයේ දී රජු විසින් සිය ඇමතිවරයෙකුට ප්‍රදානය කළ පමුණු ඇමතිවරයාගේ පරම්පරාවට අයත් විය යුතු බව දක්වා ඇත. "......කාලිංග වංශයට මැ දස්කම් කොට ආ හෙයිනුත් මෙ කළ දස්කමට තුංගහද්‍රා ඇළ වියලෙන් පමුණුවක් හා රන්මඩවතුරෙන් පමුණුවක් හා

අන් මින්සුන් සතු වූ හෙයින් විකුට ගත් යක්තුඩු කුඹුර හා දියදඩ නුදුන් තුංගභද්‍රා ඇළ ආ තැන පටන් අට කිරියක් හා තමන් වළඳනා තනතුරට පමුණුවක් ද පවරා මෙකුන් ගැති සිය ගොත් එන්නවුන්හට දූ නෑයනට දූ දෙන මුත් අපත්තුන්ට දී මෙ සැලසුණු සම්පත් අමාර්ගයෙ නොයවා පරගෘහිත කල ගලවා හැරියන් විජය කුලය හා මතු නෑ වන පරිද්දෙන් පිහිටුවා වදාළ සෙයෙකැ......"(I.C, vol.vI, p.72). ඇතැම් අවස්ථාවල රජු විසින් පමුණු වශයෙන් පවරන ලද ඉඩම් පරම්පරාවෙන් පිටකෙනෙකුට පැවරීම සිදු නොකළ යුතු බවට ද සාධක හමුවේ. පෙරියසේනාවත්ත පුවරු ලිපියේ,"පරම්පරාවෙන් නො තොරො වළඳන් මිසැ සෙස්නට් නො දෙනු කොට්......................" (E.Z, vol.vI, p.194) යන සඳහනෙන් බුද්මහළුන්ට පමුණු වශයෙන් දුන් ඉඩම් පහක් පිළිබඳ දක්වා ඇත. පමුණු ලද්දන්ගේ ඉඩම් මරණින් පසු ඔවුන්ට පැවරී තිබූ ගම්බිම් ආදිය ඔවුන්ගේ දරු මුණුබුරන්ට පැවරීම අනිවාර්ය සිරිත වූවත් රජු විසින් නැවතත් තහවුරුකොට පවරා දීමේ සිද්ධියක් ශිලාලේඛන මගින් තහවුරු වී ඇත."............අඹදරු මුණුබුරණට් වත්හිමියන් වහන්සේ අත්තාණිය වැඩ හිඳ මාතුරයන් මෙකු දරුවන් පරපුරුවෙ වදාළ එක් තැන් සමියෙන් පහන් හිඳ්වා රට් නවැතැ දෙන්නට්වදාළෙන්........"යන සඳහන අනුව පැහැදිලි වේ. මේ නිසා පරම්පරාවට අයත් ඉඩම් නැවත රජු පවරා ගැනීම සිදු නොකළ නමුත් මෙසේ පමුණු ලද පුද්ගලයින් යම් බරපතල වරදකට චෝදනා ලැබූ අවස්ථාවන්වල දී එම ඉඩම රජු විසින් රජයට පවරා ගැනීමට කටයුතු කළ අවස්ථා ද දක්නට ලැබේ. පොළොන්නරු රාජසභා ටැම් ලිපියේ, "මෙ පමුණු රද් උදහසිනුද් රදොල් කොට් නොගන්නා ඉසා....."යනුවෙන් දක්වා ඇත. පළමුවන විජයබාහු රජුට අයත් පනාකඩුව තඹ සන්නසේ සඳහන්, "මෙකුන් දරුමුනුම්බුරන් ච මෙකුන්ගෙ අන්වය ආවු සෙ දඩ මුඩු ගතැයිතු වරදෙකැ බසින් පටවා කරන දූහැවිල්ලෙන් මුත් දඩ මුඩු නො ගන්නා ච දූහැලා නො පටනු ච දිවි දී නො මුන්නා දොසයකුදු කළ තුන්වරක් දක්වා සමා කරනු පෙත් පමුණු නොගන්නා කොට්................"(E.Z, vol.v, p.1) යන නිදසුන් අනුව පැහැදිලිවන්නේ පරම්පරාවට ප්‍රදානය කළ ඉඩම් එම ප්‍රවේණිය ලද පුද්ගලයින් විසින් වරදක් කළ විට අහිමිව ගිය අවස්ථා තිබුණු බවයි. මෙම ඉඩම් භාෂිතයේ දී පමණක් නිදහස් භුක්ති ලෙස අර්ථ නිරූපණය කළ හැකි බව කොඩ්රින්ටන් වැනි විද්වතුන් පවසන්නේ උක්ත දැක් වූ නීති රීති නිසා විය හැකිය. මෙම නීති රීති හෝ සීමා දක්නට ලැබෙන්නේ රජ කෙනෙකුගෙන් ලත් පමුණු ඉඩම් සම්බන්ධයෙන් පමණක් බවත් රජු විසින් පමුණු වශයෙන් ඉඩම් ප්‍රදානය කරන බොහෝ අවස්ථාවල දී මෙවැනි සීමාවන් දක්නට නොමැති බව ද පැහැදිලි වේ.

බොහෝ අවස්ථාවල මෙම පමුණු ඉඩම් ප්‍රදානය කරනු ලැබුවේ රජයේ නිලධාරීන්ට හෝ රාජ්‍ය අනුග්‍රහය ලද විහාරාරාම වෙනුවෙන් හෝ භික්ෂූන්ගේ ප්‍රත්‍යන් සඳහාය. නමුත් මෙසේ රජයෙන් පවරා දෙනු ලැබූ ගම් බිම් සඳහා අනුරාධපුර මුල් භාගයේ පමුණු හෝ දිවෙල් යන පද භාවිතයට ගත් බවක් නොපෙනේ. අනුරාධපුර අවසාන භාගයට අයත් කාලයේ මෙය භාවිතයට ගත් බවට සාධක ශිලා ලේඛන මගින් අනාවරණය කරගත හැකි වේ (E.Z, vol.I, p.44, E.Z, vol.II, pp.17). "රජ්කොලෙන් බහා බුජ් සස්නෙහි අනුසසැ බැඳැ දුන් පමුණු උදහසැ නොගන්නා ඉසා................"( E.Z, vol.I, p.44). මෙසේ ප්‍රදානය කරන ලද පමුණු ඉඩම් අතර කිසිඳු කොන්දේසියක් නොමැතිව ඉඩම් ප්‍රදානය කළ බවට සාධක ශිලා ලේඛන මගින් හමු වේ. එනම්, කොට්ටංගේ ගිරිලිපි දෙක (E.Z, vol.Iv, p.87) හා තවත් සෙල්ලිපි කිහිපයක් මීට නිදසුන් දක්වන අතර සාහස්සමල්ලගේ සෙල්ලිපිය ද ඒ අතර වේ. සාහස්සමල්ලගේ ශිලා ලේඛනය මතු රජ දරුවන් විසින් ද ආරක්ෂා කළ යුතු බව දක්වයි. මේ අනුව ඉඩම ලද පුද්ගලයාගේ නීත්‍යානුකූල හිමිකම රජය විසින් ම තහවුරු කර දුන් බව පැහැදිලි වේ. "හිර

සඳ පමුණු කොටැ ලක්විජයසිඟු සෙනෙවි අබොනාවන්ට දී වදාළ ගම්වර හා පරිවාර හා සියලු සම්පත්තියට මතුවන රජදරුවනුදු තමතමන්ට දස්කම් කළවුන් රක්‍ෂා කිරීම........"(E.Z, vol.II,pp.224-226). කොට්ටංගේ පළමු ගිරි ලිපියේ ලෝකේශ්වර නම් රජු විසින් ලෝකේඅරක්මෙනාට "කළම්" නම් පමුණු ඉඩමක් ප්‍රදානය කළ බව දක්වයි. මෙහි දෙවන ලිපියේ "කළම්" නම් පමුණු ගමත් තවත් ඉඩම් කිහිපයකුත් තෙර නමක් සංඝයාට ප්‍රදානය කළ බව සඳහන් වේ. "විල්ගම්මුලැ අභය........මහතෙරුන්වහන්සේ තමන්වහන්සේගෙ මෙ කළම් පමුණුවත්..........වත් උඩුසැළ ගම්සබාවසටවත් පින් පිණිස සතරදිගින් වඩන මහාසංඝයාවහන්සෙ සන්තක කොට සිවුපසයට ලූසේ....." (E.Z, vol.Iv,p.89). මේ අනුව මෙම විල්ගම්මුල අභය තෙරට මෙම "කළම්" ඉඩම හිමි වන්නට ඇත්තේ පරම්පරාගත උරුමයෙන් බව පැහැදිලි වේ. මෙහි ඇති විශේෂත්වය වන්නේ කිසිදු කොන්දේසියකට යටත්ව නොතිබීමයි. I වන පරාක්‍රමබාහු රජුගේ දෙවනගල ශිලා ලේඛනය ද මෙවැනි ලිපියකි.

ඇතැම් අවස්ථාවල සාහිත්‍ය මූලාශ්‍රයවල ද රජවරු මෙසේ ප්‍රදානය කළ ඉඩම් පිළිබඳ සාධක දක්වා ඇත. පූජාවලියේ දක්වන්නේ II වන පරාක්‍රමබාහු රජු විසින් දේවපතිරාජයනට දෙල්ගස් නම් ග්‍රාමය ආදී වූ නොයෙක් හිමි පමුණු ප්‍රදානය කළ බවයි (පූජාවලිය, පි.797). මෙහි දී මහාවංසය දක්වන්නේ මෙය කුල සන්තක ගම් කිහිපයක් බවයි (මහාවංසය, 86:53-54). මෙම "කුලසන්තක" යනු පරම්පරාගත ඉඩම්ය. ඒ අනුව පරම්පරාගත නැතිනම් ප්‍රවේණි ඉඩම් කොන්දේසි විරහිතව රජු ප්‍රදානය කළ බව දක්නට ලැබේ. මේ අනුව පැහැදිලිවන්නේ රජු විසින් ප්‍රදානය කරන ලද ඇතැම් පමුණු ඉඩම් සඳහා පූර්ණ අයිතිවාසිකමක් එම ඉඩම හෝ දේපළ ලද තැනැත්තා සතු වූ බවයි. මේ නිසාම එම ඉඩම් "හිමි පමුණු" නැතිනම් "ඉර හඳ පමුණු" යනුවෙන් ද හඳුන්වා ඇත. සෙල්ලිපිවල ද මේ බව සඳහන් කර ඇත. "හිරි සඳ් පමණියෙන් පවත්නා කොට් බුද්ගමු වෙහෙර පස්කැමිය මො එක්සෙවැ රන් පොලී ගෙන බත් දෙනුවුම්හ" (I.C, vol.v, pt.IIINo.99) යනුවෙන් දක්වයි. කිත්නුවර ගල් සෙනෙවියාගේ සාර්ථක බුරුම ආක්‍රමණය හේතුවෙන් ඔහුට ගම් බිම් ප්‍රදානය කර ඇත්තේ "හිරි සඳ පවත්නා තාක් සිටිනා පරිද්දෙන්" (I.C, vol.vI, p.43,No.15). බව දක්වා ඇත. ඇතැම් සෙල්ලිපිවල ".............කිතමබව හට් හසින් පමුණු කොට්........" (E.Z, vol.II,p.16) යනුවෙන් සඳහන් කර ඇති අතර මේ අනුව ගම් බිම් හෝ දේපළ ප්‍රදානය කිරීමේ දී රජු හංස රූපය සලකුණු කර දුන් බව පැහැදිලි වේ. කෝට්ටේ යුගය වන විට රජු හංස රුව සලකුණු කරවා ජනයාට වස්තු ප්‍රදානය කළ අවස්ථා ද දක්නට ලැබේ. එසේනම් රජු විසින් ප්‍රදානය කරන ලද ඉඩම් සඳහන් ලේඛනවල ඉර හඳ හෝ හංස රුව සලකුණු කරවා කරවා පරම්පරාවෙන් පරම්පරාවට උරුම කරදුන් බව පැහැදිලි වේ. මේ සඳහා භාවිතා කළ තවත් නමක් වන්නේ "බඹදෙයින්" යන්නයි. මජ්ඣිම නිකාය වැනි මූලාශ්‍රය මෙය අර්ථ ගන්වා ඇත්තේ " සම්පූර්ණයෙන් අත්හල පරිත්‍යාගය" යනුවෙනි (ද සොයිසා. ඒ. පී, මජ්ඣිම නිකාය අටුවා (සිංහල පරිවර්තනය) II, පි.345). vවන කාශ්‍යප රජුගේ මයිලගස්තොට ටැම් ලිපියේ මිහිඳු ඇපාණන් විසින් එහි පිහිටා තිබූ පිරිවෙනකට පිදූ කපුගම පවරා දෙනු ලැබ ඇත්තේ බඹදෙයිනි "හෙට්හස් රද්පමණියෙන් බමදෙයට් දුන්" (I.C, vol.v, p.374,No.114) යනුවෙන් දක්වයි. මැදඋල්පොතින් හමු වූ ටැම් ලිපියේ දක්වා ඇත්තේ අන්තාණිහලක සේවය කළ මෙහෙකරුවනට ඉඩම පවරා දී ඇත්තේ බඹදෙයින් වළඳනු සඳහා බව දක්වයි. "අන්(තා)ණිහල මෙහෙයුතු පුනපුනා තොප රට්හි ආවූ එක් සෙණක් හුලු පනාවැලි

කරුවන් බමබදෙයෙන් වළඤවනු කොට් ඉසා............"( E.Z,vol.Iv, p.56). මීට අමතරව මහාවංසය, රසවාහිනිය වැනි මූලාශ්‍රයවල ද ඇතැම් පාලකයන් "බ්‍රහ්මදෙය්‍ය" කොට පවරන ලද ගම්බිම් පිළිබඳ සඳහන් කරයි. ඉර සඳ පමුණු, බ්‍රහ්මදෙය්‍ය පමුණු හා නැවත රජයට පවරා දෙන යන අර්ථ ගැන්වෙන බව මින් පැහැදිලි වේ.

යම් යම් අවස්ථාවල ප්‍රදානය කළ දේපළ විවිධ හේතු පදනම් කරගෙන නැවත රජයට පවරා ගත් අවස්ථා ද ශිලා ලේඛන සාධකවලින් පමණක් නොව සාහිත්‍ය මූලාශ්‍රය කරුණු අනුව ද පැහැදිලි වේ. ධාතුසේන රජු ද්‍රවිඩයන්ට පක්ෂපාතී වූ සිංහල ප්‍රධානීන් සියලු දෙනාට අයත් කුල ගම් උදුරාගත් බව දක්වයි (මහාවංසය, 38:38,39). I වන විජයබාහු රජු පොළොන්නරු රාජධානී සමයේ දී විහාරාරාම සන්තක වූ භෝගගාම උදුරා ඒවා සිය සේවකයන්ට ප්‍රදානය කර ඇත (මහාවංසය, 61:53,54). මේ අනුව පැහැදිලිවන්නේ රජු සතු ඉඩ කඩම් නැතිනම් ප්‍රවේණිගම් රජුට පක්ෂපාතීත්වයක් දක්වන හා රජුට අනුග්‍රාහය දක්වන භික්ෂූන්, විහාරාරාම, පාලක ප්‍රධානීන්ගේ ක්‍රියාකලාප අනුව එහි නීත්‍යානුකූල උරුමය වෙනස්වන්නට ඇති බවයි.

ඉඩම් පරම්පරාවෙන් වූ උරුමය ඇතිව හෝ වෙනත් අයකුගෙන් මිලට ගැනීමෙන් හා රජුගේ පමුණු භුක්තිය සහිතව ප්‍රදානය කරන ලද ඉඩම් ආදී වශයෙන් සාමාන්‍ය ජනයාට දේපළ සම්බන්ධව අයිතියක් ලබා දී ඇති බවයි. මූලික වශයෙන් ම පැහැදිලිවන්නේ පාලන තන්ත්‍රයේ හෝ රජුගේ දැඩි බලපෑමකින් තොරව එම දේපළ පරිහරණය ඔවුන් සිදු කළ බවයි.

*II. පැවිදි පක්ෂයට අයත් ඉඩම්*

සාමාන්‍ය ජනයාට පමණක් නොව පැවිදි නැතිනම් පූජ්‍ය පක්ෂය සඳහා ද දේපළ සඳහා නීත්‍යානුකූල උරුමයක් තිබූ බවට සාධක ශිලා ලේඛන හා සාහිත්‍ය මූලාශ්‍රයවලින් හඳුනාගත හැකිය. විශේෂයෙන් 8 වන සියවසින් පසු කාලයේ ශිලා ලේඛන රැසක විහාර දේපළ සඳහා පවරන ලද ආර්ථික මෙන්ම අධිකරණ වරප්‍රසාදයන් පිළිබඳ තොරතුරු දක්නට ලැබේ. මෙහි ඇති විශේෂත්වය වන්නේ විහාරාරාම සඳහා වූ රාජ්‍ය නිලධාරීන්ගේ බලපෑම සීමා සහිත වීමයි. ක්‍රි. පූ යුගයේ සිට භික්ෂූන් සතු වූ දේපළ පිළිබඳ තොරතුරු හමුවේ. විශේෂයෙන් ගිහියන් විසින් ලෙන් හා වැව් අමුණු කෙත්වතු ආදිය භික්ෂූන්ට පූජා කළ බවට සාධක රැසක් පූර්ව හා අපර ශිලා ලේඛන මගින් අනාවරණය කරගත හැකි වේ. නමුත් ජනගහන වර්ධනය හා ශිෂ්ටාචාරවල වර්ධනයත් සමග එක් එක් භික්ෂූන්ට හිමි ව තිබූ ඉඩකඩම්, වැව්, අමුණු ආදිය භික්ෂූන් පිරිසකගේ පරිභෝජනය සඳහා වෙන් වූ ආකාරය දැකගත හැකිය. එය පසු කාලයේ විහාරස්ථානයන් හා නිකායන්වල නීත්‍යානුකූල හිමිකමට යටත් වනවා දක්නට ලැබුණි. මෙසේ විහාරස්ථාන හා නිකායන් වටා දේපළ ඒකරාශී වීම පොදු අයිතියෙන් මිදී පෞද්ගලික අයිතීන් වර්ධනය වීමට බලපෑ බව පැහැදිලි වේ. භික්ෂූන්ට හෝ විහාරස්ථානයකට නැතිනම් නිකායකට දේපළ හිමි වූයේ බොහෝ අවස්ථාවල රජු හෝ සාමාන්‍ය ජනයාගේ පරිත්‍යාග හෝ පූජා කිරීම්වලිනි. මුල් යුගයේ එනම් ක්‍රි. පූ යුගයේ දී වාරි කර්මාන්ත දියුණුව පැවති බැවින් විශාල වශයෙන් විහාරාරාම සඳහා ඉඩම් ප්‍රදානය කිරීමක් සිදු විය.

පූර්ව බ්‍රාහ්මීය ශිලා ලිපි අනුව ද බොහෝ අවස්ථාවන්වල දී ගිහියන් විසින් භික්ෂූන්ට ලෙන් පූජා කළ බව, වැව්වල ආදායම පූජා කළ බව හා නොයෙකුත් පුද පූජා කළ බව දක්වයි. කාන්තාවන් ද තම ශ්‍රද්ධාව ප්‍රකාශ කිරීම පිණිස කෙත්වතු වැව් ගම්බිම් ආදිය විහාරාරාමවලට පූජා කිරීමටද පෙළඹුන බවට

සාධක ලැබේ. කරඳගල විහාර ලිපියට අනුව *"හබුතගල විහරහි කකවණ තිශ මහරජ උපසික මත තුදහ වවිසගදිනෙ ම(හ) ව"* මෙයින් දැක්වෙන්නේ කාවන්තිස්ස රජ දවස මිත්තා නමැති උපාසිකාවක විසින් තමාගේ වැවක් හබුතගල විහාරයේ භික්ෂූන්ට පූජා කළ බවයි. මණ්ඩලගම ලිපියට අනුව, ග්‍රාමික සාතකගේ පුතා ගණකාධිකාරී නුගුයගේ දුහිතෘ දාරකතිස්සාගේ ලෙණ සංඝයාට ඉදිකරවන ලද බවත් මරගම නම් වූ වැවක් ද කරවන ලද බවත් මෙසේ සඳහන් වේ. "ගමික ශතක පුත ගණක නුගුස ඣිතය දරක තිශය ලෙණෙ ශගශ පදිට්තෙ වපික කරපිත මරගම ම...."(I,C,Vol I,P.44, No:576 ). හලඹගල ලිපියේ සඳහන් වන්නේ උතුර නැමැත්තා සතුව තිබුණු වැව වස් කාලයේ විසූ භික්ෂූන්ගේ ප්‍රයෝජනය සඳහා පූජා කළ බව දක්වයි. "උතරහ වව් තෙරහ කුම්ය නියතෙ වසවසිකෙ............"*(*I,C,Vol I, P.100, No:1228). තෝර-මයිලෑව ලිපියට අනුව පුනපිටික වැව හිමි වූ උපාසක විණුගේ ලෙණ පිළිබඳ දක්වා ඇත. "පුනපිටික වව් හමික උපසක විණුහ ලෙණෙ............"*(*I,C,Vol I, P.99, No:1217). අතීතයේ සිට භික්ෂූන්ට වැව් පූජා කළ බව දක්වා තිබීමෙන් වඩාත් පැහැදිලි වන්නේ ඒ අවධියේ දී වැව් අමුණු ඉදි කළ බවයි.

ඇතැම් උපාසක, පරුමකවරුන් පමණක් නොව රජවරුන් ද ඇතැම් බදු ද, වැව් ද භික්ෂූන්ට පූජා කළ බවට සාධක ඇත. ගල්ගමුව ශිලා ලිපිය අනුව අභය රජු වඩ්ඪමාන ගමේ ප්‍රාප්තිය (බද්ද) ද, වැව ද මහා විහාරයේ සංඝයාට පූජා කළ බව දක්වයි. "රඣ අබයෙ දිනෙ පති වඪමනගම මහ-විහරහි ශගශ වාච්ච........."(*I,C*,Vol I, P.99, No:1216). පරුමකවරුන් ද වැව් පූජා කළ බවට සාධක හමුවේ. එරියාව ශිලා ලිපියට අනුව පරුමක යශෝපාලගේ පුත්‍ර පරුමක පාදක විසින් මෙම වැව දිපිගල විහාරයේ සංඝයාට පූජා කළ බව දක්වයි. "පරුමක යහපල පුත පරුමක හදනෙ ඉම වපි දිපිගල විහරහි නියතෙ ශගශ"(I,C,Vol I, P.99, No:1225). තෝණිගල ශිලා ලිපියට අනුව පරුමක අභයගේ පුත්‍ර පරුමක තිස්සගේ වැව අච්ඡගිරික තිස්ස පබ්බතයෙහි සංඝයාට පූජා කළ බව දක්වා ඇත."පරුමක අබය පුත පරුමක තිශහ වපි අචගිරික තිශ පවතහි අගත අනගත චතුදිශ ශගශ දිනෙ"(I,C,Vol I, P.82, No:1051). නච්චියාර්මලෙයි ලිපියට අනුව අම්බගාමයේ නකදක නම් ඇළ සංඝයාට පූජා කර ඇත. "අබගමිය නකදක අඩි ශගශ"(I,C, Vol I, P.30, No:379).

මීට අමතරව ගංගා ජලය ඇළ දොළ මාර්ගයෙන් වැව්වලට යවා ඒවායේ සාදන ලද වේලි මඟින් බෙදා යැවීම සිදු කළ ආකාරය ගල්ලෙණ විහාර ලිපියේ දැක්වේ. ඒ අනුව බකිනෙය මතගේ ලෙණ සංඝයාට දෙන ලදී. අබ ඇළේ වේල්ලෙහි (පිහිටි) අඩ කිරියක් බිම හනම් පඩුවසගොඩ පණත ද, යසිස කුඹුරු යායේ (පිහිටි) අවලද (නම්) කුඹුරක් ගැනද සඳහන් කර ඇත. "බකිනෙය" මතයහ ලෙණෙ සඝස දිනෙ අබ-අඩිය අවරණහි අඩ-කරිහ බුම් දිනෙ පඩුවසගොඩ පණත අවලද කෙත යසිස රජකහි......................."(I,C,Vol I, P.89, No:1129, 1130). වාරිකර්මාන්තය ක්‍රමවත්ව පවත්වා ගැනීමට ද නිලධාරීන් පත්ව සිටි බවට සාධක ශිලා ලේඛන මගින් පැහැදිලි වේ. දඹුල්ලෙන් හමු වූ ලෙන් ලිපියකින් ධනුර්ග්‍රාහක සුමනගේ වාරිමාර්ග නිලධාරී වූ තිස්සගේ ලෙණ සංඝයාට දෙන ලද බවත් එය වියගගේ ලෙණ බවත් දක්වා ඇත. මෙහි තිශ නමැත්තා වාරිමාර්ග විශේෂඥයෙක් වූ බවත් ඔහු අණණික යනුවෙන් හඳුන්වා ඇති බවත් මේ ලිපියට අනුව පැහැදිලි වේ. "දනුග ශුමනහ බත අණණික තිශහ ලෙණෙ ශගශ දිනෙ වියගහ"(I,C, Vol I,P.65, No:846). නාඋල්පොත ශිලා ලේඛනයේ ලජ්ජිතිස්ස රජු අබදළක නම් වැවක් විහාරයකට පූජා කළ අවස්ථාවක් පිළිබඳව දක්වා ඇත. "(ල)ජක තිස මහරඣි

විහර කරවය අබදළක-වවි සඟ දිනි............"(E.Z, vol.i, p.148). යම් අවස්ථාවල කුඹුරු ආරාමිකයන්ගෙන් උගසට හෝ මිලට හෝ ගෙන එය නැවත ඒ විහාරයට ම පූජා කරන ලද අවස්ථා ද ශිලා ලේඛන සාධක දක්වයි. එය ශිලා ලේඛනවල "සිදසිනනයෙන්" යනුවෙන් අර්ථ ගන්වා ඇත. " විසි කළඹික් රන් දී පස් වෙහෙර්කැමියන් ගිවිස්වා සිදසින්නයෙන් ගෙනැ, මෙ කුඹුර් හිර් සඳ් පමණියෙන් පවත්නා කොට පවරා දෙන.................."(I.C, vol.v, No.14, p.148). මේ අනුව මෙම ප්‍රභූ කාන්තාව කුඹුර පමුණු කොට පූජා කළ බව පැහැදිලි වේ. විහාරාරාම සතු දේපළ භික්ෂූන් වෙනුවෙන් ගිහියන්ට උකසට ගැනීම හෝ විකිණීමට ආරාමිකයන්ට අයිතියක් වූ බව මින් පැහැදිලි වේ.

ශිලා ලේඛන අධ්‍යයනයේ දී පැහැදිලි වන තවත් කරුණක් වන්නේ විහාර ඉඩම් පමණක් නොව ඒවා සතු සේවකයන්, සතුන්, ගස්වැල් ආදී සියලු දේපළවල හිමිකම රාජ්‍ය මැදිහත් වීම යටතේ අණ පනත් යොදා ආරක්ෂා කළ බවට සාධක හමු වේ. අනුරාධපුර පුවරු ලිපියට අනුව රාජ්‍ය නිලධාරීන් ගස් කැපීම, විහාර සේවකයන් තම සේවාවලට යොදා ගැනීම, විහාරයට අයත් ගල් හා සතුන් බලයෙන් ලබා ගැනීම. ආදී කරුණු සඳහා විහාර ඉඩම්වලට ඇතුල් වීමට තදින්ම විරුද්ධ වී ඇති බවයි. "මෙ කුන්ගෙන් ගෙගොන් ගෙනැ කැමියන් තුමනට් ගෙවිකම් නො කැරුවිය යුතු හස්කරු පරපුරෙන් වැටෙන කැරැ කුම්බුර් නො වැටියැ හෙත් මුත් හැරැ නොගත යුතු වතු පැතට් වැද අනියා නො කටැයුතු ගස්කොළ් නො කැපිය යුතු මෙ මෙහැරැ ආවු තුවාක් ගම්බිම්හි තලත් මීවන් ඇය් පලරුක් කම්තැන් සැමැගින් දුනමුත් නොකැපියැ යුතු"(E.Z, vol.i, p.75). කළුදිය පොකුණු ලිපිය ද දක්වන්නේ රාජකීය රදොලන් යන නිලධාරියෙකුට ඒවා ලබා ගැනීමට විහාර ඉඩම්වලට ඇතුල් වීම මුළුමනින්ම තහනම් වූ බව දක්වා ඇත (E.Z, vol.i, p.75). පුලියන්කුලම ලිපිය ද මෙවැනිම සාධක සපයන තවත් මූලාශ්‍රයකි. "මෙහි අබදිතාක් ගම්බිමට් වැරි පෙරෙනාට්ටු මෙලාට්සී නොවද්නා ඉසා ගම්ගොන් නො ගන්නා ඉසා තු(ස) යැ සොළියැ බලත් රැහැණ් නො ගසනු ඉසා රදොලන් වැදූ තලන් මීවන් නො කපනු ඉසා........."(E.Z, vol.i, p.187). මීට අමතරව රාජකීය නිලධාරීන්ට තම අධිකාරී බලය විහාර ඉඩම්වලට ඇතුළු වූ පසු ක්‍රියාත්මක කිරීම තහනම් වූ බව ශිලා ලේඛන සාධක අනුව පැහැදිලි වේ. ඊරිපින්නියෑව, මොරගොඩ ටැම් ලිපිය මේ සඳහා උදාහරණ සපයයි. "මා යෙහි අට්මහා (ස්ථාන?)යට් ඇතුළැවුණාක් තැනට් කුලී මෙලාක්සීන් නොවද්නා කොට් ඉසා රට්ලදු පස්ලදුවන් නොවලඤනු කොට් ඉසා දියෙ බෙදුම් නොගන්නා කොට් ඉසා වෙල්කැමි වෙල්බැදි පියො වජාරනුවන් නොවද්නා කොට් ඉසා පෙරෙනාට්ටුවම් නොවද්නා කොට් ඉසා දුනු පාබල(ය)න් නොවද්නා කොට් ඉසා ............"(E.Z, vol.i, p.204). මේ අනුව විහාර දේපළ සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබා දී ඇති අතරම එම දේපළ සම්බන්ධව රාජකීය නිලධාරීන්ට මැදිහත්වීමට තිබූ අයිතිය ද සීමා කර ඇති බව පැහැදිලි වේ.

මූලාශ්‍රය අධ්‍යයනයේ දී පැහැදිලි වන තවත් වැදගත් කරුණක් වන්නේ විහාර ඉඩම් ප්‍රදානය කිරීම සිදුකර ඇත්තේ පොදු සංඝයාට නොව, මහාවිහාරය, අභයගිරිය හෝ ජේතවන යන නිකායන්වලට අයත් විහාරයකට හෝ විහාරයක නිශ්චිත ස්ථානයකටය. ක්‍රි. ව. පළමු සියවස තරම් ඈත කාලයේ සිට මෙම නිකායන්ට අයත් වූ විහාර දේපළ පිළිබඳ තොරතුරු මහාවංසය වැනි සාහිත්‍ය මූලාශ්‍රයවලින් ද හමුවේ. i වන විජයබාහු රජුගේ බිසව විසින් මහා විහාරය සතු දේපළ මිලදී ගත් බවට සාධක හමුවේ." පණ්ඩිත ඒ බිසව් බිම පිණිස මහා විහාරයට ලක්ෂයක් දුන්නීය. විහාරය ද කරවී. එහි සෙල්මුවා සෑය තොමෝම කරවී. ඒ ඒ තැනින් මිළට ගෙණ සංඝ භොගය දුන්නය..........."(ම.ව, 35:118). මීට අමතරව ඉළනාග රජුගෙන් පසුව රාජ්‍යත්වයට පත් චන්‍ද්‍රමුඛසීව රජු විසින් මණිකාරගම වැවක් කරවා ඉසුරුමුණි

විහාරයට පිදූ බව මහාවංසය දක්වයි (ම.ව, 35:46-47). වසභ රජුගේ රාජ්‍ය කාලයේ දී ද මහාවිහාරයට අයත් විහාරවලට කරන ලද පුද පූජා පිළිබඳ විස්තර තිස් පස්වන පරිච්ඡේදයේ විස්තර කර ඇති අතර ගලඹතොට සෑයෙහි උළුවස්ස ද කරවීය. පොහොය ගෙය ද කරවීය. මෙම පොහෝගෙයි වැටි තෙල් පිණිස දහස්කිරි වැව ද කරවා දුන් බව සඳහන් කරයි (ම.ව, 35:85-87.පි,199). ශිලා ලේඛන අනුව ද විවිධ නිකායන්ට අයත් ඉඩම් ප්‍රදානයන් පිළිබඳ තොරතුරු හමුවේ. රඹෑව ටැම් ලිපියට අනුව මහාවිහාරය සතු ඉඩම් පිළිබඳ දක්වා ඇත."කුට්ඨා සෙනෙවිරදාණන් මහවෙහෙර කැර්වූ සෙන් සෙනෙවිරද් පිරිවෙනට වදාළ ගැලිනුරු ගොමඬිල සතර් පියලට්..............."(E.Z, vol.i, p.173). අයිතිගේ වැව පුවරු ලිපියට අනුව ද තිසරම් වෙහෙර භික්ෂුණී ආරාමයට ලොහොලුවිල ඉඩම් අයිති වූ බව දක්වයි. "සෙන් සෙනෙවිරදාණන් මඟුල් මහවෙයැ කැරූ තිසරම් මෙහෙණිවර් බද් ලොහොලුවිලැ කුළියෙහි ආවු (දෙ)මෙළින් (හෙටිහයි)න් බහාලූ (සබ)ඊ කැබැලි සුඅමබුරු (පද්දලැ) කැබැලි ඇතුළ්වැ එක් පයල් (සෙණක්)............."(E.Z, vol.ii, p.35,36). මන්නාරම් කච්චේරි ලිපියට (E.Z, vol.iii, p.103) හා ඊරිපින්නියෑවේ ලිපියට(E.Z, vol.i, p.163) අනුව ද මහාවිහාරයට අයත් ඉඩම් කැබළි පිළිබඳ තොරතුරු හමුවේ. මේ අනුව පැහැදිලිවන්නේ අතීතයේ සිටම මහාවිහාරය සතුව දේපළ රැසක් තිබූ බවයි. අභයගිරි හා ජේතවන නිකායට අයත් දේපළ පිළිබඳව ද සාධක ශිලා ලේඛනවල සඳහන් වේ. මොරගොඩ ටැම් ලිපියට අනුව අටමහතැන්වලට අයත් ඉඩම් අභයගිරි නිකාය සතු වූ බව දක්වයි. අභාගිරි වෙහෙර්හි (කුකු) (ළ්) ගිරි පෙතැපිහිටි මඟුල් පිරිවෙනට් බහාලූ වැදෑ(රා) පිරිවෙනැ බද් ප(දො)න්නරුකුළියෙහි (රන්දනා දිය දුරු) (අවන්නා වෙහි) (රු සත..සි).....මා යෙහි අට්මහා (ස්ථාන?)යට් ඇතුළැ වූ තාක්...."(E.Z, vol.i, p.203). අභයගිරි සංස්කෘත ලිපියට අනුව ලහසිකා, උරුලගොණු, හුණාලා, අම්බිලග්‍රාම, උලවන්නරී බණ්ටිග්‍රාම, කීරා, පල්ලාය යන ගම් සූනග්‍රාමය යන මේ සියල්ල අභයගිරි නිකායට අයත් වූ බව දක්වයි (E.Z, vol.i, p.7). ඇටවීරගොල්ලෑව ලිපියට අනුව වෙලන්ගම නම් ජේතවන නිකායට අයත් ඉඩමක් පිළිබඳ තොරතුරු දක්වයි. "දෙනා(වෙ)හෙරු සිරිස(ග්) බොරද්පිරි(වෙන්) බද් වෙලන්(ගැ)මැ අන්තා(ණි කණු) හින්ද්වා දෙවා (ව)දාළ"(E.Z, vol.II, p.46). අනෙක් නිකායන්ට සාපේක්ෂව ජේතවන නිකායට අයත් ඉඩම් පිළිබඳ තොරතුරු ඉතා අල්පව දක්වා ඇති බව මෙම ශිලා ලේඛන අධ්‍යයනයේ දී පැහැදිලි වේ. මෙම නිකායන්වලට අයත් භික්ෂූන්ට මෙම විහාර දේපළ හිමි වූ අතර පොදුවේ සමස්ත භික්ෂූන්ට මෙම දේපළ හිමි නොවුණි. මෙසේ අයත් වූ විහාර දේපළ සිවුරු හැරගිය පිරිස් විසින් භුක්ති විදීම ද තහනම් වූ බව අංක දෙක දරණ අභයගිරි පුවරු ලිපිය සඳහන් කරයි. "(ගම් බිම් අවසට්)...වත්වා දෙනු ඉසා මෙසැ ගිහිමිනිස්වැ නො වළඳුනු ඉසා......."(E.Z, vol.i, p.233). මිහින්තලා පුවරු ලිපිය ද දක්වන්නේ එම විහාරයේ පදිංචි භික්ෂූන්ට එම විහාර දේපළ පරිභෝජනය කළ හැකි බවයි. "මෙ වෙහෙරු ආවුතුවාක් අවැසැ බද්ගම් බිම් මෙහි මෙ පසක් දී නිබද් වැ වැසැ වළඳත් මුත් දවස් හා එක් කුෂ වැ නො වැළැඳියැ යුතුය....... "(E.Z, vol.i, p.85). v වන කාශ්‍යප රජුගේ අනුරාධපුර පුවරු ලිපිය අනුව ඇතුළු විහාරයෙන් මෙහෙකරුවන්ට ලබා දුන් දහයෙන් පංගුව හැර විහාරයට අයත් වැව අසල කුඹුරු පෙළ හා ප්‍රවේණි කුඹුරු නොගත යුතු බව දක්වයි. එමෙන් ම භික්ෂූන් ගොවිකම් නොකළ යුතු බව ද මෙම ලිපියේ දක්වා ඇත.

10 වන සියවස පමණ වන විටත් වැව් අමුණු කෙත් වතු රැසක් විහාරාරාම සතු දේපළ වූ බව මින් පැහැදිලි වේ. යම් අවස්ථාවල දී විහාරය සතු දේපළ විකිණීමට නොහැකි වූ නමුත් විහාරයට නියම කළ වස්තුවෙන් ඉතිරියක් ඇති නම් ඉඩම් මිල දී ගැනීමට ද හැකි වූ බවට සාධක ඇත."පිරිකැපූ වන්

මුත් ඉතිරිතුවාක් දැයින් සඟුන් දසන් වටා කම් නවාම් පුජ සිතුවම් කොට් වැඩියාක් ඇත ගම් ගන්නා ඉසා....."(E.Z, vol.v, p.46). අනුරාධපුර අවසන් භාගයේ පමණක් නොව ක්‍රි. පූ යුගයේදී ද භික්ෂූන්ට පෞද්ගලිකව ඉඩම් හිමිව තිබූ බවට සාධක රැසක් දක්නට ලැබේ. ඒ ඒ විහාරයට පමණක් නොව එක් එක් භික්ෂූන්ට වෙන් වෙන් වශයෙන් දේපළ හෝ ලෙන් පූජා කළ බවට සාධක ඇත. හතරවන මිහිඳුට අයත් මිහින්තලා සෙල්ලිපියේ ම කෙත්වතුවලින් ලැබුණු ආදායම්වලට අමතරව රන්, කහවණු ද ආරාමවලට පූජා කළ බව දක්වයි. "ඇත්වෙහෙරින් රන් එකසියක් කළන්ද් ඉසා, ඇතුළු විහාරයෙන් කහවණු කළ. සියයකුත්, වී දස යහලක් ඉසා, වී යාල් දහයකුත්, මෙතුවාක් ගෙනැ හවුරුදු පතා මෙ වෙහෙර් හි මෙකීතාක් ගෙන අවුරුදු පතා මේ විහාරයෙහි; දාගැබ් ඇය් හැම තන්හි කම් නවාම් කරවියැ යුතුය"(E.Z, vol.v, p.85). ආරාමවල සේවයෙහි නියුක්ත වූ පුද්ගලයින්ට වැටුප් ගෙවීම් සිදු කර ඇත්තේ ද මෙම විහාර දේපළවලින් ලත් ආදායමෙනි. අභයගිරි සංස්කෘත ලිපියේ විහාරයේ නවකම් කරන්නන් ට ගෙවීම් සිදු කරන ආකාරය දක්වයි. "(විහාර) නවකර්මයෙහි නියුක්ත ග්‍රාමයෙහි දක්ෂ වූ ගල්වඩුවන් සහ ලී වඩුවන් ද සිටිය යුතු ය. ඒ සියල්ලෝ ම (තම තමන්ගේ).....කර්මයෙහි දක්ෂ වූවන් විය යුතුයි. ඔවුන් එකිනෙකාට දිවෙල් පිණිස කිරි එක හමාරක වපසරිය දිය යුතුයි"(E.Z, vol.v, p.7). සේවකයන්ට ගෙවීම් සිදු කරනුයේ ඉඩම් කිරි එකහමාරක වපසරියක් දියයුතු බව දක්වයි. ඔවුන්ගේ වැඩ අධීක්ෂණය කරන නිලධාරියාට ද ලබා දුන් විහාර දේපළ පිළිබඳ ලිපියේ සඳහන් වේ. "ඇතුළත පිටත රැකගැන්මෙහි දක්ෂ වූ ආරාම පාලකයාහට එක එක ගමින් කිරියක් කිරියක් වපසරිය ඇති නිරවුල් වූ කුඹුරක් බැගින් දිය යුතුයි"(E.Z, vol.v, p.7). මිහින්තලා සෙල්ලිපියේ සඳහන් වන්නේ භාණ්ඩාගාරිකයාට, විහාර ලේඛකයාට, කරඬු පිළිබඳ ලේඛකයාට, කරඬු සීල් තබන්නා හා යන මොවුන්ගෙන් එක් කෙනෙකුට පස්කිරිය බැගින් හා ආරක්ෂක වෘත්තියෙහි කාර්මිකයෙකුට කිරි එකක් හා දෙපැළක් ද සහල් දෙඅඩ මනාවක් ද, විහාර සරන්නෙකුට කිරිභාගයක බිම් ද සහල් එක මනාවක් ද, විහාර උත්සව සංවිධානය කරන්නෙකුට කිරි එකක් ද දම්යෙන් කොටසක් ද වශයෙන් ලබා දුන් බව දක්වයි (E.Z, vol.v, p.85). මිහින්තලා පුවරු ලිපියේ දෙවන කොටසෙහි දීර්ඝ වශයෙන් විහාර ඉඩම් හෝ දේපළවලින් ලත් ආදායමෙන් විහාරයට සේවය කරන්නන්ට වැටුප් ගෙවීම් සිදු කළ ආකාරය දක්වයි. "විහාර ආරක්ෂා කරන්නන් (කංකාණම්) තිදෙනෙකුට ද යන මොවුන්හට දිවෙල් වශයෙන් කරන්දගම ද, වරින් වර දුම් මල් නැතහොත් දුම් කබල් සපයන්නෙකුට දම්ය ගමින් කොටස් සතරක් ද....." (E.Z, vol.i, p.85).

අනුරාධපුර අවසන් භාගයේ පමණක් නොව දහතුන්වන ශතවර්ෂය වන විටත් ශිලා ලේඛනවල විහාර දේපළ පිළිබඳ පමණක් නොව විහාරයේ සේවය කළ පුද්ගලයින්ට කළ වැටුප් ගෙවීම් ද සඳහන් කරයි. විශේෂයෙන් ම එම දේපළ පරිහරණය කළ ආකාරය ද පොත්වල සටහන් කළ බව දක්වා ඇත. රජු විසින් ජනතාවට දිවෙල් හෝ පමුණු ඉඩම් මෙන් ලබාදුන් අතර විහාර දේපළ ද භුක්ති විඳීම ද එම සේවකයන්ට හෝ සාමාන්‍ය ජනතාවට ලබා දී ඇත්තේ දිවෙල් හෝ පමුණු වශයෙන් බව පැහැදිලි වේ. මිහින්තලා ලිපියේ සඳහන් පරිදි විහාර දාසයන් හා විහාර කාර්මිකයන් හැරෙන්නට විහාර භූමියෙහි සිටින පුද්ගලයින්ගෙන් ද බිම් බද්දක් වශයෙන් විහාරයට ලබා ගත යුතු බව දක්වයි (E.Z, vol.i, p.85).

අතීතයේ සිට භික්ෂූන්ට විහාර දේපළ ආදිය හිමි වූ නමුත් සිවුරු හැර ගිය පුද්ගලයින්ට එම විහාර දේපළ පරිභෝජනය නො කළ යුතු බව දක්වා ඇත. ගිහියන්ට පමණක් නොව පැවිදි පුද්ගලයින්ට ද ඉඩම් ප්‍රදානය කිරීමේ දී එහි ස්ථිර භාවය හා අයිතිය ප්‍රකාශ කිරීම සඳහා ඉර සඳ සලකුණු කිරීම හා අත්පැන් වත්කර ප්‍රදානය කිරීම සිදු කළ බව දක්වයි. ථූපාරාම පුවරු ලිපිය රන් කෙණ්ඩියෙන් අතපැන්

වත් කොට රතනාරාම විහාරස්ථානයේ භික්ෂූන් වහන්සේලා වෙත කරන ලද ප්‍රදානයක් පිළිබඳ දක්වයි (I,C,Vol II, P.90). මෝලාහිටියවෙලේගල ශිලා ලේඛනයට අනුව පයෙලි පවත විහාරයට ඇළක් ප්‍රදානය කර ඇත්තේ ද රන් කෙණ්ඩියෙන් අත්පැන් වත් කිරීමෙනි. "සොවණි කොතුරුනි නියතෙ" (I,C,Vol II, P.28). මෙසේ භික්ෂූන්ට පූජා කළ ඉඩම්වලට අත්තාණි වරප්‍රසාද සඳහන් ඇටවීරගොල්ලෑව ලිපියේ ඉර හඳ සලකුණු කර ඇත. පොදුවේ ගත් විට විහාරවලට ඉඩම් ප්‍රදානය සිදු කිරීම රජුට පමණක් සීමා වූ බවක් නොපෙනේ සමාජයේ යම් වරප්‍රසාදයක් ලත් හෝ නොලත් ඕනෑම පුද්ගලයෙකු විසින් භික්ෂූන් සඳහා කෙත්වත් අමුණු පූජා කළ බවට සාධක ඇත. ඇතැම් භික්ෂූන් ද තවත් භික්ෂූන්ට ලෙන් පූජා කළ බවට සාධක හමුවේ.

**නිගමනය**

අතීතයේ සිට දේපළ සම්බන්ධ ඇති අයිතිය පොදුවේ හෝ පෞද්ගලික වශයෙන් භුක්ති විඳි අතර ප්‍රධාන වශයෙන් ගිහි පැවිදි දෙපිරිසටම මෙම දේපළ අයිතිය හිමිවිය. ගිහි පිරිසට අයත් දේපළ සම්බන්ධයෙන් නීති රීති රැසක් ක්‍රියාත්මක වූ අතර ඇතැම් විහාර දේපළ සම්බන්ධ නීති රීතිවල දී ගිහියන්ට යම් සහනයක් ද හිමි වූ බව පැහැදිලි වේ. වැරදිකරුවන්ට විහාර භූමිය තුළ දී දඬුවම් කිරීම තහනම් කර තිබීම මීට නිදසුන් වේ. අතීතයේ සාමාන්‍ය ජනතාවට ද දේපළ සම්බන්ධයෙන් පූර්ණ අයතියක් තිබුණු අතර පසු කාලය වන විට එනම් අනුරාධපුර අවසානය හෝ මැද භාගය පමණ වන විට මෙම දේපළ සම්බන්ධ අයිතිය රජු යටතේ ලබා දුන් ආකාරය දක්නට ලැබුණි. විශේෂයෙන් රජයේ සේවය වෙනුවෙන් ලබා දුන් ස්ථිර ප්‍රදානයන් හෝ පමුණු හෝ දිවෙල් වශයෙන් රජයට අයත් කොටස ලබාගනිමින් කළ ඉඩම් ප්‍රදානයන් පිළිබඳ දක්වයි. පැවිදි පිරිසට ද දේපළ සම්බන්ධව අයිතියක් හිමි වූ අතර පොදුවේ ගිහියන් ක්‍රි. පූ යුගයේ සිට විහාරාරාම සඳහා කළ ප්‍රදානයන් අතර වැව් අමුණු කෙත් වත් ද විය. සාමාන්‍ය ජනතාව සහ පාලකයන් ද භික්ෂූන් සඳහා මෙම දේපළ ප්‍රදානය කර ඇති අතර භුක්ති ක්‍රමය යටතේ එම ඉඩම් ජනතාවට පවරා ඇත. පොදුවේ ගත් විට ගිහි පැවිදි දෙපිරිසටම අයත් දේපළ සම්බන්ධයෙන් නීති රීති රැසක් පනවා තිබූ බව ශිලා ලේඛන අධ්‍යයනයේ දී පැහැදිලි වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


*මහාවංසය* (1996), ප්‍රථම භාගය හා ද්විතීය භාගය, සිංහල අනුවාදය, ශ්‍රී සුමංගල නාහිමි, හික්කඩුවේ සහ දොන් අන්ද්‍රියස් සිල්වා, බටුවන්තුඩාවේ, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තු ප්‍රකාශනය, කොළඹ

*සාහස්සවත්ථුප්පකරණය* (1959), බුද්ධදත්ත හිමි, පොල්වතතේ (සංස්.), කොළඹ

අමරවංශ, කොත්මලේ, *ලක්දිව සෙල්ලිපි* (1969), ඇස් .ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

අනුරින්, දිවාකර, *අනුරාධපුර පොළොන්නරු යුගයන්හි අභිලේඛන ඇසුරින් කෙරෙන ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය* (2007),ඇස් .ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

ගමගේ, ගුණසේන, *පැරණි හා මධ්‍යකාලීන ශ්‍රී ලංකාවේ නීතිය සහ අධිකරණ ක්‍රමය* (2007), සරස්වතී ප්‍රකාශන, දිවුලපිටිය

ගුණවර්ධන, වී. ඩී. එන්. එස්, *සෙල්ලිපිවලින් හෙළි කරන ශ්‍රී ලංකා ඉතිහාසය* (2003), එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

මුදියන්සේ .එන්. විජේසේකර,නන්දදේව(සංස්),*ශ්‍රී ලංකාවේ සෙල්ලිපි(ක්‍රි.ව 400-800)අභිලේඛන* (1990), කොළඹ;පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

වික්‍රමසිංහ, දොන් මර්තීනු ද. සිල්වා වික්‍රමසිංහ, (සංස්.),කරුණාරත්න, සද්ධාමංගල (පරි.), *ශිලාලේඛන සංග්‍රහය* (2000), පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ.

Paranavithana, s. *Inscriptions of Ceylon. Vol: i, Vol: ii, Vol: iii* (1970), Sri Lanka, Department of Archaeology.

Wickramasinghe, Don Martino, De Zilva (ed.) *EPIGRAPHIA ZEYLANICA Vol: i,ii,iii* (1912), Oxford University press, London.

# Possible application of Sickling test in haemoglobinopathy screening of Sri Lanka

Thamal Darshana[1], Nugee Perera[2], Aresha Manamperi[3], Anuja Premawardhena[4]

## Abstract

The national screening programme for thalassaemia in Sri Lanka is currently using full blood count with red cell indices as the technique to identify haemoglobinopathies. This approach is likely to miss sickle haemoglobin (Hb-S) as it is well known that sickle haemoglobin is not associated with hypochromic microcytosis. Sickling test is a low cost microscopic screening test which detects sickle cell by its characteristic appearance. Therefore, the present study was undertaken to assess the performance of sickling test in identifying Hb-S among relatively high risk population in Hambantota district. A total of 581 school children (grade 11) were selected randomly from five (5) schools in Hambantota district. A blood sample (2ml) was collected from each participant after obtaining informed assent and consent. Screening panel comprises with sickling test by sodium metabisulphite method, one tube osmotic fragility test, dichlorophenol indophenol test, full blood count and Zinc protoporphyrin test. Haemoglobin phenotyping of each sample was confirmed by capillary electrophoresis technique. Four students out of 581 had sickle trait. Three other types of haemoglobinopathies were detected including β-thalassaemia trait (n=17), haemoglobin D trait (n=2) and haemoglobin E trait (n=1). Iron deficiency was observed in 8% (n=44) of students. All 4 cases with sickle trait were positive for sickling test and all other cases were negative. None of the Hb-S case demonstrated hypochromic microcytosis in full blood count. The average time taken for red cells with sickle haemoglobin to assume the characteristic sickle shape was 28 minutes and 45 seconds. Sickling test demonstrated 100 % sensitivity and 100 % specificity in identifying sickle trait. Inclusion of sickling test in screening individuals for haemoglobinopathies would have an additional advantage as highly specific, sensitive and low cost test for detecting sickle haemoglobin.

***Keywords :*** *Sickling test; screening; haemoglobinopathies; Hambantota; Sri Lanka.*

[1] Department of Allied Health Sciences, University of Sri Jayewardenepura, Gangodawila, Sri Lanka
[2] Manipal college of medical sciences, Nepal
[3] Molecular medicine unit, University of Kelaniya, Ragama, Sri Lanka
[4] Department of Medicine, University of Kelaniya, Ragama, Sri Lanka

## Introduction

Sickling test is a low cost microscopic test used to identify sickle cells in a wet preparation. The test encompasses the use of extraneous reducing agent to induce the formation of sickle shaped red cells. The test was first described by Daland and Castle with the use of Sodium metabisulphite as the reducing agent (Daland & Castle, 1948). Sickling test have demonstrated a high sensitivity and specificity with a greater diagnostic accuracy in detecting sickle haemoglobin (Hb-S) suggesting it's usage in preliminary screening of children for sickle cell disease. Besides, the procedure of the sickling test has been shown to be much easier than other screening tests such as sickle solubility test and peripheral blood film method (Okwi, Byarugaba, Parkes, & Ocaido, 2010).

National screening programme of thalassaemia in Sri Lanka currently rely on haemoglobin level and red cell indices (Mean corpuscular volume, mean corpuscular haemoglobin) when screening individuals for haemoglobinopathies. Nonetheless, relying merely on red cell indices and haemoglobin level is not appropriate as sickle haemoglobin carriers do not demonstrate reduction in mean corpuscular volume (MCV) and mean corpuscular haemoglobin (MCH) (Castro & Scott, 1985; Chikhlikar & Wilkinson, 2014). Hence, sickle carriers could be missed and misidentified as normal individuals. Therefore, this study was conducted to determine the screening utility of sickling test in identifying sickle carriers among a relatively high risk population in Hambantota district of Sri Lanka.

## Materials and methods

Grade 11 state school children were recruited for the study from randomly selected five schools in Hambantota district including; Weerakeatiya Rajapaksha central college, Angunakolapalassa Mahanaga national school, Suriyawewa central college, Ambalantota Theraputta national school and Debarawewa central college. A total of 581 students were selected. At least 100 students were randomly selected from each school with the help of teachers in charge of grade 11 in the respective school. Prior approval was obtained from the Education department of Southern province, Director of health service – Southern province and Director of health service – Hambantota district. Informed written consent from the participating student and informed assents were collected from a parent of students before data collection. A lecture was conducted on awareness and prevention of Sickle cell disease and thalassaemia for participating students and their parents in each school prior to data collection. 2ml of anti-coagulated blood sample was collected from each participating student.

Additionally, demographic data including; name, age, address, gender and ethnicity were also collected. Screening test panel in the present study incudes Full blood count (FBC), sickling test (Sodium metabisulphite method), Dichlorophenolindophenol test (DCIP), Zinc protoporphyrin test (ZPP) by Protofluro-Z Reagent method and single tube osmotic fragility test (SOFT). Haemoglobin phenotyping of each sample was confirmed by capillary electrophoresis technique (by Sebia Capillarys 2 flex piercing machine).

To estimate the co-existing Iron deficiency among recruited students ZPP was selected above serum ferritin estimation because along with heme; the ZPP/heme ratio has shown to foresee pre-anaemic iron deficiency better than serum ferritin levels which could affect by recent inflammations and infections (Crowell, Ferris, Wood, Joyce, & Slivka, 2006; Magge, Sprinz, Adams, Drainoni, & Meyers, 2013; Yu, 2011). Ratio of ZPP to Heme in the red blood cell was used to assess the iron status in the current study. Those who have values over 70 µmol ZPP/mole Heme were categorized as iron deficient individuals. Sickling test was conducted by 2% aqueous Sodium metabisulphite method as described by; (Old J & National Library of Medicine, 2012)

*Protocol of sickling test*

1. One drop of EDTA blood was mixed with 1 drop of 2% sodium metabisulphite solution on a microscope slide.
2. Smear was covered with a cover slip and edges were sealed with nail varnish.
3. Slide was immediately examined under the microscope with 40x magnification.
4. If negative for sickling, slide was examined intermittently up to 4 hours at room temperature before discarding.

*Statistical Analysis*

Statistical analyses were done using Statistical package for social sciences (SPSS) version 23 and Microsoft Excel programme (version 2013).

*Ethical Approval*

Ethical clearance for the study was obtained from Ethics Review Committee of Faculty of Medicine, University of Kelaniya. Ref No: p/01/01/2016.

**Results**

A total of 581 students were assessed in the present study including; 303 (52.2%) female students and 278 (47.8%) male students. Mean age was 15.83 (SD: 0.38) years. Four types of haemoglobinopathy carriers were identified by haemoglobin phenotyping. 24 out of 581 students (4%) were carriers of heamoglobinopathy. β-thalassaemia carriers (2.92%, n=17) reported at the highest frequency followed by Hb S trait (0.69%, n=4) in Hambantota district. Other haemoglobinopathy carriers identified include haemoglobin-D trait and haemoglobin-E trait. 44 (8%) students had ZPP values over 70 µmol /mole of Heme suggesting iron deficiency. Based on ZPP assessment 11 out of 17 β-thalassaemia trait subjects were identified to have iron deficiency.

**Table 01: Different types of haemoglobinopathy carriers (n=581)**

| Haemoglobinopathy | Count (n) | Prevalence |
|---|---|---|
| β-thalassaemia trait | 17 | 2.92% |
| Hb S trait | 4 | 0.69% |
| Hb D trait | 2 | 0.34% |
| Hb E trait | 1 | 0.17% |
| Total | 24 | |

Sickling test was positive in all 4 cases with Hb-S trait and was negative in others exhibiting 100% sensitivity and 100% specificity in identifying Hb-S trait. The average time taken for red cells with Hb-S to assume their characteristic sickle shape was 28 minutes and 45 seconds. DCIP test was positive in only one case with Hb-E trait. 85 (14.63%) out of 581 subjects were positive for single tube osmotic fragility test. Out of 17 β-thalassaemia trait subjects 16 had positive SOFT result. All the Hb-S and Hb-D trait subjects were negative for SOFT while the Hb-E trait individual was positive for SOFT. Sensitivity of SOFT to detect β-thalassaemia trait was 94.18%. 25 out of 44 individuals including 10 β-thalassaemia trait subjects with ZPP >70 iron deficiency had positive SOFT. Further, 46 out of 86 with positive SOFT did not have either β-thalassaemia trait or iron deficiency.

**Table 02: Different interactions of screening tests in the panel**

| | β-trait | S-trait | D-trait | E-trait | Iron deficiency |
|---|---|---|---|---|---|
| **ST (+)** | 00 | 4/4 | 00 | 00 | 00 |
| **SOFT (+)** | 16/17 | 00 | 00 | 1/1 | 25/44 |
| **DCIP (+)** | 00 | 00 | 00 | 1/1 | 00 |
| **Low MCV, MCH** | 17/17 | 00 | 00 | 1/1 | 44/44 |
| **ZPP (>70 u)** | 11/17 | 00 | 00 | 00 | 44/44 |
| **No of cases** | 17 | 4 | 2* | 1 | 44 |

**Discussion & conclusion**

Present study identified the prevalence of Hb-S in Hambantota district as 0.69% among grade 11 students, while β-thalassaemia trait was detected at a prevalence of 2.92%. However, the prevalence of Hb-E trait and Hb-D trait were much lower. As table 02 demonstrates no screening test was able to pick up Hb-S except sickling test and it did not demonstrate any interaction with other haemoglobinopathies / iron deficiency except with Hb-S. Similarly, DCIP also did not demonstrate any interaction with other haemoglobinopathies/iron deficiency except with haemoglobin-E. Contrary to above mentioned tests; SOFT and low MCV/MCH values were not specific showing positive responses for both β-thalassaemia trait and iron deficiency. Nevertheless, the sensitivity of SOFT to detect β-thalassaemia trait was high (94.18%). But when compared with FBC and red cell indices it missed one individual with β-thalassaemia trait. Similar findings of low specificity of SOFT have been reported in earlier studies too (Ansari et al., 2014; Thomas, Srivastava, Jeyaseelan, Dennison, & Chandy, 1996). Additionally, no screening test in the panel were able to identify haemoglobin-D. The four students with Sickle-trait had normal haemoglobin levels (mean Hb: 13.6 g/dl) and red cell indices (mean MCV: 82.25 fL; mean MCH: 27.8 pg) suggesting if had they been screened for haemoglobinopathies solely with the indicators such as haemoglobin level and hypochromic microcytosis, all of them would have missed and incorrectly labeled as normal individuals. Previous study identified higher degree of false positivity of ZPP in individuals with β-thalassaemia trait (Rodrigo et al., 2018). In this study when cross checked with other indicators of iron deficiency like serum ferritin, transferrin receptors levels, ZPP seemed to be elevated in

most individuals with β-thalassaemia trait. Likewise, even in the present study most individuals with β-thalassaemia trait (11/17) had elevated ZPP. Thus this value needs to be interpreted with caution. The unexplained ZPP elevation may suggest individuals with a thalassaemia, who were not characterized in the present study.

Present study have demonstrated 100% sensitivity and specificity of sickling test by Sodium metabisulphite method. Essentially, our results have shown that sickling test is independent from various other interactions with different haemoglobinopathies. Besides, the procedure of the test is easier to follow and may perform by a qualified medical laboratory technologist without any hassle. Given the required laboratory items, sickling test can be performed in field setup too. Although haemoglobin phenotyping by high performance liquid chromatography or capillary electrophoresis are the confirmatory tests for haemoglobinopathies, the baring cost for these tests is paramount. Therefore, we recommend to include sickling test in the national thalassaemia screening programme of Sri Lanka as it has an additional value on detecting sickle haemoglobin as well.

**Acknowledgment**

Funding for the present study was provided by National Research Council, Sri Lanka under the grant No: NRC: 16-001.

Concession provided by;

Southern province provincial director of health service

Regional director of health service – Hambantota district

Southern province provincial director of education

## References

Ansari, S. H., Hanifa, A., Saleem, A., Ali, S. M., Hussain, Z., Zohaib, M., . . . Hussain, S. R. (2014). Sensitivity and specificity of single-tube osmotic fragility test and its different methods as screening test for thalassemia trait: an alternative to expensive laboratory tests for resource-limited countries. *Eur J Haematol, 93*(6), 516-520. doi:10.1111/ejh.12392

Castro, O., & Scott, R. B. (1985). Red Blood Cell Counts and Indices in Sickle Cell Trait in a Black American Population. *Hemoglobin, 9*(1), 65-67. doi:10.3109/03630268508996983

Chikhlikar, K., & Wilkinson, A. (2014). A study of red cell parameters in patients of sickle cell trait. *IOSR journal of dental and medical sciences, 13*(3 (IV)), 5.

Crowell, R., Ferris, A. M., Wood, R. J., Joyce, P., & Slivka, H. (2006). Comparative effectiveness of zinc protoporphyrin and hemoglobin concentrations in identifying iron deficiency in a group of low-income, preschool-aged children: practical implications of recent illness. *Pediatrics, 118*(1), 224-232. doi:10.1542/peds.2006-0156

Daland, G. A., & Castle, W. B. (1948). A simple and rapid method for demonstrating sickling of the red blood cells; the use of reducing agents. *J Lab Clin Med, 33*(9), 1082-1088.

Magge, H., Sprinz, P., Adams, W. G., Drainoni, M., & Meyers, A. (2013). Zinc protoporphyrin and iron deficiency screening: Trends and therapeutic response in an urban pediatric center. *JAMA Pediatrics, 167*(4), 361-367. doi:10.1001/jamapediatrics.2013.751

Okwi, A. L., Byarugaba, W., Parkes, A., & Ocaido, M. (2010). The Reliability of Sickling and Solubility Tests and Peripheral Blood Film Method for Sickle Cell Disease Screening at District Health Centers in Uganda. *Clinics in Mother and Child Health, 07*, 5. doi:10.4303/cmch/C101947

Old J, H. C. L. T.-S. J., & National Library of Medicine. (2012). *Prevention of Thalassaemias and Other Haemoglobin Disorders : Volume 2: Laboratory Protocols . 2nd edition*. Place of publication not identified: Thalassaemia International Federation.

Rodrigo, R., Allen, A., Manampreri, A., Perera, L., Fisher, C. A., Allen, S., . . . Premawardhena, A. (2018). Haemoglobin variants, iron status and anaemia in Sri Lankan adolescents with low red cell indices: A cross sectional survey. *Blood Cells Mol Dis, 71*, 11-15. doi:10.1016/j.bcmd.2018.01.003

Secretariat, H. D. (2018). BASIC INFORMATION – HAMBANTOTA DISTRICT. Retrieved from http://www.hambantota.dist.gov.lk/index.php?option=com_content&view=article&id=45&Itemid=37&lang=en

Thomas, S., Srivastava, A., Jeyaseelan, L., Dennison, D., & Chandy, M. (1996). NESTROFT as a screening test for the detection of thalassaemia & common haemoglobinopathies--an evaluation against a high performance liquid chromatographic method. *Indian J Med Res, 104*, 194-197.

Yu, K. H. (2011). Effectiveness of zinc protoporphyrin/heme ratio for screening iron deficiency in preschool-aged children. *Nutrition Research and Practice, 5*(1), 40-45. doi:10.4162/nrp.2011.5.1.40

# හැඟීම්වලට වහල් නොවී බුද්ධියට තැන දීම, තර්ක ශාස්ත්‍රයේ පැනෙන න - රූපික තර්කාභාස ඇසුරින් සිදු කරන විචාරාත්මක විමර්ශනයක්

Prasad P.L. Jayalal

## හැදින්වීම

විවිධත්වයෙන් හා විෂමත්වයෙන් අනූන වූ මෙම සමාජ වපසරිය තුළ පුද්ගල ජීවන ක්‍රියා කලාපය ද එකී ගති ලක්ෂණ වලින් සමන්විත බැව් පැහැදිලිය. මෙකී සමාජ වපසරියේ සුජීවත් වන මිනිසාගේ චරිත ස්වභාවය තේරුම් ගැනීම උගහටය. එබැවින් මොනයම් ආකාරයකින් අධ්‍යයනය කර බැලුවද මිනිස් ස්වභාවය පිළිබඳව නිශ්චිත නිගමනයකට එළඹීම අසීරුය.

මේ අනුව මෙකී සමාජගත පුද්ගල ස්වභාවයන්ගේ ක්‍රියාකාරීත්වය නිසි ලෙස තේරුම් ගැනීමේ අපහසුව නිසාම අප සමාජයේ විවිධ ආකාරයෙන් මුළාවට පත් වන අවස්ථා අපමණය. මෙම තත්ත්වයන් තුළ විශේෂයෙන් අපට සිදු වනුයේ අපගේ බුද්ධිමය භාවය හා තාර්කික චින්තනය පසෙකලා හැඟීම් හා ආකල්ප උපයුක්තයෙන් යම් යම් නිගමන වළට එළඹීමයි. ඇතැම් විටක එය අපගේ ආචාරවත් බව යැයි හැඟී ගියද ඉන් අයුතු ප්‍රයෝජන වෙනකෙකු විසින් බුක්ති විඳීමට කටයුතු කරනු ඇත. උක්ත ආකාරයේ විවිධ වූ චෛතසික රටාවන්ගේ යම් යම් ස්වරූප තර්ක ශාස්ත්‍රයේ පැන නැගෙනු ලබන න - රූපික තර්කාභාස වලින් යථාවබෝධ කොට ගත හැකිය.

විශේෂයෙන් ම එකිනෙකාගේ පරමාර්ථයෙන් නිෂ්ඨාවන් සපත කර ගැනීම උදෙසා විවිධ ආකාරයේ තර්ක ගොඩ නගමින් එකී තර්ක සනාථ කර ගැනීම උදෙසා ඇතැම් අවස්ථාවන්හි මුසාවන් ව්‍යාජ හේතූන් හා මිනිසුන් මුලාවට පත් කිරීම් සිදු කරනු ලබයි. ඒ අනුව හුදෙක් කථනයේ දී පමණක් නොව ලේඛනයේ දී ද මිනිසුන් මුළාවට පත්වන ආකාරයේ භාෂා භාවිතයන් සිදු කරයි. එවැනි අවස්ථාවන්හි මෙම න - රූපික තර්ක ආභාස ඉස්මතු වනු ලබයි. ඒවා නිසි ලෙස හඳුනා ගැන්ම බුද්ධි ගෝචර වූ නිගමනයන් ට එළඹීම උදෙසා ඉවහල් වේ.

තවදුරටත් අප නිබඳවම නොදැනුවත්වම මුළාවට පත්වන අවස්ථා බොහෝය. මෙහි දී දේශපාලඥයින්ගේ ක්‍රියා කලාපය ඉහලින් ම පවතිනු ලැබේ. එමෙන් ම ජනමාධ්‍යය ක්ෂේත්‍රයේ බොහෝ වෙළඳ දැන්වීම් කලාව තුළද ක්‍රියාත්මක වනුයේ මෙකී මිනිසුන් මුළාවට පත් කිරීමේ වැඩ පිළිවලය. මෙවන් අකාරයේ මුළා කිරීම් වළට හසු නොවීමට එම මුළාවට පත් කිරීමේ ප්‍රයෝග දැන සිටීම වැදගත්ය. එසේම මෙම න - රූපික තර්කාභසයන් පිළිබඳව දැනුවත් භාවය ඇතිව හෝ නැතිව මෙම අවස්ථාවන් පොදු මහත් සමාජයේ සිදු වේ. ඒවා යහපත් චේතනාවෙන් හෝ අයහපත් චේතනාවෙන් සිදු විය හැකිය. මා මෙහිදී උත්සාහ කරන්නේ මෙම සමාජයේ මෙම පැතිකඩ පිළිබඳව උගත් හා නූගත් දෙපාර්ශවයට ම අවබෝධයක් ඇති කිරීම හා එහි ප්‍රායෝගික භාවිතාව පිළිබඳ විමර්ශනයක් සිදු කිරීමය. ඒ අනුව මෙහිදී මා පුවත්පත් ආශ්‍රිතව, පාර්ලිමේන්තු සංවාද ඇතුළත් හැන්සාඩ් වාර්ථාව හා රූපවාහිනී නාළිකාවන්හි විකාශනය කරන වෙළඳ දැන්වීම් සම්බන්ධයෙන් මූලික අවධානය යොමු කර ඇත.

මිනිසාගේ ස්වභාවය වනුයේ ප්‍රකාශ කරන දෙයට වඩා ප්‍රමාණයක් සිත්හි තබාගෙන ප්‍රකාශ නොකර සිටින ප්‍රමාණය විශාල වීමය. මෙකී ප්‍රකාශ නොකර සැගවී ඇති කොටස් ද හැඳින ගැනීම උදෙසා මෙම තර්කාභාසය පිළිබඳ අවබෝධය ඉවහල් වනු ඇත. එම යථාවබෝධය ඔබ මුළාවෙන් මුදවා

යථාර්ථය පසක් කර ගැනීමට බෙහෙවින් ඉවහල් වනු ඇත. එය සමාජ, දේශපාලන හා ආර්ථික යන පැතිකඩයන් උදෙසා වැදගත් වනු ඇත. ඒ අනුව තර්ක ශාස්ත්‍රයේ මෙකී ආභාසයන් පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී මූලික වශයෙන් මේ ආකාර ආභාසයන් න - රූපික ආභාසයන් ලෙසින් දක්වනු ලැබේ. නමුත් මීට අමතර තර්කශාස්ත්‍රය තුළ රූපික ආභාස ලෙසින් මූලික කොටසක් පවතිනු ලැබේ. එනම් එය ඇරිස්ටෝටලියානු තර්කන පද්ධතියේ තර්ක ආභාසයන් පිළිබඳව ගොඩ නැගෙන වැදගත් කොටසක් ලෙසින් හැඳින ගත හැකිය. මේ අනුව මූලික වශයෙන් මෙම රූපික හා න - රූපික තර්කාභාසයන් පිළිබඳ අවබෝධය මෙහිදී හැඳින ගැනීම වැදගත්ය.

**රූපික තර්කාභාස ( Formal Fallaceies)**

රූපික තර්කාභාසයන් පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී අපට පසක් වනුයේ මෙම ආභාසයන් මූලික වශයෙන් රූපික තර්කන පද්ධතියක් යටතේ දක්නට හැකි බවය. එනම් මෙම ආභාසයන් ඇති වීමේ දී කිසියම් තර්කයක ව්‍යුහය නැතිනම් එම තර්කයන්හි අදාළ අකෘතිය බිද වැටීම මෙන්ම තාර්කික නියතීන්ට හා රීතීන්ට අනුකූල නොවීම යන කරුණු කාරණා හේතු කර ගනිමින් ඇති වන්නා වූ ආභාස රූපික ආභාස වන බවය.

උදා - ඉදින් සියලු A, B වේ නම් එවිට සියලු A, C වේ.

සියලු A, C වේ.

එමනිසා සියලු A, B වේ.

මෙම තර්කය නිෂ්ප්‍රමාණ වේ. එනම් මෙහිදී මෙම තර්කය තර්කශාස්ත්‍රයේ එන මිශ්‍ර සෝපාධික තර්ක වලට අයත් නාස්ති ප්‍රකාරය රීතිය මෙම තර්කයේ බිඳවැටී ඇති බැවිනි. එනම් ' සාධ්‍ය අවයවයේ අපරාංගය ප්‍රතිශේධ කිරීමෙන් නිගමනය කර ගන්නා පූර්වාංගයේ ප්‍රතිෂේධය' යන ආකෘතිය මෙහි බිද වැටී ඇත. එනම් මෙහිදී නාස්ති ප්‍රකාර රීතිය බිඳී ඇත. අනුව මෙම තර්කය තුළ රූපික ආභාසය ඇති වී ඇති ආකාරය පැහැදිලි කර ගත හැකිය. මෙම ආභාසයන් ඇති වීමේ දී කිසියම් ආකාරයක බාහිර ලෝකය පිළිබඳ සිතා බැලීමක් හෝ එහි ප්‍රායෝගික භාවිතය පිළිබඳව තැකීමක් සිදු නොකරයි. අවැසි වන්නේ පවත්නා වූ තාර්කික ව්‍යුහයන් හා රීතීන් ට අදාළ ආකාරයෙන් තර්කය ගොඩ නැගී තිබීම පමණි. මේ අනුව සාම්ප්‍රදායික ඇරිස්ටෝලියානු තර්ක ශාස්ත්‍රය තුළ මේ ආකාර වූ රූපික තර්කාභාසයන් ද බොහෝ ප්‍රමාණයක් දැකිය හැකිය. මෙහිදී ඒ පිළිබඳ පුළුල් අවධානයක් යොමු නොකරන අතර අවැසි වනුයේ න - රූපික තර්කාභාස හා රූපික තර්කාභාස අතර මූලික වෙනස හැඳින ගැනීමය. මේ අනුව මෙම පරීක්ෂණය මගින් වැඩි අවධානයක් යොමු කරනුයේ න - රූපික තර්භාසයන් උදෙසාය. ඒ අනුව න - රූපික තර්කාභාස පිළිබඳ අවධානය යොමු කළ හැකිය.

**න - රූපික තර්භාසය ( Informal Fallaceies)**

මෙහි වචනාර්ථයෙන් ම ගත් කළ වැටහෙනුයේ රූපික නොවන තර්ක ආභාසයන් ඇති වීම යන්නය. මේ අනුව උක්තයේ සඳහන් කරුණට යෙදුනු ආභාස ක්‍රමයට හාත්පසින් වෙනස් ආකාරයකි මෙම න - රූපික තර්භාසය තුළ දැකිය හැක්කේ. විශේෂයෙන් ම මෙහිදී වැදගත් කාරණයක් වනුයේ මෙම තර්ක ප්‍රායෝගික ලෙසින් බාහිර ලෝකයේ පවත්නා වූ තත්ත්වයන් සමඟ සක්‍රියව පවත්නා වූ ආභාසයන්

වන බවය. මේ ආකාරයෙන් මෙම ආභාසයන් දෛනික ජීවිතයේ දී ඇතැම් නිගමන වළට එළබීමේ දී ඇති විය හැකි වැරදි සහගත ආකාරයේ නිගමන විය හැකිය. මේ අනුව මේ ආකාර නිගමනයන් කරා එළබීම උදෙසා මූලික වන්නා වූ අවයවයන් පිළිබඳ මනා තාර්කික දැනුමකින් යුක්ත වීම වැදගත් වනු ලැබේ. විශේෂයෙන් නිගමනයට අදාළ නොවන ආකාරයේ හා එය සනාථ කිරීමට තරම් ප්‍රමාණවත් නොවන ආකාරයේ අවයවයන් තුළින් අප දෛනික ජීවිතයේ නිගමන ලගා කර ගැනීම හරහා අප මුළාවට පත් වන අවස්ථා බොහෝය. එවැනි තත්ත්වයන් උදෙසා යම් පූර්ව අවබෝධයක් ලබා ගැනීමට මෙම න - රූපික තර්කාභාසයන් පිළිබඳව දක්විය හැකිය.

මේ අනුව මෙම අධ්‍යයනය තව දුරටත් ප්‍රායෝගික අකාරයෙන් මෙම න - රූපික තර්කාභාසයන් පිළිබඳව දක්වීමට කටයුතු කර ඇත. මේ ආකාර වූ න - රූපික තර්භාසයන් 13ක් පමණ ඇරිස්ටෝටල් විසින් ඉදිරිපත් කර ඇති අතර තව දුරටත් මෙම න - රූපික තර්භාසයන් තර්ක ශාස්ත්‍රය උදෙසා ඉදිරිපත් වී ඇත. මේ අනුව මෙම න - රූපික තර්භාසයන් විවිධ වර්ගී කරණයන්ට ලක් කර ඇති නමුත් එම වර්ගීකරණයන් සම්බන්ධයෙන් ද පොදු එකගතාවයක් දැකිය නොහැකිය. කෙසේ වෙතත් මෙම අධ්‍යයනය මගින් මෙම න - රූපික තර්භාසයන් පිළිබඳව ඉතා ප්‍රායෝගික ආකාරයේ අධ්‍යයනයක් සිදු කිරීම උදෙසා උත්සුක වනු ලැබේ. විශේෂයෙන් ම අප නොදැනුවත්වම මෙම සමාජයේ විවිධ නිගමන හා තීන්දු තීරණ ගැනීමේ දී මෙම අභාසයන්ගෙන් භ්‍රමයටපත් නොවීම උදෙසා මග පෙන්වීමක් මෙමගින් සිදු කර ඇත. එසේම තර්කශාස්ත්‍රය පිළිබඳ ඇල්මක් දක්වන නොදක්වන හෝ ඒ පිළිබඳ අවබෝධයක් ඇති හෝ නැති අය සඳහා මෙම අධ්‍යයනය පිටුවහලක් වනු ඇතැයි මාගේ අදහසයි.

තව දුරටත් මෙම න - රූපික තර්කාභාසයන් වඩ වඩාත් තේරුම් ගැනීමේ පහසුව උදෙසා මා මෙහිදී වඩාත් ප්‍රායෝගික යෙදුම් උපකාර කරගෙන ඇත. මන්දයත් හුදෙක් මෙම තාර්කික ආභාස පිළිබඳ දැනගැනීම පමණක්ම එයින් සිදු වන මුලාවන් පැහැදිලි කරගැනීමට උපකාර නොවන බැවිනි. ඒ අනුව වඩාත් රසවත් හා ප්‍රායෝගික වීම උදෙසා සරළ භාෂාවේ එන යෙදුම් මෙහිදී උපයුක්ත කරගෙන ඇත. එහිදී මාගේ අභිලාෂය වන්නේ තර්කශාස්ත්‍රය උගත් නූගත් සියලු දෙනාට මෙම විචාරාත්මක චින්තනය උදෙසා පෙරමං සැපයීමක් කිරීමටය. කෙසේ නමුත් මෙම අතිශය සංකීර්ණ සමාජයේ මුලාවට පත් නොවීම උදෙසා හෝ තම අභිලාශයන් සපත කර ගැනීම උදෙසා හෝ මෙම තාර්කික ආභාස පිළිබඳ දැනුම පමණක් ප්‍රමාණවත් නොවන බවද සඳහන් කළ යුතුය. කෙසේ නමුත් මෙයින් හැගීම් වළට වහල් නොවී බුද්ධිමය ආකාරයේ තීරණ ගැනීම උදෙසා යම් රුකුලක් සැපයෙනු ඇතැයි මාගේ අදහසයි.

## 01. අර්ථාන්තර ආභාසය හෙවත් නො - අදාළ බව පිළිබඳ තර්කාභාසය (Fallacies of Lrrelevancy)

### 1.1 හැඳින්වීම (Introductoin)

න - රූපික තර්කාභාසයන් පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී අපට අර්ථාන්තර හෙවත් නො - අදාළ පිළිබඳ තර්කාභාස පද්ධති කාණ්ඩය පිළිබඳව මූලික වශයෙන් අධ්‍යයනය කළ හැකිය. මේ අනුව මෙම ආභාස කාණ්ඩ කීපයක් යටතේ අධ්‍යයනය කළ හැකිය. මෙම ආභාස කාණ්ඩයේ පොදු ලක්ෂණයන් කෙරේ අවධානය යොමු කිරීමේ දී අපට පසක් වන කාරණයක් වන්නේ සාක්ෂි මගින් සානාථ කිරීමට උත්සාහ කරන නිගමනයන් වෙනුවට ඊට අදාළ නොවන නිගමනයන් සනාථ කිරීමට උත්සාහ කිරීමය. මේ අනුව මෙහිදී සාවද්‍ය නිගමනයක් ඔප්පුවීමට ඉඩ හැරීම හෝ ඉදිරිපත් කරනු ලබන කරුණු නිගමනයට අදාළ බවින් තොරවීමද සිදු වේ. ඉදිරිපත් කරන කරුණු හා නිගමනයට අදාළ බවින් තොර වීම සිදු

වේ. ඉදිරිපත් කරන කරුණු හා නිගමනය පිළිබඳ සළකා බැලීමේ දී අවයව හා නිගමනය අතර කිසියම් නොඅදාළ භාවයක් දැකිය හැකි බව මෙම තර්කාභාස පිළිබඳව අධ්‍යයනයේදී ගම්‍ය වන්නකි. මෙහිදී මෙම කාණ්ඩය යටතේ ඉදිරිපත් වී ඇති තර්කාභාස කීපයක් දැක්විය හැක.

### 1.2 තර්ජනාත්මක තර්කාභාසය. (Appeal to Force)

මෙය මට ඔබට දුලබ අවස්ථාවක් නොවේ. මෙය අප සියලු දෙනා ඍජු හෝ වක්‍රව අත්විඳ ඇත. කෙසේ වෙතත් මෙහි අවසාන ප්‍රතිඵලය වනුයේ බියට හෝ මානසික පීඩනයට ලක් වී 'හරි' හෝ 'වැරදි' ආකාරයේ කරුණු පිළිගැනීමට කටයුතු කිරීමයි. ඒ අනුව මෙය **'තර්ජනාත්මක තර්කාභාසය'** ලෙස තර්ක ශාස්ත්‍රයේ තුළ හඳුන්වනු ලැබේ. ඒ අනුව යමෙකුගේ අරමුණ සාක්ෂාත් කර ගැනීම උදෙසා එයට අදාළ යුක්තීන් හා කරුණු දක්වනු වෙනුවට ඍජු හෝ වක්‍ර ලෙස තර්ජනය කරමින් බියට හෝ මානසික පීඩනයට ලක් කිරීමෙන් එකී අරමුණ සාක්ෂාත් කර ගනී. මෙහිදී ඕනෑම අයෙකුට පාහේ ඍජු වශයෙන් සිදු කරන තර්ජනයක් හැඳින ගැනීම පහසු උවත් යම් යම් ප්‍රකාශනයන්හි ගැබ්ව පවත්නා වක්‍රාකාර තර්ජනාත්මක ස්වරූපය හැඳින ගැනීම පහසු නොවේ. නමුත් තර්කානුකූලව සියුම් ආකාරයෙන් ඒ පිළිඳව පරීක්ෂා කරන්නෙකුට එහි සත්‍යය වශයෙන් ම තර්ජනාත්මක ස්වරූපයක් ගැබ්ව පවතින බව පැහැදිලි වේ.

**උදා :- ''කවුරු කොහොම පක්ෂ මාරු කරත් ඒ අයගේ ඔය කොයිකාගේත් ෆයිල් එකක් අප සතුව පවතින බැවින් පරිස්සම් වීම හොඳය..''**

මෙම ප්‍රකාශය පසුගිය කාලවකවානුවේ දේශපාලන වේදිකාවක් මත ඇසීමට හැකි වූ ප්‍රකාශයකි. මෙහිදී කිසියම් ආකාරයේ සියුම් තර්ජනයක් සිදු කරන බව පැහැදිලි කරගත හැකිය. මේ අනුව පක්ෂමාරු කරන හා ඒ සඳහා අදහස් ඇති අයගේ වැරදි සහගත ලිපිගොනු හා තොරතුරු හෙළි කිරීමට අවස්ථාව ඇති බැවින් විරුද්ධවාදී වීම සම්බන්ධයෙන් නැවත වාරයක් සිතීමට හා එසේ නොකර සිටීම උදෙසා පියවරක් සියම් තර්ජනයක් සමඟ උක්ත ආකාරයේ ප්‍රකාශනයන් මගින් සිදු වේ.

ඒ අනුව මෙහි දී ඍජු ආකාරයෙන් සිදු කරණු ලබන තර්ජනය අපට තේරුම් ගත හැකි වුවද උක්ත ආකාරයේ වක්‍රාරයෙන් සිදු වන තර්ජනය එය තර්ජනයක් දෝ යන්න පවා තේරුම් ගත නොහැකි ලෙස අප මුළා කරවනු ඇත. මෙම තත්ත්වය අප සමාජ වපසරිය තුළ සුලබව දක්නට ඇත. මෙහි දී මූලික ලෙස ඍජු තර්ජනය හා වක්‍ර තර්ජනය පිළිබද සමාජයේ සිදු වූ සංසිද්ධීන් තුළින් තව දුරටත් අවබෝධ කරගත හැකිය.

### 1.3 දෛන්‍ය මූල තර්කාභාසය (Appeal to Pity)

'හිත හොඳ කත හැමදාමත් ගැබ්බරය' මෙය අප සමාජය තුළ අප අසා ඇති උපහැරණයකි. අනුකම්පාව යහපත් වුවද මෙමගින් සමාජය තුළ පුද්ගලයා මුළාවට පත් වන අවස්ථා ඇත. එසේ වීමෙන් ඇතැම් කපටි මිනිසුන්ගේ හෝ වෙනයම් ජීවන සංසිද්ධීන් තුළ අප අතාර්කික වී තීන්දු තීරණ ගැනීම සිදු කරන ලබන අවස්ථා බොහෝය. ඒ අනුව තර්කශාස්ත්‍රය තුළ මෙය න - රූපික තර්ක ආභාසයක් ලෙස **'දෛන්‍ය මූල තර්කාභාසය'** ලෙස විග්‍රහ කරනු ලබයි.

**උදා :- ආයතනයෙන් අයතා ලෙස මුදල් ලබා ගැනීමේ සිද්ධියක් සම්බන්ධයෙන් එම වරද සිදු කරන පුද්ගලයෙක් ආයතන ප්‍රධානියෙකු ඉදිරියේ සිදු කරන ප්‍රකාශනයක්. '' මම මේ මුදල් අයතා ලෙස**

**ගැනීම සම්බන්ධයෙන් වැරදි කරු බව පිළිගනිමි. නමුත් මට එසේ කිරීමට සිදු වූයේ දරුණු රෝගී තත්ත්වයකින් පෙළෙන මගේ බිරිඳට ඖෂධ සඳහා විශාල මුදලක් වැය වන නිසාත් අධ්‍යාපනය ලබන වයසේ සිටින දරුවන් හය දෙනාට මාසිකව විශාල මුදලක් වැය වන නිසාත්ය. ඒ නිසා මට නීතමය පියවර ගෙන දඬුවම් නොකරණ ලෙස ගරු ඔබ තුමාගෙන් බැගෑපත්ව ඉල්ලා සිටිනවා.''**

මේ අනුව මෙම උදාහරණය සම්බන්ධයෙන් කරුණු අධ්‍යයනය කිරීමේ දී අපට මෙම වැරදි කිරීම සම්බන්ධයෙන් දඬුවම් විඳීමට සිටින පුද්ගලයෙකු ආයතන ප්‍රධානියාගේ අනුකම්පාව දිනා ගැනීම උදෙසා පාපොච්චාරණය කරන කරුණු මගින් පැහැදිලි වේ. ඒ අනුව නිගමනය සනාථ කර ගැනීමට අදාළ කරුණු වෙනුවට අසන්නා තුළ 'අනුකම්පාව' ඇති වන ආකාරයේ කරුණු ගෙනහැර දැක්වීම මෙහි දී සිදු වේ. මෙය සාමාන්‍යය ජන ජීවිතයේ සුලභව සිදු වන්නක් ලෙස පැහැදිලිය. එසේ ම දේශපාලන කරලියේ ද මෙවැනි අනුකම්පාව දිනා ගැනීමේ ප්‍රකාශයන් සිදු කරමින් තම තමන්ගේ අදහස් හා පාලන ක්‍රියාන්විතයන් සම්බන්ධයෙන් මහජනතාව තුළ අනුකම්පා සහගත හැඟීම් ඇති කර ගනිමින් තම තමන්ගේ වාසිය වෙනුවෙන් ක්‍රියා කරන ආකාරය දැකිය හැකිය.

**1.4 ජනෝද්වේදන තර්කාභාසය**

කෘතක්ජන වූ මිනිස් චිත්ත සන්තාපයන්ගේ හැඟීම් හා ආකල්පයන්ට ආමන්ත්‍රණය කරනු ලබන භාෂාව ලෙස මෙම තර්කාභාසය හඳුනා ගත හැකිය. එබැවින් සමාජ වපසරියේ බහුල ලෙස පුද්ගලයන් භ්‍රමයට පත් වනු ලබන න - රූපික තර්කාභාසයක් ලෙස තර්කශාස්ත්‍රයේ දක්වනු ලබන **ජනෝද්වේදන තර්කාභාසය** හඳුනා ගත හැකිය. අප මෙතෙක් අධ්‍යයනය කළ තර්කාභසයන් වාචික බවට පමණක් සීමා උවද මෙම ජනෝද්වේදනය ලිපි ලේඛන තුළින් ද සිදු කරනු ලබයි. මෙහි දී සිදු වනුයේ හුදෙක් 'නංගි පෙන්වා අක්කා දීම' වැනි ක්‍රියාවකි. විශේෂයෙන්ම පුද්ගල චිත්ත සන්තානයන්ගේ ඇති ආදරය, තරහව, වේදනාව, පළිගැනීම, අගය කරනු ලැබීම, සැළකිල්ලට ගැනීම ආදී චිත්ත චෛතසිකයන් උත්තේජනය කොට විවිධ ක්‍රියාවන්ට පෙළඹ වීම පොළඹවා ගැනීම මෙතුළින් සිදු කරයි.

**උදා :- මේ රටට, ජාතියට මුස්ලිම් ජනතාව කරන විනාශය තව දුරටත් බලා නොසිටිය යුතුය. මෙම තත්ත්වය නිහඬව බලා සිටියහොත් මහා ජාතිය වන සිංහලයන්ගේ විනාශය අත ලඟම සිදු වනු ඇත. වසර දෙදහස් පන්සීයකටත් වඩා උරුමකම් කියන මේ සිංහලයන්ගේ රට හම්බයන්ගෙන් ආරාක්ෂා කර ගැනීමට මුස්ලිම් විරෝධී සටනට ඔබත් එක් වන්න.''**

ජාතිවාදී, ආගම්වාදී, කුලවාදී අදහස් උත්තේජනය කරමින් මිනිස් චිත්ත සන්තානයන්ගේ ප්‍රපෝපකාරී මානසික තත්ත්ව ප්‍රතීයමාන කිරීම උදෙසා උක්ත ආකාරයෙන් ජනෝද්වේදනය කිරීම හරහා සිදු කළ හැකිය. රටක් ජාතියක් ලෙස පිරිහීමට ද මෙවැනි දෑ සෘජු ලෙසම අපට බලපා තිබේ. යම් යම් දේශපාලන අරමුණු හෝ ජාතිවාදී අරමුණු පදනම් කර ගනිමින් මේ ආකාරයෙන් ජනතා පදනමක් මුලා කිරීම බොහෝ සෙයින් දක්නට ලැබේ.

සාමාන්‍ය පොදු ජන ජීවිතය තුළ පමණක් නොව දේශපාලන වේදිකාව, ජනමාධ්‍යය, වෙළඳ දැන්වීම් කලාව ආදී බොහෝ පැතිකඩ ගණනාවකින් මෙකී ජනෝද්වේදනය සිදු කරයි. මේ හරහා ඉතා සියුම් ආකාරයෙන් අපගේ බුද්ධිය වසඟ කොට අපව සෘජු හෝ වක්‍ර ලෙස මුලාවට පත් කරයි.

### 1.5 පුද්ලාලම්බන තර්කාභාසය (Argument Against the Person)

කිසියම් සංසිද්ධියක දී හෝ අවස්ථාවක දී යමක් පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීම උදෙසා සිදුව ඇති දේ පසෙකලා එය සිදු කරන තැනැත්තාගේ හෝ පාර්ශවයේ පුද්ගලත්වය මත එල්බ ගනිමින් නිගමන ලබා ගැනීම මෙහිදී සිදු කරයි. අප වැනි රටක මෙවැනි දෑ දුලබ නොවේ. මේ අනුව න - රූපික තර්කාභාසයක් ලෙස **පුද්ලාලම්බන තර්කාභාසයද** වැදගත්ය.

හොද හෝ නරක ආකාරයේ නිගමනයන් සනාථ කිරීම උදෙසා තර්ක කිරීම වෙනුවට එක් එක් පාර්ශවයේ පුද්ගල පසුබිම් ස්වභාවය විවරණය කිරීම හරහා නිගමන පසක් කිරීම මෙහි දී සිදු වේ. බහු සංස්කෘතියත්, ජාතිවාදී ස්වරූපයත්, ආගම්වාදී ස්වභාවයත් හා කුලවාදී ස්වභාවයත් සක්‍රීය වූ අප රට තුළ මෙම ආභාසය තුළින් මිනිසුන් භ්‍රමයට පත් කරනු ලබන අවස්ථා බොහෝය. මෙම ආභාසය බහුල වශයෙන් දේශපාලන කරළියේ සිදු වන ආකාරය දැකිය හැකිය. මේ අනුව මෙහිදී අසන ප්‍රශ්නයට පිළිතුරු ලබාදීමට අපොහොසත් වීම හෝ ඒ සම්බන්ධයෙන් අවබෝධයක් නොමැති වීම මෙන් ම ප්‍රශ්නය මග හැරයාම උදෙසා මෙම ක්‍රමවේදය යොදා ගැනීම සිදු කරයි.

**උදා :- '' ෆෙඩ්රික් නීට්ෂේ ඔහුට හසුවන සෑම දාර්ශනයක් ම දැඩි ලෙස විවේචනය කරනු ලැබීය. ඔහු කෘති ගණනාවක් රචනා කරනු ලැබීය. එය ඔහුගේ ජීවිතයේ අවසාන කාලයේ සිදු වූවකි. නමුත් නීට්ෂේ උමතු රෝගයෙන් පෙළුනු අයෙකි. එබැවින් ඔහුගේ දර්ශනය පිළිගැනීම ගැටලු සහගතය.''**

මෙම තත්ත්වයේ දී ද සිදුව ඇත්තේ පුද්ගලත්වය කෙරෙහි අවධානය යොමු කිරීමකි. මේ අනුව නීට්ෂේ දක්වන කරුණු ප්‍රතික්ෂේප කිරීම උදෙසා තාර්කිකව කරුණු දක්වීමක් නොකර ඔහුගේ පෞද්ගලික තත්ත්වයක් පිළිබඳ දැක්වීම සිදු කර ඇත. ඒ අනුව මෙම පුද්ගලාලම්බන තර්කාභාසය දෙපිරිසක් අතර නැත්නම් පාර්ශවයන් දෙකක් අතර සංවාද තුළදී ද ඉස්මතු කරනුයේ එකිනෙකාගේ වැරදි වසා ගැනීමට හා අනෙකාව මුලා කරමින් ප්‍රශ්නයට පිළිතුරු නොදී ඉන් පැන යාමටය බව පැහැදිලි වනු ඇත. මෙහි දී ද සිදු වනුයේ ගැටලුව විසදුම් දීම වෙනුවට අනෙක් පාර්ශවයේ පැවති තත්ත්වය විවේචනය කරමින් භ්‍රමයට පත් කිරීමයි. මේ ආකාරයෙන් මෙම පුද්ගලාලම්බන තර්කාභාසය පුද්ගලත්වය කෙරෙහි ද යම් පාර්ශවයන් කෙරෙහි ද ක්‍රියාත්මක කරමින් යථා තත්ත්වය වසන් කොට මුලාවට පත් කිරීම සිදු කරනු ලැබීම අවබෝධ කර ගත හැකිය.

### 1.6 යදෘච්ඡා තර්කාභාසය (Fallacy of Accident)

මෙහි දී සිදු වනුයේ පොදුවේ සාමාන්‍යය වශයෙන් පවතින නීතියක් හෝ සම්ප්‍රදායක් විශේෂ අවස්ථා සඳහා ද යොදා ගැනීමය. ඒ අයුරින් යොදා ගැනීම තුළින් පුද්ගලයා භ්‍රමයට පත් කිරීම සිදු කරයි. මේ ආකාර වූ විශේෂ අවස්ථාවන්ට පොදු නීතිය බල නොපාන බව දක්වමින් කරුණු ඉදිරිපත් කිරීම ද සිදු කරයි. මෙම අවස්ථාවන් පිළිබඳව ප්‍රායෝගික වශයෙන් කරුණු අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වන කරුණක් වනුයේ බලය හා ධනය යන තත්ත්වයන් මත පදනම් වෙමින් සාමාන්‍යය පොදු නීතිය විශේෂ පුද්ගලයන් සඳහා විශේෂ ආකාරයෙන් යොදා ගනිමින් ඒ උදෙසා දඬුවම් කිරීම හෝ එය කිසියම් ආකාරයකට යටපත් කිරීමක් හෝ ඉන් මගහැර යාමක් සිදු කිරීමක් මෙහිදී සිදු වන බවය. මේ ආකාරයෙන් කටයුතු කිරීම හරහා සිදු වනුයේ සාමාන්‍යය පොදු ජනතව මුළාවට පත් කිරීමක් සිදු කිරීමය.

### 1.7 අර්ථාන්තරාභාසය (Fallacies of Irrelevency)

සමාජ වපසරිය තුළ ජීවත් වන්නා වූ චරිත මෙයයැයි කියා නිෂ්චිත නිගමනයකට එළඹීම අසීරුය. තම තමන්ගේ සිතැගි අපේක්ෂා ඉටු කර ගැනීම උදෙසා ඔවුන් කටයුතු කරන්නේ නිරායාසයෙනි. එහි දී මුළාවට නැත්නම් භ්‍රමයට පත් වීම ද නෛසර්ගිකව සිදු වනු ලබයි. මේ අනුව මෙම ආභාසය හරහා ද පුද්ගලයා මුළාවට පත් වන අවස්ථා බොහෝය. මේ අනුව මෙම **අර්ථාන්තරාභාසය** මගින් සිදු වනුයේ කථා කරනු ලබන මාතෘකාවට අදාළ නොවන ආකාරයේ කරුණු ඉදිරිපත් කිරීම හෝ කරුණු වරදවා වටහා ගැනීමක් තුළින් පූර්වයෙන් ඉදිරිපත් කරනු ලබන කරුණු වලට හාත්පසින් වෙනස් නිගමනයක් ලබා ගැනීමයි. මේ අනුව මෙම ආභාසය හරහා ද සමාජගත පුද්ගලයා භ්‍රමයට පත් වීම සිදු වේ.

## 02. දුබල උද්ගමන ආභාස (Fallacies of Weak Induction)

### 2.1 හැඳින්වීම (Introductoin)

මෙම කාණ්ඩය මගින් දැක්වෙන ආකාරයට යම් නිගමනයක් සනාථ කිරීම උදෙසා ගෙන එන සාක්ෂි අදාල ඒවා උවද ඒවා ප්‍රමාණවත් නොවීම හෝ දුර්වල ඒවා වීමය. එනම් ඉදිරිපත්වන අවයව කිසියම් ආකාරයකට නිගමනය හා දුරස්ථ සබඳතාවක් පැවැත්වීම මෙහිදී දක්නට හැකිය. මේ අනුව හේතුව හා ඵලය අතර ඇති සබඳතාව වැරදි ලෙස වටහා ගැනීම, ව්‍යාජ හේතුන් හා සාක්ෂි මත කරුණු පිළිගැනීම හා ප්‍රත්‍යක්ෂයෙන් ඔබ්බට ගිය හේතුන් මගින් කරුණු සනාථ කිරීමද සිදු වේ. මෙම කාණ්ඩය යටතේ ද ආභාස කීපයකි.

### 2.2 ආප්ත ප්‍රමාණ තර්කාභාසය (Appeal to Authoority)

ජනප්‍රියතාව, පිළිගැනීම මගින් හුදෙක් සමාජගත පුද්ගලයා මුලාවට පත් වීම සිදු වේ. මෙකී තර්කාභාසය හරහා ඒ පිළිබඳ මනාව යථාවබෝද කරගත හැකිය. ඒ අනුව මෙහි දී සිදු වන්නේ යම් කෙනෙකුගේ ආප්තය හෝ අධිකාරිය මත ඔහු ප්‍රකාශ කරන ලද දෙය හෝ නිරූපනය කරන දෙය ප්‍රශ්න කිරීමකින් තොරව පිළිගැනීමට ලක් කිරීමය. විශේෂයෙන් ම මෙහි දී යම් ආයතනයක හෝ සංවිධානයක නිර්දේශයක් ඔහු විසින් ඉදිරිපත් කරන අතර එම ඉදිරිපත් කරන්නා එම අදාළ ක්ෂෙත්‍රයේ කිසිදු අදාළත්වයක් නොමැති වන්නෙක් ද වේ. එබැවින් මෙම තත්ත්වය යටතේ පුද්ගලයාගේ ලැදියාව, පිළිගැනීම, කැමැත්ත හා ආශාව වැනි තත්ත්වයන් ඉස්මතු වීම මගින් අප භ්‍රමයට පත් වීම මෙහි දී සිදු වේ.

විශේෂයෙන් ම ජනප්‍රිය පුද්ගල චරිත හා යම් ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන් විශේෂඥතාවක්, නිපුණතාවක් ඇති පුද්ගලයෙකු විසින් ඉදිරිපත් කරනු ලබන නිර්දේශයන් ප්‍රශ්න කිරීමකින් තොරව, ඔප්පු කිරීමකින් තොරව පිළිගැනීම මගින් මෙම ආභාසය ඇති වේ. ඒ අනුව වෙළඳ දැන්වීම් කලාව, දේශපාලන වේදිකාව මත පමණක් නොව සාමාන්‍ය ජීවිතයේ සංවාදාත්මක අවස්ථා තුළ වුවද මෙම තර්කාභාසය සක්‍රිය බව පැහැදිලිය.

උදා :- [1]'' **ආදරණීය බිරිඳක්, මවක් හැටියට යෙහාලි ගත කරන්නේ මං තරම්ම ක්‍රියාශීලී ජීවිතයක්. එයා හැකියාවන්ගෙන් පිරුණු කෙනෙක්.**

**මේ හැමදේම මට සතුටක්, හැම සතුටු මොහොතකම කොටසක් වෙන්න මම ක්‍රියාශීලී වෙන්න ඕන.**

**යෙහාලියි මමයි හැමදාම බොන්නේ 'ඇන්ලීන්' ඇන්ලීන් වල සාමාන්‍ය කිරි වළට වඩා දෙගුණයක් කැල්සියම් විටමින් 'ඩී' හා අස්ථි පෝෂක අඩංගුයි. ජීවිතයේ ක්‍රියාශීලීත්වයට අස්ථි ශක්තිය. දැන්ම ක්‍රියාත්මක වෙන්න ඔබේ අස්ථි රැක ගන්න.''**

මෙම උක්තයේ දක්වා ඇති වෙළඳ දැන්වීම හරහා සිදු වනුයේ පුද්ගල මනස භ්‍රමයට පත් කිරීමකි. මන්දයත් ඉහත සඳහන් දැන්වීමේ අදහස් දක්වනු ලබන්නේ කුමාර සංගක්කාර හා ඔහුගේ බිරිද වන යෙහාලි සංගක්කාරය. විශේෂයෙන් ම මෙහිදී කුමාර සංගක්කාර අප රටේ ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන් සුවිශේෂ හා ප්‍රසිද්ධ සුවහසක් ජනතාවගේ ආදරය හා ගෞරවය දිනා ගත් පුද්ගලයෙකු වේ. නමුත් ඔහු උක්ත අදහස දක්වන්නේ ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන් නොවේ. ඔහු තමන්ට අදාළ නොවන කිරිපිටි නිෂ්පාදනය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන අදහස් පිළිගැනීමට ඒත්තු ගන්වනුයේ ඔහුගේ ජනප්‍රියතාව උපයුක්ත කර ගැනීම තුළින්ය.

විශේෂයෙන් ම රටක් ලෝකයක් පිළිගන්නා ලද පුද්ගලයෙකු හා ඔහුගේ පවුලේ සමාජිකයන් යොදා ගන්මින් මේ ආකාරයෙන් කරනු ලබන ඉදිරිපත් කිරීම් හරහා මහජනතාවගේ ආකල්ප  හා අදහස් මුලා කිරීමට ලක් කරණ බව පැහැදිලිය. මෙවැනි අදහස් ප්‍රශ්න කිරීමකින් විචාරයකින් තොරව හුදෙක් ආප්තය මුල් කරගනිමින් පිළිගැනීම තුළින් පැහැදිලිවම සමාජගත පුද්ගලයා මුලාවට පත් වනු ලැබේ. ඔහු මෙහිදී යම් ආකාරයක ජනොද්වේදනයක් ද සිදු කරයි. 'දැන්ම ක්‍රියාත්මක වෙන්න ඔබේ අස්ථි රැක ගන්න' යනුවෙන් දැක්වීම තුළින් එය විශදවේ.

## 2.3 අඥාන මූලික තර්කාභාසය (Fallacy of Ignorance)

නොදැනුවත්භාවය නැත්නම් අඥාන මූලිකත්වය පදනම් කරගෙනද මිනිසුන් මුලාවට පත්කිරීම් දැකිය හැකිය. විශේෂයෙන් ම යම් තර්කයක නිගමනය ගම්‍ය කර ගැනීමේ දී අසන්නාගේ නොදැනුවත් භාවය හෝ ඉදිරිපත් කරනු ලබන කරුණු කෙරෙහි මෙතෙක් සාක්ෂි නොමැති වීම යන්න පදනම් කර ගනිමින් අසන්නා භ්‍රමයට පත් කිරීම මෙහි දී සිදුවනු ලැබේ.

## 2.4 විලෝම යදෘච්ඡාභාසය (Converse Fallacy)

මෙහි දී සිදු වනුයේ විශේෂ අවස්ථා එකක හෝ දෙකක පවතින තත්ත්වයන් සාමාන්‍ය පොදු අවස්ථාවන් ට යොදා ගැනීම මගින් නිගමන සනාථ කර ගැනීම සිදු කරයි. ඒ අනුව මෙම තත්ත්වය මූලික ලෙස අධ්‍යයන කරන ලද යදෘච්ඡාභාසයේ ප්‍රතිවිරුද්ධ අර්ථය ඉදිරිපත් වන බව පැහැදිලිය. එනම් එහිදී සිදුවුයේ විශේෂ අවස්ථාවන්හි දී තත්ත්වයන් සාමාන්‍ය පොදු තත්වයන් කෙරෙහි යොදාගැනීමකි. ඒ අනුව **විලෝම යදෘච්ඡාභාසය** තුළින් සිදුවනුයේ එහි ප්‍රතිවිරුද්ධ පැතිකඩයි.

[1] https://www.youtube.com/watch?v=cRcMqgmU-2o 2018. 12. 25, 10.20 am

### 2.5 කාකතාලීය ආභාෂය (Post Hoc Ergo Propter Hoc)

සිදුවීම් දෙකක් සමීපව සිදුවිමේදී පසුව සිදුවන සිද්ධියට පුර්ව සිද්ධිය බලපාන බව සැලකීම තුළින් මෙම ආභාෂය ඇති වේ. එනම් කපුටෙකි ඉගිලෙන අවස්ථාවේදීම ගසකින් තල්ගෙඩියක් බිමට වැටේ. ඒ අනුව කපුටා ඉගිලීයාම හා තල්ගෙඩිය වැටීම අතර කිසියම් කෙනෙකු සම්බන්ධයක් ඇති බව දක්වීම මෙහිදී සිදු වේ. එනම් තල්ගෙඩිය වැටීමට කපුටාගේ ඉගිලීයාම හේතුවූවාය යන්න දක්වීම මෙම අභාසයේ ස්වභාවයයි. මෙම ආභාසමය ස්වභාවය ද නේකවිධ ලෙස සමාජයේ දක්නට ලැබේ. මෙම තත්ත්වය මූලික ව සමාජය ගැටුම්කාරී අවස්ථා ද අපට දැක ගත හැකි වේ. මුලින් සිදුවන සිදුවීම පසු සිද්ධියට බලපාන බව සාමාන්‍ය ලෙස සමාජයේ පිළිගැනීමට ලක් උනිද තාර්කික ලෙස සලකා බැලිමේදී අපට විෂද වනුයේ එසේ සැලකීමට නොහැකි බවය. මන්ද යත් යම් සිදුවිමක් මුලින් සිදුවු නිසාම පසු සිද්ධිය එහි ප්‍රතිඵලයක් ලෙස සිදුවිය නොහැකි බැවිනි. ඒ අනුව මෙමගින් ද පුද්ගල මනෝභාවයන් භ්‍රමයට පත් කිරීම උදෙසා ඉදිරිපත් වන්නක් බව පැහැදිලිය.

### 2.6 න-ගම්‍යතා ආභාසය. (Fallacy of Non Sequiter)

මෙවැනි අවස්ථා තුළින්ද පුද්ගල මනෝ මූලික ස්වභාවයන් භ්‍රමයට පත් වීම දැකගත හැකිය. ඒ අනුව එම ආභාෂයේ දී සිදුවනුයේ ඉදිරිපත් කරනු ලබන කරුණු හරහා නිගමනය සනාථ කිරීමට හැකියාව තිබුණි ද තාර්කික වශයෙන් දැඩි තහවුරු කිරීමක් කළ නොහැකි වීමය. ඒ අනුව ඉදිරිපත් කරනු ලබන කරුණු හා නිගමනය අතර සාර්ථක සබඳතාවක් නොමැති වීමය. නේකවිධ පුද්ගලයන්ගේ අභිලාෂයන් හා පරමාර්ථ ඉටුකරගැනීම උදෙසා ප්‍රායෝගික ලෙස මෙවැනි අවස්ථා සමාජ වපසරියේ නිරූපිතය මෙවැනි තත්ත්ව ස්වභාවයන් යථාවබෝධයෙන් විමර්ශනය කළ යුතුය.

## 03. සාවද්‍ය පූර්ව විනිශ්චයන් හා සම්බන්ධ ආභාස (Fallacies of Presumption)

### 03.01 හැඳින්වීම (Introductoin)

මෙම ආභාස කාණ්ඩය සම්බන්ධයෙන් පොදු ලක්ෂණයන් පිළිබඳ සළකා බැලීමේ දී අපට අවබෝධ වනුයේ සනාථ කිරීමට අවැසි නිගමනය පූර්ව අවබෝධයෙන් යුතුව තීරණය කරමින් එකී නිගමනය සනාථ කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කරමින් පූර්ව විනිශ්චය සාක්ෂි නිගමනය ලෙස ගැනීම මෙම කාණ්ඩයේ ආභාස වල සිදු වේ. ඒ අනුව මෙම ආභාස ප්‍රබේද කීපයකි.

### 3.2 සාධ්‍යසම තර්කාභාෂය. (Begging the Question)

ඔප්පු කිරීමට නැතහොත් සනාථ කිරීමට අවැසි දේ පිළිබඳ මුලික අවධානයෙන් හා අවබෝධයෙන් පෙළෙමින් තාර්කික වශයෙන් කරුණු ඉදිරිපත් කිරීම මෙහිදී සිදුවේ. ඒ අනුව අවසාන වශයෙන් සාධනය කරගැනීමට අවැසි නිගමනය පූර්ව අවයවයන් තුළට ඇතුළත් කිරීම සිදුකර නැවත එය තර්කානුකුලව ගම්‍ය වු නිගමනයක් ලෙසින් ගැනීම **සාධ්‍යසම තර්කාභාසය** නම් වේ. මෙවැනි අවස්ථාවන් යටතේ ද පුද්ගලානුබද්ධ මනෝ මූලික ස්වභාවයන් භ්‍රමයට පත් කිරීම තත්වාකාරයෙන් සිදුවනු ලැබේ.

### 3.3 බහු ප්‍රශ්න ආභාසය.

සමාජගත පුද්ගලයන් වශයෙන් අප නිරතුරුවම ප්‍රශ්න සමග ගනුදෙනු කරමින් ජීවත් වනු ලැබේ. මෙහිදී මෙම බහු ප්‍රශ්න ආභාසය ඇති වීම ද දක්නට හැකිය. විශේෂයෙන්ම මෙවැනි තත්ත්වයන් තුළ ද පුද්ගල මනෝ මූලික තත්ත්වයන් භ්‍රමයට පත් වීම සිදුවනු ලැබේ. මන්ද යත් මෙවැනි උපක්‍රමයන් යොදාගනු ලබන ලද පුද්ගලයා නිතැතින්ම මුලාවට පත් කිරීම පමණක් නොව උපහාසයට හා අපහාසයට ද බඳුන් කොටලිය හැකිය. ඒ අනුව මෙහි දී සිදු වනුයේ සනාථ කිරීමට අවශ්‍යය කරන නිගමනය සාවද්‍ය ලෙස මූලික වශයෙන් තීරණය කරමින් ප්‍රශ්න යොමු කිරීමයි. මෙම ප්‍රශ්න යොමු කිරීම හුදෙක් එක් පිළිතුරකට සීමා නොවන අතරම එමගින් තව ප්‍රශ්න කීපියක් ඉස්මතු වනු ලැබේ.

එපමණක් නොව මෙම ප්‍රශ්න යොමු කිරීමේ දී ප්‍රශ්නය යොමු කරන්නාට සාධනය කර ගැනීමට අවශ්‍යය නිගමනය ප්‍රශ්නයේ අන්තර්ගත කිරීමද විශේෂත්වයකි. එබැවින් මෙකී ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සිදු කළ යුතුය. තව දුරටත් මෙම අසනු ලබන ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී එම පිළිතුරු අසනු ලබන දෙයෙහි තහවුරු කිරීමක් බවටද පත් විය හැකිය. එබැවින් පිළිතුරු ලබා දෙන පුද්ගලයා පිළිගැනීමට මැලිවන දෙයක් උවද පිළිගැනෙන තත්ත්වයට මෙම ප්‍රශ්න ඇසීම සිදු කළ හැකිය.

### 3.4 අසත්‍ය ද්විධාකරණ ආභාසය (Fallacy of False Dechotomy)

මෙම ආභාසයද ඇති වනු ලබන්නේ පූර්ව ලෙස නිගමනය සනාථ කරමින් ඉදිරිපත් කිරීම් සිදු කරනු ලැබීමයි. ඒ අනුව මෙහිදී සිදු වන්නේ යම් කරුණක් සම්බන්ධයෙන් තොරතුරු ඉදිරිපත් කිරීමේ දී එහි විකල්ප දෙකක් දක්වාලමින් ඉන් අවැසි විකල්ප තහවුරු කර ගැනීමට උත්සුක වීමයි. එහි දී තෙවන විකල්ප අවස්ථාවක් සඳහා ඉඩ ඇහිරීමද සිදු කර ඇත. ඒ අනුව ගැටලුවක් උදෙසා පිළිතුරු ඉදිරිපත් කරන ලබන පුද්ගලයා ඒ උදෙසා ඒ උදෙසා විකල්ප දෙකක් දක්වමින් එහි වඩාත් ඵලදායි විකල්ප තහවුරු කිරීමට කටයුතු කරයි. ඒ අනුව මේ ආකාරයෙන් ද පුද්ගල මනෝභාවයන් භ්‍රමයට පත් කරමින් මේ ආකාර වූ සංසිද්ධීන් සිදු විය හැකිය. මෙය තර්ක ශාස්ත්‍රයේ **අසත්‍ය ද්විධාකරණ ආභාසය** ලෙස හඳුන්වයි. දේශපාලන කරළියේ මෙන් ම සාමාන්‍යය ජීවිතයේ ද මෙවැනි අවස්ථා දැකිය හැකිය.

## 04. සංදිග්ධතා ආභාසය (Fallaceies of Amblguity)

### 4.1 හැඳින්වීම (Introductoin)

මෙම ආභාසමය තත්ත්වයන් බොහෝ සෙයින් ලේඛණයේ දී සිදු වේ. ඒ අනුව වාක්‍ය හා පදයක් තුළින් මතුකරන අර්ථයෙහි ඇති ව්‍යාකූලත්වය සංදිග්තාවයෙන් හෝ අස්ඵුටතාවයෙන් මත වෙනත් අර්ථයක් හෝ එවැනි ආකාරයෙන් වෙනයම් ආකාරයේ අරුත් පැන නැගීමක් මෙම ආභාස තත්ත්වයේ දී සිදු වේ. මෙම ආභාසය දෙයාකර වේ.

### 4.2 ශබ්දජල ආභාසය

යමක් ප්‍රකාශ කිරීමේදී එය නිවැරදිව අර්ථ සම්පන්නව ඉදිරිපත් කළ යුතුය. විශේෂයෙන්ම භාවිතා කරන වචන සංදිග්ධතාවයෙන් හා අස්ඵුටතාවයෙන් තොර විය යුතුය. එසේම එම වචන වල අර්ථයන් දෙකක් ගැබ්ව පැවතීම සිදුනොවිය යුතුය. එසේ විමේදී මෙම **ශබ්දජල ආභාසය** ඇති වනු ලැබේ. මෙවැනි සංදිග්ධතාවයන් යුක්ත භාෂා භාවිතයක් තුළින් ද සමාජ ගත පුද්ගලයන් මුලාවට පත්විය හැකිය.

**උදා :- ''මනමාල මහත්තයෝ කිසිදේකට බය වෙන්න දෙයක් නැහැ. ඒ පැත්තේ වැඩ ඔක්කෝම මම අහවර කරලා තියෙන්නේ ආයේ දෙකක් නැහැ. ඒ දැරිවි එක පයින් ම ඔබතුමා එක්ක සහේට එන්න සූදානම්''**

මෙම ප්‍රකාශය තුළින් ද ශබ්දජල ආභාසය ඇතිව ඇති ආකාරය විමර්ශනය කර ගත හැකිය. මෙහිදී කපුවා විසින් ප්‍රකාශ කරනු ලබන්නේ මානමාල පාර්ශවය මූලාවට පත්වන ආකාරයේ ප්‍රකාශයක්ය. මෙහි සංදිග්ධතාවයක් ඉස්මතු වනුයේ 'ඒ දැරිවි එක පයින්ම සහේට ඒමට සූදානම්' යන ප්‍රකාශය තුළ ධ්වනිතාර්තයක් ගැබ්ව පැවතීම නිසාය. එනම් එක් අර්ථයක් වනුයේ මනාලියගේ පාර්ශවය මෙම කාසාද යෝජනාවට කිසිදු විරෝධතාවයකින් තොරව එක හෙළාම කැමැති බවය. නමුත් එහි තවත් අර්ථයක් ද ගැබ්ව ඇත. එනම් මනාලියට ඇත්තේ එක් පාදයක් පමණක් බවත් එබැවින් ඇය එක පයින් මෙම මනාලයා සමග සහේට එන බවත්ය. මෙවැනි සංසිද්ධීන් තුළින් සමාජ ගතවන පුද්ගලයාව භ්‍රමයට පත් නොවන්නේද. ශබ්දජල ආභාසය පිළිබඳව මූලික වශයෙන් අවබෝධය ඇති පුද්ගලයෙකු මෙවැනි කරුණක් පිළිබඳව දෙවරක් සිතනු ලැබේ. විශේෂයෙන් ම යම් ප්‍රකාශය ඍජු මතුපිට අර්ථයට වඩා ඇතුලාන්තය නැත්නම් වක්‍රව ලබා දෙන අර්ථය කෙරෙහි ද සැලකිලිමත් වීම ඔබව භ්‍රමයට පත්වීමෙන් මුදවාලයි.

### 4.3. වාක්‍ය ජල ආභාසය (Fallaceies Amphiboly)

මෙම ආභාසය ලේඛණයේදී සිදුවිය හැක්කකි. එනම් ලේඛණයේදී විරාම ලක්ෂණ වැරදි ලෙස හෝ ලියන ලද ලේඛණය ව්‍යාකරණමය දෝෂ සහිත වීමෙන් මෙම ආභාෂය ඇතිවිය හැකිය. තවදුරටත් වචන අපරීක්ෂාකාරී ලෙස යොදාගැනීම ද එයට හේතු වේ. මේ අනුව මෙම ලේඛණය වෙනයම් කෙනෙකු විසින් ඉදිරිපත් කිරීමට ලක් කිරීමේදී උක්ත ආකාරයේ දෝෂ එහි ඇතුළත් වීමෙන් **වාක්‍ය ජල ආභාසය** ඇති වේ. එසේ ආභාසය ඇති වීම මගින් පුද්ගල මනෝ මූලික ස්වභාවයන් තුළ විවිධාකාර වූ මූලාවන්ට පත් වීම තුළින් අරුත්සුන් ආකාරයේ ක්‍රියාකාරීත්වයන් ඇතිවිය හැකිය. තවදුරටත් බලාපොරොත්තු විරහිත ආකාරයේ ඛේදාන්තයන්ගෙන් ද යමක් කෙළවර විය හැකිය. **උදා :- ''එම අපරාධකරුවා වෙඩි තබා මරන්න. එපා ජීවග්‍රහනයෙන් අල්ලා ගන්න.''**

**''එම අපරාධකරුවා වෙඩි තබා මරන්න එපා. ජීවග්‍රහනයෙන් අල්ලා ගන්න.''**

**''එම අපරාධකරුවා වෙඩි තබා මරන්න එපා ජීවග්‍රහනයෙන් අල්ලා ගන්න.''**

මෙම අවස්ථා තුනෙන් අපට තත්ත්වාකාරයෙන් මෙම වාක්‍යජල ආභාසය පිලිබඳව මනාව යථාවබෝධ වනු ලැබේ. මේ අනුව මෙවැනි අවස්ථා යටතේ සිදුවනු ලබන්නේ ද, ඇතැම් විට සැලකිලිමත් වීම මගින් හෝ නොවීම මගින් මෙම තත්ත්වයන් ප්‍රයෝජනයට ගැනීමය.

ඒ අනුව යම් කෙනෙකුගේ අවශ්‍යතාවයන් ඉටුකරගැනීම උදෙසා මෙවැනි සංදිග්ධතාවයෙන් යුතු ප්‍රකාශ නිකුත් කිරීමට අවස්ථාව ඇත.

## 05. භාෂා සාදෘශ්‍යමය ආභාසය (Fallacy of Gramatical Analogy)

### 5.1 හැඳින්වීම (Introductoin)

මෙම ආභාසය ද භාෂා ස්වරූපය මත පදනම් වෙමින් ගොඩ නැගේ. ඒ අනුව මෙහිදී සිදු වන්නේ ඉදිරිපත් වන කරුණු කිසියම් ව්‍යාකූල ස්වභාවයක් දක්නට ලැබීය. වෙසෙසින් ඔබ නිගමන සනාථ කිරීමටයාමේ දී නිගමනයන් ට ප්‍රමාණවත් නොවන ආකාරයේ කරුණු ඉදිරිපත් කිරීමක් මෙහිදී සිදු වේ. එනම් කරුණු සංගතතාවයෙන් යුතු වීමය.

### 5.2 සමූහා ආභාසයය (Fallacy of Composition)

'එක මකුණයි ළමයෝ කන්නේ ඇයි ඔක්කෝම මකුණෝ මරන්නේ', මෙය සමාජයේ පවතින්නා වූ ඔබට මට හුරුපුරුදු නිතර ආසා ඇති ප්‍රකාශයකි. මෙම ප්‍රකාශයේ අන්තර්ගත වන්නේ **සමූහා ආභාසයයි.** සමූහා ආභාසය කුමක්ද යත් යම් සමූහයක පවත්නා එක් එක් අංශයන් වෙන් වෙන් වශයෙන් ගෙන සලකා බැලීමෙන් එහි පවත්නා තත්ත්ව ස්වභාවයන් සමස්ථය තුළ ඇතැයි නිගමනය කිරිමය.

**උදා :- මෙම ක්‍රිකට් කණ්ඩායමේ එක් එක් ක්‍රිඩකයා දුර්වලයන් වේ. එබැවින් මෙම ක්‍රිකට් කණ්ඩයාම දුර්වල ක්‍රිකට් කණ්ඩායමකි.**

මෙයද සමූහ ආභාසයේ එක් අවස්ථාවකි. මෙම කණ්ඩායමේ එක් එක් ක්‍රිඩකයා සතු ලක්ෂණ සමස්ථය සතුය යන්න වැරදි නිගමනයකි. මේ අනුව සමූහයකින් එක් එක් ලක්‍ෂණය ගෙන විවරණය කිරමින් එය සමස්ථයට ආදේශ කිරිම තුළින් ඇති වනුයේ පුද්ගල මනස මුලාවට පත්කරන්නා වූ ආකාරයේ ආභාසයකි. එක් එක් අය සමූහය තුළින් එළියට ගෙන විවරණය කිරීම හරහා එම හදුනාගත් ලක්‍ෂණ සමූහයට ආදේශ කිරීම යුක්ති සහගත නොවේ.

### 5.3 ඒකෛක ආභාසය. (Fallacy of Division )

මෙය සමූහ ආභාසයේ විරුද්ධ අර්ථය දෙන ආභාසය වේ. මේ අනුව මෙහි දී සිදු වන්නේ සමූහයේ පවතින ලක්ෂණය ඉන් වෙන් කර ගන්නා එක් එක් කොටසෙහිද පවතින බව දක්වන බැවිනි. ඒ අනුව මෙම තත්ත්වය මගින් ද විවිධ ආකාරයේ මුලාවට පත් කිරීම් උදෙසා යොදා ගනු ලබන අවස්ථා දැකගත හැකිය.

**උදා :- ''කැට රැගෙන එන සමූහය ආධාර ලබාගෙන නවක වදය ලබා දීමට නිවස් කුලීයට ගනු ලැබේ. එබැවින් කැටයක් රැගෙන ආධාර එකතු කරනු ලබන සිරිපාල ද නිවසක් කුලියට ගෙන නවක වදය දෙනු ලබන්නෙක් වේ.''**

මෙම අවස්ථාව ව ද ඒකෛක ආභාසය ඇති වන්නක් වේ. මෙහි කැට අරන් එන සමූහයේ ලක්‍ෂණ කැටයක් අරන් යනු ලබන සිරිපාල සතු බව ද පැවසීම මගින් සමස්ථය තුළ ඇති ලක්‍ෂණය ඔහු සතුව ඇති බව ද ඒත්තු ගන්වනු ලබයි. මෙවැනි ප්‍රකාශ හරහා අපේක්‍ෂා කරන්නේ යම් යම් පුද්ගලයන්ගේ සිතැගි අපේක්‍ෂාවන් ඉටුකර ගැනීම උදෙසා සමාජ ගත පුද්ගලයාගේ මානසික තත්ත්වයන් මුලාවට පත්වන ආකාරයේ කටයුතු කිරිම නොවේ ද? ඒ අනුව සමූහයක ඇති ලක්‍ෂණ එහි අන්තර්ගත එක් එක් පුද්ගලයෙකු සතු වේ යන්න නිගමනය කිරීම ආභාසමය සහිතය. මෙවැනි තත්ත්වයන් පිළිබඳ යථාවබෝධය වැදගත්ය.

මේ ආකාරයෙන් විවිධ පැතිකඩයන් ඔස්සේ භාෂා භාවිතයේදී එනම් ලිඛිත හෝ වාචික යන දෙකොට්ඨාශයෙහි ම අපව භ්‍රමයට පත් වන ආකාරයේ භාවිතයන් සක්‍රීයව පවතී. මෙම තත්ත්වයන් පිළිබඳ මනා අවබෝධයකින් හා අවධානයකින් පසුවීම හරහා වංචනික මිනිසුන්ගේ මුලාවට පත් කිරීම් වලට හසු නොවී සිටීමට හැකියාව ලැබෙනු ඇත. මෙකී තර්කාභාෂයන් කෙනෙකු යහමගට ගැනීම සඳහා ද උපයුක්ත කරගැනීමේ හැකියාව පවතී. එසේ යොදාගත්ත ද යම් ආකාරයක පුද්ගල මනෝමූලික ස්වභාවයන් භ්‍රමයට පත් කිරීම සිදුවේ. මේ අනුව සමාජගත පුද්ගල අනේකවිධ ස්වභාවයන්ගේ යථාර්ථවත් ස්වභාවයන් අවබෝධ කරගැනීම උදෙසා මෙම තර්කාභාෂ පිළිබඳ අධ්‍යයනය හා අවබෝධය වැදගත් බව මාගේ හැඟීමයි.

යතුරු පද - තාර්කිකත්වය, තර්කාභාස, මුලාව, යථාර්ථය, බුද්ධිය

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

එදිරිසිංහ දයා, පෙරේරා ඥාණදාස, දහනායක සෝමප්‍රිය, **මූලික තර්ක ශාස්ත්‍රය**, වත්මා ප්‍රකාශකයෝ, දෙහිවල, 1999

ජයදේව එන්. ජී. එස්, අතුකෝරාළ දයාරෝහණ, **සාම්ප්‍රදායික තර්ක ශාස්ත්‍රය (ඇරිස්ටෝටලියානු)**, ශික්ෂා මන්දිර ප්‍රකාශන, 1992

ඤාණිස්සර හිමි අල්පිටියේ, **සම්ප්‍රදායික හා නවීන තර්ක ශාස්ත්‍රය**, නෙත්වීන් ප්‍රින්ට්ස් සෙන්ටර්, පේරාදෙණිය, 2014

වෙල්ටන් ජේම්ස්, මොනැහන්, මෙලනි ඇස්. එච්., **මධ්‍යම උපාධි තර්ක ශාස්ත්‍රය**, රාජ්‍ය භාෂා දෙපාර්ථමේන්තුව, 1966

**පුවත්පත්**

ඉරිදා ලංකාදීප, 2018. 09. 09
දිවයින, 2018. 08. 12

**අන්තර්ජාල**

https://www.youtube.com/watch?v=cRcMqgmU-2o
http://www.parliament.lk

# Productive Strategies of Generating Neologisms in Sri Lankan Print Media

Anoma Abeywickremasinghe Gunawardana[1]

## Introduction and Review of Literature

Language reflects how society perceives the world. The evolution in language reveals the changes and development of society today. With the evolution and advancement of lifestyle, culture and technology we require glossaries of new words for expressing ourselves. Languages certainly adjust with such growth in society, and English, especially, is spoken widely all over the world and subjected to frequent changes. English survives the expansions in the modern society by frequent addition of new vocabulary to meet its requirements. Formation of such new vocabulary is called neologisms.

## Neologisms

Neologisms are the elements specified in morphology of a language making the language live and efficient rather than dead (Behera & Mishra, 2013). They are derivatives newly coined when the society requires new vocabulary to exchange ideas. Yule (2006) defines neologism as a new word in a language. With the recent advancements in the society a massive flux of newly coined words could be observed to avoid disruption of the continuous exchange of ideas. The term *neologism* originated in the early 19th century from the French word *néologisme* (Oxford Advanced Learner's Dictionary, 2019) and is defined as "a new word or expression or a new meaning of a word". Newmark (1988) says that neologisms can be defined as newly coined lexical units or existing lexical units that acquire a new sense. These words could take longer periods to become standardized by adding into dictionaries. Therefore, a neologism could also be defined as a word in use but not recorded in general dictionaries.

"The most salient type of neologism is a word which is new in its form and which refers to a concept which is new" (Mair, 2006). These new words mean that the new concept should be either borrowed from another language or formed according to the rules of word-formation

[1] University of Vocational Technology

processes. Neologism is also a change or transfer of meaning of an already established word. They always come from an anonymous origin and tend to appear at first in informal style. Crystal (as cited in Pacea, 2009) often uses the term coinage as synonymous with neologism.

**Strategies of Forming New Words**

Exploring the formation of new words is a constructive way of familiarizing ourselves not only with the way the language evolves and the new words we are likely to encounter but can also help us to understand the way the words we already know have evolved and developed.

When languages are subjected to continuous evolution, use of new words and new uses of old words according to the needs of the users is unavoidable. When new words are formed, the users can very quickly understand them and accept the use of different forms of that new word as there is a lot of regularity in the word formation processes in our languages. Yule (2006) introduces 09 processes and a special process namely "Multiple Processes" by which new words are created. The nine processes are: coinage, borrowing, compounding, blending, clipping, backformation, conversion, acronyms and derivation. According to his explanation, the most productive word formation strategy is derivation. Through derivation new vocabulary is formed using a large number of small English word units. These small units are called "affixes". Borrowing and compounding are described as the most common sources of generating new words. Compounding is considered a commonly used process in languages such as German and English where the words are well documented but less common in languages such as French and Spanish. Coinage is introduced as one of the least common processes of word formation in English.

"Speakers of a language may create new words based on the existing ones, including the addition and subtraction of phonetic (or orthographic) material. These processes could also be defined as the ways in which new complex words are built on the basis of other words or morphemes" (Plag, 2002, p. 12). Plag (2002) discusses word formation processes in English using affixation, derivation without affixation (under which he discusses conversion, prosodic morphology, abbreviations and acronyms) and compounding. He identifies compounding as "the most productive type of word formation process in English, but the most controversial one in terms of its linguistic analysis".

Words can be formed or expanded by various morphological processes possible in a language. There are certain specific word formation or morphological processes which convert a morpheme into a word in a language. Murray (1995) states that new words can enter English in only two general ways: either they are borrowed from another language or they are created from elements that already exist in English. There are many patterns of word formation processes used to coin new words such as affixation, compounding, reduplication, conversion, borrowing, acronym, clipping, blending, onomatopoeia and antonomasia.

**Use of Vocabulary in Print Media**

Both print and electronic media, have contributed greatly to the introduction and widespread use of English neologisms in various fields. We encounter neologisms in English almost every day through news on television or reading the daily news from newspapers or magazines. For example, Winterval: the unpalatable making of a modern myth (The Guardian, Nov 08th 2011), Obamamania, Barack Obama is unlikely to get a better chance to run for president (The Economist, Oct 26th 2006) Textalyzer (Texting and Driving? Watch Out for the Textalyzer (The Newyork Times April 27, 2016). How Najibnomics has enhanced the country's economy (New Straits Times October 25, 2017). After 'Terroristan', India has a new phrase to describe Pakistan (The Times of India March 09, 2018).

According to Moe (2014), a newspaper headline summarizes the entire article using a few texts. These headlines use a “unique and unusual pattern of grammar” along with a special set of vocabulary.

Crystal (1987) stated that in the modern era the newspaper and magazine publishing will encompass a wider variety of linguistically distinctive devices than any other domain of language study.

Therefore, it is of utmost importance to investigate the evolution of language in Sri Lankan print media in an era where readers are exposed to a mass collection of new words with several advancements in the society.

**Studies on the use of neologisms and limitations**

Although there is a recent development in the research related to the use of vocabulary in Sri Lankan English with several arguments between scholars and researchers, studies on the use of new vocabulary in print media of Sri Lanka are relatively limited despite the very limited number of studies in the area.

Gamage (2015) in her study '"Hoos" and Hurrahs in Jumbo vs. Betel Final' explored how word formation has become an important process in the growth and expansion of the English vocabulary in Sri Lankan print media. The researcher finds out affixation as the most frequently used morphological process in forming new words in Sri Lankan English newspaper editorials and the morphological processes that have been used for decades are still being used in the formation of neologisms.

Liu & Liu (2014) carries out a study focusing on internet neologisms. They examine the characteristics of words unique to the internet context and their patterns of formation". According to their results, the most frequently occurring word formation process is compounding. Subsequently, blending, affixation, old words with new meaning, acronyms, conversion and clipping.

According to Behera & Mishra (2013) new words are coined "demonstrating that new words and phrases are far more about redesigning than actual configuration" (page 25). The processes illustrated through this study are: compounding, shortening, clipping, blending, affixation, backformation, conversion, borrowing, calquing and reduplication.

Rets (2016) attempts teaching the identified neologisms in the classroom with the purpose of improving communicative and cultural competence of the English learners.

**Aim of the study**

At present, it is evidenced that print media in Sri Lanka uses a wide variety of new vocabulary in newspapers specially maintaining the interest and the curiosity of its readership. It could also be argued that many Sri Lankans who peruse English newspapers daily tend to use such new word or neologisms in their writing and conversation knowingly or unknowingly. Moreover,

journalists in Sri Lanka tend to use many neologisms in their newspaper articles to expand their vocabulary and the use of such vocabulary in news headings is an attempt to transmit the focus of the news more realistically with a touch of local flavor. Irrespective of the knowledge of morphological characteristics of forming new words, this linguistic divergence in the language used by the Sri Lankan print media is a crucial move made transferring the newspapers more reader friendly. Based on the gaps of the research identified, the scholars and researchers in Linguistics should carryout studies on these different changes of language in Sri Lankan Mass Media. Therefore, this study investigates the productive strategies of generating neologisms in Sri Lankan print media. The study is expected to help uncover some unique Sri Lankan neologisms revealing to what extent, and how these neologisms are formed when used in local news article headings.

## Research Methodology

### Methodological Approach

This is a study that employs the content analysis method which is associated with qualitative research (Dörnyei, 2007). The data collected for this study is "textual" and a "latent level analysis" is employed, because the researcher is concerned with the deeper-level of the data analyzing and interpreting the underlying meaning in depth.

### The Sample

The number of English daily newspapers available for Sri Lankan readership is around 12. Due to time limitations neologisms were gathered after a careful observation of all local news article headings of the selected weekly newspaper 'Daily Mirror'. The data collection lasted for a period of one month beginning from 1$^{st}$ September to 30$^{th}$ September 2017.

### Analysis of Data

Content analysis follows a very generalized sequence of coding for themes, looking for patterns, making interpretations, and building theory (Ellis and Barkhuizen, as cited in Dornyei, 2007).

Gathered neologisms were analyzed to determine the various patterns of word-formation processes that are employed to form new words. The researcher identified the various word formation processes used in the formation of neologisms using the processes explained by Yule (2006), and gave a structural description of them based on the findings. Firstly, the selected words or phrases were classified into the various word formation processes. Secondly, the processes were analyzed to determine the productive processes used in the forming of neologisms in Sri Lankan print media using Microsoft Excel.

In addition, the meanings of each word or phrase were recorded for the awareness of the reader.

## Findings

36 neologisms classified under five word formation processes were gathered after a careful observation of all local news article headings of the weekly newspaper ‘Daily Mirror’. The news articles covered various fields including social, economic, sports and politics.

### Word formation processes the neologisms belong to

According to Yule (2006), there are nearly nine word formation processes in English: coinage, Borrowing (loanwords), compounding, blending, clipping, backformation, conversion, acronyms and derivation. Table 1 below shows the morphological processes the collected neologisms belong according to the above classification introduced by Yule (2006).

**Table 1: Classification of Neologisms into Respective Word Formation**

| Word Formation Process | Neologisms |
|---|---|
| Loan Words | Sil redda , Beedi, Color Lights, Kapu mahattayas, Basnayake Nilame, Kasippu, Sangha, Arahant, Polos roti, Yahapalanaya, Sammelan, Sari pota, Jihadists, Lunch sheets, Grama Niladharis, Pindapathe, Lunch packets, Kattadi keliya, Mahanayake, Dezinformatsiya |

| | |
|---|---|
| Compounds | Sil redi judgement, Beedi consumption, Sil redi shroud, Sil redi saga, Sil redi case, Yahapalana Politicians |
| Clippings | Mobike, Undergrads, Semis |
| Acronyms | JO, BN |
| Derivations | Defund, Anti –SAITM protests, Non –performing, Framers, Whitners |

As shown in table 1, majority of the words belong to the morphological process loanwords. This process is considered as one of the most common sources of forming new words in English (Yule, 2006). The process happens by taking over words from other languages into the borrowed language. In this study it was observed that many of the words borrowed are from Sinhala and very a few words from languages such as Hindi, Russian, and Sanskrit.

"In the SLE compound *'ash plantain'*, the morphemes in the Sinhala compound *alu kesel* are substituted with the two English translation equivalents *'ash'* and *'plantain'*. Vocabulary items of this type are called loan translations" (Fernando, 2012, p. 174).

Haugen (as cited in Fernando, 2012) explains that, the users of a language sometimes may blend a part or the complete word unit with a part of a foreign word in coining loanblends.

When examining the collected loanwords with reference to the above classifications, they can be further categorized as loan translations and loanblends (Figure 1). Loan translations are simply direct translations of the elements of the words into the foreign language. For example, *lunch sheets, lunch packets* and *color lights*. The Sinhala compounds, *Bath Othana Kola* and *Bath Mula* (meaning *meal wrappers* and *lunch pack*/ *packed lunch* respectively in English) are substituted with lunch sheets (the sheets which are heavily used domestically as well as by the meal providers to wrap lunch, so that it is easier to carry) and lunch packets. The English compound *traffic lights* is directly translated as *colour lights*, substituting the word *traffic* with *colour*.

Grama Niladharis and Kapu mahattayas are the two loanblends identified from the collected data (Figure 1). In these two nouns, the Sinhala stem is blended with the English regular plural suffix / - s /.





**Figure 1: Loan Translations & Loanblends**

**Table 2: Hybrid Compounds Presenting the Languages the Words Are Imported**

| Hybrid Compounds | Languages the Words Imported from |
|---|---|
| Sil redi judgement | Sinhala + English |
| Beedi consumption | Sinhala + English |
| Sil redi shroud | Sinhala + English |
| Sil redi saga | Sinhala + English |
| Sil redi case | Sinhala + English |
| Yahapalana Politicians | Sinhala + English |

Another significant observation was the neologisms belonging to the category of compounds (Table 1) one of the most common and productive processes of forming new words. All the compounds were hybrid compounds "blending two or more stems from different languages" (Fernando, 2012, 173). The identified hybrid compounds in this study were formed using words imported from Sinhala and English, the first word from Sinhala and the second word from English (Table 2) and they all were related to politics.

Generally, derivations are identified as one of the most common word formation processes in producing new English words. In this study five derivations were identified; three words with prefixes and two words with suffixes (Table 3).

**Table 3: Derivations Presenting the Identified Prefixes and**

| Derivations | Prefix | Suffix |
|---|---|---|
| Defund | De | - |
| Anti –SAITM protests | Anti | - |
| Non –performing | Non | - |
| Framers | - | -ers |
| Whitners | - | -ers |

In addition, new words were produced using clippings and acronyms. When analyzing the use of clippings in Sri Lankan print media, it was observed that the three examples were English words but unique to Sri Lankan context (Table 1). Neologisms from coinage, blending, backformation and conversion were not identified.

**Productive strategies used in the forming of neologisms in Sri Lankan print media**

The 36 neologisms classified under the five identified word formation processes or strategies reveal an extensive use of loanwords while compounds and derivations are used in moderate numbers in creating neologisms in Sri Lankan print media. In contrast, clippings and acronyms were limited in numbers. The percentage of the use of each process in generating neologisms in Sri Lankan print media is presented in the chart below (Chart 1). Higher percentages reveal higher productivity levels of the processes.

According to the chart, the most productive strategy used in Sri Lankan print media to generate neologisms is Loanwords with the highest percentage 56%. Out of the total of 20 loanwords, 02 were loanblends and 03 were loan translations amounting to 6% and 8% in the sample.

Compounding and derivation are the other common strategies of forming neologisms in local news articles amounting to 17% and 14% respectively. The three clippings and the two

acronyms amounted to 8% and 6% respectively presenting them to be less productive processes in using neologisms in local news headings.





**Chart 1: Word Formation Processes Used in Sri Lankan Print Media Generating**

## Meanings of the Identified Neologisms

The meanings of the collected neologisms in relation to the facts of the news articles are tabled below for the awareness of the readers.

**Table 4: Meanings of the Identified**

| Neologisms | Meaning |
|---|---|
| Sil redi judgement | The judgement given on being found guilty to the charge of criminal misappropriation of public fund to distribute 'sil cloth' for laymen during an election campaign |
| Beedi consumption | Consumption of sticks of illicit cigarettes |
| Sil redi shroud | 'Sil cloth' that cloaked the unlawful edict given by the President using millions of public fund |

| | |
|---|---|
| Sil redi saga | The story of the 'sil cloth' that cloaked the unlawful edict given by the President using millions of public fund |
| Sil redi case | The story of the 'sil cloth' that cloaked the unlawful edict given by the President using millions of public fund |
| Sil Redda | A piece of cloth used by laymen when observing the eight precepts |
| Kapu mahattayas | Lay priests |
| Basnayake Nilame | Office of the chief lay custodian of a temple |
| Kasippu | Illicit liquor |
| Sangha | The Buddhist priests |
| Arahant | People far advanced along the path of Enlightenment, but who may not have reached full Buddhahood |
| Polos roti | A flat bread made of flour and jack fruit |
| Yahapalanaya | Good governance government |
| Sammelan | Conference |
| Sari pota | Long fall of the sari or osari |
| Jihadists | is an Arabic word which literally means striving or struggling, especially with a praiseworthy aim |
| Lunch sheets | Meal wrappers |
| Grama Niladharis | Village officers |
| Pindapathe | Monks walking one behind the other asking bystanders to donate |
| Lunch packets | Lunch pack |
| Kattadi keliya | The Minister of Health revealed that the Prime Minister himself had ordered him to go abroad for surgery because there had been rumors that someone has engaged in exorcism to curse him. As a result of this Black Magic the Ministers have the privilege of going abroad for medicine with funds of the public |
| Mahanayake | Chief priest of the Buddhist temple |
| Dezinformatsiya | Disinformation in Russian |
| Color Lights | Traffic lights |
| Beedi | illicit cigarettes |
| Yahapalana politicians | The politicians from the good governance party |
| Mobike | Motor bike |

| | |
|---|---|
| Undergrads | Undergraduates |
| Semis | Semi finals |
| JO | Joint Opposition |
| BN | Basnayaka Nilame |
| Defund | Slash annual funding |
| Anti –SAITM protests | Protests against SAITM |
| Non –performing | to not to work or function well completely |
| Framers | The committee who drafted the new constitution |
| Whitners | Whitening cream |

**Study Limitations**

This study had a few limitations. First and foremost, out of several English daily newspapers available for Sri Lankan readership only one was selected due to time constraints. Moreover, the time duration of data collection was limited to one month. Because of this, the number of neologisms gathered for the study was greatly restricted. This limits the generalizability of the study findings. Second, the neologisms were gathered only from news article headings. Obviously, more neologisms would have been collected after a careful observation of all local news articles yielding more insight into use of word formation processes in Sri Lankan print media.

**Conclusion**

The findings of this study reveal that the most productive strategy used in news headings of Sri Lankan print media to generate neologisms is loanwords. According to Yule (2006) this process is not the most productive but one of the most common processes of producing new words in English. Loan Translations and loanblends were also found to be two strategies used in forming neologisms in print media. Derivation, the process generally accepted as the most productive strategy of forming new words in English was found to be one of the most common processes together with compounding. All the identified compounds were hybrid compounds where a word in Sinhala merged with a word in English.

The significant observation of this study was the heavy use of Sri Lankan English vocabulary in print media of the country. “Sri Lankan English (SLE) is the language spoken and understood by those Sri Lankans who speak English as their first language, and/or who are bilingual in English and Sinhala or Tamil” (Meyler, 2007 p, x). Gunesekera (2005) defines Sri Lankan English as the variety of English used only by Sri Lankans for any purpose within the country.

Therefore, the identified loanwords and compounds the print media transmit the focus of the news more realistically blending English with the local languages maintaining the human interest which is the key influence for the choice of such vocabulary.

While this study revealed that clippings and acronyms are less productive processes of forming new words, in general they are accepted as productive processes. As this study focused only on headings of local news articles, studies that focus on other areas of Sri Lankan print media are necessary to explore the actual productive processes used in generating neologisms in Sri Lankan print media. Finally, due to time constraints this study is limited to one local English newspaper. Similar studies using other local English newspapers and comparative studies to explore the variations in the use of vocabulary in Sri Lankan newspapers from the past until now may shed more light on the use of neologisms in print media of Sri Lanka.

**References**

Arscott, K. (2011, November). Winterval: the unpalatable making of a modern myth. The Guardian.

Behera, B., & Mishra, P. (2013). The Burgeoning Usage of Neologisms in Contemporary English. [ebook] pp.25-35. Retrieved from http://www.iosrjournals.org/iosr-jhss/papers/Vol18-issue3/D01832535.pdf.

Crystal, D. (1987). The Cambridge Encyclopedia of Language. The United Kingdom: Cambridge University Press.

Dornyei, Z. (2007). Research Methods in Applied Linguistics. Oxford: Oxford University Press.

Fernando, S. (2012). Sri Lankan English vocabulary: A new vocabulary in a new variety of English. Vistas: Journal of humanities and social sciences. 160-179. Retrieved from http://www.digital.lib.ou.ac.lk.docs.bitstream.

Gamage, S., U. (2015). “Hoos’ and Hurrahs in Jumbo vs. Betel Final”. Retrieved from https://www.researchgate.net/profile/Sandamali_Gamage2/publication/305209535_73_Hoos_and_Hurrahs_in_Jumbo_vs_Betel_Final/links/5784c8c308aeca7daac5783c/73-Hoos-and-Hurrahs-in-Jumbo-vs-Betel-Final.pdf?origin=publication_detail.

Gunesekera, M. (2005). The postcolonial identity of Sri Lankan English. Colombo: Katha Publishers.

Liu, W., & Liu W. (2014). Analysis on the word formation of English netspeak neologisms. Journal of Arts & Humanities. 22 – 30. Retrieved from http://www.theartsjournal.org.site.do.

Mair, C. (2006). Twentieth-Century English. History, Variation, and Standardization. Cambridge: Cambridge University Press.

Meyler, M. (2007). A dictionary of Sri Lankan English. Colombo: author publication.

Moe, S. (2014). A Brief Study on the Language of Newspaper Headlines Used in “The New Light of Myanmar”. Hinthada University Research Journal, 82 – 92. Retrieved from http://www.hinthadauniversity.edu.mm.u.

Murray, T. E. (1995). The Structure of English: Phonetics, Phonology, Morphology. Massachusetts: Allyn and Bacon.

Neelakantan, S. (2018, March). After 'Terroristan', India has a new phrase to describe Pakistan (The Times of India). Times of India.

Newmark, P. A. (1988). Text book of translation. United Kingdom: Prentice Hall International (UK) Ltd.

Oxford Advanced Learner's Dictionary. (2019). Retrieved from http://dictionary.cambridge.org/

Pacea, O. (2009). New worlds, new words: On language change and word formation in internet English and Romania. Ovidius University Press. Retrieved from http://www.diacronia.ro/ro/indexing/details/A3712/pdf

Plag, I. (2002). Word-formation in English. Cambridge: Cambridge University Press.

Rets, I. (2016). Teaching Neologisms in English as a Foreign Language Classroom. Procedia - Social and Behavioral Sciences. 813 – 820. Retrieved from https://ac.els-cdn.com/S187704281631343X/1-s2.0-S187704281631343X-main.pdf?_tid=affa3f5f-b1f1-4f99-bf98 b1cd4b229226&acdnat=1520224361_f1fd9f73612128f19174757c88674756.

Richtel, M. (2016, April). Texting and Driving? Watch Out for the Textalyzer. The New York Times.

Smith, D. (2006, October). Obamamania, Barack Obama is unlikely to get a better chance to run for president. The Economist.

Yule, G. (2006). The study of language. New Delhi, India: Cambridge University press.

# උඩරට වෙස් ඇඳුම් කට්ටලය, විකාශනය, භාවිතය සහ සමාජ විඥානය.

ජේ. ඒ. ටී. සී. ජයසිංහ[1]


**සංක්ෂේපය**

උඩරට නර්තන සම්ප්‍රදායෙහි ප්‍රධාන රංග වස්ත්‍රාභරණය ලෙස සැලකෙන වෙස් ඇඳුම් කට්ටලයේ භාවිතය සහ එහි විකාශනය පිළිබඳ විග්‍රහ කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවේ මූලික අරමුණ වේ. වෙස් ඇඳුම් කට්ටලයේ ප්‍රභවය පඬුවස්දෙව් රජුට වැළඳුණු දිවි දෝෂය සුව කරනු වස් ලක්දිවට පැමිණි මලය රජු දක්වා දිව යයි. එහිදී මලය රජු විසින් සූසැට ආභරණයෙන් සැරසී කොහොඹා යක් කංකාරි ශාන්තිකර්මය සිදු කල බව ද, එතැන් පටන් කොහොඹා කංකාරි ශාන්තිකර්මය සිදු කිරීමේ දී මලය රජුගේ වස්ත්‍රාභරණයේ අර්ධයකින් සැරසී කටයුතු කිරීමට මල රජු විසින් යක්දෙස්සන්ගේ කුලයට අවසර ලබා දුන් බව ද ජනප්‍රවාදගත සාධකයන්හි සඳහන් ය. වෙස් ඇඳුම් කට්ටලය පූජනීය වස්තුවක් සේ සලකා ආරක්ෂා කර ගැනීමට එකල පාරම්පරික ශිල්පීහු වගබලා ගත්හ. එයට ස්ත්‍රී ස්පර්ශය ලක් නොවීමට කටයුතු කල අතර කිලි නොවදින ස්ථානයක තැන්පත් කිරීමට වග බලා ගත්හ. වෙස් ආභරණ කට්ටලය කුරුණි පෙට්ටියක බහා බුදුගෙය, දේවාල ගෙය, වී බිස්ස ආදී ස්ථානයක තැන්පත් කළ අතර එය එතැනින් ඉවතට ගනු ලබන්නේ ශාන්තිකර්ම අවස්ථාවක් සඳහා රැගෙන යාමට ය. එය පැළඳීමට ප්‍රථම දෙහි ගා ස්නානය කොට පේ වීම සිදු විය. ආධුනික නර්තන ශිල්පියෙකු තමන් උගත් ශිල්පයෙහි ප්‍රවීණත්වයක් ලබා ඇතැයි ගුරුවරයා විසින් තීරණය කරනු ලැබීමෙන් අනතුරුව ඔහුව හිස වෙස් තැබීම සඳහා යොමු කරවනු ලබයි. එහිදී ආධුනික ශිල්පියා කාලයක් මුළුල්ලේ පේ වීම සිදු කල ද වර්තමානය වන විට හිස වෙස් තැබීමට ද මූල්‍යමය වටිනාකමක් එක් වී වෙස් තැබීමේ මංගල්‍යයේ ද හරවත් බව හීන වී ඇත. අතීතයේ දී වෙස් ඇඳුම් කට්ටලය හා බැඳි ගරු කිරීමක් නිරන්තරයෙන් පැවති අතර පසුකාලීනව ඇති වූ විවිධ අවශ්‍යතාවන්ට වෙස් නර්තන ශිල්පීන්ගේ දායකත්වය ලබා ගැනීමේ දී මූල්‍යමය වටිනාකමක් එක් වීම හේතුවෙන් වෙස් ඇඳුම් කට්ටලයට හිමි ගරුත්වය වර්තමානය වන විට වෙනස් වෙමින් පවතින බව පෙනෙන්නට ඇත. විවිධ සමාජ සංස්කෘතික සහ ආර්ථිකමය සාධක මෙයට බලපා ඇති බව මෙම අධ්‍යයනයේදී තහවුරු කරගත හැකි විය. මෙහිදී දැනට ලියවී ඇති මූලාශ්‍ර සාධක, සම්මුඛ සාකච්ඡා මගින් ලබා ගන්නා ලද දත්ත මගින් ඉහත අරමුණ විශ්ලේෂණය කිරීමට අපේක්ෂිත ය. මෙම පර්යේෂණ පත්‍රිකාවෙන් නිගමනය කරනු ලබන්නේ වෙස් ඇඳුම් කට්ටලය හා බැඳි චාරිත්‍ර පිළිවෙලක් ඇති බවත් මලය රජ දවස සිට වර්තමානය දක්වා වෙස් ඇඳුමේ අවශ්‍යතාව කලින් කලට වෙනස් වී ඇති බවත් ය.


***ප්‍රමුඛ පද ඃ උඩරට නර්තන සම්ප්‍රදාය, වෙස් ඇඳුම් කට්ටලය, මලය රජ, යක්දෙස්සා, වෙස් තැබීමේ මංගල්‍යය***

[1] ලලිත කලා අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ගම්පහ, ශ්‍රී ලංකාව. tashnijayasinghe@gmail.com

උඩරට නර්තන සම්ප්‍රදායෙහි ඓතිහාසික තොරතුරු පඬුවස්දෙව් රජුගේ දිවි දෝෂය සම්බන්ධ කතා පුවත දක්වා දිව යයි. එය ක්‍රි. ව. 15 වන සියවසෙහි ලියන ලද කුවේණි අස්නෙහි සඳහන් වේ. මෙකී නර්තන සම්ප්‍රදායෙහි උපත පිළිබඳ පහත කවි පෙළෙන් පැහැදිලි කරගත හැක.

"එක්තාලය සත් තාලය ගත්තේ
අක්ෂර ලඝු ගුරු දෙක දන ගත්තේ
පෙර කී රුසිවරු කීමෙ පැවැත්තේ
වලියක් ශාස්ත්‍රය එදයි පැවැත්තේ"[2]

උඩරට නර්තන සම්ප්‍රදාය ශාස්ත්‍රීය පදනමකට අනුකූලව නිර්මාණය වූ කලා සම්ප්‍රදායක් වන අතර මෙම නර්තන සම්ප්‍රදායේ ප්‍රධානතම ශාන්තිකර්මය වනුයේ කොහොඹා යක් කංකාරියයි. එහිදී භාවිත කරනු ලබන එකම සහ ප්‍රධානතම රංග වස්ත්‍රාභරණය වෙස් ඇඳුම් කට්ටලය නමින් හැඳින්වේ. මෙම වෙස් ඇඳුම් කට්ටලය මලය රාජෝත්තමයාණන් වහන්සේගේ ඇඳුම් කට්ටලය ලෙස සැලකේ. එය සිව්සැට ආභරණින් සමන්විත වුවද මලය රජුගෙන් පසු කංකාරි කටයුතු සඳහා සිව්සැට ආභරණින් අර්ධයක් පැළඳීමට යක්දෙස්සන්ගේ කුලයට අවසර ලැබී ඇත. එලෙස බිහි වූ වෙස් ඇඳුම් කට්ටලය විවිධ කාලවකවානු තුලදී විවිධ වෙනස්කම් වලට ලක් වෙමින් වර්ධනය වෙමින් අද දක්වා පැවත එනු ලබයි.

ඉතා අලංකාරවත් ඇඳුම් කට්ටලයක් වන මෙය අද්‍යතනයේදී "වෙස් ඇඳුම් කට්ටලය" ලෙස හැඳින්වීම 20 වන සියවසේදී සිදු වූ අධ්‍යාපනික ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස එක් වූවක් බවට මහාචාර්ය මුදියන්සේ දිසානායක මහතා අදහස් දක්වයි.

"වෙස්" යන්නෙන් වේශය, වෙස් වලා ගැනීම, ව්‍යාජ බාහිර පෙනුම, උපකල්පිත පෙනුම යනාදී වචනාර්ථ ගම්‍යමාන වේ. සැබැවින්ම පාරම්පරික ශිල්පීන්ගේ මතය වනුයේ කංකාරි කටයුතු සඳහා මෙම වෙස් ඇඳුමෙන් සැරසී මලය රාජෝත්තමයාණන් වහන්සේගේ වේශය මතු කරගනු ලබන බවයි. දෙවි කෙනෙකු සේ සලකනු ලබන මලය රාජෝත්තමයාණන්ගේ වේශය ගැනීම සුළු කටයුත්තක් සේ සැලකීම නොකළ යුතුය. එබැවින් වෙස් ඇඳුම් කට්ටලය හා සම්බන්ධ චාරිත්‍ර වාරිත්‍ර සහ ඒ හා බැඳුනු විශ්වාස පද්ධතියක් පාරම්පරික ශිල්පීන් සතුව අදටත් පවතිනු ලැබේ. එම වෙස් ඇඳුම් කට්ටලයේ ප්‍රභවය, අන්තර්ගතය, විකාශනය සහ භාවිතය පිළිබඳ තොරතුරු මෙසේ පෙළ ගැස්විය හැක.

**වෙස් ඇඳුමේ ප්‍රභවය.**

වෙස් ඇඳුමේ ප්‍රභවය පිළිබඳ විවිධ මත පළ වී තිබුන ද වඩාත් ජනප්‍රිය වී ඇති මතය වනුයේ පඬුවස් දෙව් රජුට පැමිණි දිවි දෝෂය සුව කරනු වස් පැවති කොහොඹා කංකාරිය සඳහා මලය රජු විසින් පැළඳි ආභරණ කට්ටලය සහිත වස්ත්‍රය වෙස් ඇඳුම් කට්ටලයෙහි මූලාරම්භය වී ඇති බවයි. එ නමුදු වෙස් ඇඳුම් කට්ටලය පිළිබඳව ලිඛිත ඓතිහාසික සාධක නොමැත.[3] මෙම රංග වස්ත්‍රය පිළිබඳව

[2] පාරම්පරික නර්තන ශිල්පී ඩබ්. ජී. එච්. එම්. වෙද්දෙනිය මහතා සමග 2019.01.04 දින කළ සාකච්ඡාව.
[3] පාරම්පරික නර්තන ශිල්පී තිත්තපජ්ජල ටී. වයි. සුමනවීර මහතා සමග 2018.10.14 දින කළ සාකච්ඡාව.

වැදගත් සාධක හමු වන්නේ එහි මූල බීජය හටගත් කොහොඹා කංකාරියේ එන ගද්‍ය සහ පද්‍ය කොටස් තුළිනි. එහි සඳහන් වන්නේ යාම කුල බ්‍රාහ්මණයන් සිව් දෙනෙක් ගෙන්වා ඉන් එක් අයෙකුට මුල්ම වරට මලය රජුගේ සිව් සැට ආභරණයෙන් අර්ධ ආභරණයක් පැළඳ වූ බව ය.

උදා: <u>මහායාතිකාව.</u>

"යාමකුල බමුණෝ සතර දෙනෙකු ගෙන්වා වඩා උස නොවන, වඩා මිටි නොවන, වඩා කළු නොවන, වඩා රතු නොවන එක් අයෙකුට මුවහිස් කෝළමක් අන්දවා, එක් අයෙකුට දිවිහිස් කෝළමක් අන්දවා, එක් අයෙකුට මඟුල් භේරිකාවක් අන්දවා, **එක් අයෙකුට මලය රාජෝත්තමයාණන් වහන්සේගේ සිව් සැටක් ආභරණයෙන් අර්ධයක් පළන්දවා....**"[4]

එමෙන්ම හඟල යැදීමේ සඳහන් වන පරිදි එදා වෙස් ආභරණ කට්ටලයේ වෙස් තට්ටුව "සිවිලිය" යන නාමයෙන් හඳුන්වා ඇත.[5]

උදා: <u>හඟල යැදීම.</u>

"බමුණු ද කුමරුන් දෙන්නෙක් ගෙන්වා
දෙන්නම පිණිදිය සඳුනෙන් නාවා
නවනරු තබමින් සඟලක් අඳවා
මුදුනට **සිවිලිය** ගෙන හැර බඳවා"[6]

මෙලෙස බිහි වූ කොහොඹා කංකාරි ශාන්තිකර්මය ඉදිරියට පවත්වා ගෙන යාමට සහ ඒ සඳහා මලය රජුගේ ඇඳුම් කට්ටලයේ අර්ධයකින් සැරසීමට මලය රජු විසින් යක්දෙස්සන්ගේ කුලයට අවසර ලබා දුන් බව කියැවේ.

**වෙස් ඇඳුමේ කොටස්.**

කංකාරි සාහිත්‍යයට අනුව පඬුවස්දෙව් රජු වෙනුවෙන් එදා සිදු කළ කොහොඹා යක් කංකාරියෙහිදී මලය රජු විසින් සිව් සැට ආභරණයෙන් යුත් වෙස් ඇඳුම් කට්ටලයකින් සැරසී සිට ඇත. මෙම වෙස් ඇඳුම් කට්ටලය මලය රාජෝත්තමයාණන් වහන්සේගේ සිව් සැටක් ආභරණයෙන් අර්ධ ආභරණයක් වන බව පාරම්පරික ශිල්පී මතය වේ. ඉන් අනතුරුව එදා මලය රාජෝත්තමයාණන් වහන්සේ විසින් තමන්ගේ සිව් සැටක් ආභරණයෙන් අර්ධ ආභරණයක් බමුණු කුමරුවන් වෙත ලබා දුන්නේ නම් එම ආභරණ කට්ටලය කොටස් තිස් දෙකකින් සමන්විත විය යුතුය. නමුත් මලය රජුගේ සිව්සැට ආභරණයේ කොටස් හැට හතර මොනවාද යන්නට පැහැදිලි වශයෙන් සාධක නොමැති අතර කංකාරියේ අයිලේ යැදීමෙහි මලය රජුගේ ආභරණ පිළිබඳව සඳහන් වේ.

අයිලේ යැදීමෙහි සඳහන් වන පරිදි මලය රාජෝත්තමයාණන් වහන්සේගේ වෙස් ඇඳුම් කට්ටලයේ අන්තර්ගත කොටස් ලෙස "මලේ රාජෝත්තමයාණන් වහන්සේගේ පළමු කොට සිරසට පළඳින්නා වූ

[4] පාරම්පරික නර්තන ශිල්පී ඩබ්. ජී. එච්. එම්. වෙද්දෙනිය මහතා සමග 2019.01.04 දින කළ සාකච්ඡාව.
[5] පාරම්පරික නර්තන ශිල්පී තිත්තපජ්ජල ටී. වයි. සුමනවීර මහතා සමග 2018.10.14 දින කළ සාකච්ඡාව.
[6] පාරම්පරික නර්තන ශිල්පී ඩබ්. ජී. එච්. එම්. වෙද්දෙනිය මහතා සමග 2019.01.04 දින කළ සාකච්ඡාව.

රන් ජටාවේ රුවන් ඒකාවැලේ... රන් පාහිම්පතේ... රන් සිකාබන්දනේ... රන් නෙත්තිමාලාවේ... රන් තෝඩුපතේ... රන් කර මාලාවේ රුවන් දෙවුරුමාලාවේ... රන් අත්මිනිවලල්ලේ කයිමෙත්තේ... රන් අවුල්සැරේ... රන් බුබුලුපටියේ රුවන් ඉනහැඩේ... රන් සඟලේ නිසංසඟලේ දකුනුනරුවේ නවනරු පොටේ පා බඳිනා පාපොටේ ගිගිරිපොටේ කලිසමේ දෙපා සිලම්බුවේ... උන් වහන්සේගේ සිව් සැටක් ආභරණයෙහි හැට හතරක් ආයුධයෙහි වෙසෙන දෙවියන් වහන්සේටයි මේ ආරාධනා කරන්නේ..."[7] දැක්විය හැක.

වෙස් ඇඳුම් කට්ටලයේ සියලුම ආභරණ රිදී ලෝහයෙන් නිමවා ඇත. රස වෙදකමට අනුව හා ආයුර්වේදයට අනුව රිදී ලෝහය, උතුම් ලෝහයක් ලෙස සලකනු ලබන බවට අදහස් පවතී.[8] ඇතැම් ආභරණ කොටස් නිර්මාණයට කබල්ලෑ පොතු සහ වර්ණවත් කිරි පබළු භාවිත කරයි. මීට අමතරව කපු හා පොප්ලින් ආදී රෙදි වලින් රංග වස්ත්‍ර කොටස් නිර්මාණය කරගනු ලබයි. අතීත වෙස් නර්තන ශිල්පීන් විසින් රියන් විසි අටකින් යුත් රෙදි ප්‍රමාණයකින් සැරසී ඇති බව කියැවේ.[9] වෙස් ඇඳුමට අයත් සියලු ආභරණ සහ රෙදි ඇඳීමට ප්‍රථමයෙන් ශිල්පීන් විසින් යටි කයට සුදු පැහැති මේස් කලිසමක් අඳිනු ලබයි.

කෙසේ වෙතත් මලය රජුගෙන් ලැබුණු අර්ධ ආභරණය පිළිබඳව ද නිසියාකාර සඳහනක් දක්නට නොමැති වුවත් පසුකාලීනව කංකාරි නර්තනය සඳහා යොදා ගත් වෙස් ඇඳුම් කට්ටලයේ කොටස් මෙසේ දැක්විය හැක.

❖ හඟල.

හඟල යනු රියන් 8ක් දිග සුදු රෙද්දකි. මේ සඳහා කපු හෝ පොප්ලින් වැනි රෙදි භාවිත කරනු ලබයි. අතීතයේදී බොහෝවිට හඟල රෙද්ද ලබා දෙන්නේ කංකාරිය පවත්වන ආතුර නිවසින් වීම හේතුවෙන් ආතුරයාට ඉන් සෙත් පැතීමක් සිදුවන බව පැරණි පාරම්පරික ශිල්පී මතයයි. ඇතැම් ඡායාරූප වල දක්නට ලැබෙන වෛවර්ණ හඟල රෙදි ඉහත කරුණ නිසාවෙන් දැකගත හැකි වන්නේද යන්න ගැටළු සහගත ය. නියමාකාරයෙන් හඟල ඇඳීමේ දී රැළි කඩා, පෙති බඳිමින් ඇඳිය යුතුය. ඒ සඳහා වැඩි කාලයක් ගත වේ. එ බැවින් වර්තමාන ශිල්පීන් කලින් සාදා නිම කළ හඟලක් භාවිතයට ගනු ලබයි. පාරම්පරික ශිල්පී සෝමබන්ධු විද්‍යාපති විසින් මෙම කලින් සාදා නිම කළ හඟල භාවිත ක්‍රමය ප්‍රථමයෙන්ම හඳුන්වා දී ඇත. කංකාරියෙහි දී සෑම නර්තන ශිල්පියෙක්ම තමා අඳිනු ලබන හඟල රෙද්ද පේ කිරීමේ චාරිත්‍රයට සහභාගී විය යුතුය.

❖ උල්උඩය.

රියන් හතක් පමණ දිග ඇති රැළි වැටෙන සේ සකස්කර අඳින සුදු සේලය මෙනමින් හඳුන්වයි. එම සුදු රෙද්දෙහි යට වාටියට රතු රිබන් පටියක් අල්ලා වර්තමාන ශිල්පීන් වර්ණවත් බවක් එක් කරගෙන ඇත.

❖ පොත්පොට.

---

[7] ගොඩකුඹුරේ, චාල්ස්. (1963). **කොහොඹාකන්කාරිය.** පිටු.76-77.

[8] පාරම්පරික නර්තන ශිල්පී ඩබ්. ජී. එච්. එම්. වෙද්දෙනිය මහතා සමග 2019.01.04 දින කළ සාකච්ඡාව.

[9] පාරම්පරික නර්තන ශිල්පී ඩබ්. ජී. එච්. එම්. වෙද්දෙනිය මහතා සමග 2019.01.04 දින කළ සාකච්ඡාව.

පොත්පොට යනු රතු පැහැති රියන් අටක් පමණ දිග රෙදි පටියකි. එහි එක් කෙළවරකට අවානක හැඩයට සමාන වන අයුරින් රැළි තබා ඇති කොටසක් එක් කොට ඇත. එම රැළි තැබූ කොටසෙහි අලංකාරය සඳහා රතු, කහ, කළු ආදී කුඩා රිබන් පටි අල්ලා ඇත. වෙස් නර්තන ශිල්පියාගේ පිටුපසින් දිස්වන ලෙසින් රැළි සහිත කොටසත්, ඉන කොටස වෙලීම සඳහා රතු පැහැති රෙදි පටියත් භාවිත කරනු ලැබේ.

❖ දෙවැල්ල.

දෙවැල්ල යනුවෙන් හඳුන්වන්නේ එක් කෙළවරක අවානක හැඩයට රැළි තබන ලද සුදු රෙද්දකි. මෙය නරු යන නමින් ද හඳුන්වනු ලබයි. මෙවන් කොටස් දෙකක් නර්තන ශිල්පියා විසින් අඳිනු ලබයි. ඒවා රතු, කළු, කහ රිබන් පටි වලින් අලංකාර කොට ඇත. ඉන දෙපසින් පිටුපසට වන්නට සිටින සේ මෙම නරු පටවල් දෙක තබා පොත් පොටෙන් වෙලීම සිදු කරනු ලබයි.

❖ ජටාව.



ජටාව සඳහා කොහොඹ, හඳුන් ආදී ලී වර්ග භාවිත කරනු ලබන අතර මෙයින් කුඩා කරඬුවක හැඩයක් නිරූපණය කරයි. අතීත නර්තන ශිල්පීන් කොණ්ඩය වවා සිටි අතර වෙස් ආභරණ පැළඳීමේදී ඔවුන් විසින් කොණ්ඩය හිස මුදුනට වනසේ බැඳ ඒ මත ජටාව පළඳා ඇත. ජටාව හිස් මුදුනෙහි මනා කොට සවි වී තිබීම සඳහා ජටාවේ යටි පැත්තේ කුඩා කුහරයක් නිර්මාණය කොට තිබූ බවට කරුණු හෙළි වේ. වර්තමානයෙහි ජටාව හිස තැබීමෙන් පසු හිස ආවරණය වන සේ රතු රෙදි කඩවල් දෙකක් හිසේ බඳිනු ලබයි.

❖ ජටා පටිය.



මෙය ඒකාවැල නොහොත් ජටාරැල්ල, ජටා පටිය යන නම් වලින් හැඳින්වේ. මෙය රියන් දෙකක් පමණ දිග රෙදි පටියකින් නිර්මාණය කර ඇත. ජටා පටියේ අගිස්සට කාසියක් දමා බරට සිටින සේ සකස් කොට ඇත්තේ නර්තනයේ දී ජටා පටිය හැසිරවීමේ පහසුව පිණිස ය.

❖ පායිම්පත.



අරලිය, කිරිවල්ලා ආදී සැහැල්ලු ලීයෙන් කපා තුනී රිදී පොත්තෙන් මෙය නිර්මාණය කොට ඇත. පාහිම්පත ජටාවට ඉදිරියෙන් හිසෙහි පළඳිනු ලබයි. සැහැල්ලු ලී භාවිත කොට ඒ මත රිදී ලෝහය ආලේප කොට මෙම ආභරණය නිර්මාණය කර ඇත.

❖ සිඛාබන්ධනය හා නෙත්තිමාලය.



නළලට පළඳිනු ලබන ආභරණයකි. මෙම ආභරණයෙන් ඉතාමත් අලංකාරයක් ශිල්පියාට සපයයි. රිදියෙන් නිම කළ ආභරණයකි. කුඩා බෝපත් සිඛාබන්ධනයෙහි එල්ලා වැටෙන සේ අල්ලා ඇත. නෙත්තිමාලයේ කුඩා මැණික් කැට තුනක් අල්ලා ඇත.

- තෝඩුපත්.



රිදීයෙන් නිම කරන ලද කර්ණාභරණයකි. කන් පෙත්තේ හැඩයට සමාන වන ලෙස නිර්මිතය. මෙහි අලංකාරය සඳහා කුඩා මැණික් කැට සහ කැටයම් යොදා ගෙන ඇත.

- කරමාලය.



ගෙලෙහි පළඳිනු ලබන අලංකාර ආභරණයකි. වර්ණවත් පබළු යොදා අලංකාරවත් කොට ඇත.

- උරබාහු.



උරබාහු දෙව්රමාලා නමින් ද හඳුන්වයි. අත් දෙකෙහි මුදුනට පළඳිනු ලබන මෙය රිදියෙන් නිමවා ඇත.

- බන්දි වළලු.



රිදීයෙන් නිම කළ ආභරණයකි. එක් අතකට හය බැගින් දෑතට ම වළලු දොළහක් පළඳිනු ලැබේ.

- කෙමෙත්ත.



දෑතේ මැණික් කටුව ප්‍රදේශයට පළඳිනු ලබන රිදීයෙන් කළ කැටයම් සහිත ආභරණයකි.

- හස්තකඩය.



අතේ පිට අල්ලට පළඳින ලද කැටයම් සහිත රිදීයෙන් කළ ආභරණයකි. වර්තමානය වන විට මෙම ආභරණය පළඳිනු නොලැබේ.

❖ අවුල්හැරය.



නර්තන ශිල්පියාගේ පපුව පුරා විහිදී යන පරිදි මකුලු දැලක හැඩ ගත් විචිත්‍රවත් ආභරණයකි. වර්ණවත් පබළු සහ කබල්ලෑ පොතු යොදා ගනිමින් නිර්මාණය කොට ඇත.

❖ ඉන හැඩය.



හස්තියකුගේ හොඬයට සමාන වූ අයුරින් නිර්මිත මෙම වස්ත්‍රාභරණ කොටස රතු පැහැති රෙද්දක් මත රිදී බුබුළු අල්ලා අලංකාර කොට ඇත. මෙය ශිල්පියාගේ ඉදිරිපස ඉන ප්‍රදේශයට වන්නට අඳිනු ලබයි.

❖ බුබුලු පටිය.



අඟල් තුනක් පමණ පළල රතු රෙදි පටියක් කැටයම් සහිත රිදී බුබුළු කොටස් අල්ලා සකස් කළ අලංකාර ආභරණයකි. මෙය ඉන හැඩයට ඉහලින් පළඳිනු ලබයි.

❖ සිලම්බු.



අතීතයේදී ලෝකඩයෙන් නිමවා ඇති අතර වර්තමානයේදී නිකල් කළ සිලම්බු දැකගත හැකිය. මෙම ආභරණය පළඳා නර්තනයේ යෙදෙන විට අලංකාරවත් සියුම් හඬක් පැනනගිනු ලබයි.

ඉහත දක්වන ලද සියලු කොටස් වලින් සැරසෙනු ලබන ශිල්පියාගේ ස්වරූපය පහත දැක්වෙන ඡායාරූප තුළින් පැහැදිලි වේ.



ඉදිරිපස පෙනුම



පිටුපස පෙනුම

මෙම සියලු කොටස් වලින් සැරසී කංකාරිය වෙත නර්තන ශිල්පියා යා යුතු ආකාරය පිළිබඳව කංකාරි සාහිත්‍යයේ මෙසේ සඳහන් වේ.

"පළමුව උල්වුඩය රැළි අල්ලා අඳිනු
දෙවනුව දෙපස පෙති කුසුමක් සේ බඳිනු

තෙවනුව සුසැට බරණ සියොගත පැළඳ ගනු
දෙවියෙකු විලස යාග සබයට වඩිනු"[10]

**වෙස් ඇඳුම සම්බන්ධ මතවාද.**



- ❖ බෙංගාලි දඩයම්කරුවන්ගේ ඇඳුමක් බව
- ❖ දකුණු ඉන්දියානු තෙයියම් නැටුමේ ඇඳුමට සමාන බව
- ❖ වෙස් ඇඳුමේ ශීර්ෂ කොටස් මලබාරයේ රාජකීය ශීර්ෂාභරණයේ අනුකරණයක් බව
- ❖ රාවණා රජුගේ ඇඳුම් කට්ටලය බව
- ❖ රාවණා රජු විසින් සූර්යයාගේ කිරණ අනුකරණය කොට නිර්මාණය කළ ඇඳුමක් බව[11]
- ❖ වෙස්තට්ටුව ඔටුන්නක ඉස්සරහ භාගයක් වන බව

ඉහත දැක්වෙන මතවාද වෙස් ඇඳුම් කට්ටලය පිළිබඳව මෑතකදී පල වූ අදහස් වේ.
මෙය රාවණා රජතුමා හා සම්බන්ධ ඇඳුමක් බවට ජනප්‍රවාද හෝ කාව්‍ය හා සාහිත්‍ය තොරතුරු වල සඳහන් නොවේ. එහෙත් ඍජුවම රාවණා රජු සමඟ සම්බන්ධ නොවූවත් යම්තාක් දුරට සම්බන්ධයක් තිබිය හැකි බව පුරාවිද්‍යාත්මක සාධක වලින් හෙළි වේ. එහෙත් මෙය ගෝත්‍රික ඇඳුමක් වශයෙන් අර්ථ දැක්වීම සුදුසු නොවේ යන්න මාගේ අදහසයි. මන්දයත් රිදී වැනි ලෝහයකින් එවැනි සුවිශේෂ වූ නිර්මාණයක් කිරීමට ප්‍රාථමික ගෝත්‍රික ජනතාවට හැකියාවක් නොමැති වීම ය. එමෙන්ම වෙනත් රටක සාම්ප්‍රදායික නර්තන රංග වස්ත්‍රයක් තුල වෙස් ඇඳුමේ එක් කොටසක් හෝ කොටස් කිහිපයක් තිබූ පමණින් ආභාෂයක් වෙස් ඇඳුම් කට්ටලය කෙරෙහි ලැබී ඇති බව නිගමනය කිරීම කොතෙක් දුරට නිවැරදිදැයි කල්පනා කළ යුතු කරුණකි.

පාරම්පරික ශිල්පී ජී. රංගනාථ මහතා පවසන පරිදි වෙස් ඇඳුම් කට්ටලයේ සියලු කොටස් වලින් නියෝජනය වන්නේ සූර්යයා සහ විශ්වීය සංකල්පයයි. "1958 දී රංගනාථ, එස්. පණිභාරත, ජේ. ඊ. සේදරමන් වැනි සාම්ප්‍රදායික ශිල්පීන්ගේ ප්‍රධානත්වයෙන් මහා නර්තන සංගායනාවක් පවත්වා ඇති අතර එහිදී මූලික වශයෙන්ම උඩරට වෙස් ඇඳුම් කට්ටලයේ නිර්මාපකයා රාවණා රජු බවටත් එහි මූලික පදනම සූර්ය සංකල්පය මුල් කොට ගෙන නිර්මාණය වී ඇති බවත් සංගායනාවේදී තහවුරු කොට ගෙන ඇත."[12] එය කොතෙක් දුරට නිවැරදි ද යන්න ගැටළු සහගතය.

පාරම්පරික ශිල්පී ජී. රංගනාථ මහතාට අනුව වෙස් ඇඳුමේ කොටස් තුළින් ගම්‍යමාන වන සූර්ය සහ විශ්වීය සංකල්පය මෙසේ පෙළ ගැස්විය හැක.

- ❖ "ජටාව - අහස් ගංගාව. ඒ වූ කලී සූර්යයාගෙන් නික්මෙන ඉතා උණුසුම් තාප කිරණවල බලපෑම මද කිරීම උදෙසා මහා ජල ධාරාවක් නිකුත් කරන ගංගාවයි.

---

[10] පාරම්පරික නර්තන ශිල්පී ඩබ්. ජී. එච්. එම්. වෙද්දෙනිය මහතා සමග 2019.01.04 දින කළ සාකච්ඡාව.
[11] ඥානසිරි, පීරිස්. (2009). **ශාන්තිකර්ම සහ අභිචාර විධි.** පිට.48.
[12] 2015 වර්ෂයේදී ඊශානි රංගනාථ මහත්මිය විසින් කැලණිය විශ්වවිද්‍යාලයේ කළ දේශනය.

- ජටා රැල - මහා ගංගාවෙන් වැස්සෙන ජල ධාරාව.
- පායිම්පත - අග්නි කිරණ. සූර්යයාගේ මධ්‍යයේ සිට ක්‍රමයෙන් සෑම දිශාවකටම විහිදී යන අග්නි කිරණ සංකේතවත් වේ.
- සිඛාබන්ධනය - රාශීන් 12.
- නෙත්තිමාලය - සූර්‍ය මණ්ඩලයේ පිහිටා ඇති නෙළුම් පොකුණ.
- බෝපත් - හිරු මඩල මත දිදුලන කෙටි, මධ්‍ය, දීර්ඝ සූර්‍ය කිරණ.
- උරබාහු - කුඹය නමින් හඳුන්වන සූර්යයාගෙන් නිකුත්වන රශ්මිය පිට කරන විශේෂ ස්ථානය.
- බන්දි වළලු - කුඹ 16න් නිකුත්වන දුමාරය.
- අවුල් හැරය - සූර්යයාගේ හිරු මඩලේ ලප 32.
  අවුල් හැරය පිළිබඳ තවත් මතවාදයක් ඉදිරිපත් කරන එස්. වෙලබඩගේ මහතා මෙයින් සූර්ය මණ්ඩලයේ විහිදී යන ආකාරය මැද බුබුළු ලොකුවටත් අනෙක්වා ක්‍රමයෙන් කුඩාවටත් දක්වා තිබීමෙන් පෙන්නුම් කරන බව ද ප්‍රකාශ කරයි."[13]

තවත් මතවාදයක් ලෙස "සූර්යයාගේ ක්‍රියාකාරිත්වය යම්සේද එය වෙස් තට්ටුවේ ජටාවේ සිට සිලම්බු දක්වා විහිදී ගොස් ඇති බව ප්‍රකාශිතය. මෙම මතවාදය බලපවත්වන්නේ බුදුදහම ලක්දිව වැළඳ ගැනීමට පෙර කාල පරාසය උදෙසා ය. මන්දයත් ඉන්පසු බෞද්ධාගමේ බලපෑම නිසා වෙස් ආභරණවල යම් යම් වෙනස්කම් විද්‍යාමාන වීමයි."[14]

**වෙස් ඇඳුම හා සම්බන්ධ ගරු කිරීම.**

වර්තමානයේ කෙසේ වෙතත් අතීතයෙහිදී මෙම වෙස් ඇඳුම් කට්ටලයට අද්විතීය ස්ථානයක් හිමිව පැවතිණි. මෙය පූජනීය වස්තුවක් සේ සැලකීමට එකල පාරම්පරික නර්තන ශිල්පීහු වග බලා ගත්හ. එයට කිසි විටෙකත් ස්ත්‍රී ස්පර්ශය ලක් නොවීමට කටයුතු කළ අතර කිලි නොවදින ස්ථානයක තැන්පත් කොට පණ මෙන් ආරක්ෂා කළහ. පොදු ජන සමාජයේ කිලි වශයෙන් සලකන කොටහළු කිල්ල, මාස් කිල්ල, උපත් කිල්ල, මරණ කිල්ල වැනි අපිරිසිඳු තත්ත්වයන් වලින් ආරක්ෂා කරගැනීම උදෙසා එකල ශිල්පීන් විසින් මෙම වෙස් ඇඳුම් කට්ටලය කුරුණි පෙට්ටියක (පසුකාලීනව ට්‍රන්ක පෙට්ටියක) බහා නිවසින් පිටත බුදුගෙය, දේවාල ගෙය, වී බිස්ස ආදී ස්ථානයන්හි තැන්පත් කළහ.



කුරුණි පෙට්ටිය.

දුම්මල මගින් විෂබීජ විනාශ කිරීමට ඇති හැකියාව නිසා වෙස් ඇඳුම් කට්ටලයට නිතරම දුම් ඇල්ලීම සිදු කළහ. මෙසේ කිලි නොවදින ස්ථානයක තැන්පත් කළ වෙස් ඇඳුම් කට්ටලය ඉන් ඉවතට ගනු ලැබුවේ කංකාරි කටයුත්තක් සඳහා සහභාගී වීම සඳහා පමණි. එමෙන් ම කංකාරි කටයුතු සඳහා මෙය

[13] 2015 වර්ෂයේදී ඊශානි රංගනාථ මහත්මිය විසින් කැලණිය විශ්වවිද්‍යාලයේ කළ දේශනය.
[14] 2015 වර්ෂයේදී ඊශානි රංගනාථ මහත්මිය විසින් කැලණිය විශ්වවිද්‍යාලයේ කළ දේශනය.

රගෙන යනු ලැබුවේ හිස මත තබා ගෙන ය. වෙස් ඇඳුමෙන් සැරසීමට ප්‍රථම යක්දෙස්සා දෙහි ගා ස්නානය කොට පේ වීම සිදු විය. එවන් සැලකිල්ලක් දැක්වූ වෙස් ඇඳුම් කට්ටලය කෙරෙහි පොදු ජන සමාජයේම විශාල විශ්වාස පද්ධතියක් ගොඩනැගී පැවතිණි. යම්කිසි පුද්ගලයකුගේ අසනීප තත්ත්වයකදී යක්දෙස්සා ලවා වෙස් ඇඳුම් කට්ටලයට පඬුරු වෙන්කොට භාරහාර වීම එකල සමාජයේ සුලභව දැකගත හැකි විශ්වාසයකි. එය උඩරට යක්දෙහි පරපුරවල් වල සිටින ශිල්පීන් අතර පවතින පහත කියමනින් මනාව පසක් වේ.

"ගැහැණුන් සිටිනා ගෙට නොගත්තු
වෙස් පෙට්ටිය ලෙඩටත් බෙහෙතක්ලු"[15]

ආධුනික ශිල්පියකු තමන් උගත් ශිල්පයෙහි ප්‍රවීණත්වයක් ලබා ඇතැයි, එනම් කංකාරියක් නැටීම සඳහා අවශ්‍යවන සියලු නර්තන සහ පෙළපාලි අංගයන්හි දැනුම ලබා ගත් පසු ගුරුවරයා විසින් තීරණය කොට වෙස් බැඳීම සඳහා යොමු කරවනු ලබයි. නමුත් එකී තත්ත්වය වර්තමාන සමාජ ක්‍රමයත් සමඟ වෙනස් ව ගොස් හමාර ය. හිටපු උඩරට නැටුම් පරීක්ෂක, ප්‍රවීණ පාරම්පරික නර්තන ශිල්පියෙකු වූ ජේ. ඊ. සේදරමන් මහතා උඩරට නර්තනය හදාරන ආධුනිකයන් හට හරවත් වූ පාඨයක් මෙසේ ඉදිරිපත් කරයි. "දණ්ඩියම් සරඹ සිට මුවමල දක්වා තෙවිසි වර්ගයක නැටුම් ක්‍රම රැසක් වෙස්කාරයෙකු වෙස් බැඳීමට පෙර උගත යුතුවේ. එහෙත් මෙයින් ඉතා ස්වල්පයක් වත් ඉගෙනීමට මෙකල ව්‍යාජ වෙස් නළුවෝ මැලිවෙති."[16]

එහිදී කාලයක් මුළුල්ලේ ආධුනික ශිල්පියා විසින් මස් මාංශ අනුභවයෙන් හා කිල්ලකට හසු වීමෙන් වැලකී පේ වී සිටිය යුතුය. එමෙන්ම වෙස් බඳින දින අරුණලු නැගීමට පෙර දෙහි ගා හිස පැන් වත්කරවා පිරිසිඳු වීමෙන් අනතුරුව සුභ මොහොතින් මඟුල් බෙර, සක් හඬ හා පිරිත් සජ්ඣායනය මධ්‍යයේ ගුරුවරයා විසින් හිස වෙස් තබා මොට්ටැප්පිලි පළඳා එළිමහනට ගෙන එනු ලබයි. ඉන් අනතුරුව කිරි හරකෙකු බැලීම, කිරි ගසකට කොටා කිරි බැලීම, ජල බඳුනකින් තම රුව බැලීම, දිය කළය බිඳීම වැනි චාරිත්‍ර සිදු කරනු ලබයි. වෙස් මංගල්‍යය උත්සවය රජ කෙනෙකුට ඔටුනු පැළඳීමේ මංගල්‍යයකට සමාන බවට මතයකි. මේ සියලු චාරිත්‍රයන් තුළින් වෙස් ඇඳුම කෙරෙහි හා වෙස් ඇඳුමින් සැරසුණු ශිල්පියා වෙත ලැබිය යුතු ගෞරවය පිළිබඳ මනාව පසක් වේ. නමුත් වර්තමානය වන විට හිස වෙස් තැබීමට ද මූල්‍යමය වටිනාකමක් එක් වී වෙස් තැබීමේ මංගල්‍යයේ ද හරවත් බව හීන වී ඇත. උගත යුතු දණ්ඩියම් සරඹ සිට මුවමල දක්වා නර්තනාංග පිළිබඳ කිසිඳු අවබෝධයකින් තොරව නර්තනාංග කිහිපයක් පමණක් ඉගෙනීමෙන් අනතුරුව හිස වෙස් තැබීම අද සුලභව දැකගත හැකි කරුණකි. අතීතයේ දී වෙස් ඇඳුම් කට්ටලය හා බැඳි ගරු කිරීමක් නිරන්තරයෙන් පැවති අතර පසුකාලීනව ඇති වූ විවිධ අවශ්‍යතාවන්ට වෙස් නර්තන ශිල්පීන්ගේ දායකත්වය ලබා ගැනීමේ දී එයට ද මූල්‍යමය වටිනාකමක් එක් වීම හේතුවෙන් වෙස් ඇඳුම් කට්ටලයට හිමි ගරුත්වය වර්තමානය වන විට හීන වෙමින් පවතින බව පෙනෙන්නට ඇත. ඒ සඳහා විවිධ සමාජ සංස්කෘතික සහ ආර්ථිකමය සාධක මෙයට බොහෝ දුරට බලපා ඇති බව තහවුරු කරගත හැකි විය.

[15] පාරම්පරික නර්තන ශිල්පී ඩබ්. ජී. එච්. එම්. වෙද්දෙනිය මහතා සමග 2019.01.04 දින කළ සාකච්ඡාව.
[16] සේදරමන්, ජේ. ඊ. (1959). **නෘත්‍ය රත්නාකරය.** පිට.111

එකල ස්ත්‍රී ස්පර්ශය පවා වෙස් ඇඳුම වෙත ලක් නොවීමට වගබලා ගනු ලැබුව ද පසුකාලීනව කාන්තාවන්ද වෙස් බැඳීම හේතුවෙන් වෙස් ඇඳුමේ ගෞරවයට එකපිට එක ප්‍රහාර එල්ල විය. ප්‍රථම වරට 1930 දී චන්ද්‍රලේඛා මහත්මිය වෙස් තැබීමෙන් අනතුරුව 1931 දී මේරියන් පීරිස් නැමැත්තිය ද වෙස් බැඳ ඇත. ඉන් අනතුරුව 2001 වර්ෂයේදී මිරැන්ඩා හේමලතා මහත්මිය විසින් කාන්තාවන්ට වෙස් බැඳීම සිදුකොට ඇත. වර්තමානය වනවිට කාන්තාවන්ට වෙස් බැඳීම සුළු කරුණක් වී හමාර ය. කාන්තාවන් හිස වෙස් බැඳීමත් සමග ම වෙස් ඇඳුම් කට්ටලයෙන් අපේක්ෂිත මූලික අරමුණු සහ ආකල්ප වෙනස් වී නව ප්‍රවණතා රැසක් උඩරට නර්තන සම්ප්‍රදායෙහි ස්ථාපිත ව ඇති බව දක්නට ඇත.







**වෙස් ඇඳුමේ විකාශය.**

එදා මෙදා තුර කාල පරාසය තුළ වෙස් ඇඳුම් කට්ටලයේ සිදුව ඇති වෙනස්කම් රාශියකි. අතීතයේදී විචිත්‍ර වර්ණ වලින් යුක්ත වූ කම්බා රෙදි උල්උඩය සඳහා සහ හඟල සඳහා භාවිත කොට ඇත. පසුකාලීනව සුදු පැහැති රෙද්දකින් උල්උඩය සැරසුණු අතර වර්තමානයේදී නැවතත් කහ, නිල් ආදී වර්ණ භාවිතයක් දැකිය හැකිය. පැරණි ශිල්පීන් විසින් කංකාරිය නටන මොහොතේ දී රැළි කඩා, පෙති බඳිමින් වැඩි කාලයක් සහ ශ්‍රමයක් යොදමින් හඟල අඳිනු ලැබූ අතර පසුව පාරම්පරික ශිල්පී සෝමබන්ධු විද්‍යාපති විසින් කලින් සාදා නිම කළ හඟලක් ප්‍රථමයෙන්ම හඳුන්වා දෙමින් ශිල්පීන්ගේ කාලය සහ ශ්‍රමය ඉතිරි කොට ඇත. එමෙන්ම වත්මනෙහි හඟල සඳහා ද විවිධ වර්ණ රෙදි භාවිතයක් දැකිය හැක.



අතීත භාවිතය.




වර්තමාන භාවිතය.

බෞද්ධාභාසය ලැබීමට මත්තෙන් ඉතා කුඩාවට නිර්මාණය වී තිබූ ජටාව බුදු දහමේ බලපෑමෙන් චෛත්‍යයක් හෙවත් කරඬුවක ස්වරූපයක් ගන්නා ලදි. තවද ජටාවේ යටි පැත්තේ පිහිටි වලක හැඩය ගත් කොටස අද දැකිය නොහැකි ය. කල්ගත වෙත්ම ජටාව බැඳ ඒ මත රතු පැහැති රෙදි කඩ දෙකක් බැඳ හිස ආවරණය කළ ද ඉතා ඈත අතීතයේදී එලෙස හිස ආවරණය නොකළ බව කියැවේ.

වර්තමානයේදී මේ තත්ත්වය අභිබවා අනිසි ප්‍රතිඵල තත්ත්වයක් උදා වී ඇත. එනම් සමස්ත වෙස් තට්ටුවම එකවිට හිස මතට බැස්ස වීමට හැකි ආකාරයට සකසා ගැනීමයි.[17]

ගිනි සිළු හතක ස්වරූපය දැකගත හැකි වූ පාහිම්පත බෞද්ධාගමික බලපෑමත් සමග මල් මෝස්තර සහිත කැටයම් වලින් නිර්මාණය විය. ඉතා විශාල වූ පාහිම්පතක් වෙනුවට අද නර්තන ශිල්පියාගේ ශරීර ප්‍රමාණයට උචිත වන ලෙස සාමාන්‍ය ප්‍රමාණයකින් යුත් පාහිම්පතක් භාවිත වේ.



අතීතයේ භාවිත වූ ප්‍රමාණයෙන් විශාල පාහිම්පතක්.

වෙස් තට්ටුවේ සිඛාබන්ධනයේ සිඛා ගණන ද ක්‍රමයෙන් වැඩි වී ඇත. එනම් 1908 පමණ වනවිට සිඛා 11ක් ද, 1930-1950 වනවිට සිඛා 13ක් ද, වර්තමානය වනවිට සිඛා 25කින් ද වර්ධනය වී ඇත.[18] සිඛා වල හැඩයේද යම් යම් වෙනස්කම් කලින් කලට සිදු වී ඇති බව පහත රූප මගින් පැහැදිලි වේ.





අතීතයේදී සියලු ආභරණ කොටස් රිදී ලෝහයෙන් නිම කල ද අද නිකල් වැනි ලෝහ ඒ සඳහා භාවිත වේ. එ පමණක් නොව අර්ථ රහිත හුදු අලංකාරය පමණක් අරමුණු කොටගෙන වෙස් ආභරණ සඳහා කැටයම් එක් කිරීම ද වර්තමානයේදී සුලබව දැකිය හැක.

1950 දී පමණ භාවිත අවුල්හැරය පපුව මධ්‍යයට පමණක් සිටින ආකාරයට සකස් කර ඇත.[19] වර්තමානයේදී භාවිත අවුල්හැරය ශිල්පියාගේ පපුව පුරා විහිදී යන අයුරින් විවිධ වර්ණ වලින් යුත් කිරි පබළු යොදා ගනිමින් නිර්මාණය කොට ගනී. එසේම එකල අවුල්හැරය සඳහා භාවිත කළ කබල්ලෑ පොතු වෙනුවට වත්මනෙහි කෘතිම ද්‍රව්‍ය වලින් සකස් කොට ගත් කොටස් භාවිත වේ.

---

[17] 2015 වර්ෂයේදී ඊශානි රංගනාථ මහත්මිය විසින් කැලණිය විශ්වවිද්‍යාලයේ කළ දේශනය.

[18] පාරම්පරික නර්තන ශිල්පී ඩබ්. ජී. එච්. එම්. වෙද්දෙනිය මහතා සමග 2019.01.04 දින කළ සාකච්ඡාව.

[19] 2015 වර්ෂයේදී ඊශානි රංගනාථ මහත්මිය විසින් කැලණිය විශ්වවිද්‍යාලයේ කළ දේශනය.

එකල භාවිත ඉන හැඩය සහ බුබුලු පටිය ඉතා විශාල බවකින් යුක්ත වූ අතර වර්තමානය වනවිට ශිල්පියාගේ ශරීර ප්‍රමාණයට අනුව ඊට ගැලපෙන අයුරින් නිර්මාණය කළ ඉන හැඩ සහ බුබුලු පටි භාවිත වේ. කලින් කලට බුබුලු පටියේ රිදී කැටයම් කොටස් ගණනේ ප්‍රමාණය ද වැඩි වී ඇත. එනම් කොටස් 3කින් යුක්ත වූ බුබුළු පටිය පසුකාලීනව කොටස් 5ක් දක්වා වර්ධනය වී ඇත.

එමෙන්ම අතීතයේදී භාවිත කළ හස්තකඩය නම් ආභරණය අද වනවිට භාවිතයෙන් තොර වූ ආභරණයක් බව දැකිය හැක.

**නිගමනය.**

කොහොඹා කංකාරි ශාන්තිකර්මය උදෙසා පමණක් භාවිත වූ වෙස් ඇඳුම් කට්ටලය කල්ගතවෙත් ම විවිධ අවශ්‍යතාවයන් උදෙසා යොදා ගැනිණි. 1915 න් පසු මහනුවර දළදා පෙරහැරට වෙස් බැඳි යක්දෙස්සන් පළමු වරට යොදා ගෙන ඇති අතර ඉන් පසු දේවාල පෙරහැර වලටත් මොවුන් යොදා







ගෙන ඇත.[20] පසු කාලීනව ප්‍රභූ පැලැන්තිය සතුටු කිරීමේ අරමුණින් වෙස් නර්තන ඉදිරිපත් කිරීමටද, උත්සව අවස්ථාවන්හිදී ප්‍රභූ පිරිස් පිළිගැනීමටත් විදේශ සංචාරක පිරිස් පිළිගැනීමටත් වෙස් නර්තන ශිල්පියෝ භාවිත වන්නට විය. වත්මනෙහි සිදුවන සෑම උත්සව අවස්ථාවකටම වෙස් නර්තන ශිල්පියා නැතුවම බැරි කෙනෙක් වීම අභාග්‍ය සම්පන්න තත්ත්වයකි. එනම් මංගල අවස්ථාවන්හි මනාල මහත්ම මහත්මීන් කැඳවා ගෙන ඒමටත්, පන්සල් පින්කම් ආශ්‍රිත පෙරහැර අවස්ථාවලටත්, වේදිකා නර්තන සඳහාත් වෙස් ඇඳුමෙන් සැරසුණු ශිල්පියා භාවිත වේ. එමෙන් ම නූතනයේදී ඇතැම් විලාසිතා ප්‍රදර්ශන සඳහා ද, විවිධ රංග වස්ත්‍ර කොටස් නිර්මාණකරණයට ද වෙස් ඇඳුම් කට්ටලයේ කොටස් භාවිතයට ගැනීම දැකගත හැකිය.

එකල ශිල්පීහු කිසිදිනක වෙස් ඇඳුමින් සැරසුණු පසු පිනුම් ගැසීමක් සිදු කලේ නැත. මන්දයත් තමා විසින් හිසෙහි දරා සිටුනු ලබන ජටාවේ ගෞරවය ආරක්ෂා කළ යුතු වූ හෙයිනි. එනම් ජටාව බිමට නැඹුරු නොවන සේ නර්තන කාර්යයේ යෙදුනි. නමුත් අද වනවිට වෙස් නර්තන ශිපියෙකු පිනුම් නොගසන අවස්ථාවක් දැකගත නොහැකි තරම් ය. මෙම ඇඳුමේ තිබෙන වටිනාකම ගැන හරිහැටි අවබෝධයකින් තොර මුදලට, ප්‍රසිද්ධියට හා රැල්ලට යට වූ හරි හැටි ශාස්ත්‍ර අධ්‍යාපනයක් නොලත් පිරිස් විසින් වෙස් ඇඳුම් කට්ටලය අවභාවිතයට ලක් කොට එහි ඇති ශාස්ත්‍රීය වටිනාකම සහ ගෞරවාන්විත භාවයට හානි සිදු කිරීම අභාග්‍යසම්පන්න තත්ත්වයකි.

[20] ගොඩකුඹුරේ, චාල්ස්. (1963). **කොහොඹාකන්කාරිය**. පිට.xviii

මෙම අධ්‍යයනය තුළින් ලබා ගත හැකි නිගමනය වනුයේ වෙස් ඇඳුම් කට්ටලය මලය රාජෝත්තමයාණන් වහන්සේගේ සිව්සැටක් ආභරණයෙහි අර්ධ ආභරණයක් වන බවත්, මෙම ඇඳුම් කට්ටලය හා බැඳි චාරිත්‍ර වාරිත්‍ර සහ විශ්වාසයන් පැවති බවත්, වර්තමානය වනවිට භාවිත වන ඇඳුම් කට්ටලය විවිධ වකවානු තුළදී වෙනස්කම් රාශියකට ලක්ව ඇති බවත් සහ අද වනවිට වෙස් ඇඳුම් කට්ටලය අවභාවිතයට ලක් කොට එහි ගෞරවයට හානි සිදු කොට ඇති බවත් ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


1. ගොඩකුඹුරේ, චාල්ස්. (1963). **කොහොඹායක්කන්කාරිය.** සංස්කෘතික දෙපාර්තමේන්තුව.

2. දිසානායක, මුදියන්සේ. (1995). **කොහොඹා යක් කංකාරිය සහ සමාජය.** කොළඹ10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

3. පීරිස්, ඥානසිරි. (2006). **ශාන්තිකර්ම සහ අභිචාර විධි.** දංකොටුව: වාසනා ප්‍රකාශකයෝ.

4. සේදරමන්, ජේ. ඊ. (2009). **උඩරට නැටුම් කලාව.** කොළඹ 11: සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

5. දිසානායක, මුදියන්සේ. (2009). **සිංහල නර්තන කලාව.** කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

6. දිසානායක, මුදියන්සේ. (1991). **කංකාරි ගීත සාහිත්‍යය.** කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

7. දිසානායක, මුදියන්සේ. (1990). **උඩරට ශාන්තිකර්ම සහ ගැමි නාට්‍ය සම්ප්‍රදාය.** කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

8. රංගනාත්, ජී. (1985). හෙළ මහ යක්කම. සංස්කෘතික කටයුතු අමාත්‍යංශය.


**<u>සම්මුඛ සාකච්ඡා.</u>**

1. පාරම්පරික නර්තන ශිල්පී තිත්තපජ්ජල ටී. වයි. සුමනවීර මහතා සමග 2018.10.14 දින කළ සාකච්ඡාව.

2. කැලණිය විශ්වවිද්‍යාලයේ තාවකාලික කථිකාචාර්ය, පාරම්පරික නර්තන ශිල්පී (බලවත්ගොඩ පරපුර) ඩබ්. ජී. එච්. එම්. වෙද්දෙනිය මහතා සමග 2019.01.04 දින කළ සාකච්ඡාව.

# නර්තනයේ භාවිත සරඹ අභ්‍යාස සහ කායික හා මානසික ඒකාග්‍රතාව (උඩරට නර්තන සම්ප්‍රදාය ඇසුරින්)

කේ. දනංජය ජයසේකර[1]

දේශිය සංස්කෘතිය හා බද්ධ වූ කලාව එකී සංස්කෘතික අනන්‍යතාව විදහා දක්වන අංගයකි. මිනිසාගේ සහජ කුසලතා අනුව වර්ධනය වී පසු කාලීනව සමාජීය වශයෙන්වන දියුණුවත් සමඟ මෙම අනන්‍යතාව අතීතයෙන් වර්තමානයටත්, වර්තමානයෙන් අනාගතයටත් සම්ප්‍රේෂණය වේ. මෙම ක්‍රියාවලිය එක් එක් යුගයන්හි දී ආගමික, සමාජීය හා සංස්කෘතික වශයෙන් යම් යම් විපර්යාසයන්ට භාජනය වුවද, කලාව රැක ගැනීම වෙනුවෙන් ඒ සඳහා ලැදියාවක් ඇත්තෝ ඊට උත්සහ දරුහ. කලා විෂය පිළිබඳ දැඩි ලෙස අවධානය යොමු වෙත්ම ඒවා විවිධ අංශයන යටතේ කාණ්ඩ වන්නට ඇත. වර්තමානයේ නර්තන කලාව ප්‍රාසංගික කලා යන විෂය ක්ෂේත්‍රය යටතේ දක්වා ඇත්තේ එහි ප්‍රතිඵලයක් ලෙසිනි.

නර්තනයේ ආරම්භය පිළිබඳ නිවැරදි නිගමනයකට එළඹීම අසීරු කටයුත්තකි. නර්තනයේ මූලික සිද්ධාන්තය චලනය බැවින්ද, චලනයේ ආරම්භය හා විකාශනය මානව ශිෂ්ටාචාරයේ ආරම්භයත් සමග අත්‍යන්තයෙන් බැදී පවතින බැවින්ද, නර්තනයේ ඉතිහාසය මානව ශිෂ්ටාචාරයේ ආරම්භය සමග බැඳී පවත්නා බව බොහෝ නිරීක්ෂකයන්ගේ නිගමනය වී ඇත. ශ්‍රී ලාංකීය නර්තන කලාව පිළිබඳ කතා කිරීමේදි උඩරට නර්තන සම්ප්‍රදාය, පහතරට නර්තන සම්ප්‍රදාය හා සබරගමු නර්තන සාම්ප්‍රදාය යන ත්‍රිත්ව නර්තන සාම්ප්‍රදායන් ඔස්සේ එය විග්‍රහ කළ හැකිය. ශ්‍රී ලාංකීය භූ විෂමතා ලක්ෂණ මූලික කර ගනිමින් මෙම ත්‍රිත්ව සම්ප්‍රදාය වෙන්කොට දක්වා ඇති අතර මානවයාගේ ඇදහිලි හා විශ්වාස පදනම් කර ගනිමින් බිහි වූ ශාන්තිකර්ම කේන්ද්‍ර කර ගනිමින් මෙම නර්තන සාම්ප්‍රදා ප්‍රභවය හා විකාශනය වී ඇති බව පැහැදිලිය.

අතීතයේ මෙම නර්තන විෂය හා සම්බන්ධ ශිල්ප ඥාණය පාරම්පරිකව දායද වූ අතර එම ක්ෂේත්‍ර පිළිබඳ විශේෂ හැකියාවක්ඇති පිරිස නර්තන ගුරු පරම්පරා ලෙස නම් කර ඇත. ඒ අනුව මුල් කාලීනව එම විෂය හා සම්බනධ ශිල්ප ඥාණය පාරම්පරිකව දායද වීම පියාගෙන් පුතුට හෝ එසේත් නැතිනම් ලේ ඥාතීත්වයක් ඇති අයෙකුට වීම අනිවාර්ය වුවකි. මුල් කාලීනව එය සමාජ සම්මතයක් ලෙස පැවතුන ද පසු කාලීනව විෂය හා ඇල්මක් දක්වන පුද්ගලයන්ට ඒවා ඉගෙන ගැනීමේ අවස්ථාව හිමි වූ අතර ඒ සඳහා ගුරු ගෙදර සිටිමින් ගුරු ඇසුර ලැබීමට සිදු විය. එය ගුරු ගෙදර කේන්ද්‍ර කර ගත් අධ්‍යාපන ක්‍රමවේදය යි. සමාජීය වශයෙන් සිදු වු විපර්යාසයන්ට අනුව මෙම කලාවේ උරුමයේ රටාවන්ද වෙනස් විය. එම ක්‍රියාවලිය ඉතා දිගු වුවත් වර්තමාන ස්වරූපය වන්නේ විවිධ අධ්‍යාපන ආයතන කෙන්ද්‍රගත කරගනිමින් මෙම විෂය නව පරපුරට උරුම කර දීමයි. එය ක්‍රමවත් හා විධිමත් වූ අධ්‍යාපන රටාවකි. අතීතයේ පැවති ඉගෙනීම් ක්‍රම තුල ක්‍රමවත් හා විධිමත් බවක් නොතිබූ බව මෙයින් ගම්‍ය නොවේ. ගුරු ගෙදර කේන්ද්‍ර කරගත් අධ්‍යාපන රටාව තුල අධ්‍යාපනය ලබාදීමට ප්‍රථම සුදුසුකම්

[1] ydananjayajayasekara@gmail.com

පරීක්ෂා කිරීමේ ක්‍රම වේද අනුගමනය කර ඇති ආකාරය පිළිබඳ අවධානය යොමු කිරීම මඟින් ඒ බව ප්‍රත්‍යක්ෂ වේ.

සාම්ප්‍රදායික ගුරු ගෙදර තුළදී ශාස්ත්‍රීය පද කොටස් ඉගැන්වීමට ප්‍රථම ශරීරයේ මූලික කොටස් සඳහා වෙන් වෙන් වශයෙන් අභ්‍යාස සිදු කිරීමේ ක්‍රමවේද ගොඩ නැගී තිබින. ත්‍රිවිධ නර්තන සම්ප්‍රදායන්හිදීම මෙම අභ්‍යාස "සරඹ අභ්‍යාස" ලෙස හැඳින්වේ. ශරීරය, නර්තනයේ මාධ්‍යය බවට පත් වී ඇති බැවින් එම මාධ්‍යය සාම්ප්‍රදායනුකූලව හැඩ ගස්වා ගැනීම මෙහිදි සිදු වේ. වර්තමානයේ ප්‍රායෝගිකව නර්තන විෂය උගන්වනු ලබන අධ්‍යාපන ආයතන මඟින් සම්පාදනය කරනු ලබන විෂය මාලා ඒකකයන්හිදී හා ඒවාහි මුල් අදියර තුල මේ පිළිබඳ දැඩි ලෙස අවධානය යොමු කර ඇත.

ත්‍රිවිධ නර්තන සමාප්‍රදායේදීම කාණ්ඩ දෙකක් යටතේ මෙම සරඹ අභ්‍යාස සිදු කරයි. එහිදි දෙපා හුරුවිම සඳහා එක් සරඹ කණ්ඩයක් ද දෙපා සහ දෙඅත් චලන එකවර ප්‍රගුණ කිරීම සඳහා එක් සරඹ කාණ්ඩයක් ද වශයෙන් කාණ්ඩ දෙකක් යටතේ මෙම සරඹ යොදාගෙන ඇත. සම්ප්‍රදායන් ත්‍රිත්වයෙහිම යොදා ගන්නා මෙම සරඹ කාණ්ඩ දෙකෙහි මූලික අරමුණු වල සමානත්වයක් පෙන්නුම් කළ ද ඒවා හඳුන්වන නාමයන්ගේ, නර්තන රටාවන්ගේ, ඊට අනුරූපව යොදා ගන්නා වාදනයේ, ශරීර පිහිටීමේ, පද පැගීමේ, හස්ත චලනයන්ගේ, ශරීර රිද්මයන්ගේ විෂමතා මෙහිදි පෙන්නුම් කරයි. පහත සඳහන් වගු ගත කිරීම තුල දක්වා ඇත්තේ එම සරඹ අභ්‍යාසයන් ය.

| **නර්තන සම්ප්‍රදාය / සරඹ කාණ්ඩය** | **උඩරට නර්තන සම්ප්‍රදාය** | **පහතරට නර්තන සාම්ප්‍රදාය** | **සබරගමු නර්තන සම්ප්‍රදාය** |
|---|---|---|---|
| දෙපා හුරුවීම සඳහා සිදු කරන අභ්‍යාස | පා සරඹ | පා සරඹ | මංඩි පද |
| දෙඅත් හා දෙපා එකවර හුරුවිම සඳහා සිදු කරන අභ්‍යාස | ගොඩ සරඹ | ඉලංගම් සරඹ | දොම්න පද |

මෙම ත්‍රිවිධ නර්තන සම්ප්‍රදායෙහිම එක් එක් නර්තන සම්ප්‍රදායන්හිදී භාවිත සරඹ අභ්‍යාස සංඛ්‍යාත්මකව දොළසකට (12) සීමා වී තිබීම ද මෙහි ඇති සුවිශේෂත්වයකි.

නර්තනයේදි අංග, ප්‍රත්‍යාංග හා උපාංග කොටස්වල චලනයන් සිදු කිරීමේ දී ඒ සඳහා මනා වූ කායික සමබරතාවක් තිබීම බෙහෙවින් වැදගත් වේ. විශේෂයෙන් දෙපා චලනයේ දී එක් පාදයක් ඔසවා තවත් ස්ථානයක පිහිටවීමේ දී අනෙක් පාදයෙන් ශරීරය සමබර කරගත යුතුව ඇත. එම සමබරතාවයේ සාර්ථකත්වය මත සම්ප්‍රදායනුකූල හැඩතලයේ සාර්තකත්වය තීරණය වේ. එම පාදයත් සමඟ දෙඅත් චලනයක් සිදු කරන්නේ නම් එම කාර්ය තවත් වඩාත් සංකීර්ණ වේ. වර්තමාන නර්තන කලාවේ දි ප්‍රාසාංගික ගුණය පිළිබඳ දැඩි ලෙස අවධානය යොමු කරන බැවින් එම ප්‍රාසාංගික ගුණය රඳා පවත්වා ගැනීම සඳහා ද මෙම සමබරතාව ඉවහල් වනු ඇත. යම් පුද්ගලයෙකුගේ කායික සමබරතාව ඇති කර

ගැනීම සඳහා මනස ඍජුවම බලපායි. එනම් කායික සමබරතාවක් ඇති කර ගැනීමට මානසික එකග්‍රතාවක් තිබිය යුතු වේ. ඒ අනුව ත්‍රිවිධ නර්තන සාම්ප්‍රදා අතරින් උඩරට නර්තන සාම්ප්‍රදායට අයත් පා සරඹ හා ගොඩ සරඹ එකී නර්තන සාම්ප්‍රදාය ප්‍රගුණ කරන ආධුනිකයන්ගේ මානසික එකාග්‍රතාව කෙරෙහි ඉහවල් වන ආකාරය පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වන අතර මානසික හා කායික ඒකාග්‍රතාව පිළිබඳ අවධානය යොමු කළ යුත්තේ ඇයි? යන ගැටළුව මුල් කරගනිමින් මෙම පර්යේෂණ කාර්යය සිදුවිය.

1940 දශකයේ එස්. එල්. බී කපුකොටුව මහතාගේ ප්‍රධානත්වයෙන් දිවයිනේ තෝරා ගත් පාසල් සතරක නර්තනය විෂයයක් ලෙස ඉගැන්වීමට ආරම්භ කිරීමත් සමඟ එය නර්තනයේ නව පුනරුද යුගයක් බවට පත්විය. එහි දී මෙම ඉගැන්වීම් කටයුතු සඳහා විෂය නිර්දේශ සකස් කළ යුතුව තිබුණි. ජේ.ඊ. සේදරමන් මහතා නෘත්‍ය රත්නාකාරය නම් කෘතියේ දක්වා ඇති ගොඩ සරඹ දොළොස 1959 සමස්ත ලංකා නැටුම් ගුරු සංස්කරණ සම්මේලනයේ දී සකස් කරන ලද්දක් බව දක්වා තබේ. එමඟින් පැහැදිලි වන්නේ එවකට සම්ප්‍රදායිකව පැවති සරඹ අභ්‍යාස යම් යම් සංශෝධනයන් සහිතව අධ්‍යයන ක්ෂේත්‍රයට ඇතුළත් කර ඇති බවයි.[2] තව ද ඒ ඒ නාට්‍ය පරම්පරා වල පවත්වාගෙන එනු ලබන සරඹ පිළිබඳ එකඟතාවක් නොමැති බව ද එතුමා උඩරට නැටුම් කලාව නම් කෘතියේ දක්වා ඇත.[3] සරඹ කළ යුතු ආකාරයත් එම සරඹ නර්තනය කිරීමෙන් ශරීරය සම්ප්‍රදායානුකූලව හැඩ ගස්වා ගත හැකි බවත් එම කෘතින්හි වැඩිදුරටත් කරුණු දක්වා ඇත.

සත් අවුරුදු ශිෂ්‍යයෙකු සඳහා දණ්ඩියක් බැඳිය යුතු ආකාරය සහ ඒ සඳහා තෝරා ගත යුතු සුභ මොහොත පිළිබඳ විස්තර ඇතුළත් කවි ගායනා දෙකක් පහත සඳහන් වේ.

**''අදය හත සිත විසා තුරු සල නැකත මයි තුන් රාශියක්**
**උදය බුධ ගුරු කිවි නිසාපති දිනය හා හෝරාද යත්**
**පදය බඹවැඳ සාදා දණ්ඩිය තුන් වියත් උස බිදිඳු වයසත්**
**සබය කළ එලි නැටුම් නැටුමට පළමුවෙන් දණ්ඩියේ නටවන්**

**අතින් මැන විග්ගුස්ස පා පරතරය සිහියට නගා සිටගෙන**
**නිතින් තුන්මුරු කර නමා බිම දන මණ්ඩියට සිටගෙන**
**බැතින් ගුරුවර නැමැඳි තා තෙයි තාම් තුං වට්ටම් නටාගෙන**
**ඉතින් සරඹින් දොළොස් වටට්ම නටනු තා තෙයි තාම් දැනගෙන''[4]**

සබරගමු නර්තන සම්ප්‍රදායේදී ද සරඹ අභ්‍යාස ප්‍රගුණ කළ යුතු ආකාරය දැක්වීම සඳහා ඉහත සඳහන් කවි යොදාගෙන ඇත.[5]

සුභ නැකත් හෝරාවන් අනුව බුලත් හුරුළු රැගෙන ගුරුතුමා වෙත යන ශිෂ්‍යයා ප්‍රථමයෙන් දණ්ඩි කඳෙහි අභ්‍යාස සඳහා සූදානම්වන බවත් දණ්ඩි කඳ දෑතින් අල්ලා "තෙයියත් තෙයි" යන හරඹයට

---

[2] සේදරමන්, ජේ.ඊ, නෘත්‍ය රත්නාකරය, 1959, 88 පිටුව.
[3] සේදරමන්, ජේ.ඊ, උඩරට නැටුම් කලාව, 1999, 156 පිටුව.
[4] එම, පිටුව - 154
[5] රාජපක්ෂ, ශ්‍රියානි, සබරගමු නර්තන කලාව, 2006, 02 පිටුව.

ආධුනිකයා පා තබන්නේ නැකතකට අනුව බවත් ජයසේන කෝට්ටගොඩ මහතා සඳහන් කරයි.[6] ඒ අනුව පහතරට නර්තනයේ දී ද පා සරඹ ප්‍රගුණ කිරීම සඳහා දණ්ඩි කදක් යොදාගෙන ඇති බව මින් පසක් වේ.

මාතර, බෙන්තර, රයිගම හා සියනෑ යනුවෙන් වර්තමානයේ රංග ශෛලීන් සතරක් පහතරට නර්තන සම්ප්‍රදාය තුල විද්‍යාමාන වුව ද ඒ අතරින් මාතර, බෙන්තර හා රයිගම යන රංග ශෛලීන් ත්‍රිත්වයට විශේෂත්වයක් හිමි වේ. මුල් කාලීනව බෙන්තර ප්‍රදේශයේ සරඹ භාවිතයක් නොතිබූ බව ද කෝට්ටේගොඩ මහතා සඳහන් කරයි.[7] සිය කෘතියෙහි දක්වා ඇත්තේ 1995.04.21 සිට 25 දින දක්වා පොල්ගොල්ල මහවැලි අධ්‍යාපන විද්‍යාපීඨයේ දී විශ්ව විද්‍යාල, විද්‍යාපීඨ හා සෞන්දර්ය ගුරුවිද්‍යාලය ආදී ආයතනයන්හි කථිකාචාර්යවරුන් හා ප්‍රවීන ශිල්පීන්ගේද සහභාගිත්වයෙන් පවත්වන ලද ''භාව දීප'' වැඩමුළුවේදී සම්මතයට පත් වූ සරඹ අභ්‍යාස බව එතුමා සඳහන් කරයි.[8]

පාරම්පරික නර්තන කලාව ඉගෙනගැනීමේ දී සරඹ අභ්‍යාස සඳහා

01. ශරීරය සීරුවෙන් තබා ගැනීම

02. මණ්ඩිය

03. චලනය

04. අක්ෂිපතනය

05. තාලය

යන ඒවා නීති මාලාවක් ලෙස පැරැණ්නෝ යොදාගෙන ඇති බව වසන්ත කුමාර මහතා පවසයි.[9]

ත්‍රිවිධ නර්තන සම්ප්‍රදායේදීම ආධුනිකයෙකු පුහුණු කිරීමේ ක්‍රමවේදය සහ ඒවා සම්මේලන හා සම්මන්ත්‍රන මඟින් සංශෝදනය වීම, පුහුණුවීම සඳහා විවිධ නීති රීති පද්ධති යොදා ගැනීම, විධිමත් ක්‍රමවේද සකස් කිරීම යන ඒවා පිළිබඳ බොහෝ පිරිස් අවධානය යොමු කර ඇති බව පෙනී යයි.

උඩරට නර්තන සම්ප්‍රදායේ සරඹ කාණ්ඩ ද්විත්වය අතුරින් පා සරඹ වලට විශේෂත්වයක් හිමි වේ. ඒ මන්දයත් ආධුනිකයකු මුලින්ම සිදු කරන අභ්‍යාස නිසාවෙනි. ත්‍රිවිධ නර්තන සම්ප්‍රදායෙදිම මූලික ඉරියව්ව මැංඩිය/මණ්ඩිය යනුවෙන් හඳුන්වනු ලබයි. මෙම මූලික ඉරියව්ව තුළ පිහිටීම පහසු කාර්යයක් නොවේ. දෙපා හා ශරීරය පිහිටවන ආකාරය ඉතා සංකීර්ණ වුවකි. දෙපාවල ඇඟිලි සහ විලුඹ සරල රේඛාවක මිටි රියනක් පමණ දුරකින් පිහිටුවා දෙදණ දෙපසට විහිදුවා ඉන ප්‍රමාණය, දණ හිස ප්‍රමාණයට ආසන්න මට්ටමකට පහත් වී කඳ ඍජුව තබා ගැනීම මැංඩිය ලෙස නර්තන සාම්ප්‍රදායේදි අර්ථ දක්වයි. මෙහිදි ශරීරයේ විවිධ ස්ථානවල මාංශපේෂීවල විශාල තෙරපීමක් ඇති කරයි.

---

[6] කෝට්ටගොඩ, ජයසේන, ප්‍රායෝගික පහතරට නර්තන කලාව i, 2009 7 පිටුව.
[7] එම, පිටුව 8.
[8] එම, පිටුව 8.
[9] කුමාර, වසන්ත, පාරම්පරික උඩරට නර්තන සම්ප්‍රදාය, 2000, පිටුව 56.

ආධුනිකයකුට මෙම ඉරියව්වේ පිහිටීම ඉතා අසීරු බැවින් ඒ සඳහා ආධාරකයක් යොදා ගනු ලබයි. දණ්ඩි කඳ ලෙස නම් කරන්නේ එම ආධාරකයයි. මෙය භාවිත කර ගනිමින් කඳ ඍජුව තබා ගෙන පාද එසවීම හා චලනය කිරීම සිදු කරයි. පා සරඹ නර්තනයේදී දණ්ඩි කඳ දෑතින් අල්ලා ගන්නා අතර ශරීර සමබරතාව රඳා පවත්වා ගැනීමට එය ඉවහල් වී ඇත.

ස්වභාවිකව පුද්ගලයෙකුගේ ශරීර පිහිටීම හා සිටගෙන සිටින ඉරියව්ව අනුව ශරීරයේ සමබරතාවක් ඇති වේ. මැංඩිය නම් වූ ඉරියව්ව ඊට ප්‍රතිවිරුද්ධ වුවක් බැවින් එම පිහිටීම ශරීර අසමතුලිතභාවය ඇති කරන්නකි. නමුත් එය නර්තන සම්ප්‍රදායේ දී මූලික ඉරියව්ව වන බැවින් එය ඉතා හොඳින් ප්‍රගුණ කළ යුතුව ඇත. ඒ සඳහා දණ්ඩි කඳ ආධාරකයකි. ශරීර සමබරතාව සඳහා මානසික ඒකාග්‍රතාව ඉවහල් වන බැවින් එය අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා කායික සමබරතාව ද ඉවහල් වේ. එනම් කායික හා මානසික එකාග්‍රතාවය තුළ ඇත්තේ අන්‍යෝන්‍ය බැඳීමකි. එසේනම් මෙම ද්විත්ව එකාග්‍රතාව රඳා පවත්වා ගැනීම සඳහා ඉවහල් වන්නේ දණ්ඩිකඳ බව පැහැදිලිය.

අතීතයේ ගුරු ගෙදර ශිල්ප හැදෑරූ ආධුනික පිරිස මෙම දණ්ඩි කඳ භාවිතා කළ අතර වර්තමාන අධ්‍යාපන රටාව තුල එය භාවිත කිරීමක් සිදු නොකරයි. දණ්ඩි කඳ පිළිබඳ තොරතුරු න්‍යායාත්මක කරුණු වශයෙන් ග්‍රන්ථවලට සීමා වී ඇත. එහි පසුබිම් පිළිබඳ තොරතුරු න්‍යායාත්මකව දක්වා තිබුණ ද ප්‍රායෝගික භාවිතය තුලින් කායික සමබරතාවය ඇති කර ගැනීමට ලැබෙන පිටුවහල අත්පත් වන්නේ කෙසේ ද? යන ගැටළුව වර්තමානයේ පැනනගී.

ආධුනිකයෙකුගේ දෙවැනි අදියර වන ගොඩ සරඹ නර්තනයේ දී දෙඅත් චලනය සිදු කරන බැවින් එවිට දණ්ඩි කදෙන් මිදීමට සිදුවේ. එනම් පා සරඹ නැටීමෙන් ඔහු සමබරතාව ප්‍රගුණකිරීම හමාර කළ යුතුව ඇත. ඒ සඳහා සංඛ්‍යාත්මක වශයෙන් සරඹ දොළසක් නැටීම සාම්ප්‍රදාය තුල සිදු කරයි. එහිදි සාම්ප්‍රදායානුකූලව චලන ප්‍රගුණ කිරීම සඳහා විවිධ චලන ආකෘති භාවිත කරන අතර ඒවා සරල බවේ සිට සංකීර්ණවන ආකාරයට නිර්මාණය වී ඇත. උඩරට නර්තන සාම්ප්‍රදායේදි ගොඩ සරඹවලට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. මක්නිසාද යත් සාම්ප්‍රදායානුකුල පූර්ණ හැඩතලය ගොඩනැගෙන්නේ ගොඩ සරඹ තුලිනි. මෙහි දී පා සරඹ නර්තනය සඳහා යොදා ගත් පූර්ණ මංඩිය නම් වු ඉරියව්ව සඳහා, වෘත්තාකාර හැඩයකින් හා උරහිස මට්ටමට සමානව දෑත ඔසවා තබාගැනීම සිදු කරයි. දෑත පිහිටුවීමේ දී එහි අත්ල ඉදිරියට දිස්වන ආකාරයකටත් මහපට ඇඟිල්ල පොළව දෙසට පිහිටන ආකාරයටත් අනෙක් ඇඟිලි සතර එකට එකතු කර දෙඅතේ ඇඟිල් මුහුණට මුහුණ සිටින ආකාරයටත් තබා ගැනීම සිදු කරයි. ඒ ඒ ගුරු කුල අන්‍යනතා ලක්‍ෂණයන් ප්‍රදර්ශනය කිරීම සඳහා මෙම මූලික හස්ත ඉරියව්වේ සුළු සුළු වෙනස්කම් සිදු කර ඇති බවද මෙහි දී සඳහන් කළ යුතුය. එහි දී අතෙහි මැණික් කටු ප්‍රදේශයෙන් තද කරමින් හස්තයේ ශක්තිය හා ජවය ප්‍රදර්ශනය කරන අතර මෙම මුලික ඉරියව්වේ චලනය ගොඩ සරඹවලදී සිදු කරයි. මෙම චලන අභ්‍යාසය තුලදී හස්ත හා පාද චලනය සමඟ සාම්ප්‍රදායානුකූලව ගොඩ නැගෙන ශරීර රිද්ම රටාවන් ද ග්‍රහනය කරගත යුතුව ඇත.

චලනය යනු රංග වින්‍යාසයේ මූලික සිද්ධාන්තයකි. ශක්තිය, කාලය, වේගය දුර යන අනුකොටස් චලනය සිදු කිරීම සඳහා ඉවහල් වන බව එහි වැඩි දුරටත් විස්තර කර දක්වයි. සරඹ නැටීමේ දී ශරීරය ඍජුව තබා ගැනීම සඳහාත් චලන සිදු කිරීම සඳහාත් ශක්තිය අත්‍යවශ්‍ය සාධකයක් වේ. ශිල්පියෙකු තුළ පවතින ජවසම්පන්න බව එහි ප්‍රාසංගික ගුණය කෙරෙහි බලපායි. පා සරඹ නර්තනයේ දී එක්

පාදයක් එසවීමේ දී අනෙක් පාදයෙන් ශරීරයේ බර දරාගත යුතුව ඇත. ඒ සඳහා පාදයේ එක් එක් ස්ථාන වල ශක්තිය රැඳවිය යුතුය. දෑත චලනය කිරීමේ දී සහ එය උරහිස මට්ටමට තබා ගැනීම සඳහා ඇඟිලිතුඩුවල සිට උරහිස දක්වා ශක්තිය ගබඩාකාර ගැනීමක් සිදු කරයි. චලනයේ දී ඇතැම් විට එක් අතක් පමණක් චලනය සිදු කරන අතර එහි දී අනෙක් හස්තයෙහි වෙනසක් සිදු නොවූවත් එය ඒ ආකාරයෙන් තබා ගැනීම සඳහා ද ශක්තිය ඉවහල් වේ. මෙම සරඹ නර්තනයේ දී ඊට අනුකූල වූ ශරීර රිද්මයන් ගොඩ නැගෙන අතර එම රිද්මයානුකූල චලන තුළින් ද ශක්තිය හා ජවය ඉස්මතු විය යුතු අතර ඒවා ක්‍රමානුකූලව හැසිරවීමෙන් දීර්ඝ වේලාවක් නර්තනයේ යෙදිය හැකිය.

නර්තනයේ දී කාලය මැන දැක්වීම තාලය ලෙස හඳුන්වයි. තාලය මත පිහිටා චලනය සිදු කරන බැවින් එහිදී කාලය පිළිබඳ දැඩි අවධානයක් යොමු කළ යුතුව ඇත. සරඹ අභ්‍යාස තුල සිදු කරන දෙපා සහ දෙඅත් චලනයේ දී ඒවා තනි තිතකට අනුව සිදු වුව ද ශාස්ත්‍රිය පද කොටස් නර්තනයේ දී සංකීර්ණ වූ තාල රූප යොදා ගනු ලබයි. ආධුනිකයෙකුට මුලින්ම තාලය ග්‍රහණය වන්නේ මෙම සරඹ අභ්‍යාස මඟිනි. නර්තන කලාවේ චලනය ප්‍රධාන කොටස් ත්‍රිත්වයක් යටතේ දක්වයි.

1. තලානුකූල චලන
2. රිද්මයානුකූල චලන
3. ප්‍රකාශනාත්මක චලන

මෙම ත්‍රිත්ව වූ චලනයන් අතරින් උඩරට නර්තන සම්ප්‍රදායේ දී තාලානුකූල චලනයන්ට විශේෂත්වයක් හිමි වේ. ඒ අනුව හුදු චලන යොදා නොගන්නා බවත් තාලය මත පදනම් වූ චලන සිදුකළ යුතු බවත් මෙයින් පැහැදිලි වේ. එම තාලය මත පදනම් වූ රිද්මයක්ද එහි අන්තර්ගතව ඇත.

දෙපා සහ දෙඅත් එකවර භාවිත කරන පූර්ණ ඉරියව්ව (මංඩිය) තාලය මත පිහිටුවා රිද්මයානුකූලව චලනය කිරීම ගොඩ සරඹ තුලදී සිදු කරයි. මෙය ඉතා සංකීර්ණ කාර්යයකි. එම සියළු චලනයන් සමඟ දෘෂ්ඨි සම්බන්ධතා ඇතිකර ගැනීම තවත් සංකීර්ණ වේ. එම සරඹ අභ්‍යාස මූලික සරඹ අභ්‍යාස ලෙස නම් කළ ද ඒවායේ ඇති සංකීර්ණ බව ග්‍රහණය කර ගැනීම සඳහා එහි නියලෙන්නෙකුට නිරවුල් මානසික මට්ටමක් තිබිය යුතුය. එනම් මානසික ඒකාග්‍රතාවයයි.

මෙම ද්විත්ව වූ අභ්‍යාසයන් ත්‍රිවිධ ලය ගුණාකාරයන්ට අනුව ප්‍රගුණ කළ යුතුව ඇත. විලම්භ, මධ්‍ය. දෘත ලෙස ව්‍යවහාර වන්නේ එම ලය ප්‍රභේදයන්ය. මෙම ලය ප්‍රභේද සෑම විට දෙගුණයකින් ගුනවිය යුතුය. එනම් විලම්භ ලය එකක් නම් මධ්‍ය ලය දෙකක් වන අතර දෘත ලය සතරක් විය යුතුය. මෙහි විලම්භ ලය යනු වේගය ඉතා අඩුවෙන් නර්තනය කෙරෙන ක්‍රමයයි. මෙමඟින් තාලය මත රඳා පැවතීම ප්‍රගුණ කරයි. චලනයේ වේගය ඉතා අඩු අවස්ථාවේ දී එය සිදු කරන්නා සතුව සමබරතාවය ප්‍රභල ලෙස තිබිය යුතුය.ඉතා පහසුවෙන් ග්‍රහණය කර ගතහැකි ලය මධ්‍ය ලය ලෙස නම් කළ හැකිය. මධ්‍ය ලය යනු නර්තනයේ වේගය මධ්‍යස්තව පවත්වා ගැනීමයි. ඒ නිසා එය තරමක් පහසු වනු ඇත. දෘත ලය යනු වේගයේ උච්ච අවස්ථාවයි. මෙම අවස්ථාවේ දී විලම්භ හා මධ්‍ය ලයෙහි අංගහාර හැසිරවූ ආකාරයටම ඒවා හසුරවමින් වේගය දෙගුණ කළයුතු බැවින් දෘත ලයෙහි පිහිටා නැටීම ඉතා අසීරු කාර්යයකි. සරඹ අභ්‍යාස මෙම ලය ගුණාකාරයන්ට අනුව නැටීමේදි සාම්ප්‍රදායික හැඩතල හා රිද්ම රටා තුල ඇති භාවාත්මක ලක්‍ෂණ හා ජවසම්පන්නබව ද ප්‍රගුණ කල යුතුය. මේ සියළු කාර්යන් සාර්ථකව සිදු කිරීම සඳහා කායික හා මානසික ඒකාග්‍රතාව ඉවහල් වේ.

උඩරට නර්තනයේ මූලික අවධියෙහිම සිදුකෙරෙන සරඹ අභ්‍යාස මඟින් ආධුනිකයාගේ අංග, ප්‍රත්‍යාංග, උපාංග කොටස් සාම්ප්‍රදායානුකූලව ගොඩනගා ගැනීම යන මූලික අරමුණ ඉටු කර ගැනීම සඳහා මණ්ඩිය, දෙපා හැසිරවීම, දෙඅත් සහ දෙපා එකවර හැසිරවීම, තාලානුකූලව සරඹ ප්‍රගුණ කිරීම, ලය ගුණාකාරයන්ට අනුව සරඹ ප්‍රගුණ කිරීම, විවිධ නීති රීති මාලාවන් යොදා ගැනීම සිදු කරයි. අධුනිකයාගේ මුල්ම අදියර සරඹ අභ්‍යාස ප්‍රගුණ කිරීම වුවද ශරීර පිහිටීමේ ක්‍රමවේද දෙස අවධානය යොමු කිරීමේ දී ඔහුට එය පහසු කාර්යක් නොවන බව ප්‍රත්‍යක්ෂ වේ. ඒ සඳහා මුලින්ම ඔහු සිදු කළ යුතු වන්නේ කය සමබරව තබාගැනීමයි. එම සමබරතාව ඒකාග්‍රව රඳා පවත්වා ගනිමින් ශරීරාංග චලනය කිරීම ඉන් අනතුරුව සිදු කරයි. එම අවස්ථාවන්හි දී කායික ඒකාග්‍රතාව පවත්වා ගැනීම සඳහා තම ශරීරාංග සහ ඒවායේ චලන ස්වභාවය තුල මනස ඒකාග්‍ර කරගත යුතුව ඇත. ඒ අනුව ආධුනිකයකු සඳහා සිදු කරන මූලික සරඹ අභ්‍යාසයන්හි දී එම මානසික ඒකාග්‍රතාව මත පදනම්වන කායික ඒකාග්‍රතාව තුලින් මනා වූ සමබරතාවකින් යුතු සම්ප්‍රදායික හැඩතලවලින් හෙබි නර්තන ශිල්පියකු හෝ ශිල්පිනියක නිර්මාණය කර ගැනීමේ හැකියාව පවතී. මෙම විෂය ඉගැන්වීමේ කටයුතු වල නියැලෙන ගුරු භවතුන් මෙම ඒකාග්‍රතාවන් පිළිබඳ දැඩි අවධානයක් යොමු කරමින් හා සැලකියයුතු කාල වේලාවක් ඒ සඳහා වැය කරන්නේ නම් එම අභ්‍යාස මඟින් අපේක්ෂිත අරමුණු ලඟාකර ගත හැකිය. තවද මෙම ඒකාග්‍රතාවන් පිළිබඳ ගැටලුවක් පවතින අයෙකුට දීර්ඝ කාලයක් සරඹ අභ්‍යාස ප්‍රගුණ කිරීම මඟින් ඒවා වර්ධනය කර ගැනීමේ හැකියාවක්ද ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථාවලිය


01. සේදරමන්, ජේ.ඊ, නෘත්‍ය රත්නාකරය, 1959, ඇම්.ඩී ගුණසේන සහ සමාගම, කොළඹ.

02. සේදරමන්, ජේ.ඊ, උඩරට නැටුම් කලාව, 1999, ඇම්.ඩී ගුණසේන සහ සමාගම කොළඹ.

03. රාජපක්ෂ, ශ්‍රියානි, සබරගමු නර්තන කාලව, 2006, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10

04. කෝට්ටගොඩ, ජයසේන ප්‍රායෝගික පහතරට නර්තනය 1, 2009, ජේ.කේ පබ්ලිකේෂන්, කටුවාවල, බොරලැස්ගමුව.

05. කුමාර, වසන්ත, පාරම්පරික උඩරට නර්තන සම්ප්‍රදාය, 2000, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

# ශ්‍රී ලාංකීය නර්තන චලන සංකේතකරණය හා ලේඛනගත කිරීමේ වැදගත්කම පිළිබඳ අධ්‍යයනයක්

බී.ඩබ්.ආර්. දිල්කුෂි විජේරත්න[1]

නර්තන ශිල්පියා රංගනයේ දී ශරීරයේ පිහිටීම හා එය ස්ථානගත කළ යුතු ආකාරය පිළිබඳව ලිඛිතව වාර්තා කිරීම නර්තන චලන ප්‍රලේඛනය හෙවත් චලන රචනය යි. එම ලේඛන කලාව චලන අංකනය නොහොත් සංකේතකරණය ලෙස ද හැඳින්විය හැකිය. දශක කිහිපයක සිට ලෝකයේ සම්භාව්‍ය නර්තන සම්ප්‍රදායන් බොහෝමයක නර්තනමය මානව චලිතයන් විශ්ලේෂණාත්මකව වාර්තා කිරීම සඳහා සම්මත සංඥා පද්ධතියක් භාවිතා කෙරෙන අතර එය Dance Notation හෙවත් නර්තන අංකනය කිරීම යනුවෙන් හැඳින්වේ. දේශීය නර්තන කලාව උදෙසා ද එවැනි නර්තනමය චලන රචනා කිරීමේ ක්‍රමවේදයක් වැදගත්වන්නේ ද? යන ගැටළුව ඔස්සේ සමාජ හා මානව විද්‍යාත්මක දෘෂ්ඨිකෝණය පදනම් කරගනිමින් මෙම පර්යේෂණය සිදුකෙරීය.

නර්තනය යනු ඥාණාන්විත ක්‍රියාවලියකි. එම ප්‍රායෝගික ක්‍රියාවලිය උදෙසා විශ්ලේෂණාත්මක ලිඛිත භාෂාවක් භාවිතා කිරීම නර්තන සාක්‍ෂරතාවෙහි ඇති ලක්‍ෂණයක් වන්නේ ය. නෘත හා නෘත්‍යයෙන් සමන්විත නර්තනය යනු තාලය, රිද්මය හා භාවය පදනම් කරගත් චලනය කි. නර්තනමය චලන රංග ආකෘතීන් හා ඒ හා සම්බන්ධ ශිල්පෝපක්‍රමයන්ගෙන් සමන්විත වේ.

දේශීය නර්තන කලාව ප්‍රධාන නර්තන සම්ප්‍රදායන් ත්‍රිත්වයක් කේන්ද්‍රව පවතී. එනම්,

- උඩරට නර්තන සම්ප්‍රදාය
- පහතරට නර්තන සම්ප්‍රදාය
- සබරගමු නර්තන සම්ප්‍රදාය

වශයෙනි. මෙම එක් එක් නර්තන සම්ප්‍රදායන් ඒවාට ආවේනික වූ සුවිශේෂී ලක්‍ෂණයන්ගෙන් උපලක්ෂිත වේ. නර්තනමය චලනය එයින් මුඛ්‍යතම සාධකයක් වන්නේය. මෙම දේශීය නර්තන සම්ප්‍රදායන් ත්‍රිත්වයට ආවේනික ව සාම්ප්‍රදායික මුද්‍රා සහ අංගහාරයන් පවතින අතර ඒ ඇසුරින් දේශීය නර්තනමය චලන සකස්ව ඇත. දේශීය රංග ආකෘතීන් හි කේන්ද්‍රස්ථානය වන ලද්දේ යාතුකර්මයෝ ය. ඒ හා සම්බන්ධ ආගමික, සමාජීය හා සංස්කෘතිකමය අභිප්‍රේතාර්ථ මත නර්තනය මෙන් ම නර්තනමය චලන ශාස්ත්‍රය ද පෝෂණය වූහ. ඒ අනුව ප්‍රධාන වශයෙන් දේශීය නර්තන කලාව පූජාර්ථය හා විනෝදාස්වාද අරමුණුතිව රංගවින්‍යාස වන්නට ඇත.

පාරම්පරික පසුබිමක් මත ඇති දේශීය නර්තන කලාව විකාශනය වූයේ සාම්ප්‍රදායික ශිල්පීනටම ආවේනික වූ ගුරුකුල අධ්‍යාපන ක්‍රමවේදයකිනි. ඔවුහු බෙර පද හා කවි ගායනා කටවහරින් හා අත් පිටපත් ඇසුරින් පරපුරෙන් පරපුරට දායාද කළේය. නමුත් නර්තන චලන සටහන් කිරීමේ ක්‍රමවේදයක් භාවිතයක අවශ්‍යතාවයක් නොවීය. වසර ගණනාවක් පුරාවට ආධුනික නර්තන ශිල්පියා සිය

[1] dilkushi777@gmail.com

ගුරුවරයාගේ ඇසුරෙහි හැදීවැඩෙන අතර ශාස්ත්‍රීය ශිල්ප ඥාණය අත්දැකීමෙන් ම ලබා ගැනේ. ඊට අමතරව වනපොත් කරලීමෙන් මතකයේ රඳවා ගන්නට වූහ. එම කාලවකවානුවන් හි භාවිත කරන ලද ලේඛන විධි ඇසුරින් ඒවා සටහන් කර තබන ලදි. එහි දී වඩාත් සංරක්ෂිත ක්‍රමවේදයක් වශයෙන් පුස්කොලපත් ආශ්‍රිතව සටහන්කර තැබූහ. පසු කාලීනව එම පුස්කොල පොත්, අත්පිටපත් හා සාම්ප්‍රදායික ශිල්පඥාණය ඇසුරින් නර්තනමය සාහිත්‍ය කෘති රචනාවීමත් සමඟ දේශීය නර්තනයේ ප්‍රායෝගික පැතිකඩයන් ලේඛනගත කිරීම කෙරෙහි ද අවධානය යොමුවන්නට වූහ. කවි ගායනා හා බෙර පද ප්‍රස්තාරගත කිරීම මඟින් ඒවාහි තාල රූප මෙන් ම නාදමාලා පිළිබඳව අවබෝධයක් ලබාගත හැකි විය. නර්තනවේදී ජේ.ඊ.සේදරමන් මහතා විසින් 1952 වාර්ෂික කලාපයට දේශීය තාල ශාස්ත්‍රයෙන් ''ජාතික වන්නම'' නම් කවි පෙළක් ප්‍රස්තාරගත කර දක්වා ඇත. ඊට වෙනස් වූ තාල ක්‍රමවේදයක් ඇසුරින් සංගීතඥ ඩබ්ලිව්.බී.මකුලොළුව මහතා 1962 වසරෙහි ප්‍රකාශයට පත් කළ ''හෙළ ගී මග'' නම් සාහිත්‍ය කෘතියෙහි නර්තනමය බෙර පද හා කවි ගායනා ප්‍රස්තාර කර ඇත. නමුත් මෙම ප්‍රස්තාර ක්‍රමවේදය චලන හා සම්බන්ධ ක්‍රමවේදයක් නොවීය.

ඊට අමතරව සාහිත්‍ය කෘතීන්හි රූප සටහන් සහ ඡායාරූප ආශ්‍රයෙන් නර්තන අංගහාර හා චලන පිළිබඳව අවධානය යොමු වූ අවස්ථා ද පැවතුනි. නර්තනවේදී ජේ.ඊ.සේදරමන් මහතා විසින් ''නෘත්‍ය රත්නාකරය'' හා ''උඩරට නැටුම් කලාව'' යන සාහිත්‍ය ග්‍රන්ථයන්හි ද නර්තනවේදී පී.ආර්.ගොඩගන්දෙණිය මහතා ''නාට්‍ය ගුරුවරයා'' නම් සාහිත්‍ය ග්‍රන්ථයෙහි ද නර්තනමය මුද්‍රා, අංගහාර හා හැඩතලයන් පිළිබඳව ශාස්ත්‍රීය කරුණු බොහෝමයක් සඳහන් කර ඇත. එමෙන්ම නර්තන කථිකාචාර්ය ජේ.ඊ.ගුණසේන මහතා ''නෘත්තෝපදේශය හෙවත් නැටුම් ඉගැන්වීම'' නම් සාහිත්‍ය ග්‍රන්ථයෙහි ද වසන්ත කුමාරයන් විසින් රචිත ''පාරම්පරික උඩරට නර්තන සම්ප්‍රදාය'' නම් සාහිත්‍ය ග්‍රන්ථයෙහි ද උඩරට නර්තනයේ අන්තර්ගත මූලික චලන හා අංගහාර පිළිබඳව සටහන් කර ඇත. ඒ අකාරයට පහතරට නර්තන සම්ප්‍රදායේ මූලික අංගහාර හා චලනයන් සම්බන්ධයෙන් එච්. එස්. සචිරිස් සිල්වා ශිල්පියාණන් ''පහතරට නැටුම්'' නම් කෘතියේ සඳහන් කර ඇත. මෙම සියළුම සාහිත්‍ය ග්‍රන්ථයන්හි විශේෂයෙන් අවධානය යොමුව පැවතුනේ සාම්ප්‍රදායිකව පැවත එන හැඩතලයන්ගේ ඇති විද්‍යාත්මක හා ජාමිතිකබව මෙන්ම ශාස්ත්‍රීය පසුබිම පිළිබඳව ය. එනමුත් ඒවාහි චලන සටහන් කිරීමක් හෝ නර්තන විධි ලියා දක්වන ලේඛන ක්‍රමවේදයක් පිළිබඳව සඳහන් නොවේ.

මහාචාර්ය ලයනල් බෙන්තරගේ මහතා(1999) සංස්කෘතික දෙපාර්තුමේන්තුව මඟින් ප්‍රකාශිත ''සංඛ'' සඟරාවට ඉදිරිපත් කරන ලද ''අඩසියවසක ප්‍රායෝගික නර්තන කලාවේ අඩි වට්ටම් පිළිබඳ ව්‍යවහාරය'' නම් ලිපියේ දේශීය චලන රචනය පිළිබඳව අවධානයක් යොමු කර ඇත. එහි දී පහතරට මූලික පා චලනයන් හඳුන්වා ඊට රූපාක්ෂර පද්ධතියක් නිර්මාණය කර ඇත. ඉන් පසුව මහාචාර්ය ජයසේන කෝට්ටේගොඩ මහතා (2011) ''පහතරට රංග කලාවේ ලේඛන රීතිය'' නමින් චලන රචනය හා සම්බන්ධ සාහිත්‍ය ග්‍රන්ථයක් රචනාකර ඇත. එහි දී පහතරට නර්තන චලනයන් වර්ගීකරණය කර ඊට රූපාක්ෂර පද්ධතියක් හා ලේඛන කලාවක් හඳුන්වා ඇත. මෙම පර්යේෂණ ක්ෂේත්‍රය හා සම්බන්ධව විධිමත් ලේඛන කලාවක් පහතරට නර්තනය හා සම්බන්ධව ගොඩ නැගී ඇති බව එම සාහිත්‍ය මූලාශ්‍ර දිත්වය සාක්ෂි දරණ අතර උඩරට හා සබරගමු යන නර්තන සම්ප්‍රදායන් දිත්වයෙහි චලන රචනය හා සම්බන්ධව පූර්ණ වශයෙන් අවධානය යොමු වී නැත. පහතරට නර්තන චලනයන් වර්ගීකරණය කර ඊට රූපාක්ෂර පද්ධතියක් හා ලේඛන කලාවක් හඳුන්වා ඇති නමුත් එය ප්‍රායෝගිකව භාවිතය සඳහා

සැලකිලිමත් නොවී. දේශීය නර්තන ශිල්පීන් මෙම ක්‍රමවේදයේ ඇති වැදගත්කම පිළිබඳව ඇති අනවබෝධය මෙවැනි විධිමත් ලේඛන කලාව භාවිතා නොවන්නට හේතු වන්නට ඇත. ඒ හේතුවෙන් නර්තනාංගවල ආවේණිකව පැවතුන විවිධ ශාස්ත්‍රීය ලක්‍ෂණ හා බොහෝ නර්තනාංග මේ වන විට වියැකෙමින් යන අතර යම් නර්තනාංග සදොස් ලෙස ප්‍රතිනිර්මාණය වෙමින් ද පවතී. එබැවින් මෙහි දී ශ්‍රී ලාංකීය නර්තන චලන සංකේතකරණය හා ලේඛනගත කිරීමේ වැදගත්කම පිළිබඳ විශ්ලේෂණාත්මක විවරණයක් සිදු කෙරේ.

නර්තන කලාවේ ඉතිහාසය මානව වංශයේ ආරම්භය තෙක් විහිදී යයි. ආගමික විශ්වාස හා සමාජ අවශ්‍යතා මත ගොඩනැගුණු නර්තන කලාව ලෝකයේ භූගෝලීය පිහිටීම් හේතුකර විවිධත්වයෙන් යුතුව ප්‍රභවය ලබා ඇත. නර්තන කලාවට ඉතා ඈත ඉතිහාසයක් පවතින බව හා ඒ ඒ නර්තන කලාවන් පැවති ස්භාවය පිළිබඳව ඓතිහාසික මූලාශ්‍ර සාධකයන්ට අනුව දළ අවබෝධයක් ලබාගත හැකිය. එසේ ම චලන රචනය සම්බන්ධව ද ඓතිහාසික මූලාශ්‍ර ඇසුරුකරගත හැකි අතර පුරාවිද්‍යාත්මක සාධක ඉන් විශේෂ වේ.


ආදි මානවයාගේ සිට සිය අත්දැකීම් හා අවට පරිසරයේ දෘෂ්‍ය ගෝචර වූ ක්‍රියාවලියන් සටහන් කිරීමේ ක්‍රමවේදයක් පැවතුණි. ඒමෙන් ම නර්තනය හා සම්බන්ධ වූ චලන ද එසේ සටහන් කළ අවස්ථා ද හඳුනාගත හැකි ය. ආදි මානවයාගේ අභිචාරාත්මක නර්තන අවස්ථාවක් ක්‍රි.පූ.10000 ට පමණ අයත් ශෛල උත්කීරණයක් සිසිලයේ අද්දෞරා ගුහාවෙන් හමු වී ඇත. එය නර්තනයේ යෙදෙන සමූහයකින් යුක්ත මානව රූපාවලියක් වන අතර ඔවුහු කිසියම් චලනයකින් සමන්විත වේ.



නර්තනමය නොවූවත් මෙවැනි චලන සටහන් කළ අවස්ථා ලංකාවෙන් ද හමුවී ඇති අතර ඒවා දඩයම්, සතුන්, මානව රූප හා විවිධ සංකේත පිළිබඳ රූප සටහන් වේ. ඒවා විටක භාෂාවක් ද විය හැකිය. මෙයින් පැහැදිලි වන්නේ මානවයාට සිය දෘශ්‍ය ගෝචර දෑ සටහන් කිරීමේ අවශ්‍යතාවක් පැවති බවයි. එමෙන් ම ඒවා අධ්‍යනය කිරීමෙන් යටගියා වූ සමාජ සංස්කෘතීන් ද නිරූපණය වෙති. ඒ අනුව නර්තනය සටහන් කර තැබීම හෙවත් ලේඛනය යනු මානව සංස්කෘතියේ පැවැත්ම පූර්ණය කරන්නක් වැනිය.

අතීතයේ ශිෂ්ටාචාරයන් සමග කලාවන් ද වර්ධනය වූහ. ප්‍රාග් ඓතිහාසික යුගයන්ගේ සිට නර්තනය හා සම්බන්ධ චිත්‍ර, මූර්ති, කැටයම්, රූකම්, ප්‍රතිමා යනාදී මූලාශ්‍ර හමුවී ඇති අතර එම මූලාශ්‍රයන්ගෙන් නර්තන අවස්ථා, අංගහාර, චලන ස්භාවයන්, රංග වස්ත්‍රාභරණ හා වාදන භාණ්ඩ යනාදියෙහි පසුබිම

පිළිබඳව හඳුනාගත හැකි ය. දේශීය සාහිත්‍ය මූලාශ්‍ර ඇසුරින් නර්තන කලාවේ පසුබිම පිළිබඳව හඳුනාගත හැකි නමුත් චලන පිළිබඳ ව අවබෝධයක් ලබා ගත හැකි වන්නේ විශේෂයෙන් පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර ඇසුරින් ය. උදාහරණයක් ලෙස අනුරාධපුර යුගයට අයත් යැයි සැලකෙන කුට්ටම් පොකුණෙන් හමු වූ නළඟනකගේ රුව වේගයෙන් භ්‍රමණ අවස්ථාවක් බවට උපකල්පනය කෙරේ.



තව ද ඇම්බැක්කයේ දේවාලයේ කනුවල සිව්රැස් පනේලයක ඇති නළඟනකගේ රුවෙහි ද චලනමය ස්භාවයන් ඇත.







එවැනි සාධක විශාල ප්‍රමාණයක් දේශීය ඉතිහාසයේ පවතින අතර ඒවා චලනමය අවස්ථාවන් ලෙස උපකල්පනය කරනුයේ හස්තපාදාංග හා රංගවස්ත්‍රාභරණවල ස්භාවය අනුවය. මෙසේ හමු වී ඇති බොහෝමයක් සාධක මගින් දෘශ්‍ය ගෝචර වූ චලන අවස්ථා චිත්‍රණය කිරීම පමණක් වී ඇති අතර එහි ලේඛන ක්‍රමවේදයක් හෝ රූපාක්ෂර කලාවක් නොවීය.


මේ ආකාරයට ලෝකයේ ද නර්තනය හා සම්බන්ධ ඓතිහාසික සාධකයන් විශාල වශයෙන් ව්‍යාප්තව පැවතුන ද නර්තන චලන රචනය කෙරෙහි අවධානය යොමු වී ඇති බවට සාධක හමුවන්නේ 15 වන සියවසේ දී පමණ ය. එහි ආරම්භක අවධියේ පැවත ඇත්තේ විස්තරාත්මක ආකෘතියකිනි. මුල්ම සටහන් කළ අත්පිටපත ලෙස සැලකෙන්නේ 15 වන ශතවර්ෂයට පමණ අයත් '' බැසට් ඩන්සන් '' වාර්තා කිරීමයි. මෙය ඉංග්‍රීසි අක්ෂර කීපයක් ආශ්‍රයෙන් සකස්කරගත් සරල ක්‍රමයක් වූහ. එම සියවසේ සිට 20 වන සියවසය දක්වා අපරදිග රටවල ශිල්පීන් චලන රචනය සඳහා විවිධ අත්හදාබැලීම් සිදුකරන්නට විය. එම පර්යේෂණයන් අතරින් සුවිශේෂ වූ පර්යේෂණ කීපයක් පවතී.

- ස්ටෙපනොව්
- මාග්රට් මොරිස්
- රුඩෝල්ෆ් ලාබන්


එයින් ''මාග්රට් මොරිස් හා රුඩෝල්ෆ් ලාබන්" නර්තනය හා සම්බන්ධ සුවිශේෂී පර්යේෂකයන් දෙදෙනෙකි. මාග්රට් මොරිස් විසින් 1928 '' The Notation of Movement " නමින් නර්තන රචනාමය ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදි. ඇය, දිශාව හා ශරීරයේ සෑම කොටසක් සඳහා ම සංඥා සකස් කෙරීය.




හංගේරියානු ජාතික රුඩෝල්ෆ් ලාබන් (1879 - 1958) යනු නර්තන චලන රචනය උදෙසා විශ්ලේෂණාත්මක ක්‍රමවේදයක් හඳුන්වා දුන් පර්යේෂකයෙකි.





චලන අංකනය (Dance Notation) සඳහා 1928 දී ''Schrifttanz'' නමින් ඔහුගේ පළමුවන පදනම් ක්‍රමවේදය හඳුන්වා දුන්හ.





Schrifttanz

ලාබන් යනු චලනයේ වාස්තුවිද්‍යාත්මක පැතිකඩයන් පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළ ශිල්පියෙකි. ඔහු සකස් කළ චලන රචනාමය පද්ධතියේ නිරූපණය වී ඇත්තේ අවකාශීය දෘෂ්ටි කෝණයකි. ලාබන් විසින් චලන පිළිබඳ ව පැහැදිලි අවබෝධයකින් යුතුව වර්ගීකරණය කර ඊට සංඥා හෙවත් රූපාක්ෂර පද්ධතියක් සකස් කෙරීය. ඉන් පසුව නර්තනමය චලිතයන් සංඥා ආශ්‍රයෙන් සටහන් කිරීම සඳහා ලේඛන ශෛලියක් හඳුන්වා දෙන්නට වූහ. එම විශ්ලේෂණාත්මක ක්‍රමවේදය ඇසුරින් වින්‍යාස කරන ලද නර්තනාංග ලේඛනාරූඪ කිරීමේ අවකාශය ඇති වූහ. මොහු විසින් සිදු කරන ලද මෙම පර්යේෂණාත්මක ලේඛන කලාව පසුකාලීනව නර්තන ශිල්පීන් විසින් අඛන්ඩව පවත්වාගෙන යන ලදි. ඒම ලේඛන කලාව රුඩෝල්*a ලාබන්ගේ නම ඇසුරින් ''Labanotation'' හා ''Kintographie Laban'' යන නාමයන්ගෙන් හඳුන්වන්නට විය.

චලන හා රූපාක්ෂර (සංඛේත)





ලේඛන ශෛලියක්,



මෙම චලන රචනාමය ක්‍රමවේදය ජර්මනිය, ඇමරිකාව, කැනඩාව, ඊශ්‍රායලය, රුසියාව, ප්‍රංශය, ඉතාලිය, කොරියාව, චීනය හා ඉන්දියාව යනා දී පෙර අපරදිග රටවල් පුරා ව්‍යාප්තවන්නට වූහ. එමෙන්ම එම ඒ ඒ රටවල නර්තන සම්ප්‍රදායන්ට ආවේනික වූ රංග ආකෘතීන්ට අනුව ප්‍රතිනිර්මාණය වූහ. විටෙක එය විශ්ව භාෂාවක් ලෙස වුවත් පරිහරණය කිරීමේ ප්‍රවණතාවයක් ඇති වීමේ අවකාශය ද පවතී. පසුකාලීනව අපරදිග රටවල නිර්මාණය වූ බොහෝ දැවැන්ත කලා නිර්මාණයෝ මෙම ලේඛන කලාව භාවිතා කරන්නට වූහ. අධ්‍යතනය වන විට ලෝකයේ චලන රචනය, නර්තනයේ හා රංගවින්‍යාසයේ මුඛ්‍ය අංගයක් වී ඇති අතර ඒ හා සම්බන්ධ විද්‍යාත්මක හා තාක්‍ෂණික පර්යේෂණ මානයන් කරා ද යොමු වෙමින් පවතී.

කෙසේ නමුදු දේශීය නර්තන කලාවේ චලන රචනය සඳහා මෙවන් රූපාක්‍ෂර පද්ධතියක් හා විශ්ලේෂණාත්මක ලේඛන ක්‍රමවේදයක් භාවිත නොවේ. නමුත් ආයතනගත වූ අධ්‍යාපන ක්‍ෂේත්‍රයන් හි විස්තරාත්මක වූ ලේඛන ක්‍රමවේදයක් භාවිතයේ පවතී.




- පහතරට නර්තන චලන සටහනක් (2018) -

මෙහි දී භාවිතා කර ඇත්තේ විස්තරාත්මක ලේඛන කලාවයි. ඒ සඳහා විවිධ සංඥා හා සංකේත භාවිත කර ඇත. එහි දී චලන හැඳින්වීම සඳහා භාවිතකර ඇති ක්‍රමවේදය දළව මෙසේ වර්ග කළ හැකිය.

එනම්,

- නර්තනයේ යෙදෙන රූපයට සමාන වූ සංඛේතයන්
- සරඹ නාමයන්ගෙන්
- නර්තනයේ පවතින පාරිභාෂිත වචන
- නර්තනයේ යෙදෙන රූපයට සමාන වූ ක්‍රියාවන්

**නර්තනයේ යෙදෙන රූපයට සමාන වූ සංඛේතයන්,**



- දකුණු පැත්තට යාම
- වම් පැත්තට යාම
- රවුමට යාම
- crose කිරීම
- උකුල දමා යාම (පහතරට නර්තන සම්ප්‍රදායේ)

**සරඹ නාමයන්ගෙන් හැඳින්වීම,**

- පළමු ගොඩසරඹය
- අර්ධ චක්‍රය / අර්ධ චක්‍රයේ භාගය
- පස්වන ඉලංගම් සරඹය මෙන්

**නර්තනයේ පවතින පාරිභාෂිත වචන,**

- සුරල
- මාලක්කම
- බඹරවළල්ල
- වැදුම් අත

**නර්තනයේ යෙදෙන රූපයට සමාන වූ ක්‍රියාවන්ගෙන් හැඳින්වීම,**

- ඉදිආප්ප අඩිය
- මල් කඩන අඩිය
- සූරන මාත්‍රය

වර්තමානයේ ආයතනගත වූ අධ්‍යාපනය ක්ෂේත්‍රයේ නියුතු බොහෝමයක් ආධුනිකයන් විසින් මෙම ක්‍රමවේද භාවිත කෙරේ. ඉහත සාධකයන් අනුව ඒ සඳහා භාවිත භාෂාවන්, සංඥා හා සංඛේත අවිධිමත් බව පැහැදිලි ය. නමුත් මෙම ක්‍රියාවලියෙන් දේශීය නර්තන කලාවට ද චලන රචනය කිරීමේ විශ්ලේෂණාත්මක ක්‍රමවේදයක් සකස් කිරීම වැදගත් බව ප්‍රත්‍යක්ෂ ය.

ලෝකයේ නර්තනය උදෙසා විශ්ව භාෂාවන් සකස්වන යුගයක ලාංකීය නර්තනය මේ ආකාරයට ප්‍රාථමික තත්වයක පසුවීම ඉතා ඛේදනීය ය. නමුත් තාක්ෂණික දියුණුවත් සමඟ අපට හුදකලා විය නොහැකිය. ලොව මහා සම්ප්‍රදායන් සමඟ උරෙනුර ගැටිය හැකි තරම් සම්භාව්‍ය ලක්ෂණයන්ගෙන් අප

දේශීය නර්තන සම්ප්‍රදායන් පරිපූර්ණව පවතින බව නොරහසකි. ඉතා මෑත ඉතිහාසයක් පවතින ලොව නර්තන සම්ප්‍රදායෝ අපව අභිබවමින් යන්නේ දේශීය කලාවන්ගේ ඇති අඩුලුහුඩුකම් හේතුවෙන් නොවන අතර අධ්‍යතන ලාංකිකයන්ගේ ඇති මානව හා සමාජමය චින්තන ස්භාවය නිසාවෙන් ය.


නර්තනයක චලනයන් පිළිබඳව සටහන් කිරීම සරල ක්‍රියාවලියක් නොවන්නේ ය. ප්‍රායෝගික ක්‍රියාවලිය සිද්ධාන්තයක් ලෙස ගොඩනැගීමේ දී එම විෂය ක්ෂේත්‍රය සම්බන්ධව පූර්ණ අවබෝධයක් තිබිය යුතුය. කිසියම් වූ අර්ථයක් සම්ප්‍රේෂණය කරනු ලබන සංඥාවක් භාෂාවක් ලෙස සැලකේ. චලන රචනය උදෙසා නිර්මාණය කරනුයේ නර්තනමය භාෂාවකි. බොහෝවිට භාවිතවනුයේ රූපාක්ෂර කලාවකි. එසේනම් නර්තන කලාව ආශ්‍රිතව රූපාක්ෂර පද්ධතියක් භාවිතා කිරීමේ දී මනා අවබෝධයකින් භාවිතා කළ යුතුය. දේශීය නර්තනයට එවන් පද්ධතියක් සැකසීමේ දී අවධානය යොමුකළ යුතු පැතිකඩයන් කිහිපයක් පවතී.

- සාම්ප්‍රදායික හැඩතලවල ඇති ශාස්ත්‍රීය ලක්ෂණ පිළිබඳ අවබෝධය.
- චලනයේ මූලික සිද්ධාන්ත පිළිබඳ අවබෝධය.
- ව්‍යුහ විද්‍යාව හා ජ්‍යාමිතික හැඩතල පිළිබඳ අවබෝධය.

දේශීය නර්තන සම්ප්‍රදායන් ත්‍රිත්වයේ චලන ආකෘති එකිනෙකට වෙනස් වන අතර ඒවාට ආවේනික වූ සුවිශේෂ ශිල්පෝපක්‍රමයන් ද පවතී. තව ද ඒ ඒ සම්ප්‍රදායන්ට අයත් රංග ශෛලීන් හා ගුරු පරපුරවල් අනුව ද චලනමය වෙනස්කම් අන්තර්ගත වේ. එම නිසා දේශීය නර්තන චලන ඉතා පුළුල් අවකාශයක් පුරා ව්‍යාප්තව පවතී. එම විවිධත්වය දේශීය කලාවේ ඇති විචිත්‍රත්වයකි. ඒ හේතුවෙන් චලන රචනයේ දී මෙම සුවිශේෂතා පිළිබඳව ද සැලකිලිමත්වීම ඉතා වැදගත් වේ.

අභිවාහකයා චලනයේ දී පසුබිම් කරගනු ලබන සාධකයන් අතරින් කීපයක් පවතී. ඉන් අවකාශය, කාලය හා ශක්තිය ප්‍රධාන වන අතර චලන රචනයේ දී ද ඒ පිළිබඳව සැලකිලිමත්විය යුතුය. චලනයේ දී අවකාශය ප්‍රධාන වශයෙන් ආකාර දෙකකට භාවිත කෙරේ. ඒ තල සහ දිශා ලෙස ය. ලෝකයේ කුමන වර්ගයේ නර්තන ආකෘතියක් වුව ද අභිවාහකයා නර්තනමය චලන හසුරවනුයේ මෙම සිද්ධාන්තයන් පදනම් කරමින් ය. ඒ හේතුවෙන් චලන සටහන් කිරීමේ දී මේ ආකාරයෙන් ඇති සියළුම චලන සිද්ධාන්ත පිළිබඳව අවධානය යොමුකළ යුතුවේ.

නර්තනයේ දී අවකාශය තුල හසුරවනුයේ මානව ශරීරය යි. චලන සටහන් කිරීමේ දී එම මානව ශරීරය හා ව්‍යුහ විද්‍යාව (Anatomy) පිළිබඳව ද අවබෝධය ඉතා වැදගත් ය. එමඟින් ශරීරයේ ජ්‍යාමිතික හැඩතල, ශිල්පීය නිපුණතා යනාදිය පිළිබඳව අවබෝධයක් ඇතිවනවා සේම එය චලන රචනය උදෙසා ද උපයෝගී කිරීම ඉතා වැදගත් වේ. එමෙන් ම ඊට අනුගත චලනයෙන් ප්‍රතිභාපූර්ණ නර්තනයක් ඉදිරිපත්කළ හැකිය.




දේශීය නර්තන චලන රචනය උදෙසා මෙම විෂය ක්ෂේත්‍රයන් පිළිබඳ පූර්ණ අවබෝධයක් තිබිය යුතුය. ඊට අනුගතව චලන රචනය කිරීමෙන් විශ්ලේෂණාත්මක හා ප්‍රමිතිගත වූ ලේඛන ක්‍රමවේදයක් භාවිතා කළ හැකිය. අධ්‍යතනයේ භාවිතා කරනු ලබන විස්තරාත්මක ලේඛන ක්‍රමවේදයේ මෙම සාධක පදනම් වී නැති අතර විධිමත් ලෙස ප්‍රතිනිර්මාණය කිරීමේ හා භාවිතා කිරීමේ දැඩි අවශ්‍යතාවයක් පවතී. එසේ සකස් කිරීමෙන් පහත සඳහන් ආකාරයේ ක්ෂේත්‍ර ගණනාවකට වැදගත් වේ.

- නර්තනයේ සංරක්ෂණය සඳහා
- අධ්‍යාපන ක්‍රමවේදයක් ලෙස
- රංගවින්‍යාසය සඳහා
- පර්යේෂණයන් සඳහා

දේශීය නර්තන කලාවේ බොහොමයක් ශාස්ත්‍රීය අංග වියැකෙමින් යන මෙම අවධියේ ඒ සඳහා චලන රචනය සංරක්ෂණ ක්‍රමවේදයක් ලෙස හඳුන්වාදිය හැකිය. එහිදී සාම්ප්‍රදායික නර්තන අංගවල කවි හා බෙර පද පමණක් නොව නර්තනයේ යෙදෙන ආකාරය ද චලන ඇසුරින් ලේඛනගත කළ හැකිය. මෙම ක්‍රමවේදයේ ඇති සුවිශේෂීත්වය වන්නේ නර්තනයේ දී සිදු කරනු ලබන චලනවල ඇති සෑම සියුම් අවස්ථාවක්ම ස්පර්ෂ කිරීමයි. එබැවින් මෙය විශ්ලේෂණාත්මක ලේඛන ක්‍රමවේදයක් ලෙස හැදින්වීම සර්වසාධාරණ වේ. උඩරට, පහතරට හා සබරගමු යන ප්‍රධාන නර්තන සම්ප්‍රදායන් ත්‍රිත්වයට ම ආවේනික වූ ශිල්පීය උපක්‍රම පවතී. ඒවාහි යම් අවස්ථා සටහන් කළ හැකි අතර යම් අවස්ථා සටහන් කිරීමට නොහැකි වන්නට පුළුවන. ඒ කෙසේ නමුත් චලන රචනාමය සටහන් බලා අවබෝධ කළහැකි අයුරින් මෙම ක්‍රමවේදය උපරිමයෙන් නර්තන සංරක්ෂණයට දායක කරගත හැකිය. එමඟින් සාම්ප්‍රදායික නර්තන අංග පරපුරෙන් පරපුරට නිවැරදිව දායාද කිරීමේ ඉඩ ප්‍රස්තාව ලැබේ. සාම්ප්‍රදායික නර්තන අංග පමණක්  නොව සාම්භාව්‍ය කලා නිර්මාණයන්ට ද මෙහි ප්‍රයෝජන අත්පත්කර ගැනීමේ හැකියාව ඇත. ඒ ඒ කලා නිර්මාණ සඳහා භාවිත කරන ලද චලන ආකෘති විකෘති නොවී කාලාන්තරයක් පුරා නව පරම්පරාවන්ට හැදෑරිය හැකිවන අතර ඒවා අධ්‍යනය කර ස්වාධිනව සිය දක්ෂතා ඔප්නංවා ගැනීමේ අවකාශය සැලසේ.

සාම්ප්‍රදායික නර්තන අංග සහ නර්තන නිර්මාණ පටිගත කිරීම ද සංරක්ෂණ ක්‍රමවේදයකි. එහි දී චලන කැමරා කෝණයන්ට හසුවන දර්ශනයන්ට පමණක් සීමා වේ. එමෙන් ම එම නර්තන ඉදිරිපත් කරනු ලබන අභිවාහකයාට ආවේණික වූ ලක්ෂණ පටිගත වන අතර පසුකාලීනව එය අනුකරණාත්මක ලෙස උපයෝගී කරනු ඇත. එක් එක් ශිල්පියාට ආවේණික වූ සුවිශේෂතා නිර්මාණය වන්නේ ඔවුනොවුන් ඒවා ස්වාධීන කලාවක් බවට පත්කර ගැනීමෙන් පසුවය. එසේනම් චලන රචනය වූකලී නර්තන ශිල්පීන්ගේ ස්වාධීන දක්ෂතාවයන් ප්‍රතිනිර්මාණය කිරීමට ද උපයෝගී කරගත හැකිය. ඒ අනුව යම් නිර්මාණයක් සංරක්ෂණය කිරීමේ දී එහි සංගීත බන්ධයේ පටිගත කිරීමත් සමඟ චලනයන් රචනා කර දැක්වීම ද සිදු කළ හැකිය.




චලන ප්‍රලේඛනය කිරීම දේශීය අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වාදීම නර්තන කලාව විධිමත් ලෙස විකාශනය සඳහා කාලෝචිත වන්නේ ය. දේශීය නර්තන කලාව උගැන්වීමට සුදුසුම ක්‍රමවේදය වූයේ පාරම්පරිකව ශිල්පශාස්ත්‍ර ප්‍රගුණ කළ ආකාරය යි. නමුත් කාර්මික විප්ලවයත් සමඟ ලාංකිකයා ද සමාජ හා සංස්කෘතික විපර්යාසයන්ට මුහුණ දෙන්නට වූහ. දශක කීපයක සිට පාරම්පරිකව පැවති නර්තන කලාව ආයතනගත වීමත් සමඟ එහි අධ්‍යාපන රටාව ද වෙනස් වී ඇත. අතීතයේ වැඩි කාලයක් නර්තනය හදාරනු ලැබූවත් මේ වන විට ඒ සඳහා යොදවනුයේ ඉතා කෙටිකාලයකි. මෙම සමාජීය පසුබිම මත නර්තනය ලේඛනගත කිරීම සාර්ථක ක්‍රමවේදයකි. නර්තනයන් උගැන්වීමේ, මතකතබා ගැනීමේ හා දීර්ඝ කාලීන පැවැත්මෙහි ඇති පහසුව ගුරුවරයාට සහ ශිෂ්‍යයන් යන දෙවර්ගයටම පොදුවේ වැදගත් ය. චලනයක ඇති ජාමිතික වූ හැඩතලයන් පිළිබඳ නිවැරදි අවබෝධයක් මේ හරහා ව්‍යාප්ත වේ. අධ්‍යාපනය ලබා කිසිදු විකෘති ස්භාවයකින් තොරව එය ඒ ආකාරයෙන් දීර්ඝ කාලයක් පවත්වාගෙන යා හැකිය. මේ වන විට පවතින අවිධිමත් ලේඛන විධීන් භාවිතයෙන් ඉවත් කිරීමට ද මෙය භාවිත කළ හැකිය.


චලන රචනය සඳහා අපරදිග ශිල්පීන්ගේ අවධානය යොමු වූයේ රංගවින්‍යාසය නම් විෂය ක්ෂේත්‍රයත් සමඟ ය. විශේෂයෙන් නර්තන පිටපතක් සකස් කිරීම මෙම ක්ෂේත්‍රය සඳහා අත්‍යවශ්‍ය සාධකයක් ව පවතී. එහිදී චලන ලේඛනයේ ප්‍රයෝජ්‍යතා කීපයක් ඇත.

- රංගවින්‍යාස ශිල්පියාට
- අභිවාහක/ අභිවාහිකාවට

- ආලෝකකරණ ශිල්පියාට
- කැමරා ශිල්පියාට
- වේදිකා පරිපාලකට
- පසුතල නිර්මාණ ශිල්පියාට

යනා දී පුද්ගල ක්‍රියාදාමයන්ට විශේෂයෙන් චලන රචනය වැදගත් වේ. ඒ අතරින් මෙහි අග්‍ර ඵලය ඇත්තේ රංගවින්‍යාස ශිල්පියාට ය. තමා විසින් සිදුකරනු ලබන නිර්මාණය සෙසු ශිල්පීනට සන්නිවේදනය කළ හැකි ප්‍රධානතම මාධ්‍ය ලෙස නර්තන පිටපත සැලකිය හැකිය. සංගීතය හා නාට්‍යයේ දී පිටපත් සැකසෙන්නේ ඒවාට ආවේනික ස්භාවයකිනි. නර්තනයේ දී සකස්විය යුත්තේ නර්තනයට අවශ්‍ය කවි, බෙර පද හා සංගීතය ආශ්‍රයෙන් පමණක් නොවන අතර එහි ප්‍රධාන මාධ්‍යවන චලනය ඇසුරින් විය යුතුය. රංගවින්‍යාස ශිල්පියා නර්තන පිටපත තම නිර්මාණයට දායක කරගනු ලබන අභිවාහක/ අභිවාහිකාවට, ආලෝකකරණ ශිල්පියාට, කැමරා ශිල්පියාට, වේදිකා පරිපාලකට හා පසුතල නිර්මාණ ශිල්පියාට ලබා දීමෙන් ඔවුනට සිය නිර්මාණය පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබා දිය හැකිය. එමගින් සිය නිර්මාණයන්ට අනුෂාංගික කලාවන්ගෙන් උපරිම දායකත්වය ලබා ගත හැකිවේ.

අඛණ්ඩ ඉතිහාසයක් ඇති දේශීය නර්තන කලාව එක් එක් යුගයන්හි පැවති ලේඛන ක්‍රමවේදයන්ගෙන් පෝෂණය වූහ. අධ්‍යතනයේ පවතින්නේ ඩිජිටල්කරණය වැනි තාක්ෂණික ක්‍රම ශිල්ප භාවිතා වන යුගයක් වන අතර චලන රචනය ද ඒ සඳහා පිවිසුමක් වන්නේ ය. අනාගත පරම්පරාවේ වැඩි ප්‍රවනතාවයක් පවතින්නේ තාක්ෂණය පරිශීලනයෙන් අධ්‍යාපනය හැදෑරීමට ය. වර්තමානයේ දී නර්තනමය චලන  එම තාක්ෂණය ද අතික්‍රමණය කරමින් සිටී. අපරදිග බොහෝමයක් රංග ආකෘති සඳහා  පරිගණක මෘදුකාංග පවා නිර්මාණයව පවතී.




මෙවැනි තාක්ෂණයන් භාවිතා කිරීම සඳහා නව පර්යේෂකයන් යොමුවන්නට වූයේ චලනය විශ්ලේෂණාත්මකව ලේඛනගත වූ නිසාවෙනි. අප වත්මන් පරම්පරාව දේශීය නර්තන කලාවට වඩා විදේශීය කලාවන්ට නැඹුරුවීමේ ප්‍රවණතාවයක් ඇත්තේ ද මෙම ආකර්ෂණීය ස්භාවය නිසා වන්නට ඇත. ලොව බලවත් රටවල් සිය කලාවන්ගෙන් ද සෙසු රටවල් අතික්‍රමණය කිරීමට නව තාක්ෂණික ශිල්පයන් ඉතා දක්ෂ ලෙස භාවිත කෙරේ. මේ අනුව අප සතුව ඇති නර්තනමය ශිල්ප ශාස්ත්‍රයන්ගෙන් අනාගත මානව වංශයට අවතීරණයවන්නට චලන ලේඛනය ද වැදගත් සාධකයක් බව අවබෝධකරගත


යුතු ය. ඒ කෙසේ නමුත් දේශීය නර්තන කලාවේ ද එවන් ක්‍රමවේදයක් සැකසීම සඳහා අවශ්‍ය පසුබිමක් සැකසෙමින් පවතී.

උදා -

පළමු ඉලංගම් සරඹය



එක් තාලය



- පහතරට රංග කලාවේ ලේඛන රීතිය - ජයසේන කෝට්ටේගොඩ

මෙහි අන්තර්ගත වන්නේ පහතරට නර්තන සම්ප්‍රදායේ චලනයක් අංකනය කළ යුතු සාධකයන් පදනම්ව නිර්මාණයව පවතින චලන රචනාමය ක්‍රමවේදයකි. උඩරට සම්ප්‍රදායේ සහ සබරගමු සම්ප්‍රදායන්හි මෙවන් ක්‍රමවේදයක් නිර්මාණය වී නොමැති අතර එවන් ක්‍රමවේදයක් මේ ආකාරයට සකස් කළ හැක බව පැහැදිලිය. එමෙන් ම පහතරට නර්තන සම්ප්‍රදාය උදෙසා ඉහත චලන රචනාමය ක්‍රමවේදයක් පැවතියමුත් ප්‍රායෝගිකව භාවිතා කිරීමේ ප්‍රවනතාවක් දක්නට නොමැත. ඒ හේතුකොටගෙන මෙම අධ්‍යනයේ දී දේශීය නර්තන චලන රචනා කිරීමේ ක්‍රමවේදයක් ප්‍රතිනිර්මාණය කිරීම උදෙසා පර්යේෂකයන්ගේ අවධානය යොමු වීමෙහි වැදගත්කම පිළිබඳව පමණක් නොව එම පද්ධතීන් දේශීය නර්තනයේ දී ප්‍රායෝගිකව භාවිතා කිරීම කෙරෙහි ද අවධානය යොමු කළ යුතු බවට යෝජනා කරමි.

මෙම සමස්ථ සාධකයන් විශ්ලේෂණාත්මකව බැලීමේ දී නර්තන රචනය හෙවත් ලේඛනය යනු නර්තනයේ පමණක් නොව මානව සංස්කෘතියේ පැවැත්ම ද පූර්ණය කරනු ලබන සාධකය කි. එය අවබෝධ කරගත් මානව ශිෂ්ඨාචාරයෝ නර්තන චලනය හා සම්බන්ධ විවිධ පර්යේෂණ මානයන් අතික්‍රමණය කෙරේ. මෙම අධ්‍යනයෙන් සම්භාව්‍ය සම්ප්‍රධායකින් උපලක්ෂිත දේශීය නර්තන කලාව උදෙසා විශ්ලේෂණාත්මකව මානව චලිතයන් රචනා කිරීමේ අවශ්‍යතාවයක් පවතින බවත් එයින් දේශිය නර්තන කලාව නව විශ්ලේෂණාත්මක අවධියකට අවතීරණය වන බවත් ප්‍රත්‍යක්ෂ වේ. ඒ අනුව නර්තන චලන රචනය දේශීය නර්තන කලාවේ ප්‍රගමණයට ඉතා වැදගත් සාධකයක් බවට නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පද*** *: චලන සංකේතකරණය, චලන අංකනය, රූපාක්ෂර, රංගවින්‍යාසය, චලන ප්‍රලේඛනය*

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


01. කුමාර වසන්ත, පාරම්පරික උඩරට නර්තන සම්ප්‍රදාය, 2000, එස් ගොඩගේ සහ සහෝදරයෝ

02. කෝට්ටේගොඩ ජයසේන, පහතරට රංග කලාවේ ලේඛන රීතිය, 2011, කේ.ඒ. පබ්ලිකේෂන්

03. ගුණසේන ජේ.ඊ., නෘතෝපදේශය හෙවත් නැටුම් ඉගැන්වීම, 2008, රත්න පොත් ප්‍රකාශකයෝ

04. ගොඩගන්දෙණිය පී.ආර්, නාට්‍ය ගුරුවරයා, 1963, එම් ඩී ගුණසේන සමාගම

05. බෙන්තරගේ ලයනල්, ''සංඛ'' සඟරාව, 1999 , සංස්කෘතික දෙපාර්තුමේන්තුව

06. මකුලොළුව ඩබ්ලිව්.බී., හෙළ ගී මග, 2003,සංස්කෘතික දෙපාර්තුමේන්තුව

07. මධුරංග ප්‍රගීත්, අපරදිග කලා ඉතිහාසය, 2007, තරංග ප්‍රකාශකයෝ

08. ලංකාතිලක ධම්මිකා, උඩරට වන්නම් අඩිවහනෙහි නූතන ප්‍රවනතා,2017, එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස්

09. සචිරිස් සිල්වා එච්. එස්., පහතරට නැටුම්, 1965, එම් ඩී ගුණසේන සමාගම

10. සේදරමන් ජේ.ඊ., උඩරට නැටුම් කලාව, 2012, එම් ඩී ගුණසේන සමාගම

11. සේදරමන් ජේ.ඊ., නෘත්‍ය රත්නාකරය, 1959, එම් ඩී ගුණසේන සමාගම

12. සෝමතිලක එම්, පුරාතන ශ්‍රී ලංකාවේ චිත්‍ර, 2004, එස් ගොඩගේ සහ සහෝදරයෝ


අන්තර්ජාල මූලාශ්‍ර


01'https://www.google.com/search?hl=enLK&authuser=0&biw=1366&bih=608&tbm=isch&sa=1&ei=b2tEXLzCFNKoyAOzmalg&q=dance+notation+software+and+animation.

02' http://www.dlir.org/archive/items/browse/tag/Women+in+music+and+dance

03' https://www.pinterest.com/pin/505247651927312314/?lp=true

04' https://www.britannica.com/topic/Schrifttanz/media/1233693/71981

# ශ්‍රී ලාංකේය ශාන්තිකර්ම රංගභූමිය හා බැඳි දේශීය වාස්තු විද්‍යාත්මක ලක්ෂණ.

ඩබ්ලිව්. ජී. එච්. එම්. වෙද්දෙනිය[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලාංකේය උඩරට, පහතරට, සබරගමු යන සම්ප්‍රදායන් ත්‍රිත්වයේ අන්තර්ගත ප්‍රධාන (කොහොඹා යක් කංකාරිය, පහන් මඩුව, දෙවොල් මඩුව) ශාන්තිකර්මවල රංග භූමි සැකසීම සඳහා භාවිත දේශීය වාස්තු විද්‍යාත්මක ලක්ෂණ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවේ ප්‍රධාන අරමුණ වේ. මෙහිදී දැනට ලියවී ඇති මූලාශ්‍ර සාධක, ක්ෂෙත්‍ර ගවේෂණ, සම්මුඛ සාකච්ඡා, ප්‍රායෝගික ස්වයං අධ්‍යයන තුළින් හා ප්‍රායෝගික අත්දැකීම් පදනම් කරගෙන ලබා ගත් දත්ත ඉහත අරමුණ විශ්ලේෂණය කිරීම සඳහා උපයෝගී කොට ගෙන ඇත. වාස්තු විද්‍යාව යනු ඉන්දීය සම්භවයක් සහිතව වර්ධනය වූවක් ලෙස විද්වතුන් හා පර්යේෂකයින් කරුණු පෙන්වා දී ඇත. නමුත් එම විෂය ක්ෂෙත්‍රය ඉන්දීය සම්භවයක් සහිත ව දේශීය වශයෙන් වර්ධනය වූවක් බවට හඳුනාගත හැකි සාධක පවතී. වාස්තු විද්‍යාව තුළ අන්තර්ගත වාස්තු විද්‍යාත්මක ලක්ෂණ අතරින් භූමිය තෝරා ගැනීම, මානක්‍රම, පාද බෙදීම, දිශාගත කිරීම ආදී ලක්ෂණ දේශීය ශාන්තිකර්මයන් හි රංගභූමි නිර්මාණය සඳහා භාවිතා කරනු ලබයි. මෙම පර්යේෂණයෙන් ලද දත්ත හා තොරතුරු විශ්ලේෂණය කිරීම මගින් දේශීය ශාන්තිකර්මයන් හි රංග භූමි තුළ අන්තර්ගත වාස්තු ලක්ෂණ කෙරෙහි ඉන්දීය වාස්තු විද්‍යාත්මක මූලධර්ම බලපා ඇති බවත් එකී ලක්ෂණ රංග ශෛලිය අනුව හා පාරිසරික සාධක මත වෙනස් ව ගොඩනගා ගත් බවත් නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛපද :** දේශීය ශාන්තිකර්ම, රංග භූමි, වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ

## හැඳින්වීම

දේශීය ශාන්තිකර්ම සහ ප්‍රාදේශීය ව්‍යාප්තිය.

උඩරට, පහතරට, සබරගමු යන සම්ප්‍රදායන් ත්‍රිත්වයේ ප්‍රධාන මඩු ශාන්තිකර්ම හෙවත් (දෙවියන් උදෙසා පවත්වන) ශාන්තිකර්ම රංග භූමි සැකසීම සඳහා මූලික වශයෙන් වාස්තු විද්‍යාත්මක සිද්ධාන්ත භාවිතයට ගැනේ. ඒ සඳහා භාරතීය වාස්තු විද්‍යාත්මක ලක්ෂණ සෘජුවම බලපා නැත. එසේ වුවද මිනිසා විසින් භූමිය තුළ කරනු ලබන සියලු ඉදිකිරීම් සඳහා පාරිසරික සාධක වන කාළගුණික හා දේශගුණික තත්ත්වයන් බලපාන බවත් එකී තත්ත්ව ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වන බවත් ඔවුහු දැන සිටියහ. මිනිසා සියලු ඉදිකිරීම් ඊට ගැලපෙන පරිදි සිදුකළහ. එම ඉදිකිරීම් ස්ථිර හා තාවකාලික ගොඩනැගිලි වශයෙන් හැඳින්විය හැකිය. ශාන්තිකර්ම රංග මඩුව තාවකාලික ගොඩනැගිල්ලක් ලෙස ඉදි වූවත් රංග භූමි බොහෝවිට ස්ථිර වශයෙන් පවතිනු ඇත. ශාන්තිකර්මකරුවා දිනය සැන්දෑ, මධ්‍යම, අළුයම වශයෙන් බෙදා ගත්තේය. ඊට උචිත වනපරිදි ක්‍රමානුකූලව නිර්මාණය වනඉදිකිරීම් හා සැරසිලි ද නිත්‍ය

[1] ලලිත කලා අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ගම්පහ, ශ්‍රී ලංකාව.

වාස්තු ලෙස හැඳින්විය හැකිය. මිනිසා භූමිය, ස්වභාවික පරිසරය හා අවකාශය කළමනාකරණය කරගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් වාස්තු විද්‍යාව ප්‍රභවය වූවායැයි හඳුනාගත හැකිය.

මිනිසා සහ සොබාදහම යනු විශ්වයේ අපූරු නිර්මාණ ද්විත්වයකි. ඒ අපූර්වත්වය නම් මිනිසා නිසා සොබාදහම නිර්මාණය වූවාද නැතිනම් සොබාදහම නිසා මිනිසා නිර්මාණය වූවාද යන්නයි. කෙසේ වෙතත් මිනිසා සහ සොබාදහම අතර ඇත්තේ අන්‍යෝන්‍ය සබඳකමකි. සමස්ත විශ්වයේම පදනමට සහ පැවැත්මට  ප්‍රධාන වශයෙන් බලපාන මූලාංගයන් කිහිපයක් ඇත. එනම්,

- මධ්‍යලක්ෂය
- පිහිටීම (ඉරියව්)
- ආශ්වාස ප්‍රාශ්වාස
- ගුරුත්වබලය
- රිද්මය
- අවකාශය
- සමබරතාව
- චලනය
- කාලය

මිනිසා හා සොබාදහමේ පැවැත්මට ද මෙකී අංගයන් සෘජුව ම දායක වී ඇත. සොබාදහමේ සෑම නිමැවුමක් තුළම රිද්මයක් පවතී. ඒ නිසාම ස්වභාධර්මයේ රිද්මය මිනිසාට දැනෙන්නට විය. සොබාදහම අනුකරණය කරගනිමින් නර්තනය නිර්මාණය විය. නර්තනයේ මූලික අවධිය මෙය බව පෙන්වාදිය හැකිය. මිනිසා හා සොබාදහම වර්ධනය වන්නේ පොළව හෙවත් භූමිය හා අවකාශය හෙවත් අහස යන ප්‍රපංචයන් මතය. ප්‍රාථමික නර්තනයේ මූලික හැඩගැසීම සිදු වන්නේ පොළව ස්පර්ශ කිරීම හා ඉහළට අත් එසවීමෙන් බව නර්තන පර්යේෂකයන් පෙන්වා දෙන කරුණකි.




ප්‍රාථමික මිනිසාගේ මූලික අවශ්‍යතාව වූයේ ආහාරය හෙවත් පෝෂණයයි. පසුව ආරක්ෂාවයි. ආහාර හා ආරක්ෂාව සපයා ගැනීමට යෑමේ ප්‍රතිඵලයන් ලෙස ප්‍රාථමික අභිචාර විධීන්ගේ ප්‍රභවය ඇතිවිය. මානවයා පරිණාමයේ විවිධ අවධීන් පසු කරමින් ශිෂ්ටාචාර ගතවීමත් සමග මිනිස් අවශ්‍යතා ක්‍රමයෙන් වර්ධනය විය. අභිචාර විධීන්ද මූලික මිනිස් අවශ්‍යතාවක් ලෙස වර්ධනය වූ බව මානව විද්‍යාඥයින්ගේ මතයයි. "ප්‍රාථමික සංස්කෘතිය (Primitive Culture, 1871) නැමැති කෘතියෙන් ටයිලර් පෙන්වා දෙන්නේ සර්වාත්මවාදය යන සංකල්පයට අනුව විශ්වයේ සෑම දෙයකටම ආත්මයක්, ජීවයක්, ඇතැයි ප්‍රාථමික මිථ්‍යා කල්පනා කලබව ය".[1] "අභිචාර යනු තොවිල්, යන්ත්‍ර, මන්ත්‍ර, හදිහූනියම්, අණවින, කොඩිවින, බලියාග, සෙත් ශාන්ති ආදී වශයෙන් පැතිරී ඇති ගුප්ත විද්‍යා සීමාව ආවරණය කිරීමට යොදා ගන්නා වියත් පදයකි."[2]

[1] දිසානායක, උබේසේකර. (2010). **අභිචාර**. පිටුව 13.

[2] දිසානායක මුදියන්සේ. (2014). **නර්තන වාක් කෝෂය**. පිටුව 111.

*"රේමන්ඩ් ෆර්ත් (Raymond firth) නැමති මානව විද්‍යාඥයා මානව ප්‍රභේද (Human Types) නම් කෘතියේ පෙන්වා දෙන්නේ සියළු අභිචාර ප්‍රධාන වර්ග තුනක් යටතේ විග්‍රහ කල හැකිබව ය.*

1. *නිෂ්පාදක අභිචාර (Productive Magic)*
2. *ආරක්‍ෂක අභිචාර (Protective Magic)*
3. *විනාශකාරී අභිචාර (Destructive Magic)* වශයෙන් ය."[1]

*"අභිචාර යන ව්‍යවහාරය භාවිතා කළ හැක්කේ චූල සම්ප්‍රදාය හා සබැඳි ශාන්තිකර්ම උදෙසා පමණක් බවත් එකී අභිචාර ක්‍රම දෙස අවධානය යොමු කරන සමාජ විද්‍යාඥයෝ එහි මූලික ප්‍රභේද 2 ක් හඳුන්වා දෙති."*

1. *දුරාභිචාර (Black Magic)*
2. *ශාන්තිකර්ම (White Magic)*[2]

**"ශාන්තිකර්ම"** ශාන්තිය යනු ගතේ සිතේ සන්සුන් බවයි. කායික ව වැළඳෙන රෝගාබාධයන්ගෙන් තොරව සිටීම කායික සංසුන් බවයි. ප්‍රාර්ථනා මල්ඵල ගැනීමෙන් ඇතිවන සුවය මානසික සන්සුන් බවයි. මිනිසාට වැළඳෙන රෝග පීඩා, අමනුෂ උපාද්‍රව, උවදුරු, ග්‍රහ අපල, හදිසූනියම්, අංගම්, පිල්ලි ආදියෙන් ඇතිවන පීඩාවන්ගෙන් මිදී සහනයක් සලසා ගැනීමේ සුභ කාර්යය ශාන්තිකර්මය ලෙස අර්ථ දැක්විය හැකිය. ශාන්තිකර්ම යන වචනාර්ථයට විවිධ අර්ථකන රාශියක් දැකගත හැකිය.


*"ශාන්ති යන වචනයෙහි අර්ථය සෙත සැලසීම, දුක නැතිවීම, ඇතිවන යහපතයි. කර්ම යන වචනයෙහි අර්ථය ලෙස කාර්යය, ක්‍රියාව, කටයුත්ත, කෘත්‍ය ලෙස ගත හැකිය. ශාන්තිකර්ම යන වචනය නිර්මාණය වී ඇත්තේ ශාන්ති සහ කර්ම යන පද දෙක එකතු වීමෙන් ය."*[3]

*"ශාන්තිකර්ම" ලෙඩ, අමනුෂ්‍ය උවදුරු, ග්‍රහ අපල, යනාදි සියළුම උපද්‍රවයන් දුරුකර ගැනීම සඳහා කරනු ලැබේ. මිනිසුන්ට ඇතිවන්නා වූ අපල උපාද්‍රව හා විවිධ දෝෂ දුරුකර ගැනීම සඳහා යකුන් දෙවියන් විෂයෙහි පවත්වනු ලබන සෙත් ශාන්තිය."*[4]

දේශීය ශාන්තිකර්ම ප්‍රධාන වශයෙන් නර්තන සම්ප්‍රධායන් ත්‍රිත්වය අනුව බෙදා දැක්විය හැකිය. එනම් උඩරට, පහතරට හා සබරගමු වශයෙනි. මෙම සම්ප්‍රද ත්‍රිත්වයටම අයත් ශාන්තිකර්ම ද ප්‍රධාන වශයෙන් කොටස් 03 කි.

---

1 දිසානායක, උබේසේකර. (2010). **අභිචාර.** පිටුව 14.
2 රත්නවංශාලාකාර හිමි, කන්දේගම. (2007). **නැණසර ශාස්ත්‍රිය සංග්‍රහය.** පිටුව 42.
3 ලියනගේ, සිරි. (2000). **නිරුක්ති සහිත සිංහල ශබ්ද කෝෂය.** පිටුව 219.
4 දිසානායක, මුදියන්සේ. (2014). **නර්තන වාක් කෝෂය.** පිටුව 1207.





**රංග භූමිය.**

ශාන්තිකර්ම සඳහා භාවිතා කරන භූමිය ශාන්තිකර්ම භූමිය ලෙසත් ශාන්තිකර්ම පවත්වන ඇදුරන් රංගනයේ යෙදෙන්නේ මෙම භූමිය තුල නිසා රංග භූමිය යන්න භාවිතයට ගැනේ. රංග භූමිය, රඟමඩල, මඩුව, මණ්ඩපය ආදී වචන ද මේ සඳහා ව්‍යවහාරය කරයි. රංග භූමිය සම්බන්ධ නිර්වචන විමසා බැලීමේදී මණ්ඩප යනු "වහලක් සහිත බිත්ති නොමැති මඩුවක්"[1] ලෙස ව්‍යවහාරයේ පවතී.

> "රංග භූමිය/රංග පීඨය රංගනය ඉදිරිපත් කිරීම සඳහා තෝරාගත්/ යොදාගත් විශේෂ ස්ථානය, පීඨිකාව, රංග පීඨය යනුවෙන් හැඳින්වේ. වේදිකාව, රංග මණ්ඩලය, රංග භූමිය යන නම් වලින් හැඳින්වෙන රංග පීඨය ඒ ඒ රංග සම්ප්‍රදායන් වලට ආවේණික නාම පෙරව යොදා ගැනීමෙන් විශේෂ කොට හැඳින්වෙන අතර එළිමහන් හා ගෘහාශ්‍රිත වශයෙන් දෙකොටසකට වෙන් කෙරේ."[2]

රංග භූමිය ප්‍රධාන වශයෙන් කොටස් 03ක් ලෙස හඳුනාගත හැකිය.

[1] මාරසිංහ, වෝල්ටර්. (2014). **මඤ්ජුශ්‍රීභාෂිත වාස්තු විද්‍යා ශාස්ත්‍ර.** පිටුව 228.
[2] දිසානායක, මුදියන්සේ. (2018). **නර්තන වාක් කෝෂය.** පිටුව 1044.




අතීතයේ ශාන්තිකර්ම රංග භූමිය සඳහා භාවිතා කළ ස්ථාන ලෙස කමත, මිදුල, දේවාල භූමිය, ගමේ උස් තැනිතලා භූමිය, පන්සල් භූමිය දැක්විය හැක. මේ සඳහා පවිත්‍ර වූ ස්ථානයක් නිර්දේශව පවතී. රඟමඩල ඒ ඒ සම්ප්‍රදායන්ට (නර්තන සම්ප්‍රධායන් ත්‍රිත්වය) අනුව දිග, පළල, මඩුවේ හැඩය හා මඩුවේ සැකැස්ම ද වෙනස් වේ. යක් තොවිල් හා බලි රඟමඩල ද එසේ වෙනස් වේ. මෙහි එකිනෙකට අනන්‍ය වූ හා වෙනස් වූ වාස්තු විද්‍යාත්මක ලක්ෂණ ගණනාවක් හඳුනාගත හැකිය. නර්තන සම්ප්‍රදාය බිහි වීමට සෘජුවම පරිසරය බලපෑවා සේම ඒ සඳහා රංග භූමිය හා සැරසිලි ආදිය ප්‍රබලව බලපා ඇත. එහි වාස්තු විද්‍යාත්මක ලක්ෂණ ද නර්තනයට සෘජුවම දායක වී ඇති බව ද පෙන්වා දිය හැක. නර්තන ශිල්පියා රංග භූමියේත් දේශීය පරිසරයේත් රිද්මය මනාව හඳුනා ගත්හ. එහි ප්‍රතිඵලය වශයෙන් එම රිද්මය නර්තනයෙන් පිළිබිඹු කරන්නට ශාන්තිකර්ම ශිල්පියා සමත්ව ඇත. දේශීය රංග භූමිය වශයෙන් ශාන්තිකර්මකරුවා භාවිත කරන්නේ පිහිටි භූමියයි. එහි ගොම පිරිබඩගා සුදු වැලි අතුරා පවිත්‍රකර පුවක්, උණ හෝ වෙනත් ශක්තිමත් ශාකවල දැව කණු හා පටි වර්ග ආධාරයෙන් මඩුව සකස් කිරීම සිදු කරයි. වහලයට පොල් අතු හා පිදුරු භාවිතා කරනු ලබයි. කෙසෙල්, හබරල, ගොක් අතු ආදී ස්වභාවික ද්‍රව්‍යයන් පමණක් රඟමඩල අලංකාරයට භාවිත කරනු ලබයි.

**<u>කොහොඹා යක් කංකාරි රංග භූමිය (මහනුවර).</u>**

කොහොඹා යක් කංකාරියේ රංග භූමි වාස්තු විද්‍යාත්ම ලක්‍ෂණ පෙන්වා දීම සඳහා මහනුවර හාරිස්පත්තුවේ බලවත්ගොඩ සිරිසෝම ගුරුතුමාගේ හා ගඩලාදෙණිය කළුඋක්කුවා ගුරුතුමාගේ මුල් අත්පිටපත් 1701 - 1988 (කතුවරයාගේ පරම්පරාව) භාවිතාකර ඇත.

**<u>භූමිය තෝරා ගැනීම.</u>**

**මහයාතිකාවේ :**

"නිසි උතුරු දිග්භාගයේ මහාමෙව්නා උයන මැන බලා ඉඩ ඇතැයි කියා".......[1]

**අයිල යැදීම (මහා යාදින්න) :**

"කියා නිසි උතුරු දිග්භාගයෙහි හැට රියන් දිගපුළුල ඇති රඟමඩලක් යොදා මුළු වියන් බන්දවා පංච නාද කරමින්"................[2]

---

[1] බලවත්ගොඩ සිරිසෝම ගුරුතුමාගේ (1888). අත්පිටපත්.

[2] ගඩලාදෙණිය කළුඋක්කුවා ගුරුතුමාගේ (1968). අත්පිටපත්.

**මඩු සැරසිල්ල :**

"නරනඳු හට බිම දකුණු දිගින් හැ  ර
බමුණු කුලට බිම උතුරු දිගින් හැ  ර
වෙළඳ කුලට බිම වරුණ දිගින් හැ  ර
ගොයි වන්සෙට බිම පැදුම දිගින් හැ  ර"[1]

**පාද බෙදීම.**

කංකාරියේ පාද බෙදීම සම්බන්ධ මුල්ම සාධකය හමුවන්නේ කප් සිටුවීමේ අවස්ථාවේ දී ය. "කප" යනු සිංහල සංස්කෘතියේ සම්මත මංගල ලකුණකි. යම් සුභ යැයි සම්මත කාර්යයක් ආරම්භ කිරීම සංකේතවත් කරමින් එම භූමියේම කප සිටුවනු ලැබේ. කිරි වෘක්ෂයකින් කපා ගත් කණුවක් කප ලෙස හඳුන්වනු ලබයි. කංකාරිය සඳහා කප සිටුවීම සිදුවන්නේ බ්‍රහ්ම පාදය මැද බව සඳහන් වේ.

**කපේ කවි :**



"සුභ මොහොතින් කප හෙලමින් යට  පා
බ්‍රහ්ම පාද මැද දෙව්පද මැද  පා
ගැබ තුලටා හැර දෙරියන් මෙවු  පා
බැබලෙන ලෙස රඟ මඩුවට මෙයු  පා"[2]

**මඩු සැරසිල්ල :**



"බෙදා සතර පාදය එහි  පළමුත්
යොදා එ පද සැට හතරින්  ඇරගත්
සදා පොරණ ඉසිවරු කිව්  ලකුණත්
එදා ඒ රඟ මඩුවට මේ  ලෙසගත්"[3]

**දිශා නිර්ණය.**

**මඩු සැරසිල්ල :**

නන්වා මඩුවක් උතුරු  දෙසේයා
බඳවා වියනුත් පස්වල්  බැඳයා
නවකැන් නවවලු නවඅතු  බැඳයා
වැඳපුව මලරජ හට මේ  ලෙසයා

**පඬුවස් කථාව :**

සිරිත් පිරි අනුරාධපුරයට උතුරු දිග උපතිස්ස  පුරයට
ගොසින් සුර නර සෙනග සහ මල නිරිඳු මහ මෙවුනා  උයන්හට
සකින් උන් මැනි සෙනඟ රැස් කර උතුරු දිග නිසි බිමක  එමට
පසන් රඟ මඬලක් පමා නොව කරව වදහල ඒ පුර  මැතිඳුට

---

[1] බලවත්ගොඩ සිරිසෝම ගුරුතුමාගේ (1888). අත්පිටපත්.
[2] බලවත්ගොඩ සිරිසෝම ගුරුතුමාගේ (1888). අත්පිටපත්.
[3] බලවත්ගොඩ සිරිසෝම ගුරුතුමාගේ (1952). අත්පිටපත්.

**මුව මලේ කවි :**

වැදි පිරි වර වට කරට සදෙන්නේ
සැණෙකින් මුව මල පයිඩ කරන් නේ
ගෙනවිත් මුව මල අයිලෙ සදන් නේ
උතුරට මුව මල ගෙන සිටු වන් නේ

**මාන ක්‍රම.**

කංකාරි යාග සාහිත්‍යය තුළ කංකාරියේ භාවිතා වන මිනුම් ක්‍රම පිළිබඳ විස්තර ඇතුලත් ය. ඒවා සංස්කෘත වාස්තු විද්‍යා මූලධර්ම වලට වෙනස්ව ගොඩනැගී ඇත.

**මඩු සැරසිල්ල :**

දිගින් මඩුව සැටරියන යි
පුළුල අසන් තිස්රියන යි
තලව්වෙ උස පස් රියනයි ......

**පඬුවස් කථාව :**

සතර රියනක් අතුරු ඇර සොඳ විතර රඟ මඩලට ඉදිරිපිට
විතර දිග වඩු තුන් රියන් දෙරියන් සමාරක් උසින් නිදෙසට
පතර ඇර අයිල මැද රඹ තුරක් සිටුවා සරස මින්වට
එතර රන් කලසක පුලුක් මල් පිහිටවා සරසමින් මෙලෙසට

පස් රියන් මැන ගෙමුල මිනිස් පද
විස්තර මුතුසේ සතහට මන නද.....

**හඟල යැදීම :**

උස දනක් පමණ යි - පුළුල නම් තනි රියනයි
වටවඩු රියන් තුනගුල යි - මෙසේ විශ්කම් පුටුව සැදුවයි


**අයිලෙ යැදීම : (මහා යාදින්න)**


"සිව් දිගින් සිව්රියන් අතර හැර උසින් දෙරියන් පමණ අඬල සොද අයිලක් තනා ගජ තොරණක් ලමින්"[1] ......

**මල් යහන පිළිබඳ විස්තර :**

"දිගිනුත් සත් රියනයි මැන ගන්නේ
පුළුලින් දෙරියන් හමාර ගන්නේ
උසිනුත් දෙරියන් හමාර ගන්නේ
මෙලෙස දෙවිඳුට යහන සදන්නේ"[2]

[1] ගඩලාදෙණිය කළුඋක්කුවා ගුරුතුමාගේ (1965-11-10) මුල් අත්පිටපත් .
[2] බලවත්ගොඩ සිරිසෝම ගුරුතුමාගේ (1952) අත්පිටපත්.









<u>**දෙවොල් මඩු ශාන්තිකර්ම රංග භූමිය (සියනෑ කෝරළය).**</u>

සියනෑ කෝරළය යනුවෙන් හැඳින්වෙන්නේ වර්තමාන ගම්පහ දිස්ත්‍රික්කය වේ. මෙම ප්‍රදේශය තුළ චිර ප්‍රසිද්ධියක් උසුලන බුත්පිටිය නර්තන පරම්පරාවේ කථිකාචාර්ය නිහාල් බටුවිට ගුරුතුමා (අට වෙනි පරපුර) සතු අත් පිටපත් ආශ්‍රයෙන් මෙම විග්‍රහයන් කර ඇත.

**<u>භූමිය තෝරා ගැනීම හා දිසා ගත කිරීම.</u>**

**සේරමාන් යාදින්න :**

"පළමු කෝවිල එතන - රුවන් වැලි ඉසනේ
බැලී බිම සන්තොසින - මඩුව කරවන්නටා"[1]

**පත්තිනි යාදින්න :**

"කෝවිලට පුදවමින් - රෝග සංසිඳුවමින්
උතුරු දිග බිම රැගෙන - දිගින් සැට රියනකින්
කරවි කර බිම රැගෙන - ..................................."[2]

**<u>පාද බෙදීම.</u>**

වඩු ඇදුරු ගෙන්නවා - කරන වඩුකම් නොයෙක්
විශ්වකර්ම ඇවිත් - මඩුවේ බිම බෙදාලා"

**බිසෝ කපේ කවි :**

"නැකැත් ඇදුරෝ ගෙන්නවා ගෙන ඉගෙන ගතිනම් සුබසදේ
දිගති සැටකින් පුලුල තිස් ගෙන තනා පේකඩ හිමි සදේ
මනනි බව දැව කප්පවා ගෙන පාද බෙදමින් හිමි සදේ
මෙලක සැප තැන බැලූ නිසි මේ තැනූ ගී මඩුවක් සැදේ"[3]

**තෙල්මේ මඩු බැසීමේ කවි :**

සේරමන් රජු එදා - ගෙන්නා නොයෙක් සමුදා
මඩුවට බිම බෙදා - තනා සිටුවා සුබ මොහොතටා

**මහ මඩුපුරය :**

ගොස කරවන බිසෝකප ද සිටුවා මෙහි බඹ පද මැද
පස් වළු මල් රැගෙන පබඹ ද සැවොල් මුවෙන් ගෙන නිවරද
ලෙස් ඇරනෝ පෙති අටකින් යුතු වූ පියුමක් එහි මැද
හිස් වූ නොව රන් කළසක් කරව්ව පුද කරවන සොඳ

**<u>මාන ක්‍රම (මඩුව සෑදීම හා සම්බන්ධ මිනුම්)</u>**

**සේරමාන් යාදින්න :**

ගෙන දැව සිටුවලා - ගෙනා යටලී දමාලා
රන් තොරණ බැඳලා - මෙසේ සැරසූ මඩුව එකලා

---

[1]කවීකාචාර්ය නිහාල් බටුවිට ගුරුතුමාසතු අත් පිටපත් (පිටු. 84).
[2]කවීකාචාර්ය නිහාල් බටුවිට ගුරුතුමාසතු අත් පිටපත් (පිටු. 145).
[3]කවීකාචාර්ය නිහාල් බටුවිට ගුරුතුමාසතු අත් පිටපත් (පිටු. 145).

දිගින් සැට රියනේ - පුලුල ද එ තිස් රියනේ
මඩුව සරසමිනේ - තොරණ මකරිඳු එ සත් රියනේ

විශ්වකර්ම ඇවිත් - මඩුවකුත් සදන්නට
දිගින් මඩු සැටරියන් - පුලුල වඩු තිස් රියන්
තලව් මැන පස් රියන් - ගඩොල් සුනුලා පසන්
සුදු වැලි ද ඉසිමින් ........

**පත්තිනි යාදින්න :**

දිගින් සැට රියනකින් - පුලුල තිස් රියනකින්
සදා කප්රුක් සොදින් - .......

**තොරණ් යාගය :**

ගත් උස සත් වියන් සාඟුල් සිව් අඟුලා
මෙත් වට පුලුල සත් වියත් අඟුල තුනඟුලා
මෙත් දණ බඳින රඹ පත තොරණ සක්වලා
යුත් තෙද පතිනියන් හට තොරණ මුල් කලා

සතකි වියත් සාඟුල් උසකින් ගන්නේ
තුනකි අඟුල් සවියත් පුළුලින් ගන්නේ
පසකි කලස් කොත මුදුනට සදමින්නේ
බසකි තොරණ සිට ඇදුරෝ සරසන්නේ


**තොරණ් යාගයේ :**

කී හෙයින් සත් වියත් සාගුලක් ද ....... කී හෙයින් පුළුලින් සවියත් තුන ගුලක් ද...... අඩු වැඩි නොකර පස තබා සිතුයම් කරමින් මෙහි රඹ පතුරු වෙලමින් සතර වටට නොයෙක් මල් පෙති සරසා........ කී හෙයින් මේ සූර්ය මණ්ඩලයක් මෙන් නැමැති තොරණ මාලා දක්වමින් මේ ආතුරයන්ට සුවසෙත් ශාන්තියක් කෙරෙත්වා.


**පන්දම් දොළහ කවි (දෙවොල් තෝරණ් කවි) :**

නව වියත් උස ගෙන - සත් පියවරක් පළලින
නවයට බෙදා ගෙන - සදා කණු නවයකුත් වෙන වෙන

බිම සිට සත් වියත් - දළුමුර යහන බැඳ ගත්
ඉන් උඩට දෙවියත් - කපා රඹකල මුදුන බඳවත්















**<u>පහන් මඩු රංග භූමිය (රත්නපුර සම්ප්‍රදාය).</u>**

සබරගමු නර්තන සම්ප්‍රදායේ රත්නපුර ගළුකාගම නර්තන පරපුරේ කවීකාචාර්ය යොහාන් පුංචිනිළමේ මහතා සතු අත්පිටපත් ආශ්‍රයෙන් මෙම විග්‍රහයන් කර ඇත.

**<u>භූමිය තෝරා ගැනීම</u>.**

ඔඩුපුරය :

කී ඇඳුරන් බස් උතුරු - කීලෙස යස දිග පැතිරු

බෝ ලෙස වැව් පිරි ඉතිරු - මඩුවට බැලු බිම උතුරු

රුවන් එදා වරුසාක් සත්දවසක් වසිමින් නේ
රුවන් නියම කරන ලෙසින් නන්වා පුරයට වන් නේ
රුවන් සළඹයට ගනිමින් රුවන්වැල්ල නම දුන් නේ
රුවන්වැල්ල ඊසානෙට ගනිමින් බිම බලමින් නේ

පතුරුවාපු යස දිගබල මැතිදෝ සිට යුත්තු
අතුරු නොදී කියමින් සිට ඇදුරෝ නොම යුත්තු
මිතුරු ගුණෙන් සදහන් කර රුසිරෙන් අග පත්තු
උතුරු දිගින් රගමඩුවට බිමක් බලා ගත්තු

<u>පාද බෙදීම.</u>

බොහෝ සුරන් වැසෙනුත් සුභ පාද මැද
ලසෝදරව රකිනා දෙවි පාද මැද
ලසෝ දුකට පානා දෙවිපාද මැද
මගුල් කපද සිටුවා සුභ පාද මැද

<u>මාන ක්‍රම.</u>

**තෙල්මේ තටුවේ කියමන් :**


දිගින් මඩුව සැට රිය නේ - පුළුල අසන් තිස් රියනේ
තලව්ව උස පස් රිය නේ - කළෙ මඩුව මෙලෙසි නේ

කන් වියත් පමණි න් - විද කුළුණයක දමමි න්
රඹ පත්ම එළමි න් - තැඹිළි ගෙප්පන් මෙන් සරසමි න්

**තොරණ යාගය :**

ගත් උස සත් වියත් සාගුල් සිව් අගුලා
මෙත් වට පුළුල සවියත් සමග තුනගුලා
ගෙත් වට බැඳි මෙ රංතොරනේ ලකුණු බලා
යුත්තෙද පතිනියන් හට තොරණ පුල්කලා

කාලක් රියන් හැර දෙපිටින් තොරණ වට
කාලක් මිටිරියන් ගෙන මැසි බැද සතුට
යාලක් සහල් පුදනර වන්ඩ මැසිපිට
මේ ලක්ෂණෙන් තබ පුන්කලස් ගෙනවට






**භාරතීය වාස්තු විද්‍යාව.**

වාස්තු විද්‍යාව යන වචනයට සිංහලයේ මෙන්ම සංස්කෘත පාලි ආදී භාෂා තුළ ද නිර්වචන ඉදිරිපත් වී ඇත. සිංහල ශබ්ද කෝෂයේ වාස්තු යනුවෙන් සඳහන් වන්නේ වාසය කරන ස්ථානය, ගෙවල්, නගර, ඉඩම, ගෙපල, වත්ත, සත්ත්වයාගේ වාසයට යෝග්‍ය ස්ථානය වාස්තු යනුවෙනි.[1]

සංස්කෘත ශබ්ද කෝෂයෙහි වාස්තු යන්න අර්ථකථනය කර ඇත්තේ වාස් (නිවාසේ) ධාතුවෙන් නිපන් වාසය කිරීම යන අර්ථය දෙන පදයකි. අලගියවැන්න සංස්කෘත සිංහල ශබ්දකෝෂයෙහි වාස්තු යන පුරුෂ ලිංග හා නපුංසක ලිංග යන ලිංගද්වයෙහි ම වර නැගෙන ද්විලිංගික වචනයකි. වාස්තු යන වචනයෙන් ගෙවත්ත, ඉඩම, ගෙබිම, ගෙදර, වසන තැන අර්ථවත් වන බව සඳහන් වේ. පාලි භාෂාවේ වාස්තු විද්‍යාව හඳුන්වන්නේ වත්ථුවිජ්ජා යනුවෙන් ය. ගොඩනැගිලි සෑදීමට යෝග්‍යය තැන් දැනීමේ ශාස්ත්‍රය ඉන් අර්ථවත් වන බව පාලි සිංහල ශබ්දකෝෂයෙහි නිර්වචනය වේ. දීඝ නිකාය අට්ඨකතාවේ සඳහන් වන්නේ වත්ථුවිජ්ජා යනු ගෘහය පමණක් නොව ගෙවතු ආරාම හා ඉඩමේ ආදියෙහි ගුණ දොස් සලකන විද්‍යාව ලෙස ය.

වත්ථු කම්මං - පොදුවේ වාස්තු විද්‍යාව
වත්ථු පරිකම්මං - නව ගෘහයක් තැනීම
වත්ථු පරිකිරණං - භූමින්හි පවත්නා උවදුරු දුරු කිරීමට පිළියම් යෙදීම
(දීඝනිකාය බ්‍රහ්මජාල සූත්‍රය)

**සමරංගණ සූත්‍රධාරයෙහි**

***භූරේව මුඛ්‍යං වස්තු සත්‍යාත් - තත්‍ර ජාතානි යානිති***
***ප්‍රසාදාදීනි වස්තූන් - වස්තුත්වාත් වස්තු සංශ්‍රයාත්***

වාස්තු යනු වසු යන පදයෙන් සෑදුනු පදයකි. වසු යන්නෙන් පොළව අර්ථවත් කෙරේ. වාස්තු යන වචනයෙන් පොළව මත තනා ඇති සියලු ම ගොඩනැගිලි හඳුන්වනු ලැබේ. සියලුම ඉදිකිරීම් සිදු කරනු ලබන්නේ භූමිය මතය. ඉදිකිරීම් වලට පමණක් නොව සමස්ත

[1] බෙන්තරගේ, ලයනල්. (2005). **පහතරට ශාන්තිකර්මවල වාස්තු විද්‍යාත්මක ලක්ෂණ.** පිටුව 45.

ලෝකයටම ආධාර වී ඇත්තේ ද භූමියයි. ඒ නිසා වාස්තු අතර ප්‍රධාන වාස්තුව වන්නේ භූමියයි. Monior Williams ශබ්ද කෝෂයෙහි විවරණය කර ඇත්තේ The site of foundation of a house site, ground building or dwelling place, habitation, hom ested, house යනාදි පරිදි ගෘහය, ගෘහය තනනු ලබන භූමිය, වාසස්ථානය, පදිංචිය යන අර්ථ වලිනි. වාස්තු යන්න ඉංග්‍රීසි භාෂාවේ දී Architecture යන වචනයෙන් ව්‍යවහාර කෙරේ. The art and study of designing building යනුවෙන් ගෘහයන් තැනීමේ කලාව හා ඒ පිළිබඳ අධ්‍යයනය architecture යන වචනයෙන් අර්ථවත් වන බව Oxford English ශබ්දකෝෂයෙහි සඳහන් වේ.[1]

"වේද විද්‍යාවේ දී "වාස්තු" යනුවෙන් හැඳින්වේ. වාස්තු කොටස් 4 කින් සමන්විත වේ.

1. **භූමි** යන්නෙන් පෘථිවිය හා ඉඩම ද (මිනිසාගේ වාසයට සුදුසු)
2. **ප්‍රාසාද** යන්නෙන් විවිධ කර්තව්‍යයන් සඳහා වන ගොඩනැගිලි ද
3. **යාන** යන්නෙන් වාහන ආදී චංචල වස්තූන් ද
4. **සායන** යන්නෙන් ගෘහ භාණ්ඩ ආදිය ද ගැනේ"[2]

"වාස්තු යන වදන සංස්කෘතික නිධානයේ වාස් යන්න වාසස්ථාන ගත වීම වේ."[3] "වාස්තු යන පදය විමසා බැලීමේදී ඒ මගින් සත්ත්වයන්ගේ වාසයට යෝග්‍ය ස්ථාන යනුවෙන් එය අර්ථවත් කෙරේ. එකී ස්ථාන ගෘහ, ග්‍රාම හා නගර යනුවෙන් ප්‍රධාන කොටස් 3 කි."[4] එය ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳව පමණක් කරුණු උගන්වන ශාස්ත්‍රයක් නොවේ. මනුෂ්‍යයාගේ අර්ථ, ධර්ම, කාම යන ත්‍රිවර්ග සම්පත් ඔහුගේ ප්‍රතිලාභයට ඉවහල් වූ දහසයක් කරුණු ඊට ඇතුළත් වේ."[5] වාස්තු විද්‍යාවේ සම්බන්ධ විවිධ වූ නිර්වචන රාශියක් ග්‍රන්ථානුගතව ඇත. වාස්තු විද්‍යාව ගොඩනැගෙන්නේ පෘථිවිය කේන්ද්‍ර කොටය. පොළොව මත ඉදිවන හා අලංකරණය වන සියලුම කලාවන් අතර වාස්තුව ද කලා අංගයක් බවට පෙන්වා දිය හැකිය. වාස්තු විද්‍යාවේ ප්‍රභවය ආපෝ, තේජෝ, පඨවි, වායෝ, ආකාශ යන පංච මහා භූත සංකල්පයයි. භාරතීය වාස්තු දර්ශනය සඳහා දේව විශ්වාසයන් ගැබ්ව පවතී. වාස්තුවට අධිපති දෙවියා වන්නේ "වාස්තොශ්පති" වේ. එම නාමය ඉන්ද්‍ර දෙවියන්ට භාවිත නම්වලින් එකක් බවට ද සැලකේ.

---


[1] රේවත හිමි, උඩවෙල. (2017). **වාස්තු විද්‍යා සහතික පත්‍රපාඨමාලාව.** දේශන අංක 02.

[2] විජේදාස, පි. බී. (1998). **වාස්තු විද්‍යාව හෙවත් ගෘහ නිර්මාණ ශිල්පය.** පිටුව 15.

[3] දේවනාරායන, ක්වින්ටින්. (2007). **සැබෑ වාස්තු.** පිටුව 09.

[4] විජේදාස, පි. බී. (1998). **වාස්තු විද්‍යාව හෙවත් ගෘහ නිර්මාණ ශිල්පය.** පිටුව vi.

[5] දේවනාරායන, ක්වින්ටින්. (2007). **සැබෑ වාස්තු.** පිටුව 09.




වාස්තුව ප්‍රධාන වශයෙන් කොටස් 3 කි.

- නිත්‍ය වාස්තු - පැය 03 කට වරක්
- වර වාස්තු - මාස අනුව
- ස්ථිර වාස්තු - ස්ථිරව පවති

වාස්තු විද්‍යාවේ ප්‍රධාන සිද්ධාන්ත රාශියක් පවති. ඒ අතර භූමිය තෝරා ගැනීම (භූ පරීක්ෂණය), පාද බෙදීම, මාන ක්‍රම, දිශාගත කිරීම, ක්ෂේත්‍රඵල සාදනය, ද්වාරස්ථාපනය, මර්මස්ථාන, වහලය, භූමි සංස්කරණය, වේධ දෝෂ හා ප්‍රතිකර්ම, ආදී සරල මට්ටමේ සිට සංකීර්ණ තත්ත්වයන් දක්වා වර්ධනය වූ වාස්තු විද්‍යා සිද්ධාන්ත සමූහයක් ඇත. භාරතීය වාස්තු විද්‍යා ගුරුකුල දෙකකි. එනම් උත්තර හා දක්ෂිණ පරම්පරාය. දක්ෂිණ පරම්පරා ග්‍රන්ථ ද්‍රවිඩ භාෂාවෙන් ද උත්තර පරම්පරා ග්‍රන්ථ සංස්කෘත භාෂාවෙන් ද රචනා වී ඇති අතර ඒ සඳහා භාරතීය පාරිසරික සාධකයන් බෙහෙවින් බලපාන ලදි. දේශීය වශයෙන් අපේ පරිසර තත්ත්වයන්ට ගැලපෙන වාස්තු ශාස්ත්‍රයක් ද තිබී ඇති බවට පුරා විද්‍යාඥයින් කරුණු පෙන්වා දෙයි. ප්‍රාග් ඉතිහාසයට අයත් සාධක ද අනුරාධපුර, පොළොන්නරුව ආදී පැරණි ශිෂ්ටාචාර මගින් ද මෙරට දියුණු වාස්තු විද්‍යා ශාස්ත්‍රයක් තිබූ බවට සාධක හමු වී ඇත. ඒ සඳහා භාරතීය වාස්තු විද්‍යා ගුරුකුල දෙකේ බලපෑම ලැබී ඇති බව පෙනෙන්නට ඇත.

දේශීය නර්තන සම්ප්‍රදායේ රංග භූමියන් හි වාස්තු විද්‍යාත්මක කරුණු විමසීම සඳහා යොදා ගන්නේ මාන ක්‍රම, දිශාගත කිරීම්, පාද බෙදීම හා තාවකාලික නිවාස හෙවත් මානස්‍ය හා නන්දන වර්ගයේ ගෘහයන් ඉදිකිරීම පිළිබඳ සිද්ධාන්තයන් පමණි.


**භූමිය තෝරා ගැනීම.**


භූමිය තෝරා ගැනීමේ දී විවිධ භූමි ලක්ෂණ හා ඒවායේ ශුභ අශුභ තත්ත්වයන් පිළිබඳව සැලකිළිමත් වේ. දහසය ආකාරයක භූමි පිළිබඳව වාස්තු විද්‍යා ග්‍රන්ථගත සාධක ඇත. "චතුරස්‍ර භූමි, ආයාත භූමි, ත්‍රිකෝණ භූමි, විෂම භූමි, වෘත්ත භූමි, වක්‍ර භූමි, දණ්ඩ භූමි,.........”[1] ශාන්තිකර්ම රංග භූමි සඳහා බොහෝ විට යොදා ගන්නා භූමි වර්ගය වන්නේ සෘජුකෝණාකාර (ආයාත භූමි), චතුරස්‍ර භූමි හා වෘත්තාකාර භූමි වේ.

[1] කෝරළගේ, දයාරත්න. (2000). **විද්‍යාත්මක පදනමක් මත වාස්තු ශිල්පය.** පිටුව 10.

**පාද බෙදීම.**

වාස්තු විද්‍යාවේ ප්‍රධාන සිද්ධාන්තයට අනුව භූමිය ප්‍රධාන වශයෙන් කොටස් සතරකට බෙදා වෙන්කරනු ලබයි. ප්‍රේත, මනුෂ්‍ය, දේව, බ්‍රහ්ම යන පාද සතරයි. ඕනෑම වර්ගයේ භූමියක් බෙදා වෙන් කිරීමක් වාස්තු විද්‍යාත්මකව සිදුකරනු ලබයි. ඒ නිසා පාද බෙදීම වාස්තු විද්‍යාවේ මූලික ලක්ෂණයක් ලෙස හැඳින්වේ.




**ප්‍රේත පාදය** යනු ඉඩමක මායිම් ස්ථානය වේ. එය බොහෝ විට අපිරිසිදු දෑ රැස්වන ස්ථානය ලෙස යොගන්නා නිසා එයට ප්‍රේත පාදය යැයි කියනු ලැබේ. ඉදිකිරීම් කිසිවක් සෑදීමට මෙම පාදය යොදාගන්නේ නැත.

**මනුෂ්‍ය පාදය** මෙම කොටස මනුෂ්‍යන් සඳහා සුදුසු කොටස ලෙස සඳහන් වේ. සියළු ඉදිකිරීම් ආරම්භක පාදය ලෙස මෙය භාවිතා කිරීම සුදුසු බව වාස්තු විද්‍යාවේ පෙන්වා දෙයි.

**දේව පාදය** "මෙම කොටස තුළ නිවස ඉදිකිරීම සිදුවන්නේ රාජකීය, ප්‍රභූවරුන්ටය."[1] උත්තම වුන්, බැබලෙන වූත් කොටස වන දේව පාදය, උසස්, ආර්ථික තත්ත්වයක් ගෙන දෙන නිවෙස් ශ්‍රියාව වඩවන පිහිටීමකි.[2]

**බ්‍රහ්ම පාදය** "ඕනෑම හැඩයකින් යුත් ඉඩමක හරි මැද බ්‍රහ්ම පාදයයයි."[3] මෙම කොටස ඉතා උසස් වූ ස්ථානය ලෙස සලකනු ලැබේ. ඒ නිසාම වාස්තු විද්‍යාව තුල මෙය අධ්‍යාත්මික ස්ථාන ආගමික කටයුතු සඳහා නිර්දේශ කොට ඇතිබව පැරණි සියළු වාස්තු ග්‍රන්ථ පෙන්වා දෙයි.

**දිශා නිර්ණය.**




[1] විලියම්, ආර්. එච්. (2017). **ජ්‍යොතිෂ හා වාස්තු විද්‍යාව.** පිටුව 13.
[2] කෝරළගේ, දයාරත්න. (2000), **විද්‍යාත්මක පදනමක් මත වාස්තු ශිල්පය.** පිටුව 33.
[3] විලියම්, ආර්. එච්. (2017) **ජ්‍යොතිෂ හා වාස්තු විද්‍යා නිවිස අත්පොත.** පිටුව 13.

වාස්තු විද්‍යාව අනුව දිශා නිර්ණය ක්‍රම කිහිපයකට දැකගත හැකිය. ඉඩම පිහිටි දිශාව, ඉඩමේ බෑස්ම ඇති දිශාව, දොරවල් තබන දිශාව, නිවසේ ගෘහ අංග දිසාගත කිරීම ආදී කරුණු රාශියක් පිළිබඳ අවධානය යොමුකරනු ලබයි. මෙම පර්යේෂණයේදී ප්‍රධාන වශයෙන් අධ්‍යයනය කරන්නේ භූමියේ ඉදිකරන රංග භූමිය හා පූජාසන හෙවත් මල්යහන් තොරණ් ආදිය දිශා ගත කිරීම පිළිබඳව වේ. "හින්දු සම්ප්‍රදායට අනුව මිනිසාගේ දකුණත නැගෙනහිර පෙදෙස ලෙසත්, වමත බටහිර පෙදෙස ලෙසත් අර්ථ ගන්වා ඇත. මෙයට හේතුව වී ඇත්තේ යමකු උතුරට මුහුණලා සිටින විට, දිව්‍යමය දොරටු කලාපය විවෘත වන බවට ඔවුන් තුළ වූ විශ්වාසයයි."[1] දේශීය වශයෙන් නිර්මාණය කර ඇති පැරණි අනුරාධපුර, පොළොන්නරු ආදී යුගවල පැරණි ආගමික හා රාජ්‍ය, ප්‍රභූ ගොඩනැගිලි හා නගර සැළසුම් ආදිය ප්‍රධාන දිශා 4ට සමාන්තරවන ලෙස දොරටු පිහිටා නිර්මාණය කර ඇති බවට සාධක හමුවේ.


උදා : සිතුල්පව්ව බිම් සැලසුම (නැගෙනහිරට)

අනුරාධපුර නගර සැලසුම (උතුරට)

"දිසාවන් නිර්ණය කිරීමේදී භාරතීය සංස්කෘත වාස්තු ග්‍රන්ථ දක්වන්නේ බ්‍රාහ්මණ ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර යන වර්ණයන්ට ප්‍රදක්ෂිණා ක්‍රමයෙන් උත්තරා දී දිශාවන්ට නතු වූ බිම් ශුභවේ ඒ මෙසේය උතුරු දිගට නතුබිම බ්‍රාහ්මණයන්ට ද නැගෙනහිරට නතුබිම ක්ෂත්‍රයන්ට ද දකුණට නතුබිම වෛශ්‍යයන්ට ද බටහිරට නතුබිම ශුද්‍රයන්ට ද ශුභ ස්ථාන වේ."[2]

**මාන ක්‍රම.**

වාස්තු විද්‍යාවේ මේ පිළිබඳව විවිධ අර්ථකථන හා මතවාදයන් රාශියක් පවතී. උත්තර භාරතීය පරම්පරා හා දක්ෂිණ භාරතීය පරම්පරා ගුරුකුල අතර ද මේ සම්බන්ධ පරස්පරතා රාශියක් පවතී. පැරණි මාන ක්‍රම පිළිබඳ මෙසේ සඳහන් වේ.




| | |
|---|---|
| දුව්ලි අංශු 1 | පරමාණු 08 |
| පරමාණු 8 | වක් 01 |
| වක් 8 | රජස් 01 |
| රජස් 8 | රෝම කූප 01 |
| රෝම කූප 08 | ලිප්සා 01 |
| ලිප්සා 08 | යුකා 01 |
| යුකා 08 | යවඇට 01 |
| යවඇට 08 | අඟල් 01 |

[1] දේවනාරාණ, ක්වින්ටන්. (2010). **වාස්තු පරිසරය මිනිසා හා ගැටෙන විවිධ ශක්තීන්.** පිටුව 33.

[2] සෙනවිරත්න, ඩී. ආර්. (1986). **වාස්තු රත්නාවලිය.** පිටුව 11.

සංස්කෘත වාස්තු විද්‍යා නිර්දේශයට අනුව විවිධ පරිමාවන් භාවිතයට ගන්නා නිශ්චිත ක්‍රමවේද පෙන්වා දී ඇත.

| |
|---|
| "නගර, ග්‍රාම, ක්ෂෙත්‍ර, මාර්ග, මැනීම, සඳහා - දණ්ඩ (හස්ත 05 ක් දඬු 01) |
| ප්‍රාසාද, ගෘහ, සඳහා - රියන (වඩු රියන) |
| රථ හා කරත්ත සඳහා - වියත |
| ඔටුණු හා ආභරණ සඳහා - යව |
| රන්මසු සහ කහවනු සඳහා - යූකා"[1] |

රියන සම්බන්ධ විවිධ පරිමාවන් භාවිතා කරනු ලබයි. එනම් අඟල් 18, අඟල් 24, අඟල් 31 හෝ 32 ආදී වශයෙන්ය. "ගෙහිමියාගේ මැද ඇඟිල්ලේ සිට වැලමිට දක්වා රියනක් ලෙස ගන්නා බව සඳහන් වේ. ප්‍රාදේශීය වශයෙන් ද රියනේ දිග වෙනස් ව පවතී. ඒ සම්බන්ධව මනු, මය, ස්වත්‍ර හා විශ්වකර්ම යන වාස්තු ඍෂිවරු විවිධ පරිමාවන් ගැන කථා කෙට ඇත. "විශ්වකර්මට අනුව අඟල් 24 - උත්තමයි. අඟල් 21 - මධ්‍යමයි. අඟල් 18 - සමයි යනුවෙනි."[2]

**නිගමනය** : මෙම පර්යේෂණය කාර්ය්‍යය සම්පූර්ණ නිමා වීනොමැත. වර්ථමානය තුළ ශාන්තිකර්ම ශිල්පින් විසින් මෙම වාස්තු සිද්ධාන්ද කෙරෙහි මූලික අවදානයක් යොමුනොකෙරේ. එමගින් ඇතිවියහැකි හානි රාශියකි. ප්‍රමිති කරණය නොවූ ඉදිකිරීම් නිසා පාරසරියට හා මිනිස් ජීවිතකෙරෙහි ඇතිවියහැකි හානි,සංස්කෘතික වශයෙන් ශාස්ත්‍රීය දැන්ම පරිහානියට යෑම, ඉන් ප්‍රධන සාදක ලෙස පෙන්වා දිය හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


**ප්‍රථමික මූලාශ්‍ර.**

1. බලවත්ගොඩ සිරිසෝම ගුරුතුමාගේ හා ගඩලාදෙණිය කළුඋක්කුවා ගුරුතුමාගේ මුල් අත්පිටපත් 1701 - 1988.
2. බුත්පිටිය නර්තන පරම්පරාවේ කථිකාචාර්ය නහිල් බටුවිට ගුරුතුමා (අට වෙනි පරපුර) සතු අත් පිටපත්.
3. ගළකාගම නර්තන පරපුරේ කථිකාචාර්ය යොහාන් පුංචිනිළමේ මහතා සතු අත්පිටපත්.

**ද්විතීය මූලාශ්‍ර.**

1. රාජපක්ෂ, ශ්‍රියාණි. 2014. **සබරගමු නර්තන කලාව.** එස්. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන.
2. දිසානායක, මුදියන්සේ. 2018. **කොහොඹා යක් කංකාරි කාව්‍ය සාහිත්‍යය.** එස්. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන.


[1] රේවත හිමි, උඩවෙල. (2017). වාස්තු විද්‍යා සහතික පත්‍රපාඨමාලාව. දේශන අංක 04.

[2] කෝරළගේ, දයාරත්න. (2000). **විද්‍යාත්මක පදනමක් මත වාස්තු ශිල්පය.** පිටුව 38.

3. දිසානායක, මුදියන්සේ. 2018. **නර්තන වාක් කෝෂය.** එස්. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන.

4. මද්දුමගේ, දීපිකා ගයාණි, 2004. **සබරගමු පහන් මඩුයාගය.** එස්. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන.

5. බෙන්තරගේ, ලයනල්. 2013. **පහතරට ශාන්තිකර්මවල වාස්තු විද්‍යාත්මක ලක්ෂණ.** කතෘ ප්‍රකාශණයක්.

6. අමරසූරිය, දේශප්‍රිය. 2017. **වාස්තු විද්‍යා අත් පොත.** ඇම්. ඩී. ගුණසේන සමාගම, කොළඹ.

7. විලියම්, ආර්. එච්. 2017. **ජ්‍යොතිෂ හා වාස්තු විද්‍යා නිවාස අත්පොත.** ඇම්. ඩී. ගුණසේන සමාගම, කොළඹ.

8. කෝරළගේ, දයාරත්න. 2016. **විද්‍යාත්මක පදනමක් මත වාස්තුශිල්පය.** කතෘ ප්‍රකාශණයක්.

9. ගම්ලත්, දනංජය. 2016. **ප්‍රාතිමෝක්ෂ සහ උපෝසථගරයේ වාස්තුවිද්‍යා ව්‍යාවච්ඡේදනය.** සරසවි ප්‍රකාශකයෝ, නුගේගොඩ.

10. මාරසිංහ, වොල්ටර්. 2014. **මංජුශ්‍රීභාෂිත වාස්තු විද්‍යා ශාස්ත්‍රය.** සමයවර්ධන මුද්‍රණ ශිල්පියෝ සමාගම.

11. දේවනාරායන, ක්විටන්. 2007. **සැබෑ වාස්තු.** කතෘ ප්‍රකාශණයක්.

12. සෙනෙවිරත්න, ඩී. ආර්. 2012. මොඩන් පොත් සමාගම, නුගේගොඩ.

13. දේවනාරාණ, ක්වින්ටන්. 2010. **වාස්තු පරිසරය මිනිසා හා ගැටෙන විවිධ ශක්තීන්.** කතෘ ප්‍රකාශණයක්.

# The Moderating Effect of Ethnicity on Relationship between Role Demands and Work-Life Balance among Women Lecturers in Sri Lanka

Indumathi Welmilla[1]

**Abstract**

Women lecturers participate in various work and life roles, which can create challenges when trying to balance the pressures and responsibilities associated with each role. That means that, as lecturers, they face great demands, which must be met diligently. The current study seeks to argue that the constructs of role demand and ethnicity have been neglected in the work-life balance literature in Sri Lankan context.

The purpose of this study is to investigate the moderating effect of ethnicity on role demand and the work-life balance of women lecturers in Sri Lanka. Therefore, the study examines the relationship between two aspects of role demand (work and family) and work-life balance among women lecturers in Sri Lanka as well as the role of ethnic identity as a moderator of the relationship. First, to investigate the direct relationship, two exogenous constructs; work demand and family demand and two endogenous constructs namely work satisfaction, family satisfaction were identified. Next, the study was to decide whether the relationship between role demand and work-life balance among women lecturers in Sri Lanka differ on the basis of ethnicity. To test this, ethnicity used as a moderating variable and considered the two major ethnic groups in Sri Lanka namely, Sinhala and Tamil.

The sample has been selected through the disproportionate stratified random sampling method and the quantitative research approach has been applied. A questionnaire survey was used to gather data from state universities in Sri Lanka. There were 265 responses were obtained. The structural equation model was used in analyzing the data. First, the result of the study demonstrates that the significant negative relationship between role demand and work-life balance, and it fills a gap in the literature by validating the associations between role demand and work-life balance dimensions. finally, the study shows that the relationship between role demand and work-life balance is not moderated by ethnic identity. This result is remarkable as this is the first study that presented the outcome of relationships between role demand and work-life balance among women lecturers' in Sri Lanka as not differing on the basis of ethnicity. This finding implies that when living under the same economic and social system different ethnic groups gain similar perceptions.

---

[1] Department of Human Resource Management, University of Kelaniya, Sri Lanka.

***Keywords:*** *Family demand; ethnicity; moderating effect; Work demand; Work -life balance*

## Introduction

Globally, there has been a considerable increase in women's participation in careers/occupations as well as a steady increase in dual-career earners in the family (Munn & Chaudhuri, 2015). Hence, work life balance (WLB) is an increasing problem worldwide, and consequently research into WLB has increased (Kossek, Bales, & Matthewa, 2011). In other words, more employees are now playing a dual role as an employee and parent; in combining work and family roles it is difficult for them to achieve WLB.

Early researchers treated work and family systems as if they operated independently because work and personal life are most often physically and temporally separated and because men traditionally assumed the role of breadwinner and women the role of a homemaker (Clark, 2000). However, regardless of this traditional view, the number of dual professional couples who have more responsibilities towards their families has increased (Greenhaus & Allen, 2010). Most Western workers, including those with responsibilities to care for family and those without, value a positive relationship between their work lives and personal lives (Skinner, 2008). But these activities are rather different in the case of men and women in Asia.

Asian women perform many domestic activities such as cooking, babysitting, aged care, and childcare (Greenhaus et al., 1989). Even though they have many family roles, the proportion of educated women employees in Asia has increased (Flores & Day, 2006). At present, this phenomenon is largely a consequence of women entering the teaching profession, which job entails great responsibility in terms of disseminating knowledge, serving simultaneously as educators, managers, planners, and facilitators, and being exemplary to the community (Johanim et al., 2018).

The women employees' who are engaging in teaching professions personal lives are intimately linked to their performance of the professional lives and that means the multiple roles are influenced both of professional and personal lives of the academics. Therefore, academic identities are shaped and reshaped over time and these identities are influenced by personal and professional histories, professional training, academic culture and leadership influences (Flores & Day, 2006). Most studies find that there is an imbalance in the work and personal lives of

women in the teaching profession (Bridges & Searle 2011; Goyal & Arora 2012; Punia & Kamboj 2013), therefore making it necessary that academics find a solution to this problem.

## Research Problem

Most research on WLB experiences has been carried out in Western contexts (Cohen & Kirchmeyer 2005; Poelmans et al.,2003; Roehling, Jarvis, & Swope, 2005). Those researches have directly addressed the ethnic groups of the West in identifying the effects of work and family life balance only. Hammer (2004) notes this lack of studies of work–family interactions among different ethnic groups and individual perceptions and experiences regarding the demands of work-family roles. There is a dearth of research that addresses the role demands (RDs) and WLB experiences of women employees of different ethnic groups in developing countries like Sri Lanka. Furthermore, reviewing literature, it was identified that there were no studies conducted on RDs and WLB experiences among women academics in the Sri Lankan context. Therefore, the current study is trying to fill this gap by determining the relationships between RDs and WLB experience of women academics in different ethnic groups in Sri Lanka.

***Research questions:***

1. What are the relationships between RDs (work and family) and WLB among women in the academic profession in Sri Lanka?
2. Do relationships between RDs (work and family) and WLB among women in the academic profession in Sri Lanka differ on the basis of ethnicity?

## Objectives of the study

Researchers have further demonstrated with limited empirical evidence that a strong ethnic identity will predict the experience of WLB (Aziz & Chang, 2013; Grzywacz, Carlson, Kacmar, & Wayne, 2007). However, empirical findings to date do not indicate this with regard to Sri Lankan ethnicity and WLB. In response to blind literature of Sri Lanka, the purpose of this study is to examine RD and WLB experiences in a more diverse grouping of both Sinhala and Tamil women academics. Therefore, this study aimed to:

Determine the relationship between RD (work and family) and WLB among women in the academic profession

Decide whether the relationship between RD (work and family) and WLB among women in the academic profession in Sri Lanka differ on the basis of ethnicity.

## Literature Review

### Work Life Balance

As researchers have suggested, there is no exact definition of WLB (Chandra, 2002; Felstead, Jeson, Phizacklea, & Walters, 2002). The concept of balance is an inter-role phenomenon that reveals personal attention across various life roles (Marks & McDermid, 1996). In spite of the hierarchy of importance of multiple roles, individuals have equal responsibilities related to different life roles which they have to balance through balanced orientation (Marks & MacDermid 1996). However, WFB literature has revealed that this concept of balance has not received extensive research attention (Greenhaus et al., 2003). Though many researchers (Blunsdon, Blyton, Reed, and Dastmalchian, 2006; Chan, 2008; Clark 2000; Kirchmeyer, 2000; Marks & MacDermid 1996) have suggested different definitions for WLB those are not completely consistent with each other (Greenhaus et al., 2003).

According to Carlson et al. (2013) WLB as a composition of work satisfaction (WS) and family satisfaction (FS). As well, Higgins, Duxbury, and Johnson (2000) defined WLB as a "*perceptual phenomenon characterized by a sense of having achieved a satisfactory resolution of the multiple demands of work and family domains*" (p.19). Furthermore, Hill (2005) interpreted WLB is referring to how an individual simultaneously balances the temporal, emotional, and behavioral demands of both paid work and non- paid work activities. Also, researchers such as Chan (2008) and Blunsdon et al. (2006) supported Hill's (2005) definition, presenting the same ideas of their definitions. They described WLB as the successful integration of an individual's life and work, also elaborated on this expression by looking at psychological factors. Consequently, it was noted that WLB is about attaining a satisfying quality of life, overall satisfaction with less stress. Clark (2000) defines WLB as *'satisfaction and good functioning at work and at home with a minimum of role conflict'* (p.751). This definition reflects that WLB is how people play a successful role in both domains of work and family with minimum role conflict. Based on Clark (2000) the WFB definition includes five dimensions such as WS, FS, work functioning, family functioning, and role conflict. Competing demands from workplace and family life cause conflict and it negatively affects the individual's satisfaction (Clark, 2000; Frone, 2004). Therefore WLB can be achieved when individuals are satisfied with their work and family roles (Clark, 2000).

**Role Demands of work and family**

Experiences of WLB and work family conflict may be the result of both work and family responsibilities. These responsibilities become emotional and physical demands and they badly affect each other because of limited personal resources. Increasing role demands of work and life are probably deleterious to individual psychological health as well as work attitudes (Lu, Gilmour, Kao, & Huang, 2006; Spector et al., 2004). These aspects of role demand require individuals' resources such as time, energy, and attention. Some scholars use the term 'role stressor' to describe the consequences of work family roles (Spector et al., 2004).

Demerouti, Bakker, and Nachreiner (2001) define WD as *'physical, social, or organizational aspect of a job that requires sustained physical or mental effort, and are therefore associated with certain physiological and psychological costs'* (p.501). Individuals have to devote available limited resources to multiple roles in life. Thus, time or energy allocated to one role is restricted from another. According to Voydanoff (2005) time- and strain-based demands are two kinds of WD. Long working hours, over time and organizational time expectations can be identified as examples of time-based WDs and strain-based demands may comprise work overload, work stress, work pressure and job insecurity (Voydanoff, 2005). Past literature shows that several WDs were associated with high work family conflict and work family imbalance (Batt & Valcour, 2003; Valcour, 2007; Voydanoff, 2005).

Boyar, Carr, Mosley, and Carson, (2007) define FD as '*a global perception of the level and intensity of responsibility within the family domain'* (p.103). They also pointed out that this demand pertains not only to objective characteristics of the family domain but also subjective characteristics. The family role is essential for an individual, as it is an integral part of one's identity. Therefore an individual's perception regarding family is a threat to works, consuming energy and time. Fulfillment of FS and responsibilities depends on spending time on family members. Thus, high demands and expectations in the family domain lead to work-family conflicts (Beutell, 2010). Hours spent providing care in the family is the most prominent factor which impacts FD (Carlson & Perrewe, 1999). Some researchers argue that the number of children in the family directly affects the degree of FD (Parasuraman, Purohit, Godshalk, & Beutell, 1996) because parents are responsible for their children and to provide their day to day requirements. So reserving time and energy for that purpose is essential. Moreover, in the family domain, demand has been linked with the number and age of dependents at home and hours spent on household responsibilities (Lu et al., 2006).

## Ethnicity

The word ethnicity is generated from two Greek terms such as ‘ethnos’ and ‘ethnikos’ which stands for the nation, national, clan or caste (Betancourt & Lopez, 1993 as cited in Lawrence & Fabian, 2014). Among characteristics such as nationality, culture, language, race, religion, and descent, one or several common to any group can be defined as ethnicity (Venkatesh, 1995). The literature identifies ethnicity as a strong tool which can be used to join or separate people because interpersonal communication is a major aspect of the cultural identity of a people. (Ebiai & Akpomuvie, 2005).

However, more scholars such as Choi and Park (2006); Sen and Chowdhury (2006) mention that ethnicity refers to a collective identity. Furthermore, Choi and Park (2006) state that it comprises various combinations of factors including religious, origin and national heritage, and patterns of social interaction, shared values and beliefs.


## Sri Lankan Ethnicity

Sri Lanka is a small tropical island off the southern tip of India. The island nation covers approximately 65,100 square kilometers. Like other nations in the South Asia region, Sri Lanka has a diverse population which speaks several languages and follow different religions. Based on the two main characteristics that mark a person’s ethnic group – namely, language and religion four major ethnic groups are created in Sri Lanka (Bandaranayaka, 1985). The largest ethnic group of the country is the Sinhalese, officially comprising 22 million as of 2018. The second largest group is Tamil which is subdivided into two groups, Sri Lankan Tamil and the Indian Tamil. Altogether, these two groups of Tamils account for 18 percent of the country’s population, of which the Sri Lankan Tamils and Indian Tamils present ages are 12.5 and 5.5 percent respectively. The next group of Moors of Arab origin, recognized as Muslims, who constitute seven percent of the total population in Sri Lanka. The remainder of the population consists of numerous ethnic minorities such as Burghers, Mixed European, Malays, aboriginal Veddahs and others (Department of Census and Statistics, Sri Lanka - 2017).

In Sri Lanka ethnic group may provide some basis for expected differences in WLB experiences. Therefore, ethnic identities such as cultural backgrounds, perceptions, attitudes, religious of Sri Lankan women may moderate the relationship between work and family roles and WLB. Hence, in the current study, the researcher explores the women academics’ ethnicity as a moderating construct.

According to the literature mentioned, the following conceptual framework (figure 1) was developed for the study.

**Figure 1: Conceptual Framework**




Source: Author construct, 2018

**Hypotheses**

Amongst widely cited WDs, several are associated with higher levels of work-life conflict and lower WLB (Batt and Valcour, 2003; Major et al., 2002; Valcour 2007; Voydanoff, 2005). These WDs include long working hours, hours worked, work overload, and work pressure and work distress. Valcour (2007) has developed his own multi-item scale and used it in his empirical study which reveals that a high level of work-life conflict leads to low satisfaction with the ability to balance their work and family responsibilities. Furthermore, Valcour (2007) proves satisfaction with the WLB is negatively related to working hours. Moreover, Yilldirim and Aycan (2008) observe a strong positive relationship between work-life conflict and work overload. This means the WLB of individuals is negatively correlated with WDs.

Noor (2004) proposes that women are principally responsible for the home, even if she is working. However, fulfilling these responsibilities for family facilitates WLB and helps reduce work-family conflict (Elisabeth, 2003). Huang et al., (2004) found that work-family conflict has a positive correlation with FD for childcare. This means WLB of individuals is negatively correlated with FDs.

FS is the individual attitude or positive feeling towards family life (Edura et al., 2012). Samsinar et al., (2010) empirically proves that overall satisfaction with family life has a significant positive relationship with quality of non–work (family) life. Likewise, they report, that the quality of family life is gained from having personal time and spending time with family members. Consequently, spending time with family significantly influences FDs such as child care, household chores, and perceived FD.

Past studies observe the relationship between RDs of work and family, within the domain as well as cross-domain. RD variables within domains strongly affect outcome variables in those domains (Biggsq & Brough, 2005; Carlson & Kacmar, 2000). In contrast, the cross-domain relationship between RDs and outcomes have been searched in previous studies, but their relationship (eg: WD and family domain outcome) are contradictory (Lu et al.,2006). Hence, the current study only focuses on within-domain factors (eg: FDs and family domain outcomes and WDs and work domain outcomes).

Considering the above facts, the researcher hypothesizes that there is a negative relationship between RDs and WLB dimension of satisfaction. Thus, the following hypotheses are proposed:

**$H_1$**: Work demand is negatively associated with work satisfaction of women academicians in Sri Lanka.

**$H_2$**: Family demand is negatively associated with family satisfaction of women academicians in Sri Lanka.

Research in the cross–cultural field rarely examines the variation in work life experiences across ethnic groups (Clauss & Ehlers, 2007). Although these studies explore the relationship between ethnicity and WLB experience, they do not often specify the ethnic background of individuals (Clauss & Ehlers, 2007). However, a majority of this research relating to WLB and ethnicity has been conducted in the Western context.

Roehling et al. (2005) conducted a study of Hispanic women’s work life experience and found that the women experienced a highly negative work family spillover relative to black women than white. But these findings cannot apply for non-Western context, because cultural values of ethnicities in non- Western countries are different from those in the West.

Another comparative study has done by Banduer (2004) reveals ethnic differences in perception towards work and attributes it to the influence of economic status differences, between groups. Furthermore, this study examines the moderation effect of the ethnicity of perception towards work and the economic status of Chinese and South Africans.

Smith et al. (2004) empirically examines ethnic differences in work stress and work life conflict among ethnic minorities and white workers. They found an association between ethnicity and work stress. A recent study (Lawrence et al., 2014) has examined the work family conflict

among Nigerian workers and found that ethnic difference is a significant factor in the experience of work life conflict among Nigerian employees.

However, empirical findings to date do not address Sri Lankan ethnicity and WLB. Also, the results of past studies lack consistency. Therefore, regardless of countries, nations, or any other cultural units, ethnicity can moderate the relationship between RDs and WLB. Based on the above argument, the following hypotheses are formulated,

**$H_3$**: The relationship between work demand and work satisfaction is differed significantly among ethnic groups.

**$H_4$**: The relationship between family demand and family satisfaction is differed significantly among ethnic groups.

## Research methodology

### *Sample data collection and measurement*

To fulfill the study objectives four hypotheses were advanced. The quantitative research approach is used to verify the hypotheses. A self-administered questionnaire was used to gather data on WLB and work- family demands. The population element has known, the researcher used a stratified random sampling technique. This study, the population elements are grouped into strata based on the criterion of two ethnicities (Sinhala and Tamil), and women lecturers from each stratum are then chosen randomly. The respondents were Sinhalese or Tamils from all state universities of Sri Lanka. However, this study chose a disproportionate type of stratified random sampling method. Because through the disproportionate stratified random sampling technique, the researcher can use an equal number of participants from each group that leads to achieving realistic findings. Questionnaires were distributed to 325 lecturers in state universities. Out of 325 questionnaires distributed, 265 questionnaires, which constitute of 81.5 percent response rate, were returned and usable for analysis. In the study, the questionnaire adapted from original sources and some modifications were made to suit the context of the study. A total of 19 items with the five-point Likert scale were used to measure all variables under study.

There were two latent constructs constructed for role satisfaction such as WS and FS in WLB following Clark's (2000) model. WS was assessed with five items by Clark (2000), while FS was assessed with three items based on the same study. Sample items for the WS construct are ‘I receive a lot of satisfaction from carrying out my responsibilities at work’ and ‘I love what I

do at work'. Sample items for the FS construct are 'I receive a lot of satisfaction from carrying out my responsibilities at home' and 'I love what I do at home'.

Two exogenous latent constructs of WD and FD were measured by using 6 items scales and 5 item scales for each respectively, which had been previously used by Boyar et al. (2007). Sample items for WD construct are "I feel like I have a lot of work demands" and "I feel like I have a lot to do at work" and sample items for FD construct are "I have to struggle when managing family – related activities" and "My family requires all of my attention".

**Data Analysis**

In this study there were two exogenous constructs; WD and FD and the endogenous constructs were WS and FS. The data were prepared and screened before performing the analysis. Descriptive statistics analysis was performed as a pretest of data cleaning. Exploratory factor analysis (EFA) was used to decide whether the data at hand suits the underlying constructs, thereby ascertaining their appropriateness. Ensuring validity and logical solution, multivariate assumptions were tested for the data set. The measurement model was assessed with the test of the item's loading and reliability. Confirmatory Factor analysis (CFA) employing AMOS 22.0 was used to examine the measurement component of each latent construct. Unidimensionality, validity, and reliability of all latent constructs were assessed using CFA. The validity of each measurement model was assessed using three measures: convergent validity, construct validity and discriminant validity. The convergent validity was verified by computing the average variance extracted (AVE) and examining the statistical significance of all items in a measurement model. Construct validity was achieved using numerous goodness - fit indicators. Root Mean Square Error of Approximation (RMSEA) and Goodness-of-Fit Index (GFI) indicators were used to confirm the absolute model fit. The incremental model fit category was measured using goodness-of-fit indicators of Comparative Fit Index (CFI) and Tucker- Lewis Index (TLI). Parsimonious fitness achieved was tested with Chi-square /df value. Discriminant validity of the measurement model was tested when comparing AVE estimates and square of the correlation of each measurement model.

Internal reliability of each measurement model was achieved when testing the value of Cronbach's Alpha. Composite reliability was measured using the standard formula in order to achieve internal consistency of latent constructs. Then the structural model assessed to test the hypotheses that reflect the direct relationships of RDs and WLB. In assessing the indirect effect

of moderator variables, the Multi- Grouped CFA method was utilized through the structural model. All data were analyzed using SPSS 21.0 and AMOS 22.0 packages.

## Results

### *Measurement model*

Factor loading for all items was above 0.5, were considered acceptable reliability. For Bartlett's test of sphericity also were significant with p-value 0 and KMO statistics were above 0.6 for all constructs (WS=0.87 FS= .76, WD= 0.81, FD=.77). KMO also supports factor analysis. In addition to EFA, CFA was utilized to test the validity and reliability of the measurement model and assess modify the proposed research model. Figure 2 depicts the modified full measurement model which was incorporated all latent constructs indicated by respective items pertaining to each scale.

Internal consistency reliability was confirmed by examining the composite reliability (CR) coefficients and Cronbach's alpha coefficients of each construct (Henseler, Ringle, & Sinkovics, 2009). All CR and Cronbach's alpha values were above 0.7 suggested that internal consistency reliability for each construct were achieved. In addition to that, the values of the average variance extracted (AVE) were also examined to determine the convergent validity of WS, FS, WD, and FD. The results showed that the values of AVE for all constructs were above 0.5, suggest adequate convergent validity (Hair, Black, Babin, & Anderson, 2010). Table 1 shows the summarized results of assessing the measurement model.


**Table 1: Result of assessing the measurement model**

| Construct | Items | Item Loading | Item Reliability | Cronbach's Alpha | CR | AVE |
|---|---|---|---|---|---|---|
| WS | WS1 | .933 | .943 | .801 | .706 | .651 |
| | WS2 | .955 | .901 | | | |
| | WS3 | .968 | .854 | | | |
| | WS4 | .970 | .821 | | | |
| | WS5 | .946 | .806 | | | |
| FS | FS1 | .969 | .870 | .733 | .702 | .601 |
| | FS2 | .998 | .904 | | | |
| | FS3 | .946 | .871 | | | |
| WD | HWD1 | .550 | .502 | .791 | .878 | .701 |
| | HWD2 | .875 | .782 | | | |
| | PWD1 | .906 | .813 | | | |
| | PWD2 | .961 | .785 | | | |
| | PWD3 | .942 | .782 | | | |
| | PWD4 | .905 | .804 | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| FD | HFD1 | .949 | .806 | .701 | .797 | .661 |
| | PFD1 | .942 | .709 | | | |
| | PFD2 | .955 | .881 | | | |
| | PFD3 | .955 | .811 | | | |
| | PFD4 | .940 | .799 | | | |

Source: Data analysis results, 2018

**Figure 2: Measurement Model**





Source: Results of AMOS graphics, 2018

***Assessment of structural model***

The overall model fit for the structural model was examined by using the fitness indices. Proposed structural model shown in Figure 3. Model fit indicators exhibited a good fit, as CMIN/DF less than 3, GFI and CFI are greater than 0.80, and RMSEA is less than 0.8 (Hair et

al., 2010) between the data and conceptualization model. The model fit statistics in table 2 shows the acceptability of the structural model.

**Figure 3: Structural equation model**




Source: Results of AMOS graphics, 2018

**Table 2: Model fit statistics of the structural equation model**

| Fit Indications | CMIN/DF | GFI | CFI | TLI | RMSEA |
|---|---|---|---|---|---|
| Value | 2.660 | 0.91 | 0.921 | 0.910 | 0.51 |

Source: Adapted from data analysis, 2018

***Hypotheses Testing (Direct effects)***

The direct hypotheses were tested through the SEM using AMOS 22. The path that connects work demand to WS yields a significant coefficient value of -0.51 (SE= 0.57, CR= -13.567, P=0.000). Hence, a significant negative path coefficient is suggested that WD is negatively

associated with WS. Thus, the result of standard regression weights output is providing support for $H_1$. The path coefficient value that is produced FD and FS is -0.0.46. This is significant results (SE=0.050, CR= -12.345. P=0.000). In effect, this path is also considered that FD is significantly associated with the degree of FS at a significant level of 0.000, which provides support for $H_2$. The results of the direct hypotheses testing of AMOS output extract are presented in Table 3.

**Table 3: Direct hypotheses testing: AMOS output extract**

| Path | Hypothesized Direction | Path Coefficient | SE | Critical Ratio | P value | Supported |
|---|---|---|---|---|---|---|
| H1 | Negative | -0.51 | 0.57 | -13.567 | 0.000 | Yes |
| H2 | Negative | -0.46 | 0.05 | -12.345 | 0.000 | Yes |

Source: Adapted from data analysis results, 2018

**Hypotheses testing (Moderating effects)**

This study was performed a multiple group CFA analysis to estimate the moderating effects of ethnicity on relationships between RDs on WLB. Some of the goodness of fit indices were not at the recommended level, but all indices were very close to the recommended level, hence, on the whole, it was acceptable (Hair et al., 2010). The result indicated that the chi-square difference in the unconstrained and constrained models was 33.182 (1632.75-1599.568) for both groups. A standard chi-square value with 28 degrees of freedom at the 0.05 significance level is 41.337 and it is confirmed that there is no moderating effect of ethnicity on the relationship between WD and WS; not supporting $H_3$. The results of the moderating effects of ethnicity on the relationship between WD and WS for Sinhala and Tamil groups are presented in Table 4.

**Table 4: The results of the moderating effects of ethnicity (Sinhala and Tamil) on the relationship between WD and WS**

| Group | Sinhala | | Tamil | |
|---|---|---|---|---|
| Model | Constrained | Unconstrained | Constrained | Unconstrained |
| Chi-Square | 1599.568 | 1632.75 | 1599.568 | 1632.75 |
| Df | 778 | 750 | 778 | 750 |

| | | | | |
|---|---|---|---|---|
| Chisq/df | 2.056 | 2.177 | 2.056 | 2.177 |
| GFI | 0.825 | 0.857 | 0.825 | 0.857 |
| CFI | 0.899 | 0.937 | 0.899 | 0.937 |
| RMSEA | 0.048 | 0.038 | 0.048 | 0.038 |
| NFI | 0.854 | 0.891 | 0.854 | 0.891 |
| TLI | 0.889 | 0.931 | 0.889 | 0.931 |
| Result on Moderation | Significant | | Significant | |
| Result on Hypothesis | Not Supported | | Not Supported | |

Source: Adapted from data analysis, 2018

The difference between chi-squared values that were found between constrained and unconstrained models of the path FD to FS was 34.505 (1667.254-1632.75). The analysis involved determining whether this difference was statistically significant or not. For the test to be significant, the difference in chi-square values of constrained and unconstrained models must be higher than the value of chi-square with 28 (778-750) degrees of freedom (critical value), which is 41.337 at the significance level 0.05. When comparing these values, it was indicated that the moderation test was not significant since the difference in chi-square values was less than 41.337. Thus, $H_4$ was not supported in this study. The results of the moderating effects of ethnicity on the relationship between FD and FS for Sinhala and Tamil groups are presented in Table 5.

**Table 5: The results of the moderating effects of ethnicity (Sinhala and Tamil) on the relationship between FD and FS**

| Group | Sinhala | | Tamil | |
|---|---|---|---|---|
| Model | Constrained | Unconstrained | Constrained | Unconstrained |
| Chi-Square | 1667.254 | 1632.75 | 1667.254 | 1632.75 |
| Df | 778 | 750 | 778 | 750 |
| Chisq/df | 2.143 | 2.177 | 2.143 | 2.177 |

| | | | | |
|---|---|---|---|---|
| GFI | 0.825 | 0.857 | 0.825 | 0.857 |
| CFI | 0.899 | 0.937 | 0.899 | 0.937 |
| RMSEA | 0.048 | 0.038 | 0.048 | 0.038 |
| NFI | 0.854 | 0.891 | 0.854 | 0.891 |
| TLI | 0.889 | 0.931 | 0.889 | 0.931 |
| Result on Moderation | Significant | | Significant | |
| Result on Hypothesis | Not Supported | | Not Supported | |

Source: Adapted from data analysis, 2018

**Discussion**

Due to the lack of research in WLB, specially focusing on the higher education sector in the Sri Lankan context, this study was examined the WLB experiences among university lecturers. The aims of this study, namely to identify relationships between RDs of work and family and WLB among women academic staff in Sri Lankan Universities, and to decide whether the relationship between RDs (work and family) and WLB among women in the academic profession in Sri Lanka differ on the basis of ethnicity.

The results indicate that there is a negative relationship between RDs and WLB. This is in line with previous research findings by, Valcour (2007), Aycan (2008), Elisabeth, 2003, and Samsinar et al. (2010). It is evident that when individuals have a heavy workload and more responsibilities in their work and family roles it will be big challenged to attain their work and family satisfaction. In the previous literature, WLB often assists to be explained in term of work life conflict (Byron, 2005; Ford et al., 2007). When an individual's participating in multiple roles such as work and life, inter-role conflict may arise.  (Higgins, et al., 2010). Thus, WLB means the absence of work life conflict or, work life conflict means work family imbalance. Therefore, through the related literature of work life conflict, the relationship between RDs and WLB can be identified. However, Carlson et al., (2013) highlighted that the absence of work life conflict is the historical definition of WLB.

Based on such considerations, the researcher designed in this study RDs of work and WLB would have a negative relationship. The reason for that university lecturers' dedication to and

enthusiasm for their job, because they have to build their academic career and fulfill professions goals (higher studies, research publications). Therefore, they might consider WD (heavy workload, working long hours) is a challenge contributing toward their overall WLB.

Noor (2004) has proposed that women are the principal responsible person for the home yet, even if she is working. However, doing these responsibilities for family, it facilitates WLB and helps reduce work family conflict (Elisabeth, 2003). Huang et al. (2004) found that work family conflict has a positive correlation with the family demand for childcare. This means the WLB of individuals negatively correlated with family demands. Based on this argument, the research design in this study RD of family and WLB would have a negative relationship. Similar to the previous result, the study was confirmed that there is a negative relationship between FD and WLB.

This finding is consistent to some extent with Smith et al. (2004) who examined ethnic differences in work stress and work-family conflict and reported the association between work stress and the work-family conflict among different groups to be at similar levels. Smith and colleagues' study focused on the work-family conflict which also related to this study concept. Moreover, this finding may be explained by the cultural differences that not exist between these ethnic groups (Sinhala and Tamil) which influence the association between RDs and WLB.

Contrary to expected hypotheses, different ethnicities did not show any moderating effect among relationship between RDs and WLB, which differs from the result by Lawrence et al. (2014). However, this study has followed the idea posited from Western context (Joshi et al., 2006; Grzwacz et al., 2007) of positioning ethnicity to moderate the relationship between RDs and WLB as opposite ends of a continuum, although the researcher is aware that there is no consensus about this understand in the literature.

## Conclusion, Limitations and Further research

This study indicated that WD had a particularly moderating negative association with WS. Women academics who perceive high WD may receive the lower WLB, along with lacking their WS. Moreover, the study results show a significant negative association between FD and FS. That means when women in the academic profession are unable to fulfill their family responsibility, they receive less FS and also face work-family imbalance.

However, the ethnic base did not moderate the relationships among RDs and WLB of Sri Lankan women academics. Women in different ethnic groups in Sri Lanka seem to share

common cultural values which tend to influence their WLB in many other ways such as work and family tasks, responsibilities, not the ethnic identity. This result is remarkable as this is the first study that presented the outcome of relationships between RDs and WLB among women in the academic profession in Sri Lanka as not differing on the basis of ethnicity. This finding implies that when living under the same economic and social system different ethnic groups gain similar perceptions. It is noted that this is a new contribution to the literature on the WLB of diverse ethnic women in the academic profession in Sri Lanka.

The current research was conducted amongst women academics in the government sector only, omitting women who are working in private universities. In order to gain a better understanding of characteristics across women academics in Sri Lanka, it is recommended to conduct similar research amongst the private and public sector.

In the current study WLB is measured by using only the constructs of WS and FS, thus the researcher suggests to include in future studies more dimensions to measure WLB. Recent research argued that men experienced higher work family conflict and they also have work life imbalance. Thus, future research is needed that replicates the study for men to generalize the results at hand. The present study found that RDs and WLB experiences do not differ in groups of different ethnicities. This will allow researchers to find out the reasons why this result contradicts with previous literature. Another recommendation for future research is to investigate other aspects of WLB, such as imbalance work-life or work-life conflict, to determine the relationship with RD. This may produce a more meaningful result and enhance current studies in terms of Sri Lankan women academics' perspective.

**References**

Aycan, Z. (2008). Cross-cultural perspectives to work-family conflict. In K. Korabik, D. Lero and D. Whitehead (Eds.), *Handbook of work-family integration,* (pp.359–371). Cambridge: Cambridge University Press

Aziz, A., & Chang, A. (2013). Work–family balance: The 3-way interaction effect of role demands, collectivism value and ethnicity. *Journal of Global Management, 6,* 22–39.

Bandaranayake, S., (1985). *The Peopling if Sri Lanka' in Ethnicity and Social Change,* Colombo.

Bandura, A. (2004). Social cognitive theory for personal and social change by enabling media.

Batt, R., & Valcour, P. M. (2003). Human resources practices as predictors of work life outcomes and employee turnover. *Industrial Relations, 42*(2), 189-220.

Beutell, N. J. (2010). The causes and consequences of work-family synergy: An empirical study in the United States. *International Journal of Management*, *10*(*1*)

Biggs, A., & Brough, P. (2005). Investigating the moderating influences of gender upon role salience and work-family conflict. *Equal Opportunities International, 24*(2), 30-41.

Blunsdon**,** B., Blyton, P., Reed, K., & Dastmalchian, A. (2006). *International perspectives on the balancing of multiple roles: Work Life Integration.* Macmillan: UK.

Boyar, S.L., Carr, J.C., Mosley, D.C., & Carson, C.M. (2007). The development and validation of scores on perceived work and family scales. *Educational and Psychological Measures, 67*,100-115.

Bridges, S., & Searle, A. (2011). Changing workloads of primary school teachers: I seem to live on the edge of chaos. *School Leadership and Management, 31* (5), 413-433. https://doi.org/10.1080/13632434.2011.614943

Byron, K. (2005). A meta- analytical review of work-family conflict and its antecedents. *Journal of Vocational Behavior*, 67 (02),169-198.

Carlson, D. S., Kacmar, K.M., & Williams, L.J., (2000). Construction and initial validation of a multidimension measure of work- family conflict. *Journal of vocational Behavior, 56* (2), 249-276.

Carlson, D., & Perrewe, P.L. (1999). The Role of Social Support in the Stressor-Strain Relationship: An Examination of Work-Family Conflict. *Journal of Management,25*(4), 513-540 http://doi.org/10.1177/014920639902500403

Carlson, S.D., Kacmar, M.K., Grzywacz, G.J., Tepper, B., & Whitten, D. (2013). Work- family balance and supervisor appraised citizenship behavior: the link of positive affect. *Journal of Behaviour & Applied Management*,*14*(02), 87-106.

Chan C. K. Y. (2008). Border crossing: Work-life balance issues with Chinese entrepreneurs in New Zealand. (Master's thesis, Auckland University of Technology, New

Chandra, V. (2012). Work-life balance: Eastern and Western perspectives. *The International Journal of Human Resource Management,23*(5), 1040-1056.

Chandra, V. (2012). Work-life balance: Eastern and Western perspectives. *The International Journal of Human Resource Management,23*(5), 1040-1056.

Choi, N., & Park, C.G. (2006). Understanding adolescent depression in ethnocultural context: update with empirical findings. *Advances in Nursing Science, 29* (4), 1-4

Clark, S. (2000). Work/family border theory: a new theory of work/ family balance. *Human Relations,18*(3),747-770.

Clauss, - Ehlers, C.S. (2007). Extending work –family concepts to the lives of Latinas (Electronic Version). Retrieved from hptt:// wfnetwork.b.edu/encyclopedia template.php? id-4238.

Demerouti**,** E., Bakker, A.B., Nachreiner F. (2001). The job demands-resources model of burnout. *Journal of Applied Psychology 86*(3), 499–512.

Department of Census and Statistics (2017). Population by ethnic group, Population by religion. Statistic information service. Sri Lanka, http://www.statistics.gov.lk/

Ebiai, A., & Akpomuvie, B. (2005). Traditional work ethics in Nigeria and rigid authoritarian motivational characteristics of modern paid work. *International Journal of Social and Policy, 3*(2), 106-114.

Edura, W., Mohamad, S.N., Azura, O., & Izhairi, I. (2012). Work/Family Conflict: The Link between Self-Esteem and Satisfaction Outcomes. *Social and behavioral Science*, 65, 564-569.

Elisabeth, G. (2003). Women doctors in Norway: The challenging balance between career and family life. *Social Sciences & Medicine Journal*, 57(07), 1327-1341, http://org/doi/10.1016/S0277-9536(02)00513-0

Felstead, A., Jewson, N., Phizacklea, A., & Walters, S. (2002). Opportunities to work at home in the context of work–life balance. *Human Resource Management Journal*, *12*(1), 54–76.

Flores, M. A., & Day, C. (2006). Contexts which shape and reshape new teachers' identities: A multi-perspective study. *Teaching and Teacher Education, 22*(2), 219-232.

Ford, M. T., Heinen, B. A., & Langkamer, C. L. (2007). Work and family satisfaction and conflict: A meta-analysis of cross-domain relations. *Journal of Applied Psychology, 92,* 57–80.

Frone, M.F. (2003). Work family balance. In. JC Quick & L.E. Tetrick (Eds), *Hand book of Occupational Health Psychology* (pp.143-162). Washington. APA.

Goyal, M., & Arora, S. (2012). Harnessing work: family life balance among teachers in educational institute. *International Journal of Applied Services marketing Perspectives, 1* (02), 170-176.

Greenhaus, J. H., & Allen, T. D. (2010). Work–family balance: A review and extension of the literature in Tetrick, L. and Quick, J.C. (Eds.) *Handbook of occupational health psychology*, (2nd ed.) (pp.165-183), Washington, DC: American Psychological Association.

Greenhaus, J. H., Parasuraman, S., Granrose, C. S., Rabinowitz, S., & Beutell, N.J. (1989). Sources of Work-Family Conflict among Two-Career Couples. *Journal of Vocational Behavior, 34*,133-153.

Greenhaus, J.H., Collins, K.M., & Shaw, J.D. (2003). The relation between work– family balance and quality of life. *Journal of Vocational Behaviour, 63*(3), 510–31.

Grzywacz, J.G., & Carlson, D. S. (2007). Conceptulizing work-family balance: implications for practice and research. *Advance in Devloping Human Resources*, *9* ,455-471.

Hair, J. F., Black, W. C., Babin, B. J., & Anderson, R. E. (2010). *Multivariate data analysis: A global perspective* (7th ed.). Upper Saddle River, N.J: Pearson Education.

Hammer, T.H. (2004). Expanding the Psychosocial Work Environment: Workplace Norms and Work-Family Conflict as Correlates of Stress and Health. *Journal of Occupational Health Psychology*, 9(1), 83-97.

Higgins, C., Duxbury, L. & Johnson, K.L. (2000). Part- time work for women: does it really help balance work and family?. *Human Resource Management*, *39* (1),17-32.

Hill, E. (2005). Work-family Facilitation and Conflict: working fathers and mothers work-family stressors and support. *Journal of Family Issues, 26*, 793- 819.

https://doi.org/10.1016/j.sbspro.2012.11.166.

Huang, Y. H., Hammer, L. B., Neal, M. B., & Perrin, N. A. (2004). The relationship between work-to family conflict and family-to-work conflict: A longitudinal study. *Journal of Family and Economic Issues*, *25*(1), 79-100.

Johanim, J. Fee, Y.T., & Zati, I. T. Z. (2018). Autonomy, workload, work-life balance and job performance among teachers. *International Journal of Educational management*,*32*(1), 107-120. https://doi/org/10.1108/IJEM-10-2016-0226

Joshi, K.G., Liao, H., & Jackson, S.E. (2006). Cross-level effects of workplace diversity on sales performance and pay. Academy of management Journal, 69(3), 459-481.

Kossek, E.E., Baltes, B.B., & Matthewa, R.A. (2011). How work- family research can finally have an impact in organizations. *Industrial and Organizational Psychology*, *4*(3), 352-369.

Lawrence, O.A., & Fabian, O.U. (2014). Ethnicity and self- esteem as predictors of work family conflict among Nigerian workers. *European Journal of Business and Management*, *6*(26), ISSN 2222-2839(online).

Lu, L., Gilmour, R., Kao, S.F., & Huang, M. T. (2006). A Cross-Cultural Study of Work/Family demands, Work/Family Conflict and Wellbeing: the Taiwanese vs British, *Career Development International*, *11*(1): 9-27.

Major, V.S., Klein, K.J., & Ehrhart, M.G. (2002). Work time, work interference with family and psychological distress. *Journal of Applied Psychology,* 08 (3), 427-436.

Marks, S. R., & Mac Dermid, S. M. (1996). Multiple roles and the self: A theory of role balance. *Journal of Marriage and the Family, 58,* 417–432.

Munn, S.C., & Chaudhuri, S. (2015). A Cross-Cultural Review of Dual-Earner Couples in India and the United States. *Advances in Developing Human Resources,18*(1),54-68.

Parasuraman, S., & Greenhaus, J. H. (2002). Toward reducing some critical gaps in work-family research. *Human Resource Management Review*, *12*(3) ,299-312.

Parasuraman, S., Purohit, Y.S., Godshalk, V.M. & Beutell, N.J. (1996). Work and family variables, entrepreneurial career success and psychological well-being. *Journal of Vocational Behavior, 48,* 275-300.

Poelmans, S., Spector, P.E., Cooper, C.L., Allen, T.D., O'Driscoll, M., & Sanches, J.I. (2003). A cross national comparative study work /family demands and resources. *International Journal of Cross-Cultural Management, 3*(3), 275-288.

Punia, V., & Kamboj, M. (2013). Quality of work-life balance among teachers in higher education Institutions. *Learning Community,4*(3), 197-208.

Roehling, P.V., Jarvis, L.H, & Swope, H.E. (2005). Variation negative work family spillover among White, Black and Hispanic American Men and Women: Does ethnicity matter? *Journal of Family Issues, 26*(6), 840-865.

Samsinar, S.M., Murali, S. & zhairi, I. (2010). Relationship between work-family conflict and quality of life: An investigation into the role of social support. *Journal of Managerial Psychology, 25*(1), 58-81, http://org/doi/10.1108/02683941011013876

Sen, P., & Chowdhury, A.N. (2006). Culture, ethnicity and paranoia. *Current Psychiatric Reports, 8,* 174-178.

Skinner, N., & Pocock, B. (2008). Work, Life and Workplace Culture. *The Australian Work and Life Index (AWALI) 2008*, Adelaide: Centre for Work Life, University of South Australia.

Smith, A., Wadsworth, E., Moss, A., & Simpson, S. (2004). *The scale and impact of drug use by workers health and safety.* Retrieved from www.hsebooks.co.uk .

Spector, P. E., Cooper, C. L., Poelmans, S. A. Allen, T. D., O'Driscoll, M., Sanchez, J. I., Siu, O. L., Dewe, P., Hart, P., & Lu, L. (2004). A cross-national comparative study of work-family stressors, working hours, and well-being: China and Latin America versus the Anglo world. *Personnel Psychology, 57*(1), 119–142.

Valcour, M. (2007). Work-based resources as moderators of the relationship between work hours and satisfaction with work-family balance. *Journal of Applied Psychology, 92*(6), 1512-1523.

Venkatesh, A. (1995). Ethnoconsumerism: A New Paradigm to Study Cultural and Cross-Cultural Consumer Behaviour, in Costa, J. and Bamossy, G. (Eds.) Marketing in a multicultural world-Ethnicity, *Nationalism and Cultural Identity*, London: Sage Publications, 68-104.

Voydanoff, P. (2005). Consequences of Boundary-Spanning Demands and Resources for Work-to Family Conflict and Perceived Stress. *Journal of Occupational Health Psychology*, *10*(4), 491- 503.

Voydanoff, P. (2005). Consequences of Boundary-Spanning Demands and Resources for Work-to Family Conflict and Perceived Stress. *Journal of Occupational Health Psychology*, *10*(4), 491- 503.

Yildirim, D., & Aycan, Z. (2008). Nurses' work demands and work-family conflict: A questionnaire survey. *International Journal of Nursing Studies, 45*(9), 1366-1378.
Zealand. Retrieved from http://core.ac.uk/download/pdf/56361186.pdf.

# වතු ජනතාවගේ මානව සම්පත් සංවර්ධනය : බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්

ඩී.කේ. මහේෂා සාවිත්‍රි නන්දසිරි[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාව සමස්තයක් ලෙස ඉහළ මානව සංවර්ධන දර්ශකයකට හිමිකම් කීවද, වතු ජනතාවගේ ජීවන තත්වය ඉතා දුෂ්කර තත්වයක පවතියි. ඒ අනුව වතු ජනතාවගේ මානව සම්පත් සංවර්ධනය පහළ මට්ටක පවතින්නේ ඇයි? යන්න මෙම අධ්‍යයනයේ ගැටළුව වේ. වතු කම්කරුවන්ගේ සමාජ, ආර්ථික පසුබිම් තත්වය හඳුනා ගැනීමත්, ඔවුන් මුහුණ දෙන සමාජ, ආර්ථික ගැටළු අධ්‍යයනය කිරීම මෙන්ම එම ගැටළු විසඳීම සඳහා රජය ගෙන ඇති ක්‍රියා මාර්ග සහ එහි අඩු පාඩුකම් පිළිබඳව හඳුනා ගැනීමත් මෙම අධ්‍යයනයේ අරමුණු වේ. අධ්‍යයන ප්‍රදේශය ලෙස බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වතු හතරක් තෝරා ගත් අතර ප්‍රශ්නාවලියක් සහ සම්මුඛ සාකච්ඡා මඟින් ප්‍රාථමික දත්ත ලබා ගන්නා ලදී.එමෙන්ම ද්විතීක දත්ත ලෙස ග්‍රන්ථ, සඟරා, ලිඛිත වාර්තා, ලිපි ලේඛණ, පුවත්පත් සහ අන්තර්ජාලය භාවිතා කරන ලදී.වතු පවුල් 80ක නියැදි සමීක්ෂණය ඇසුරින් ලබා ගත් දත්ත විශ්ලේෂණය SPSS පරිගණක මෘදුකාංගය මඟින් සිදු කරන ලදී. වතු ජනතාව තුළ පවතින අඩු අධ්‍යාපන මට්ටම සහ ඒ තුළින් ඇති වන නූගත් බව, අවම සෞඛ්‍ය පිළිවෙත්, ආර්ථික දුෂ්කරතා, ඔවුන්ට ආවේණික චර්යා රටා, මානව සංවර්ධනය සඳහා රජය විසින් විවිධ ක්‍රියා මාර්ග සම්පාදනය කර තිබුණ ද ඒවා වතු ජනතාව අතර ක්‍රමවත්ව ක්‍රියාත්මක නොවීම තුළින් මානව සම්පත් සංවර්ධනය පහළ මට්ටමක පවතියි. වතු ජනතාවගේ චර්යා රටා සහ ආකල්ප වෙනස් කිරීම ද, රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී බිම් මට්ටමේ නිලධාරීන් සහ ජනතාව අතර සමීප සබඳතාවක් ඇති කිරීම සහ පහළ සිට ඉහළට ක්‍රියාත්මක වන සැලසුම් මාලාවක් ඇති කිරීම තුළින් වතු ජනතාවගේ මානව සම්පත් සංවර්ධනය ඇති කිරීමට හැකියාව ලැබේ.

***ප්‍රමුඛ පද :*** *මානව සම්පත් සංවර්ධනය , වතු ජනතාව, රාජ්‍ය ප්‍රතිපත්ති, මානව සංවර්ධනය*

## හැඳින්වීම

සංවර්ධනය යන්න ඉතා පුළුල් දිශානතියක් දක්වන්නකි. එය ආර්ථික, සමාජීය, සංස්කෘතික, දේශපාලනික ලෙස විවිධ පැති හරහා යොමු වේ. ලොව ඇති සම්පත් ප්‍රධාන ලෙස කොටස් දෙකකට බෙදිය හැකිය. එනම්, මානව සම්පත් සහ භෞතික සම්පත් වශයෙනි. වර්තමානය වන විට ප්‍රබල සංවර්ධනයක් කරා යාමට මානව සම්පතට හැකියාව ලැබීම ඉතා විශිෂ්ටත්වයක් ලෙස සැලකිය හැකිය. සියලුම භෞතික සම්පත් සම්පතක් බවට පත් වනුයේ මිනිසාගේ මැදිහත් වීමකින් යුතුවය (අභයරත්න,2001).

[1] දේශපාලන විද්‍යා අධ්‍යයන අංශය maheshasavithri.n@gmail.com

මානව සම්පත් සංවර්ධනය යන්න 1950 ගණන් තුළ ප්‍රචලිත වූ අදහසකි. මෙම යුගයේ සම්ප්‍රදායික යෙදුම අනුව අධ්‍යාපනය, පුහුණුව, කුසලතා, හැඩගැස්ම සහ සෞඛ්‍ය දියුණුව තුළින් ශ්‍රමයේ ඇති වන ගුණාත්මක වෙනස්කම් ද අර්ථවත් වන පරිදි එහි මුල් පදය වූ "ශ්‍රමය" යන්න වෙනුවට මානව සම්පත් සංවර්ධනය භාවිතයට ගන්නා ලදී. මානව සම්පත් සංවර්ධනය යනු "නිරෝගිමත් සහ දිගු කාලීන දිවියක් ගත කිරීමට ඇති හැකියාව ප්‍රචාරණය කිරීම සහ දැනුම ලබා ගැනීමටත්, ශීලාචාර දිවි පැවැත්මකට අවශ්‍ය සම්පත් වලට ප්‍රවේශ වීමේ අවකාශය පුළුල් කිරීම" ලෙස සරලව නිර්වචනය කළ හැකිය.

වර්තමාන ලෝක තත්වය පිළිබඳ අවධානය යොමු කිරීමේදී මානව සම්පත් සංවර්ධනය සිදු වී ඇත්තේ විවිධාකාරයෙනි. සංවර්ධිත රටවල් බොහෝමයක් ඉදිරියට ගොස් ඇති අතර සංවර්ධනය වෙමින් පවතින රටවල් පසුබෑමකට ලක් වී ඇත.

**උදාහරණ -: 2015 වර්ෂය වන විට රටවල්වල මානව සංවර්ධනය,**
ඕස්ට්‍රේලියාව- 0.939 , ජපානය- 0.903 , සිංගප්පූරුව- 0.925 , බංගලාදේශය- 0.579 ,ඉන්දියාව- 0.624 , උගන්ඩාව- 0.493 , ශ්‍රී ලංකාව- 0.766

"ශ්‍රී ලංකාව පොහොසත් රටක් නොවේ. ලක්වැසියෝ දුප්පත්ය " යන කියමන ප්‍රකට කියමනකි.ශ්‍රී ලංකාව පොහොසත් නොවේ යැයි නිගමනය කරනුයේ ලක්වැසි බොහෝ දෙනාගේ සෑහීමට සහ සෞඛ්‍යයට අවශ්‍ය ආහාරපාන, ඇඳුම් පැළඳුම්, ඉඳුම් හිටුම්, යනාදිය ලබා ගැනීමට තරම් වත්කමක් ඔවුනට නැති බැවිනි. එනම් ඇතැම් පිරිසට යැපුම් තත්වයෙහි වත්, ජීවත් වීමට අවශ්‍ය දේ ගැනීමට තරම් වත් වත්කමක් නැත. සමහරුන්ට තම හැකියාවන් දියුණු කර ගැනීමට තරම් වත්කමක් ද නොමැත. මෙම කරුණු සලකමින් ලංකාවේ ජීවන තත්වය සෑහීමකට ප්‍රමාණවත් නොවේ යැයි නිගමනය කරයි. එහෙත් ආර්ථික අතින් දියුණු වූ ඇමරිකා එක්සත් ජනපදය වැනි රටක නම් බොහෝ දෙනෙකුට අවශ්‍යතාවයන් නොමඳ වශයෙන් ද, අප බොහෝ දෙනා සුඛෝපභෝගී යැයි සලකන දේ ප්‍රමාණවත් වශයෙන් ද තිබෙන බැවින් එරට වැසියන්ගේ ජීවන තත්වය උසස් යැයි කියනු ලැබේ. ජීවන තත්වයට බොහෝ දේ ඇතුළත් වේ. ජන සංඛ්‍යාව, බුදින ආහාර ප්‍රමාණය සහ එහි ගුණය වැනි මින් සමහරක් මැනිය හැකි දේය. ජනතාවට ලැබෙන අධ්‍යාපනයේ තත්වය වැනි අන් දේ ඍජුවම මැනිය නොහැක. එබැවින් මැනිය හැකි සාමාන්‍යයෙන් මුදල් දී ගත යුතු ආහාර, නිවාස, සහ ඇඳුම් යනාදිය පමණක් " ජීවන තත්වය " මැනීමේ දී සලකා බැලීම සාමාන්‍ය සිරිතයි. තව ද යම් රටක අභිමත යැයි සැලකෙන ජීවන තත්වයේ මට්ටම රටින් රටට වෙනස් වේ. යම් රටක දේශගුණය සභ්‍යත්වය ආදී නොයෙකුත් දේ මෙම අවම තත්වය තීන්දු කිරීමේ දී බලපායි. යම් රටක අවම ජීවන තත්වය විය යුත්තේ කුමක්ද යන්න පිළිබඳව මහජන මතය ද වෙනස් විය හැකිය.

සමහරෙක් සිතන අන්දමට නම් මිනිසෙකුට යැපුම් තත්වයටවත් පැමිණීමට අදාළ වන ඉතාම ලාභ ආහාර, ඇඳුම් සහ නිවාස යනාදියේ ප්‍රමාණය අවම ජීවන තත්වය ලෙස ගැනේ. තවත් සමහර අයගේ අදහස් අනුව අවම ජීවන තත්වයට ඇතුලු විය යුත්තේ උසස් ලෙස ජීවිතය ගත කිරීමට අවශ්‍ය දේ පමණක් නොව මානසික නිපුණත්වය පවා ලබා දෙන දේ එයට අයත් වේ. යම් රටක ආර්ථික තත්වය මැනවින් දියුණු වී ඇත්නම්, එවැනි වූ උසස් ආර්ථික තත්වයක් නඩත්තු කර ගැනීමට එරට වැසියන්ට

ශාරීරික සහ මානසික නිපුණත්වයක් තිබිය යුතු බව මතක තබා ගත යුතුය. මනුෂ්‍යයෙකුගේ ජීවන තත්වය රඳා පවතිනුයේ ඔහු නියමිත කාල පරිච්ඡේදයක් ඇතුළතදී පරිභෝජනයට ගන්නා ආහාර, ඇඳුම්, නිවාස, විදුලි බලය, වෛද්‍ය සේවය යනාදිය මතයි. තවද යමෙකුගේ පරිභෝජනයට ගත හැකි දේ ඔහුට ලැබෙන මුදල් ආදායම අනුව සීමා වෙයි. එහෙයින් ජීවන තත්වය මැනීමේදී මුදල් ආදායම ඉතා වැදගත්ය.

ශ්‍රී ලංකාව තුළ ග්‍රාමීය, නාගරික, වතු ලෙස කොටස් තුනකට ජනතාව බෙදිය හැකිය. ග්‍රාමීය අංශයේ වැඩි ප්‍රවණතාවක් ද, නාගරික අංශයේ ඉහළ ප්‍රවණතාවයක්ද, මධ්‍යස්ථ ප්‍රමාණයේ අඩු සංවර්ධන තත්වයක් වතු ආශ්‍රිතව දක්නට ලැබේ. නමුත් ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයට වතු කම්කරු දායකත්වය සුවිශේෂ වේ. (පියරත්න.ඒ,2005). ශ්‍රී ලංකාවට විශාල විදේශ විනිමයක් අත්කර දුන්නද, ආර්ථික සහ සමාජ සංවර්ධනය අතින් ඔවුන් තවමත් පහළ මට්ටමක පසු වේ. වතු ජනතාව ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායේ ප්‍රධාන කොටසක් ලෙස සැලකිය හැකිය. නමුත් වතු ක්ෂේත්‍රය ආශ්‍රිත අධ්‍යාපනික තත්වය රටේ පොදු අධ්‍යාපනික මට්ටමට වඩා පහත් මට්ටමක පවතියි. එමෙන්ම ඉතා අඩු සෞඛ්‍ය තත්වයක් දක්නට ලැබේ. මොවුන්ගේ අපිරිසිදු බව එයට හේතුන් ය. අපිරිසිදු බවට හේතුව වාසස්ථාන පිණිස ලැබුණු සීමිත ඉඩ ප්‍රමාණයයි. වතු ආශ්‍රිතව උද්ගත වී ඇති ඛේදනීය තත්වය වනුයේ වර්තමානයේ ඔවුන් එක විට රැකියාවන් දෙකක නිරත වීමයි. මොවුන් වතු වල මෙන්ම නගර බඳව කුලී වැඩ සොයා යයි. වැඩි මුදලක් සොයා ගැනීමේ අභිප්‍රාය වනුයේ ඔවුන් තුළ දැවෙමින් පවතින දරිද්‍රතාවයේ විෂම චක්‍රය ක්‍රියාත්මක වීමයි. මෙවැනි ආර්ථික සහ සමාජ දර්ශක මඟින් වතු ජනතාව තුළ අඩු මානව සම්පත් සංවර්ධනයක් සිදු වන බව පෙනී යයි.

19 වන සියවසේදී බ්‍රිතාන්‍යයන් විසින් අපනයන භෝගයක් ලෙස තේ කර්මාන්තය දියුණු කිරීමට පියවර ගනු ලැබීය. ඒ සඳහා වැටුප් මත සේවය කිරීමට මෙරට ලාංකිකයන් අකමැති වූයෙන්, අර්ධ වහල් සේවකයන් ලෙස ඉන්දියානු දෙමළ ජනයා මෙහි ගෙන්වා තේ වගාව සඳහා යොදවනු ලැබීය. ඔවුන් තේ වත්තේ කෙළවර පදිංචි කරනු ලැබීය. මෙලෙස පැමිණි දමිළ වතු කම්කරු ජනතාව මේ වනවිට ලංකාවේ ජනගහනයෙන් 8%ක් පමණ වේ. පුද්ගලික දේපලක් මත තාවකාලික පදිංචිකරුවන් ලෙස ජීවත් වන ඔවුන්ගෙන් බහුතරයකට ස්ථිර පදිංචියක්, ලිපිනයක් තවමත් නැත. සාධනීය පියවරක් වශයෙන් දැකිය හැක්කේ ඔවුන්ගේ උප්පැන්න ලියාපදිංචිය සහ ඡන්දය භාවිතා කිරීමේ අයිතිය ලැබී තිබීම පමණි (දුනුසිංහ,2015). නමුත් මානව සම්පත් සංවර්ධනය තුළින් අවසාන වශයෙන් සමස්ත සමාජයේම සමාජීය සංවර්ධනය අපේක්ෂා කරයි. ඒ අනුව මෙම වතු ජනතාවගේ මානව සම්පත් සංවර්ධනය පහළ මට්ටමක පවතින්නේ ඇයි? යන්න මෙම පර්යේෂණයේ ගැටළුව වේ.

**සාහිත්‍ය විමර්ශනය**

ලීලාවතී ( 1982 ) විසින් දෙනියාය ප්‍රදේශය ඇසුරින් අධ්‍යනයක් සිදු කර ඇත. ඇය දක්වන පරිදි මෙරටට පැමිණි සෑම වතු කම්කරුවෙකුගේම පෞද්ගලික අනන්‍යතාව දක්වන " සපත්තු සීට්ටුව " ඔහු අයත් වන කුලය කුමක්දැයි පැහැදිලිව දක්වයි. නමුත් මෙම කුල ක්‍රමයට අනුකූලව නොවුවහොත් එය ජනයා අතර කැරලි කෝලාහල සඳහා තුඩු දෙනු ඇතැයි යන බියෙන් වතු පාලකයෝ රැකියා සඳහා තෝරා ගැනීමේදී කුල ක්‍රමය පිළිබඳව සලකනු ලබයි. මෙම අඳුරු සමාජ රටාව විසින් පහත් යැයි

සම්මත කම්කරු පවුල්වල අධ්‍යාපනය කෙරෙහි නිසරු ආකල්පයක් ඇති කොට ඇත. පහත් කුලවලට අයත් වැඩි දෙනා අක්ෂර ඥාණය නොමැති වූවන් බව ද ළමුන් පාසල් නොයවා සිටීමට ද ඇතමුන් උත්සහ කරන බව නිගමනය කර ඇත. ප්‍රාථමික සහ ද්විතීක දත්ත භාවිතය තුළින් පර්යේෂණය සිදු කර ඇති අතර මෙම අධ්‍යයනයේදී වතුකර ජනතාවගේ අධ්‍යාපනය සම්බන්ධව පමණක් අවධානය යොමු කර ඇත.

රත්නපාල ( 1987 ) විසින් කළුතර දිස්ත්‍රික්කයේ ගම් තුනක් පදනම් කර ගනිමින් කළ සමීක්ෂණයක් මඟින් සම අධ්‍යාපන අවස්ථා ඇති කිරීමෙහිලා බලපාන දුෂ්කරතා සහ ගැටලු පිළිබඳව අධ්‍යයනයක් සිදු කර ඇත. එම අධ්‍යයනයේදී ඔහු පහත නිගමන සඳහා එළඹී ඇත.

I. වතුකරයේ දෙමළ සිසුන් හට බොහෝ විට දෙමළ මාධ්‍ය පාසල් නැත.
II. අනාගත කම්කරු රැකියා කෙරෙහි ඇති බලාපොරොත්තුව ළමා මෙහෙකාර වෘත්තිය නිසා වතුකරයේ බොහෝ ශිෂ්‍යයින්ට අධ්‍යාපන අවස්ථා අහිමි වී ඇත.
III. ආර්ථික දුෂ්කරතා අධ්‍යාපන සම අවස්ථා සැලසීමට බාධකයක් වන අතර විශේෂයෙන් එය දෙමළ දරුවන් හට බලපායි.
IV. ආර්ථික දුෂ්කරතා නිසාවෙන් දෙමව්පියන් සමාජ විරෝධී කටයුතුවල යෙදීම ළමා පරපුරේ අධ්‍යාපනය විනාශ කිරීම කෙරෙහි බලපෑම් ඇති කරයි.
V. ජාතිවාදී හැඟීම් නිසා දෙමළ මව්පියන් තම දරුවන් සිංහල මාධ්‍ය අධ්‍යාපනය කෙරෙහි යොමු කිරීමට උනන්දු නොවේ.

මෙම අධ්‍යනය තුළින්ද වතු ජනතාවගේ අධ්‍යාපනය සම්බන්ධව වැඩි අවධානයක් යොමු කර ඇත.

Transparency International Sri lanka (2010) විසින් වතු පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක භාවය පිළිබඳ මිනිසුන්ගේ අදහස් හා අත්දැකීම් පිළිබඳව සකස් කරන ලද වාර්තාවකට අනුව වතු ජනතාව ඓතිහාසිකව සමාජීය සහ ආර්ථිකමය වශයෙන් දුර්වල වන අතර එම තත්වයෙන් නැඟී සිටීමට නම් අධ්‍යාපනය මෙවලමක් කර ගත යුතු බව සඳහන් කර ඇත. කෙසේ වෙතත් වැවිලි පාසල්වල සිසුන් අධ්‍යාපනය ප්‍රයෝජනයට ගැනීමට එතරම් උනන්දුවක් නොදක්වන බව මේ තුළින් පැහැදිලි කර ඇත.

“Children Of Plantation Communities In Sri Lanka”(2009) නම් මාතෘකාව යටතේ වැවිලි ග්‍රාමීය අධ්‍යාපනය පිළිබඳව අධ්‍යනයක් සිදු කර ඇත. ශ්‍රී ලංකාවේ සංවර්ධනය සහ සහයෝගීතාව සඳහා SWISS නියෝජිත ආයතනය මඟින් නුවරඑළිය දිස්ත්‍රික්කයේ බොගවන්තලාව ප්‍රදේශය ආශ්‍රයෙන් අධ්‍යයනය සිදු කර ඇත.ශ්‍රී ලංකාවේ සාක්ෂරතාව 94% වුවද සාපේක්ෂව වතු දරුවන්ගේ සාක්ෂරතාවය 0.1% පමණ වේ. එමෙන් ම වතු දරුවන්ට බලපාන ගැටලු අතර ඔවුන් රටේ බොහෝ ප්‍රදේශවල දේශීය කම්කරුවන් සහ සුළු සේවකයින් ලෙස සේවය කරමින් සිටින අතර ඔවුන් සම්පූර්ණ අධ්‍යාපනයම අහිමි කරගෙන ඇති බව සඳහන් කර ඇත.

නිමාලි (2016 ) විසින් වතු ජනතාවගේ දරුවන්ගේ අධ්‍යාපන කුසලතා සහ ආර්ථිකමය තත්වය පිළිබඳව කරන ලද පර්යේෂණයක් තුළින් වතු ජනතාවගේ අධ්‍යාපන මට්ටමේ සාර්ථක සහ අසාර්ථක බව පිළිබඳව සාකච්ඡා කර ඇත. මෙම අධ්‍යයනය ආනුභාවික අධ්‍යනයක් ලෙස සිදු කර ඇති අතර ද්විතීක

දත්ත ලෙස වතු අධ්‍යාපනය ආශ්‍රයෙන් කරන ලද සමීක්ෂණ 7ක් අධ්‍යයනය කර නිගමන ලබා ගෙන ඇත. වතු අංශයේ අධ්‍යාපනය අනෙකුත් අංශවලට වඩා පහළ මට්ටමක පවතින බව හා සාක්ෂරතා මට්ටමත්, අධ්‍යාපන සහභාගීත්වයත් අවම මට්ටමක පවතින බව නිගමනය කර ඇත. එයට ප්‍රධාන හේතුව ලෙස ආර්ථික හේතු බලපා ඇති බව සඳහන්කර ඇත.

දුනුසිංහ (2015) විසින් සිදුකර ඇති පර්යේෂණයක් තුළින් ශ්‍රී ලංකාවේ වැවිලි වගාව ආශ්‍රිත වතු ශ්‍රමිකයන්ගේ ජීවන තත්වය පිළිබඳව විමර්ශනයක් සිදු කර ඇත. වතු ශ්‍රමිකයින්ගේ පැමිණීම, ඔවුන් ජීවත් වූ ආකාරය, මෙරට රජයන් විසින් ඔවුන් වෙනුවෙන් අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ වර්තමානයේ ඔවුන්ගේ සේවය පිළිබඳව මෙමඟින් අවධානය යොමුකර ඇත.වතු ජනතාවගේ ජීවන තත්ත්වය අනෙක් අංශයන්ට සාපේක්ෂව අඩු දියුණු මට්ටමක් පවතින බවත්, නූගත් බව, දක්ෂතා අඩුකම, අවම වරප්‍රසාද, අවශ්‍ය යටිතල පහසුකම් නොමැති වීම වැනි ගැටළු නිසා දිළිඳුකම ඔවුන්ගේ සමාජ ගැටළුවක් බවට පත් වී ඇති බවත් නිගමනය කර ඇත.

**අධ්‍යයන ක්‍රමවේදය**

මෙම අධ්‍යයනය සඳහා ශ්‍රී ලංකාවේ ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්ලේන් ඇල්පින් ග්‍රාම නිලධාරී වසම, තෙල්බැද්ද වත්ත ග්‍රාම නිලධාරී වසම,වේවැස්ස ග්‍රාම නිලධාරී වසම, සිරිමල්ගොඩ ග්‍රාම නිලධාරී වසම යන ග්‍රාම නිලධාරී වසම් හතරේ වතු හතරක් තෝරා ගන්නා ලදී. බහුතරයක් වතු ජනතාව ජීවත් වීම සහ ඔවුන් අතිශය දුෂ්කර ජීවිත ගත කිරීම මෙම ග්‍රාම නිලධාරී වසම් හතර තෝරා ගැනීමට හේතු විය.


මෙම අධ්‍යයනයේ පසුබිම සකස් කිරීමට අවශ්‍ය වන තොරතුරු ලබා ගැනීමට ද්විතීක මූලාශ්‍ර පරිශීලනය කිරීම අත්‍යවශ්‍ය විය. ඒ අනුව මහ බැංකු වාර්ෂික වාර්තා, බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් සහ අදාළ ග්‍රාම නිලධාරී වසම්වල ග්‍රාම නිලධාරීන්ගෙන් මෙම ප්‍රදේශ පිළිබඳව දත්ත වාර්තා ලබා ගත් අතර ලිපි, සඟරා, පොත්පත් සහ වතු ජනතාව සම්බන්ධව සිදුකර ඇති වෙනත් පර්යේෂණ අධ්‍යයනයන්ගෙන් ද ද්විතීක දත්ත ලබා ගැනුණි.

මෙම අධ්‍යයනයේ ප්‍රාථමික දත්ත ලබා ගැනීම සඳහා ප්‍රශ්ණාවලියක් සහ සම්මුඛ සාකච්ඡා ක්‍රම යොදා ගනු ලැබීය.වතු හතරෙන් අහඹු ලෙස තෝරා ගන්නා ලද පවුල් තුළින් සහ වතු ජනතාව සඳහා බදුල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටුවා ඇති ආයතන සහ නිලධාරීන්ගෙන් අවශ්‍යය තොරතුරු ලබා ගැනුණි. ලබා ගත් දත්ත SPSS මෘදුකාංගය භාවිතා කර සංඛ්‍යා, වගු, ප්‍රස්තාර භාවිතයෙන් විශ්ලේෂණය කරන ලදී.

**දත්ත විශ්ලේෂණය සහ ප්‍රතිඵල**

*පවුලේ සාමාජිකයින් ගණන*

ප්‍රස්තාර අංක 01





මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය 2018.

නියදි සමීක්ෂණයේදී අහඹු ලෙස තෝරා ගත් කුටුම්භ 80 තුළ සිටින සාමාජිකයින් ගණන ප්‍රස්තාර අංක 01 දක්වා ඇත. ඒ අනුව ගම්‍ය වනුයේ වතු ජනතාවගේ නිවෙස් තුළ අවම වශයෙන් සාමාජිකයින් 60-09 ත් අතර ප්‍රමාණයක් සිටින බවයි. වතු පවුල් තුළ දරුවන් විශාල ප්‍රමාණයක් සිටීම දැක ගත හැකිය. වයස අවුරුදු 60ට වැඩි සාමාජිකයින් සිටින්නේ ඉතා සීමිත ප්‍රමාණයකි. වතු ජනතාවගේ ආයු කාලය දීර්ඝ නොවීම මෙහිදි නිරීක්ෂණය වූ තත්වයකි. කෙසේ නමුත් පවුලක සිටින අධික සාමාජිකයින් ප්‍රමාණය මත ඔවුන්ට ආර්ථික හා සාමාජීය වශයෙන් ගැටළු ගණනාවකට මුහුණ දීමට සිදු වී ඇත.

*දෙමව්පියන්ගේ අධ්‍යාපන මට්ටම*

ප්‍රස්තාර අංක 02





මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය 2018.

වතු තුළ ජීවත් වන ජනතාවගේ අධ්‍යාපනික මට්ටම ප්‍රස්තාර අංක 02හි දක්වේ. එයින් පැහැදිලි වනුයේ සමස්තයක් ලෙස පාසල් නොගිය පිරිසෙහි සංඛ්‍යාව වැඩි බවකි. එය සමස්ත නියදියෙන් 53% කි. ඉන් පසුව බහුතර සංඛ්‍යාවක් ප්‍රාථමික අධ්‍යාපනය පමණක් ලබා ඇත. ද්විතියික අධ්‍යාපනය ලබා ඇත්තේ මුළු නියදියෙන් 9% කි. උසස් පෙළ හදාරා ඇත්තේ සමස්ත නියදියෙන් 4%කි. වෘත්තීය අධ්‍යාපනය ලබා ඇත්තේ 3%කි. විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබූ කිසිදු වැඩිහිටි පුද්ගලයකු වතු හතරෙහිම නොසිටීම කණගාටුදායක තත්වයකි. බහුතරයක් පාසල් නොයෑම තුළින් අධ්‍යාපනයේ වටිනාකම මෙම ජනතාව තුළ නොපවතින බව ගම්‍ය වේ. හුදෙක් දෛනික ජීවිතය පවත්වා ගෙන යාම සඳහා මුදල් ඉපයීමේ ඉලක්කය පමණක් ඔවුන් සතු විය. විශේෂයෙන් ඔවුන් අභිමුඛව පවතින ගැටළු රාශියකට හේතුව වන්නේ යහපත් අධ්‍යාපනික පසුබිමක් නොමැති වීමයි. අධ්‍යාපනය නොමැති වීමෙන් ඇති වන නූගත් බව, නොදැනුවත් බව, සෘණාත්මක ආකල්ප හේතුවෙන් ඔවුන් අදටත් පසුගාමී ජීවිත ගත කරන ජන කොටසක් බවට පත් වී ඇත.

*දෙමව්පියන්ගේ රැකියා තත්වය*

ප්‍රස්තාර අංක 03





මූලාශ්‍රය- ක්ෂේත්‍ර සමීක්ෂණය, 2018.

ප්‍රස්තාර අංක 03 යටතේ වතු තුළ ජීවත් වන දෙමව්පියන්ගේ රැකියා තත්වය සලකා බැලීමේදී පැහැදිලි වනුයේ බහුතර පිරිසක් වතු ආශ්‍රිත රැකියාවල නිරත වන බවයි. අද රටෙහි සාමාන්‍ය කම්කරු දෛනික වැටුප රු.1500-2000 ත් අතර වේ. නමුත් වතු කම්කරු දෛනික වැටුප ඉතාම සුළු මුදලකි. මෙම වැටුප ලබා ගැනීම සඳහා කම්කරුවකු විසින් තේ දලු කිලෝ 18-20 ත් අතර ප්‍රමාණයක් නෙළිය යුතුය. රබර් කිරි කැපීම සහ වෙනත් වතු කම්කරු රැකියා සම්බන්ධයෙන් ද මෙවැනි ඉලක්ක තිබේ. වතු කම්කරුවන්ට වැඩ ලැබෙන දින ගණන තීරණය වන්නේ වත්තේ ස්වභාවය අනුවයි. ඇතැම් වතුවල කම්කරුවන්ට මාසයකට දින 14ක් වත් වැඩ නොලැබේ.මෙම තත්වයන් තුළ විශාල සාමාජිකයින් ප්‍රමාණයක් සිටින පවුලක් නඩත්තු කරනුයේ කෙසේද යන්න විශාල ගැටළුවකි. ජීවත් වීමට අවශ්‍ය ආහාර ඇතුළු සියල්ල පිටතින් මිලදී ගැනීමට සිදු වන නිසා විශාල ආර්ථික අර්බුදයකට වතු ජනතාව මුහුණ පාමින් සිටියි.

*මාසික ආදායම් තත්ත්වය*

ප්‍රස්තාර අංක 04





මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය 2018.

ඔවුන්ගේ මාසික ආදායම පිළිබඳ තොරතුරු ප්‍රස්තාර අංක 04 හි දක් වේ. බහුතරයක් දෙනා 8000 - 10000 ත් අතර මාසික ආදායමක් උපයනු ලබයි.


10000ට වැඩි මුදලක් උපයන පිරිස් විදේශ රැකියාවල හෝ වෙනත් රැකියාවල නිරත වන අය බව සමීක්ෂණයේදී අනාවරණය වූ කරුණාවක් විය. මෙම වතු ජනතාවගේ මාසික ආදායම පිළිබඳව විමසීමේදී ගම්‍ය වනුයේ ඔවුන්ට අවශ්‍ය අවම පහසුකම්වත් ළඟා කර ගැනීමට ඔවුන්ගේ මුදල් ප්‍රමාණවත් නොවන බවයි.මෙම තත්වය තුළ ඔවුන්ගේ අධ්‍යාපනය, සෞඛ්‍ය යන අත්‍යවශ්‍ය ක්ෂේත්‍රවල පසුගාමී තත්වයක් දක්නට ලැබේ. ප්‍රාථමික අධ්‍යාපනයෙන් හෝ සාමාන්‍ය පෙළින් පසු බහුතරයක් දෙනා පාසල් ගමනින් සමුගන්නේ මෙම ආර්ථික ගැටලු හේතුවෙන් බව සනාථ විය.

*ඉතිරි කිරීම් සහ ණය*

ප්‍රස්තාර අංක 05 වතු ජනතාවගේ ඉතිරි කිරීම්




ප්‍රස්තාර අංක 06 වතු ජනතාවගේ ණය ලබා ගැනීම්




වතු ජනතාවගේ ඉතිරි කිරීම් සහ ණය පිළිබඳව

මූලාශ්‍රය- ක්ෂේත්‍ර සමීක්ෂණය, 2018.

ප්‍රස්තාර අංක 05,06 හි සඳහන් වේ.ඒ අනුව පැහැදිලි වනුයේ ඉතිරි කිරීම් නොමැති ප්‍රජාව බහුතරයක් වන බවය. ඔවුන්ට ඉතිරි කිරීමට තරම් මුදල් ප්‍රමාණයක් නොමැත.දෛනිකව ලැබෙන්නා වූ ඉතා සුළු මුදල ඔවුන්ට දිනක තම අවශ්‍යතා සපුරා ගැනීමටවත් නොසෑහේ. ඔවුන්ගේ එකම අපේක්ෂාව එදිනෙදා තම කුස පුරවා ගැනීම මිස මුදල් බැංකුවල තැන්පත් කිරීම නොවේ. යම් මුදල් ප්‍රමාණයක් හෝ ඉතිරි කර තිබෙන්නේ විදේශ රැකියාවල නිරත වන හෝ වෙනත් කර්මාන්ත හෝ සේවා සිදු කරන පිරිස් වේ. මෙම පවුල්වල බහුතරය ණය ගැනීම් සිදු කර නොමැත. බහුතරයක් වතු ජනයා ණය ලබා ගැනීම

සඳහා යොමු නොවන්නේ ණය පියවීමට තරම් වත්කමක් ඔවුන් සතු නොවීමයි.ඔවුන් ණය ලබා ගැනීමේදී ඉතා කුඩා ණය සඳහා යොමු වන බවක් දක්නට ලැබේ. ලක්ෂයට වැඩි ණය ප්‍රමාණයක් ලබා ගෙන ඇත්තේ විදේශ ගත වීම් සඳහා සහ වෙනත් ආර්ථිකමය කාරණා සඳහාය. ඔවුන් තුළ ඉතිරි කිරීමටද ආදායමක් නොමැති අතර ණය ගැනීමෙන් පසු එම ණය පියවීමට ද ආදායමක් නොමැත. ඒ අනුව වතු ජනතාවගේ ආර්ථිකයේ පවතින පරිහානිය පැහැදිලි වේ.

*දරුවන්ගේ අධ්‍යාපන තත්ත්වය*

වගු අංක 01

| | | දරුවන් පාසල් යාම | |
|---|---|---|---|
| | | ඔව් (පවුල් සංඛ්‍යාව | නැත (පවුල් සංඛ්‍යාව) |
| වත්ත | හිඟුරුගමුව වත්ත | 20 | 0 |
| | තෙල්බැද්ද වත්ත | 20 | 0 |
| | වේවැස්ස වත්ත | 20 | 0 |
| | කලන් වත්ත | 20 | 0 |
| එකතුව | | 80 | 0 |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය 2018.

වගු අංක 01 හි එක් එක් වතු තුළින් අහඹු ලෙස තෝරා ගත් සමස්ත පවුල් 80 තුළම සිටින දරුවන් පාසල් අධ්‍යාපනය ලබා තිබීම සම්බන්ධව ඒකරාශී කර ගත් දත්ත සඳහන් වේ. මේ අනුව පැහැදිලි වනුයේ වතු දරුවන් සියල්ලක්ම පාහේ පාසල් යාමේ ප්‍රවණතාවයක් පවතින බවයි.ප්‍රශ්ණාවලිය තුළින් ලබා ගත් දත්ත අනුව පැහැදිලි වනුයේ  පාසල් අවසන් කර ඇති දරුවන් අවම වශයෙන් සාමාන්‍ය පෙළ දක්වා ඉගෙනුම ලබා ඇති බවයි.සමස්ත නියැදියෙන් තිදෙනෙකු කලා අංශයෙන් විශ්වවිද්‍යාල වරම් හිමි කර ගෙන තිබූ අතර එක් අයෙකු ගණිත අංශයෙන් විශ්වවිද්‍යාල වරම් හිමි කර ගෙන ඇත. එක් අයෙකු විවෘත විශ්වවිද්‍යාලයේ බාහිර උපාධිය හදාරමින් සිටියි.දරුවන් අට දෙනෙකු පමණ වෘත්තීය අධ්‍යාපනය සඳහා යොමු වී ඇත. දරුවන්ගෙන් බහුතරයක් ද්විතියික අධ්‍යාපනයෙන් පසුව රැකියාවන් සඳහා යොමු වී ඇත. දැනට පාසල් යන දරුවන් බහුතරයක් තුළ උසස් අධ්‍යාපන වරම් හිමි කර ගැනීමේ අභිප්‍රායක් නොමැති බව සමීක්ෂණයේදී අනාවරණය විය. දැනට අධ්‍යාපනය හදාරන වැඩිහිටි දරුවන් තුළ තිබෙන හැඟීම වනුයේ ඉක්මණින් රැකියාවක් කිරීමයි. ඔවුන් ද උසස් අධ්‍යාපනය තෙක් ගමනක් යන බව විශ්වාස කිරීමට අසීරුය. එයට මූලිකම හේතුව ඔවුන් සතුව පවතින ආර්ථික ගැටලු වේ.

*නිවාසවල තත්ත්වය*

වගු අංක 02

| නිවසේ ඇති පහසුකම් | හිඟුරුගමුව වත්ත | තෙල්බැද්ද වත්ත | වේවැස්ස වත්ත | යූරි වත්ත | **එකතුව** |
|---|---|---|---|---|---|
| **දුරකථන** → **ජංගම** | 20 | 20 | 20 | 20 | **80** |


| | | | | | | |
|---|---|---|---|---|---|---|
| → ස්ථිර | - | - | - | - | - | |
| විදුලිය | 20 | 20 | 20 | 20 | **80** | |
| වැසිකිළි → තමන්ගේ | 12 | 16 | 14 | 17 | **59** | **80** |
| → පොදු | 8 | 4 | 6 | 3 | **21** | |
| ජලය → ළිඳ | 8 | 3 | 5 | 6 | **22** | **80** |
| → ජලකරාම | 5 | 12 | 6 | 4 | **27** | |
| → පොදු | 7 | 5 | 9 | 10 | **31** | |
| ඉන්ධන → දර | 17 | 14 | 18 | 12 | **61** | **80** |
| → ගෑස් | 3 | 6 | 2 | 8 | **19** | |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය 2018.


වතු හතරෙහි තෝරා ගත් කුටුම්භ තුළ පවතින යටිතල පහසුකම් පිළිබඳව වගු අංක 02හි දක්වා ඇත. මානව සම්පත් සංවර්ධනය උදෙසා සනීපාරක්ෂක පහසුකම් යහපත්ව පැවතීම ඉතාමත් වැදගත් වේ.එහිදී මූලිකම අවධානය යොමු වන්නේ වැසිකිළි පහසුකම් වෙතයි.වැසිකිළි පහසුකම් පිළිබඳව අවධානය යොමු කරන විට සියලුම දෙනා භාවිතා කරනුයේ වල වැසිකිළියකි. නියදියෙන් බහුතරයක් පිරිස තමන්ගේම වැසිකිළියක් භාවිතා කරනු ලබයි. තමන්ගේම වැසිකිළි භාවිතා කළද, පොදු වැසිකිළි භාවිතා කළ ද වතු හතරෙහිම දැකිය හැකි වූයේ අපිරිසිදු, නිසි ප්‍රමිතියෙන් තොර වූ වැසිකිළි පද්ධතීන්ය.මනුෂ්‍ය ජීවිතයට අවශ්‍යම සනීපාරක්ෂක පහසුකමක් වන වැසිකිළි පහසුකම් පවා සපුරා ගැනීම ඔවුන්ට දුෂ්කර වී තිබීම කණගාටුදායක තත්වයකි. ජලය ලබා ගැනීම පිළිබඳව නිරීක්ෂණය කිරීමේදී විශාල වශයෙන් පරිභෝජනයට තරම් ජලය ඔවුන්ගේ නිවසට නොලැබේ. එමෙන්ම සමීපව නිවාස පිහිටීම (ලැයිම් නිවාස) නිසා මෙම වතු තුළ ළිං භාවිතය අවම වේ. නල තුළින් ලැබෙන ජලය වුව ද එතරම් පිරිසිදු තත්වයේ නොමැත. ජලය ස්වභාවික සම්පතකි. එය පිරිසිදුව ලබා ගැනීම පවා ඔවුන්ට දුෂ්කර වි තිබේ. මේ අනුව පැහැදිලි වනුයේ යටිතල පහසුකම් විශේෂයෙන් සනීපාරක්ෂක පහසුකම්වල විශාල දියුණුවක් දක්නට නොමැති බවයි. මනුෂ්‍යයකු වශයෙන් ලැබිය යුතු අවම පහසුකම් හෝ නොලැබෙන ජන කොටසක් ලෙස වතු ජනතාව හඳුනා ගත හැකිය.

*සෞඛ්‍ය තත්ත්වය*


ප්‍රස්තාර අංක 07




ප්‍රස්තාර අංක 08




ප්‍රස්තාර අංක 09





මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය, 2018.

වතු ජනතාවගේ සෞඛ්‍ය තත්වයන් සම්බන්ධව ප්‍රස්තාර අංක 07,08,09 තුළින් පැහැදිලි වේ.නියදි සමීක්ෂණයේදී අනාවරණය වූයේ බහුතරයක් දෙනා පෝෂණ ඌණතාවලින් පෙළෙන බවයි. එම ප්‍රදේශ තුළ සේවය කරන වෛද්‍යවරු මෙන්ම පවුල් සෞඛ්‍ය සේවිකාවන් ප්‍රකාශ කර සිටියේ වතු ප්‍රජාවගෙන් බහුතරයක් පෝෂණ ඌණතා පිළබඳව දැනුවත්භාවය මදි බව සහ ඔවුන්ට පෝෂණ ඌණතා තිබුණද, නිසි ප්‍රතිකාර ගැනීමට උත්සුක නොවන බවයි. පෝෂ්‍යදායී ආහාර ගැනීමට තරම් හැකියාවක් ඔවුන් සතුව නැත.මන්දපෝෂණය, අඩු බර, යකඩ, විටමින් සහ කැල්සියම් ඌණතා වැනි රෝග බහුලව පවතියි. විශේෂයෙන් ගැබිණි මව්වරුන් සඳහා අවශ්‍ය වන්නා වූ පෝෂණයේ පවතින දුර්වලතා හේතුවෙන් බිහිවන දරුවන් උප්පත්තියේදීම විවිධ පෝෂණ ඌණතා සහිතව බිහි වන බව අනාවරණය විය. මෙම වතු ජනතාවට ත්‍රිපෝෂ ලබා දීමේ වැඩපිළිවලක් මෙම වතු තුළ ක්‍රියාත්මක වේ. ත්‍රිපෝෂ ලබා ගැනීම ප්‍රදේශයේ වතු රෝහල් තුළින් සිදු කෙරේ

එමෙන්ම බහුතරයට බෝ වන රෝග වැළඳී ඇත.පාචනය වැඩි වශයෙන් වැළඳී ඇති රෝගයකි.එයට බලපා ඇති ප්‍රධානතම හේතු පිරිසිදු පානීය ජලය භාවිතයට නොගැනීම,සනීපාරක්ෂක පහසුකම් නිසි අයුරින් භාවිතා නොකිරීම මෙන්ම සෞඛ්‍ය ආරක්ෂණ ආහාර භාවිතා නොකිරීම ආදීය වේ.උණ, සෙම්ප්‍රතිශ්‍යාව වැනි වෛරස් රෝග ඉතා ඉක්මණින් මෙම ජනපද තුළ ව්‍යාප්ත වේ. එකිනෙකට ලංව පිහිටි කුඩා නිවාස හේතුවෙන් ඉතා සීඝ්‍රයෙන් රෝග බෝ වන ප්‍රවණතාවය වැඩිය. චර්ම රෝගයන් ද ඉතා බහුලව මෙම ජනතාව තුළ දක්නට ලැබේ. බෝ නොවන රෝග ද වතු ජනතාව අතර ඉතා සුලභව දැකිය හැකිය. ඔවුන්ගෙන් බහුතරයක් දෙනා අතර අක්මාව ආශ්‍රිත රෝග,ක්ෂය රෝගය, පෙනහළු රෝග, නිදන්ගත ශ්වසන රෝග (ඇදුම), හෘද රෝග, ගැස්ට්‍රයිටීස් වැනි රෝග තත්වයන් පවතියි. එයට ප්‍රධානතම හේතුව වී ඇත්තේ මත්පැන් සහ දුම්වැටි පානයයි. විශේෂයෙන්ම මෙම රෝග තත්වයන් වතු කාන්තාවන් අතර ද බහුලව දැකගත හැකිය. මන්ද ඔවුන් මත්පැන් පානයට හුරු වී ඇති බැවිනි.

*සංවර්ධනය පිළිබඳ තොරතුරු*

ප්‍රස්තාර අංක 10 : ප්‍රදේශයේ ක්‍රියාත්මක වන සංවර්ධන වැඩසටහන් පිළිබඳ දැනුවත් භාවය




මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය,2018

ප්‍රදේශයේ වතු ජනතාව වෙනුවෙන් වන සංවර්ධන වැඩසටහන් සම්බන්ධව ඔවුන් තුළ පවතින දැනුවත්භාවය පිළිබඳව ප්‍රස්තාර අංක 10 හි දැක් වේ. එහිදී පැහැදිලි වනුයේ බහුතරයක් පිරිස ඒ සම්බන්ධව දැනුවත්භාවයකින් තොර බවයි. මේ සම්බන්ධව යම් ප්‍රමාණයක දැනුවත්භාවයකින් සිටින පිරිස දැක් වූ පරිදි සමෘද්ධි, ආර්ථික සංවර්ධන පදනම, නිවාස ව්‍යාපෘති වැනි සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වේ. ඔවුන් විවිධ සමිති තුළ සාමාජිකයන් වීම තුළින් එවැනි දැනුවත්භාවයක් ලබා ඇති බව

පැහැදිලි විය. ක්‍රියාත්මක වන සංවර්ධන වැඩසටහන් ද නිසි පරිදි ක්‍රියාත්මක නොවන බව වතු ජනයාගේ අදහසයි. නිසි පරිදි ක්‍රියාත්මක වේ නම් ඔවුන්ගේ ජීවිත පවතින තත්වයට වඩා සුබිත මුදිත වේ.

**සමාලෝචනය**

වතු ජනතාවගේ මානව සම්පත් සංවර්ධනය අනෙකුත් ග්‍රාමීය සහ නාගරික ජන කොටස්වලට සාපේක්ෂව ඉතාමත් පසුගාමී තත්වයක පවතියි.ශ්‍රී ලංකාවේ ආර්ථිකයට විශාල ශ්‍රම දායකත්වයක් සපයන ජන කොටසක් වන වතු ජනයාගේ ජීවිතය වටා ගැටළු ගණනාවක් නිර්මාණය වී ඇත.වතු ජනතාවගෙන් බහුතරය අවම අධ්‍යාපනික තත්වයක් භුක්ති විඳීම, ශ්‍රමයට සරිලන වැටුපක් නොලැබීම, යටිතල සහ සනීපාරක්ෂක පහසුකම් අවම මට්ටමක පැවතීම, බාහිර සමාජය සමග සබඳතා නොමැති වීම යන කාරණා නිසා ඔවුන් සමාජයෙන් වෙන් වූ ජන කොටසක් බවට පත්ව ඇත.වතු ජනතාවගේ සංවර්ධනය උදෙසා රාජ්‍යය සහ රාජ්‍යය නොවන ආයතන විවිධ ක්‍රියා මාර්ග ගෙන තිබුණ ද ඒවායේ සාර්ථකත්වයක් නොමැති අතර වතු ජනතාව තවදුරටත් අඩු මානව සංවර්ධනයක් සහිත ජන කොටසක් ලෙස ජීවත් වීම දැකිය හැකිය. ඒ අනුව වතු ජනතාව කෙරෙහි සමාජයේ දැඩි අවධානයක් යොමු විය යුතු අතර ඔවුනගේ මානව සම්පත් සංවර්ධනය නගා සිටුවීමට ක්‍රමවත් පියවර ගැනීම සිදු කළ යුතුය.

**නිගමන සහ යෝජනා**

ශ්‍රී ලංකාව මානව සංවර්ධන දර්ශකයේ ඉහළ ස්ථානයක සිටියත්, ග්‍රාමීය, නාගරික සහ වතු යන ප්‍රධාන ජන කණ්ඩායම් අතුරින් අදටත් ශ්‍රී ලංකාවේ සංවර්ධනය සඳහා විශාල ශ්‍රම දායකත්වයක් සපයන වතු ජනතාව ආර්ථික සහ සමාජ සංවර්ධනය අතින් ඉතාමත් අඩු මට්ටමක පවතියි. මෙම තත්වය ඔවුන්ට උදා වීම සඳහා කරුණු රාශියක් හේතු වන බව නිගමනය කළ හැකිය.

- වතු ජනතාව තුළ පවතින අඩු අධ්‍යාපනික මට්ටම සහ ඒ තුළින් ඇති වන නූගත් බව සහ අනවබෝධය, අවම සෞඛ්‍ය පිළිවෙත් මානව සම්පත් සංවර්ධනය පහළ බැසීමට ප්‍රබල හේතුවක් වී ඇත.
- පහළ අධ්‍යාපනික මට්ටමකින් යුක්ත වූවන් හෙයින් දෛනික අදායම කළමනාකරණය කිරීමට ඇති නොහැකියාව නිසාවෙන් විශාල වශයෙන් ආර්ථිකමය පරිහානියකට ලක්ව තිබීම.
- මත් පැන් පානය සඳහා කාන්තාවන් සහ පිරිමින් යන දෙපාර්ශවයම යොමු වීම හේතුවෙන් බොහොමයක් සමාජ ප්‍රශ්න උද්ගත වී ඇත.
- ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්වය නංවාලීම සඳහා නොයෙකුත් ව්‍යාපෘති රජය මගින් ක්‍රියාත්මක කර තිබුණ ද වතු ජනයාගේ සංවර්ධනය සඳහා රජය මගින් ක්‍රියාත්මක කර ඇති ව්‍යාපෘති ප්‍රමාණවත් නොවීම.
- ක්‍රියාත්මක මට්ටමින් පවතින ව්‍යාපෘති පවා නිසියාකාරව ක්‍රියාක්මක නොවීම සහ විවිධ ගැටළු පැවතීම.
- ඔවුන්ගේ ජීවන රටාව වෙනස් කර ගැනීමට වතු ජනතාව තුළ පවතින අකමැත්ත සහ ඔවුන් ස්වෝත්සහයෙන් නැඟී සිටීමට උත්සහ දරන පිරිසක් නොවීම .ඔවුන් නොමිලේ සියලු දේ ලබා ගැනීමේ ආකල්පයන් සහිතව ජීවත් වන පිරිසකි.
- වතු ආශ්‍රිත වර්තමාන පරම්පරාව වතු ආශ්‍රිත රැකියාවන්වල නියැලීමට දක්වන අකමැත්ත නිසා බොහෝ තරුණයින් වත්තෙන් පිට රැකියාවල නියුතු වීම.

- නිවාස, වැසිකිළි, සෞඛ්‍ය සනීපාරක්ෂාව, ළඳරු රැකවරණය, ජලය, යටිතල පහසුකම් නැංවීමට රාජ්‍ය අංශයේ මැදිහත් වීම ප්‍රමාණවත් නොවීම.

වතු ජනතාවගේ මානව සම්පත් සංවර්ධනය යන තේමාව යටතේ සිදු කරනු ලැබූ මෙම පර්යේෂණයේ වතු ජනතාවගේ මානව සම්පත් සංවර්ධනය පහළ මට්ටමක පවතින්නේද? යන ගැටළුවට අනුව ගොඩනගා ගත් උපන්‍යාසය වූයේ "වතු ජනතාවගේ මානව සම්පත් සංවර්ධනය පහළ මට්ටමක පවතියි ය" යන්නයි. ඒ අනුව සමස්ත පර්යේෂණයට අනුව වතු ජනතාව මානව සංවර්ධනය අතින් ඉතාමත් පහළ මට්ටමක සිටින බව නිගමනය කළ හැකිය.

**යෝජනා**

අඩු මානව සංවර්ධනයක් පවතින වතු ජනතාවගේ මානව සම්පත් සංවර්ධනය ඉහළ මට්ටමකින් පවත්වා ගැනීමට යෝජනා රැසක් ඉදිරිපත් කළ හැකිය.

- වතු ජනතාවගේ චර්යා රටාවන් වෙනස් කිරීමට පියවර ගැනීම.
  උපදෙස් සහ පුහුණු වැඩසටහන් සඳහා ඔවුන් සහභාගී නොවන්නේ දෛනික ආදායම උපයා ගැනීමට තිබෙන අවශ්‍යතාවය නිසාවෙනි. මෙම තත්වය මත එවැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ඔවුන්ට යම් වේතනයක් ලබා දීමට කටයුතු කිරීම තුළින් ඔවුන්ව සහභාගී කරවා ගැනීමට හැකියාව ලැබේ.
- වතු ජනතාව සඳහා ලබා දෙන සුභසාධන පහසුකම් වඩාත් විධිමත් ලෙස මනා කළමනාකාරීත්වයකින් යුතුව ලබා දිය යුතුය.
  රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී බිම් මට්ටමේ නිළධාරීන් සහ ජනතාව අතර සමීප සබඳතාවයක් ඇති කිරීම සහ පහළ සිට ඉහළට ක්‍රියාත්මක වන සැලසුම් මාලාවක් ඇති කිරීම.
- මත් ද්‍රව්‍ය සඳහා දැඩි නීති රීති ක්‍රියාත්මක කර ඒවා වත්තෙන් ඉවත් කළ යුතුය. ඒ සඳහා ක්‍රියාත්මක කරන වැඩසටහන් ජනතාවගේ සිත් දැඩි ලෙස යොමු කරවීම සඳහා කටයුතු කළ යුතුය.
- මූලික වශයෙන් මෙම වතු ජනතාව තුළ පවතින ප්‍රධාන ප්‍රශ්නය වන්නේ මුදල් පිළිබඳ ගැටලුවයි. ඔවුන්ගේ මූලික අවශ්‍යතාවයන් සපුරා ගැනීමට හෙවත් ආහාර පාන, ඇඳුම් පැළඳුම් සහ නිවාස පහසුකම් සලසා ගැනීම සඳහාවත් ප්‍රමාණවත් වැටුපක් ඔවුනට නොලැබෙයි. මේ නිසා රජයේ ඍජු මැදිහත් වීමක් අවශ්‍ය වේ. වතු හිමියන් ලබන ආදායම් අනුව එය වැඩ කරන ජනතාව අතරට සාධාරණව බෙදී යන වැටුප් ක්‍රමවේදයක් සකස් විය යුතුය. ඒ සඳහා රජය සහ කම්කරු සංවිධාන ඍජුව මැදිහත් වීමෙන් මෙම ජනතාවට සාධාරණ වැටුප් ක්‍රමයක් සකස් කර එය නීති ගත කළ යුතුය. ඔවුන්ගේ සේවයට සරිලන සේ ආකර්ෂණීය වැටුපක් ලබා දීමට කටයුතු කළ යුතුය.
- වර්ෂයක් පාසා දෙනු ලබන සේවක දිරිගැන්වීම් වැඩි දියුණු කිරීමට නව දැනුම යොදා ගත යුතුය. එමෙන්ම ඔවුන්ගේ සේවය අගය කිරීම සහ සමාජයේ වටිනා පුද්ගලයින් බව ඔවුන්ට පසක් කරවීමට සුදුසු වැඩසටහන් නිර්මාණය කිරීම.
  උ:දා -:
  - ක්‍රීඩා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ත්‍යාග ප්‍රදානය කිරීම.
  - මාසික දිරි දීමනා ලබා දීම.
  - ඔවුන්ගේ මානසික සුවතාවය සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- වත්ත තුළ ඔවුන්ගේ රැකියාවට අදාළ දෛනික ඉලක්ක සපුරන පුද්ගලයින්ට යම් ත්‍යාගයක් ලබා දීම. ඒ තුළින් ඔවුන්ගේ කාර්යක්ෂමතාවය වර්ධනය වන අතර ඉතා හොඳ සේවයක් ලබා ගැනීමටද හැකි වේ. ඔවුන්ට තමන් පිළිබඳ ආත්ම විශ්වාසයක් ඒ තුළින් ගොඩ නැගෙයි.

- වතු ජනතාවට රැකියා පමණක් නොව ස්වයං රැකියා සඳහා පුහුණුවක් ලබා දීමට සැලසුම් සම්පාදනය කිරීම. දියුණු වීමේ හැකියාව සහ මාර්ග පෙන්වා දෙමින් ශරීරය බොහෝ වෙහෙස නොවන සුළු පරිමාණ ස්වයං රැකියාවන් සම්බන්ධ පුහුණුවක් ලබා දී ඒ සඳහා මූලික දීමනාවක් ද, ලබා දී ඔවුන්ට අමතර ආදායමක් සලසා දිය හැකිය.

  උ:දා -:

  ලියුම් කවර සෑදීම, තේ කොළ පැකට් කිරීම, අත් බෑග් සෑදීම සහ විවිධ කලාත්මක නිර්මාණ වැනි ස්වයං රැකියා හඳුන්වා දීම.

- වතු ජනතාව අතර ඇති ප්‍රධානතම ගැටලුවක් ලෙස පෝෂණය සම්බන්ධ ගැටලු හඳුනාගත හැකිය. ඔවුන් අතුරින් බහුතරය මන්දපෝෂණයෙන් පෙළෙන අතර උපත් බරද සමාන්‍ය මට්ටමට වඩා පහළ අගයක් ගනියි. මෙම තත්වයන් අවම කර මන්දපෝෂණය තුරන් කිරීම සඳහා මෙම ජනතාවට යම් පෝෂණ මල්ලක් හෙවත් මාසිකව හෝ සතිපතා පෝෂ්‍යදායී වියළි ආහාර සලාකයක් ලබා දීම සුදුසුය. නිදසුනක් ලෙස ලංකාවේ දැනටත් ඉතා දුර්වල මට්ටමින් ක්‍රියාත්මක වන සමෘද්ධි ක්‍රමය තවත් ශක්තිමත් කිරීමෙන් හෝ වතුකර ජනතාවට සීමා වූ හෝ ක්‍රමවේදයක් සකස් කළ යුතුය.

  එය ලංකාවේ අනෙක් ප්‍රදේශවල යම් ප්‍රශස්ථ ආදායම් මට්ටමක් සහිත පවුල්වලට දැනට හිමි වන සමෘද්ධිය ඉවත් කර හෝ මෙම ජනතාවගේ දීමනාවන් වැඩි කළ හැකිය. එමගින් අඩු වේතනයක් ලැබුව ද, ඔවුන්ගේ ආහාර අවශ්‍යතාවය යම් පමණකින් හෝ පියවා ගනිමින් මෙම තත්වය අවම කර ගත හැකිය. මෙහිදී එක් පාර්ශවයකට පමණක් වගකීම නොපවරා රජය සහ වතු හිමියන් ඒකාබද්ධව මෙකී ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම සුදුසුය. මෙහිදී වයස අවුරුදු පහට හෝ දහයට අඩු දරුවන් කෙරෙහි සහ ගැබිණි මව්වරු කෙරෙහි විශේෂ අවධානයක් දැක්විය යුතුය.

- එමෙන්ම මෙම ප්‍රදේශවල දරුවන්ට නිසි අධ්‍යාපනයක් නොමැති වීමට සැලකිය යුතු කාරණයකි. දරුවන්ට හොඳින් ඉගැන්වීමට තරම් වත්කමක් එම මව්පියන්ට නොමැති අතර එමනිසා රජය මඟින් නොමිලයේ ලබා දෙන අධ්‍යාපනයට පමණක් සීමා වීමට සිදු වේ. අමතර දැනුමක් හෝ වෘත්තීය පාඨමාලාවන් හැදෑරීමට තරම් වත්කමක් නොමැති නිසා වෙනත් රැකියාවක් සොයා ගැනීමද අපහසුය. එමෙන්ම බොහෝ දරුවන් පාසල් යාමට හෝ අධ්‍යාපනය සඳහා එතරම් උනන්දුවක් දක්වන්නේ ද නැත. එම අපහසුතාවන් දුරු කිරීම සඳහා වතු හිමියන් පමණක් නොව ස්වෙච්ඡා සංවිධානද උනන්දු කළ හැකිය. මෙම අඩු ආදායම් ලාභී පවුල්වල දරුවන්ට අත්‍යවශ්‍ය පාසල් පොත් ආදී උපකරණ හා ඇඳුම් බෙදා දීමෙන් ඔවුන් දිරිමත් කළ හැකිය. තවද ඉතා දක්ෂ දරුවන් තෝරා ගනිමින් ඔවුන්ට ශිෂ්‍යත්ව ලබා දෙමින් වඩා හොඳ අධ්‍යාපනයක් සඳහා දිරි ගැන්විය හැකිය.

- වතු දරුවන්ගේ අධ්‍යාපනය විශ්වවිද්‍යාලය දක්වා යොමු වීමක් දක්නට නොලැබේ. ඒ සඳහා රජය මඟින් මෙම ප්‍රදේශවල දරුවන් සඳහා නොමිලයේ හෝ අවම ගාස්තු යටතේ වෘත්තීය පුහුණු පාඨමාලාවන් පැවැත්වීම සහ තරුණ තරුණියන් ඒ සඳහා උනන්දු කරවීම සිදු කළ හැකිය. මෙය දීර්ඝ කාලීනව ප්‍රතිඵල ගෙන දෙන සිදුවීමක් ලෙස හඳුන්වා දිය හැකිය. වතුකර දෙමළ ජනතාව සඳහා වෙනමම විශ්වවිද්‍යාලයක් ලබා දීමත්, ජාතික විශ්වවිද්‍යාලවලට අමතරව සාගර විශ්වවිද්‍යාලය,

UNIVOC, SLIIT වැනි අනෙකුත් රාජ්‍ය අංශයේ උසස් අධ්‍යාපන ආයතනවලට ඇතුළත් වීම සඳහා වතුකර දෙමළ සිසුන් සවිබල ගැන්වීම සඳහා පියවර ගැනීමත්, දෙමළ භාෂාවට අභිමතය ලැබෙන පරිදි ප්‍රමාණවත් මානව සහ භෞතික සම්පත් සහිතව ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ප්‍රාදේශීය මධ්‍යස්ථාන පිහිටුවීමත් සිදු කළ යුතුය.

- මෙම වතුකර පවුල්වල දරුවන් අධික වීම දුප්පත් බව ඉහළ නංවන හේතුවක් ලෙස දැක්විය හැකිය. සුළු ආදායමක් තිබියදී විශාල පිරිසක් නඩත්තු කිරීම දුෂ්කර වේ. උපත් පාලන ක්‍රම හඳුන්වා දීම සහ ආරක්ෂිත ලිංගික ක්‍රම පිළිබඳව දැනුවත් කිරීම සිදු කළ යුතුය.

මේ ආකාරයෙන් විවිධ ක්‍රමෝපායන් දියත් කිරීමෙන් මෙකී වතුකර ප්‍රදේශවල ජනතාවගේ දුප්පත් කම අවම කිරීමටත්, පෝෂණ මට්ටම ඉහළ නංවා ශක්තිමත් පිරිසක් බිහි කිරීමටත් හැකියාව පවතියි. එහිදී ඔවුන් සමාජයේ වැදගත් පුද්ගලයින් බවට පත් වන අතර වතු ජනතාවගේ මානව සංවර්ධනය ඉහළ මට්ටමකට ගෙන ඒමට හැකි වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

ජයකොඩි, එස්. කේ. (2000). **තිරසර සංවර්ධනය සංකල්පනාත්මක න්‍යාය සහ ව්‍යවහාරිකත්වය** : කර්තෘ ප්‍රකාශනයකි

පියරත්න, ඒ. (2005). **වතුකරය, කම්කරුවා සහ වෙනස්වන ජීවන රටාව** : විජේසූන්දර ග්‍රන්ථ කේන්ද්‍රය.

සමරසිංහ, පී. (1999). **මානව සම්පත් සංවර්ධනය හා පුහුණුව**. නුගේගොඩ : සුනෙර ප්‍රකාශකයෝ.

සමරසිංහ, පී. (1999). **ශ්‍රී ලංකාවේ මිනිස් බල ගැටළුව**. : පහන් ප්‍රකාශකයෝ.

Mondy, W.R. and Noe, R.M. (2005). **Human Resource Management**. London : person Prenties Hall.

### සඟරා

අභයරත්න, එස්. ඒ. එම්. (2001 සැප්තැම්බර්). **මානව සම්පත් සංවර්ධනය**. සටහන

අමරතුංග, ඩී. ජේ. (2001). **මානව සංවර්ධනයේදී ශ්‍රී ලංකාව නරක නැහැ**. දෙසතිය : රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

උපාලි, එච්. (2006). **ශ්‍රී ලංකාවේ වතු වැවිලි අංශයේ උපනතීන් සහ ගැටලු පිළිබඳ විමසීමක්.** කැලණිය විශ්වවිද්‍යාලය : ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය.

දුනුසිංහ, ඩී. ඩී. එස්. ජී. ඩී. (2015). **ශ්‍රී ලංකාවේ වැවිලි වගාව ආශ්‍රිත වතු ශ්‍රමිකයන්ගේ ජීවන තත්ත්වය.** ආර්ථික විද්‍යා. කැලණිය විශ්වවිද්‍යාලය : ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය.

බණ්ඩාරනායක, පී. (2003). **ශ්‍රී ලංකාවේ මානව සම්පත් සංවර්ධනයේ අවශ්‍යතාවය.** භෞම විද්‍යා. කැලණිය විශ්වවිද්‍යාලය : භූගෝල විද්‍යා අධ්‍යයන අංශය.

## අප්‍රකාශිත ග්‍රන්ථ

කහතුඩුව, කේ. අර්. ටී. (2014). ශ්‍රී ලංකාවේ වතු ආශ්‍රිත පාසල්වල සිසුන්ගේ තොරතුරු කුසලතාවය පිළිබඳ සවිස්තරාත්මක අධ්‍යයනයක් : යටියන්තොට අධ්‍යාපන කොට්ඨාසය ඇසුරින්. කැලණිය විශ්වවිද්‍යාලය : පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය.

සිරිවර්ධන, ජී. එම්. (2000). ශ්‍රී ලංකාවේ තේ වතු පෞද්ගලීකරණය තුළින් ඇති වූ සමාජ, ආර්ථික බලපෑම පිළිබඳ අධ්‍යයනය. කැලණිය විශ්වවිද්‍යාලය ඃ ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය.

## වාර්තා

බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. (2017). කාර්ය සාධන වාර්තාව හා වාර්ෂික ගිණුම්. බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය.

බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. (2017). සම්පත් පැතිකඩ. බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

රාජ්‍ය ආයෝජන වැඩසටහන. (2017-2020). මානව සම්පත් සංවර්ධනය ඃ රාජ්‍ය ආයෝජන වැඩසටහන.

ශ්‍රී ලංකා මහ බැංකුව. (2018 ජූලි). ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන. රාජගිරිය ඃ මහ බැංකු මුද්‍රණාලය. කොළඹ 01 ඃ ශ්‍රී ලංකා මහ බැංකුව.

ස්වදේශ කටයුතු අමාත්‍යංශය. (2017). වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ගිණුම් ඃ විදේශ කටයුතු අමාත්‍යංශය

# ලී ඉරීම හා බැදි උප සංස්කෘතික භාෂාව පිළිබඳ අධ්‍යයනයක් (බිබිල ප්‍රදේශයට විශේෂිතව)

# A Study on sub cultural language of wooden tear (With reference to Bibile)

A.M. Chaminda Kumara[1]

**Abstract**

Main human needs are food, clothes and houses. Wood can be identified as one of the main raw materials used in construction of houses. From the past decades humans used wood in constructing their residences. With the humans' social development, they cut off the large trees and tear by two men with the power and of force and ability. A sub culture and its own language was born due to the long period occurred in this process.

Research problem of this study is that what the sub cultural language use in wooden tear? and from this study illustrated the sub cultural language use in wooden tear. Snow ball sampling is used as the sampling method and also interview method is used for the data collection. Collected data presented that there is a sub cultural language and also there are some related customs and rituals related with wooden tear. Through the study, it can be identified that there are few researchers restudies related with this field and this sub cultural language is going away in the present. Therefore it have conducted must take immediate action for secure this sub culture for new generation.

***Key words:*** *Wooden industry, Sub cultures, wooden culture, Wood, Trees*

## හැඳින්වීම

මිනිසාගේ මූලික අවශ්‍යතා වන ආහාර, වස්ත්‍ර, නිවාස යන මූලික සාධක අතර නිවාස සකස් කර ගැනීමට හා ගෘහ නිර්මාණකරණයට අවශ්‍ය ලී ප්‍රධාන මූල ද්‍රව්‍යයක් විය. ඈත අතීතයේ සිට මානවයා තම ආරක්ෂාව පතා නිවාස සකස් කර ගැනිමට ලී දඬු භාවිතා කරනු ලැබීය. එහිදී කැලෑවේ ඇති ලී දඬු ඒ ආකාරයෙන්ම ගෙන ලී භාවිතයට ගනු ලැබීය. ඒ බව ධර්මසේන හිමියන් න් විසින් සද්ධර්මරත්නාවලිය නම් ග්‍රන්ථයේ පෙන්වා දෙන්නේ "යම් සේ දඬුපතින් ප්‍රයෝජන ඇති මිනිස්සු වලට වැදලා හැද නැති දඬු හැද නැති සැටියේ හා වක් දඬු වක් සැටියේ  කපාගෙන සිදුරු ඇති තැන් දිරා ගියතැන් ගැටතැන් එතැන්හිම හැරපියද්ද පසුවත් දඬුපතක් සොයා ආ කෙනෙක් නිසි දණ්ඩක් පතක් කපාගෙන යත් මුත් " ලෙසය. (ධර්මසේන හිමි, පුරාතන ගද්‍ය සංග්‍රය.අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේනතුව) පසුව මිනිසාගේ ක්‍රමික සමාජ සංවර්ධනයත් සමඟ විශාල ගස් බිම හෙළා එය කුට්ටි

[1] Department of Mass Communication, Faculty of Social Sciences, University of Kelaniya.
chamindabibile@gmail.com

කර දණ්ඩියන් මඟින් පළංචිය උඩට ගෙන කාය බලයෙන් යුක්ත හා ශිල්පීය හැකියාවෙන් යුක්ත ඉරුම්කරුවන් දෙදෙනෙකු විසින් කාලයක් තිස්සේ අවශ්‍ය ලී ඉරීමට කටයුතු කරනු ලැබීය. එසේ ලී ලබා ගැනීම දක්වා වූ කාල පරාසය තුළ සිදු කරනු ලබන කාර්යයභාරය අති මහත්ය. එහිදී අනුගමනය කරනු ලබන චාරිත්‍ර වාරිත්‍ර විධික්‍රමයන් හා භාෂාව කාලයක් තිස්සේ භාවිත කිරීමෙන් උප සංස්කෘතික භාෂාවක් හට ගනි. මේ සම්බන්ධයෙන් ලියැවුණු පතපොත අල්ප බැවින් එම උප සංස්කෘතික භාෂාව වර්තමානයේ ක්‍රමයෙන් ගිලිහී යන බව දක්නට ලැබේ. එනිසා මෙවැනි වෘත්තීන් හා බැඳී උප සංස්කෘතික භාෂාව මතු පරම්පරාවට දායාද කිරීම වර්තමාන පරම්පරාවේ යුතුකමක් හා වගකීමක් ලෙස පෙන්වා දිය හැකිය.

## 01. සංස්කෘතිය යනු කුමක්ද

යම් ජන සමාජයක් කාලයක් තිස්සේ එකට වාසය කිරීමේ දී ඇති කර ගනු ලැබූ සම්මතයන් පරපුරෙන් පරපුරට දායාද කිරීම සංස්කෘතිය ලෙස පෙන්වා දිය හැකිය. නමුත් සංස්කෘතිය යන්න පිළිබඳව පුළුල්ව අවධානය යොමු කරන විට විවිධ විද්වතුන් විසින් තම විෂය ක්ෂේත්‍රයන්ට අනුව විවිධ නිර්වචන ඉදිරිපත් කර ඇති බව දැකගත හැකිය. සංස්කෘතිය යන්න ඉංග්‍රීසි භාෂාවේ Culture ලෙස හඳුන්වයි. 1861 දී ඊ.බී. ටයිලර් විසින් රචිත ප්‍රාථමික සංස්කෘතිය නම් කෘතියේ සංස්කෘතිය යන්න පෙන්වා දී ඇත්තේ

"සමාජයේ සමාජිකයෙක් වශයෙන් මිනිසා විසින් අගය කරන්නාවූත් පරිණතවූත් දැනුම, විශ්වාසය, කලා, සදාචාර, ධර්මයන්, නීතිය, සිරිත් හා අනෙකුත් සියලු හැකියාවන් වන සංකීර්ණ සමස්තය සංස්කෘතියයි"

ඊ.බී. ටයිලර් - ප්‍රාථමික සන්නිවේදනය,1861

"සංස්කෘතිය යනු ජීව මනෝ ප්‍රේරණයන් සංතෘප්ත කිරීමේ දී මෙම සංස්කෘතිය ඉතා වැදගත් වේ"

මානව විද්‍යාඥ මලිනොවුස්කි සහ ප්‍රාන්ස් බොආස්

"සංස්කෘතිය යනු සමාජීය විද්‍යාවන්වල මධ්‍යගත සංකල්පය වේ""

මාග්‍රට් මීඩ් ඇල් ක්‍රෝබර් සහ රූත් බෙනඩික්ට්

"සමාජයේ සමාජිකයින් විසින් පවරනු ලබන බෙදාහදා ගනු ලබන ඉගෙනගත් හැසිරීම් රටාව සංස්කෘතිය වේ"

රැල්ෆ් ලින්ටන් - 1940

"සංස්කෘතිය යනු මිනිස් චර්යාවේ ප්‍රකට හා අප්‍රකට රටාවන් සංකේත මඟින් ව්‍යාප්ත කරන මානව සමූහවල සුවිශේෂී සාධනයක් ලෙස ගොඩ නැගුණු ක්‍රියාවලියක් වේ"

ක්‍රෝබර් ක්ලක්හෝන්

"සංකේතානුසාරයෙන් සමාජීය ලෙස හිමිකරගන්නාවූද පාරම්පරික වශයෙන් අත්පත් කොට ගත්තාවූද සියලූම චර්යා රටාවන්ට දිය හැකි සාමුහික නාමය සංස්කෘතිය වේ"


චාල්ස් ඒ එල්වුඩ්

"සංස්කෘතිය වනාහි එක් අතකින් සංකේතාත්මකවූත් අනෙක් අතින් අඛණ්ඩවූත් අලුත් අලුත් දෑ ඉක්මනින් සාධනය කරගන්නාවූත් ප්‍රගතිශීලි ක්‍රියාදාමයකි"

ලෙස්ලි ඒ වයිට්

මේ අනුව පැහැදිලි වන්නේ මිනිසාගේ ජීවිතය හා බැඳී ඇති විවිධ ජීවන රටාවන් හා වෘත්තීන් මුල් කරගෙන පරපුරෙන් පරපුරට දායාද වන්නා වු කලාව විශ්වාස ඇදහිලි නීතිය සදාචාරය යන සියල්ල සංස්කෘතිය යන්න තුළින් නිරූපනය වන බවයි. එනම් සංස්කෘතිය යන්න පුළුල් ස්වරූපයක් ගන්නා බව පෙන්වා දිය හැකිය. මෙම සමස්ථ නිර්වචන අධ්‍යයනය කරන විට පෙන්වා දිය හැකි වන්නේ පහත සඳහන් ආකාරයේ වර්ගීකරණයකි.

සංස්කෘතිය




ඒ අනුව සංස්කෘතිය කොටස් දෙකක් ලෙස වර්ගීකරණය කළ හැකිය. එනම් සමස්ත සමාජයම ආවරණය වනු ලබන මහා සංස්කෘතිය හා මහා සංස්කෘතියේම කොටසක් වන උප සංස්කෘතියයි. ඒ පිළිබඳව පුළුල් අර්ථකථනයෙන් විමසා බලන විට මහා සංස්කෘතිය යනු භූගෝලීය සීමාවක් තුළ සිටින විවිධ ජන කණ්ඩායකගෙන් සමන්විත පුළුල් සමාජයකි. උප සංස්කෘතිය යනු මහා සංස්කෘතියේ කුඩා අංගයක් බව ඩර්කස් මිචෙල් දක්වයි. එම උප සංස්කෘතිය කොටස් කිහිපයක් යටතේ වර්ගීකරණය කර දැක්විය හැකිය.

01. ප්‍රාදේශීය උප සංස්කෘතිය

මෙම සංස්කෘතිය භූමිය පදනම් කරගනිමින් නිර්මාණය වී ඇත. ලෝකයේ ඌන සංවර්ධිත රටවල අගනුවර පදනම් කර ගනිමින් ප්‍රාදේශීය උප සංස්කෘතිය බිහි වී ඇත. මහා සමාජයේ භාෂාවම තරමක් වෙනස් ආකාරයෙන් භාවිතයට ගැනීම දැකගත හැකිය.

02. ජනවාර්ගික උපසංස්කෘතිය

විවිධ ජනවර්ග පදනම් කරගනිමින් එම සමාජ ක්‍රමයට ගැලපෙන ආකාරයට මෙම උපසංස්කෘතික භාෂාව ගොඩනැගී ඇත. ශ්‍රී ලංකාවේ නම් සිංහල,දෙමළ, මුස්ලිම්,බර්ගර්, මැලේ ලෙස ඒ ඒ ජන වර්ගයට අනුව උප සංස්කෘතිය සකස් වී ඇත.

03. ග්‍රාමීය උප සංස්කෘතිය

මෙය ග්‍රාමීය සමාජ ක්‍රමය පදනම් කරගනිමින් සකස් වී ඇත. එක් එක් ග්‍රාමයන්ට අදාළව උපසංස්කෘතිය වෙනස් වනු ලබයි.

04. නාගරික උප සංස්කෘතිය

නාගරික සමාජය මුල් කරගනිමින් උපසංස්කෘතිය ගොඩනැගී ඇත.

05. වෘත්තීයමය උප සංස්කෘතිය

විවිධ ජීවන වෘත්තීන් පදනම් කරගනිමින් උපසංස්කෘතිය නිර්මාණය වී ඇත.

06. ආගමික උප සංස්කෘතිය

විවිධ ආගම් පදනම් කරගනිමින් උපසංස්කෘතිය බිහි වී ඇත. එනම් බෞද්ධ, හින්දු, ඉස්ලාම් ආදීය උදාහරණ ලෙස පෙන්වා දිය හැකිය.

## 02. ලී ඉරීමේ වෘත්තීය

ලී ඉරීම වෘත්තියක් ලෙස ආරම්භ වූයේ කවර දිනකද යන්න නිශ්චිතව සඳහන් කළ නොහැකිය. කෙසේ වෙතත් මානවයාගේ ආරම්භයේදීම තම වාසස්ථාන සකස් කර ගැනීම සඳහා ලී භාවිත කළ බව සිතිය හැකිය. අද පවතින නීතිය අනුව සපු, ලුනු මිදැල්ල වැනි ගස් කැපීමට අවසර ලබා දී ඇත. නමුත් බොහෝ ගස් කැපීම නීතියෙන් තහනම් වේ. වර්තමානයේ ඇති අති නවීන තාක්ෂණික උපකරණ සහිත සමාජ ක්‍රමයක මෙන් නොව මුල් කාලීන වැසියන් තම නිවෙස් වලට අවශ්‍ය ලී ලැලී කපා ගැනීම සිදු කරනු ලැබුයේ ප්‍රාථමික ආකාරයටය. මුලින්ම මාසේ කළුවර දිනයේ දී ගස් කැපීම සිදු කරනු ලබයි. එමගින් ලී වලට ගුල්ලන් පණුවන්ගෙන් වන හානිය අවම වන බවට වූ විශ්වාසයක් පවතී. විශාල ගසක් කැපීමට පෙර දිනයේ සිදු කරනු ලබන චාරිත්‍රයන් දැකගත හැකිය. එනම් ගස සමීපයට ගොස් ගස අසළ පහනක් දල්වා වැද මෙම ගසට අරක්ගත් ඉෂ්ඨ දෙවිදේවතාවෙක් තම විමානය කරගෙන වාසය කරයිනම් වෙනත් වෘක්ෂයකට වැඩම කරන ලෙසත් තම නිවස සකස් කරගැනීමට අවශ්‍ය ලී ලබා ගැනීමට මෙම ගස කපනු ලබන බවත් දැනවීමට කැපීමට නියමිත ගසින් අත්තක් කඩාගෙන ගොස් ඒ සමීපයේ ඇති වෙනත් ගසක් දෙවියන්ගේ විමානය ලෙස භාවිත කරන ලෙස අයැද සිටි. ඉන්පසු දිනයේ දී ගස සමීපයට පැමිණ වැද නමනස්කාර කර පොරොවෙන් ගස කැපීම ආරම්භ කරනු ලබයි. ගස කැපීමේ දී පළපුරුද්ද මත සිදු කරනු ලබයි. එනම් ගස වැටෙන දිශාව තීරණය කිරීමට හැකියාව ලැබේ. එසේ කපා දමනු ලබන කඳ කුට්ටි කරනු ලබයි. ලී අවශ්‍ය ප්‍රමාණයට කුට්ටි කැපීම සිදු කරනු ලබයි. එසේ කපා ගනු ලබන ගසේ මුල කොටස හා අනෙක් කොටස් වලට මුල කුට්ටිය,

දෙවන කුට්ටිය ලෙස හඳුන්වනු ලබයි. එසේ කපා ගනු ලැබූ කුට්ටි පලංචියක් මතට ගැනීම සිදු කරනු ලබයි. එය පහත ආකාරයට ඉදිරිපත් කළ හැකිය.



(සිතුවම- රාවය පුවත්පත)

කුට්ටිය මත සිටගෙන ලීය ඉරීම අසීරු කාර්යයකි. එනම් සමබරතාව පවත්වා ගනිමින් ඉතා පරෙස්සමෙන් සිදු කළ යුක්තක් වන බැවිනි. පසුව ලී ඉරීම සිදු කරනු ලබන දෙදෙනාගේ පවතින එකගත්වය හා කාර්යයගුර බව මත ඉරීම සිදු කරනු ලබයි. එහිදී ලඹ බැම සිදු කර කදෙහි පවතින සමබරතාව පවත්වා ගනී. මුලින්ම මහ කඳ දෙකට පළා ගැනිම සිදු කරගනු ලබන අතර පසුව එම පළුව ලී බවට පත් කර ගනී. එහිදී පරාල, රීප්ප, උළුවහු ආදී ලෙස අවශ්‍ය පරිදි ලී ඉරා ගනු ලබයි. මෙලෙස ලී ඉරීමේ දී ඉරුම්කරුවන් දෙදෙනා ඉවසීමෙන් හා නිවැරදිව නූලට ඉරීමේ හැකියාවෙන් යුක්ත විය යුතුය. කාය ශක්තිය යොදා ගනිමින් කියත ඉහළ පහළ යවමින් දීර්ඝ කාලයක් ලී ඉරීම සිදු කරනු ලබයි. ඒ නිසාම ජනශ්‍රැතියේ ඇති කාව්‍ය නිර්මාණ වලින් ඒ බව පසක් වේ. තවද ලී ඉරන දින අතර ලී බාන දිනය පැමිණේ එනම් ලී ඉරීම අවසන් කර අවශ්‍ය ලී ලබා ගත හැකි දිනයයි. විශාල ගසක් ඉරනු ලබන්නේ නම් මාස දෙක තුනක් යනතෙක් ලී ඉරීම සිදු කරනු ලබයි. එමෙන්ම ගමේහි යම් පුරවැසියකු මරණයට පත්වනු ලැබුවේ නම් මෙම ඉරුම්කරුවන් කඩිනමින් සකස් කරනු ලබන පලංචියක් මත කඳක් තබා මිනී පෙට්ටිය සකස් කිරීමට අවශ්‍ය ලැලී ලබා දෙනු ලබයි. ලී ඉරුම් කරන විට අඳිනු ලබන ඇඳුම විමසා බලන විට දැකගත හැකි වන්නේ මුල්කාලයේ අමුඩය ගසා ලී ඉරීමත් පසුව සරම කැසපොටකවා ගෙන ලී ඉරීමත් සිදු කරනු ලබයි. අද වන විට එය කලිසමක් ඇදගෙන ලී ඉරීම සිදු කරනු ලබයි. මෙමගින් බලාපොරොත්තු වන්නේ ශරීර ක්‍රියාකාරීත්වය ඉතා පහසුවෙන් සිදු කර ගැනීමට හැකි වීමයි. කාය ශක්තියෙන් හෙබි පුද්ගලයින් දෙදෙනාගේ සම්බන්ධතාවය සුනිල් එදිරිසිංහයන් විසින් ගායනය කරනු ලබන " පලංචියේ ලී ඉරුවේ අපි එකට...."යන පද්‍යයෙන් පැහැදිලි

වේ. එකී කාලය තුළ භාවිත කරනු ලබන වාග් මාලාව මෙම වෘත්තීයටම ආවේණික වේ. එය මෙම වෘත්තිය හා බැඳී උප සංස්කෘතික භාෂාවයි.

### 2.1 ලී ඉරීමේ දී භාවිත කරනු ලබන උපකරණ

- ❖ මහ කියත - ප්‍රධාන ඉරුම් කියත වේ
- ❖ හරස් කියත - කඳවල් කුට්ටි කිරීමට යොදා ගන්නා කියත
- ❖ පොරෝව
- ❖ වප් පිහිය
- ❖ පීර - කියත මුවහත් කිරීම සිදු කිරීමට ගන්නා උපකරණය
- ❖ දත් අඬුව - කියතේහි දත් දැමීම හා කියත් කැපුම් සකසන උපකරණය
- ❖ කියත් පෙට්ටියී කියතෙහි කැපුම් තලය වැසීමට සකසනු ලබන ලීය

## 03. භාවිත කරනු ලබන උප සංස්කෘතික භාෂාව

- ❖ කුට්ටිය - මෙය මුල් කුට්ටිය, දෙවන කුට්ටිය ලෙස හඳුන්වයි
- ❖ නොහොරිය - උඩ සිට ඉරන ලද තැනැත්තා කියත අල්ලනය/කියත් අත
- ❖ දණ්ඩියන් - මේ මත ඉරණු ලබන කඳ තබනු ලබයි
- ❖ දිගන ලීය - පලංචියේ ප්‍රධාන හරස් ලීය
- ❖ කප්පිල්ල - දෙතැරිය සහිත කණු
- ❖ කත්තිරික්කා බඳිනවා - දණ්ඩියන් දෙක දෙතැරියෙහි බඳින ස්ථානය
- ❖ ලඹ බානවා - ලී අවශ්‍ය ප්‍රමාණයට ගැනීමට ලීය සමබරව පවත්වා නූල් ගැසීමට සිදු කරයි
- ❖ පිට පළුව - මෙය ලඹ බෑමෙන් පසුව ඉවත් කරනු ලබන පළුව වේ
- ❖ නෙත්ති අමුණනවා - ඇද නොයන්න බැඳ තැබීම
- ❖ මරක්කැහෙලා දෙන්නා - ඉරනු ලබන දෙදෙනා හඳුන්වන නාමය
- ❖ ඉරුන්කාරයෝ දෙන්නා -
- ❖ වාඩුවට ඉරණවා - එක හුස්මක් ඉරීම ලෙසද හඳුන්වයි
- ❖ කියත් නෙත්තිය - ඉරන විට කියත ගමන් කරනු ලබන මාර්ගය
- ❖ බෙනය - කඳ මැද ඇති මදය ඉවත්ව ගොස් ඇති විට මෙනමින් හඳුන්වයි
- ❖ කෝදුව - අඩි එකක දිග
- ❖ කියත් පෙට්ටිය - බිම සිට කියත අල්ලා ගන්නා ස්ථානය
- ❖ ලී වැටෙනවා - ඉරිය හැකි ලී ප්‍රමාණය
- ❖ නෙත්තිය අමුණනවා - මුලින්ම නූල දීගේ ඉරීම
- ❖ මැද පළුව - මෙයින් ලී අවශ්‍ය පරිදි කපා ගනු ලබයි

- කුංඤය - ලී දෙක එක්වීම වැළැක්විමට යොදන ලී කැල්ල
- දත් දානවා - අලුතින් කියතට කැපුම් දත් එකතු කිරීම
- කුවිල - ලී කුඩු වලින් එන ගඳ
- එලය - අරටුව රහිත ලී කොටස
- වැය - ලී කඳන් වල පොත්ත ඉවත් කිරීමට යොදා ගන්නා ආයුධයකි
- බලු කට්ට - කැපුම් රේඛාව සහ සෙලවීම වැළැක්වීමට යොදා ගනු ලබන කුඤය
- පීරි කුඩය - කියත ගෑම සඳහා ගනු ලබන උපකරණ තබා ඇති කුඩය
- පාන බල තැබීම - කණුවල ශක්තිමත්භාවයට මුක්කු ගැසීම
- සෙලෙක් ගැසීම - ඉරුම් කඳේ දෙපැත්තේ පලු දෙකක් කපා ඉවත් කිරීම
- කියත ඇවිලීම - කියතේ මුවහතින් ලීය ඉරීමට ප්‍රමාණවත් ලෙස ලී කඳට තද කිරීම

මේ ආකාරයට වෘත්තීය පදනම් කරගෙන වාග් මාලාවක් හඳුනා ගැනීමට මෙම පර්යේෂණය හරහා හැකි විය. මෙම වාග් මාලාව හා මෙම වෘත්තීය නූතන පරම්පරාවට දායාද කිරීම උදෙසා රැක ගැනීමට හැකියාව මේ හරහා ලැබෙනු ඇතැයි පෙන්වා දිය හැකිය.

## 04. නිගමන

මෙම පර්යේෂණය හරහා හඳුනා ගත හැකි වන්නේ ලී ඉරීම හා බැඳී පවතින උප සංස්කෘතික භාෂාවක් පවතින බවයි. එම වෘත්තියේ යෙදුනු අයගේ පරපුරක් පැවතගෙන නොයෙන බව තහවුරු වනු ලබන බැවින් උප භාෂාව මතු පරපුරට දායාද කිරීමේ වටිනාකමක් පවතී.

## 05. යෝජනා

පර්යේෂයේ අවසාන වශයෙන් පෙන්වා දිය හැක්කේ ලී ඉරීම හා බැඳී පවතින උප සංස්කෘතික භාෂාව ආරක්ෂා කර මතු පරපුරට දායාද කිරීමට තැබීමට කටයුතු කළ යුතු බව පෙන්වා දිය හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


- දනන්සූරිය, ජිනදාස.(2002). ජනශ්‍රැති අධ්‍යයන. පියසිරි ප්‍රින්ටින් සිස්ටම්.නුගේගොඩ
- වීරසූරිය, ගුණසිරි. (2006). සිංහල සමාජය හා සංස්කෘතිය. ආරිය පබ්ලිකේෂන්.
- කුලරත්න, සාලිය.(2006).සන්නිවේදන ජනශ්‍රැතිය. ආරිය පබ්ලිකේෂන්.
- මැදඋයන්ගොඩ, විමලකීර්ති හිමි.(2002)සිංහල ගොවිතැන
- දනන්සූරිය, ජිනදාස.(2002). ජනශ්‍රැති අධ්‍යයන. පියසිරි ප්‍රින්ටින් සිස්ටම්. නුගේගොඩ
- දළුපොත, මහින්ද කුමාර.(2001).ගමේ වගතුග. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන
- දළුපොත, මහින්ද කුමාර.(2001). කෙතේ වගතුග. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන
- දළුපොත, මහින්ද කුමාර.(2002). හේනේ වගතුග. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන

- පොඩි අප්පුහාමී, කේ.බී. (2002). රටරටින් ගිලිහි යන ගැමි ජීවන රටා, ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන
- විමලවංශ නාහිමි, බද්දේගම.(2000). අපේ සංස්කෘතිය, සමයවර්ධන පොත්හල, 63, මාලිගාකරන්ද පාර, මරදාන.
- දිසානායක, ජේ. බී. (1976).සිංහල ජනවහර. සීමාසහිත ලෙක්හවුස් ඉන්වෙස්ට්මන්ට් සහ සමාගම
- අමුණුගම, සරත්.(1999). සංස්කෘතික සමාජය හා පරිසරය.සදීපා සමාගම,සදීපා පොත් සමාගම, කොළඹ.
- මානවඩු, සුසිරිපාල. (2006). ජනවහරේ වියත් ලකුණු. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන.

WEB :

- http://ravaya.lk/?p=5668
- http://www.dinamina.lk/2016/03/25/%E0%B7%80%E0%B7%92%E0%B7%81%E0%B7%9A%E0%B7%82%E0%B7%8F%E0%B6%82%E0%B6%9C/14158
- geeyaka-arutha.blogspot.com/2016/03/blog-post_6.html

# සත්‍යජිත් රේගේ සිනමාව කෙරෙහි සාහිත්‍යයේ ආභාසය

නිපුණ හේමින්ද බස්නායක[1]

**හැඳින්වීම**

ආසියානු සිනමාව ලෝකයේ බොහෝ රටවල ව්‍යාප්ත වී තිබේ. ඒ සඳහා ප්‍රබල හේතු සාධක බවට පත්වන සිනමා අධ්‍යක්වරුන් වශයෙන් අකිර කුරසොවා, සත්‍යජිත් රේ, ලෙස්ටර් ජේම්ස් පීරිස් පෙන්වා දිය හැකි ය. මොවුන් තිදෙනාම සාහිත්‍යයෙන් නොමඳ ආභාසයක් ලැබූවෝ වූහ. මෙහි ලා තෝරා සිනමා කෘති ඇසුරෙන් සත්‍යජිත් රේ කෙරෙහි සාහිත්‍යයෙන් වූ අලෝකය පිළිබඳ විමර්ශනය කිරීම අභිප්‍රේතාර්ථයයි. මෙහි පර්යේෂණයෙහි ගැටලුව වූයේ භාෂාමය එනම්, නවකතා හා කෙටිකතා මාධ්‍යය සිනමා පරිවර්තනය කිරීමේ දී අධ්‍යක්ෂවරයා උපයෝගී කර ගත් ශිල්පීය හා කලාත්මක පක්ෂය මෙන් ම එහි කතා අන්තර්ගතයෙහි සිදු කර ඇති වෙනස්කම් මොනවාද? යන්නයි. ඒ පිළිබඳ ව සත්‍යජිත් රේගේ තෝරාගත් සිනමා කෘති කිහිපයක් ඇසුරෙන් විමසා බැලිම අපේක්ෂා කෙරේ. එමෙන් ම මෙහි ලා පරිවර්තිත කෘති පමණක් උපයෝගී කොටගත් බව වෙසෙසින් සඳහන් කළ යුතු ය. ඒ අනුව පර්යේෂණය සඳහා පතේර් පංචලී, ශත්රනජ් කේ කිලාඩි හා චාරුලතා යන චිත්‍රපට උපයෝගී කර ගැනිණ.

**සාහිත්‍යය හා සිනමාව**

නවකතාව හා චිත්‍රපටය යන උභය මාධ්‍යයන්හි ප්‍රාරම්භය සලකා බැලීමේ දී විද්‍යමාන වන්නේ චිත්‍රපටය සාපේක්ෂ ව බොහෝ කලකට පසුව බිහි ව ඇති බවකි. එහෙත්, මෙහි වෙසෙස් ලකුණ නම් චිත්‍රපටය නවකතාව මෙන් නොව වර්තමානයේ ලොව පුරා වෙසෙන බාල මහලු කා අතරත් අතිශය ජනප්‍රිය වී තිබීමයි. එක් අතකින් තාක්ෂණික තත්ත්වයන්හි ඇති වන හා ඇති වූ ප්‍රවණතා මේ සඳහා බලපා ඇති බැව් අනුමාන කළ හැකි ය.

පැහැදිලි වශයෙන් ම මේ උභය මාධ්‍යයන් අතුරෙහි ඇත්තේ බොහෝ විට එකිනෙකට විසාම්‍ය වූ අංග ලක්ෂණයන් බැව් අවිවාදිත ය. ඒවාට ආවේණික වෙනස්කම් ගණනාවකි. එසේ වුව, මේ ද්වයෙන් ම සිදු වන්නේ මූලික ඒකීය ක්‍රියාවකි. එනම් යථාර්ථය අනුකරණය කිරීම යි. බටහිර සෞන්දර්ය විද්‍යාවේ පිතෘවරයා වශයෙන් සැලකෙන ඇරිස්ටෝටල් පඬිතුමාට අනුව කලාව හොඳින් අවබෝධ කොට ගත හැකි වන්නේ එය ප්‍රකාශන ක්‍රමයක් මගින් යථාර්ථයේ අනුකරණයක් වශයෙන් මාධ්‍යය යොදා ගන්නා ආකාරයේ අනුකරණ විශේෂයක් ලෙසිනි. වර්තමාන කලා විචාරකයන් අතර පවත්නා මතිමතාන්තර සමඟ සම්බන්ධ කරන විට මෙම ප්‍රකාශය සරල සේ කෙනෙකුට පෙනුන ද කලාවෙන් සිදු කෙරෙන්නේ යථාර්ථයේ පුනර්නිර්මාණයක් යන්න විවාද රහිත වූවකි.[2]

---

[1] සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය. nipunaheminda90@gmail.com.

[2] පල්ලියගුරු. චන්ද්‍රසිරි (2000). සිරිලක සිනමා සමරු සටහන් **''නවතකාවෙන් පෝෂණය වූ සිනමාව''** කොළඹ: ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව.74 පිට.

**සත්‍යජිත් රේ**

විසිවැනි සියවසේ ශ්‍රේෂ්ඨ චිත්‍රපට අධ්‍යක්ෂවරුන් අතරට අයත්වන සත්‍යජිත් රේ බෙංගාලි භාෂාවෙන් සිනමා කෘති රැසක් අධ්‍යක්ෂණය කළේ ය. ඔහු ස්වකීය සිනමාව ඔස්සේ වැඩි වශයෙන් උත්සුක වූයේ ජන ජීවිතය පදනම් කරගත් විෂය ප්‍රදේශයක් නිරූපණය කිරීමටයි. ඉන්දියානු සිනමාවේ තීව්‍ර ව ඉස්මතු වන ජනප්‍රිය සිනමා රැල්ල වෙනුවට ඔහු තෝරා ගත්තේ එයට ප්‍රතිපක්ෂ වූ මගකි. බොහෝ අවස්ථාවල දී සත්‍යජිත්ගේ සිනමාවට පාදක වූයේ බෙංගාලි නවකතා හා කෙටිකතා ය. නවකතාවේ අංග ප්‍රත්‍යංග සිනමාව වෙත ප්‍රවිෂ්ට කරවීමේ දී ඔහු සතු ව පවත්නා සිනමා ශක්‍යතාව උද්දීප්ත වෙයි.

සත්‍යජිත් රේ අවශේෂ කලා මාධ්‍ය ගණනාවක ශක්‍යතාවන්ගෙන් සපිරුණු කලාකරුවෙකි. ළමා කතා පොත් රචකයෙකු ද වන රේ, චිත්‍ර ශිල්පියෙකු වශයෙන් ද ප්‍රතිභාපූර්ණ කුසලතාවකින් හෙබි වූවෙකි.[3] සිනමා ශානරයෙහි ඔහු වඩාත් ඉස්මතු වන්නේ ඔහු සතු අංග සම්පූර්ණ සිනමා ප්‍රවීණත්වය හේතුවෙන් බව කිව හැකි ය. තිර නාටක රචනයෙන් ද සංගීත අධ්‍යක්ෂණයෙන් ද කලා අධ්‍යක්ෂණයෙන් ද කැමරාකරණයෙන් ද සිනමාවට දායකත්වය සපයා ඇති බැවින් ලෝකයේ අවශේෂ බොහෝ සිනමා අධ්‍යක්ෂවරුන්ගෙන් ඔහු විනිර්මුක්ත වෙයි.[4]

සත්‍යජිත් රේ විසින් අධ්‍යක්ෂණය කරන ලද සිනමා කෘති ගණනාවකි. ඒවා මෙහි ලා නාමිකව සඳහන් කිරීම වටී.

**පතේර් පංචලි** (1955), **අපරාජිතයෝ** (1956), **පරෝශ් පතර්** (1958), **ජොල්සඝාර්** (1958), **ඔපූ සංසාර්** (1959), **දේවී** (1960), **තීන්කන්‍යා** (1961), **රබීන්ද්‍රනාත් තාගෝර්** (1961), **කන්චන්ජුන්ගා** (1962), **අභිජාන්** (1962), **මහනගර්** (1963), **චාරුලතා** (1964), **දෙදෙනා** (1964), **මහපුරුෂ්** (1964), **කාපුරුශ්** (1965), **නායක්** (1966), **චිරිආඛානා** (1967), **ගුපි ගයේන් භඝා බයේන්** (1968), **ඔර්නේර් දින්රාත්‍රී** (1969), **ප්‍රතිද්වන්දි** (1970), **සීමාබද්ධෝ** (1971), **සීකිම්** (1971), **අභ්‍යන්තර ඇස** (1972), **ඔශානි සන්කේත්** (1973), **ශෝනාර් කෙල්ලා** (1974), **ජොන අරන්‍ය** (1975), **බාලා** (1976), **ශත්රනජ් කේ කිලාඩි** (1977), **ජෝයිබාබා ෆෙලූනාත්** (1978), **හිරොක් රාජා දේශේ** (1980), **පීකු** (1980), **ශර්ගාති** (1981), **සොරේ බයිරේ** (1984), **සුකුමාර් රේ** (1987), **ගනශොත්රු** (1989), **ශාඛා ප්‍රෝශාඛා** (1990), **ආගන්තුක්** (1991) යන සිනමා කෘති දෙස් විදෙස් අවධානයට පාත්‍ර වූ රේගේ සිනමා කෘති වේ.

**සත්‍යජිත් රේ සාහිත්‍යයෙන් ලද ආභාසය**

සාහිත්‍ය කෘතියක් එනම් මෙහි ලා සැලකිල්ලට භාජනය වන නවකතාව හා කෙටිකතාව සිනමා කෘතියක් බවට පරිවර්තනය කිරීමේ කාර්යයේ දී පළමු කොට හඳුනා ගත යුතු වන්නේ ඒවාට අනන්‍ය වූ ශිල්ප ලක්ෂණ පිළිබඳවයි. පොදුවේ ලේඛනය පදනම් කොටගෙන සිදුකෙරෙන සාහිත්‍ය කෘතියක අංග ලක්ෂණ කිහිපයක් හඳුනාගත හැකිය. ඒවා නම් සංකේත භාවිතය, සංකල්ප රූප, දෘෂ්ටිකෝණය,

[3] http://www.malkakulu.com/2012/03/2.html

[4] බෙල්ලන්විල ඕ.ටී. පෙරේරා. සිනමාවෙන් සමුගත් සත්‍යජිත් රායි. 1994. (කර්තෘ ප්‍රකාශන ) පි. 01.

කතා වින්‍යාසය, චරිත නිරූපණය, කාලය හා අවකාශය යනාදියයි. සිනමා කෘතියකට අනන්‍ය වූ ලක්ෂණ ද රැසකි. රූපය, ආලෝකකරණය, හඬ, පසුබිම් හඬ, සංගීතය, සංස්කරණය යනාදිය ඉන් ප්‍රධානය.

1955 දී සත්‍යජිත් රේ විසින් **'පතේර් පංචලී'** නිර්මාණය කරන විට නිදහස් ඉන්දියාවේ වයස දස අවුරුද්දකටත් අඩු ය. ඉන්දියානු විචාරක ටී. ජී. විද්‍යානාදන් පැවැසූ පරිදි අපූ ත්‍රිත්වයේ දී සත්‍යජිත් විසින් කුඩා දරුවෙකුගේ හැඟීම්බර දෑසින් ද, යථාර්ථය පිළිබඳ අතිශයෝක්තිගත ළමා මනසකින් ද ඉන්දියාව දැකීම පුදුමයට කාරණයක් නොවේ. එය ශතවර්ෂාධික කාලයක් විදේශාධිපත්‍යයට අසු ව නැවත ඉන්දියාව සොයා ගැනීමක් වැන්න. සිත විමතියට පත් කරන අන්දමේ නවකතාවක් එහි රැඳී ඇත්තේ එබැවිනි.[5]

සත්‍යජිත් රේ ස්වකීය පළමු චිත්‍රපටය වන **'පතේර් පංචලි'** මගින් උත්සුක වූයේ ද ඉන්දීය විපර්යස්ථ ජන ජීවිතය පිළිබඳ ව යම්බඳු ඉගියක් සමාජ ගත කිරීමට දැයි හැඟේ. එය විශාල චරිත ප්‍රමාණයක් අන්තර්ගත බිභූති භූෂාන් බැනර්ජිගේ නවකතාවකි. මෙහි ප්‍රධාන චරිතය වනුයේ ඔපු නමැති කුඩා ළමයා ය. ඔහුගේ සොයුරිය දූර්ගා නම් විය. මව සර්බෝජයා ය. පියා හරිහර් ය. හරිහර් දිළෙන්දෙකි. ඔහුට මේ පවුල ජීවත් කරවීමට සෑහෙන ප්‍රමාණයේ මුදල් නොමැති බව නිරූපණය වන නමුදු ඔහු නිර්ව්‍යාජ ගතිගුණවලින් සමන්විත වූ අයෙකි. මෙහි නිරූපිත ඉන්දිර් හරිහර්ට දුර ඥාතිත්වයක් දරන්නියකි. සර්බෝජයා විසින් කිසිදු සැලකිල්ලක් නොමැති ව හැත්තෑ පස් පමණ විය ගත කරන ඉන්දිර් අතිශය දුක්ඛිත ජීවිතයක් ගත කරන නමුදු දිගු කලක් ජීවත් නොවී මිය යයි. දූර්ගා ඉන්දිර්ට අතිශයින් ආදරය කළා ය. දූර්ගා පසු කාලයේ මිය යන්නී උණ රෝගයක් වැළඳීමෙනි. දිළිඳුකමෙන් තව දුරටත් අගාධයට පත් වන හරිහර් තම බිරිඳත් දරුවාත් සමග බෙනාරිස් නම් නගරයට ගොස් අලුත් ජීවිතයක් ආරම්භ කිරීමට පෙලඹෙයි. මෙය **'පතේර් පංචලී'** සිනමා කෘතියේ සාරයයි.

**'පතේර් පංචාලි'** සිනමා කෘතියෙන් බෙංගාලයේ දුගී දුප්පත් භාවය නිරූපණය කරයි. විශේෂයෙන් අධිරාජ්‍යවාදයෙන් දුරස් ව දස වසරක් හෝ නොඉක්ම වූ ඉන්දියාවේ ආර්ථිකය ද අතිශය පහත් මට්ටමකට ඇද වැටී තිබිණ. මෙබඳු තත්ත්වයන් හේතුවෙන් සමාජයේ ජන ජීවිතවලට එල්ල වූයේ දැඩි පීඩනයකි. සත්‍යජිත් රේ මෙම ස්වභාවය ස්වකීය සිනමාකෘතියට උපයෝගී කර ගෙන තිබේ. බිභූති භූෂණගේ නවකතා උපයෝගී කොට ගත් නමුදු සත්‍යජිත්ට තදීය සමාජය තථ්‍යාකාරයෙන් ම විෂය වී තිබිණ. **'පතේර් පංචලී'** නවකතාවට විෂය වන්නේ ඉන්දියාව නිදහස ලැබීමට පෙර ගත වූ කාල පරිච්ඡේදයයි. පාරම්පරික රැකියාව කරගෙන යාමට අවැසි පසුබිම ජන සමාජයෙන් දුරස් ව ගිය පසු මිනිසුන් විඳි දුක්ඛ දෝමනස්සයන් එහි නිරූපණය වෙයි.

විසිවන සියවස වන විට වංග සාහිත්‍යයේ හිරු සඳු මෙන් බැබළුණු රවීන්ද්‍රනාත් ඨාකුර්, සරච්චන්ද්‍ර චාට්ඨෝපාධ්‍යාය යන සාහිත්‍යකරුවන්ට පසු ව පහළ වූ වඩාත් ඉස්මතු ව පෙනෙන ලේඛකයන් අතුරෙන් විභූති භූෂණට හිමි වන්නේ සුවිශේෂ ස්ථානයකි. පාඨක සිත් ඇද බැඳ තබා ගන්නා සරල, ස්වතන්ත්‍ර රචනා ශෛලියකින් නිර්මාණකරණයේ යෙදුණු මොහුගේ කෘතිවල, ස්වභාව ධර්මයේ කෝමල ශාන්ත ස්වරූපය පිළිබඳ ව සිත් ගන්නා අයුරින් සඳහන් වේ. මානව දයාවෙන් මෘදු වූ

---

[5] රත්නවිභූෂණ. ඇෂ්ලි (1993). සංස්: **සිනෙසිත් අංක 26. 1993/4.** බොරලැස්ගමුව: ආසියානු සිනමා කේන්ද්‍රය. පි 18.

හදවතකින් යුතු ව මිනිසාගේ සැප හා දුක මිශ්‍ර වූ අත්දැකීම් ස්වභාව ධර්මය සමග මනා ලෙස සංකලනය කරන මේ ලේඛකයා එමගින් පාඨක හදවත් බැඳ ගනියි.[6]

භාෂාත්මක කථනයත් රූපාත්මක කථනයත් සම කක්ෂයෙහි ලා සැලකිය නොහැකි අතර ඒ මාධ්‍යයන් අතර පවතින සියුම් විසාම්‍යතා ගණනාවක් පවතී. **'පතේර් පංචාලි'** සිනමා කෘතියත් බිභූති භූෂාන් ලියූ නවකතාවත් අතුරෙහි යම්බඳු වෙනස්කම් කිහිපයක් දක්නා ලැබෙන අතර එමගින් මූලික කතාවට බලපෑමක් සිදු ව නොමැත. විශේෂයෙන් චරිත නිරූපණයෙහි දී ද වෙනස්කම් කිහිපයක් ම හඳුනා ගත හැකි ය. නවකතාවේ හරිහර්ගේ ඥාති සොයුරියක වන ඉන්දිර් මිය යන පුවත අපට දැක ගත හැකි වන්නේ කතාව ඇරඹී වැඩි දුරක් යාමට මත්තෙනි. එහි ඉන්දිර්ගේ මරණය සිදු වන අන්දම මෙසේ සඳහන් වෙයි.

> **"දැන් ඕක හරි යයි. කලන්තේ හැදිලා වෙන්න ඇති" තවත් කෙනෙක් කීහ.**
>
> **"කලන්තේ නොවෙයි. නාකි උන්දෑ මැරෙන්න යනවා. හරිහර බාප්පා ගෙදර නැතුව ඇති. පණිවිඩේ නම් දුන්නා. ඒ වුණත් කවුද ඔච්චර දුර එන්නේ" යැයි බිශූ පාලිත කී ය.**
>
> **"..ගංගා ජලය ටිකක් කටට දාන්න. බ්‍රාහ්මණයින් ගේ ගම්මැද්දේ වෙලත් කටට ගංගා ජලය ටිකක් වත් කළේ නැත්නම් ලොකු වැරැද්දක් නේ" බොහෝ දෙනෙක් කීහ.**[7]

එහෙයින් ඉන්දිර් පිළිබඳ ව පාඨක මනසෙහි ගැඹුරට යාමට අවකාශයක් නොමැත. එහෙත් චිත්‍රපටයෙහි ඈ මිය යන්නී ප්‍රේක්ෂක සිත්හි ඈ බොහෝ දුරක් ගත කිරීමෙන් අනතුරුව ය. එනම් චිත්‍රපටයෙන් අඩකටත් වැඩි ප්‍රමාණයක් ඉක්ම වූ පසු ව ය. සිනමා කෘතියේ දී ඊට උචිත අයුරින් ප්‍රේක්ෂකයාට එය ඉදිරිපත් කිරීමට වෑයම් කර තිබේ. එහි තිර රචනය පහත පරිදි ය.

> **"ඈ ඇහෙරෙන තුරු ළමෝ බලාපොරොත්තු සහිතව හිඳිති. නමුත් ඉන්දීර්ගේ සෙලවීමකුදු නැත. දුර්ගා තම අත ඉන්දීර්ගේ දණහිස මත තබා සොළවා ඇව අවදි කරවීමට උත්සාහ කරද්දීම, ඉන්දීර් බිම පෙරළී ගොස්, ඇගේ හිස පොළොවේ වදී. ප්‍රාණය නිරුද්ද වී ඇති ඇගේ සිරුරට හේත්තු වන දුර්ගා 'නැන්දේ' යයි කොඳුරයි. ඉන්පසු බියෙන් තිගැස්සෙයි. පසෙකට හැරෙයි. ඉන්දීර්ගේ සෙම්බුවේ දුර්ගාගේ පය හැප්පීමෙන් එය බිම දිගේ පල්ලමට පෙරළී ගොස්, පොළොවේ තිබූ වතුර රොදක රැඳී නවතී. සැන්දෑ මීදුම ඉංදීගේ නොසෙසල් වෙන මුහුණ මත පතිත වෙයි. මිනී රැගෙන යන්නෝ, ඉන්දීර් ඔසවාගෙන ඉවත්ව යති."**[8]

චිත්‍රපටයේත් නවකතාවේත් මිනිසුන්ගේ විපර්යස්ථ වූ ජන ජීවිතයෙහි ස්වභාවය මනා ව නිරූපණය කරන්නකි, දුර්ගාගේ මරණය. නවකතාවේ දී ඈ මිය යන්නේ වැස්සට තෙමී හටගත් උණ රෝගයකිනි. එහෙත් සිනමා කෘතියේ උණ වැළඳීමට නිශ්චිත හේතු ප්‍රත්‍යයක් නිරූපණය නොවේ. එහෙත් රූපණ මාධ්‍යය මගින් එහි හානියක් ප්‍රේක්ෂකයාට නොදැනීමට අධ්‍යක්ෂවරයා අවකාශය සලසා තිබේ.

---

[6] සිංහ ආරච්චි. චින්තා ලක්ෂ්මී (2013). පරි: **මාවතේ ගීතය**. මුල්ලේරියාව: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය. ප්‍රස්ථාවනාව.

[7] සිංහ ආරච්චි. චින්තා ලක්ෂ්මී (2013). පරි: **මා. ගී.** 49 පිට.

[8] ජයසේකර. බර්ටි (2002). පරි: **පතේර් පංචාලි**. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ. 78 පිට.

ශත්‍රනජ් කේ කිලාඩි නමැති චිත්‍රපටයට පාදක කොට ගැනුණේ ප්‍රේම්චාන්ද් විසින් ලියන ලද කෙටිකතාවකි. 1977 වර්ෂයේ තිරගත වුණු තදීය සිනමා කෘතියෙහි ඉන්දියාවේ බ්‍රිතාන්‍ය පාලන සමය පසුබිම් කොටගෙන තැනුණකි. යටත්විජිතසමය පදනම් කරගෙන සත්‍යජිත් රේ විසින් අධ්‍යක්ෂණය කළ ප්‍රථම චිත්‍රපටය ද වන මෙය **'චෙස් ක්‍රීඩකයෝ'** නමින් සිංහලට පරිවර්තනය විය.

ඔහුගේ සිනමා සම්ප්‍රදායෙහි කිසියම් විවිධත්වයක් දක්නට ලැබුණ ද ප්‍රධාන වශයෙන් ඔහුගේ කෘතිවලින් ඉස්මතු වන්නේ ඉන්දියානු සමාජය වෙනස්වන ආකාරයයි. සමකාලීන සමාජ වෙනස්වීම් සත්‍යජිත් ස්වකීය කෘතිවලට පාදක කොට ගැනීමට අමතර ව එම කෘතීන්ගෙන් ඔහු ගැඹුරු අන්දමින් සමාජ ගවේෂණයේ යෙදුණේ ය. මෙහි දී ඔහු පුළුල් වශයෙන් ඓතිහාසික සමාජ පරිසරය වෙත මෙන් ම මිනිස් චිත්තාභ්‍යන්තරය වෙත ද සමීප වූයේ ය. ඔහු ඓතිහාසික සමාජ පසුතලයක් ඔස්සේ සමකාලීන අත්දැකීම් ගවේෂණය කරමින් මිනිස් ආත්මයට එබී බලන අන්දම පිළිබඳ කදිම නිදසුනක් ඔහුගේ **'චෙස් ක්‍රීඩකයෝ'** චිත්‍රපටය දැක්විය හැකි ය.[9]

ප්‍රේම්චාන්ද්ගේ කෙටිකතාවේ මූලික හරය නොසිඳ එහෙත් වෙනස්කම් කිහිපයකට එය ලක්කොට **'චෙස් ක්‍රීඩකයෝ'** සිනමා කෘතිය අධ්‍යක්ෂණය කිරීමට සත්‍යජිත් රේ පෙලඹී තිබේ. මෙහි ලා මූලික ව කෙටිකතාවට අමතර ව චරිත ද්වයක් නිරූපණය කිරීම දැක්විය හැකි ය. මුන්ෂි නන්දලාල් සහ කල්ලො නමැති තරුණයන්ගේ චරිත මෙලෙස එක් කොට තිබේ. මුන්ෂි චෙස් ක්‍රීඩකයන්ගේ හිතවත් මිතුරෙකු වන අතර කල්ලො නමැත්තා සිනමා කෘතිය අවසානයට හමුවන්නෙකි. මෙම චරිතයන්හි එක්වීම කෙටිකතාවේ ගුරු අරුතට බාධාවක් ව නොමැත. කෙටිකතාවේ අවසානයේ විපර්යස්ත වූ ජන ජීවිතයේ යථා ස්වරූපය පළට වනු වස් කෙටිකතාකරු ඉදිරිපත් කරන චෙස් ක්‍රීඩකයන් දෙදෙනාගේ මාරාන්තික සටන චිත්‍රපටයට නොගෙන අතහරී. කෙටිකතාවේ මිතුරන් දෙදෙනා අතුරෙහි ඇති වන සටන මෙසේ නිරූපණය වේ.

> **"හෙල්ල කරකැවීම, ගට්කා සටන් ආදිය පිළිබඳව කෙළ පැමිණ සිටි ඔවුහු ද්වන්ධ සටනකට වන්හ. අසිපත් ළෙල දුන්නේය. සටන් හඬ අවකාශය ඔස්සේ පාවී ගියේය. දෙදෙනාම තුවාල ලදහ. මාරාන්තික වේදනා මැද ඔවුහු සටනින් දිවි තොරකර ගත්හ. තමන්ගේ රජු ගැන කඳුළු බිඳක් නොහෙලූ මේ අපූරු ප්‍රභූන් දෙදෙනා චෙස් ක්‍රීඩාවේ බිෂොප් වෙනුවෙන් ගෙල සිඳගත්හ!"**[10]

විපර්යස්ත වූ ජන දිවියේ යථා ස්වභාවය පළට කරනු වස් අධ්‍යක්ෂවරයා ද එම සිදුවීම යථා ස්වරූපයෙන් ම රූපාත්මක කථනයට පරිවර්තනය කොට ගත්තේ නම් වඩාත් යෝග්‍ය ය. එහෙත් සත්‍යජිත් රේ ස්වකීය සිනමා කෘතිය අවසන් කරනුයේ මේ ආකාරයෙනි.

> **මීර්-: ඉක්මන් චෙස් අතක්?**
> **(මීර් සෙමින් වාඩිවෙයි.)**
>
> **මීර්ශා-: ඔව්. ඉක්මන් චෙස් අතක්. හරියට කෝච්චිය යන්නා වගේ වේගයෙන් චෙස් අතක් අදිමු.**

---

[9] වීරසිංහ. සේනාරත්න (1999). පරි: **චෙස් ක්‍රීඩකයෝ**. වේයන්ගොඩ: ප්‍රභා ප්‍රකාශකයෝ. 08 පිට.
[10] එම. 128 පිට.

**(මීර්ශා මිනිස්ටර් ඉත්තා අතට ගිනියි.)**

**මිනිස්ටර් එහාට කරල වික්ටෝරියා කුවීන්ට යන්ඩ පාර හදමු!**

**(මීර්ශාගේ අතෙහි ඇති කුවීන් ඉත්තාගේ සමීප රූපයක් සමගින් දර්ශනය නිසල වෙයි. මිතුරන් දෙදෙනා ගෙවී යන සීත ඍතුවේ පඩු පැහැති එළියෙන් ප්‍රථම වරට බ්‍රිතාන්‍ය ක්‍රමයට චෙස් ක්‍රීඩාවේ යෙදෙන දර්ශනයක් මත එම සමීප රූපය බොඳව යයි. මුස්ලිම් දේවස්ථානයෙන් නිකුත්වන යාඥාව සමග බියුගල් නලා හඬ මුසුවෙයි.)**[11]

දේශපාලනයේ යථා ස්වභාවය චෙස් ක්‍රීඩාවට සම තත්ත්වයක් උසුලන බැව් තදීය සිනමා කෘතියෙන් විශද වෙයි. පාලකයන්ගේ කෙලි සෙල්ලම් හේතුවෙන් දැඩි ලෙස ජනයාගේ ජීවන තත්ත්වය පිරිහීමට හේතු වන්නේ ය. එක් අතකින් ජනයාගේ දෛනික අවශ්‍යතා කෙරෙහි ඇති වන බලපෑම තවත් අතකින් ජීවන තත්ත්වයන්හි අනාරක්ෂිත ස්වභාවය ද මෙමගින් අවධාරණය කෙරේ.

බ්‍රිතාන්‍ය රජය විසින් ලක්නව් නගරය 1856 දී යටත් කර ගැනීම නිරූපණය වන මෙම චිත්‍රපටයෙහි තදීය කාලසීමාවෙහි මිනිසුන්ගේ ජන ජීවිතය පිළිබඳ විවරණයක් අන්තර්ගත වෙයි. ඖද් ප්‍රාන්ත රාජ්‍යයත් එහි අගනුවර වන ලක්නව් නගරයත් දහඅටවන ශත වර්ෂයේ අවසාන භාගයේත් දහනවවන ශත වර්ෂයේ මුල් භාගයේත් මෝගල් සංස්කෘතියේ මධ්‍යස්ථානය බවට පත් ව තිබුණු බව සැලකිය හැකි ය. එම කාලයෙහි වැසියන්ගේ ජීවිත විනිවිද දුටු සත්‍යජිත් රේ ස්වකීය සිනමාකෘතියට උපයෝගී කර ගන්නේ ද විපර්යාසයට ලක්වුණු ජීවිත ය.

නවකතාවට නොමැති ලක්ෂණ රැසක් සිනමාවේ දී උපයෝගී කර ගැනීමේ අවකාශය අධ්‍යක්ෂවරයාට පවතින හෙයින් ඉන් උපරිම ඵල නෙළා ගැනීමට සත්‍යජිත් රේ සමත් වූ බව කිව හැකි ය. එහි ලා ඔහු සුභාවිත රූප වියමන අතිශයින් භාවාත්මක ය. යොදා ගත් පසුබිම් සංගීතය හා පසුබිම් හඬ ද සිනමා කෘතියේ මූලික හරය ඔප් නැංවීමෙහි ලා සප්‍රයෝජන වී ඇතැයි කිව හැකි ය.

රබීන්ද්‍රනාත් තාගෝර්ගේ සෙවණැල්ලෙහි චින්තනමය වෙනසක් අත් කර ගත් සත්‍යජිත් රේ ඔහු විසින් ලියන ලද සාහිත්‍ය කෘති කිහිපයක් ම ස්වකීය සිනමාවට ග්‍රහණය කර ගත්තේ ය. තාගෝර්ගේ **'The Broken Nest'** නමැති නවකතාව ද එසේ සිනමාවට පාදක කොට ගත්තකි. එමගින් සත්‍යජිත් රේ අධ්‍යක්ෂණය කළ සිනමා කෘතිය **'චාරුලතා'** නම් විය. චාරුලතා වනාහි ලෝකවාසී බොහෝ දෙනෙකු දැනටමත් නරඹා ඇති සිනමා කෘතියක් බව අවිවාදයෙන් කිව හැකි ය.

බටහිර ජාතීන්ගේ ආධිපත්‍යයත් සමග ම ඉන්දීය සමාජයෙහි නොයෙක් විපර්යස්ත ස්වභාවයන් ඇති විය. 19 වැනි සියවස පමණ වන විට ඉන්දියාවේ **'පවුල'** නමැති සංකල්පය ශීඝ්‍ර දෙදරා යාමකට තුඩු දුන්නේ ය. නගරයේ පැවැතුණ රැකියා හා වෙනත් පහසුකම් හේතු කොට ගෙන ගම්බද ජීවත් වූ බොහෝ දෙනා නගරබද ව පදිංචිය පිණිස තෝරා ගත්හ. ඇතැම් විට එක ම නිවෙසක පවුල් කිහිපයක් ජීවත් විය. කුඩා පවුල් තුළ ආරක්ෂාව නොමැති වීම එක ම නිවෙස් හිමියෙකු යටතේ පවුල් කිහිපයක් ජීවත් වීම වැනි ලක්ෂණ නාගරික සමාජයෙහි සුලබ දසුනක් විය. තාගෝර්ගේ **'The Broken Nest'** නමැති නවකතාවට ප්‍රස්තුත වන්නේ එවැනි වෙනස්කම්වලට ගොදුරු වුණ ඉහළ පන්තියේ පවුලක චරිත තුනක් ආත්ම සම්බන්ධතා ගොඩනගා ගන්නට ගත් වෑයම පිළිබඳ වූ වෘත්තාන්තයකි. මිනිස්

[11] වීරසිංහ. සේනාරත්න (1999). පරි: **චෙස් ක්‍රීඩකයෝ.** 104 පිට.

සිතෙහි ගැඹුරු තැන් සංස්පර්ශ කරමින් රචනා කර ඇති තදීය නවකතාවෙහි ප්‍රධාන චරිත ලෙසින් විස්තීර්ණ කරනුයේ භූපති, ඔහුගේ බිරිඳ වන චාරුලතා හා ඔවුන්ගේ ඥාති සොහොයුරා වන අමල් යන තිදෙනාගේ චරිතයන් ය. බ්‍රිතාන්‍ය පාලන සමයේ කල්කටාවේ ජීවත් වූ ඉහළ පැලැන්තියට අයත් මොවුහු බටහිර හා බැඳුණු සාරධර්මවලින් හික්මවනු ලැබූවෝ වෙති.[12]

ඉංග්‍රීසි බසින් ලිවීමට හා කියවීමට වැඩි ඇලුම්කමක් ඇති භූපති සතු වූ ලක්ෂණ බටහිරින් සංක්‍රමණය වූ ඒවා ය. එහෙත් ඔහුගේ බිරිඳ වන චාරුලතා සහ ඇගේ ඥාති සොහොයුරා වන අමල්, භූපතිට වඩා සාකල්‍යයෙන් ප්‍රතිපක්ෂ ය. චාරුලතාගේ චරිතය නිරූපණය වී ඇත්තේ සාම්ප්‍රදායික සමාජ රාමුවෙහි වැඩෙන එහෙත් නවීන ඇතැම් සංලක්ෂණයන්ගෙන් ද හෙබි චරිතයක් වශයෙනි. එහෙයින් ඇගේ චරිතය මේ ද්විත්වයට ම අතරමැදි තත්ත්වයක් නිරූපණය කරන දෙමංසලක ජීවත්වන චරිතයක් වශයෙන් හැඳින්වීම අතිශයෝක්තියක් නොවේ. අමල් වනාහි සමකාලීන අධ්‍යාපන ක්‍රමවේද ඔස්සේ හා දේශීය කලා ශිල්ප හා සාහිත්‍යය මගින් පුළුල් කරගත් දැනුමක් සහිත වූවෙකි. භූපතිගේත් චාරුලතාගේත් නිවසට නවීන සංකල්ප රැගත් කෘති, සඟරා හා අදහස් ප්‍රවිෂ්ට කරවන්නේ ද අමල් ය.

අමල් මෙන් ම චාරුලතා නිර්මාණශීලි අදහස්වලින් යුක්ත වූවෝ වෙති. මේ හේතුවෙන් චාරුලතා අමල් කෙරෙහි දැක්වූයේ දැඩි ළෙංගතුකමකි. දෙදෙනා ම දේශීය ඥානයෙන් පොතපතින් උකහාගත් නව දැනුමෙන් යන උභය පාර්ශවයන්ගෙන් සමන්විත වූහ. චාරුලතා සතු ලේඛනමය කුසලතාව මගින් ඇය හා සිතුම්පැතුම්වල ඇති තීක්ෂ්ණ ස්වභාවය හේතුවෙන් අපට විද්‍යමාන වන්නේ භූපති සහ චාරුලතා අතුරෙහි ඇති දුරස්ථභාවයත් චාරුලතා සහ අමල් අතුරෙහි පවතිනා සමීපතාවත් ය. ඊට අමතර ව ඒ සඳහා වෙනත් සංස්කෘතික හේතු සාධකයක් ද තිබේ. එනම් බිරිඳ සහ ඇගේ ස්වාමි පුරුෂයාගේ බාල සොහොයුරාත් අතර ඇති සම්බන්ධයයි. මෙය බෙංගාල ජන ජීවිතයෙහි පිළිගත් බැඳීමකි. වෙනත් පිරිමින් ඉදිරියට පැමිණීමට නිදහස නැතත් ස්වාමි පුරුෂයාගේ බාල සොහොයුරා ඉදිරියට පැමිණීමට නිදහස තිබේ. බෙංගාල සංස්කෘතියට අනුව ඔහුට ඇයත් සමග ආශ්‍රය කිරීමට නිදහස ඇති හෙයින් මෙම සතුට වඩා බලවත් යැයි කිව හැකි ය. මේ හේතුව නිසා දෙදෙනා අතර වඩාත් ගැඹුරු සම්බන්ධතාවක් ඇති වීමට හැකියාව තිබේ.[13] නවකතාවේ දී තාගෝර් පළට කරන ගැඹුරු සිතිවිලි අතිශය සියුම් ලෙස භාෂා මාධ්‍යයෙන් ඉදිරිපත් කර තිබේ.

ආධ්‍යාපනික වශයෙන් නව පන්තියක ආගමනය පිළිබඳ ව සමකාලීන යුගයේ තත්ත්වය මතු සඳහන් පරිදි වෙයි.

> **"18 වැනි සියවස අගභාගයේ හා 19 වැනි සියවස අගභාගයේ සාහිත්‍යකරණයට පිවිසුණ නව පංතියට අයත් පුද්ගලයන් බෙංගාලි බසින් හඳුන්වනු ලැබුවේ 'බඬ්ර-ලොක්ස්' යන නමිනි. 'උගත්, හික්මුණු, ප්‍රබුද්ධ' යනු අරුත් මේ වචනයෙන් ගම්‍යවෙයි. මොවුහු වැඩිදෙනා ඉහළ මැද පංතියට අයත් වූහ. රජුන් ප්‍රභූවරුන් ආදීන්ගේ අනුග්‍රහයෙන් සාහිත්‍යකරණයේ නොයෙදුණ මේ පිරිස සිය පෞද්ගලික රුචි අරුචිකම් අනුව නිර්මාණකරණයේ යෙදුණෝ වූහ. ඉංග්‍රීසි අධ්‍යාපනය ලබා බටහිර කලාවන් හා විද්‍යාවන් ගැන හොඳ හැටි උගත් මොවුහු සිය නිර්මාණයන් තුළට එතෙක් නොදුටු**

[12] වීරසිංහ. සේනාරත්න (2015). පරි: **චාරුලතා**. වේයන්ගොඩ: ප්‍රභා ප්‍රකාශකයෝ. 5 පිට.

[13] බෙල්ලන්විල ඕ.ටී. පෙරේරා (1994). **සිනමාවෙන් සමුගත් සත්‍යජිත් රායි**. 91 පිට.

**නවතාවක් ලබාදීමෙහි සමත්වූහ. මේ නව පරපුරට අයත් වූවන් අතර රබීන්ද්‍රනාත් තාගෝර් තුමාද ප්‍රබලයෙක් විය."**[14]

භාෂාමය පක්ෂයෙන් තදීය සමාජ තත්ත්වය නවකතාවට පාදක කොටගෙන ඇති අන්දම තාගෝර්ගේ කතා කීමේ ශක්‍යතාව ප්‍රකට කරන්නකි. විපර්යස්ත වූ සමාජ තත්ත්වය පෙන්නුම් කරන එම කෘතිය ඇසුරු කොටගත සත්‍යජිත් රේගේ සිනමා කෘතිය හා තුලනාත්මක ව විමසා බැලීම වටී.

නවකතාවෙහි ආරම්භයට වඩා වෙනස් මුහුණුවරක් සිනමා අධ්‍යක්ෂවරයා ස්වකීය කෘතියට එක් කර තිබෙනු පෙනේ. නවකතාවේ දී තාගෝර් භූපතිගේ චරිත නිරූපණයකින් කෘතිය අරඹයි.

**"සෑහෙන පමණ ධන සම්භාරයකට උරුමකම් කියන ලද හෙයින්, උෂ්ණාධික රටක ජීවත් වන භූපතිට රැකියාවක නිරතවීමේ අවශ්‍යතාවක් නොවීය. එහෙත් මුළු ලොවටම පායන ඉර, හඳ තාරකාවන්ගෙන් විහිදෙන ආලෝකය යට ජීවත් වන හෙයින්, මිනිසා කුමන හෝ වෘත්තියක නිරත විය යුතු ය යන්න ඔහුගේ ඇදහීම විය."**[15]

සිනමා කෘතිය ඇරඹෙන්නේ චාරුලතා විසින් රටාවක් ගෙත්තම් කරමින් සිටින අවස්ථාවකිනි. එහි ඇය විසින් ගොතනු ලබන්නේ '**B**' අක්ෂරයයි. ඒ භූපති යන්න වෙනුවෙනි. අනතුරුව ඇය සිය ඇඳ මත තිබූ පොතක් ගෙන පෙරළා බලා එය රාක්කය මත තබා ගීයක් මුමුණමින් හා තුෂ්ටියෙන් යළිත් එයින් පොතක් ගන්නීය. එමගින් ප්‍රතීයමාන වන්නේ කෘති කියවීම සඳහා ඇ සතු රුචිකත්වයයි. එම සමීප රූප කිහිපය ඒ බැව් තහවුරු කිරීමෙහි ලා සමත් වෙයි. තාගෝර් නවකතාවේ දී පේළි ගණනාවකින් පාඨකයාට අවබෝධ කරවීමට උත්සුක වූ ඇතැම් දෑ සිනමාවේ දී පහසුවෙන් ප්‍රේක්ෂකයා වෙත සම්ප්‍රේෂණය කිරීම කෙරෙහි එය ප්‍රබල නිදර්ශනයක් වෙයි.

'චාරුලතා හි' පූර්වාර්ධය මගින් ඇගේ තනිකම පිළිබඳ ව පුළුල් විවරණයක් සපයයි. විශේෂයෙන් ම චාරුලතාට දරුවන් නොමැති වීම එයට ප්‍රබල හේතුවකි. ඇයට දරුවන් නොමැති වීමත් භූපති නමැති ස්වාමියා ඇය කෙරෙහි දක්වන ඌන සැලකිල්ලත් හේතුවෙන් ඇ වරෙක දූරදක්නයක් උපයෝගී කර ගනිමින් මහමග යනෙන මිනිසුන් දෙස විමර්ශනශීලී වෙයි. සත්‍යජිත් රේ ස්වකීය සිනමා කෘතියට එක් කරන අපූර්ව සිදුවීම නම් ඇය එසේ භූපති දෙස ද බලා සිටීමයි. එමගින් රායි චාරුලතා හා භූපති අතර නොපැවැති අන්‍යෝන්‍ය සම්බන්ධතාව සංකේතාත්මක ව සිනමාවේ සටහන් කිරීමක් වැන්න. එමෙන් ම අධ්‍යක්ෂවරයා එම අවස්ථාවන්ට උචිත අයුරින් පසුබිම් හඬ යොදාගෙන ඇති අන්දම ද ප්‍රේක්ෂකයාගේ භාව උද්දීපනයෙහි ලා සමත් වෙයි.

භූපති සහ චාරුලතා වෙසෙන සුවිසල් නිවහනෙහි ස්වභාවය ප්‍රකාශ කිරීම සඳහා රේට වැය වී ඇත්තේ රූපරාමු කිහිපයක් පමණි. මධ්‍යම රූප භාවිතයෙන් නිවසෙහි සැරසිලි යනාදිය විශද කිරීමට සමත් ව තිබේ. නිදන කාමරයෙහි පවතින වික්ටෝරියානු සම්ප්‍රදාය සිහි ගන්වනසුලු යහන්, බිත්ති මත තිබෙන රටා සහිත කඩදාසි යනාදිය එකී සුවිසල් නිවසෙහි විද්‍යමාන සංස්කෘතික තත්ත්වයන් ය. භාෂාමය කථනයට වඩා රූපමය කථනයෙහි පවත්නා සුවිශේෂත්වය වන්නේ ද කාලය හා අවකාශය ජය ගනිමින් වඩාත් තාත්වික අන්දමින් ප්‍රේක්ෂකයාට ඒත්තු ගැන්වීමේ ශක්‍යතාවයි.

---

[14] වීරසිංහ. සේනාරත්න (2015). පරි: **චාරුලතා**. 10 පිට.
[15] වීරසිංහ. සේනාරත්න (2015). පරි: **චාරුලතා**. 15 පිට.

සිනමා කෘතියෙහි අවසානයත් නවකතාවේ අවසානයත් අතිශයින් සාම්‍යත්වයක් උසුලන බව කිව හැකි ය. එසේ වුව ද පසුබිම් හඬත් රූපරාමු මගිනුත් චිත්‍රපටයට සජීවීත්වයක් ආරෝපණය වී තිබේ. භූපති විසින් චාරුලතා ව තනි කොට දමා යන අවස්ථාව සිනමා කෘතියෙහි අතිශය සංවේදී අයුරින් නිරූපණය වෙයි. සයනාසන්න ව වැතිරී කඳුළු පිරි දෙනෙතින් යුතු ව සිටි චාරුලතා භූපති පිට ව යන දසුන නැරඹීමට ද්වාරය අසලට පැමිණෙයි. දුරස්ථ රූපයක් උපයෝගී කරගෙන එම අවස්ථාව සිනමාවට නඟා තිබේ. එයින් අනතුරුව හදවතින් වැළපෙන චාරුලතාගේ දෙනෙතින් ගලා හැලෙන කඳුළු සමීප රූපයකින් ප්‍රේක්ෂකයාට විද්‍යමාන කරවීමට සත්‍යජිත් රේ උත්සුක වී තිබේ. එය චිත්‍රපටය නරඹන්නාගේ භාව සංවේදී කරවීමෙහි ලා සමත් ය.

**සමාලෝචනය**

සත්‍යජිත් රේගේ සිනමාවෙහි දක්නා ලැබෙන සුවිශේෂතා කිහිපයකි. එයින් වඩාත් ප්‍රකට ව වියත් සම්භාවනාවට පාත්‍ර වන්නේ ඔහු සතු මානව හිතවාදී ගුණයයි. ඔහුගේ රූප වියමනෙහි දක්නා ලැබෙන එම ලක්ෂණයට අමතර ව දැක ගත හැකි වන්නේ ඔහු සාහිත්‍යයෙන් ලද ආලෝකයයි. ඔහුගේ සිනමා කෘතිවලින් අඩකටත් වැඩි ප්‍රමාණයක් නිර්මාණය වී ඇත්තේ නවකතා හෝ කෙටිකතා ආශ්‍රය කර ගනිමිනි. එයින් අප ඉහත තෝරා ගත් පතේර් පංචලී, ශත්රනජ් කේ කිලාඩි සිනමා කෘතිය හා චාරුලතා යන චිත්‍රපට ත්‍රිත්වයෙහි මුල් කෘතිය හා තුලනාත්මක ව විමසා බැලීමේ දී එහි යම් යම් වෙනස්කම් කොට ඇති බව තහවුරු වෙයි. කෙටිකතාව හෝ නවකතාව සහ සිනමාව යනු එකිනෙකට වෙනස් මාධ්‍යයන් ය. එයට උචිත ආකාරයෙන් මුල් කෘතියෙහි ගුරු අරුත නොසිඳ සිනමා කෘතියක් නිර්මාණය කිරීමට සත්‍යජිත් රේ උත්සුක ව ඇති බව කිව හැකි ය. එමෙන් ම සාහිත්‍යයෙන් රේ ලද ආභාසය තව දුරටත් ප්‍රතීයමාන වන්නේ ඔහු එමගින් තෝරා ගත් ප්‍රස්තුත දෙස විමර්ශනශීලී වන විට ය. විපර්යස්ත ජන සමාජ නිරූපණයට ඔහු වැඩි නැඹුරුවක් දක්වා තිබේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


පල්ලියගුරු. චන්ද්‍රසිරි (2000). සිරිලක සිනමා සමරු සටහන් **''නවකතාවෙන් පෝෂණය වූ සිනමාව''** කොළඹ: ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව.

බෙල්ලන්විල ඕ.ටී. පෙරේරා (1994). **සිනමාවෙන් සමුගත් සත්‍යජිත් රායි**. කර්තෘ ප්‍රකාශන.

වීරසිංහ. සේනාරත්න (2016). පරි: **චාරුලතා.** වේයන්ගොඩ: ප්‍රභා ප්‍රකාශකයෝ.

වීරසිංහ. සේනාරත්න (1999). පරි: **චෙස් ක්‍රීඩකයෝ.** වේයන්ගොඩ: ප්‍රභා ප්‍රකාශකයෝ.

සුනිල් සෙනෙවි. හිනිදුම (2007). **සිංහල කෙටිකතාවේ සිනමාවතරණය**. කොළඹ: එස්.ගොඩගේ සහ සහෝදරයෝ.

සුරවීර. ඒ. වී. (1973). **නවකතා නිර්මාණය හා අවබෝධය**. කොළඹ: සීමාසහිත හංස ප්‍රකාශකයෝ.

http://www.malkakulu.com/2012/03/2.html

දෘශ්‍ය පටවලට අදාළ සිනමා කෘති